
සෝවාන් වීමට
පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

සෝවාන් වීමට

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

ප්‍රකාශනය

පින්වත් කළණ මිතුරන් පිරිසක් විසිනි

පිරිසිඳු ධර්ම දානයකි

ප්‍රථම මුද්‍රණය - 2023 ඔක්තෝම්බර්

පිටපත් කිරීම

ආර්. එම්. උමේෂා මංජලී බණ්ඩාර

අනුරාධා දෙල්ගොල්ල

නිමන්ත නිරෝධ

පිටකවරය සැකසීම

මදුසංඛ නවරත්න

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්

17/2 , පැඟිරිවත්ත පාර,

ගංගොඩවිල, නුගේගොඩ

011-2809499

පොත පිළිබඳව විමසීම්

නිමන්ත - 077 9 455 569

හරේන්ද්‍ර - 076 6 642 882

ප්‍රස්තාවනාව

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාරන ලද්දේ ලෝකයත් ලෝක සමුදයත් ලෝක නිරෝධයත් ලෝක නිරෝධගාමිනී ප්‍රතිපදාවත් දැන අවබෝධ කරගෙන සංසාර දුකින් එතෙර වීමේ ක්‍රමයකි. එය විවිධ ක්‍රමානුසාරයෙන් විවරණය කොට ඇති බව ත්‍රිපිටකය පුරා දක්නට හැකි ය. මෙහි දී තම ජීවිතය අවබෝධ කරගැනීම මගින් ලෝකය අවබෝධ කරගැනීමට හැකි ආකාරය දක්වා තිබීම සැබවින් ම විස්මයජනක ය. මෙතෙක් අනාවරණය කරගෙන ඇති ඉතිහාසය තුළ ලෝකය අවබෝධ කරගැනීම පිළිබඳ එබඳු විග්‍රහයක් දක්නට ලැබෙන්නේ බුදුදහම තුළින් ම පමණි. බුදුසමයට අනුව නම් මෙම ධර්මය බුදුපසේබුදු උතුමන් වහන්සේලාට පමණක් ස්වයංභූඥානයෙන් අවබෝධ කළ හැකි අතර සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකගෙන් ලොවට විවෘත වී ශ්‍රාවකයන් මගින් තව දුරටත් එය ව්‍යාප්ත වේ.

බුදුදහමෙහි එන ගැඹුරු විෂයික කරුණු අවබෝධ කරගැනීමෙහි ඇති දුෂ්කරතාව හේතුවෙන් ම දීර්ඝ කාලයක් තිස්සේ බොහෝ විට සරල දහම් කරුණු පමණක් වැඩි වශයෙන් සමාජයට විවෘත වූ බව පෙනේ. ස්කන්ධ, ධාතු, ආයතන, පටිච්චසමුප්පාද වැනි ගැඹුරු දහම් විවරණ සිදු වී ඇත්තේ විරල වශයෙනි. ආභිධර්මික කරුණු ඇතුළත් දේශනා පවා සම්පූර්ණ වශයෙන් ම අභිධර්මාර්ථ සංග්‍රහය සහ තත් පාදක කෘති ආශ්‍රයයෙන් සිදු වී ඇති බව දක්නට ලැබේ. එතුළින් චිත්ත, චෛතසික, රූප හා චිත්තවීථි වැනි ප්‍රස්තුත පිළිබඳ උගැන්වීම් හා ගණනය කිරීම්වලට සීමා වූ බුද්ධිමය හා ගණිතමය අධ්‍යයනයකට යොමු කෙරෙන බවක් හැරුණු කොට අභිධර්ම පිටකාගත, නිර්වාණය අභිමුඛ කරගත් විවරණ දක්නට නොලැබෙන තරම් ය.

දීර්ඝ කාලයක් මුළුල්ලෙහි ඒකාකාරී දේශනා ක්‍රමයක සිරවී සිටි යුගයක පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් බුදුදහමෙහි අතිගම්භීර ධර්ම විග්‍රහ පිළිබඳ සුනිපුණ විවරණ ඉදිරිපත් කිරීම මගින් ධර්ම දේශකයන් පරිවර්තනීය යුගයකට පමුණු වන ලද බව පෙනේ. ගැඹුරු දහම් අරුත් යටපත් වී තිබීම කෙතරම් ද යත්: දැනට වසර ගණනාවකට පෙර සුදස්සන ස්වාමීන් වහන්සේගේ දේශනාදිවියේ මුල් යුගයේ දී "පඤ්ච උපාදානස්කන්ධය සළායතන මගින් වර්තමානයෙහි ක්ෂණිකව උපදනා බව හා ව්‍යය වන බව" සඳහන් කරමින් පවත් වන ලද ප්‍රසිද්ධ දේශනයක් අරබයා ඇතමුන් දැඩි විවේචන ද එල්ල කරන ලදී. සළායතන ආශ්‍රයයෙන් ස්කන්ධ පහළ වන ආකාරය පිළිබඳ බෞද්ධ විවරණ ඒ තරමට ම යටපත් වී තිබෙන්නට ඇත. කෙසේ වුව ද දැන් තත්වය පෙරට වඩා වෙනස් බව දක්නට හැකි ය.

අතිගම්භීර බුද්ධදේශනා තත්වාකාරයෙන් අවබෝධ කිරීම හා දේශනා කිරීම පහසු දෙයක් නොවේ. ඒ සඳහා සාංසාරික පුරුද්දත් වර්තමානයේ සුභාවිතයත් අත්‍යවශ්‍ය වේ. එක් එක් අය එක ම දහම් කරුණක් අධ්‍යයනය කිරීමේ දී පවා වෙනස් අදහස් සමුදායක් මතු වනු පෙනේ. ඒවා සියල්ල ම නිවැරදි නොවුන ද ධර්මයෙහි ඇති ගැඹුරුබව හේතුවෙන් හා තේරුම් ගැනීමෙහි නානා භාවය හේතුවෙන් සැබෑ අර්ථය මතු කරගැනීම ද පහසු නැත. කෙසේ වුවත් සතර මහාඅපදේශ අනුව සහ නෙත්තිප්පකරණ පේටකෝපදේස ග්‍රන්ථාගත ක්‍රමවේද අනුව ධර්ම පර්යේෂණ කිරීම මගින් නිවැරදි ධර්මාර්ථ මතු කරගැනීමට ධීමත්හු යත්න දැරිය යුත්තාහ.

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සිදු කරන ලද ධර්ම දේශනා කිහිපයක් ආශ්‍රයයෙන් සකස් කොට ඇති මෙම ධර්ම ග්‍රන්ථය නිවන් දකිනු රිසියෙන් වෙසෙන සැදැහැවතුන්ට

මහඟු දායාදයක් වනු ඇත. මෙබඳු දහම් පොතපත කියවා දහම් දැනුම දියුණු කරගනිමින් නිවන් මග ගමන් කිරීමට සැමට උත්සාහය ඇති වේවා!

එසේ ම මේ සත්කාර්ය සඳහා කැප වී කටයුතු කළ නිමන්ත නිරෝධ මහත්මා සහ ලක්ෂ්මන් සිල්වා මහත්මා ඇතුළු සැමටත් මුද්‍රණ කාර්ය මැනවින් සිදු කර දුන් කොලිටි ප්‍රින්ටර්ස් ආයතනයේ සැමටත් දේශකයන් වහන්සේටත් දෙලොව යහපත සහ නිවන්සුව අත්වේවා!

මෙයට,

ශාසනස්ථිතිකාමී,

ආචාර්ය, රාජකීය පණ්ඩිත

පූජ්‍ය මාන්කඩවල නන්දරතන ස්ථවිර

සංස්කාරකගෙන් පණිවිඩයක්

සමාජය පුරා හතු පිපෙන්නාක් මෙන් ධර්ම විකෘතීන් පැතිර යන මෙවන් සමයක සුපිරිසිදු සම්බුද්ධ දේශනාව ලෝකය තුළ පැවැත්වීමට කටයුතු කරන ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසනවාසී අප ගුරු දේවෝත්තමයන් වහන්සේලා වන පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, පූජනීය මාන්කඩවල නන්දරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, පූජනීය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන්ද්‍රයන් වහන්සේටත් මෙම ධර්ම ග්‍රන්ථය තුති පූජාවක් ම වේවා!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් වසර ගණනක් පුරා ත්‍රිපිටකය, අටුවාව පරිශීලනයෙන් ලබා ගත් ලෝකෝත්තර අර්ථයන් මතු කෙරෙන ගම්භීර ධර්ම දේශනා නවයකින් මෙම ධර්ම ග්‍රන්ථය සම්පාදනය කොට ඇත. පූජනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේ දෙනම විස්තර කෙරෙන දහම් කරුණු කෙතරම් දුරට ත්‍රිපිටකානුලෝම ද යන කාරණාව ඔබට ද ත්‍රිපිටකය හා සසඳා බලා ස්වයං අධ්‍යනයක යෙදිය හැකි ආකාරයෙන් මෙම සුවිශේෂී ධර්ම ග්‍රන්ථය සකසා ඇත. එනිසා ධර්මය අධර්මය වෙන් කොට ගෙන ඔබේ නිවන් මඟ සකසා ගැනීමට මෙම ධර්ම ග්‍රන්ථය කදිම උපකාරයක් වන බව අපගේ විශ්වාසය යි.

දම් පිපාසාවෙන් පෙළෙන සැදැහැවත් බෞද්ධ ඔබ වෙනුවෙන් මෙම ග්‍රන්ථය මුද්‍රිත මාධ්‍යයෙන් මෙන් ම PDF ආකාරයෙන් ද ලබා ගැනීමට හැකි පරිදි කටයුතු සම්පාදනය කර ඇති බව මහත් සතුටකින් යුතුව දැනුම් දෙමි. මෙහි මුද්‍රිත මාධ්‍යයෙන් දොරට වඩින ග්‍රන්ථයේත්, PDF වශයෙන් නිකුත් වන ග්‍රන්ථයේත් ධර්ම දේශනාවන්ට අදාළ සූත්‍ර දේශනාවන්ගේ සබැඳීන් දක්වා ඇති අතර PDF ග්‍රන්ථය භාවිතා කිරීමෙන් ඉතා පහසුවෙන් ත්‍රිපිටකයේ අදාළ සූත්‍ර දේශනාව පරිශීලනය කළ හැකිය. එනිසා ඔබට මෙම ධර්ම ග්‍රන්ථය අමාරස වෑහෙන ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය කියවීමට යොමු කරවන කළ්‍යාණ මිත්‍රයෙක් වන බව නොඅනුමානය.

බොහෝ කල් සිට සිහිනයක්ව පැවති මෙම උතුම් ධර්ම ග්‍රන්ථය සම්පාදනය වෙනුවෙන් දින සති මාස ගණන් බොහෝ වෙහෙස වී සෝදුපත් බැලීමෙන් හා දේශනා පිටපත් කිරීමෙන් සහාය වූ ආර්. එම්. උමේෂා මංජලී බණ්ඩාර මහත්මියට හා අනුරාධා දෙල්ගොල්ල මහත්මියටත් පිටකවරය සකසා දුන් මදුසංඛ නවරත්න මහතාටත්, ධර්ම ග්‍රන්ථය මුද්‍රණය වෙනුවෙන් නොමසුරු මුල්‍යමය දායකත්වය ලබා දී එම සිහිනය යථාර්ථයක් බවට පරිවර්තනය කර දුන් ලක්ෂ්මන් සිල්වා මහතා ඇතුළු සියලු කළණ මිතුරන්ටත් මෙම උතුම් ධර්ම දානමය කුසලය නිවනෙන් නිවීම පිණිස ම හේතු වාසනා වේවා!

මෙම ග්‍රන්ථය සම්බන්ධ අදහස්, යෝජනා, චෝදනා, විවේචන වෙතොත් අප වෙත nimantha.nirodha@hotmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කරන මෙන් මෙත් සිතින් යුතුව දන්වා සිටිමි. මෙම ධර්ම ග්‍රන්ථය සංස්කරණයේ දී මා අතින් යම් වරදක්, අතපසු වීමක් සිදු වී ඇත්නම් ඒවා මා කරාම ඒවා. ගුණයක් වේ නම් මාගේ ගුරු දෙවිවරු කරාම යේවා. අවසාන වශයෙන් තථාගතයන් වහන්සේ විසින් දේශිත සූත්‍ර පාඨයක් මෙසේ සටහන් කර මාගේ සටහන නිමා කරමි.

“තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද ගැඹුරු වූ අරුත් ඇති ලොවුතුරා අරුත් දැක්වෙන ශූන්‍යතා ධර්මය පැවසෙන යම් ඒ සූත්‍රාන්ත කෙනෙක් වෙද්ද, ඔවුන් දේශනා කරනු ලබන කල්හි අසනු කැමති වන්නෙමු. කන් යොමු කරන්නෙමු. අවබෝධය පිණිස සිත එළවන්නෙමු. ඒ දහම් ම උගත යුතුය යි, පිරිවැහිය යුතු ය යි සිතන්නෙමු යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැ යි”

(ආණි සූත්‍රය - සංයුත්ත නිකාය 2)

මෙයට,
නිමාන්ත

සිහිපත් කිරීමක්

අති පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ, අතිපුජනීය මාන්කඩවල නන්දරතන ස්වාමීන් වහන්සේ, අති පූජනීය කොත්මලේ කුමාරකස්සප ස්වාමීන් වහන්සේ ඇතුළු ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසන වාසී පූජනීය ස්වාමීන් වහන්සේලාගේ ධර්ම ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට

සති TV Youtube නාලිකාව

https://www.youtube.com/@SathiTVofficial

පරමත්ථ Youtube නාලිකාව

https://www.youtube.com/@paramaththa-labunoruwakand2329

“සවාකඛාතෙ භිකඛවෙ ධම්මවිනයෙ යො ච සමාදපෙති, යඤච සමාදපෙති, යො ච සමාදපිතො තථතතාය පටිපජජති, සඛෙඛ තෙ බහුං පුඤඤං පසවනති. තං කිසස හෙතු: සවාකඛාතතතා භිකඛවෙ ධම්මසසාති”.

“මහණෙනි, මා විසින් මනා කොට දේශනා කරන ලද මේ ස්වක්ඛාත වූ ධර්ම විනය කෙරෙහි යමෙක් යොමු වෙත් ද, යමෙකු යොමු කරවත් ද, යොමු වූ යමෙක් එහි පිළිවෙත් පුරත් ද, ඒ සියල්ලෝ ම බොහෝ පින් රැස් කර ගනිති. ඒ මක් නිසා ද යත්, මහණෙනි, මේ ධර්මය මා විසින් මනා කොට දේශනා කොට ඇති බැවිනි”

(ස්වක්ඛාත සූත්‍රය - ඒකධම්මපාළි - අංගුත්තර නිකාය 1)

පුණ්‍යානුමෝදනාව

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.06.03 පොසොන් පොහොය දින සති TV නාළිකාව ඔස්සේ සිදු කරන ලද ධර්ම දේශනාව ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"තසමාතිහ භික්ඛවෙ, මා අගොචරෙ චරිත්ථ පරවිසයෙ. අගොචරෙ භික්ඛවෙ, චරතං පරවිසයෙ ලච්ඡති මාරෝ ඔතාරං, ලච්ඡති මාරෝ ආරම්මණං" [1]

සදා පූජනීය වන්දනීය මහා සංඝරත්නයෙන් අවසරයි. ශ්‍රද්ධා බුද්ධි සම්පන්න කාරුණික පින්වතුනි, මේ පින්වත් සියලු දෙනා ම දැන් මේ සූදානම් වෙන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අපි සියලු දෙනා කෙරෙහි ම මහත් වූ කරුණාවෙන් දේශනා කළ සසර දුක් ගිනි නිවීම පිණිස පවතින සද්ධර්මයෙන් බිඳක් ශ්‍රවණය කරන්න.

ඒ නිසා හැමදෙනා ම ඉතාමත් ම ඕනෑකමෙන් ඉතාමත් ම උවමනාවෙන් අද දවසේ දී මෙම දේශනාව ශ්‍රවණය කරන්න කියලා මතක් කරනවා. විශේෂයෙන් ම මේ දුක් සහගත සසර නිමා කර ගන්න වෙර වීරිය වඩන, සසර දුක ගෙවා ගන්න උවමනා කරන, ඒ ශ්‍රද්ධාවන්ත සියලු දෙනාට ම සසර ගමන අවසන් කර ගන්න පුළුවන්වන ඉතාමත් ම වටිනා දහම් කරුණු ටිකක් මේ දේශනාව තුළින් කියලා දෙන්නට බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් ම අද දවස ගත්තහම ලංකාවාසී බෞද්ධ අපිට බොහෝ ම වැදගත් දවසක්. ඒ මීට අවුරුදු දෙදහස් තුන්සිය ගණනකට පෙර මිහිඳු මහරහතන් වහන්සේ අපි කෙරෙහි අනුකම්පාවෙන් ලංකාද්වීපයට වැඩම කරලා ඒ අමා මෑණි බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය දේශනා කරලා මේ ලංකා ධරණී තලයේ සද්ධර්මය පිහිටවලා අපිට අනුග්‍රහය දක්වපු දවසක්.

[1] https://tipitaka.lk/sn-5-3-1-6 - **සකුණග්ඝි සූත්‍රය- අම්බපාලි වර්ගය- සතිපට්ඨාන සංයුක්තය- සංයුත්ත නිකාය 5 - 268 පිටුව**

ඉතින් මම හිතනවා, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දුක් සහගත සසර ගෙවා ගැනීම පිණිස පෙන්වපු මාවත, මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කරලා අපිට පෙන්නුව අද වගේ දවසක වසර දෙදහස් තුන්සිය ගණනක් ගත වුවත් ඉතාමත් ම වටිනා එබඳු ම වූ ඒ පණිවිඩය ලැබෙන දවසක් වේවි අද දවස කියලා.

ඒකෙන් මම මතක් කළේ වර්තමානය තුළ බොහෝ දෙනෙක් ධර්ම ශ්‍රවණය කරනවා, භාවනා කරනවා දුක් සහගත සසර නිමා කර ගන්නට නොයෙක් විදිහේ වෙර වීර්යය කරනවා. නමුත් අපිට පෙනෙනවා මේ පින්වතුන් ධර්මය අහලා, නුවණින් හිතලා, වෙර වීර්යය කරන තරමට ආධ්‍යාත්මික සංසිඳීමක් අද දවසේ දී මේ ශාසන වටපිටාව තුළ ලැබෙන්නේ නැහැ කියලා.

ඉතින් ඒ නිසා ගිහි පින්වතුන් වගේ ම අපේ පින්වත් ස්වාමීන් වහන්සේලා අතරත් වාද විවාද තර්ක විතර්ක මතුවෙනවා. එහෙම මතුවෙන්නේ කෙනා කෙනා තම තමන් යම් මට්ටමක හෝ දහමක් තුළ හැසිරෙනවා නම් ඒ හැසිරෙන පමණට හෝ තමන් තුළ ආධ්‍යාත්මික සංසිඳීමක් නොලැබෙන නිසයි. එහෙම ආධ්‍යාත්මික සංසිඳීමක් ලැබෙනවා නම්, මේ තරම් වාද විවාද තර්ක විතර්ක ඇතිවෙලා මේ වගේ අර්බුදකාරී වටපිටාවක් ලැබෙන්නේ නැහැ.

ඉතින් අද දවසේ දී ඒකාන්තයෙන් ම සසර දුක ගෙවාගන්නට බලාපොරොත්තුවන ශ්‍රද්ධාවන්ත පින්වතුන් හට ආධ්‍යාත්මික සංසිඳීමක් ඇතිවෙන, සසර ගෙවාගන්නට ඉවහල්වන නියම ප්‍රතිපදාව එළිපෙහෙළි කර ගන්නට පුළුවන් වෙයි කියලා මම හිතනවා.

අපි සාමාන්‍යයෙන් දන්නේ, කතා කරන්නේ මේ ලංකා ධරණී තලයේ පහළ වෙච්ච අන්තිම මහ රහතන් වහන්සේ මලියදේව මහ රහතන් වහන්සේ හැටියට. ඊට පස්සේ රහතන් වහන්සේ නමක් මේ ශාසනයේ පහළ වෙච්ච බවක්, ලෝකයේ වැඩ හිටිය බවක් පෙනෙන්නට නැහැ.

කොහොම හරි අවුරුදු දහස් ගණනක් මේ දක්වා ගලාගෙන ආපු මේ ශාසනයේ පෙළ දහම ගත්තහම ඉතාමත් නිරූපද්‍රිතව, මනා කොට ම පෙළ දහම පවතින බව මතක් කරන්නට පුළුවන්. එහි අඩුපාඩුවක්, ගිලිහුණු බවක් මම දකින්නේ නැහැ. දුක් සහගත සසරෙන් එතෙර වෙන්න අවශ්‍ය පණිවිඩය ඒ පෙළ දහම තුළ පවතිනවා.

නමුත් එම පෙළ දහම තුළ පවතින ධර්මයේ අර්ථය කාලයත් එක්ක වැහිලා, ඊට පස්සේ එහි අර්ථය මතු කර ගන්න වෙර වීර්යය දරන ලෝකය තුළ හරියට ම ඒ ධර්මයේ අර්ථය මතු වෙච්ච බවක් පෙනෙන්නේ නැහැ මට.

මොකද මම එහෙම මතක් කරන්නේ, ***"අපථමඤ්ඤඳාය ධම්මමඤ්ඤඳාය ධම්මානුධම්මපටිපන්නො හොති"*** [2], ධර්මය දැනගෙන ධර්මයේ විදිහට අර්ථය තේරුම් ගන්නට ඕනේ. අර්ථය බලාගෙන තමයි ප්‍රතිපත්තිය තියෙන්නේ. ප්‍රතිපත්තිය අනුව තමයි ප්‍රතිවේදය තියෙන්නේ.

යම් වෙලාවක පෙළ දහම තුළ පෙන්වන අර්ථය වැරදුනොත් ඒකෙන් ප්‍රතිපත්තිය වරදිනවා. ප්‍රතිපත්තිය වැරදුනොත් ප්‍රතිවේදය නැතහොත් මාර්ගඵල වරදිනවා. අද මේ ශාසනයේ ප්‍රතිපත්තියේ යම් අඩුවක් වෙලා තියෙන බව මට තේරෙනවා. මොකද, ආධ්‍යාත්මික සංසිඳීමක් ඇති කර ගත්ත උත්තමයන්ගේ නැතහොත් දහම තුල යෙදෙන කෙනා කෙනාගේ මනස් තුළ ආධ්‍යාත්මික සංසිඳීමක් ඇතිවෙලා දහම තුළින් නිවිලා සැනසෙන ගතියක් නොපෙනෙනවා නම්, ඒ අඩුව තියෙන්නේ ප්‍රතිපත්තිය තුළ යි.

ප්‍රතිපත්තිය තුළ අඩුවක් තියෙනවා නම් අඩුවක් තියෙන්නේ ඒ ප්‍රතිපත්තියේ හැසිරෙන්න දහම තුළින් ලබා ගත්ත අර්ථයේ තියෙන අඩුවක් නිසයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එදා පරිනිර්වාණ මඤ්චකයේ ඉඳගෙන **"සුභද්ද, මනා කොට පිළිවෙත් පිරුවොත් මේ ලෝකය රහතුන්ගෙන් කවදාවත් හිස් වෙන්නේ නැහැ"** [3] කියලා.

---

[2] https://tipitaka.lk/an-8-2-3-8 - **අලං සූත්‍රය- යමක වර්ගය- දෙවන පණ්ණාසකය- අඞ්ගුත්තර නිකාය 5- 326 පිටුව**

[3] https://tipitaka.lk/dn-2-3/sinh - **මහාපරිනිර්වාණ සූත්‍රය- දීඝ නිකාය 2- 237 පිටුව**

එතකොට ලෝකය රහතුන්ගෙන් හිස් වෙන්නේ නැත්නම්, නමුත් අද දවසේ දී රහතුන්ගෙන් අඩුවක් තියෙනවා නම් කොතනක හරි ප්‍රතිපදාවේ අඩුවක් ඇති. එතකොට ප්‍රතිපදාව කිවුවහම අපි තේරුම් ගන්නට ඕනේ සීලය විතරක් එහෙම නෙවෙයි.

ස්වාමීන් වහන්සේලා හෝ ගිහි පින්වතුන් ඇත්තට ම බොහෝ ම ආදරෙන් සකසා මනා කොට සිල්වත් වෙනවා වෙන්ට පුළුවනි, සිල්වත් ඇති. නමුත් සීලය මනා කොට තිබුණු පමණකින් ප්‍රතිපදාව ම නිවැරදි වෙන්නේ නැහැ. මොකද, මේ දුක නැති කරන මාවත සීල, සමාධි, ප්‍රඥා කියන ත්‍රිශික්ෂාවකින් යුක්ත නිසා.

අන්න ඒ ප්‍රතිපදාවේ කොතනක හරි වැරැද්දක් තියෙන නිසයි රහතුන්ගෙන් හිස් වෙන්නේ කියන කාරණාව අපිට පැහැදිලි යි. පෞද්ගලිකව මම කල්පනා කරපු දෙයක් තමයි, අපි වුණත් පෙළ දහමට අනුව දර්ශනය මතු කරලා අරගෙන දේශනා කරනවා. ඇත්තට ම ඒ දර්ශනය තුළ යථාභූත ස්වභාවය මැනවින් කැටි වෙලා පවතිනවා. ඒ තුළ කිසි ම දෝෂයක් නැහැ.

නමුත් ඒ තරම් ධර්මයක් අහලා, ධර්මයක් දන්න මේ පුද්ගල සන්තානවල සංසිඳීමක් දකින්නේ නැහැ. ඒ වගේ ම ලෝකයේ අපි දේශනා කරන දර්ශනාත්මක පැත්ත තබලා තව අපේ පින්වත් ස්වාමීන් වහන්සේලා, ගිහි පින්වතුන් නොයෙක් නොයෙක් පර්යායන්ගෙන් මේ ධර්මය පෙන්නනවා. ඒ ධර්මය වුණත් අහලා හැසිරෙන ඒ පින්වතුන්ගේ ආධ්‍යාත්මික චිත්ත සන්තානවල සංසිඳීමක් ඇතිවෙන බවක් පෙනෙන්නටත් නැහැ.

ඉතින් මේ කාරණා ඇයි මෙහෙම වෙන්නේ කියන අදහසක් මට තිබුණා. පහුගිය කාල වකවානුවේ දී මම බොහෝ සෙයින් ධර්ම දේශනා කරන එක ටිකක් නතර කරලා පිටකයත් ළඟ තබාගෙන හොඳට භාවනා කරමින් මේ ප්‍රශ්නය මොකක්ද, කොතනද අඩුපාඩුව, කොතනද වැරැද්ද කියන කාරණාව හෙව්වා.

මට බොහොම සතුටුයි මතක් කරන්නට, විශේෂයෙන් ම ලංකාවට බුද්ධ ශාසනය පැමිණි අද වගේ දවසක නැවත සම්බුද්ධ ශාසනය ප්‍රකෘතිමත් වෙන්න පුළුවන් ඒ ප්‍රතිපත්තිය තුළ තියෙන අඩුව මොකක්ද කියලා හොයා ගන්නට පුළුවන් වුණා. අන්න ඒ අඩුව මොකක්ද කියන කාරණාව මං අද පැහැදිලි කරනවා.

ඒ හින්දා ඉතාමත් ම උවමනාවෙන්, ඕනෑකමින් මේ දේශනාව ශ්‍රවණය කරන්න. ඉතාමත් ම උවමනාවෙන්, ඕනෑකමින් ශ්‍රවණය කළොත් මේ පින්වතුන්ට මම හිතන්නේ මේ ජීවිතයේ දී ම තමන්ගේ නිවීම, තමන්ගේ මිදීම හඳා ගන්නට පුළුවන් දිට්ඨධම්ම සුඛ විහරණයක්, දිට්ඨධම්ම ව ම සැපසේ වාසය කරන්න පුළුවන් වටපිටාවක් ගිහි ජීවිතයේ වේවා, පැවිදි ජීවිතයේ වේවා හඳා ගන්න පුළුවන් වටිනා දහම් පරියායක්, ධර්මයේ අර්ථයක් තේරුම් කර ගන්නට පුළුවන් වෙයි.

පින්වතුනි, විශේෂයෙන් ම අද මම මේ ධර්ම දේශනාව සඳහා මාතෘකා කළේ, බුදුරජාණන් වහන්සේ අප වෙනුවෙන් අනුකම්පාවෙන් දේශනා කළ ත්‍රිපිටක ධර්මයේ සංයුක්ත නිකායේ පස්වෙනි කාණ්ඩයේ සතිපට්ඨාන සංයුත්තයේ එන 'සකුණග්ඝි සූත්‍රය'. 'සකුණග්ඝි' කියලා කියන්නේ උකුස්සකුට නැත්නම් ගිජුලිහිණියෙකුට. මම ඒ සූත්‍රයේ අදහස කෙටි කරලා, කැටි කරලා මතකයෙන් දේශනා කරන්නම්.

~ උකුස්සෙකු හා කැටකුරුල්ලෙක් අතර කතාවක් ~

එක්තරා අවස්ථාවක කැට කුරුල්ලෙක් (වී කුරුල්ලෙක්) ගලක් උඩ අව්ව තපිමින් ඉන්න කොට අහසින් යන ගිජුලිහිණියෙක් වේගයෙන් ඇවිල්ලා මේ කැටකුරුල්ලා ව ඩැහැගෙන යනවා. ඩැහැගෙන යන කොට කැටකුරුල්ලා තමන්ට ම දොස් කියා ගන්නවා, "මම, මට සුදුසු නැති තැන හිටපු නිසා, මට අයිති තැන හිටපු නැති නිසයි මම මේ ගිජුලිහිණියාට අහුවුණේ. මෙහි වරද මගේ ම යි" කියලා තමන්ගේ වරදින් ම තමන් දුකට පත් වුණා නේද කියලා

තමන්ට ම දොස් කියා ගන්නවා. එතකොට තමන්ගේ බලයේ අධික මහන්තත්ත්වයෙන් යුක්ත මේ ගිජුලිහිණියා අහනවා, "මොකද උඹ උඹට ම බැන ගන්නේ?" කියලා.

සාමාන්‍යයෙන් අපිට යම්කිසි කෙනෙක් දුකක් පීඩාවක් කරදරයක් කළොත්, තව කෙනෙක් නිසා දුකක් පීඩාවක් කරදරයකට පත් වුණොත් අපි, බනින්නේ බොහෝ වෙලාවට අපිව පීඩාවට පත් කරන, අපිව මරන්න, අපිට ගහන්න එන කෙනාට නේ. ඉතින් මරන්න ගෙනියන ගිජුලිහිණියාට බනින්නේ නැතුව තමන්ට ම බැන ගන්නේ ඇයි කියලා ගිජුලිහිණියා ඇහුවා කැටකුරුල්ලාගෙන්.

එතකොට කැටකුරුල්ලා කියනවා, "මම පියාගෙන් උරුම වෙච්ච මට අයිති භූමියේ ඉන්නෙ නැතුව, මට නුසුදුසු තැන වාසය කරපු නිසයි මම උඹට අහුවුණේ. ඒ නිසා මෙහි දෝෂය කාගෙවත් නෙවෙයි මගේ ම යි" කියලා. ඊට පස්සේ මේ ගිජුලිහිණියාත් බොහො ම මාන්නයෙන් අහනවා, "හරි, උඹට අයිති භූමිය මොකක් ද"? එතකොට කැටකුරුල්ලා කියනවා, "කුඹුරුවල හාලා කැට නැගපු කැට තියෙන කුඹුරු තමයි මට ජීවත් වෙන්න සුදුසු කියලා."

"හරි, මම නුඹව එතනට ගිහිල්ලා දානවා. ඒ දැම්මත් මම නුඹව අල්ලනවා" කියලා බොහො ම මාන්නයෙන් ගිජුලිහිණියා කියනවා. එතකොට කැටකුරුල්ලා හා කියලා කියනවා. ඊට පස්සේ මේ ගිජුලිහිණියා කැටකුරුල්ලාව කැට සහිත කුඹුරකට අතහැරලා උඩට යනවා.

කැටකුරුල්ලාගේ ක්ෂේත්‍රය නේ කැට සහිත කුඹුර. තමන්ට අයිති තැන තමන්ට ආරක්ෂා වෙන්න පුළුවන් තැනක් හොඳට බලාගෙන කැටයක් උඩට නැගලා ගිජුලිහිණියාට කියනවා "හරි, දැන් ඇවිල්ලා මාව අල්ලන්න" කියලා. ඊට පස්සේ ගිජුලිහිණියා තමන්ගේ බලයේ මහන්තත්ත්වයෙන් "ඕනෑ ම තැනක හිටියත් මම උඹව අල්ලනවා" කියන අදහසින් වේගයෙන් පියාඹලා මේ කැටකුරුල්ලා ගාවට එන්න ආවා.

ගිජුලිහිණියා බොහෝ දුරක් ආවා කියලා දකින කොට ම කැටකුරුල්ලා තමන්ගේ වාසස්ථානය වූ කැටයක් ඇතුළට හෙමින් රිංග

ගත්තා. කැටකුරුල්ලා අල්ලගන්න ආපු ගිජුලිහිණියා කැටකුරුල්ලාව අල්ලගන්න බැරුව ආපු වේගයෙන් බිම ඇනිලා ලය පැලිලා එහෙම ම මැරුණා කියලා පෙන්වනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා "මහණෙනි, පෙර වූවක් කියමි" කියලා පෙර වූ සිද්ධියක් මේ පෙන්වන්නේ.

~ මාර භූමිය හා පියා සතු ඉඩම ~

ඒක උපමා කරලා පෙන්වනවා, "මහණෙනි තමන්ට අයිති නැති, තමන්ට අගෝචර, අනුන්ට අයත් භූමි භාගයේ හැසිරුණා නිසයි කැට කුරුල්ලා ගිජුලිහිණියාට හසුවුණේ. *''තසමාතිහ භික්ඛවෙ, මා අගොචරෙ චරිත්ථ පරවිසයෙ''* - "ඒ හින්දා මහණෙනි, තමන්ට අගෝචර වූ අනුන්ට අයත් විෂයෙහි හැසිරෙන්නට එපා".

"අගොචරෙ භික්ඛවෙ, චරතං පරවිසයෙ ලච්ඡති මාරො ඔතාරං, ලච්ඡති මාරො ආරම්මණං". "මහණෙනි, අනුන්ට අයත් අගෝචර භූමියේ හැසිරුනොත්, මාරයා අරමුණු ලබනවා, මාරයාට නුඹලාව පේනවා, මාරයාට නුඹලා ගාවට එන්නට ඉඩ තියෙනවා. ඒ කියන්නේ "ජරා මරණයෙන් කවදාවත් නුඹලා මිදෙන්නේ නැහැ" කියලා පෙන්වනවා.

"මහණෙනි කැටකුරුල්ලාට අගෝචර වූ භූමිය වගේ, මහණෙනි, නුඹලාට අගෝචරය කුමක්ද"? නිවන් දකින්න බලාපොරොත්තුවන කෙනෙකුට, මේ ශාසනයේ ඉන්න කෙනෙකුට අගෝචර වූ අනුන්ට අයත් වූ ප්‍රදේශය මොකක් ද කියලා බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගෙන් අහලා ඒ ගැන විස්තර කරනවා.

"මහණෙනි ඇහෙන් දතයුතු මන වඩන ප්‍රිය වූ මනාප වූ කාමය ඇති කළ හැකි රූප තියෙනවා. රූප වගේ ම, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, කියලා මෙන්න මේ පංච කාම ගුණ ටිකේ අපි වාසය කරනවා නම්, ඒවා

ඇසුරු කර ගෙන ජීවත් වෙනවා නම් මේක තමයි අනුන්ට අයත් අගෝචර භූමියේ අපි වාසය කරනවා කියලා කියන්නේ.

කැමැත්ත හෝ අකමැත්ත හෝ කියන කතාව පැත්තකින් තැබේවා. අනුන්ට අයත්, අගෝචර භූමිය තමයි රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ කියන මෙන්න මේ කාමය ඇති කරන්න හිත වූ පංචකාම ගුණ ධර්මයන්. මෙන්න මේ පංච කාම ගුණයන් ඇසුරු කර ගෙන හිටියොත් මාරයා අපි කෙරෙහි අරමුණක් ලබනවා. මාරයා අපි කෙරෙහි අවකාශයක් ලබනවා.

ඒ කියන්නේ මාරයාට අපිව පෙනෙනවා. අපිට මාරයාව පෙනෙන්නේ නැහැ. එතකොට අපිට මාරයා අනුව යන්නට ම වෙනවා. එතකොට ජරා මරණ දුකෙන් නොමිදෙනවා කියන කාරණාවයි පෙන්නුවේ.

ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ අහනවා *"ගොචරෙ නිකඛමෙ, චරථ සකෙ පෙතතිකෙ විසයෙ."* - "මහණෙනි, සිය පියාගෙන් උරුම වෙච්ච ගෝචර භූමියේ හැසිරෙන්න. මහණෙනි නුඹලාට පියාගෙන් උරුම වෙච්ච ගෝචර භූමිය කුමක් ද?" "මේ සතර සතිපට්ඨානය යි" කියලා පෙන්වනවා.

මේ පෙන්වන දහමේ දී අතිශය වටිනා ඉතාමත් ශ්‍රේෂ්ඨ අර්ථයක් තියෙනවා. අපිට විතරක් නෙවෙයි මුළු ලෝකෙට ම අද දවසේ දී නිවන් මඟ වැරදිලා තියෙන්නේ මෙන්න මෙතනින්. අද මම මේ පෙන්නන්න ටික ඉතාමත් හොඳට අහලා තේරුම් ගන්න උත්සාහවත් වන්නට ඕනේ.

එතකොට නිවන් දකින්න සුදුසු කෙනෙකුට ගෝචර භූමිය කුමක්ද, පියා සතු ඉඩම මොකක් ද? මෙන්න මේ සතර සතිපට්ඨානය යි. සතර සතිපට්ඨානයේ වාසය කරන කොට, *"න ලච්ඡති මාරෝ ඔතාරං, න ලච්ඡති මාරෝ ආරම්මණං."* මාරයා ඉඩක් ලබන්නේ නැහැ. මාරයා නුඹලා කෙරෙහි අරමුණක් ලබන්නේ නැහැ කියලා පෙන්වනවා.

ඒ කියන්නේ මාරයාගේ නොදැක්මට යනවා. ජරා මරණයෙන් මිදෙනවා, අජරාමර වෙනවා, නිවන් දකිනවා කියන කාරණාව පෙන්නුවා. එතකොට ඒ සතර සතිපට්ඨානය වඩන්නේ කොහොම ද? ඒක වඩන්නේ ඇයි? කියන කාරණාව මම අද දවසේ දීත් බොහො ම කෙටියෙන් ටිකක් මතක් කරන්නම්.

~ සතර සතිපට්ඨානය වැඩීමට පෙර දත යුතු දේ ~

සතර සතිපට්ඨානය කියලා කියන්නේ දුක්ඛ සත්‍යය, දුක්ඛ සමුදය සත්‍යය, දුක්ඛ නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය කියන චතුරාර්ය සත්‍යයේ මාර්ග සත්‍යයට අයිති ධර්මතාවයක්. එතකොට එයා ඒ දුක නැති කරන මාර්ගය වඩන්න කලින් දුක කියන්නේ මොකක් ද? දුක ඇතිවෙන හේතුව මොකක් ද? ඒ හේතුව නැති කළොත් දුක නැති වෙනවා කියලා දැනගෙන තමයි මාර්ගය කියන එක පුරන්නේ, වඩන්නේ.

අපි අද දවසේ දීත් පොඩ්ඩක් මතක් කරමු, සතිපට්ඨානය වඩන්න හේතු පාදක වෙන්නේ මොකක් ද, ඇයි අපි සතර සතිපට්ඨානයෙන් වාසය කරන්න ඕනේ කියන එක ගැන. මගේ දේශනාවේ මූලික හරය මෙතන නෙවෙයි. අද ඔයගොල්ලන්ට විශේෂයෙන් බර කරලා විශේෂ නිමිත්තක් කොට පනවන කොටසක් තියෙනවා.

දැනට මේ ටික දැනුමට තියා ගන්න. මේ කොටසත් අවශ්‍ය යි, මේ කොටස නුවණින් දත යුතුයි. තව අවශ්‍ය ම අවශ්‍ය කොටසක් තියෙයි ඉස්සරහට. ඒ අවශ්‍ය ම අවශ්‍ය කොටස මේ කරුණු ටිකෙන් පස්සේ මම ඉදිරියේ දී පෙන්වන්නම්. අන්න ඒ ටිකට හොඳට සිහිය යොමු කරලා තේරුම් අරගන්ට ඕනේ. ඒ තුළ තමයි අපිට හැසිරෙන්නට පුළුවන්කම තියෙන්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, **“ඉපදීම කියන්නේ ද දුකක්. ලෙඩවීම ද දුකක්. මහලු බව ද, මරණය ද, අප්‍රියයන් හා එක්වීම,**

ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති බලාපොරොත්තුවන දේ නොලැබීම ද දුකක්. කෙටියෙන් කියනවා නම් පංච උපාදානස්කන්ධය දුකයි [4] කියලා.

දුක්ඛ සත්‍යය පෙන්නන කොට පින්වතුනි, විශේෂයෙන් ම අපේ නුවණා යන්න ඕන කාරණාවක් තියෙනවා. තමන් නොදන්නා වූ, නොදක්නා වූ තමන්ට පරිබාහිර ලෝකයේ තියෙන පංච උපාදානස්කන්ධයක් දකින්න එපා. පංච උපාදානස්කන්ධය කියලා කියන්නේ උපාදානයට හිත වූ ස්කන්ධ පංචකයට.

උපාදානයට හිත වූ රූපය, වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය දුකක්. එතකොට උපාදානයට හිත වූ ස්කන්ධයෝ දුකක්. ඒකෙන් මතක් කරන්නේ තමන්ගෙන් පරිබාහිර දෙයක් දකින්න එපා. බුදුරජාණන් වහන්සේ පංච උපාදානස්කන්ධ ලෝකයකට යි ධර්මය දේශනා කරන්නේ.

කෙනා කෙනා තමන් තමන්ව දත යුතුයි. කෙනා කෙනාටයි බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන්නේ. *"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"* කියන කොට තම තමන්ගේ උපාදානයට හසු වූ ස්කන්ධයෝ දුකක් කොට දකින්න.

<u>පංච උපාදානස්කන්ධය දුකක් කියන්නේ ඇයි?</u>

අපි උපමාවක් කළොත්; කනබොන බත්, පාන්, කව්පි, මුං ඇට කියන අනාත්ම වූ ආහාරයෙන් හැදෙන, පඨවි ධාතුව හා සමාන කෙස්, ලොම්, නිය, දත්, සම් කියන තද ගතියෙන් යුක්ත කොටස් තියෙන, ආපෝ ස්වභාවයෙන් යුක්ත පිත, සෙම, සැරව, ලේ, දහඩිය තියෙන අනාත්ම වූ සතර මහා ධාතු රූප මිටියක් ඇස් ඉදිරිපිටට එන කොට මට 'අම්මා' කියලා හිතෙනවා. මට 'අම්මා' කියලා පෙනෙනවා.

[4] https://tipitaka.lk/an-6-2-1-9/sinh - **නිබ්බේධික සූත්‍රය- මහා වර්ගය - ඡක්කනිපාතය- අඞ්ගුත්තර නිකාය 4- 209 පිටුව**

‘රූපය සත්ත්වයෙක්/ ආත්මයක්’ ආදී විසි ආකාර සක්කාය දිට්ඨියෙන් කුමන හෝ ආකාරයකට හිතනකම ‘අත්තවාද උපාදානය’ [5]. රූපය අම්මා’ හැටියට හිතනකම මගේ මනසේ තියෙන ‘කාම උපාදානය’. ‘රූපය කර්මානුරූපව පැමිණි තවත් සත්ත්වයෙක් ආදී යම් ම මිථ්‍යා දිට්ඨික හැඟීමක් මට තියෙනවා නම් ඒ ‘දිට්ඨි උපාදානය’. එතකොට ‘රූපය පුද්ගලයෙක්’ කරලා, ‘අම්මා’ කරලා පෙන්නනකම තමයි මං ගාව තියෙන උපාදානය.

මගේ උපාදානයට හසුවෙච්ච ඒ රූපය මට දුකක් කියනවා. අපි ඕක ගැන පර්යේෂණයක් කරලා බලමු. ඔය රූපය ම ටීවී එකක හෝ තිබුණොත් ටීවී එක දිහා බලන කොට මට හිතෙයි ‘අම්මා’ වගේ. මම ඒ රූපය දිහාත් බලයි, ‘අම්මා මෙතන ඉන්නේ’ කියලා.

‘ඒ රූපය අම්මා’ කියලා මට පෙනුණාට, මම ඒ රූපය දිහා ‘අම්මා’ කියලා බැලුවට, හොඳට තේරෙනවා ටීවී එකේ තිරය ඇතුළේ එහෙම පුද්ගලයෙක් නැහැ. අන්න ඒ වගේ තැනකට තබලා බැලුවහම හොඳට පේනවා, පුද්ගලයෙක් නොවන අනාත්ම වූ වර්ණ රූපයක් ඇස් ඉදිරිපිටට එන්නේ කියලා.

ටීවී එකේ තියෙන රූපය ‘අම්මා’ වගේ පෙනෙන, ‘අම්මා’ කියලා ඒ රූපය දිහා බලන ගතිය තියෙන්නේ මං ගාව. දැන් මගේ උපාදානයට හසුවෙලා ටීවී එකේ තියෙන රූපය. ටීවී එකේ තියෙන රූපය වගේ ම කනබොන ආහාරයෙන් හැදෙන කර්මජ රූපය පැත්තත් අනාත්ම යි.

නමුත් ඒ කනබොන ආහාරයෙන් හැදෙන රූපයේ ඇත්ත අපිට පෙනෙන්නේ නැහැ. එතනත් කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක් වූ සතර මහා ධාතු රූපයක් තියෙන්නේ. මම ඒ රූපය දකින කොට ම, ‘අම්මා’ කියලා හිතලා ඒ රූපය ‘අම්මා’ කියලා බලනවා.

---

[5] https://tipitaka.lk/ap-dhs-4-12/sinh - **උපාදානගොච්ඡකය - නික්ඛේපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 455 පිටුව**

එතකොට මම ඒ රූපය උපාදාන වශයෙන් අරගෙන තියෙනවා ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’, ‘අම්මා’ කියලා. අන්න ඒ මගේ උපාදානයට හසුවෙච්ච ස්කන්ධය දුකක්. මොකක් නිසා ද? මට අම්මා කියලා පෙනෙන රූපය කැඩෙන කොට, බිඳෙන කොට, වෙනස්වෙන කොට මට දුක එනවා. අඬන්න විලාප දෙන්න වෙනවා.

ඔබට ප්‍රියමනාප දරුවෙක් ඉන්නවා කියලා හිතන්නකෝ. එවිට ඔබට හිතෙන්නේ ඒ රූපය ‘දරුවා’ ම යි කියලා නේ. එතනත් බත්, පාන්, කවුපි, මුං ඇට වගේ කනබොන ආහාරයෙන් ඒ රූපය හැදෙන්නේ. ඒ රූපයේ තියෙන්නෙත් කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර වැනි පුද්ගල නොවන කොටස් තිස් දෙකක්.

ධාතු වශයෙන් ගත්තොත් කෙස්, ලොම්, නිය, දත් කියන්නේ පඨවි ධාතුවට සමානයි. පිත, සෙම, සැරව කියන්නේ ආපෝ ධාතුවට සමානයි. ඒ ශරීරයේ තියෙන උෂ්ණය තේජෝ ධාතුව ම යි. ඒ ශරීරයේ තියෙන වාතයත් බාහිර වාතයත් සමානයි.

කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූප මිටිය ඇස් ඉදිරිපිටට එන කොට ඔබට හිතෙන්නේ ම, ‘රූපය දරුවා’ වගේ. ඔබ ඒ කනබොන ආහාරයෙන් හැදුණු රූපය දිහා බලන්නේ ම ‘දරුවා’ කියලා. එතකොට ‘රූපය දරුවා’ කියලා හිතෙනකම ඔබේ මනසේ තියෙන්නේ. ඒක ඔබගේ කාම උපාදානය.

රූපය සත්ත්වයෙක්, පුද්ගලයෙක් කියලා හිතනකම ‘අත්තවාද උපාදානය’. ඔබගේ උපාදානයට හසු වූ රූපය තමයි කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූපය. දැන් ඔබට රූපයේ අනාත්ම බව පෙනෙන්නේ නැහැ. ඔබ උපාදාන වශයෙන් ඒ රූපය අරගෙන, ඔබේ උපාදානයට හසුවෙලා ඒ රූපය.

පංච උපාදානස්කන්ධය දුකක් කියන්නේ ඔබේ උපාදානයට හසුවෙච්ච ඒ රූපය දුකක්. ඒ රූපය කැඩුණොත්, බිඳුණොත්, වෙනස් වුණොත් ඔබට දරුවා ලෙඩවෙලා, දරුවා මැරුණා, දරුවාට හානියක් වුණා කියලා තමයි පෙනෙන්නේ.

එතකොට ඔබට ප්‍රියමනාප දරුවා නැති වෙච්ච ප්‍රිය විප්පයෝග දුක එනවා. තව කෙනෙක් අනවශ්‍ය දෙයක් කිව්වොත් හෝ කළොත් අකමැති දේවල් ලැබීමේ අප්‍රිය සම්පයෝග දුක ලැබෙන්නට පුළුවන්. එතකොට හොඳට බලන්න, පංච උපාදානස්කන්ධය දුකයි කියන එක කෙනා කෙනා තමන් තුළින් ම දකින්න ඕනේ.

තමන්ගේ උපාදානයට හසුවෙච්ච ඒ රූප වෙනස්වෙන දවසට මගේ ගෙදර කැඩුණා, මගේ වාහනය කැඩුණා, මගේ සල්ලි නැති වුණා, මගේ දරුවා නැති වුණා කියලා තමයි පෙනෙන්නේ අපිට. එතකොට දුකට හේතුව තණ්හා උපාදානය. රූප; දරුවා කරලා, අම්මා කරලා, මිල මුදල් කරලා පෙන්නපු අපේ මනසේ තියෙන ගතියට තමයි තණ්හා උපාදාන කියලා කියන්නේ. ඕක තමයි දුකට හේතුව.

තණ්හා උපාදානය නැති වුණොත් දුක නැති වෙනවා. ඇහෙන් ඒ රූපය බලන කොට, ඒ රූපය ‘දරුවා’ කියලා බලන්නට පුළුවන්කමක් ඔබේ මනසට නැති නම්, ඒ රූපය විපරිණාම වුණාට ඔබට දුක එන්නේ නැහැ. රූපය දිහා බලන කොට ‘මේ මගේ අම්මා’ කියලා පෙනෙන්නේ නැති නම්, රූප දිහා බලන කොට ගෙවල් දොරවල්, රන්, රිදී, මුතු, මැණික් කියලා ඔබට පෙනෙන්නේ නැති නම්, ඔබට රූප දිහා බලන්න නිමිති නැති නම් ඒ රූප විපරිණාම වුණාට ඔබට දුක එන්නේ නැහැ.

රූප දකින කොට අම්මා, තාත්තා, දුව, පුතා, කියලා තමන්ට පෙනෙන්නේ නැති නම් ඒ රූප කැඩුණහම බිඳුණහම නැති වුණා දවසකට

දරුවා මළ දුක, අම්මා මළ දුක විඳින්නට වෙන්නේ නැහැ. එක දෙයක් හොඳට මතක තියා ගන්න ඕනේ.

උපාදානයට හිත ස්කන්ධ පරිහරණය කරනකන් අම්මා, දුව, පුතා කියලා පේනවා ම යි. උපාදානස්කන්ධය කෙරෙහි තමන්ගේ තණ්හා උපාදාන කියන කෙලේසය නැති වුණොත් භවය හැදෙන්නේ නැහැ. භවය නොවුණොත් ඉපදීම වෙන්නේ නැහැ. ඉපදීම නොවුණොත් ලෙඩවීමේ දුක, ජරා මරණ දුක ආදී සියළු දුක එන්නේ නැහැ.

එහෙනම් අපිට රූපය දිහා බලන කොට 'රූපය සත්ත්වයෙක්' 'රූපය පුද්ගලයෙක්', 'රූපය වටිනවා', 'රූපය අම්මා', 'රූපය දරුවා' කියලා පෙනෙනකම මගේ මනසේ නොඑන්න නම් රූපයේ ඇත්ත ඇති හැටිය මට පෙනෙන්න වෙනවා.

එහෙම රූපයේ ඇත්ත ඇති හැටිය පෙන්නන්නේ නැතුව මේ ඉන්න විදිහට ම ඇහෙන් රූපය බැලුවොත්; 'රූපය දරුවා' කියන අදහස, 'රූපය අම්මා' කියන අදහස එන එක වළක්වන්න බැහැ. 'දරුවා', 'අම්මා' කියන අදහස ආවොත්, ඒ අදහස කනබොන ආහාරයෙන් හැදෙන සතර මහා ධාතු රූපයට තබලා දුක් විඳින එක නවත්තන්නත් බැහැ.

එහෙනම් කනබොන ආහාරයෙන් හැදෙන සතර මහා ධාතු රූපය දකින කොට ඒ රූපය අනාත්මයි කියලා පෙනෙනවා නම්, 'ඒ රූපය දරුවා' කියලා මට පෙනෙන්නේ ම නැති වුණොත් තමයි දුක නැති වෙන්නේ. ***"චක්ඛුං අනත්තා, රූපා අනත්තා"*** [6] ඇහැ අනාත්මයි, රූපය අනාත්මයි කියලා හොඳට පෙනුනොත් විතරයි 'රූපය දරුවා' කියලා පෙන්වන තණ්හා උපාදාන කියන කෙලේසය නැති වෙන්නේ. අන්න එහෙම නැති වුණොත් තමයි දුක නැති වෙන්නේ.

---

[6] https://tipitaka.lk/an-10-2-1-10 - **ගිරිමානන්ද සූත්‍රය- සචිත්ත වර්ගය- දසක නිපාතය- අඞ්ගුත්තර නිකාය 6- 196 පිටුව**

එහෙනම් දැන් අපිට දුක ඇති කරන තණ්හා උපාදාන කියන කෙලේසය නැති වෙන්න නම්, ඒ තණ්හා උපාදානය ඇති වෙන්න හේතුවන ස්කන්ධ ටික පිරිසිඳ දකින්න වෙනවා. ඒ කියන්නේ අපිට දුක ආපු ස්කන්ධ ටික පිරිසිඳ දකින්න වෙනවා. එහෙම පිරිසිඳ දැක්කොත් තමයි සමුදය නැත්නම් තණ්හාව ප්‍රහාණය වෙන්නේ.

එහෙම තණ්හාව ප්‍රහාණය වුණොත් තමයි ඒ කෙලෙස් ටික නිසා අම්මා, තාත්තා, දුව, පුතා කියලා අපි දුක් වින්දා නම් ඒ දුක නිරුද්ධ වෙන්නේ. ඒ දුක නිරුද්ධ කරන්න නම් ඒ කෙලෙස් ප්‍රහාණය වෙන්නට ඕනේ. කෙලෙස් ප්‍රහාණය වෙන්නට නම් ස්කන්ධ ටිකේ ඇත්ත දකින්න ඕන කියන සිද්ධියක් තියෙනවා චතුරාර්ය සත්‍යයේ. ඒක තමයි සම්මා දිට්ඨිය.

ඇහැ, රූප, කන, ශබ්ද, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම කියන මේ **උපාදානස්කන්ධය පිරිසිඳ දකින්න නම් හොඳ චිත්ත සමාධියක් ඕනේ.**[7] ඒ සම්මා දිට්ඨියට උපකාර පිණිස ඕනේ සමාධියක්. හොඳ චිත්ත ඒකාග්‍රතාවයක් ඕනේ. ගැඹුරු චිත්ත සමාධියකට තමයි ඒ ඇත්ත ඇති හැටිය පෙනෙන්නේ.

අනාත්ම වූ දේ අනාත්ම යි, දුක් වූ දේ දුක යි, අසුභ වූ දේ අසුභ යි, අනිත්‍ය වූ දේ අනිත්‍ය යි කියලා පෙනෙන්නේ සමාධිගත මනසකට, ගැඹුරු චිත්ත සමාධියට. ගැඹුරු චිත්ත සමාධියක් ලබන්නට නම් කායික වාචසික සංවරයක් අවශ්‍ය වෙනවා.

~ දුක නැති කරන ප්‍රතිපදාව සැකෙවින් ~

අපි පංච උපාදානස්කන්ධය දුකක් හැටියට දුක්ඛ සත්‍යය දැකලා, දුකට හේතුව තණ්හාව, තණ්හාව නැති කළොත් තමයි දුක නැති කරන්න පුළුවන්. තණ්හාව නැති වෙන්න නම් තණ්හාව උපදින්න පුළුවන් වස්තු ටිකේ

[7] https://tipitaka.lk/sn-3-1-1-1-5/sinh - **සමාධිභාවනා සූත්‍රය- නකුලපිතු වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 23 පිටුව**

ඇත්ත ඇති හැටිය දකින්නට ඕනේ. ඇත්ත දකින්න නම් සමාධියක් තියෙන්නට ඕනේ. සමාධියක් ඇතිවෙන්න නම් සීලයක පිහිටන්නට ඕනේ කියලා මෙන්න මේක තමයි දුක් නැති කරන ප්‍රතිපදාව කියලා දන්නවා. එතකොට ප්‍රතිපදාව සීල, සමාධි, ප්‍රඥා.

ඔන්න බලන්න එතැන දී අපිට උත්තරයක් ආවා දුක ඇති කරන හේතුව වූ තණ්හා උපාදාන කියන කෙලේසයෙන් 'රූපය දරුවා' කරලා, 'රූපය අම්මා' කරලා පෙන්නනකම නැති වෙන්න නම් ඇස් ඉදිරිපිටට එන රූපයේ ඇත්ත ඇති හැටිය මට පෙනෙන්න ඕනේ කියලා.

දැන් අපි ඇහෙන් බලන කොට ඉබේම නේ අපිට, 'ඒ රූපය අම්මා', 'ඒ රූපය දරුවා' කියලා පෙනෙන්නේ. ප්‍රාර්ථනාවක් ඕනේ නැහැ ඉබේම නේ එහෙම පෙනෙන්නේ. 'ඒ රූපය දරුවා' කියලා පෙනෙන හින්දනේ අපි දරුවා ගැන හිතිමි, කිමි, කිරිමි කරන්නේ.

රූපයේ ඇත්ත ඇති හැටිය දකින මට්ටමට හිත සමාධිමත් නම් මට පෙනෙනවා ඒ රූපය ධාතු හැටියට, අනිත්‍ය හැටියට, දුක් හැටියට, අනාත්ම හැටියට, අසුභ හැටියට. එතකොට මට 'රූපය දරුවා' හැටියට පෙනෙන්නේ නැහැ, 'රූපය අම්මා' හැටියට පෙනෙන්නේ නැහැ.

රූපය කියන්නේ දුකක් කියලා පෙනෙනවා. රූපය දුකක් හැටියට පිරිසිඳ දකිනවා මිසක රූපය ඇහෙන් දකින කොට 'සත්ත්වයෙක්', 'පුද්ගලයෙක්', 'ආත්මයක්' කියන අදහස නැහැ මට. ඒ රූපය අනාත්ම යි කියන එක පෙනෙනවා. එතකොට පෙනෙනවා කියන කොට අමුතුවෙන් හිතන්න අවශ්‍යයත් නැහැ. රූපය ඇහෙන් බලන කොට ම රූපයේ ඇත්ත ඇති හැටිය නුවණින් පෙනෙනවා.

පාරේ සතෙක් ජරා කරලා තියෙන ටිකක්, වමනේ ටිකක් දැක්කොත් බලන කොට ම අපිට පිළිකුල් බව පෙනෙනවා නේද. ඒ හින්දා නේ අපි

වැරදිලාවත් සාක්කුවේ දාගන්නේ නැත්තේ. ඇයි ඒ අසුභ බව හිත හිතා ඉන්නේ නැහැ. මේ වමනේ ටිකක්, අසූචි, පිළිකුල්, දුගඳයි, ගන්න හොඳ නෑ නේද කියලා හිතන්න ඕනේ වෙන්නේ නැහැ. බලන කොට ම ඒ අසුචි බව පෙනෙනවා. එහෙම පෙනෙන කොට අසිහිය නැහැ.

නමුත් අපිට ඇතැම් අරමුණුවල අසූචි බව, පිළිකුල් බව, අනාත්ම බව පෙනෙන්නේ නැහැ. කනබොන ආහාරයෙන් හැදෙන සතර මහා ධාතු රූපය 'දරුවා' කියලා පෙනෙන්නේ, 'අම්මා' කියලා පෙනෙන්නේ. ඒ පේන කෙලේසයට තමයි දුක ගෙනත් දෙන්නේ. එහෙම පේනකම අයින් වෙන්න නම් මට රූපය අනිත්‍ය දෙයක්, දුක් දෙයක්, අනාත්ම දෙයක්, අසුභ දෙයක් කියලා පෙනෙන්නට ඕනේ.

රූපය අනිත්‍ය දෙයක්, දුක් දෙයක්, අනාත්ම දෙයක් ලෙස පෙනෙනවා කියන ටිකට ප්‍රාර්ථනාවක්වත් ඕනේ වෙන්නේ නැහැ චිත්ත සමාධිය තියෙන කොට. චිත්ත සමාධිය ඇති කර ගන්න භූමිය තමයි සීලය. ඔන්න මම අරගෙන ආවේ දුක පෙන්නලා, දුක ඇතිවීම පෙන්නලා, දුක නැතිවීම පෙන්නලා, දුක නැති කරන මාර්ගයට.

ගොඩක් දෙනෙක් මේ ටික ගැන ඕන තරම් බණ අහලා ඇති. චතුරාර්ය සත්‍යය කටපාඩමින් හිතන්න, කියන්නත් පුළුවන්කමක් ඇති. ඒත් අනාත්මය තුළ මනස පිහිටලා *"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"* කියලා දුක පිරිසිඳ දකින තැනට මනස ගන්න බැරි වෙලා. ඒකයි රහතුන්ගෙන් හිස් වෙලා තියෙන්නේ.

දැන් තමයි අද මම කතා කරන ධර්ම දේශනාවේ සුවිශේෂී තැනට එන්නේ. මම එක සිද්ධියක් පෙන්නන්නම්. එතකොට ඔයගොල්ලන්ට තේරෙයි "අනේ මෙච්චර මෝඩකමක්, මෙච්චර වැරදීමක් අපි තුළ තියෙද්දි රහත් වුණා නම්, දුක නිවුණා නම් තමයි පුදුමේ" කියලා.

අවුරුදු දහස් ගණනකට ඉස්සෙල්ලා මේ දහම ම අහලා ප්‍රතිපත්තියේ හැසිරුණු බොහෝ අය නොබෝ දවසකින් විශේෂණයකට පත්වුණා නම්, අදත් අපි ඒ දහම ම අහලා කොච්චර යෙදුණත් චතුරාර්ය සත්‍යය අවබෝධය, රහත් වීම පැත්තකින් තැබේවා. ගතවෙන ජීවිතයේ දහමකින් තමන්ගේ මනසේ සිසිලසකින් ජීවත් වෙන්න ලැබුණු බවක්වත් පේන්න තියෙනවා අඩුයි නේ.

ඒකට හේතුව මොකක්ද, එදා මේ දහම අහලා ප්‍රතිපත්තියේ හැසිරුණු හැම කෙනෙක් ම නොබෝ දවසකින් ම ආධ්‍යාත්මික සංසිඳීමකට ආවා නම් අද එහෙම ලැබෙන්නේ නැත්නම් මොකක්ද ඒකට හේතුව, කොතැන ද ඒ අඩුපාඩුව කියන හේතුව තමයි මම ගොඩක් කල් හෙව්වේ.

සමස්ත ලංකාවාසී, ලෝකවාසී හැමෝට ම මෙන්න මේ ටික වැරදිලා. “අන්න අතන රහතන් වහන්සේලා ඉන්නවා, අන්න අර අය මාර්ගඵල ලාභීන්” කියලා කතා කළාට රහත් වුනේ කොහොමද කියන එක පුදුමයක් මේ දහමේ වැරදුණ තැන ලෙහලා බලන කොට.

හොඳයි එහෙනම් අපි බලමු මේ චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගන්නට තිබෙන මාවත මොකක්ද කියලා. කරුණු කාරණා තේරෙන හත් හැවිරිදි දරුවෙක් හරි අඛණ්ඩව අද මම මේ පෙන්නන දහම් ක්‍රමය කළොත්, නොබෝ දවසකින් නිදුකින් සුවසේ නිවන් පුරයට පැමිණෙනවා.

~ ඇයි අද මාර්ගඵල ලබන්න බැරි වෙලා තියෙන්නේ ~

ඒ නිසා අපි මේ සුවිශේෂී වූ පොහොය දවසේ සමස්ත බුද්ධ ශාසනයට ම ඉතා ම වැදගත්වන ඒ පණිවිඩය මොකක්ද කියලා පොඩ්ඩක් බලමු. අපි දැන් සීලයක පිහිටලා තියනවනේ. මෙන්න මේ අඩුපාඩුව, මෙන්න මේ වැරැද්ද තියෙන්නේ සතර සතිපට්ඨානය වඩන තැන.

අපි දැක්කා, දුක පිරිසිඳ දකින්න නම් චිත්ත සමාධියක් තියෙන්නට ඕනේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශික්ෂා තුනක් (ත්‍රිශික්ෂාවක්) තියෙනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප දෙක අයිති ප්‍රඥාවට. සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි අයිති සමාධියට. උත්සාහයෙන් සතර සතිපට්ඨානය වැඩීමෙන් හිත සමාධි වෙනවා. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව අයිති වෙන්නේ සීලයට.

ගිහි පින්වතුන් හැටියට පංචශීලයේ හෝ පිහිටනවා නම් ආජීව අෂ්ටමක සීලයේ හෝ පිහිටනවා නම් උපෝසථ අෂ්ටාංග සීලයේ හෝ පිහිටනවා නම් එපමණකින් සීලයක පිහිටියා වෙනවා. ස්වාමීන් වහන්සේලාට නම් සාමණේර දස සීලය හෝ උපසම්පදා සීලය යන දෙකෙන් කැමති සීලයක පිහිටන්නට පුළුවන්. එපමණකින් කායික වාචසික සංවරයකට පැමිණෙනවා.

එහෙම සීලයක පිහිටලා, එයා සතර සතිපට්ඨානය වැඩිය යුතුයි. මෙන්න මේ සතර සතිපට්ඨානය වඩනවා කියන තැන අපි වෙනදාට දැනගෙන හිටියට වඩා වෙනත් වූ සිද්ධියක් තියෙනවා. මෙන්න මෙතන තමයි ප්‍රතිපදාවේ අඩුව. මෙන්න මෙතන තමයි අද දවසේ දී ප්‍රශ්නය ලෙහෙන්නට ඕනේ.

අපි ගොඩක් වෙලාවට හිතන්නේ චතුරාර්ය සත්‍ය පැත්ත, දර්ශනය ගොඩක් අඩුවක් ඇති කියලා. දර්ශනයේ ලෙහාගන්න ඕන නිබර කර ගන්න ඕන පැතිකඩවල් කරුණු කාරණා නැතුවා නෙමෙයි තියෙනවා. නමුත් ඒ දර්ශනය පැත්තේ කරුණු කාරණා බොහෝ සේ අපි ලෙහා ගෙන නිබර කර ගෙන නිවැරදි ඉලක්කයකට අරගෙන තියෙනවා. ඒත් ඒ දර්ශනය අපේ ජීවිතයේ ඵළඹ සිටින්නේ නැහැ තාම.

උදාහරණයක් හැටියට රූපය දිහා බලන කොට තාම 'අම්මා' කියලා ම යි පෙනෙන්නේ. එතකොට අම්මා ලෙඩ වුණා, අම්මා මැරුණා කියන දුක විඳින්නට වෙනවා. අපි කොච්චර බණ දැන ගත්තත් අපේ උපාදානයට හසු වූ

ස්කන්ධය විපරිණාම වෙන කොට දුක එන මට්ටමකයි තියෙන්නේ. ඒ රූපය උපාදාන වශයෙන් නොගෙන හිත මිදිලා නැහැ.

ඒ රූපයේ ඇත්ත දැකිනකම අපි තුළ එළඹ සිටින්නේ නැහැ. අපි දන්නවා ***"චක්ඛුං අනත්තා, රූපා අනත්තා"*** [8] කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා. නමුත් ඒ රූපය දිහා බලන කොට ආත්මයි කියලා තවම පෙනෙන්නේ බණ ඇහුවට. මේ ශරීරය දිහා බැලුවහම 'මේ මම' කියලා නම් පෙනෙන්නේ රූපය අනාත්ම යි කියලා බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කළාට අපිට අනාත්ම බව පෙනෙන්නේ නැහැ

එහෙනම් අඩුව තියෙන්නේ අපිට එතන නෙවෙයි මෙන්න මේ සතිපට්ඨානය වඩන තැන. මේ කාරණාවෙන් හොඳට තේරුම් ගන්න, මම අර සකුණගඹි සූත්‍රය මතක් කළේ. "මහණෙනි, තමන්ට අයිති නැති, තමන්ට ගෝචරත් නැති, තමන්ට ගැළපෙන්නෙත් නැති, අනුන්ට අයත් භූමිය හැටියට පෙන්නුවේ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ කියලා.

බුදුරජාණන් වහන්සේ "මහණෙනි, පියාගෙන් අයිති වූ ගෝචරයේ හැසිරෙන්න" කියලා කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා කියන සතර සතිපට්ඨානය පෙන්නුවා. මේ සතර සතිපට්ඨානය කියලා කියන්නේ පින්වතුනි, අපි අද දවසේ දන්න විදිහට තව එක භාවනාවක් එහෙම නෙමෙයි. සතර සතිපට්ඨානය කියන්නේ අවස්ථාවට කුණප වශයෙන්, ධාතු වශයෙන් කය දිහා බලාගෙන මෙනෙහි කරන සිද්ධියක් එහෙම නෙවෙයි.

සතර සතිපට්ඨානය කියන්නේ මාරයාට අහුවෙන්නේ නැතුව සැඟවිලා ජීවත් වෙන්න පුළුවන් වෙන ම පොළොවක්. සතර සතිපට්ඨානය හඳුනා ගන්න වාසය කරන බිමක් හැටියට.

[8] https://tipitaka.lk/mn-3-5-6 - **ජ ජක්ක සූත්‍රය- සළායතන වර්ගය- මජ්ඣිම නිකාය 3- 586 පිටුව**

සතිපට්ඨානය කියලා කියන්නේ මේ ලෝකයේ කිසි ම තැනකට, කිසි ම කෙනකුට අයිති නැති, එහි වාසය කරන කෙනා ලෝකයෙන් අයින් කරලා නිවන පිණිස ම අරගෙන යන තව එක පොළොවක්.

කාම භූමිය

ඇහැ, කන, නාසය, දිව, ශරීරය, මනස කියන ආධ්‍යාත්මික ආයතන හයයි, රූප, ශබ්ද ගන්ධ, රස, ඵොටඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන හයයි කියන දොළොස් ආයතන තුළ හැසිරෙනකමට කියනවා කාමාවචර යි කියලා, කාම භූමිය කියලා. ඔය තුළ පංච උපාදානස්කන්ධයක් තියෙනවා. කාමය කියන ලෝකයට පොළොව ඔය ආයතන දොළහ.

රූප භූමිය

ඇහැත්, කනත්, මනසත් කියන ආධ්‍යාත්මික ආයතන තුනයි; රූපයත්, ශබ්දයත්, ධර්මාරම්මණත් කියන බාහිර ආයතන තුනයි කියන මෙන්න මේ ආයතන හයේ, මෙන්න මේ පංච උපාදානස්කන්ධයේ ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින ඉරියව් පවත්වන, ආයතන හය බලාගෙන හිතීම්, කීම්, කිරීම් කරමින් ජීවත්වෙන එකට තමයි රූප භූමිය/ රූපී බ්‍රහ්ම ලෝකය කියලා කියන්නේ.

අරූප භූමිය

මනායතනය කියන අධ්‍යාත්මික ආයතනයත්, ධම්මායතනය කියන බාහිර ආයතනයත් දෙක බලාගෙන හිතීම්, කීම්, කිරීම් කරමින් ජීවත් වෙනවා නම් ඒකට කියනවා අරූපාවචර යි කියලා. එතන තියෙනවා උපාදානස්කන්ධ වශයෙන් හතරක්.

ආයතන, උපාදානස්කන්ධ කියලා කියන්නේ ඒ ඒ ලෝකවල කෙනාට වාසය කරන්න බිමක්. ඒ වගේ ම සතර සතිපට්ඨානය කියන්නේ නිවන් දකින කෙනා වාසය කටයුතු පොළොවක්. කවදාවත් ම පංච උපාදානස්කන්ධයේවත් ආයතන දොළහෙවත් හැසිරිලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒකයි පංච

උපාදානස්කන්ධය, ආයතන දොළහ දුකක් කියලා පෙන්නලා පංච උපාදානස්කන්ධය, ආයතන දොළහ නිසා ඇතිවෙන තණ්හා උපාදාන කියන කෙලේසයක් තියෙනවා නම් ඒකයි දුක ඇතිවෙන හේතුව කියලා ලෝකය පැත්තෙන් පෙන්නුවා; දුකයි, දුක ඇතිවෙන හේතුවයි කියන දෙක.

ඒ පංච උපාදානස්කන්ධය උපදින තැන තණ්හා, උපාදාන කියන කෙලේසය නැති වුණොත් විතරයි භවය හැදෙන්නේ නැත්තේ, ලෝකයක් හැදෙන්නේ නැත්තේ. එහෙම වුණොත් තමයි ඉපදෙන්නේ නැත්තේ කියලා පෙන්නලා මේ දුක් නැති කරන මඟ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි කියලා පෙන්නන කොට ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන ටික තියෙන්නේ සීල, සමාධි, ප්‍රඥා කියන ත්‍රිශික්ෂාවක් මත පිහිටලා.

ඒ ත්‍රිශිශික්ෂාව හදාගන්න කරුණු කාරණා වෙනම ම තියෙන්නේ. ඒක අයිති නෑ පංච උපාදානස්කන්ධ ලෝකය ඇතුළේ සක්මන් කරන එකට. උදාහරණයක් හැටියට ඇහැත් දුකයි නම් ඇහැ නිසා තණ්හාව ඇති වෙනවා නම් ඒ ඇහැ රූප දෙක පරිහරණය කරමින්, ඒකේ අනිත්‍ය බලනවා කියන සිද්ධියක්වත් නැහැ. ඒ පැත්තට නොයා ම යුතුයි.

නිවන් දකින කෙනා කටයුත්තේ සීලයක පිහිටලා සතිපට්ඨානය තුළ වාසය කරන එක. ඒ බව මම පැහැදිලි කරලා දෙන්නම්. සතිපට්ඨානය කියලා කියන්නේ තව පොළොවක්, තව බිමක්. සතිපට්ඨානය තුළ ඉන්න කොට මාරයාට අහුවෙන්නේ නැතුව, පංච උපාදානස්කන්ධ ලෝකයට යන්නේ නැතුව, පංච උපාදානස්කන්ධය පරිහරණය කරන්නේ නැතුව, ස්පර්ශ ආයතන හය පරිහරණය කරන්නේ නැතුව, සැඟවිලා ජීවත් වෙන්න පුළුවන් තව එක්තරා තැනක් නේද කියලා අපි හඳුනගෙන නැහැ.

ඇහැ, කන, දිව, නාසය, කය, මනස දුකයි කියලා, ඕවා නිසා ම දුක ඇති කරන හේතුව ඇති වෙනවා කියලා අහලා තිබුණත් අපි ඒවා ඇතුළේ ම

ජීවත් වෙන්නේ. ඒ වගේ ම; රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන හයේ ම තමයි අපි ජීවත් වෙන්නේ.

රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම අරමුණු කරගෙන ම ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව් දක්වනවා. ඒවා අරමුණු කරගෙන ම හිතීම්, කීම්, කිරීම් කරනවා. ඕකට තමයි අපි ලෝකයේ ජීවත් වෙනවා කියලා කියන්නේ.

ඇහැ, රූප, කන, ශබ්ද, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම කියලා කියන්නේ ලෝකය. ඇවිදිනවා, ඉඳගන්නවා, හිටගන්නවා, නිදාගන්නවා කියන ඒ කුමන හෝ ඉරියව්වක් පවත්වමින් කුමන හෝ වැඩ කටයුත්තක් කරන එකට තමයි ලෝකයේ ජීවත් වෙනවා කියලා කියන්නේ

මේ මුළු ලෝකයට ම අහුවුනේ නැති, මුළු ලෝකයට ම වැරදුණු තැනක් තියෙනවා. අද සතිපට්ඨානය වඩන ඔක්කොමලා වගේ සතිපට්ඨානය හඳුනගෙන තියෙන්නේ බාහිර ආයතන හයේ, පංච උපාදානස්කන්ධයක් තුළ ජීවත් වෙමින් විටින් විට කුණාප වශයෙන් මේ ශරීරය දිහා බලමින්, ධාතු වශයෙන් බලමින්, අනාත්ම වශයෙන් බලමින් ඉන්න එක කියලා.

එතකොට අපි පිහිටලා තියෙන්නේ, පය ගහලා තියෙන්නේ අපිට පොළොව වෙලා තියෙන්නේ කාම භූමිය. අද බොහෝ දෙනා කාම භූමියේ හිඳිමින් කය අනුව බලනවා. ඕකට කියනවා සතිපට්ඨානය ලෞකික යි කියලා. එතකොට අපි නිවන් දැක්කා නම් තමයි පුදුමේ. ලෝකේ ඇතුළේ ලෝකෝත්තර දහම් ප්‍රතිපදාවක් නැහැ.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සතර සතිපට්ඨානය කියන්නේ පින්වතුනි, වෙනම ම පොළොවක් හැටියට අද ඉඳන් හඳුනා ගන්නට ඕන. අවස්ථාවට විතරක් මෙනෙහි කරලා ආපහු ලෝකේ තුළ ජීවත්වෙන

ධර්මතාවයක් නෙවෙයි සතිපට්ඨානය තුළ වාසය කරන්න කියන එකෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ.

ඒකෙන් මතක් කළේ වෙනදා වගේ ම අපි රූප, ශබ්ද, ගන්ධ, රස ඵොට්ඨබ්බ පරිහරණය කරමින් ජීවත් වෙමින් කෙලෙස් ටික නැති කර ගන්න කියලා එක මොහොතකට පමණක් කය පැත්ත කුණප කොටස් වශයෙන්, ධාතු වශයෙන්, නවසීවථික වශයෙන්, ආදීනව වශයෙන් බලලා ආයෙත් ඒ භාවනාව අතහැරලා ලෝකයේ ජීවත් වෙනවා කියන සිද්ධියක් එහෙම නෙමෙයි.

අඛණ්ඩව ජීවත් වෙන්නේ කාය, වේදනා, චිත්ත, ධම්ම කියන හතර තුළ. අපි ඒක බලමු කොහොමද කියලා. දැන් අපි සීලයක පිහිටලා සතිපට්ඨානය වඩන්නට යන්නේ. මේ සතිපට්ඨානය කියන එක ගත්තහම පින්වතුනි, බුදුරජාණන් වහන්සේ පෙන්වනවා "මහණෙනි, සිය පියාගෙන් උරුම වෙච්ච බිම" කියලා.

බුදුරජාණන් වහන්සේ අපේ ශාස්තෘන් වහන්සේ. පැවිදි ස්වාමීන් වහන්සේලාට කියනවා 'බුද්ධ පුත්‍රයෝ' කියලා. ඒ හැමෝටම බුදුපියාණන් වහන්සේ. ඒ වගේ ම ගිහි පින්වතුන්ටත් බුදුරජාණන් වහන්සේ කියන්නේ නිවන් දකින්න මඟ කියපු බුදුපියාණන් වහන්සේ. අපි හැමෝටම බුදුපියාණන් වහන්සේගෙන් උරුම වෙච්ච බිම කියන්නේ සතිපට්ඨානය හැටියට හඳුන ගන්න.

කොහොමද අපි සතිපට්ඨානයෙන් ජීවත් වෙන්නේ කියන ඒ කරුණ අපි ලෙහා ගනිමු, අපි ඒ කරුණ නිබර කර ගනිමු. එතකොට අපි මාරයාට අහුවෙන්නේ නැහැ. අර පෙන්නපු සකුණග්ඝි සූත්‍රයේ කැට කුරුල්ලා ගිජුලිහිණියාට හසුවුණේ කැට කුරුල්ලාට අයිති නැති තැන හිටපු හින්දා නේ.

ඒ වගේ බුදුරජාණන් වහන්සේ අහනවා, “මහණෙනි භික්ෂුවට සුදුසු නැති තැන කුමක්ද? රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ. එතකොට පියාගෙන් උරුම වෙච්ච කොටස සතර සතිපට්ඨානය කියලා පෙන්නුවා.

දැන් හොඳට බලන්න, ඔයගොල්ලො ඇවිදිනවා නම්, ඉඳගන්නවා නම්, හිටගන්නවා නම්, නිදාගන්නවා නම් මේ හතර ඉරියව්වේ ම බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන කුමන හෝ අරමුණක් ගැන හිතීම්, කීම්, කිරීම් කරමින් ම ඇවිදිනවා හෝ හිටගෙන ඉන්නවා හෝ ඉඳගෙන ඉන්නවා හෝ නිදාගෙන ඉන්නවා නේද කියලා.

ඒ කියන්නේ බාහිර අගෝචර වූ තමන්ට අයිති නැති තැනක යි ඕගොල්ලෝ ඉරියව් පවත්වලා තියෙන්නේ. ඊට පස්සේ මොනවා ම හරි වැඩක් කරන කොට බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ දිහා බලාගෙන තමයි වැඩ කටයුතු කරන්නේ. ඕකට තමයි අපි ලෝකේ ජීවත් වෙනවා කියලා කියන්නේ.

බුදුරජාණන් වහන්සේ පෙන්නුවා ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව්ව දක්වන්න කය කෙරෙහි පිහිටි සිහියෙන් කියලා. ලෝකෙන් එතෙර වෙන්න කැමති කෙනාට/ නිවන් දකින්න කැමති කෙනාට සතර සතිපට්ඨානය කියලා කියන්නේ ජීවත් වෙන්න පොළොවක් හැටියට දකින්න.

අපි ක්‍රමානුකූලව සතිපට්ඨානය නැමැති භූමියේ වාසය කරන හැටි ඉගෙන ගනිමු. ඇහෙන් රූප බලමින්, කනෙන් ශබ්ද අහලා නාසයෙන් ගඳ සුවඳ ලබලා, දිවෙන් රස විඳලා, කයෙන් ස්පර්ශ ලබලා ඒවා අනුව හිතීම්, කීම්, කිරීම් කරමින් ජීවත්ව ඉන්න ඕගොල්ලන්ට අවස්ථාවට මෙනෙහි කරන්න භාවනාවක් නෙමෙයි, මං අද මේ කියලා දෙන්නේ.

මං අද ඕගොල්ලොන්ට කියලා දෙනවා; ඇහෙන් රූප බලනවා, කනෙන් ශබ්ද අහනවා, නහයෙන් ගඳ-සුවඳ විඳිනවා, දිවෙන් රස විඳිනවා, කයෙන් ස්පර්ශ ලබනවා කියන ටික පරිහරණයට ම නොගොස්, ඒ පැත්තට යන්නේ ම නැතුව ජීවත්වෙන ක්‍රමයක්.

ආයතන කියන්නේ දුක, ඒ තුළ තියෙනවා දුක ඇති කරන හේතුවත්, ඒක මාරයාට අයිති භූමිය. **ඇහෑ මාරයා, රූපය මාරයා, කන මාරයා, ශබ්දය මාරයා, නාසය මාරයා, ගන්ධය මාරයා, දිව මාරයා, රස මාරයා, කය මාරයා, ඵොට්ඨබ්බය මාරයා, මනස මාරයා, ධම්මරම්මණ මාරයා**[9] කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ.

ඒවා මාර විෂය. ඒවා අගෝචර ය. ඒවායේ හිටියොත් මාරයාගෙන් බේරෙන්න බැහැ කියලා දැකලා ඒ පැත්තට නොයා ඉන්නේ කොහොමද කියලා ඒ පැත්තට නොයා ජීවත් වෙන්න තමයි සතිපට්ඨානය හඳුනා ගන්නේ. සතිපට්ඨානය හඳුනා ගන්න, ස්පර්ශ ආයතන හය පරිහරණය නොකොට, පංච උපාදානස්කන්ධය පරිහරණය නොකොට ජීවත් වෙන ක්‍රමයක් හැටියට.

~ සතිපට්ඨානය නිවැරදිව වඩන ආකාරය ~

සතිපට්ඨානය අපි කමටහනෙන් කමටහනට එක දිගට පොඩ්ඩක් සාකච්ඡා කරමු. මෙන්න මේ අද දවසේ දී කියලා දෙන ටික හොඳට අහගන්න. අහගෙන ඉස්සෙල්ලා ඒක ටිකක් පුරුදු කරන්න. පුරුදු කරලා ඒ විදිහට ජීවත් වෙන්න ඒකාන්තයෙන් ඕගොල්ලෝ නොබෝ දවසකින් සුවසේ නිවනට යනවා, මාරයාගෙන් මිදෙනවා.

ඉස්සෙල්ලා ම පටන් ගන්නවා ආනාපානසතියෙන්. අදත් කෙටියෙන් මතක් කළොත්, එක තැනක ඉඳගෙන ඉන්න කොට; රූප, ශබ්ද, ගන්ධ, රස,

[9] https://tipitaka.lk/sn-4-1-7-3/sinh - **සමිද්ධි මාරපඤ්හ සූත්‍රය- මිගජාල වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 87 පිටුව**

ඔොට්ඨබ්බ, ධම්ම කියන බැහැර ආයතන අනුව, පංච උපාදානස්කන්ධ ලෝකය අනුව අපේ මනස දිවෙන්නේ නැති වෙන්න නාසයේ කෙළවර හෝ මුඛ නිමිත්තේ (තොල් දෙක ළඟ) හිත තබා ගන්න. **නාසයේ කෙළවර හෝ මුඛ නිමිත්තේ (තොල් දෙක ළඟ) හිත පිහිටුවා ගන්න එකට කියනවා සති නිමිත්තේ හිත තියා ගන්නවා/ සිහිය පිහිටුවා ගන්නවා කියලා.**[10]

"සො සතොව අසසසති, සතොව පසසසති" [11] සති නිමිත්තේ හිත තබාගෙන සිහියෙන් ම ආශ්වාස වෙන බවට සිහියෙන්ම ප්‍රශ්වාස වෙන බවට හොඳට දැනුම් සහගත බවක ඉන්නවා. ඒ කිවුවේ සිහිය පිහිටුවා ගෙන තියෙනවා සති නිමිත්තේ; ආශ්වාස වෙන බව, ප්‍රශ්වාස වෙන බව නුවණින් දන්නවා. එතකොට සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනුම් සහගතව ම ඔය විදිහට කරන්න.

"සබබකායපටිසංවෙදී" සියලු ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳව ම දැනුම් සහගතව ම ආශ්වාස ප්‍රශ්වාස කරන්න. *"පසසමහයං කායසඛඛාරං අසසසිසිසසාමීති සිකඛති, පසසමහයං කායසඛඛාරං පසසසිසිසසාමී'ති සිකඛති."* ආශ්වාස ප්‍රශ්වාස කයේ සංසිදීම ඇතිවෙන තාක් ඒක කරන්න කියලා පෙන්නුවා. ආශ්වාසය ප්‍රශ්වාසය අනුව සිහිය පිහිටවන එකත් කායගතාසතියටයි අයිති. එක තැනක ඉඳගෙන ඉන්න කොට කායගතාසතිය වඩන එක ක්‍රමයක් ආනාපානසතිය කියලා කියන්නේ.

අපි ඒ කමටහන ගැන නොයෙක් තැන්වල දී කතා කරලා තියෙන නිසා, අද දවසේ දී මම ඒ ගැන ගොඩක් කතා කරන්නේ නැහැ. මට අවශ්‍ය අපි මාර විෂයට යන්නේ නැතුව, සතිපට්ඨානයෙන් වාසය කරන්නේ කොහොමද, නිවන් දකින්නට භූමියක්, ලෝකයෙන් එතෙර වෙන ලෝකෝත්තර භූමියක් හදාගන්නේ කොහොමද කියන ටික පැහැදිලි කරන්නයි.

---

10 https://tipitaka.lk/ap-vbh-12/sinh - **ධ්‍යාන විභඞ්ගය- විභඞ්ග ප්‍රකරණය- 47 පිටුව**

11 https://tipitaka.lk/mn-3-2-8 - **ආනාපානසති සූත්‍රය- අනුපද වර්ගය- මජ්ඣිම නිකාය 3- 228 පිටුව**

මෙන්න මෙතන තමයි අවශ්‍ය ම දේ. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව්වල හොඳට බලන්න මෙච්චර කාලයක් අපි කොච්චර බණ ඇහුවත්, අපි හැම කෙනෙක් ම බාහිර ඉන්න කෙනෙක් ගැන හිතමින් ම, බාහිර තියෙන වස්තුවක් ගැන හිතමින් ම හිටගන්නවා. බාහිර මොනවා ම හෝ සවිඤ්ඤාණක හෝ අවිඤ්ඤාණක දෙයක් ගැන හිතමින් ම ඇවිදිනවා. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම පැත්තේ කුමන හෝ අරමුණක් ගැන හිතමින් ම හිටගෙන ඉන්නවා. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ස්පර්ශ ආයතන හය පැත්තේ කුමන හෝ සවිඤ්ඤාණක වේවා අවිඤ්ඤාණක දෙයක් ගැන සිහි කරමින් ම නිදාගන්නවා.

අපි ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින මේ හතර ඉරියව්ව මේ තාක් කල් පරිහරණය කළා නම් පරිහරණය කළේ රූප, ශබ්ද, ගන්ධ, රස ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන ටිකට හිත තබලා. ඒ කියන්නේ පෙනෙන දේ ගන්න ම තමන් හිටගන්නවා. පෙනෙන දේ බලාගෙන පෙනෙන දේ ගන්න ම යනවා.

එහෙම නැත්නම් හිතෙන් බැහැර තියෙන යම් වස්තුවක් සිහි කර ගෙන ඒ සිහි කර ගත්ත දේ ගන්න ම නැගිටිනවා. කඩේකට හරි යනවා නම් තව කවුරුහරි ගැන හෝ තව දෙයක් ගැන හෝ මොනවා හරි හිත හිත ම යනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, **දුතිය ගද්දුලබද්ධ සූත්‍රයේ**[12] දී දම්වැලකින් බැඳපු බල්ලෙක් හිටගෙන ඉන්නවා නම් ඒ කණුව ළඟ ම හිටගෙන ඉන්නවා. ඇවිදිනවා නම් කණුව වටා ම ඇවිදිනවා. ඉඳගෙන ඉන්නවා නම් කණුව වටේ ම ඉඳගෙන ඉන්නවා. නිදාගෙන ඉන්නවා නම් කණුව වටේ ම නිදාගන්නවා.

---

[12] https://tipitaka.lk/sn-3-1-2-5-8/sinh - **දුතිය ගද්දුලබද්ධ සූත්‍රය- පුජ්ජ වර්ගය- බන්ධ සංයුත්තය- සංයුක්ත නිකාය 3- 259 පිටුව**

ඒ වගේ අශ්‍රැතවත් පෘථග්ජනයා ඉඳගෙන, නිදාගෙන, හිටගෙන, ඇවිදින මේ හතර ඉරියව්වේ ම පංච උපාදානස්කන්ධයක ම හැසිරෙනවා කියලා. එතකොට රූපය හෝ ශබ්දය හෝ ගන්ධය හෝ රසය හෝ ඵොට්ඨබ්බ හෝ, ධම්ම යන කුමන හෝ යමක් ගැන හිතමින් ම ඉඳගෙන ඉන්නවා, හිතමින් ම හිටගෙන ඉන්නවා, හිතමින් ම ඇවිදිනවා, හිතමින් ම නිදාගන්නවා.

දම්වැලෙන් බැඳපු බල්ලා කණුව වටේ ම හැසිරෙනවා වගේ ධර්මය කොච්චර ඇහුවත් අපි පංච උපාදානස්කන්ධයක ම යි සක්මන් කරලා තියෙන්නේ. නමුත් මේ සතිපට්ඨානය කියන්නේ හරි අමුතු පුදුම තැනක් ජීවත් වෙන්න. මේක කරලා බලන්න.

ඔබ යම් තැනක ඉඳගෙන ඉඳලා නැගිටින කොට නැගිටිනවා කියලා දැනුම් සහගතකමකින් නැගිටින්න. මේක දන්නේ නැත්නම් ඉගෙන ගන්න වෙනවා. ඒ කියන්නේ ඔබ බැහැර රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ ධම්මයන්ට හිත තබලා කවදාවත් ම ඉරියව්ව පවත්වන්න එපා.

කයට හිත තබලා ම නැගිටින්න. යන කොට යනවා කියලා දැනුම් සහගත බවක ම තියාගෙන යන්න. ඒ කියන්නේ කයට හිත තබලා ම යි යෑම් කරන්නේ ***"ගචජනෙතා වා ගචජාමීති පජානාති"*** [13] යන කොට "යන්නෙමි" කියන දැනුම් සහගතකමක තබාගෙන යන්න.

ඒ කියන්නේ ඔබ මීට පෙර ඇවිදින කොට තව කෙනෙක් හෝ දෙයක් ගැන හෝ හිත හිතානේ ගියේ. නමුත් අද ඉඳන් තමන් යන බව දන්නාකමෙන් යන්න. *"ඨිතො වා ඨිතොමහීති පජානාති"* හිටගෙන ඉන්න කොට තමන් හිටගෙන ඉන්නකම ගැන දැනුම් සහගතව හිටගෙන ඉන්න.

---

[13] https://tipitaka.lk/mn-3-2-9 - **කායගතාසති සූත්‍රය- අනුපද වර්ගය- මජ්ඣිම නිකාය 3- 240 පිටුව**

"නිසිනෙනා වා නිසිනෙනාමහීති පජානාති" ඉඳගන්න කොට තමන් දැන් ඉඳගන්නවා කියන දැනුම් සහගත කමකින් ඉඳගන්න. *"සයානො වා සයානොමහීති පජානාති"* නිදාගන්න කොට තමන් නිදාගන්නවා කියලා කය හාන්සි කරනවා කියන සිද්ධිය දැනුම් සහගතව ම කරන්න.

'යනවා' කියන සිද්ධිය දැන ගෙන ම කරන්න. 'හිටගෙන ඉන්නවා' කියන සිද්ධිය දැන ගෙන ම කරන්න. 'ඉඳගන්නවා' කියන සිද්ධිය දැන ගෙන ම කරන්න. 'නිදාගන්න කොට' නිදාගන්න බව දැන ගෙන ම කරන්න. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින සතර ඉරියව්ව ම ඔබ පරිහරණය කරන්න ඔබේ කයට හිත තබලා.

දැන් ඔබට රූප, ශබ්ද, ගන්ධ, රස ඵොට්ඨබ්බ, ධම්ම කිසිම දෙයක් අහුවෙන්නේ නැතිව ජීවත්වෙන ක්‍රමයක් මේ. බාහිර ආයතන පැත්තට යන්නවත් බැහැ එතකොට. ඔන්න ඕකට මාරයාගේ ඉඩමට යන්නේ නැතුව සතිපට්ඨානයෙන් වාසය කරනවා කියලා කියනවා.

මේක අවස්ථාවට පමණක් භාවනා කරන එකක් නෙවෙයි. අඛණ්ඩව මේ විදිහට ජීවත් වෙන්න හුරු කළ යුතුයි. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව් දක්වන්න කයට හිත තබලා. කය අරමුණු කර ගෙන මේ ඉරියව් දක්වන්න ඔබ හුරුවෙන්නට ඕනේ. ඒකට කියනවා 'සතිපට්ඨානය' කියලා. වායාම, සති - උත්සාහයෙන් සිහිය පිහිටුවා ගන්නට වෙනවා සතර ඉරියව්වේ ම.

ඊට පස්සේ තියෙනවා 'සති සම්පජඤ්ඤ'. අපි ජීවත් වෙනවා කියලා කියන්නේ; ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වක් පවත්වමින් එම හතර ඉරියව්ව තුළ මොනවා ම හරි දෙයක් හිතමින් හෝ කියමින් හෝ කරමින් ඉන්න එකට නේ. ඕකට තමා අපි ජීවත් වෙනවා කියලා කියන්නේ. එතකොට දැන් සති සම්පජඤ්ඤ ගැන අපි බලමු.

"අභික්කනෙත පටික්කනෙත සම්පජානකාරී හොති" [14] - යම් වෙලාවක දී ඉදිරියට ගියොත් ආපහු ආවොත් දැනුම් සහගත බවකින් ම ඉරියව්ව පවත්වනවා. ඒ කියන්නේ අතන මේසය ගාවට ගිහිල්ලා පෑන අරගෙන එන්න කියලා කවුරු හරි කිව්වොත්, ඔබ ඒ මේසය ගාවට ගිහිල්ලා පෑන අරගෙන එනවා කියන සම්පූර්ණ ඒ සිද්ධිය කරනා වූ කමට දැනුම තියාගෙන යනවා මිසක මේසයවත්, පෑනවත් අරමුණු කරගෙන යන්නේ නැහැ. මෙහෙම කරන කොට හරි ඉක්මනට කෙලෙස් ගෙවනවා. මෙතන නැතුව අපිට නිවන් දකින්නත් බැහැ.

"ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති"- වටපිට බලන කොට වටපිට බලනවා කියනකමට දැනුම් සහගතව කරනවා. නමුත් අපි හැමදාම යමක් බැලුවා නම් බැලුවේ බාහිර රූපයට හිත තබලා. ඒ කිව්වේ, වටපිටාවේ මෙහෙම කෙනෙක් දිහා බලලා අනික් කෙනා දිහා බලනවා, නැත්නම් ගහක් දිහා බලනවා, නැත්නම් ගොඩනැගිල්ලක් දිහා බලනවා. අපි යමක් දිහා බැලුවේ එහෙමයි.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ *"ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති"* වටපිට බලන කොට වටපිට බලනවා කියනකමට දැනුම් සහගතව කරන්න. ඒ කියන්නේ යමෙක් කිව්වොත් "හාමුදුරුවනේ, මෙන්න මේ දිහා බලන්න" කියලා, කියපු කෙනා දිහා හෝ ශබ්දය ඇහිච්ච පැත්තට හැරෙන්න ඕන නම්, මම මගේ බෙල්ල හරවලා ඒ පැත්ත බලනවා කියන එකට දැනුම් සහගතව බෙල්ල හරවනවා.

ඒ කියන්නේ මම බාහිර රූපයට හිත තියලා එක පාරට බලන්නේ නැහැ. මම බලන කොට 'බලනවා' කියන එක දැනුම් සහගතව කරනවා. බලනවා කියන සිද්ධිය ගැන හොඳට මම දන්නවා, දැන ගෙන ම බලනවා. එහෙම බලන කොට එක දශමයක්වත් රූපය පැත්තට අපේ මනස නැඹුරු වෙන්නේ නැහැ.

---

[14] https://tipitaka.lk/dn-1-11 - **කේවට්ඨ සූත්‍රය- දීඝ නිකාය 1- 504 පිටුව**

"සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති". අපි මොනවා හරි දෙයක් ගන්න හදන කොට අතපය හකුලන කොට, දිගහරින කොට නුවණින් දැන ගෙන කරන්න. අපි නිකන් ම අතපය හකුලනවා, දිගහරිනවා නෙවෙයිනේ. මොනවා හරි ගන්නවා, තබනවා වගේ ක්‍රියාවක් නේ අත දිගහරිනවා, හකුලනවා කියන එකෙන් කරන්නේ.

එතකොට අපි වෙනදට කරන්නේ යම් වස්තුවක් දිහා බලලා ඒක ගන්න එක හෝ තබන එක නේ. බාහිර ආයතනයට නැමිලා එහෙම කරනවා කියන්නේ ම අපි මාරයාගේ බිමේ ම යි ඉන්නේ බණ ඇහුවට. නමුත් සතිපට්ඨානය තුළ වාසය කරනවා කියන්නේ; වස්තුවට අත දික් කරන කොට දැනුම් සහගතව ම අත දික් කරනවා, දැනුම් සහගතව ම අත හකුලනවා.

මම ඒක උපායශීලීව කරන විදිහ පෙන්වන්නම්. මේ වටාපත මේසය උඩ තියෙනවා. මට මේ වටාපත ගන්න ඕනේ වෙන කොට මම වෙනදාට කළේ, අසිහියෙන් මෙහෙම බැලුවා ක්ෂණිකව වටාපත ගත්තා. කෙලින් ම මගේ හිතයි, කයයි ඔක්කොම තියෙන්නේ මාරයාගේ පැත්තේ/ බාහිර ආයතන පැත්තේ.

නමුත් දැන් හොඳට සිහියෙන් අත හකුලනවා, දිගහරිනවා කරනවා. දැන් වටාපත ගන්න අත ගෙනියනකමටත් මට නුවණයි. ඒ වස්තුව අරගෙන එන කමටත් මට නුවණයි. ඒකෙන් මම මතක් කළේ, අපි වෙනදට පෙනෙන දේ එක පාරට අත දාලා ගන්න එක නේ කළේ. නමුත් සතිපට්ඨානය තුළ පිහිටි සිහියෙන් ම දැන ගෙන කරන කොට මේ වස්තුව ගන්න අත දිගහරින කමටත් සිහිය යි. ආපහු ඒක ගත්ත කමටත් සිහිය යි. අත හකුලනවා, දිගහරිනවා කියනකමට සිහියෙන් තමයි ගත්තේ.

ඊට පස්සේ අපි මොනවා හරි ආහාරයක් කන කොට, බොන කොට වෙන කොහේ හරි තියෙන මොනවා හරි දෙයක් සිහි කරමින් නේ කන්නේ බොන්නේ. නමුත් අපි දැන් ආහාර ටික ගන්න කොට ආහාර ටික අනනවා

කියන එකත් තමන් දැනුම් සහගතව ම කරනවා. අනපු බත් ටික කට ළඟට ගෙනියනවා කියන එකත් දැනුම් සහගතව ම කරනවා. හපනවා කියන එකත් දැනුම් සහගතව ම කරනවා. ගිලිනවා කියන එකත් දැනුම් සහගතව ම කරනවා.

අපි බොන්න වතුර වීදුරුවට අත දාන කොට කෙලින් ම වීදුරුව දිහා බලලා, ඇහැත් එළියට දාගෙන හිතත් එළියට දාගෙන ඉන්නේ නැහැ ඉස්සර වගේ. වතුර වීදුරුව ගන්න අත දානකම ගැනත් හොඳට දන්නවා, වතුර වීදුරුව අරගත්ත කමත් දන්නවා, වතුර බොන කොට බොන බව හොඳට දැනුම් සහගත බවක ම කරනවා.

ඊට පස්සේ, *"සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති"* - භික්ෂූන් වහන්සේලා චීවරය පොරවන කොට බැහැර එක එක අය ගැන, එක එක දේවල් ගැන හිත හිත චීවරය පොරවන්නේ නැහැ. සිවුර පොරවන කොට මුළු හිත ම ගෙතිලා තියෙන්න ඕන කය පැත්තේ. සිවුර අරගෙන සිවුර කයට දාන කොට සිවුර අඳින පොරවන එක දැනුම් සහගතව ම කරන්න ඕන.

ගිහි පින්වතුන් නම් කමිසයේ බොත්තම් ටික දාන කොට කමිසයේ බොත්තම් ටික දානකම ගැන දැනුම් සහගතව බොත්තම් ටික දාන්න. සපත්තුවේ ලේස් එක ගැට ගහන කොට වෙන එක එක අය ගැන, එක එක දේවල් හිතින් හිතන්නේ නැතුව සපත්තුවේ ලේස් එක ගැට ගහන බව දැනුම් සහගතව ගැට ගහන්න. මේක කරලා බලන්න හරිම පුදුම යි. හරි ඉක්මනට කෙලෙස් ගෙවෙනවා. බාහිර ස්පර්ශ ආයතන හය පැත්තට යන්නේවත් නැහැ.

දැන් මම මේ බණ ටික මේ පින්වතුන්ට දේශනා කරනවා, දේශනා කරන බව දැනුම් සහගතව ම. එතකොට බැහැර අහවල් කෙනාටයි, අහවල් අයටයි බණ කියන්නේ කියලා බාහිර කෙනෙක්ව, පුද්ගලයෝ හසුවෙන්නේ නැහැ. හැබැයි බණ කියනවා, බණ කියන බවට සිහියෙන්.

එතකොට මට බණ කියන 'බවයි' හසුවෙලා තියෙන්නේ මිසක බැහැර අහවල් කෙනාටයි, අහවල් අයටයි බණ කියන්නේ කියලා අහුවෙන්නේ නැහැ. මෙන්න මේ විදිහට යම් යම් වැඩක් කරනවා නම් කරන කරන දේ සිහියෙන් කරනවා. එතකොට මට ඒ වැඩේ කරන කය හසුවෙනවා මිසක බාහිර ආයතන අහුවෙන්නේ නැහැ.

එක තැනක ඉන්න කොට ආනාපානසතිය වඩනවා. ඉඳගෙන ආනාපානාසති භාවනාව කරලා ඉවර වෙලා හිටගන්න කොට තමන් දැනුම් සහගතව හිටගන්නවා. තමන් ඇවිදින කොට ඇවිදිනවා කියලා දන්නාකමින් ම ඇවිදිනවා. ඉඳගන්න කොට දන්නාකමෙන් ම ඉඳගන්නවා. නිදාගන්න කොට දන්නාකමින් ම නිදාගන්නවා.

එතකොට ඔබ හතර ඉරියව් දැක්වූයේ නැහැ මාරයාගේ භූමියේ. ඔබ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම ටිකේ සක්මන් කෙරුවේ නැහැ. ඔබ පංච උපාදානස්කන්ධයක සක්මන් කළේ නැහැ. ඔබ සක්මන් කළේ ඔබ සතර ඉරියව්වෙන් වාසය කළේ ජීවත් වුණේ මාරයාට අහුවෙන්නෙවත් නැති මාරයාට දකින්න බැරි පියා සතු ඉඩමේ.

ඒ විදිහට මොනවා ම හෝ වැඩ කටයුත්තක් කරන කොට කය කෙරෙහි පිහිටි සිහියෙන් කරන්න. වෙනදට කඩේ යන කොට එක එක දේවල් හිතමින් නේ ගියේ. අද කය කෙරෙහි පිහිටි සිහියෙන් ම කඩේට යනවා. එතකොට ඔබ වැඩ කටයුතු කළේ නැහැ මාරයාගේ භූමියේ ඉඳගෙන. පංච උපාදානස්කන්ධයක හැසිරුනේ නැහැ. ඔබ පියා සතු භූමියේ ඉඳගෙන වැඩ කටයුතු කළේ වෙනවා.

ඊට අමතරව ***"අපථී ඉමසම්ිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු..."***[15]- මේ කය පැත්තට හිත යොමු කරලා කෙස් ලොම් නිය

[15] https://tipitaka.lk/sn-4-1-13-4 - **භාරද්වාජ සූත්‍රය- ගහපති වර්ගය- සළායතන සංයුත්තය- සංයුක්ත නිකාය 4- 230 පිටුව**

දත් සම් මස් නහර මේ වගේ කොටස් තියනවා නේද කියලා ඒ කොටස්වලට සිහිය පවත්වන්න පුළුවන්.

එහෙම නැත්නම්, ***"අත්ථි ඉමසම්ං කායෙ පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු"*** [16] - මේ ශරීරය පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු කියලා ධාතු වශයෙන් නුවණින් මෙනෙහි කරමින් ඒ කොටස්වලට සිහිය පිහිටුවා ගන්නත් පුළුවන්.

එතකොට ඔබට ආශ්වාසය ප්‍රශ්වාසය වශයෙනුත් කයේ සිහිය පිහිටියා. ඊට පස්සේ හතර ඉරියව්වේ සිහියේ පිහිටියා. යම් යම් වැඩ කටයුත්තක් කරන කොට කරන කරන දේ සිහියෙන් කරනවා. ඒ කියන්නේ යමක් ගන්න අත දිගහරින කොට අත හකුලන කොට ඒ වස්තුව අල්ලන්න අත දිගහරින කමටත්, අත ආපහු ගන්නකමත් දැන ගෙන කරනවා.

වටපිට බලන කොට, වටපිට බලනකමට ඒ කියන්නේ මුහුණ, ඇස් දෙක හරවනවා කියන පැත්තේ දැනුම් සහගත බවකින් ම වටපිට බලනවා. කතා කරන කොට කතා කරනවා කියන දැනුම් සහගත බවකින් ම කතා කරනවා. කන කොට, බොන කොට කනවා, බොනවා කියන එක පිළිබඳ දැනුම් සහගතව ම කරනවා. මොනවද කන්නේ, මොනවද බොන්නේ කියන එක හසුවෙලා නැහැ. නුවණින් දන්නවා, නමුත් බාහිර රූපය මත විඤ්ඤාණය පිහිටලා නැහැ. පාත්‍ර සිවුරු දරන කොට නැතිනම් ඇඳුම් අඳින කොට අඳිනකමට නුවණයි.

මෙතැනදී මට පෙන්වන්න ඕනේ පින්වතුනි, මෙන්න මේ ටිකේ අවබෝධය වැරදුණු කමයි මේ ශාසනයට වැරදුනේ. සතිපට්ඨානය කියන්නේ තව වාසය කටයුතු බිමක් හැටියට අපි හඳුනගත්තේ නැහැ. මාරයාට අහුවෙන්නේ නැතුව ජීවත් වෙන්න ඕනේ තැනක් හැටියට අපි දැන ගෙන හිටියේ නැහැ.

---

16 https://tipitaka.lk/dn-2-9 - **මහා සතිපට්ඨාන සූත්‍රය- දීඝ නිකාය 2- 446 පිටුව**

අපි වැරදි, වැරදි හෝ අමාරුවෙන් හරි ටික ටික පුරුදු කටයුතු තැනක් හැටියට අපි හඳුනා ගත්තේ නැහැ මේ සතිපට්ඨානය. අලුතෙන් අද දවසේ දී මට පෙන්නන්නට ඕනේ වුණේ ඔය කාරණාව. ශාසනයේ ආපහු රහතන් වහන්සේලාගෙන් හිස්වෙන්නේ නැති දවසකට එයි. ඒ නිසා හැම කෙනෙක් ම සතිපට්ඨානයෙන් වාසය කරන්න හුරු කරන්න. අද ඔබට සතිපට්ඨානය වඩන්න බැහැ කියලා කියන්නේ, බැරි නිසා නෙමෙයි ඔබ ඒක කරන විදිහ දන්නේ නැති නිසා.

'කාමාස්‍රව' කියන්නේ; ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩකඩම් ම ඇසුරු වෙච්ච හුරුවක් තියෙයි. 'භවාස්‍රව' කියලා කියන්නේ බාහිර ගෙවල් දොරවල් ඉඩකඩම් බැහැර වස්තු තියෙනවා කියලා හිත බැහැරට ම යොමු වෙච්ච හුරුවක් තියෙයි.

'දිට්ඨාස්‍රව' කියලා කියන්නේ තව සත්ත්වයෝ, පුද්ගලයෝ ඉන්නවා කියලා සත්ත්ව පුද්ගලයන් ඉන්නා බවට ඇසුරක හුරුවක් ම තියෙයි. එතකොට මේ කය පැත්තේ සිහිය තබා ගෙන ඉන්නවා කියලා කියන්නේ කාමයට යන හුරුව, භවයට යන හුරුව, දිට්ඨියට යන හුරුවට ප්‍රතිපක්ෂව ඉන්නවා කියන එක.

'ඕඝ' කියන්නේ සැඩ පහරට, සැඩ පහරකට හසුවුණොත් ගහගෙන ම යනවා නේ. ඒ වගේ කය කෙරෙහි සිහිය තබාගෙන ම ජීවත් වෙන්න කියලා කිව්වට මොන විදිහටවත් අද දවසේ දී කය කෙරෙහි සිහිය තබා ගෙන ජීවත් වෙන්න ඔබට බැහැ. ගහගෙන යනවා පංච කාමය පැත්තට ම. දරුවා ගැන ම හිතනවා, ගෙදර ගැන ම හිතනවා, මුදල් ගැන ම හිතනවා, ඉඩකඩම් ගැන ම හිතනවා. එහෙම කාම භාණ්ඩ තියෙනවා කියලා හිතනවා නේ. ඒකට කියනවා 'කාම ඕඝ' කියලා.

අරහේ යන එක ගැනත් හිතනවා, මෙහේ යන එක ගැනත් හිතනවා, අතන ගැනත් හිතනවා, මෙතන ගැනත් හිතනවා කියලා බාහිර ආයතන

පැත්තට ම හිත නැඹුරු වෙනවා. ඒකට කියනවා 'භව ඕඝ' කියලා. සත්ත්වයෝ ඉන්නවා, පුද්ගලයෝ ඉන්නවා කියන තැනකින් ම හිතන පැත්තට ගහගෙන යනවා. ඒකට කියනවා 'දිට්ඨි ඕඝ' කියලා.

සැඩ පහරක් වගේ තමන්ව ස්පර්ශ ආයතන හය පැත්තට, එනම් මාරයාගේ භූමිය පැත්තට ගහගෙන යද්දි, පහතට වේගයෙන් ගලන සැඩපහරක උඩහට පීනනවා වගේ සතිපට්ඨානය තුළ වාසය කරනවා කියලා කියන්නේ.

ස්පර්ශ ආයතන හය පැත්තට, මාරයාගේ භූමිය පැත්තට කාම, භව, දිට්ඨි, අවිජ්ජා කියන සැඩපහරට අහුවෙලා ඔබව ගහගෙන යද්දි, ඒ පැත්තට ගහගෙන යන්න බැරි වෙන්න ඔබට කය කෙරෙහි සිහිය පිහිටුවා ගන්න හොඳ උත්සාහයක් තියෙන්න වෙයි. බලන්න; වායාම, සති, සමාධි - උත්සාහයෙන් සිහිය පිහිටුවා ගෙන හිත සමාධි කර ගන්න තියෙන්නේ.

අද මම මේ කියලා දෙන දේ තේරුම් ගන්න බලන්න. නිදුකින් පහසුවෙන් නිවන් දකින්න පුළුවන් බිමක් තියෙයි වාසය කරන්න. පංච උපාදානස්කන්ධ ලෝකයේ වාසය කරන්නේ නැතුව සිය පියාගෙන් උරුම වෙච්ච මාරයාට පෙනෙන්නේ නැති, මාරයාට අවකාශ නැති, මාරයාට අරමුණු වෙන්නේ නැති තැනක ජීවත් වෙන්න තැනක් තියෙයි. ඒ තමයි සතිපට්ඨානය කියලා හාමුදුරුවෝ කිව්වා.

ඒත් මට ඒක කරන හැටි තේරෙන්නේ නැහැ කියලා ඔබට තේරුණොත්, ඒක කොහොමද කරන්නේ කියලා දැන ඉගෙන ගන්න තියෙනවා කියන කාරණාවකුත් තේරුම් ගන්න. කෙටියෙන් ගත්තොත් සතිපට්ඨානය කියන්නේ අවස්ථාවට කුණප කොටස් හෝ ධාතු වශයෙන් මෙනෙහි කරලා ආපහු රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතනවලට නැමිලා හිතිමි, කිමි, කිරිමි කරමින් ඉරියව් දක්වමින් වැඩ කටයුතු කරන එක නෙවෙයි.

පින්වතුනි, අපි කවුරුවත් හිතලා කෙලෙස් කර්ම ඇති කර ගන්නේ නැහැ. අපි ජීවත්වෙන ක්‍රමයට කෙලෙසුත් ඇතිවෙලා, කර්මත් රැස්වෙලා, දුකට හිමිකාරයකුත් වෙනවා. දුකත් විඳලා, දුක ඇතිවෙන හේතුවත් (තණ්හාව) හඳා ගන්නවා.

බාහිර ආයතන පැත්තට නැඹුරු වෙලා ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව්වක් පවත්වමින් හතර ඉරියව්වේ ම මොනවා හරි හිතීම්, කීම්, කිරීම් කරනවා කියන එකට තමයි ලෝකේ තුළ ජීවත් වෙනවා කියලා කියන්නේ. මෙන්න මේ විදිහට ජීවත්වෙන කෙනාට කෙලෙස් කර්ම ඉබේ ම රැස්වෙනවා.

බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වුණේ අමුතුවෙන් භාවනාව කියලා එකක් පෙන්නන්න නෙමෙයි. ප්‍රතිපදාවක් පෙන්නුවා මෙන්න මේ විදියට හැසිරෙන්න. මෙන්න මේ විදියට ජීවත් වෙන්න. එතකොට දුක නැති වෙනවා කියලා. සතර සතිපට්ඨානය තුළ වාසය කිරීම කියන්නේ දුක් නැති කිරීමේ ප්‍රතිපත්තියක්, ජීවත් වීමක්.

බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වුණේ යම් විදිහකට ජීවත් වෙනවා ද, ඒ විදිහට ජීවත්වෙන කොට කෙලෙස් නැති වෙලා, කර්ම ක්ෂය වෙලා, නිවන සාක්ෂාත්වන, දුකත් නිරුද්ධවන ක්‍රමයක් පෙන්නන්න. සතිපට්ඨානයෙන් වාසය කරන්න කිව්වෙ ඒකට. සතිපට්ඨානය කියන්නේ ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව්ව ම රක්ෂිත ස්ථානයක තබාගෙන වැඩ කටයුතු කරන්න හුරුවෙන එකට. ඒකයි ප්‍රතිපත්තිය. ඔතනයි අපිට වැරදුනේ.

කොච්චර බණ ඇහුවත් බාහිර රූපය දිහා ම බලාගෙන ඇවිදින, ඉඳගෙන, හිටගෙන, නිදාගෙන ඉන්න ඕගොල්ලෝ කණුවක දම්වැලකින් බඳින ලද බල්ලා කණුව වටේ සක්මන් කළා වගේ පංච උපාදානස්කන්ධයක ම සක්මන් කරන කොට, පංච උපාදානස්කන්ධයේ ම වැටිලා ඉන්න ඔබ පංච

උපාදානස්කන්ධය පිරිසිඳ දකිනවා, පංච උපාදානස්කන්ධයෙන් මිදෙනවා කියන එකක් වෙයි ද? නැහැ.

පංච උපාදානස්කන්ධයෙන් මිදෙන්න නම් පංච උපාදානස්කන්ධය පිරිසිඳ දකින්න නම් ඒකෙන් අපි බැහැර වෙන්න ඕනේ. ඒ නිසා මේ සතර ඉරියව්වේ කරන, කියන හැම දෙයක් ම සිහි නුවණින් දැනගෙන කරන්න වෙනවා. ඉඳගෙන ඉන්න කොට ආනාපානසතිය වඩන්න. අනිත් වෙලාවේ දී ධාතු වශයෙන්, අසුභ වශයෙන් මෙනෙහි කරමින් මෙන්න මේ වගේ අඛණ්ඩව කය කෙරෙහි සිහිය පිහිටුවා ගන්න උත්සාහවත් වෙන්න ඕනේ.

මෙන්න මෙහෙම සිහිය පිහිටුවා ගන්න උත්සාහවත්වන කොට බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම අනුව යන මනස වළකිනවා. බාහිර අරමුණුවල හිත විසිරෙන්නේ නැතුව ආධ්‍යාත්මයේ ම හිත පිහිටන්න හුරු වෙනවා. සතිපට්ඨානය කියලා කියන්නේ නිවන් දකින කෙනා ජීවත්වෙන පොළොවක් හැටියට හඳුන ගන්න ඕනේ. ඒ බව හඳුනා නොගත්තකම තමයි අපි හැමෝටම වැරදුණ තැන. බණ ඇහුවට මනසවල් සංසිඳෙන්නේ නැත්තේ ඒ නිසයි.

~ සතිපට්ඨානයෙන් වාසය කරන කොට වෙන දේ ~

හොඳට බලන්න, කය කෙරෙහි සිහිය පිහිටුවා ගත්ත ගමන්, කය කෙරෙහි දැනුම් සහගතව ඉන්න කොට ම එයාට අතීත අනාගත දෙක අරමුණු කරන්න බැහැ. අතීත අනාගත දෙක අරමුණු කරන්නේ නැහැ විතරක් නෙවෙයි. වර්තමානයක ඇහැ, රූප, කන, ශබ්ද, නාසය, ගන්ධ, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම කියන මේ ආයතන දොළහෙන් ම සම්පූර්ණ මුදවලා තියෙයි. ඒ දොළහේ හැසිරෙන්නේ ම නැහැ.

"මජ්ඣේ මනතා න ලිපපති" [17] වර්තමානයක (මැද) ද තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ඇලෙන්නේ නැතුව ඉන්නවා. එතකොට මෙන්න මේ විදිහට හොඳට සිහිය පිහිටුවා ගන්න කටයුතු කළ යුතුයි. දැන් ඔය මම මතක් කළේ සතිපට්ඨානය විතරයි.

~ සිහිය පිහිටවාගෙන නුවණින් මෙනෙහි කරන ආකාරය ~

එහෙම සිහිය පිහිටුවා ගෙන සිහියට හසුවෙලා තියෙන කය නුවණින් බැලිය යුතුයි. ***"සමුදයධම්මානුපසසී කායසමිං විහරති ආතාපී සමපජානො සතිමා විනෙයය ලොකෙ අභිජඣාදොමනසසං. වයධම්මානුපසසී කායසමිං විහරති ආතාපී සමපජානො සතිමා විනෙයය ලොකෙ අභිජඣාදොමනසසං. සමුදයවයධම්මානුපසසී කායසමිං විහරති ආතාපී සමපජානො සතිමා, විනෙයය ලොකෙ අභිජඣාදොමනසසං."*** [18] කියලා කියන්නේ 'සම්පජඤ්ඤ' නුවණින් මෙනෙහි කිරීමට. තව පැත්තකින් ඕක **සතිපට්ඨාන භාවනාව** කියලා කියනවා.

හොඳට මතක තබා ගන්නට ඕනේ මේ නුවණින් මෙනෙහි කරන එක සිහිය පිහිටුවාගෙන සිහියට හසුවෙච්ච කයෙයි බලන්නේ. අන්න ඒ තුළින් ඔබට විදර්ශනාව ගෙනත් දෙනවා. තව පැත්තකින් ***"විනෙයය ලොකෙ අභිජඣාදොමනසසං"*** [19] පංච උපාදානස්කන්ධ ලෝකයේ ලෝභ ද්වේශ දෙක ඇති නොවෙන විදිහට නුවණින් බැලිය යුතුයි, සිහිය පිහිටුවා ගෙන.

ඒකෙන් මම මතක් කළේ වෙනදට අපි මේ ශරීරය පැත්තට යොමු වෙලා කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක්, සතර මහා ධාතු යි කියලා බලනවා නේ. ඔහොම බලන කොට වෙන්නේ බැහැර ඉඳන් මේ කය

---

[17] https://tipitaka.lk/an-6-2-1-7 - **මජ්ඣේ සූත්‍රය- මහා වර්ගය- ඡක්කනිපාතය- අඞ්ගුත්තර නිකාය 4- 186 පිටුව**

[18] https://tipitaka.lk/sn-5-3-4-10 - **විභඞ්ග සූත්‍රය- අනනුස්සුත වර්ගය- සතිපට්ඨාන සංයුක්තය- සංයුක්ත නිකාය 5- 326 පිටුව**

[19] https://tipitaka.lk/ap-vbh-7 - **සතිපට්ඨාන විභඞ්ගය- විභඞ්ගප්‍රකරණය- 342 පිටුව**

දිහා බලන එක. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියලා බාහිර ආයතන හයේ පිහිටලා, පංච උපාදානස්කන්ධයක පිහිටලා, ලෝකයේ පිහිටලා අවස්ථාවට කය කෙරෙහි බලපු එකක් වෙන්නේ එතකොට.

"කායෙ කායානුපස්සී විහරති" කයෙහි කය අනුව බලනවා කියන්නේ, ඉස්සෙල්ලා ම කයෙහි හොඳට සිහිය පිහිටුවා ගන්න. සිහිය පිහිටුවා ගෙන කය අනුව බලන්න. ඒ කියන්නේ මම ඉඳගෙන ඉන්න කොට බැහැර රූප, ශබ්ද ආදී කිසි දෙයක් හසුවෙන්න ඉඩ දෙන්නේ නැතුව 'ඉඳගෙන ඉන්නවා' කියලා දන්නා වූ කමින් ඉස්සෙල්ලා මේ කයේ සිහිය පිහිටුවා ගන්නවා. ඒ ඉඳගෙන ඉන්නවා කියන ඉරියව්වට සිහිය පිහිටුවා ගෙන ඊට පස්සේ ඒ කයේ යථා ස්වභාවය ගැන නුවණින් බලන්න ලෝභ, ද්වේශ දෙක ඇති නොවෙන විදිහට නුවණින් බලන විදිහ මම කියලා දෙනවා දැන්

එතකොට ඒ නුවණින් මෙනෙහි කරන එක ආනාපානසතිය වඩමිනුත්, ඉරියව් දක්වමිනුත්, මොනවා හරි වැඩ කටයුතු කරමිනුත් හිතන්න පුළුවන්. හොඳට මතක තියාගන්න; ආනාපානසතියට හෝ ඉරියව්වලට හෝ කරන කරන දේට ඉස්සෙල්ලා සිහිය පිහිටුවා ගන්නට ඕනේ සිහිය බැහැරට යන්න නොදී. ඊට පස්සේ සිහියට හසුවෙලා තියෙන, සිහිය පිහිටුවා ගෙන ඉන්න කයේ ඇත්ත ඇති හැටිය පෙන්නනවා.

"අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති" මේ ශරීරය ගැන හොඳට පෙන්නනවා; කෙස්, ලොම්, නිය, දත්, සම්, නහර කුණප කොටස් තියෙන්නේ කියලා හෝ මේ කය යම් සේ පවතී ද, යම් සේ පිහිටා පවතී ද එසේ ඇත්ත ඇති සැටියෙන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ සතර මහා ධාතු වශයෙන් හෝ පෙන්වනවා.

"සමුදයධම්මානුපස්සී වා කායසම්ං විහරති, වයධම්මානුපස්සී වා කායසම්ං විහරති" - කනබොන ආහාරය නිසා මේ රූපය ඇති වෙනවා නේද, කනබොන ආහාරය නැති වුණොත් නැති වෙනවා නේද කියලා පෙන්වනවා.

තවත් ඕනේ නම් පෙන්නනවා; මේ කය ඇසුරු කර ගෙන පවතින හිත නිසයි නේ මේ කය පවතින්නේ. විඤ්ඤාණය මේ කයෙන් නිරුද්ධ වුණොත් ඉදිමිලා, නිල්වෙලා, පුපුරලා යන ස්වභාවයෙන් යුක්තයි නේද මේ කය කියලා නවසීවථිකයත් හසුවෙන විදිහට පෙන්වනවා.

එහෙම පෙන්නලා, ප්‍රපංච පැත්තත් පෙන්නනවා. මේ කය දකින කොට, මේ 'මම' කියලා හිතෙනවා. 'මම' කියලා කය දිහා බලනවා. නමුත් මේ කයේ ස්වභාවය අනාත්මයි නේද කියලා නුවණින් පෙන්වනවා. එහෙම පෙන්නුවට හිත පිළිගන්නේ නැහැ. හිතට හිතෙන්නේ, 'මේ කය මම ම යි' වගේ.

එතකොට ඔබ පොඩි උපායක් කරන්න. මේ රූපය ටීවී එකක තිබුණොත් හෝ පත්තර කඩදාසියක තිබුණොත් කොහොමද කියලා බලනවා. එතකොට තමන්ගේ හිත කියයි, ඒ රූපය දැක්කත් 'මම' කියලා හිතෙයි. 'මම' කියලා ඒ දිහා බලනවා නේද කියලා.

එතකොට හොඳට තේරෙනවා මේ රූපය කණ්ණාඩියේ තිබුණත්, ටීවී එකේ තිබුණත්, පත්තරේ තිබුණත්, 'මම' කියලා පෙනුනට 'මම' කියලා බැලුවට ඒ රූපය කෙනෙක් නෙමෙයි කියලා හොඳට තේරෙනවා. එහෙම පෙන්නුවහම ඒ අරමුණේ දී රූපය අනාත්ම යි. මට ඒක ආත්මව පේනවා කියලා ස්කන්ධ සහ කෙලෙස් වෙන්වෙලා පේනවා අපිට.

නමුත් මේ කය 'මම' කියලා පෙනෙන තැන දී; කනබොන ආහාරයෙන් හැදෙන රූපය අනාත්ම යි. මට ආත්මව පේනවා කියලා ස්කන්ධ සහ කෙලෙස් වෙන්වෙලා පෙනෙන්නේ නැහැ. ඒ නිසා කලින් උපමාව ඔසවලා තබනවා මෙතනට. එහෙනම් මෙතන ද, අනාත්ම වූ කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක් තියෙන රූපය දකින කොට 'මම' කියලා පේනවා නේද කියලා බලනවා.

කය ‘මම’ කියලා පෙනුනට, රූපයේ ඇත්ත ස්වභාවය කුණප කොටස් ටිකක් ධාතු ටිකක්, අනාත්ම යි නේද කියලා ඔහොම බලලා ආපහු ඉරියව්වේ හොඳට සිහිය පිහිටුවා ගන්නවා.

“බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති”, කියන කොට තමන්ට උපාදාන වශයෙන් හසුවෙච්ච ස්කන්ධ ටික ගන්නවා. උපාදානස්කන්ධ ටික තමයි පිරිසිඳ දකින්න ඕනේ. මොකද, *“විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං”* - පංච උපාදානස්කන්ධ ලෝකයේ ලෝභ, ද්වේශ දෙක දුරු කරන්න තියෙන්නේ.

මට වැඩිම උපාදාන වෙලා තියෙන, වැඩිම හිත බැඳිලා තියෙන, ඒ දේවල් නැති වුණොත් මට දුක එයි කියලා හිතෙන රූප ගන්නවා. විශේෂයෙන් ම ගන්න සවිඤ්ඤාණක වස්තු. ඒ කියන්නේ මට; ‘අම්මා’, ‘දුව’, ‘පුතා’, ‘දරුවා’ කියලා හම්බවෙච්ච රූප ගන්නවා.

‘දරුවා’ සිහි කර ගන්නවා. බැහැර තියෙන රූපයේ කෙස්, ලොම්, නිය, දත්, සම් මස්, නහර කියන කුණප කොටස් ටිකක් නේ තියෙන්නේ. කෙස් ටික කපලා බිමට දැම්මොත් කෙස් කියලා පෙනෙනවා මිසක ‘දරුවා’ කියලා පෙනෙන්නේ නැහැ නේ.

ඒ ශරීරයේ තියෙන කෙස්, ලොම්, නිය, දත් කියන්නෙත් බාහිර ගස් වැල්වල තියෙන පඨවිය ම යි. ගස් වැල්වල තියෙන පඨවිය යි කෙස්, ලොම්, නිය, දත්වල තියෙන පඨවිය යි සමාන යි. ගස් වැල්වල තියෙන පඨවි ධාතුව සත්ත්වයෙක්, පුද්ගලයෙක් නොවෙනවා වගේ ඒ ශරීරයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, සම් කියන පඨවි ධාතුව සත්ත්වයෙක්, පුද්ගලයෙක් නෙවෙයි.

ඒ වගේ ‘දරුවා’ කියලා අපිට හසුවෙච්ච රූපය ගැන නුවණින් බලනවා. *“සමුදයධම්මානුපස්සී වා කායසම්ං විහරති”* - කනබොන ආහාරය

නිසයි රූපය හැදෙන්නේ, *"වයධම්මානුපස්සී වා කායසම්ං විහරති"*, කනබොන ආහාරය නැති වෙනවා නම් නැති වෙනවා නේද කියලා.

මොකද, ශරීරයෙන් විඤ්ඤාණය නිරුද්ධ වුණාහම ආහාර දෙන්න බැහැ. ආහාර නැතිවෙන කොට රූපය නැති වෙනවා. එතකොට රූපය ඉදිමිලා, නිල්වෙලා, පුපුරලා යනවා නේද කියලා පෙන්නනවා. එහෙම රූපයේ යථා ස්වභාවය පෙන්නලා, එබඳු කනබොන ආහාරයෙන් හැදුණු රූපය දකින කොට, රූපය 'මගේ දරුවා' වගේ පෙනෙන, උපාදානය මගේ මනසේ පහළ වෙනවා කියන එක පෙන්නන්නයි මෙහෙම කරන්නේ.

මගේ උපාදානයට හසුවෙලයි මේ රූපය තියෙන්නේ කියන එක පෙන්නන්නයි මෙහෙම කරන්නේ. සිහිය සහ නුවණ නැති වුණොත් ඒ සතර මහා ධාතු රූපය දකින කොට මට පෙනෙන්නේ 'දරුවා' වගේ ම යි. මම ඒ දිහා බලන්නෙත් 'දරුවා' වගේ. එතකොට මට හරි ආදරයක්, සෙනෙහසක් ඒ රූපය කෙරෙහි හිතෙනවා, පතින වෙනවා.

රූපය සතර මහා ධාතු යි, කනබොන ආහාරයෙන් හැදෙන අනාත්ම වූ ස්කන්ධ ටිකක් තියෙන්නේ. ඒ රූපය දකින කොට 'දරුවා' කියලා මට පෙනෙනවා කියලා ස්කන්ධ සහ කෙලෙස් ටික වෙන් කරලා පෙන්නුවට හිත පිළිගන්නේ නැහැ. 'රූපය දරුවා ම යි' කියන තැනකින් හිතෙන්නේ. එච්චරට අපි උපාදාන යි.

එතකොට අපි පොඩි උපායක් කරනවා, ඔය රූපය ම ටීවී එකේ දැක්කොත් කියලා. ටීවී එකේ වීදුරු තිරයක් තියෙන්නේ. ඒ වීදුරු තිරයෙන් එහා පැත්තේ වයර් කෑලි තියෙනවා. අහසින් ක්ෂුද්‍ර තරංග ටිකක් එනවා. ඒ ස්ක්‍රීන් එකේ ඩොට් ටිකකින් හැදෙන රූපය දකින කොට මට, 'දරුවා' කියලා පෙනෙයි. ඒ රූපය දිහාත් මම, 'දරුවා' කියලා බලයි.

පත්තරයක් ගත්තොත් කඩදාසියකුයි, තීන්ත ටිකකුයි තියෙයි. ඔය රූපය ම පත්තර කඩදාසියක තිබුණොත් ඒත් 'දරුවා' කියලා මට පෙනෙයි. 'දරුවා' කියලා බලයි. හොඳට තේරෙනවා, මට පත්තර කඩදාසියේ තියෙන රූපය දකින කොට 'දරුවා' කියලා පේනවා. මම 'දරුවා' කියලා බලනවා කියලා.

නමුත් රූපය කියන්නේ ටීවී එකේ තිරයේ ඇතිවෙච්ච ඩොට් ටිකකින් හැදිච්ච එකක්. පත්තර කඩදාසියක තීන්ත ටිකක් තියෙන තැනක චිත්‍රයක්. නමුත් ඒ චිත්‍රය මගේ උපාදානයට හසුවෙලා, මට පේන්නේ දරුවා ම යි කියලා රූපයේ යථා ස්වභාවය හා උපාදානය වෙන්වෙලා පෙනෙනවා ඒ උපමාව හොඳින් විමසන කොට.

ඒ උපමාව ඔසවලා හැබෑවට අපිට 'දරුවා' කියලා පෙනෙන රූපයට තබනවා. එහෙනම් මෙතනත් තියෙන්නේ කනබොන ආහාරයෙන් හැදුණු, සතර මහා ධාතු, කුණප කොටස් ටිකක් වූ, සත්ත්ව පුද්ගල නොවන රූපයක්. ඒ රූපය දකින කොට 'රූපය දරුවා' කියලා මගේ මනසේ උපාදානය යෙදෙනවා.

ඊට පස්සේ 'දරුවා' කියලා සතර මහා ධාතු රූපය දිහා බලනවා කියන්නේ ඒ සතර මහා ධාතු රූපය මගේ උපාදානයට හසුවෙලා. ඒ හේතුවෙන් ඒ රූපය කැඩෙන බිඳෙන දවසට දරුවා ලෙඩ වුණු, දරුවා මැරුණු දුක් විඳින්න වෙනවා නේද කියලා පෙන්නනවා.

"අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති" මේ විදිහට ආධ්‍යාත්මික බාහිර කයවල් ගැන බලනවා. කය අනුව එහෙම බලන එකට කියනවා සම්පජඤ්ඤ කියලා. නුවණින් මෙනෙහි කරනවා පංච උපාදානස්කන්ධ ලෝකයේ ලෝභ ද්වේශ දෙක හික්මෙන්න.

කයේ සිහිය පිහිටුවාගෙන වාසය කරනවා. කයෙන් සිහිය බැහැරට ගෙන යන්නේ ම නැහැ. ඔබට පොළොව, ඔබට බිම, ඔබට ඉන්න නිවහන තමයි කය. කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන තමයි ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින්නේ, වැඩ කටයුතු කරන්නේ. ඒ සිහියට හසුවෙලා තියෙන කයේ යථා ස්වභාවයයි නුවණින් පෙන්නන්නේ.

එහෙම නුවණින් පෙන්නන එක වෙන ම ම සිද්ධියක්. ඒ විදිහට බැහැර කයෙත් නුවණින් බලන්න, මේ කයෙත් නුවණින් බලන්න, ඒක ඔබේ 'සම්පජඤ්ඤ'. ඒ වගේ උත්සාහයෙන් කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන පංච උපාදානස්කන්ධයේ ලෝභ ද්වේශ දෙක දුරුවෙන විදිහට නුවණින් මෙනෙහි කරන්න.

මෙන්න මෙහෙම මෙනෙහි කරන කොට ඔබට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන පැත්තට හිත නැමෙන්නේ ම නැහැ, හිත ඒ පැත්තට යන්නේ ම නැහැ. එතකොට මේ කය අනුව සිහිය පිහිටනවා. එතකොට තියෙන තව ලොකු වාසියක් තියෙනවා.

කය අනුව සිහිය පිහිටියහම ඒ මනසට අතීතය අනුව යන්න බැහැ, අනාගතය අනුව යන්න බැහැ, වර්තමානයෙත් ආයතන දොළහ පැත්තට, පංච උපාදානස්කන්ධයට යන්න බැහැ. මාරයාගේ බිමට යන්න බැහැ. කය පැත්තේ ම සිහිය පිහිටුවා ගෙන ජීවත් වෙනවා.

<u>වේදනානුපස්සනාව</u>

එහෙම ජීවත්වෙන කොට පින්වතුනි, ඊගාවට ඉබේම තමන්ට දෙවැනි සතිපට්ඨානය පූරණය වෙනවා. ඒ කියන්නේ මේ කය ඇසුරු කර ගෙන යම්

වේදනාවක් උපදී නම් ඒ වේදනාව පෙනෙනවා. ***"වෙදනාපච්චයා තණ්හා"***,[20] වේදනාව නිසයි තණ්හාව ඇති වෙනවා. වේදනාවේ යථාභූත ස්වභාවය, අනිත්‍ය ස්වභාවය නොදැන නොදැක කවදාවත් ම දුකෙන් එතෙර වෙන්න බැහැ.

රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ පැත්තේ හිත යොමා ගෙන, ඇස් යොමා ගෙන ඉන්න අපිට වේදනාවේ යථාභූත ස්වභාවය පෙනුණොත් නම් තමයි පුදුමේ. කයේ හිත තබාගෙන ඉන්න කොට වේදනාවේ ඇත්ත පේනවා. ස්පර්ශය නිසා හටගන්න වේදනාව ස්පර්ශය නැතිවෙන කොට නැති වෙනවා කියන එක පෙනෙනවා.

අපි උදාහරණයක් විදිහට ගත්තොත්, ඔබට කවුරු හරි ලීයකින් හෝ පොල්ලකින් ගැහුවොත්, ලීය කයට වැදිලා කය තැලුණුකම ඔබ වින්දා මිසක බාහිර ලී කෑල්ල විඳලා නැහැ නේ. එහෙම බැලුවහම බාහිර කිසිම වස්තුවක් විඳලා නැහැ. බාහිර වස්තු ස්පර්ශ වෙච්ච කය ම විඳලා තියෙනවා විතරයි. කාය සම්ඵස්සජා වේදනාවක් විඳිනවා.

නමුත් වේදනාව ස්පර්ශය නිසා හටගෙන ස්පර්ශය නැතිවෙන කොට නැති වෙනවා කියලා වේදනාවේ ඇත්ත ඇති සැටිය දකින්න අපිට සිහි නුවණක් නැතිවෙන කොට අපිට හිතෙන්නේ ඒ සැප, දුක් දෙක ආවේ බැහැරින් කියලා.

පංචකාමය ඇසුරු කරනවා කියලා කියන්නේ අපි තුළ උපදින සැප සහගත වේදනාවන් ඕනේ වුණහම මාරයාගේ භූමියේ තියෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ හොයාගෙන බැහැරට දුවන එකට. ඒවා ගත්තහම අපිට මෙහෙම සැපක් ලැබෙනවා වගේ කියලා හැඟෙන්නේ ඒවා කයට ස්පර්ශ වෙලා ඇතිවෙන වේදනාව රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බවලට බැඳපුකම හින්දයි.

---

[20] https://tipitaka.lk/an-10-2-5-2 - **භය සූත්‍රය- උපාලි වර්ගය- දසක නිපාතය- අඞ්ගුත්තර නිකාය 6 - 330 පිටුව**

කායානුපස්සනාව වඩන කොට ඉබේ ම හිත කය කෙරෙහි තියෙන නිසා කය ඇසුරු කර ගෙන උපදින උපදින වේදනාවන් ප්‍රකට වෙනවා. එතකොට දෙවැනි සතිපට්ඨානය වූ වේදනානුපස්සනාවට එනවා.

<u>චිත්තානුපස්සනාව</u>

වේදනාව පිළිබඳව සිහියෙන් ඉන්න කොට අපිට යම් යම් අරමුණක් නිසා සිත් උපදී නම් උපදින උපදින සිත අපිට ඊගාවට ප්‍රකට වෙනවා. තමන් තුළ උපදින උපදින සිත ගැන නොදන්න නිසයි අපි බාහිරයට යන්නේ. උදාහරණයක් කිව්වොත් අපි ඇහෙන් රූපයක් දිහා බලන කොට ඒ රූපය දකින කොට ම ඒ රූපය අරභයා සරාග සිතක් අපිට ඉපදුණා කියලා හිතමුකෝ.

ඇහැත් රූපයත් දෙක රූප ස්කන්ධය. ඇහැත් රූපයත් තියෙන තැනට සිත බැස ගත්තහම ස්පර්ශය වෙනවා. ස්පර්ශය කියන්නේ නාමය. ‘පෙනෙනවා’ කියන තැන තියෙන්නේ නාම රූප දෙකක්. *“නාමරූපපච්චයා විඤ්ඤාණං”* කියන්නේ පෙනෙනවා කියනකම (නාම රූප) නිසා රාග සිතක් (විඤ්ඤාණය) ඇතිවෙන කොට චිත්තානුපස්සනාවක් නැහැ අපිට. ඒ රූපය දකින කොට රාග සිතක් අපි තුළ ඇති වුණා කියලා අපිට පෙනෙන්නේ නැහැ.

චිත්තානුපස්සනාව නැති අපිට නාම රූප දෙක නිසා උපන්න විඤ්ඤාණය ආපහු නාම රූප දෙක මතට පතිත වෙනවා ම යි. ඒ කිවුවේ විඤ්ඤාණය ආපහු රූප, වේදනා, සංඥා, සංඛාර කියන විඤ්ඤාණ ධීති මතට පතිත වෙනවා ම යි. ඒ නිසා පෙනෙන වස්තුව හරි හොඳයි වගේ තැනකින් තමයි අපිට පෙනෙන්නේ.

ඇහෙන් රූපයක් දකින කොට පටිඝ සිතක් ඇති වුණා නම් තමන්ට පටිඝ සිතක් ඇති වුණා කියන එක පෙනෙන්නේ නැහැ. චිත්තානුපස්සනාව

නැති අපිට පේන්නේ අර කෙනා, අර දේ නරකයි වගේ. එතකොට පින්වතුනි, ඒ වෙලා තියෙන්නේ නාම රූප දෙක නිසා හටගත්ත විඤ්ඤාණය ආපහු නාමරූප දෙකට පතිත වෙන එක.

සතිපට්ඨානයෙන් වාසය කරන කොට වෙන්නේ නාම රූප දෙක නිසා රාග හිතක් හෝ ද්වේශ සිතක් පහළ වුණහම; තමන්ට රාග සිතක් පහළ වුණා, තමන්ට ද්වේශ සිතක් පහළ වුණා කියන එක පේනවා. අර රූපය හොඳයි හෝ නරකයි නෙවෙයි, රූපය දකින කොට 'ඒක හොඳයි' හෝ 'ඒක නරකයි' කියලා හිතක් තමන්ට උපන්නා කියලා පෙනෙන කොට බාහිර රූපය පැත්තට යන්නේ නැහැ. පින්වතුනි, ඒ චිත්තානුපස්සනාව නැමති තුන්වෙනි සතිපට්ඨානයත් තමන්ට හොඳට ප්‍රකට කරන මට්ටමට ගේනවා.

<u>ධම්මානුපස්සනාව</u>

එතකොට සිතක ඇතිවෙන සිතුවිලිත් හොඳට පෙනෙනවා.

~ මාරයාගේ භූමියට නොයන හැටි ~

සතිපට්ඨානයෙන් වාසය කරන කොට වෙන්නේ මේ නාම රූප දෙක නිසා විඤ්ඤාණය ඇතිවෙන කොට, තව විදිහකට කිව්වොත් ඇහැ- රූප, කන- ශබ්දය, නාසය- ගන්ධය, දිව- රස, කය- ඵොට්ඨබ්බ නිසා තමන්ට දැනුමක් ඇතිවෙන කොට ඒ දැනුම (විඤ්ඤාණය) ආපහු නාම රූප දෙක පැත්තට එහෙම නැත්නම්, විඤ්ඤාණය ආපහු ස්පර්ශ ආයතන හයට බැස ගන්නේ නැති වෙනවා නම් වෙන්නේ සතිපට්ඨානය වඩනවා නම් විතරයි.

කය කෙරෙහි පිහිටි සිහියෙන් ඉන්න කෙනාට ඉබේ ම වේදනානුපස්සනාවට ගේනවා. වේදනානුපස්සනාව ඉන්න කෙනා චිත්තානුපස්සනාවට ගේනවා. චිත්තානුපස්සනාව ඉන්න කෙනා

ධම්මානුපස්සනාවට ගේනවා. ඔය ටික අනුක්‍රමයෙන් වෙනවා ම යි. ආයතන ටික නිසා තමන්ට දැන ගැනීමක් ඇති වෙයි. ඒ දැන ගැනීමෙන් ආපහු බාහිරට යන්න බැරි වෙන්නයි සතිපට්ඨානය තියෙන්නේ. මාරයාගේ භූමියට යන්නේ නැති වෙන්නයි සතිපට්ඨානය තියෙන්නේ.

මට අද විශේෂයෙන් ම පොසොන් පොහොය දවසේ දී මේ පින්වතුන්ට පෙන්වන්න ඕන වුණේ එක ම එක දෙයයි. මේ ශාසනයේ මෙච්චර බණ දහම් අහලා, භාවනා කරලා, මේ තරම් වීර්යය කරලත් අපිට තාම නිවන් දකින්න බැරි වුණා නම් බැරි වුණේ, අපේ හිත සමාධි කර ගන්නවත් බැරි වුණා නම් බැරි වුණේ වෙන මුකුත් හින්දා නෙවෙයි. අපි කොච්චර දුක ගැන කතා කළත් දුක තුළ ම, දුක ඇති කරන හේතුව තියෙන තැන ම අපි තාම ලැගගෙන ඉන්න නිසා. දුකේ ඉඳගෙන දුක තුළ අපි මාර්ගයක් වඩන්න හදලා තියෙන්නේ. එතකොට මාර්ගය වැඩෙන්නේ නැහැ.

පින්වතුනි, මේ සතර සතිපට්ඨානය කියලා කියන්නේ පංච උපාදානස්කන්ධය දුකක් ඒ නිසා උපදින තණ්හාව දුකට හේතුවයි කියලා බලලා ඒ දුක ඇතුළේ ම දැනි පනි ගාන්න නෙවෙයි. සතිපට්ඨානය කියලා කියන්නේ, පංච උපාදානස්කන්ධය පැත්තට හිත යොමු කරන්නෙවත් නැතුව සීලයක පිහිටලා කය පැත්තේ හිත තබා ගෙන වෙන ම ම ජීවත් වෙන එකට.

මොකද, **ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා පංච උපාදානස්කන්ධය; අනිත්‍ය දෙයක්, දුකක්, බයක්, රෝගයක්, හුලක්, ගඩක්, පීඩාවක් හැටියට දකින්නේ.**[21] ඒ හින්දා ඒ පැත්තෙන් සිසිලසක් ලබන්න, පිහිටක් ලබන්න, රැකවරණයක් ලබන්න යන්නේ නැහැ.

බාහිර ආයතන පැත්තට යන්න බැරි වෙන්න, ඒ පැත්තට යන්නෙ නැති වෙන්න කය පැත්තට සිහිය තබාගෙන ජීවත් වෙනවා. හැබැයි පින්වතුනි, හොඳ උත්සාහයක් දරන්න වෙනවා. මොකද, ආස්‍රව කියලා

[21] https://tipitaka.lk/sn-3-1-3-2-10/sinh - **සීල සූත්‍රය- ධම්මකථික වර්ගය- බන්ධ සංයුත්තය- සංයුක්ත නිකාය 3- 295 පිටුව**

කියන්නේ අපිට ස්පර්ශ ආයතන හය පැත්තට ම යි දුවන්න හොඳට ම හුරුව තියෙන්නේ. ඒ නිසා කය කෙරෙහි සිහිය අතහැරුණු ක්ෂණයෙන් මාරයාගේ භූමියට යි අපිව ගහගෙන යන්නේ.

එහෙම මාරයාගේ භූමියට ගහගෙන නොයන්න ඔබ සීලයක පිහිටලා, හොඳ උත්සාහයකින් ඔබට කය කෙරෙහි සිහිය පිහිටුවා ගන්න වෙන්නේ. කය කෙරෙහි සිහිය තබාගෙන ම හිටගන්නවා, යනවා, ආදී ඉරියව් පැවැත්වීම් කරන්න බැහැ ඔබට තවම. එහෙම කළත් එක ස්වල්ප ඇසිල්ලේ ටක් ගාලා අමතක වෙලා බැහැරට යනවා. එතකොට ඔබ නැවත නැවත මතක් කර කර කය කෙරෙහි ම සිහිය පිහිටුවා ගන්න ඕනේ.

මෙහෙම සිහිය පිහිටුවන කොට පින්වතුනි, ටික ටික සතිපට්ඨානය වැඩෙනවා. කය පැත්තේ සිහිය පිහිටන කම ටික ටික වැඩෙනවා, දියුණු වෙනවා. එතකොට ඒ සතිය; සති ඉන්ද්‍රිය වෙලා, සති බල වෙලා, සති සම්බොජ්ඣංග වෙලා, සම්මා සතිය දක්වා වැඩෙනවා.

මේ පින්වතුන්ට හොඳ වැඩක් අද ඉඳලා තියෙනවා කරන්න. බාහිර ආයතන හය පැත්තට හිත යන්න නොදිය යුතුයි. ඒක මාරයාගේ භූමිය. එහෙම ගියොත් මාරයාගෙන් බේරෙන්න බැහැ කියලා බණ දහම් අහගත්තා. ඒ නිසා තමන්ට පියාගෙන් උරුම වෙච්ච ඉඩමේ හිටියොත් විතරයි බේරෙන්නේ කියලා දන්න හින්දා කය අනුව ම සිහිය පිහිටුවා ගන්න මහන්සි දරන්න වෙනවා. කාය, වේදනා, චිත්ත, ධම්ම කියන හතර තුළ ම ජීවිතය හසුරවන්න වෙනවා.

මුලින් ම අද දවසේ දී කය කෙරෙහි සිහිය පිහිටුවන්න. කය කෙරෙහි පිහිටි සිහියෙන් ම ජීවත් වෙනවා කියලා කියන්නේ ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදිනවා කියන ඉරියව් පැවැත්වීම වගේ ම යම් යම් වැඩ කටයුතු කරනවා කියන ටික කයට හිත තබලයි කරන්නේ. කයට හිත තබලයි

හිතීම්, කීම්, කිරීම් කරන්නේ. හිතීම්, කීම්, කිරීම් කරන්නේ නැහැ මාරයාගේ භූමියට හිත තබලා.

මේ විදිහට කරන කොට නොබෝ දවසකින් ඔයගොල්ලන්ගේ හිත ටිකෙන් ටික සමාධි වෙනවා. මේ විදිහට සතිපට්ඨානය සති දෙක තුනක්, මාසයක් වැඩුවොත් ඔයගොල්ලන්ට පෙර පසු විශේෂණයක් පෙනෙයි. ඒ හින්දා හොඳට මතක තබාගන්න ඕනේ, සතිපට්ඨානය කියන්නේ එක මොහොතකට විතරක් මෙනෙහි කරලා අතහැරලා, ආපහු වෙනදා වගේ පුරුදු විදිහට පීවත් වෙන්න කරන භාවනාවක් නෙවෙයි. නිවන් දකින තාක් පීවත් වෙන්න ඕමක්. ඒ ඕම ඉන්න හුරු කරන්න.

හැම වෙලාවේ ම සතිපට්ඨානයෙන් ඉන්න පුරුදු විය යුතුයි කියන මෙන්න මේ ටිකයි මට කියලා දෙන්න ඕනේ වුණේ. එතකොට වෙන අමුතු භාවනාව කියලා එකක් නැහැ ඔයගොල්ලන්ට. "හාමුදුරුවනේ අපි දැන් බණ ඇහුවා, මොකද්ද කරන්න ඕනේ භාවනාව" කියලා ඕගොල්ලොන්ට වෙනදාට ප්‍රශ්නයක් එනවා නේ.

"භාවෙතබ්බනති භාවනා"- වැඩිය යුතු අර්ථයෙන් භාවනාව කියලා කියනවා. මොකද්ද වැඩිය යුත්තේ? සිහිය පිහිටුවන එක. සතිපට්ඨානය වඩන්නකෝ. බැහැරට හිත යන්න නොදී කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන ඉන්න එක වඩන්න උත්සාහවත් වෙන්න.

අන්න ඒ සිහිය ටිකෙන් ටික පිහිටන කොට යම් වෙලාවක නීවරණ ධර්ම දුරු වෙලා හිත සමාධි වෙයි. හිත සමාධි වුණහම උපාදානයට හිත වූ ස්කන්ධයන්ගේ ඇත්ත ඇති හැටිය පෙනෙනවා. අනිත්‍ය බව, දුක් බව, අනාත්ම බව පෙනෙනවා. ඇහැ- රූප, කන- ශබ්ද, නාසය- ගන්ධය, දිව-රස, කය-ඵොට්ඨබ්බ, මන-ධම්ම මේ ටිකේ ඇත්ත ඇති හැටිය පෙනෙනවා.

ඇත්ත ඇති හැටිය පෙනෙන කොට රූපය; 'දරුවා' කියලා, 'අම්මා' කියලා, 'දුව' කියලා, 'පුතා' කියලා පෙන්නපු කෙලේසයක් තියෙනවා නම් ඒ කෙලේසය දුරු වෙනවා. එතකොට ඒ කෙලේසය බාහිර සතර මහා ධාතු රූපයට තබලා විඳපු දුකක් තියෙනවා නම් ඒ දුක නිරුද්ධ වෙයි. දුක පිරිසිඳ දකින කොට කෙලෙසුන්ගෙන්, ආස්‍රවයන්ගෙන් මනස මිදෙයි. මිදුණහම, 'මිදුණා' කියලා නුවණ පහළ වෙනවා.

'මිදුණා' කියලා නුවණ පහළ වෙන්න කෙලෙසුන්ගෙන් මිදෙන්න ඕනේ. කෙලෙසුන්ගෙන් මනස මිදෙන්න ඇහැ- රූප, කන- ශබ්ද, නාසය- ගන්ධය, දිව-රස, කය-ඵොට්ඨබ්බ, මන-ධම්ම කියන පංච උපාදානස්කන්ධය පිරිසිඳ දකින්නට ඕනේ. පංච උපාදානස්කන්ධය පිරිසිඳ දකින්න චිත්ත සමථයක් තියෙන්නට ඕනේ. චිත්ත සමථය ගන්න උත්සාහයෙන් කය කෙරෙහි සිහිය පිහිටුවාගෙන වාසය කරන්නට ඕනේ. ඒකට උපකාරයි කය වචන දෙක සංවර කරන සීලය.

සීලයක පිහිටලා උත්සාහයෙන් සතිපට්ඨානය වඩලා මේ දුක් සහගත සසරෙන් එතෙර වෙන්න හැමදෙනා ම උත්සාහවත් වෙන්න කියන කාරණාව මතක් කරනවා. බුද්ධ වර්ෂය 2567 ක් ගෙවිච්ච මේ යුගයක අද දවසේ දී යළි බුදුරජාණන් වහන්සේ ජීවමාන වුණා වගේ තත්ත්වයකට පත්වෙයි අපි හඳුනා ගත්තොත් සතිපට්ඨානය කියන්නේ එක වෙලාවකට පමණක් භාවනා කරලා අතහරින එකක් නෙවෙයි. නිවන් දකින කෙනා ජීවත් විය යුතු බිම හැටියට අපි හඳුනා ගත්තොත්.

~ ලෝකයට දිය යුතු පණිවිඩය ~

මේ කාරණාව ලෝකයට හඳුන්වලා දෙන්න පින්වත් ස්වාමීන් වහන්සේලා සතිපට්ඨානය තුළ වාසය කරන්න. පින්වත් ස්වාමීන් වහන්සේලාත් සතිපට්ඨානය තුළ ගිහි අයව සමාදන් කරවන්න. ගිහි පින්වතුන් ද තමන්ගේ

දුවා දරුවෝ සතිපට්ඨානය තුළ සමාදන් කරවන්න, සතිපට්ඨානයේ යොදවන්න.

අපි සෑම දෙනාට ම මේ ජීවිතයේ දී නිදුකින් නිවන් පුරයට යන්න පුළුවන් මේ උත්සාහයෙන් මේ උපායෙන්. අපි අහලා තියෙනවා එදා කුරු රටවාසීන් යටත් පිරිසෙයින් දැසි දස් කම්කරුවෝ වතුර කළයක්වත් ගෙනෙන්නට යන්නේ නැහැ කියලා සතිපට්ඨානය අතහැරලා කියලා.

ඉතින් මම කාලයක ඉඳලා පර්යේෂණයක් කළා මොකද්ද මේ තියෙන අඩුව, කොතනද අඩුව කියලා. ඇත්තටම අන්තිමට හෙළිවුණේ දර්ශනයවත් සීලයවත් නෙවෙයි මෙතන තියෙන අඩුව සමාධිය ඇති කර ගන්න භාවනා කමටහනක් කරන්න තියෙන මෙන්න මේ සතිපට්ඨානය හරියට හඳුනා නොගත්ත තැනයි මේ ප්‍රශ්නය අද දවසේ දී තියෙන්නේ කියලා තේරුණා.

ඒ නිසා මෙන්න මේ කාරණාව හැම කෙනෙක් ම හොඳින් තේරුම් අරගෙන, නිබර කරලා, ගැටිති තියෙනවා නම් සුද්ද කරලා, පිරිසිදු කරලා අපි හැම දෙනාම එකතු වෙලා මේ අර්ථය මතු කරලා ගනිමු. මේ අර්ථය අරගෙන ලෝකයාට කියලා දීලා ලෝකයා සතිපට්ඨානයේ යොදවමු, සමාදන් කරවමු. අපිත් සතිපට්ඨානයේ වාසය කරමු. එතකොට පියා සතු ඉඩමේ ම යි අපි ඔක්කොමලා ඉන්නේ. මාරයාගේ බිමට යන්නේ ම නැහැ.

අපිට නිදුකින් ම නිවන් පුරයටත් යන්න පුළුවන්. අනාගතයේ දී ලෝකයේ පහළවෙන පශ්චිම ජනතාවටත් සුවසේ නිදුකින් නිවන් පුරයට යන්න මාවතත් හෙළිපෙහෙළි කළා වෙනවා. ඇත්තට ම තව චිරාත් කාලයක් මේ බුද්ධ ශාසනය පවතී.

මොකද, නික්ලේශී මනස්, කෙලෙස් සංසිඳුනු මනස් දකින කොට ඒ අයට මේ ධර්මය රැක ගන්න, මේ ධර්මය ඉස්සරහට තියන්න ඇත්තට ම මේ ධර්මයට ආදරය හිතෙනවා ‘මට ලැබුණ සැනසිල්ල අනිත් අයටත් දෙන්න

තියෙනවා නම්' කියලා. ඒ සිතුවිල්ල උපදින්නේ නිරායාසයෙන්. ඉතින් අද මට මේ පින්වතුන්ට මේ කාරණාවයි පෙන්නන්න ඕනේ වුණේ. සතිපට්ඨානය කියලා කියන්නේ නිවන් දකින්න අවශ්‍ය කෙනකුට පීවත් වෙන්න, නිවන් දකින්න පොළොවක් භූමියක් කියන කාරණාව හඳුන්වලා දෙන්නටයි.

නමුත් ඒ අර්ථය අද දවසේ දී ගිලිහිලා තියෙන බව පෙනෙනවා. කාම භූමියේ ඉඳගෙන සතිපට්ඨානය වඩනවා වගේ තැනකින් තමයි මෙච්චර කල් හඳුනගෙන තියෙන්නේ. නමුත් එසේ නොවිය යුතුයි. මොකද, කාම ලෝක, රූප ලෝක, අරූප ලෝක කියන තුන් ලෝකය ම දුකක්. ඒ ලෝකයෙන් එතෙර වෙන මාවත තමයි සීල, සමාධි, ප්‍රඥා කියලා කියන්නේ.

සීලයක පිහිටලා කාය, වේදනා, චිත්ත, ධම්ම කියන මේ හතරේ සිහිය පිහිටුවා ගෙන හිතීම්, කීම්, කිරීම් කරලා සමාධිය උපදවා ගෙන පංච උපාදානස්කන්ධයේ ඇත්ත ඇතිහැටිය දැකලා, පංච උපාදානස්කන්ධය පැත්තට යන්නේ නැතුව පංච උපාදානස්කන්ධයෙන් මිදෙනවා. ඈත තියා ම පංච උපාදානස්කන්ධයේ දොස් දැකලා මිදිලා ම යනවා. **ආසිවිසෝපම සූත්‍රයේ**[22] පෙන්වනවා වගේ සතුරු වධකයන්ගෙන්, සර්පයන්ගෙන් ගොඩවෙලා එගොඩට ම යනවා.

ඉතින් ඒ නිසා අද මේ දේශනාව ඔබ සියලු දෙනාට ම මනා කොට සතිපට්ඨානය භූමියක් කොට, දිවයිනක් කොට, දීපයක් කොට වාසය කරන්න ශක්තිය ධෛර්යය ලැබේවා. එහෙම වාසය කරලා තමන්ගේ පීවිතවලටත් විමුක්තිය උදාකර ගෙන, සම්බුද්ධ ශාසනයටත් ආලෝකයක් සපයලා මේ සතර සතිපට්ඨානය නැමැති දායාදය අනාගත ලෝකයටත් උරුම කරලා දෙන්න මේ දේශනාව හැමදෙනාට ම හේතු උපනිශ්‍රය ම වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

---

22 https://tipitaka.lk/sn-4-1-19-1/sinh - **ආසිවිසෝපම සූත්‍රය- ආසීවිස වර්ගය- සළායතන සංයුක්තය- සංයුක්ත නිකාය 4- 341 පිටුව**

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.03.06 මැදින් පොහොය දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසනයේ දී උදැසන සිදු කළ ධර්ම දේශනාව ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සදා පූජනීය වන්දනීය මහා සංඝරත්නයෙන් අවසරයි. ශ්‍රද්ධා බුද්ධි සම්පන්න කාරුණික පින්වතුනි, මේ පින්වත් සියළු දෙනා අද දවසේ දී ගෙවල් දොරවල්වල නොයෙක් කටයුතු කාරණා තිබුණත් ඒ හැම දෙයක් ම පැත්තකින් තබලා, තුණුරුවන් සැඟවෙන තැන් කර ගෙන, පිහිට තැන් කර ගෙන මේ ස්ථානයට ඇවිල්ලා පෙහෙවස් සමාදන් වුණේ මේ ඉමක් කොනක් පරතෙරක් නැති දුක් සහගත සසරෙන් එතෙර වීම පිණිස තියෙන ධර්මය අවබෝධ කර ගෙන ඒ ප්‍රතිපදාව තුළ හැසිරෙන්න ඕනේ කියන සත් අදහස් ඇතුව.

ඒ නිසා ඒ තමන් පැමිණි සත් කෘත්‍ය සිද්ධ කර ගන්නට හැමදෙනා ම අද දවස පුරාවට ම බොහොම උවමනාවකින් ඕනෑකමකින්, ඒ වගේ ම බොහෝ ම සිහි ඇතුව කටයුතු කළ යුතුයි. පින්වතුනි, අද මම විශේෂයෙන් ම දහම් කරුණු ටිකක් කියලා දෙන්න බලාපොරොත්තු වෙනවා.

මේ කරුණු ටික ටිකක් ගැඹුරුයි වගේ ම අපිට සමහරවිට නුහුරු ස්වභාවයක් තියේවී. ඒ නිසා ඉතාමත් ම උවමනාවෙන්, ඉතාමත් ම ඕනෑකමින් ධර්මය ශ්‍රවණය කරන්නට ඕනේ. අපි වෙනදා කතා කළ දහම් පරියායන්ට වඩා ටිකක් වෙනස්. ඒකෙන් අදහස් කරන්නේ අපි මෙච්චර කල් කතා කළ, කියපු දේවල් වැරදි කියන එක නෙමෙයි. ඒ දේවල් නිවැරදි.

නමුත් ඒ තැනට පැමිණ වාසය කරන්නට තියෙන ප්‍රතිපදාවක් හෙළිපෙහෙළි වෙනවා මෙතනින්. අපි මෙච්චර කාලයක් අහපු දහම් කාරණා තියෙන තැනට ම අපි ආපහු එනවා, ඒකට අදාළ ප්‍රතිපදාවකුත් සමග. ඉතින් ඒ නිසා මේ දේශනාව හැමදෙනා ම හොඳින් ශ්‍රවණය කරන්න කියලා මතක් කරනවා.

ඇයි අපි ඒ තරම් උවමනාවෙන්, ඕනෑකමෙන් මේ ධර්මය ශ්‍රවණය කළ යුත්තේ? ධර්මය හොඳින් ශ්‍රවණය කරලා, ධර්මය හිතේ දරාගෙන, ධර්මයේ හැසිරිය යුත්තේ ඇයි? වෙන මොකුත් නිසා නෙමෙයි, සසර ඇති දුක් සහගත ස්වභාවය නිසා.

මේ ඉමක් කොනක් පරතෙරක් නැති සසරේ මේ ලෝකයා ඉපදෙමින් මැරෙමින්, මැරෙමින් ඉපදෙමින් ඒ මේ අත දුවනවා, සැරිසරනවා. නමුත් දුකෙන් එතෙරවෙන මාවතක් පෙනෙන තෙක් මානයකවත් නැහැ ලෝකේ තුළ. ඒ නිසා ලෝකයාට දුකෙන් එතෙරවෙන, දුක නැති කරන, දුක නිරුද්ධ කරන මාවතක් හොයලා දෙන්නයි බුදුරජාණන් වහන්සේ ලෝකේ පහළ වුණේ.

ඒ දුක නැති කරන සැබෑ මාවත හෙළිපෙහෙළි වෙනවා, මේ ධර්මය ශ්‍රවණය කිරීමෙන්. ඒ නිසයි ධර්මය හොඳින් ශ්‍රවණය කළ යුත්තේ. ඒ එක්ක ම මම මතක් කළා ධර්මය හොඳින් තව ශ්‍රවණය කළ යුත්තේ සසර දුක නිසා කියන කාරණාවත්.

බුදුරජාණන් වහන්සේ සසර දුක ශි කියන්නේ ඇයි

දුක කියන කොට අපිට බොහෝ සෙයින් ම දැනෙන්නේ, මතක් වෙන්නේ මේ මනුස්ස ලෝකෙට අයිති දුක් ටික. නමුත් බුදුරජාණන් වහන්සේ සසර දුකයි කියලා කියන්නේ, මනුස්සයෙක් වෙලා විඳින්න තියෙන දුක් ටික විතරක් හින්දා නෙමෙයි. මේ ලෝකයේ අපිත්, මේ සත්ත්වයොත් උපන්නට පස්සේ ලෙඩවීමේ දුක විඳිනවා.

ලෙඩ වෙනවා කියන කොට මොන තරම් ලෙඩවල ප්‍රභේද තියෙනවා ද. ඒ ඕනෑම ප්‍රභේදයක රෝගී ස්වභාවයට අපිත් පත්වෙන්න පුළුවන්. අංසභාග, පිළිකා, හොරි, කුෂ්ඨ, දද ඔය ඕනෑම රෝගයක් හැදෙන්න පුළුවන්කම තියෙනවා.

මහළු බව කියන කොට ඇස් පෙනෙන්නේ නැති, කන් ඇහෙන්නේ නැති, අතපය වලංගු නැති තමන්ගේ ම මළ මුත්‍රා ගොඩේ වැටිලා ජීවත් වෙන්න පුළුවන් ස්වභාවයට පත්වීම වෙනවා.

තමන් ජීවිතය පුරාවට ම හරිහම්බ කරපු හැම දෙයක් ම දාලා වෙන්වෙලා, හැම ඥාතී පිරිසගෙන් ම වෙන් වෙලා මිය පරලොව යන්නවෙන එකත් දුකක්.

ඒ විතරක් නෙමෙයි, ප්‍රිය විප්පයෝග දුක්ඛයන් තියෙනවා. තමන්ට ප්‍රිය වූ මනාප වූ දූ දරුවන් අහිමි වෙලා දෙමව්පියෝ අඬනවා. තමන්ගේ ප්‍රිය වූ මනාප වූ දෙමව්පියෝ අහිමි වෙලා දරුවෝ අඬනවා. ඒ වගේ ම ඔවුනොවුන්ට ඥාති හිතේෂින් අහිමි වෙලා අඬනවා. මේ වගේ ප්‍රිය වස්තු, ප්‍රිය දේවල් නැති වීම නිසා ප්‍රිය විප්පයෝග දුක්ඛයන් විඳිනවා.

ඒ වගේ ම අප්‍රිය පුද්ගලයෝ, අප්‍රිය දේවල් ලැබීම නිසා විඳින්නවෙන දුක්, හිතන බලාපොරොත්තුවන දේවල් නොලැබීමේ දුක්, නින්දා, අපහාස, ඇනුම් බැනුම්, ණය ප්‍රශ්න ආදී මේ වගේ මේ ලෝකේ කෙළවරක් නැති ප්‍රශ්න නිසා මහා දුක් විඳිනවා.

මේ ප්‍රශ්න සමහරවිට ඔරොත්තු දෙන්නේ නැතිකම කොච්චර ද කියනවා නම් ඒ අය එක්කෝ කෝච්චියට පනිනවා, එක්කෝ බෙල්ලේ වැල දාගන්නවා, එක්කෝ වහ බොනවා, එක්කෝ මුහුදට පනිනවා. ඔය වගේ සියදිවි නහගන්න අවස්ථාවනුත් එනවා.

~ කබලෙන් ලිපට වැටීම ~

ඊට පස්සේ වෙන්නේ කබලෙන් ලිපට වැටුණා වගේ වැඩක්. මේ දුකෙන් බේරෙන්න කියලා, දුක මගහැර ගන්න කියලා, දුක ඉවසගන්න බැරුව තමයි ජීවිතය නැති කර ගන්නේ. ඒ වගේ සිය ජීවිතය නැති කර ගන්න කොට බොහෝ සෙයින් චුති සිතට අරමුණු වෙන්නේ අකුසල සහගත කර්ම නිමිත්තක්.

ඒ වගේ අය මැරිලා ගියහම එක්කෝ වැටෙනවා ප්‍රේත ලෝකයට. ඒ ප්‍රේත ලෝකයේ ඇතැම් ශරීරයන් සාමාන්‍යයෙන් යොදුන් ගණනක් දිගයි කියනවා. ඒ මොකද, දැනෙන වේදනාව වැඩි ශරීරය ලොකු වෙච්ච තරමට. හරියට ගහක ගිනිගෙන දැවෙන බෙනයක් වගේ කියනවා, බඩගින්න පිපාසය නිසා ඇතිවෙන වේදනාවන්. ඇතැම් ප්‍රේත ආත්මභාව අවුරුදු සිය දහස් ගණනකින්වත් සෙම සොටු ටිකක් නැතුව බුද්ධාන්තර ගණන් දුක් විඳිනවා.

~ දේවදූත සූත්‍රය[23] ~

ඒ එක්ක ම තව සමහරු නිරයට වැටෙනවා. බුදුරජාණන් වහන්සේ කියලා කියන්නේ පින්වතුනි, කෙනෙක්ව යහපත් මාර්ගයට ගන්නවත් බොරුවක් කියන උත්තමයෙක් නෙමෙයි. දේවදූත සූත්‍රය වගේ සූත්‍රවල දී බුදුරජාණන් වහන්සේ ඇප වෙනවා, “මහණෙනි, මම මේ ටික කියන්නේ කාගෙන්වත් අහලවත්, එහෙම නැතුව තව දෙවි කෙනෙක් ඇවිත් කියලවත් නෙමෙයි. මිනිස් ඇස ඉක්ම වූ පිරිසිදු දිවැසින් මම ම දන්න, මම ම දකින නිසයි” කියලා අකුසල කර්ම නිසා අපාය වැනි දුක් සහගත භූමියක ඉපදිලා දුක් විඳින සත්ත්වයන්ගේ ස්වභාවය පෙන්වනවා.

ඒ වගේ අකුසල කර්ම බලයෙන් දුගතියකට වැටුණහම ඉස්සෙල්ලා ම ඒ නිරි සත්ත්වයාට කරනවා පංචවිධ නම් බන්ධනයක්. සම්පූර්ණ ගිනිගෙන දැවෙන යකඩ පොළොවේ නිදි කරවලා අත් දෙක දිගහැරලා අත් දෙකටත් ඇණ දෙකක් ගහනවා. කකුල් දෙකටත් ඇණ දෙකක් ගහනවා. පපුව මැද්දටත් ඇණයක් ගහනවා. එතකොට අර ගින්නෙන් පැහෙනවා. යම් තාක් අකුසල් නොගෙවේ ද ඒ තාක් කළුරිය කරන්නේ නැහැ.

“අඞ්ගාරපබ්බත නිරය” කියලා මහා විශාල ගිනිගෙන දැවෙන ගිනිඅඟුරු පර්වතයක් තියෙනවා. යමපල්ලෝ අර නිරිසතාව ඒ ගිනිඅඟුරු

[23] https://tipitaka.lk/mn-3-3-10/sinh – **දේවදූත සූත්‍රය- සුඤ්ඤත වර්ගය- මජ්ඣිම නිකාය 3- 385 පිටුව**

පර්වතයේ නග්ගනවා බස්සනවා. යම් තාක් අකුසල් නොගෙවේ ද ඒ තාක් කළුරිය කරන්නේ නැහැ.

ඊට පස්සේ යමපල්ලෝ අර නිරිසතාව **අවිචි මහා නරකයට** දානවා. අවිචි මහා නරකය යොදුන් සීයක් උසයි, යොදුන් සීයක් දිගයි, යොදුන් සීයක් පළල යි. යටින් හටගන්න ගින්න උඩටත්, උඩින් හටගන්න ගින්න යටටත්, උතුරෙන් හටගන්න ගින්න දකුණාටත්, දකුණෙන් හටගන්න ගින්න උතුරටත්, නැගෙනහිරෙන් හටගන්න ගින්න බටහිරට, බටහිරෙන් හටගන්න ගින්න නැගෙනහිරට හාත්පස හැපිලා තියෙන්නේ.

ඉතින් මේ කර්ම වේගයෙන් උපන්න නිරිසත්ත්වයා ඒ ගින්නට හසුවෙලා හම ද පිච්චෙනවා. මස් ද පිච්චෙනවා. නහර ද පිච්චෙනවා. ඇට ද පිච්චිලා ඇටමිඳුළු වලින් දුම් දානවා. යම් තාක් කර්මය නොගෙවේ ද ඒ තාක් මැරෙන්නේ නැහැ කියනවා. මෙහෙම පැහී පැහී ඉන්න කොට කිසියම් ම කාලයක නැගෙනහිර දිශාවේ දොර ඇරෙනවා.

මේ පිච්චෙන දුක කොච්චර ද කියනවා නම් ඉවසගන්න බැරුව ඒ පේන දොරටුවෙන් එළියට යන්න කියලා දුවන්න හදන කොට දිව්වට දිවවෙන්නේ නැහැ, එක ම තැන. ඉතින් මේ වගේ දුවලා දුවලා මනුස්ස ලෝකෙන් අවුරුදු දහස් ගාණක් ගිහිල්ලා ඒ නැගෙනහිර දිශාවේ දොර ගාවට කිට්ටුවෙන කොට ම ඒක වැහෙනවා.

එතකොට ම බටහිර දිශාවේ දොර ඇරෙනවා. ආපහු ඒ පැත්තට දුවනවා. කිට්ටුවෙන කොට ම ඒ පැත්තේ දොර වැහෙනවා. එතකොට ම උතුරු දිශාවේ දොර ඇරෙනවා. මෙහෙම ඒ පැත්තට මේ පැත්තට බුද්ධාන්තර ගණාන් දුවනවා. දුවලා, කිසියම් ම කාලෙක එක දොරටුවකින් එළියට එනවා.

ඒ දොරටුවකින් එළියට එන කොට ම ඒ එක්කම තියෙනවා, **"ගූථ නරකය"**. මහා අසුචි පිරුණු අපායක්. මේ නිරිසත්ත්වයා ඒකේ හිසේ ඉඳන් යටට ම කිඳා බහිනවා. ඒකේ ඇතුළේ ඉන්නවා ඉඳිකටු වගේ තුඩු තියෙන පණුවෝ. උන් මේ නිරිසත්ත්වයාගේ හම ද විදලා, මස් ද විදලා, නහර ද

විදලා, ඇට ද විදලා, ඇටමිදුළු කනවා. ඒ හේතුවෙන් කෑර වූ කටුක වූ තියුණු වූ දුක් වේදනාවන් විඳිනවා. යම් තාක් පාප කර්ම නොගෙවේ ද ඒ තාක් මැරෙන්නේ නැහැ. එහෙම අවුරුදු දහස් ගාණක්, ලක්ෂ ගාණක් කෑර වූ කටුක වූ තියුණු වූ දුක් වේදනාවන් විඳිනවා.

එතනින් චුත වුණහම ඊට සමනන්තරව තියෙනවා **"කුක්කුල නරකය"** (උණු අළු නිරය). කුක්කුල කියලා කියන්නේ සම්පූර්ණයෙන් ම ගිනිගෙන රත් වෙච්ච අළුවලට. ඒ උණු අළු නිරයට වැටුණහම, මේ නිරිසත්ත්වයා හිසේ ඉඳන් යටට ම කිඳාගෙන බහිනවා උණු අළු ගොඩේ. ඒ හේතුවෙන් කෑර වූ කටුක වූ තියුණු වූ දුක් වේදනා විඳිනවා. යම්තාක් පාපකම් නොගෙවේ ද ඒ තාක් කලුරිය කරන්නේ නැහැ.

එතනින් අවුරුදු දහස් ගාණක් පැහිලා එන කොට ඒ එක්ක ම තියෙනවා **"කටුඉඹුල"**. එතනට යන කොට ඒ නිරිසත්ත්වයාට අධික රාගයක් ඇති වෙනවා. පිරිමි නිරිසත්ත්වයෙක් එන කොට ලස්සන කාන්තාවකගේ කතා කරන හඬ වගේ ඇහෙනවා අර කටුඉඹුල උඩ. එතකොට මේ නිරිසත්ත්වයා කටුඉඹුලේ නගින්න හදන කොට ගිනිදැල් සහිත වූ කටු හැරෙනවා බිම අතට.

ඇඟ ඉරාගෙන පලාගෙන පිච්චීගෙන නගිනවා කටුඉඹුලේ උඩට. උඩට ගියහම හඬ ඇහෙනවා පහතින්. පහතට බහින්න හදන කොට කටුව හැරෙනවා උඩ අතට. ඔහොම අවුරුදු සියදහස් ගාණක් එතන දුක් විඳිනවා. පාප කර්ම නොගෙවේ ද ඒ තාක් කළුරිය කරන්නේ නැහැ.

ඊට සමනන්තරව තියෙනවා, **"අසිපත්‍ර වනය"**. ඒකේ තියෙන ගස්වල කොළ හරියට කඩු වගේ. නිරිසත්ත්වයා ඒ කැලේ මැද්දෙන් යන කොට හුළඟට ඒ කොළ ඇවිල්ලා වැටෙන කොට නාසයත් කැපෙනවා, කනත් කැපෙනවා, කන් නාස ද කැපෙනවා, අතත් කැපෙනවා, කකුලුත් කැපෙනවා. ඒ හේතුවෙන් කෑර වූ කටුක වූ තියුණු වූ දුක් වේදනාවන් විඳිනවා. ඒත් මැරෙන්නේ නැහැ.

එතනින් යන කොට ඊට සමනන්තරව තියෙනවා **"වේතරණී නම් නදිය"** (කරදිය සහිත ගඟක්). අපේ ඇඟට උණුවතුර ටිකක් දැම්මහම

පිච්චෙන්නේ. ඒ වගේ පිච්චිලා සම්පූර්ණයෙන් ම හම යනවා. හරියට අපිට ලුණු ඇඹුල් ටිකක් තුවාලෙක ගෑවුණහම ඉන්න බැහැ වගේ ඒ කරදිය ගෑවුණහම ඉන්න බැහැ දනවා. ඒකේ පිච්චි පිච්චි උඩහට පහතට යනවා.

එතකොට යමපල්ලෝ මොකද කරන්නේ, බිලිකොක්කෙන් නිරිසත්ත්වයාව අල්ලලා උඩට ඇදලා ගන්නවා. “උඹට මොනවද ඕනේ” කියලා අහනවා. “මට බඩගිනි ස්වාමීනි” කියලා අර නිරිසත්ත්වයා කියනවා. එතකොට යමපල්ලෝ මොකද කරන්නේ, අර නිරිසත්ත්වයාගේ බලෙන් කට ඇරවලා ලා අඹ දල්ලේ පාටින් රත්වෙච්ච ගිනිගෙන දිලිහෙන ලෝහගුලි ගිල්ලනවා.

ඒ හේතුවෙන් තොලත් පිච්චෙනවා, දිවත් පිච්චෙනවා, උගුරත් පිච්චෙනවා, බඩවැල්, බඩවැල්දරණත් අරගෙන අධෝමාර්ගයෙන් නික්මෙනවා. ආපහු යමපල්ලෝ අහනවා, “උඹට මොනවාද ඕනේ” කියලා. “පිපාසයි, ස්වාමීනී” කියලා අර නිරිසත්ත්වයා කියනවා. අර වගේ ම ලෝදිය වක්කරනවා. ඒ නිසා තොලත් පිච්චෙනවා, දිවත් පිච්චෙනවා, උගුරත් පිච්චෙනවා, බඩවැල්, බඩවැල්දරණත් අරගෙන අධෝමාර්ගයෙන් නික්මෙනවා. ආපහු අර වේතරණී ගඟට දානවා. සසර හිටියොත් හැමෝටම ඕක ලැබෙනවා ම යි.

ඊට පස්සේ ඔහොම කල්ප ගණන් දුක් විඳලා මනුස්ස ලෝකෙට බොහෝම අමාරුවෙන් එන කොට බුද්ධෝත්පාද කාලවල් හැමදාම නැහැ. සද්ධර්මය හැමදාම නැහැ. නිවන් මඟ පැත්තකින් තැබේවා. මේවා තමයි අකුසල්, ඒ නිසා ඒවායින් වළකින්න. මේවා කුසල් ඒ නිසා ඒ දේවල් කරන්න කියලා පෙන්වන කර්මවාදී ක්‍රියාවාදී ශාස්තෘවරුවත් නැහැ ලෝකේ සමහර කාලවල. ඕගොල්ලොන්ට අද බරක් දැනෙන්නේ නැහැ මේ කාරණාවේ.

නිරයේ ඉඳලා මනුස්ස ලෝකෙට ආවත් ධන ධාන්‍ය මොකුත් නැති බොහොම නිර්ධන පවුලක, බොහෝම දුක සේ ආහාර පාන ටික, වස්ත්‍ර ටික හොයා ගන්නවෙන, ඉන්න හිටින්න බොහොම අපහසු තැනක් තියෙන බොහොම දිළිඳු වටපිටාවක තමයි බොහෝවිට උපදින්නේ. ඒ පවුලේ ජීවිකාව

එක්කෝ මාළු මරනවා. එක්කෝ මත්පැන් වගේ දේවල් පෙරනවා. එක්කෝ හරක් මරනවා.

හරක් මරණ කුලයක නම් උපන්නේ, ඒ ළමයා ලොකුවෙන කොට තාත්තා කියනවා, "පුතේ කඹය ගනින්කෝ අද තියෙනවා හරකෙක්ව මරන්න" කියලා. ඉතින් බැහැ කියන්නේ නැතුව ඒ ළමයාත් යනවා. ගියාට පස්සේ, "බැඳපන් කකුල් දෙක අල්ලලා, කපපන් බෙල්ල" කියලා තාත්තා කියන විදිහට මරනවා ඉතින්.

අර තරම් අපායේ දුක් විඳලා බොහොම අමාරුවෙන් මනුස්සයෙක් වෙලා ආවා විතරයි. මේ ජීවිතය ජීවත් කරන්න හරක් මරනවා හෝ මාළු අල්ලනවා වගේ කර්මාන්තයක යෙදිලා අනේ මරණෙන් පස්සේ ආපහු අපායට වැටෙනවා. ආයෙත් අපායට ගිහින් කල්ප ගණාන් පැහෙනවා.

ඔය වගේ අනන්ත අපරිමාණ සංසාරයක් තියෙන්නේ. මේකෙන් බේරෙන්න පුළුවන්කමක් ලෝකේ කිසිම කෙනෙකුට නැහැ. ඒ නිසයි බුදුරජාණන් වහන්සේලා පහළ වෙන්නේ. බුදුරජාණන් වහන්සේ සසර දුකයි කියන්නේ මේ ඕගොල්ලොන්ට බඩගින්න නිසා, පිපාසය නිසා, දරුවෙක් ලෙඩ වෙච්ච නිසා, දරුවෙක් මැරිච්ච නිසා, ණයතුරුස් ටිකක් තියෙන හින්දා නෙමෙයි.

කෙනෙක් මනුස්ස ලෝකේ ඉපදිලා උපන්න දවසේ ඉඳන් මළමූත්‍ර ගොඩේ වැටිලා අතපය හතර ම වලංගු නැති වෙලා ඔත්පල වෙලා පනුවොත් ගහලා ජීවත්වෙන ජීවිතයක් තිබුණොත් අපායේ දුකට සාපේක්ෂව ඒ ජීවිතය දිව්‍යලෝකේ වගේ. ඒ නිසයි බුදුරජාණන් වහන්සේ සසර දුකයි කියන්නේ. ඉතින් ඔය වගේ මේ ලෝකෙත් දුක් විඳලා ඒ වගේ ම කබලෙන් ලිපට වැටෙනවා වගේ ප්‍රේත ලෝකවල, නිරයේ වැටිලා අනන්ත අපරිමාණ දුක් විඳිනවා. පෘථග්ජනයාට සතර අපාය මහගෙදර වගේ කියලනේ කියන්නේ.

අපි ගමනක් ගියොත් ආපහු ගෙදරට එන්න හදිසි වගේ, අහම්බෙන් හරි මනුස්සයෙක් හෝ දෙවියෙක් වුණොත් ආපහු අපායට යන්න හරි හදිසි කියනවා. එක මොහොතකට ඔළුව ඉස්සුවා විතරයි. ලෝකේ හැදිලා

තියෙන්නේ ම පයින් ඇනලා ආපහු අපායට දාන විදිහට. වටපිටාව හැදිලා තියෙන්නේ ම ආපහු අකුසල කර්ම සිද්ධවෙන විදිහට ම යි.

මෙන්න මේ වගේ නැවත නැවත ඕනෑම තැනක විඳින්න තියෙන දුක් ටික විඳින්න වෙනවා ඉපදීම කියන ධර්මතාවය ඇති තාක්. ඉපදීම කියන ධර්මතාවය ඇති තාක් ඔය සෑම තැනක ම තියෙන දුක උරුම යි. ඒ දුක අයිති කර ගෙන, ඒ දුකට යන උරුමය (License එක) අතේ තියාගෙන අපි මේ ඉන්නේ.

~ ලෝකය යනු ~

ඉපදීම කියන එක කවදාවත් නැති කරන්න බැහැ භවය (කර්මභවය) තියෙනකන්. කර්ම භවය කියලා කියන්නේ ලෝකේ. ලෝකේ කියලා කිව්වේ අපිට ජීවත්වෙන්න, ඇසුරු කරන්න බාහිර වටපිටාවක් තියෙන එකට. දෙමව්පියෝ, සහෝදරයෝ, දරුවෝ, ඥාති හිතේෂීන් ඉන්නවා, ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම්, මිළමුදල් තියෙනවා, ගම් තියෙනවා, නගර තියෙනවා, පළාත් තියෙනවා, රටවල් තියෙනවා, ලෝකවල් තියෙනවා, විශ්වය තියෙනවා කියලා භවය යනවා අනන්ත අපරිමාණය දක්වා.

අපිට පරිබාහිරින් ලෝකය කියලා යමක් ඇති බවට හම්බවෙන එකට තමයි භවය කියලා කියන්නේ. ඒ කියන්නේ අපේ ගෙවල් දොරවල් තියෙනවා, යානවාහන තියෙනවා, ඉඩකඩම් තියෙනවා, ස්කෝල තියෙනවා, පොලිසි තියෙනවා, ඉස්පිරිතාල තියෙනවා කියලා ඒවා බාහිර ඇතිකමට හැඟෙන එකට තමයි භවය කියලා කියන්නේ. භවය කියන්නේ ලෝකෙට නමක්. ඔය භවය ඇති තාක්/ ඔය ලෝකය ඇති තාක් ඉපදෙනවා කියන එක නතර වෙන්නේ නැහැ.

ඉපදෙන්න බිමක් තියෙනකන් ඉපදෙනවා. ඉපදෙන්න පරිසරය ඇති තාක් ඉපදෙනවා. ඉපදීම කියන එක ඇති තාක් අර කලින් කිව්ව දුක් ඔක්කොම විඳින්න වෙනවා. ඉපදෙනවා කියන එක නතර වෙන්නේ නැහැ,

නවත්තන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ භවය කියන එක ඇති තාක්. ලෝකය කියන එක ඇති තාක්. අපි බලමු ඔය ලෝකය හැදුනේ කොහොමද කියලා පොඩ්ඩක්.

අපිට සාමාන්‍යයෙන් හිතෙන්නේ ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම්, මිළ මුදල් තියෙන, තව සත්ත්වයෝ, පුද්ගලයෝ, නෑදෑයෝ ඉන්න ඔය ලෝකෙට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. අපි ඒ ලෝකය ඇසුරු කර ගෙන ජීවත් වෙනවා. ඊට පස්සේ ජීවිතයේ අන්තිම කාලේ දී කර්මානුරූපීව අපි මැරිලා යනවා. නමුත් ලෝකය තියෙනවා වගේ තැනකින් නේ අපිට තේරෙන්නේ. නමුත් අපි බලමු බුදුරජාණන් වහන්සේ දේශනා කරන දර්ශනය.

"ඉමසම්මෙඳකඳව බ්‍යාමමතෙත කලෙබරෙ සසඤඳඳිමහි සමනකෙ ලොකඤඳව පඤඳඳාපෙමි, ලොකසමුදයඤඳව ලොකනිරොධඤඳව ලොකනිරොධගාමිනිඤඳව පටිපදනති" [24]

මේ සංඥා සහිත මනස සහිත බඹයක් පමණ ශරීරය තුළ ම මම ලෝකයත් පනවමි, ලෝකයේ ඇතිවීමත් පනවමි, ලෝකය නැතිවීමත් පනවමි, ලෝකය නැති කරන මඟත් පනවමි කියලා බුදුරජාණන් වහන්සේ පෙන්වනවා.

ඒ එක්ක ම බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ***"ජසසු ලොකො සමුපපනෙනා"*** [25] - ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන ආයතන හය උපන්න කල්හි ලෝකය උපන්නේ.

"ජනනමෙව උපාදාය" - මේ ආයතන හය ඇසුරු කර ගෙනයි ලෝකය කියන එක පවතින්නේ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ.

නමුත් බුදුරජාණන් වහන්සේලා වැනි මහෝත්තමයන් වහන්සේලා හැර ලෝකේ අය හිතන්නේ තියෙන ලෝකෙකට තමයි උප්පත්ති වශයෙන්

---

[24] https://tipitaka.lk/sn-1-2-3-6 - **රෝහිතස්ස සූත්‍රය- නානාතිත්‍ථිය වර්ගය- දේවපුත්ත සංයුත්තය- සංයුත්ත නිකාය I- 120 පිටුව**

[25] https://tipitaka.lk/sn-1-1-7-10 - **ලෝක සූත්‍රය- අනවච වර්ගය- දේවතා සංයුත්තය- සංයුත්ත නිකාය I- 76 පිටුව**

ආවේ කියලා. ලෝකෙට තව නමක් මම කිව්වා, 'භවය' කියලා. ඔය ලෝකය/ භවය තිබුනොත් වෙන දෝෂය මොකක් ද? ඉපදෙන්න වෙනවා.

ඒ කිව්වේ අම්මලා ඉන්න හින්දා, මව්කුසවල් තියෙන හින්දා ඉපදෙන්න වෙනවා. තාත්තලා ඉන්න හින්දා, බීජ තියෙන හින්දා ජාතක වෙන්න වෙනවා. පොළොවවල් තියෙන හින්දා මනුස්ස ලෝක, දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝකවල ඉපදෙන්න වෙනවා.

ඒ හින්දා ලෝකය (භවය) තිබුනොත් ඉපදෙන එක නතර වෙන්නේ නැහැ. ඔය ලෝකය හැදුනු හැටි තමයි දැන් මං කියන්න යන්නේ. අපි ජීවත්වෙන මේ ලෝකය අපි ඉපදෙන්න කලින් තිබ්බා කියන තැනකින්, තියෙන ලෝකෙක අපි උපන්නා කියන තැනකින් තමයි මේ හැම කෙනෙක්ට ම තේරෙන්නේ.

නමුත් බුදුරජාණන් වහන්සේලා ඊට වඩා වෙනත් දර්ශනයක් දේශනා කරනවා. මොකද, බුදුරජාණන් වහන්සේ බෝසත් කාලේ ඉඳන් ම මේ ලෝකයා දුකෙන් එතෙර කරවන්න මාවතක් හොයමින් පාරමී ධර්ම පිරුවේ. ඒ දුකෙන් එතෙර කරවන මාවත පෙන්වන කොට මේ ලෝකයා දකින දේට සම්පූර්ණ හාත්පස වෙනස් සිද්ධියක් තමයි බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ.

අපි දැන් බලන්න යන්නේ නැවත ඉපදෙන්න හේතුවන ඒ ලෝකය නැත්නම් කර්ම භවය හැදුනේ කොහොමද කියන එක. අපි හැම කෙනෙක් ම පෙර ජීවිතවල කුමන හෝ මට්ටමක ඉඳලා කර්ම රැස් කළහම ඒ කර්මයට විපාකයක් හැටියට උප්පත්ති වශයෙන් විඤ්ඤාණය මව් කුසකට බැසගෙන උපදිනවා.

~ පුරාණ කර්මයට හටගත්ත විපාක සීමාව ~

ඒ පුරාණ කර්මයට හටගත්ත විපාක සීමාව අපි බලමු. සංයුත්ත නිකායේ නව පුරාණ වර්ගයේ කම්ම සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, **"මහණෙනි, මම නුඹලට පුරාණ කර්මත් නව කර්මත් දේශනා කරමි.**

මහණෙනි, ඇස, කන, නාසය, දිව, කය, මනස පුරාණ කර්මයක්. මහණෙනි, නව කර්ම මොකක් ද? වර්තමානයේ හිතීම්, කීම්, කිරිමක් කරනවා නම් මේක නව කර්මයි" [26] කියලා පෙන්නුවා.

ඒ අනුව බලන කොට අපි ප්‍රතිසන්ධි වශයෙන් මෙතනට එන කොට ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන ආධ්‍යාත්මික ආයතන ටික ඇතුව උපන්නා. උපන්නහම, ඇහැ හැදිලා රූප පේනවා. හැබැයි රූප පෙනෙන කොට ඒ රූප ගැන නිමිති නැහැ. සීමා නොකරන ලද මනසක් තමයි අපිට පුංචි කාලේ තිබුණේ.

සීමා නොකරන ලද මනසක් කියලා කිව්වේ පොදුවේ හැම දෙයක් ම පෙනෙනවා. එක දෙයකට, එක වස්තුවකට හිත සීමා වෙලා නැහැ. ඔන්න ඔය විදිහට තමයි පුරාණ කර්මයට උප්පත්ති වශයෙන් පැමිණෙන කොට අපි පෙනෙනවා කියන ධර්මතාවය ඇතුව උපන්නා. හැබැයි ඒකේ නිමිති නැහැ.

එහෙම පෙනෙන තැනක තියෙන්නේ විපාක නාම රූප දෙක. සීමා නොකරන ලද විදිහට එක දෙයක් ඉලක්ක වෙලා නැතුව ධර්මය දන්න කෙනාටත්, ධර්මය නොදන්න කෙනාටත් පොදුවේ හැමෝටම යමක් පෙනෙනවා කියන එක වෙනවා උප්පත්ති වශයෙන් ඇවිල්ලා ඇහැ හැදුනට පස්සේ.

හැබැයි පෙනෙන තැන තියෙන්නේ මොනවද කියලා කතාවක් දන්නේ නැහැ ඒ විපාක නාමරූප දෙක මට්ටමේ දී. නමුත් ඔය පෙනෙනවා කියන එක තුළ අඩංගු වෙලා තියෙනවා රූපයක්. ඒ රූපය හැදිලා තියෙන්නේ ආහාර ප්‍රත්‍යයෙන්. ඇහැට පෙනෙන සිද්ධියේ දී නම් ඒ රූපයට කියනවා වර්ණ සටහනක් කියලා.

ඒ වගේ ම තව තියෙනවා; රූපය ස්පර්ශ වීම නිසා හිතේ පහළ වෙච්ච අරමුණ විඳිනවා (වේදනා), අරමුණ හඳුනනවා (සංඥා), අරමුණට හිතනවා (සංඛාර) කියලා නාම ධර්ම ටිකක්. ඒ නාම සහ රූප කියන ධර්මතා දෙක නිසා හටගත්ත විඤ්ඤාණයට තමයි 'පෙනෙනවා' කියලා කියන්නේ.

---

[26] https://tipitaka.lk/sn-4-1-15-1/sinh - **කම්ම සූත්‍රය- නවපුරාණ වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 267 පිටුව**

ඕකට කියනවා ***"දිට්ඨේ දිට්ඨමත්තං"*** [27] - දැකීම දැකීම් මාත්‍රයක් පමණයි කියලා. සීමා නොකරන ලද මනසකින් පොදුවේ පෙනෙනවා කියන තැනක රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන ධර්මතා පහක් තිබුණාට පෙනෙන්නේ මෙන්න මේ දේ කියලා එක රූපයක් විතරක් අහුවෙලා නැහැ.

ඒ මට්ටමේ දී වේදනාව කියලා එකක් තියෙනවා කියලා දන්නෙත් නැහැ, සංඥාව කියලා එකක් තියෙනවා කියලා දන්නෙත් නැහැ, සංඛාරය කියලා එකක් තියෙනවා කියලා දන්නෙත් නැහැ. නමුත් දහමක් දන්න කෙනත්, නොදන්න කෙනත්, බෞද්ධ කෙනත්, අබෞද්ධ කෙනත් කියන හැම කෙනාට ම පෙනෙනවා කියන සිද්ධියක් තියෙයි.

පෙනෙන්න තියෙන නාමරූප දෙක නැතිවෙන කොට ඒ පෙනෙනකම නැති වෙනවා කියන හටගත්ත දේ ඉතුරු නැතිව නැති වෙනවා කියන ධර්මතාවයක් ඉබේම තියෙනවා. සීමා නොකරන ලද මනසේ දී සමස්තයක් වශයෙන් පෙනෙනවා කියන ධර්මතාවයක් නිර්මාණය වුණහම, එක දෙයකට සීමා කරන්නේ නැති නිසා ඕගොල්ලොන්ට හිතිම්, කිම්, කරන්න පුළුවන් ද කියලා බලන්න යමකට? බැහැ.

අපිට එහෙම පොදුවේ පෙනෙන තැනක රාග, ද්වේශ, මෝහ ඇති කර ගන්න පුළුවන් ද කියලා බලන්න? බැහැ. ඇයි ඒ බැරි? පොදුවේ ඔක්කොම පේන මටම්මේ දී මොකේකට ද රාග, ද්වේශ, මෝහ ඇති කර ගන්නේ එක දෙයක් සීමා කරලා අල්ලගන්නේ නැතුව. අලෝභ, අද්වේශ, අමෝහ කුසලයක් ඇති කර ගන්න හිතන්න පුළුවන් ද? බැහැ. ඇයි ඒ? ඔක්කොම පොදුවේ පෙනෙනවා වුණාත් මොකේට ද මම හොඳට හෝ නරකට හිතන්නේ, එහෙම එක දෙයක් අහුවෙලා නැති නිසා.

ඒකයි පුරාණ කර්මයෙන් හටගත්ත විපාක ටිකට හිතිම්, කිම්, කිරීම් කරන්න බැහැ. පෙනෙනවා, හැබැයි ඒ පෙනීම පෙනීමක් පමණයි- *"දිට්ඨේ දිට්ඨමත්තං"*. ඔන්න ඔහොම පෙනෙන තැන තියෙන රූපයේ ඇත්ත තමයි

---

[27] https://tipitaka.lk/kn-ud-1-10 - **බාහිය සූත්‍රය- පළමු බෝධි වර්ගය- උදාන පාළිය- ඛුද්දක නිකාය- 144 පිටුව**

වර්ණ සටහන කියලා කියන්නේ. පොඩි ළමයි අඬන කොට අම්මලා අර පාට පාට කැරකෙන ඒවා එල්ලන්නේ ටිලිං ටිලිං ගාලා. මාස හතරක පහක ළමයෙක් ගත්තොත් කැරකෙන ඒ බෝලවල වර්ණ පේනවා. නමුත් මේ නිල් පාට, කහ පාට, රතු පාට කියලා හිතන්නවත් ප්‍රඥප්තියක් නැහැ ඒ ළමයාට. අන්න එබඳු වූ යථාර්ථයක් තමයි අපිට සීමා නොකරන ලද මට්ටමේ දී පෙනීම සිද්ධවන තැනක රූපයේ තියෙන්නේ.

ඊට පස්සේ කන හැදිලා ශබ්ද ගොඩ ඇහෙනවා. එක ශබ්දයක් විතරක් තනි කරලා අහුවෙලා නැති නිසා ශබ්දවල නිමිති නැහැ මේ සීමා නොකරන ලද මනසේ දී. හරියට නොතේරෙන භාෂාවකින් කෙනෙක් අපිට කතා කළොත් ශබ්දයක් ඇහෙන බව දන්නවා. හැබැයි ඒ ශබ්දය මෙන්න මේකයි කියලා ඒකෙන් අපිට හොඳක් කියනවා කියලා දැන ගන්නෙත් නැහැ, නරකක් කියනවා කියලා දැන ගන්නෙත් නැහැ නේ.

ඒ කිව්වේ නොදන්නා භාෂාවකින් මොනවා හරි කිව්වොත්: ‘මේ මට හොඳ කියනවා’, ‘ගුණ කියනවා’, ‘ප්‍රශංසා කරනවා’ කියලා හෝ ‘මට බනිනවා’, ‘නින්දා කරනවා’ කියන අදහස් එනවද අපිට? ඒවා මොකුත් නැහැ, ශබ්දයක් තියෙයි. හැබැයි ඒ ශබ්දය ශූන්‍යතාවයක්.

අන්න ඒ වගේ මේ ඇහැ ඇතුව උපන්න අපිට රූප පෙනෙනවා සීමා නොකරන ලද මනසකින්. කන හදාගෙන උපන්නා. ශබ්දය ඇහුනට නිමිති නැහැ සීමා නොකරන ලද මනසේ දී. ඔතන තිබුණේ අනිමිත්ත, ශූන්‍යත, අප්පනිහිත ස්වභාව ලක්ෂණයක්.

අද ඕකේ ගැඹුර අපිට තේරෙන්නේ නැහැ. මොකද මෙහෙ (ආධ්‍යාත්මික පැත්තේ) ‘මම ඉන්නවා’ කියන හැඟීම තාම අපි ළඟ තියෙන හින්දා. එහෙම ගතියකුත් නැතුව ශූන්‍යතාවයක් තියෙන තැනක අපි උපන්නේ. ඔන්න ඔහොම ඉපදෙන කොට අද අපි කතා කරන අම්මා, තාත්තා, ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම්, මිලමුදල්, පොලිසි, ඉස්පිරිතාල තියෙන ලෝකය අපිට හැදිලා තිබුණේ නැහැ. ඒ කර්ම භවය තිබුණේ නැහැ.

උප්පත්ති වශයෙන් අපි ආවේ ඇහැ හැදිලා රූප පෙනෙන, කන හැදිලා ශබ්ද ඇහෙන, නාසය හැදිලා ගඳ සුවඳ දැනෙන, දිව හැදිලා රස දැනෙන, කය හැදිලා ස්පර්ශ දැනෙන ඒකේ ද හිතීම්, කීම්, කිරීම් කරන්න බැරි නිමිති නැති සීමා නොකරන ලද මනසක් තිබුණේ.

ඒ කියන්නේ *"දිටඨ දිටඨමත්තං, සුතෙ සුතමත්තං, මුතෙ මුතමත්තං, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං"* - දැකීම දැකීම් මාත්‍රයක් පමණක්වන, ඇහීම ඇහීම් මාත්‍රයක් පමණක්වන, දැනීම දැනීම් මාත්‍රයක් පමණක්වන, දැනගැනීම් දැනගැනීම් මාත්‍රයක් පමණක්වන ස්වභාවයක් තිබුණේ.

"දිටඨ දිටඨමත්තං" කියන මට්ටමේ දී, පෙනෙන දේට හිතන්නත් බැහැ, කියන්නත් බැහැ, කරන්නත් බැහැ. පෙනෙන්න තියෙන හේතු ටික නැතිවෙන කොට ඉබේම පෙනෙන එක නැති වෙනවා. මේ කාරණාව තේරුම් ගන්න, රළු උදාහරණයක් කිව්වොත්; මාස දෙක තුනක පුංචි ළමයෙකුට යමක් පෙනෙන තැනක ඒ අරහයා එයාට හිතන්න, කියන්න, කරන්න බැහැ. පෙනෙන්න තියෙන හේතු ටික නැතිවෙන කොට ඉබේම පෙනෙන දේ නැති වෙනවා. ඔය වගේ තැනකින් තමයි අපි උපන්නේ.

~ කර්ම භවයක් නොවුණා නම් ~

අවිද්‍යාව නැති කිරීමෙන් කර්ම භවය නැති කරලා සීමා නොකරන ලද මනසේ අපි හිටියා නම් පිරිනිවන් පානවා. ඒ සීමා නොකරන ලද මනසට කියනවා, ***"විමරියාදීකතං චිත්තං"*** [28] කියලා.

"බීණං පුරාණං නවං නත්ථි සම්භවං - විරත්තචිත්තා ආයතිකෙ භවසම්මං.
තෙ බීණබීජා අවිරූළ්හිවඡන්දා- නිබ්බන්ති ධීරා යථායමපදීපෝ" [29]

---

[28] https://tipitaka.lk/kn-thag-2-4-2 - **සීවක ස්ථවිරගාථා- සතරවැනි වර්ගය- දුක නිපාතය- ථේරගාථා- ඛුද්දක නිකාය- 70 පිටුව**

[29] https://tipitaka.lk/kn-khp-6 - **රතන සූත්‍රය- ඛුද්දකපාඨපාළි - ඛුද්දක නිකාය- 12 පිටුව**

පුරාණ කර්මයට හටගත්ත විපාක ටික නැතිවෙන කොට අලුතින් කර්ම භවයකුත් නැතිව භවයට නොඇලුණු සිතින් වාසය කරන නිසා පහනක් නිවෙනවා වගේ ඒ ධීරයන් වහන්සේ නිවිලා යනවා. නිවෙන්න පුළුවන්, නිවනට කිට්ටු තැනකට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ.

"පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච බො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං".[30] "මහණෙනි, මේ සිත මුල් ස්වභාවය ප්‍රභාස්වරයි. ආගන්තුක උපක්ලේශ නිසයි සිත කිලිටි වුණේ" කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

සසර දුක් විඳින විදිහට ප්‍රතිසන්ධියට යන කර්ම භවය/ ලෝකය කියන එක අපි අරගෙන ඇවිල්ලා නැහැ උප්පත්ති වශයෙන් එන කොට. ඒ ලෝකය තාම හැදිලත් නැහැ. බොහොම පිරිසිදු මනසකින් රූපයක් පේනවා, සීමා නොකරන ලද මනසක් හැබැයි. ඔහොම තමයි අපි හැම කෙනෙක් ම ආවේ. එතන නිවනට ගොඩක් කිට්ටුයි. අලුතෙන් කර්ම භවය හැදුනේ නැති වුණොත් ඔතන ජීවත්වෙන එක විතරයි තියෙන්නේ පිරිනිවන් පානවා. ඔතන ඉන්න කොට කය කෙළවර කොට දිවි කෙළවර කොට ඇති වේදනාවක් විතරයි විඳින්නට වෙන්නේ.

මාසයක, දෙකක පුංචි ළමෙක් බඩගින්න හින්දා අඬයි, පිපාසය හින්දා අඬයි, මදුරුවෙක් විද්දොත් අඬයි මිසක දරුවෝ නැති වුණා, මිළ මුදල් නැති වුණා, ගෙවල් දොරවල් නැති වුණා, අරහේ යන්න ඕනේ මෙහේ යන්න ඕනේ කියලා දුකකින් අඬනවා ද? එහෙම ඒවා තියෙනවා ද එයාට? නැහැ. කය කෙළවර කොට ඇති දිවි කෙළවර කොට ඇති වේදනාවක් විතරයි වින්දේ.

නිවනට ගොඩක් කිට්ටු තැනකට ඇවිල්ලා, බොහොම ප්‍රභාස්වර මනසකින් තමයි උප්පත්ති භවය තිබුණේ. නැවත ප්‍රතිසන්ධියට යන්න කර්ම භවයක්/ ලෝකයක් හැදිලා තිබුණේ නැහැ තවම. හැබැයි ඔතන ලොකු

30 https://tipitaka.lk/an-1-5-9 - **1. 5. 9.- සුක්ක වග්ගය- ඒකකනිපාතය- අඞ්ගුත්තර නිකාය 1- 18 පිටුව**

අඩුවක් තිබුණා. ඒ මොකක්ද? අවිද්‍යා අනුසය ගෙවිලා නැහැ කියන ලොකු අඩුව තිබුණා. අවිද්‍යා අනුසය කියන එක අනුසය වෙලා තිබුණා.

අවිද්‍යා අනුසය නැමති එක ම එක දෝෂයක් විතරයි ඔතන තිබුණේ. ඔන්න ඔය අවිද්‍යා අනුසය නැමති දෝෂය තියාගෙන සීමා නොකරන ලද පිරිසිදු මනසක නිමිති නැති තැනක ඉඳන් ***"ඉධ පරිපකකතත්තා ආයතනානං"*** [31] ආයතන මුහුකුරා යන කොට (පොඩි ළමයා ටික ටික ලොකුවෙන කොට) අවිද්‍යාව කියන එක සක්‍රිය වුණා, පරියුට්ඨාන වුණා.

~ අවිද්‍යාව කියලා කියන්නේ මොකක් ද ~

"දුකෙඛ ඤාණං, දුකඛසමුදයෙ ඤාණං, දුකඛනිරොධෙ ඤාණං, දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං" [32] කියන මෙන්න මේ ටික නොදන්නාකම ඇතිවයි අපි දැන් මෙතන ඉන්නේ. මෙතන කිව්වේ කොතනට ද? සීමා නොකරන ලද මනසේ, උප්පත්ති තැන. අපි අවිද්‍යාව කියන එක අර්ථ දක්වා ගමුකෝ, ඔතන ඉන්න කොට අවිද්‍යාව නිසා අවිද්‍යාව හේතුවෙන් අපිට වුණේ මොකක්ද කියලා.

- **<u>දුක ගැන නුවණ</u>**

  "දුකෙඛ ඤාණං" - සීමා නොකරන ලද මනසේ (උප්පත්ති තැන) ඉඳන් හැදෙන, ලොකුවෙන අපිට දුක ගැන නුවණක් තිබුණේ නැහැ. මොකක් ද දුක ගැන තියෙන නුවණ කියන්නේ?

ඉපදීම දුකක්, ලෙඩවීම දුකක්, මහළු බව දුකක්, මරණය දුකක්, අප්‍රියයන් හා එක්වීම දුකක්, ප්‍රියයන්ගේ වෙන්වීම දුකක්, හිතන බලාපොරොත්තුවන දේ නොලැබීම දුකක්. කෙටියෙන් කියනවා නම් මේ දුක්

---

31 https://tipitaka.lk/kn-ps-1-1-4 - **ධම්මට්ඨිති ඥානය- ඥාන කතා- මහා වර්ගය- පටිසම්භිදාමාර්ගය- බුද්දක නිකාය- 100 පිටුව**

32 https://tipitaka.lk/sn-4-4-9 - **අවිජ්ජා සූත්‍රය- ජම්බුඛාදක සංයුක්තය- සංයුත්ත නිකාය 4- 480 පිටුව**

ඔක්කොට ම කියන්න වෙනවා ***"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"*** [33] - පංච උපාදානස්කන්ධය දුකයි කියන නුවණ තිබුණේ නැහැ අපිට.

- **<u>දුක ඇතිවීම ගැන නුවණ</u>**

"දුක්ඛසමුදයෙ ඤාණං" – ඇයි පංච උපාදානස්කන්ධයට දුකයි කියලා කියන්නේ කියන නුවණ අපිට තිබුණේ නැහැ. පංච උපාදානස්කන්ධයට දුකක් කියන්නේ ඇයි? පංච උපාදානස්කන්ධය තිබුණොත් තණ්හාව ඇති වෙනවා. තණ්හාව ඇති වුණොත් උපාදාන වෙනවා. උපාදානය වුණොත් භවය ඇති වෙනවා. භවය වුණොත් ඉපදෙනවා. ඉපදුනොත් මේ සියළු දුක් ඇති වෙනවා නේද කියලා දුක ඇතිවෙන විදිහ ගැන නුවණ තිබුණොත් නැහැ.

අපි නැවත ඒ ටික බලමු. සීමා නොකරන ලද මනසේ ඉඳන් හැදෙන වැඩෙන ජීවත්වන අපිට දුක ගැන නුවණ තිබ්බේ නැහැ. පංච උපාදානස්කන්ධය කියන්නේ මොකක් ද, ඒක දුකයි කියන්නේ ඇයි කියන නුවණක් අපිට තිබුණේ නැහැ.

පංච උපාදානස්කන්ධය දුකක් කියන නුවණ නැහැ කියන කොට ඒකේ අපිට දෙපැත්තක ඌනතාවයක් තියෙනවා. පංච උපාදානස්කන්ධයක් කියන්නේ මොකක් ද, ඒක දුකක් කියන්නේ ඇයි කියන කාරණා දෙක ම *"දුක්ඛෙ ඤාණං"* කියන කාරණාව ඇතුළේ අන්තර්ගත යි.

"ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛො, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" [34] කියන නුවණ නැහැ කියන කොට ඒ අනුවණකම තුළ තියෙනවා පංච උපාදානස්කන්ධයක් කියන්නේ කුමකට ද, පංච උපාදානස්කන්ධය දුක වුණේ කොහොමද කියන එක ගැන දන්නේ නැහැ කියන එක.

---

[33] https://tipitaka.lk/mn-3-4-11 - **සච්චවිභඞ්ග සූත්‍රය- විභඞ්ග වර්ගය- මජ්ඣිම නිකාය 3- 514 පිටුව**

[34] https://tipitaka.lk/sn-5-12-2-1 - **ධම්මචක්කප්පවත්තන සූත්‍රය- සච්ච සංයුක්තය- සංයුත්තනිකාය 5-2- 270 පිටුව**

"දුක්ඛසමුදයෙ ඤාණං" - දුක ඇතිවීම පිළිබඳව නුවණකුත් නැහැ. දුක ඇතිවීම පිළිබඳව නුවණක් තිබුණා නම් පංච උපාදානස්කන්ධය කියන්නේ මොකේට ද, ඒක දුකක් වුණේ කොහොමද කියන ඒ ප්‍රශ්න දෙක පුරවනවා.

~ ඇයි පංච උපාදානස්කන්ධයට දුකක් කියන්නේ ~

"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" කියලා කිව්වා නේ. පංච උපාදානස්කන්ධයට දුකක් කියන්නේ ඇයි කියන එක අපි බලමු. පංච උපාදානස්කන්ධය ඇති කල්හි උපාදානය වෙනවා කියන එක නවත්තන්න බැහැ. උපාදාන වුණොත් භවය ඇති වෙනවා කියන එක නවත්තන්න බැහැ.

භවය ඇති වුණොත් ඉපදෙනවා කියන එක නවත්තන්න බැහැ. ඉපදුනොත් ජරා මරණ දුක ඇති වෙනවා කියන එක නවත්තන්න බැහැ. ඒ හින්දයි පංච උපාදානස්කන්ධයට දුකක් කියලා කියන්නේ. උපාදානයට හිත වූ ස්කන්ධ තිබුණොත් උපාදානය වෙනවා ම යි කියන පරියායක් තියෙනවා. ඒ හින්දයි පංච උපාදානස්කන්ධයට දුකයි කියලා කියන්නේ.

එතකොට ඒ පංච උපාදානස්කන්ධ දුකට හේතු වුණේ තණ්හාව යි. මේ තණ්හාව කියන කාරණාවෙන් පෙන්වනවා පංච උපාදානස්කන්ධයේ වපසරිය/ ක්ෂේත්‍රය. පංච උපාදානස්කන්ධය කියන එක කොච්චර දුරට තියෙනවා ද කියලා.

"යමක් ලෝකේ ප්‍රිය යි නම් මධුර යි නම් අන්න ඒකට තණ්හාව උපදිනවා. එහි තණ්හාව පවතින්නේ කියලා."[35] තණ්හාව උපදින්න පවතින්න පුළුවන් දේට කියනවා පංච උපාදානස්කන්ධය කියලා. ඇයි ඒ? තණ්හාව කියන එක උපන්නොත් උපාදාන වෙනවා ම යි.

---

[35] https://tipitaka.lk/sn-2-1-7-6/sinh - **සම්මසන සූත්‍රය- මහා වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්තනිකාය 2- 169 පිටුව**

"තණ්හා පච්චයා උපාදානං". උපාදානය වුණොත් භවය හැදෙනවා ම යි. භවය හැදුනොත් ජාති ජරා මරණ ආදි දුක් එනවා ම යි. දුකට හේතුව කියපු මේ තණ්හාව ඇතිවෙන්න හා පවතින්න පුළුවන් තැන් කීයක් තියෙනවා ද?

~ තණ්හාව ඇතිවෙන හා පවතින තැන් ~

අපි කෙටියෙන් ගත්තොත්, **"තණ්හාව උපදින්න පුළුවන් හා පවතින්න පුළුවන් ධර්මතා හැටක් පෙන්වනවා බුදුරජාණන් වහන්සේ."** [36] අපි කෙටි කරලා ගත්තොත්, ඇහෙන් රූපයක් බලලා තණ්හාව උපදවාගන්න, පවත්වාගන්න පුළුවන්. කනෙන් ශබ්දයක් අහලා තණ්හාව උපදවාගන්න, පවත්වාගන්න පුළුවන්. නාසයෙන් ගඳක් සුවඳක් විඳලා තණ්හාව උපදවාගන්න, පවත්වාගන්න පුළුවන්. දිවෙන් රසක් විඳලා තණ්හාව උපදවාගන්න, පවත්වාගන්න පුළුවන්. කයෙන් ස්පර්ශයක් විඳලා තණ්හාව උපදවාගන්න, පවත්වාගන්න පුළුවන්. හිතින් යමක් සිහි කරලා විඳලා තණ්හාව උපදවාගන්න, පවත්වාගන්න පුළුවන්.

මෙන්න මේ කිව්ව කාරණා හයක් තියෙනවා නේ. ඔන්න ඔය හයට ඇතුලත් වු සිද්ධි ටික ඔක්කොම. අපි රූපයක් බලලා ඒ ගැන සිහි කරනවා කියන තැන ගත්තොත්; ඇහැ ඕනේ. ඇහැට ප්‍රතිපක්ෂව රූපයක් ඕනේ. චක්ඛු විඤ්ඤාණය ඕනේ. චක්ඛු සම්ඵස්සය ඕනේ. ඒ අරමුණ විඳින්න ඕනේ. ඒ අරමුණ හඳුනන්න ඕනේ. ඒ අරමුණට හිතන්න ඕනේ. අරමුණට තණ්හා කරන්න ඕනේ. තණ්හා කරපු දේ හිතෙන් නැවත නැවත සිහි කර කර ඒක හොයන්න ඕනේ කියන සිද්ධි ටිකක් තියෙනවා තණ්හාව උපදින්න හා පවතින්න නම්. ඔන්න ඔය ටිකේ තමයි තණ්හාව යෙදෙන්නේ.

මම ඕක වෙන පරියායකින් කියන්නම්කෝ. සීමා නොකරන ලද මනසක් ඇතුව උප්පත්ති වශයෙන් ආපු අපිට නුවණක් තිබුණේ නැහැ පංච

---

[36] https://tipitaka.lk/dn-2-9/sinh - **මහා සතිපට්ඨාන සූත්‍රය- දීඝ නිකාය 2- 487 පිටුව**

උපාදානස්කන්ධය දුකක් කියන එක. පංච උපාදානස්කන්ධය කියන එක අපි තේරුම් ගමු.

පංච උපාදානස්කන්ධය[37]

<u>රූප උපාදානස්කන්ධය</u>

ඇහැ, රූප, කන, ශබ්දය, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ කියන මේ ටිකට කියන නමක් තමයි රූප උපාදානස්කන්ධය.

<u>වේදනා උපාදානස්කන්ධය</u>

චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාණ සම්ඵස්සජා වේදනා, ජිහ්වා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා කියලා යම් වේදනාවන් තියෙනවා නම් ඒවට කියනවා වේදනා උපාදානස්කන්ධය කියලා.

<u>සංඥා උපාදානස්කන්ධය</u>

රූප සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, ඵොට්ඨබ්බ සංඥා, ධම්ම සංඥාවක් තියෙනවා නම් ඒවාට කියනවා සංඥා උපාදානස්කන්ධය කියලා.

<u>සංඛාර උපාදානස්කන්ධය</u>

රූපයට හිතනවා රූප සංචේතනා, ශබ්දයට හිතනවා සද්ද සංචේතනා, ගන්ධයට හිතනවා ගන්ධ සංචේතනා, රසයට හිතනවා රස සංචේතනා, ඵොට්ඨබ්බයට හිතනවා ඵොට්ඨබ්බ සංචේතනා, ධම්මයන්ට හිතනවා ධම්ම සංචේතනා. මේවාට කියනවා සංඛාර උපාදානස්කන්ධය කියලා.

---

37 https://tipitaka.lk/sn-3-1-2-1-4/sinh - **උපාදාන පරිවත්ත සූත්‍රය- උපය වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්තනිකාය 3- 103 පිටුව**

විඤ්ඤාණ උපාදානස්කන්ධය

රූප දැන ගන්න හිත (චක්ඛු විඤ්ඤාණ), ශබ්ද දැන ගන්න හිත (සෝත විඤ්ඤාණ), ගන්ධ දැන ගන්න හිත (ඝාන විඤ්ඤාණ), රස දැන ගන්න හිත (ජිව්හා විඤ්ඤාණ), ඵොට්ඨබ්බ දැන ගන්න හිත (කාය විඤ්ඤාණ), ධර්මයන් ගැන දැන ගන්න සිත (මනෝ විඤ්ඤාණ). මේවාට කියනවා විඤ්ඤාණ උපාදානස්කන්ධය කියලා.

උප්පත්ති වශයෙන් ඇවිල්ලා සීමා නොකරන ලද මනසේ ඉන්න කොට අපිට නුවණක් තිබ්බේ නැහැ; ***"ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛො, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"*** [38] කියන දුක්ඛ ආර්ය සත්‍යය ගැන.

"සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"- කෙටියෙන් කියනවා නම් පංච උපාදානස්කන්ධය දුකයි. ඒ කියන්නේ කෙටියෙන් කියනවා නම් **ඇහැ දුකයි, කන දුක යි, නාසය දුක යි, දිව දුක යි, කය දුක යි, මනස දුක යි.** [39] **රූපය දුක යි, ශබ්දය දුක යි, ගන්ධය දුක යි, රසය දුක යි, ඵොට්ඨබ්බය දුක යි, ධර්මයෝ දුකයි**[40] කියලා.

දුකට කෙටියෙන් තව නමක් කිව්වොත් කියන්න වෙනවා 'ඇහැ' කියලා. දුක විස්තර කරලා කෙටියෙන් දුකට තව නමක් කිව්වොත් කියන්න වෙනවා 'රූපය' කියලා කියන එක තමයි කියන්නේ පංච උපාදානස්කන්ධය දුකක් ය කියන එකෙන්.

"දුක්ඛෙ ඤාණං" කිව්වේ ඇහැ දුකක් කියන එක අපි දැනගෙන හිටියේ නැහැ කියන එකයි කියන්නේ. ඇහැ කියන්නේ ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහළුවීමේ දුක, මරණ දුක, ප්‍රියයන්ගේ වෙන්වීමේ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, කැමති දේ නොලැබීමේ දුක ගෙනෙවිත් දෙන

---

[38] https://tipitaka.lk/ap-vbh-4-1 - **සත්‍යවිභඞ්ගය- විභඞ්ගප්‍රකරණය- 182 පිටුව**

[39] https://tipitaka.lk/sn-2-6-1-1/sinh - **චක්ඛුආදි සූත්‍රය- රාහුල සංයුක්තය- සංයුත්ත නිකාය 2- 375 පිටුව**

[40] https://tipitaka.lk/sn-2-6-1-2/sinh - **රූපාදි සූත්‍රය- රාහුල සංයුක්තය- සංයුත්ත නිකාය 2- 377 පිටුව**

දෙයක්. කෙටියෙන් ම කියනවා නම් ඇහැ කියන එක දුකක් ම යි කියන එක දැනගෙන හිටියේ නැහැ කියලා කියන්නේ.

~ ඇයි ඇහැට දුකක් කියන්නේ ~

"දුක්ඛසමුදයෙ ඤාණං" - ඇයි ඇහැට ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහළුවීමේ දුක, මරණ දුක, ප්‍රියයන්ගේ වෙන්වීමේ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, කැමති දේ නොලැබීමේ දුක කියන්නේ කියන එක දැනගෙන හිටියෙත් නැහැ.

ඇහැ තිබුණොත් ඇහැ මම, ඇහැ මගේ කියලා තණ්හා කරනවා.[41] තණ්හා කරලා ඒකට උපාදාන වෙනවා. උපාදාන වුණොත් භවය හැදෙනවා. භවය හැදුනොත් නැවත ඉපදෙන්න වෙනවා. ඉපදුනොත් ජරා මරණ දුක් ඔක්කොම ගෙනත් දෙනවා. ඒ නිසා ඇහැ දුකක් කියලා කියන්නේ කියන එක අපි දැනන් හිටියේ නැහැ.

මං ආපහු කියන්නම්කො ඒ කාරණාව තේරුනේ නැති වුණා නම්. උප්පත්ති වශයෙන් ඇවිල්ලා සීමා නොකරන ලද මනසේ ජීවත් වුණු අපිට කියලා දෙන්න කෙනෙක් හිටියේ නැහැ චතුරාර්ය සත්‍යය ගැන. ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහළුවීමේ දුක, මරණ දුක, ප්‍රියයන්ගේ වෙන්වීමේ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, කැමති දේ නොලැබීමේ දුක කියන යම්තාක් දුක් තියෙනවා නම් ඒ දුක් ඔක්කොටම කෙටියෙන් කියන්න වෙනවා ඇහැට. කෙටියෙන් කියන්න වෙනවා රූපයට දුකයි කියලා.

"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" කියන කොට පංච උපාදානස්කන්ධයේ එක ප්‍රදේශයක් ඔය. *(ඉතිරි ආයතන දහය ගැන ද මෙසේ දත යුතුයි.) "දුක්ඛෙ ඤාණං"* - දුක ගැන එහෙම නුවණක් අපිට තිබුණේ නැහැ.

---

41 https://tipitaka.lk/sn-4-1-11-5/sinh - **මෙය්‍ය සූත්‍රය- යෝගක්ඛේමී වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 187 පිටුව**

දුක්ඛ සමුදය පිළිබඳව නුවණක් තිබුණොත් නැහැ අපිට. ඇයි ඇහැට, රූපයට; ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහළුවීමේ දුක, මරණ දුක තියෙනවා කියලා කියන්නේ? **ඇහැ ලෝකේ ප්‍රියයි, මධුරයි. රූපය ලෝකේ ප්‍රියයි, මධුරයි. තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් එහි.**[42] තණ්හාව වුණොත් උපාදාන වෙනවා. උපාදානය වුණොත් භවය හැදෙනවා. භවය හැදුනොත් ඉපදෙනවා.

ඉපදුනොත් ජරා මරණ දුක එනවා නම් ඒ ජරා මරණ දුක නවත්තන්න බැහැ ඉපදෙනකන්. ඉපදීම නවත්තන්න බැහැ මොකක් වුණොත් ද? භවය (ලෝකය) ඇති තාක්. භවය ඇතිවෙන එක නවත්තන්න බැහැ මොකක් ඇති තාක් ද? උපාදාන වෙන තාක්. උපාදාන වෙන එක නවත්තන්න බැහැ තණ්හාව ඇති තාක්. ඒ තණ්හාව කොහෙද උපදින්නේ කොහෙද පවතින්නේ? ඇහේ, රූපේ තමයි තණ්හාව උපදින්නේ හා පවතින්නේ.

එහෙම උපදින හා පවතින තණ්හාව නිසා උපාදානය වෙනවා. උපාදානය වුණොත් භවය වෙනවා නම්, භවය වුණොත් ඉපදීම වෙනවා නම්, ඉපදීම වුණොත් ජරා මරණ දුක් එනවා නම් මේ ඇහැ, රූප කියන දේ නතර වෙලා තියෙන්නේ අන්තිමට මොකක් හදලා ද? දුක ම හදලා මිසක වෙන තැනකින් නතර වෙලා තියෙනවා ද? නැහැ. එහෙනම් ඇහැට යි, රූපයට යි කියන්න වෙන්නේ දුක කියලා නෙමෙයි ද? මොකද, උපාදාන සහිත මනසකින් ඇහැ පරිහරණය කරලා, රූපය පරිහරණය කරලා ජරා මරණ දුකෙන් නිදහස් වෙන්නේ නෑ කෙනෙක්.

ආදිත්තපරියාය සූත්‍රය අහලා තියෙනවා නේද, ***"සබ්බං භික්ඛවෙ, ආදිත්තං"***.[43] – "මහණෙනි, සියල්ල ඇවිලගන්නා ලදි. කුමන සියල්ල ද? ඇහැ ඇවිලගන්නා ලදි. රූපය ඇවිලගන්නා ලදි. චක්ඛු විඤ්ඤාණය ඇවිලගන්නා ලදි. චක්ඛු සම්ඵස්සය ඇවිලගන්නා ලදි. චක්ඛු සම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනාවක් උපදී නම් ඒ ද ඇවිලගන්නා ලදි". "කුමකින් ඇවිලගන්නා ලදි ද? ජාති, ජරා, ව්‍යාධි මරණ,

---

[42] https://tipitaka.lk/kn-ps-1-1-1/sinh - **ශ්‍රැතමය ඥානය- ඥාන කතා- පටිසම්භිදාමාර්ග- බුද්දක නිකාය- 77 පිටුව**

[43] https://tipitaka.lk/sn-4-1-3-6 - **ආදිත්තපරියාය සූත්‍රය- සබ්බ වර්ග- සළායතන සංයුත්තය- සංයුක්ත නිකාය 4- 38 පිටුව**

ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේශ, මෝහයන්ගෙන් ඇවිලගන්නා ලදි".

~ ඇයි කනට, ශබ්දයට දුකක් කියන්නේ ~

උප්පත්ති වශයෙන් සීමා නොකරන ලද මනසකින් ඇවිල්ලා ඉන්න අපිට දුක ගැන නුවණක් තිබුණේ නැහැ. කන, ශබ්දය කියන්නේ; ඉපදීමේ දුක ගෙනත් දෙන, ලෙඩවීමේ දුක ගෙනත් දෙන, මහලු බවේ දුක ගෙනත් දෙන, මරණ දුක ගෙනත් දෙන, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක ගෙනත් දෙන, අප්‍රියයන් හා එකතුවීමේ දුක ගෙනත් දෙන, හිතන බලාපොරොත්තුවන කැමති දේ නොලැබීමේ දුක ගෙනත් දෙන, කායික වෙහෙස, මානසික වෙහෙස කියන සියළු දුක් ගෙනත් දෙන ධර්මයක් නේද කියන එක අපි දැනගෙන හිටියේ නැහැ.

ඇයි කනට, ශබ්දයට දුකක් කියලා කියන්නේ කියන දුක්ඛ සමුදයේ ඥානය ගැනත් අපි දැනගෙන හිටියේ නැහැ. කන කියලා කියන්නේ, ශබ්දය කියලා කියන්නේ ලෝකයේ ප්‍රිය ස්වභාවයෙන්, මධුර ස්වභාවයෙන් යුක්ත දෙයක්. තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් කනට. තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් ශබ්දයට.

තණ්හාව ඉපදුනොත්, පැවතුනොත් මොකද වෙන්නේ? උපාදානය වෙනවා කියන කාරණාව වෙනවා ම යි. අපි කෙටියෙන් ගත්තොත් තණ්හාව තිබුණොත් කන මම, කන මගේ, කන මගේ ආත්මය යි කියලා දැඩිව ගන්නකම නවත්තන්න බැහැ. උපාදානය කියන්නේ ඒක යි.

එහෙම දැඩිව ගත්තොත් තියෙන දෝෂය මොකක් ද? ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව්වේ ම මට කන ඇති බවට නිමිති තියෙයි. භවය කියලා කියන්නේ ඒකට. ඕක තමයි දෝෂය. එහෙම භවය ඇති වුණහම තියෙන දෝෂය මොකක් ද? ජාතිය වෙනවා. හතර

ඉරියව්වේ ම කන ඇති බවට නිමිති තියෙන හින්දා කන සිහි කරලා නැවත ප්‍රතිසන්ධියට යන්නත් පුළුවන්. උපන්නහම ආයෙත් කෙළවරක් නැති සසර.

<u>දුක්ඛ නිරෝධය පිලිබඳ නුවණ</u>

"දුක්ඛනිරොධෙ ඤාණං" - ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහළුවීමේ දුක, මරණ දුක, ප්‍රියයන්ගේ වෙන්වීමේ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, කැමති දේ නොලැබීමේ දුක කියන මේ දුක් ටික ඔක්කොම නැති වෙනවා තණ්හාව කියන එක නැති කළොත්.

ඇහැට, රූපයට, කනට, ශබ්දයට තණ්හාව නැති වුණොත් මම, මගේ, මගේ ආත්මය යි කියලා උපාදාන වෙන්න බැහැ. එහෙම උපාදාන වශයෙන් ගත්තේ නැත්නම් ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව්වේ ම ඇහැ තියෙනවා, කන තියෙනවා කියලා නිමිති හිටින්නේ නැහැ.

ඒ නිසා ප්‍රතිසන්ධියට යන්න නිමිති වශයෙන් ඇහැක්, කනක් හම්බ වෙන්නේ නැහැ. ඒ කියන්නේ භවය නැහැ. භවය නැති වුණොත් ඉපදෙන්නේ නැහැ. ඉපදුනේ නැත්නම් ජරාමරණ දුක නැහැ කියලා දුක්ඛ නිරෝධය පිලිබඳ නුවණක් අපිට තිබුණේ නැහැ. *(අනෙක් ආයතන ධර්මයන් ගැන ද මෙසේ දැන යුතුයි).*

ඒ හින්දා තණ්හාව උපදින පවතින විදිහට ඇහැ, රූප නූපැද්දවිය යුතුයි. කන, ශබ්ද නූපැද්දවිය යුතුයි. නාසය, ගන්ධය නූපැද්දවිය යුතුයි. දිව, රස නූපැද්දවිය යුතුයි. කය, ඵොට්ඨබ්බ නූපැද්දවිය යුතුයි. මන, ධම්ම නූපැද්දවිය යුතුයි කියලා ඉගෙන ගෙන නැහැ.

ඇහැ, කන, නාසය, දිව, කය, මනස මහා දුකක්. ඇයි ඒවට දුකක් කියන්නේ? ඒවා තිබුණොත් තණ්හා උපාදාන වෙලා භවය හැදිලා ජරාමරණ දුක එනවා. ඇස, කන ආදී ආයතන නැති වුණොත් තණ්හා උපාදාන වෙන්න බැහැ. උපාදාන නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ජරා මරණ දුක නැහැ.

ඒ හින්දා උපාදානයට හිත විදිහට ඇහැ, රූපය, කන, ශබ්දය, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම උපදින්නේ නැති විදිහට කටයුතු කළ යුතුයි කියන නුවණක් නැතුවයි උප්පත්ති වශයෙන් ඇවිල්ලා සීමා නොකරන ලද මනසේ ඉඳන් ටික ටික අපි ලොකු වෙන්නේ. ඒකට කියනවා අවිද්‍යාව කියලා.

"දුකෙඛ ඤාණං, දුකඛසමුදයෙ ඤාණං, දුකඛනිරොධෙ ඤාණං, දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං" [44] කියන චතුරාර්ය සත්‍යය ගැන නොදන්නාකමට කියනවා අවිද්‍යාව කියලා. අවිද්‍යාව හින්දා මොකද දන්නවා ද වුණේ? සීමා නොකරන ලද මනසකින් උප්පත්ති වශයෙන් එන අපිට අවිද්‍යාව නිසා ඇහැ දොස් සහිතයි, රූපය දොස් සහිත යි, චක්ඛු විඤ්ඤාණය දොස් සහිත යි කියලා නුවණක් තිබුණේ නැහැ.

එහෙම නුවණක් නැති අපි තමයි සීමා නොකරන ලද මනසකින් උප්පත්ති වශයෙන් ඇවිල්ලා ටික ටික හැදෙන්නේ වැඩෙන්නේ. එහෙම හැදෙන වැඩෙන අපි අවිද්‍යාව නිසා මොකද කරන්නේ?

<u>පටිච්චසමුප්පාදය</u>

"අවිජ්ජාපච්චයා සඞඛාරා" - පෙනෙන දේට හිතන්න ගත්තා.

"සඞඛාරපච්චයා විඤ්ඤාණං" -හිතුවහම අරමුණේ විඤ්ඤාණය පිහිටනවා.

"යඤ්ච හිකඛවෙ, චෙතෙති යඤ්ච පකපෙපති, යඤ්ච අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණසස ඨිතියා." [45]- හිතන කොට, කල්පනා කරන කොට අනුසය වශයෙන් හෝ පවතින කොට අරමුණේ විඤ්ඤාණය පිහිටනවා.

---

[44] https://tipitaka.lk/mn-1-1-9 - **සම්මාදිට්ඨි සූත්‍රය- මූලපරියාය වර්ගය- මජ්ඣිම නිකාය 1 - 130 පිටුව**

[45] https://tipitaka.lk/sn-2-1-4-9 - **දුතිය චේතනා සූත්‍රය- කළාරවත්තිය වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය 2- 102 පිටුව**

"විඤ්ඤාණපච්චයා නාමරූපං" - විඤ්ඤාණය පෙනෙන නාමරූප දෙක පැත්තට බැසගන්නවා. (*තසමිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළෙහ නාමරූපසස අවකකනති හොති"*)-

"***නාමරූපපච්චයා සළායතනං"*** - එතකොට ඇහැ උපදිනවා.

"සළායතනපච්චයා ඵසෙසා" - ඇහැ උපදින කොට රූපයක් ස්පර්ශ වෙනවා.

"ඵසසපච්චයා වෙදනා" - ඒ ස්පර්ශය නිසා විඳීමක් ඇති වෙනවා

"වෙදනාපච්චයා තණහා" - ඒ විඳීමට තණ්හා කරනවා.

"තණහාපච්චයා උපාදානං" - තණ්හාව නිසා උපාදානය වෙනවා

"උපාදානපච්චයා භවො" - උපාදානය නිසා භවය වෙනවා.

"භවපච්චයා ජාති" - භවය තිබ්බොත් ඉපදීම වෙනවා

"ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුකඛදොමනසසුපායාසා සමභවනති, එවමෙතසස කෙවලසස දුකඛකඛනධසස සමුදයො හොති" - ඉපදීම වුණොත් ජරා මරණ ආදී සියළු දුක එනවා. මෙන්න මෙහෙමයි ලෝකය හැදුණු හැටි කියලා පෙන්වනවා.

ඒක මම ජීවිතයෙන් පෙන්වන්නම්. අපි ඉස්සෙල්ලාම මෙහෙම පර්යේෂණයක් කරමු. මං ඉස්සෙල්ලා කිව්වානේ සීමා නොකරන ලද මනසට එක දෙයක් විතරක් සීමා කරන්නේ නැති විදිහට හැම දෙයක් ම පෙනෙනවා කියලා. එහෙම සීමා නොකර ඉන්න කොට මොනවා හරි එක දේකට ඕගොල්ලොන්ට තණ්හා කරන්න පුළුවන් ද? බැහැ.

එහෙම නම් සීමා නොකරන ලද මනසේ දී පුළුවන්ද කුසලයක් ගැන හිතන්න? බැහැ. මොකක් ගැන ද හිතන්නේ කියලා එහෙම තනි වස්තුවක් අහුවෙලා තියෙන්න එපැයි නේද. ඒ නිසා සීමා නොකරන ලද මට්ටමේ දී හිතන්න බැහැ. දැන් එතකොට සීමා නොකරන ලද මනස ගැන දළ අදහසක් තියෙනවා නේද.

ඊට පස්සේ බලන්න, මෙන්න මෙහෙමත් අපිට බලන්න පුළුවන් නේද කියලා. මම සීමා නොකරන ලද මට්ටමේ ඔක්කොම පෙනෙන එක අතහැරලා මම බලනවා එක රූපයක් දිහා විතරක් තනි කරලා. දැන් එහෙම බලන කොට මට ඒ රූපය ගැන හිතන්න බැරි ද 'කෙනෙක්', 'පුද්ගලයෙක්' කියලා? පුළුවන්.

දැන් මෙහෙම යම් දෙයකට සීමා කරලා බලන කොට ඕගොල්ලොන්ගේ මනස දිහා බලන්න; 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්', 'කෙනෙක්', හෝ 'දෙයක්' කියන ගතියක් ඇවිල්ලා තියෙනවා නේද? ඔව්. වෙන මොකුත් ඕනේ නෑ ඕගොල්ලෝ එක රූපයක් තනි කරලා මෙහෙම බලන්න. එතකොට ම 'මනුස්සයෙක්', 'කෙනෙක්', හෝ 'දෙයක්' කියන හැඟීම තමන්ට ඇවිල්ලා තියෙයි.

~ ස්කන්ධ හා උපාදානස්කන්ධ අතර වෙනස [46]~

මෙන්න මේ තනි කරලා, සීමා කරලා උපාදානයට හිත විදිහට ගන්න එකට තමයි 'උපාදානස්කන්ධ' කියලා කියන්නේ. සීමා නොකරන ලද මට්ටමේ මනසක් තියෙන කොට තියෙන ඒවට කියන්නේ 'ස්කන්ධ' කියලා. පුරාණ කර්මයට හටගත්ත ඒ ස්කන්ධ ටිකට උපාදාන වෙන්න බැහැ.

එතකොට අපි ඉගෙනගෙන තිබුණේ නැහැ; උපාදානයට හිත විදිහට ඇහැ ඉපැද්දුවොත්, රූපය ඉපැද්දුවොත් තණ්හා උපාදානය යෙදෙනවා. එහෙම වුණොත් භවය ඇති වෙනවා. භවය වුණොත් ජාති ජරා මරණ ආදී දුක එනවා කියන එක.

අපි අවිද්‍යාව නිසා මොකද කරන්නේ? පෙනෙන සිද්ධිය ඇතුළේ එක දේකට හිතනවා. හිතුවහම, ඒ අරමුණ ගැන දැනුමක් ඇති වෙනවා. ඒ දැනුමෙන් හිත නාම රූප දෙක පැත්තට බැස ගත්තහම ඇහැ උපාදානයට

[46] https://tipitaka.lk/sn-3-1-1-5-6/sinh- **බන්ධ සූත්‍රය- අත්තදීප වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 85 පිටුව**

හිත විඳිහට හැඳෙනවා. ඒකට තමයි කියන්නේ *"නාමරූපපච්චයා සළායතනං"* කියලා. එතකොට ඒ නිසා එක රූපයක් විතරක් ගැටෙනවා.

රූපයක් ගැටෙන කොට ඒ අරමුණ විඳලා, ඒ වේදනාවට තණ්හා කරලා උපාදාන වෙනවා. උපාදාන වෙනවා කියන කොට; **අත්තවාද උපාදානය**[47] කියන්නේ 'රූපය සත්ත්වයෙක්/ ආත්මයක්' ආදී ලෙස විසි ආකාර සක්කාය දිට්ඨියෙන් කුමන හෝ ආකාරයක ගතියක් එන එකට. 'හොඳයි', 'කැමති' කියලා හිතෙනවා නම් **කාම උපාදානය** තියෙනවා. 'දස වස්තුක මිථ්‍යා දිට්ඨියට අදාළ දෙයක් හෝ කිනම් හෝ මිථ්‍යා දෘෂ්ඨියක් හැඟෙනවා නම්', **දිට්ඨි උපාදානය** තියෙනවා.

ඔන්න දැන් මට 'රූපය කෙනෙක් ම යි', 'රූපය පුද්ගලයෙක් ම යි' කියන තැනකින් ඇසුරු කරලා අතහැරෙනවා. ආපහු සීමා නොකරන ලද මනසට එන කොට, 'මම දැකපු කෙනෙක් අන්න අරහේ ඉන්නවා' කියන නිමිත්තක් හිටිනවා. කලින් මොකුත් ම නිමිති නැතුව සීමා නොකරන ලද මනසේ හිටියේ. සීමා නොකරන ලද මනසේ ඉන්න අපි ඇහැ ගැන දන්නෙත් නැහැ. රූප ගැන දන්නෙත් නැහැ. පෙනෙනවා කියන සිද්ධිය විතරයි තියෙන්නේ.

"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" - උපාදානයට හිත වූ ස්කන්ධ පංචකය දුකයි. ඒ නිසා උපාදානයට හිත විඳිහට ඇහැ උපද්දවන්න එපා. රූපය උපද්දවන්න එපා. චක්ඛු විඤ්ඤාණය උපද්දවන්න එපා කියන එක අහලා නැහැ. ඒ හින්දා අපි මොකද කරන්නේ, එක රූපයක් පමණක් සීමාවෙන විඳිහට හිතලා, ඒ රූපය ගැන දැනගෙන, ඇහැ සීමා කරලා එක රූපයක් විතරක් අල්ලගත්ත ගමන් තණ්හා උපාදාන වෙන එක නවත්තන්න බැහැ.

ඒ කියන්නේ 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' කියන හැඟීම යෙදෙනවා ම යි. එතකොට කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූපයක් කියලා රූපයේ යථාභූත ස්වභාවය පේනවා ද? පේන්නේ නැහැ. ඔන්න ඒ විඳිහට රූප බලලා ආපහු එන කොට සීමා නොකරන ලද මනසකුත්

---

47 https://tipitaka.lk/ap-dhs-4-12 - **උපාදානගොච්ඡකය- නික්ඛේපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 454 පිටුව**

තියෙනවා. ඊට අමතරව 'බාහිර මෙහෙම කෙනෙක් ඉන්නවා' කියන නිමිත්තකුත් තියෙනවා දැන්.

සීමා නොකරන ලද මනසේ ඉන්න කොට අපි අහලා නැහැ, උපාදානයට හිත විදිහට ඇහැ උපද්දවන්න එපා. රූපය උපද්දවන්න එපා. චක්ඛු විඤ්ඤාණය උපද්දවන්න එපා. ඇහැ දුක ම යි. රූපය දුක ම යි. චක්ඛු විඤ්ඤාණය දුක ම යි කියලා.

ඇයි එහෙම කියන්නේ? ඇහැ ඉපද්දුවොත්, රූපය ඉපැද්දුවොත් තණ්හා උපාදාන වෙන එක නවත්තන්න බැහැ. එහෙම වුණොත් භවය (නිමිති) හිටිනවා. එහෙම නිමිති හිටියොත් මතු ප්‍රතිසන්ධියට යන්න වෙයි කියලා ඉගෙනගෙන නැහැ. ඒ නිසා සංසාර ප්‍රවෘත්තිය ගැන බයකුත් නැහැ.

ඒ බය නැති හින්දා, *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"* කියන්නේ පෙනෙන දේ අරහයා එක දේකට හිතනවා, 'කෝප්පය' කියලා. හිතලා, හිත බාහිරට නැඹුරු කරලා බලනවා. එහෙම බලන කොට මේ කෝප්පේ පොසිලේන් වලින් හැදිලා තියෙන්නේ, මෙච්චර වටිනවා ඇති කියලා හොඳට තණ්හා උපාදාන වෙන විදිහට හිතලා ආපහු සීමා නොකරන ලද මනසට එන කොට, 'බාහිර මෙච්චර වටිනාකමෙන් යුක්ත කෝප්පයක් තියෙනවා' කියලා නිමිත්තකුත් දැන් අපි ගාව තියෙනවා.

අපිට නිමිති හිටියේ සීමා නොකරන ලද මනසේ හැසිරිලා නෙමෙයි. සීමා කරලා ගත්ත ගමන් ම ඒක 'පුද්ගලයෙක්' හෝ 'වස්තුවක්' හෝ 'දෙයක්' හැටියට ඇසුරු වෙනවා. එහෙම උපාදාන වශයෙන් ඇසුරු වුණාහම එතැනින් අපි ගියත්; දැකපු දේ, දැකපු කෙනා අන්න අතන ඉන්නවා කියන තැනකින් නිමිති හැදෙනවා.

ඕගොල්ලෝ කවදාවත් නොදැක්ක පැත්තක යන්න ඉස්සෙල්ලා අහවල් තැන අහවල් දේ මෙන්න මෙහෙමයි තියෙන්නේ කියලා මනසේ නිමිති තියෙනවා ද කියලා බලන්න? නැහැ. නමුත් වෙන මොකුත් ඕනේ නැහැ. එතනට ගිහින් නිකන් මෙහෙම ඇහෙන් බලලා එන්නකෝ. එතකොට දැකපු

දේ අන්න අහවල් තැන තියෙනවා කියලා නිමිත්තක් හිටින්නේ නැද්ද කියලා බලන්න.

අවිද්‍යා සහගත මනසකින් ඉන්න අපි ඇහෙන් රූප බලන්න බලන්න තමන්ගේ ලෝකය ලොකු වෙලා තියෙයි. කනෙන් කවදාවත් අහපු නැති දෙයක් අහපු ගමන් ම මෙහෙම මෙහෙම ශබ්දත් තියෙනවා කියලා නිමිති ලෝකය ලොකු වෙයි.

ඒ වගේ දකින, අහන, දැනෙන, දැන ගන්න දේවල් ඇති බවට ඉතුරු වෙලා තමයි භවය හැදෙන්නේ, ලෝකේ හැදෙන්නේ. ඒ ලෝකය (භවය) තිබුණොත් අදත් ජරා මරණ දුක් විඳිනවා. ඇයි? දැකපු, අහපු පැත්තේ ඉන්න අය ලෙඩවීම නිසා, මහලු වෙච්ච නිසා, මැරුණ නිසා ආදී ඔය ලෝකේ ඇතුළේ දේවල් නිසා අදත් දුක් විඳිනවා.

ඒ විතරක් නෙමෙයි ඔය ලෝකේ තියෙන නිමිත්තක් නිසා ම නැවත ප්‍රතිසන්ධියට යනවා. ඇහැ පරිහරණය කරනකන්, රූපය පරිහරණය කරනකන්, චක්ඛු විඤ්ඤාණය පරිහරණය කරනකන් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

මම ඔය කිව්ව ඒවා ග්‍රහණය කර ගන්න බැරි නම් එහෙම ම ඒ ටික කපලා දාන්න. මෙන්න මේ ටික අල්ල ගන්න. බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ ලෝකයට තමයි භවය කියලා කියන්නේ. ඒ ලෝකය/ භවය නිසා තමයි දරුවා මැරිලා, දෙමව්පියෝ මැරිලා, යානවාහන, ඉඩකඩම්, මිල මුදල්, ණය තුරුස් මේවා නිසා නොයෙක් විදිහේ දුක් දොම්නසුත් විඳිනවා වගේ ම සසර නැවත උපදින්නත් වෙන්නේ කියලා මේ ලෝකය පෙන්නුවා දුක හැටියට. **ඔය ලෝකය ම පෙන්නුවා දුක්ඛ සමුදය හැටියට.**[48]

ඇයි ඒ? ඔය ලෝකය කෙරෙහි තණ්හාවෙන් තමයි නැවත ප්‍රතිසන්ධියට යන්නෙත්. ඒ ලෝකය හැදුණු හැටි තමයි ඕගොල්ලෝ පටිච්චසමුප්පාද වශයෙන් මෙනෙහි කරන්න ඕනේ. මේ සිද්ධිය දැනගෙන ඉන්න.

---

[48] https://tipitaka.lk/sn-4-1-11-4/sinh - **ලෝකසමුදය සූත්‍රය- යෝගක්ඛේම වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 185 පිටුව**

අපි උප්පත්ති වශයෙන් ඔය ලෝකයට ආවා නෙමෙයි. බුදුරජාණන් වහන්සේ පෙන්නුවා, අපි උප්පත්ති වශයෙන් ආවේ කෙලෙස් නැති සීමා නොකරන ලද ප්‍රභාශ්වර මනසක් ඇතුව. ඇහැ හැදුන නිසා රාග, ද්වේශ, මෝහ හෝ අලෝභ, අද්වේශ, අමෝහ කියන අකුසල හෝ කුසල වශයෙන් හිතීම්, කීම්, කිරීම් කරන්න බැරි පෙනීම පෙනීම් මාත්‍රයක් පමණක් වූ මට්ටමක් ඇතුවයි අපි උපන්නේ. සීමා නොකරන ලද මනසේ හිඳිමින් අපිට හොඳටවත්, නරකටවත් හිතන්න බැහැ නේ.

අවිද්‍යාව නිසා උපාදානයට හිත විදිහට එහෙම නැත්නම් කෙලෙස් ඇති කර ගන්න පුළුවන් විදිහට ඇහැ හදාගන්න එපා. ඇහැට රූප අල්ලගන්න එපා. එහෙම කෙලෙස් (තණ්හා, උපාදාන) ඇති කර ගන්න පුළුවන් විදිහට රූපයක් ඉපැද්දුවොත් කෙලෙස් ඇති වෙනවා ම යි. ඇති වුණොත් උඹලා එතැනින් පැත්තකට යන කොට ඒ දැකපු දේ බාහිර තියෙනවා කියලා නිමිත්ත හිටිනවා.

කෙලෙස් ඇති වෙන්න පුළුවන් විදිහට කන හදාගන්න එපා. කන හදාගත්තොත් ඒකට තණ්හාව හා උපාදනය (දැඩිව ගන්නවා කියන එක) ඇති වෙනවා ම යි. එහෙම වුණොත් උඹලට කන ගැන, ශබ්දය ගැන නිමිති හිටිනවා/ භවය හැදෙනවා. භවය වුණොත් දුක එනවා කියලා අහලා තිබුණේ නැහැ. එහෙම අහලා නැතිකම හින්දා උපාදානයට හිත විදිහට ඇහැ, රූප, කන, ශබ්ද ආදිය හදාගෙන ඒකට කෙලෙස් උපදවාගෙන නිමිති හදාගෙන තියෙන්නේ කියන එක පෙන්වන්න තමයි පටිච්චසමුප්පාදය පෙන්නන්නේ.

උප්පත්ති වශයෙන් සීමා නොකරන ලද මනසකින් ආවට පස්සේ අපි ගාව තියෙන අවිද්‍යාව නැමැති වරද නිසා *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"*- අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විදිහට ස්කන්ධ ටික උපද්දලා ඒවාට තණ්හා උපාදාන වෙච්ච නිසා තමන් ඒ කෙලෙස් සහගතව ඇසුරු කළ නිමිත්ත බාහිර තියෙනවා කියලා මතකයක්/ නිමිත්තක් හිටියා. ඒකට තමයි භවය කියන්නේ. ඒකට තමයි ලෝකය කියන්නේ.

ඔන්න ඔහොම තමයි ඕගොල්ලොන්ට කර්ම භවය (ලෝකය) හැදුනේ කියන එක තමයි පටිච්චසමුප්පාද සිද්ධියෙන් පෙන්වන්නේ. උප්පත්ති වශයෙන් ආවේ පිරිසිඳු මනසකින් සෘජු ගමනක් යන්න. අවිද්‍යාව නිසා ඊට පස්සේ අපේ ගමන් මඟ සම්පූර්ණයෙන් වෙනස් වෙනවා.

අවිද්‍යාව හා සංඛාරය හරහා පංච උපාදානස්කන්ධයක් හදාගෙන ඒකට තණ්හා උපාදාන වෙලා නිමිති හදාගෙන ආපහු සීමා නොකරන ලද මනසට එනවා. අවිද්‍යාව හා කලින් හදාගත්ත නිමිති (ආස්‍රව) නිසා සීමා නොකරන ලද මනසේ ඉන්න බැරුව, ඒක බිඳගෙන ආයේ පංච උපාදානස්කන්ධයක් උපදවාගෙන ඒකට තණ්හා උපාදාන වෙලා නැවත අලුතෙන් අලුතෙන් නිමිති හදා ගන්නවා.

පංච උපාදානස්කන්ධයක් ම සිහි කරනවා. සිහි කරලා ආයේ බලනවා, අහනවා කියලා පංච උපාදානස්කන්ධය ඇතුළේ ම කැරකෙනවා. දැන් ඔන්න අපි ලෝකේ ඇතුළේ, ජරා මරණයට අයිති වෙලා. ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස ධර්මයෝ කියලා කියන්න වෙනවා ඇහැට, රූපයට. ඇයි ඒ?

ඇහැ උපන්නොත්, රූපය උපන්නොත්; ඇහැ ලෝකේ ප්‍රියයි මධුරයි. රූපය ලෝකේ ප්‍රියයි මධුරයි. ඒ නිසා තණ්හාව ඇති වෙනවා. එහෙම වුණොත් උපාදානය වෙනවා. උපාදානය වුණොත් භවය හැදිලා ජරා මරණ දුක එන නිසා.

ඇහැට තණ්හා නොකළොත්, රූපයට තණ්හා නොකළොත් උපාදාන වෙන්න බැහැ. උපාදානය නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ජාති ජරා මරණ නැහැ. එහෙනම් කෙලෙස් ඇති කර ගන්න පුළුවන් විදිහට ඇහැ උපද්දන්නේ නැතුව, රූපය උපද්දන්නේ නැතුව හිටපල්ලා කියලා උපදේශයක් අහලා තිබුණා නම් අපි එහෙනම් කවදාවත් සීමා කරලා නිමිති ගන්නේ නැහැ. අපිට එහෙම නම් කර්ම භවයක් අද නැහැ. පුරාණ කර්මයට හටගත්ත විපාක ටික විතරයි තියෙන්නේ. අපි එහෙම හිටියා නම්,

"ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං.
විරත්තචිත්තා ආයතිකෙ භවසම්මිං
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායමපදීපො." [49]

පුරාණ කර්මයට හටගත්ත විපාක ටිකත් ඉවරවෙන දවසක් එනවා. අලුතෙන් භවයකුත් නැහැ. නැවත භවයක නොඇලුණු සිතින් අපි පහනක් නිවෙනවා වගේ එහෙනම් නිවෙනවා.

දැන් අපි තේරුම් ගන්න ඕනේ අපිට වෙලා තියෙන දේ. දැන් අපිට දෙපැත්තක් පේන්න ඕනේ. අපි උප්පත්ති වශයෙන් ආපු තැන ගැන පේන්නත් ඕනේ. අද ඉන්න තැන ගැන පේන්නත් ඕනේ. උප්පත්ති වශයෙන් ආපු තැන මොකක් ද? ඇහැ හැදිලා රූප පෙනුණා. ඒ මට්ටමේ දී කුසල සහගතවත්, අකුසල සහගතවත් හිතිමි, කිමි, කිරිමි කරන්න බැහැ.

සීමා නොකරන ලද මනසකින් තමයි රූප පෙනුණේ. එතන තිබුණා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියලා ස්කන්ධ පහක් පෙනීම ඇතිවෙන්න. හැබැයි ඒ මට්ටමේ දී අපි එහෙම රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියලා කතාවක් දන්නෙත් නැහැ. පෙනීම පෙනීම් මාත්‍රයක් විතරයි. *"දිට්ඨෙ දිට්ඨමත්තං"*. ඒකට හිතන්න, කියන්න, කරන්නවත් බැහැ.

පෙනෙන්න තියෙන හේතු දෙක (නාම හා රූප) නැතිවෙන කොට ඉබේම පෙනෙන දේ ඉතුරු නැතිව ම නැති වෙනවා. ඔන්න ඔය සීමා නොකරන ලද මනසේ ඉඳලා බලලා අහකට යන කොට මනසේ නිමිති හිටින්නේ නැහැ. ඇයි? ඒකේ සීමා කරලා අහුවෙන්න එකක් නැති නිසා.

ඔය සීමා නොකරන ලද මනසේ හිටියා නම් ***"යං කිඤ්චි සමුදයධම්මං, සබ්බන්තං නිරොධධම්මන්ති"*** [50] - හටගත්ත දේ ඉතුරු නැතිව නැති වෙනවා කියන එක සාක්ෂාත් වෙන තැනක් තමයි මේ. ඒකට අපි මුකුත්

---

[49] https://tipitaka.lk/kn-snp-2-1 - **රතන සූත්‍රය- චූල වර්ගය- සූත්‍රනිපාතය- බුද්දක නිකාය- 72 පිටුව**

[50] https://tipitaka.lk/kn-nc-4 - **මෙත්තගූ සූත්‍ර නිද්දේශය- පාරායන වර්ගය- චූලනිද්දේශය- බුද්දක නිකාය- 160 පිටුව**

කරන්න ඕනේ නැහැ. මොකද, සීමා නොකරන ලද මනසේ දී මුකුත් අහුවෙලා නැති හින්දා අපිට නිමිති හිටින්නේ නැහැ.

ඕනේ නම් බාහිරයට නැමිලා පෙනෙන නිමිත්ත ම අල්ල ගත්ත හැකි. ඒ කිව්වේ මට ඕනේ නම් බාහිරයට නැමිලා 'මේ පිරිස හරි ලස්සනයි නේ', හෝ 'හොඳයි නේ' කියලා ඕනේ නම් කියන්න පුළුවන් නේ. එතකොට මම ඒ මට්ටමට සීමා කරගෙන තියෙනවා. යථාර්ථය තමයි සීමා නොකරන ලද මනස නිර්මාණය වෙලා තියෙන්නේ බැහැර නිසා ඕගොල්ලොන්ට පෙනෙනවා කියන එකක් වෙලා මිසක ඕගොල්ලෝ බලන්න යොමු වෙලා නැහැ කියන එකයි මේ කියන්නේ.

~ පෙනීම සහ බැලීම අතර වෙනස ~

අපිට පෙනෙනවා හා අපි බලනවා කියලා දෙකක් තියෙනවා. පෙනෙනවා කියන සිද්ධිය සීමා නොකරන ලද මනසක් තියෙන තැනක වෙන්නේ. බලනවා කියන එක කරන්නේ කර්මයකින් (චේතනාවකින්). ඒක අවිද්‍යා ප්‍රත්‍යයෙන් අපි අද කරන්නේ.

අවිද්‍යා සහගත මනසක් තියාගෙන මම බලන්න ගියොත්, මට බලන්න වෙන්නේ 'කෙනෙක්' හෝ 'දෙයක්' දිහායි. එතකොට ඒක චේතනාවකින් කරන්න වෙනවා. නමුත් සීමා නොකරන ලද මනසේ ඉන්න කොට 'පෙනෙනවා' කියන සිද්ධිය වෙන එකට චේතනාවක් ඕනේ නැහැ.

සීමා නොකරන ලද මනසකින් තමයි අපි උපන්නේ. මම මේ කියන්නේ ආදීම තැන ගැන. සීමා නොකරන ලද මනස කිව්වහම මොකුත් නිමිති නැති තැනක්ය කියලා තේරුනාට අද අපිට 'මම ඉන්නවා' කියන හැඟීම ආධ්‍යාත්මික පැත්තේ පසුතලයේ තියෙනවා. හොඳට ඒක මතක තියා ගන්න ඕනේ.

තව පැත්තකින් ගත්තහම පෙනෙන දේ නියෝජනයවන තැනක 'පෙනෙන්නේ මට' කියන හැඟීමක් අනුසය වෙනවා අද අපිට. ඒ අනුසය වෙන

ගතිය නැහැ රහතන් වහන්සේගේ සීමා නොකරන ලද පිරිසිදු මනසේ. සීමා නොකරන ලද මනස ගැන අද මම ඔහොම දළ වශයෙන් පෙන්නුවට තාම කෙලෙස් සහගතවයි පෙන්නන්න වෙලා තියෙන්නේ. පිරිසිදු මනස ඔයිට වඩා විශාල ශූන්‍යතාවයක්. ඒකේ කෙනා (රූපය දකින්නා) නැහැ.

බාහිය, යම් කලෙක ඔබට දැකීම දැකීමක් පමණ වුණොත් එකල්හි ඔබ එහි නැහැ. එකල්හි ඔබ මෙලොවත් නෙමෙයි. ඔබ පරලොවත් නෙමෙයි. ඔබ මෙලොව පරලොව දෙඅතර අතරත් නෙමෙයි[51] කියන තරමේ ශූන්‍යතාවයක් එතන තියෙනවා.

අපි ඇහැ උපද්දලා රූප නිමිති, කන උපද්දලා ශබ්ද නිමිති ගන්න පටන් ගත්තට පස්සේ තමයි ආධ්‍යාත්මික පැත්ත ගැන දැනුමක් ආවේ. එහෙම නැත්තම් අපිට ආධ්‍යාත්මික කය ගැන නිමිති නැහැ.

~ දකින්න බැරි ඇහැ / ඇහේ අනිදස්සන[52] බව ~

ඕගොල්ලො ඕගොල්ලොන්ගේ ඇහැ දැකලා තියෙනවා ද කියන්නකෝ? ඒ කිවුවේ ඕගොල්ලොන්ගේ ඇහැට ඇහැ පේනවද? නැහැ. ඕගොල්ලොන්ගේ ඇහැට වර්තමානයේ ද ඕගොල්ලොන්ගේ ඇහැ පේන්නේ නැත්නම්, එහෙනම් අතීතයේ දී ඕගොල්ලොන්ගේ ඇහැට ඕගොල්ලොන්ගේ ඇහැ පේන්න ඇද්ද? නැහැ.

එහෙනම් අනාගතයේ දී ඕගොල්ලොන්ගේ ඇහැට ඇහැ පෙනෙයි ද? නැහැ. අතීතයේ දී කවදාවත් ඇහැ දැකලත් නැති නම්, දැන් ද ඇහැ දකින්නේ නැති නම්, අනාගතයට ද ඇහැ දකින්නේ නැති නම්, කිසිම දවසක නොදැක්ක ඇහැ ගැන අපිට නිමිත්තක් තියෙන්න පුළුවන් ද? බැහැ.

---

51 https://tipitaka.lk/kn-ud-1-10/sinh - **බාහිය සූත්‍රය- පළමු බෝධි වර්ගය- උදාන පාළිය- ඛුද්දක නිකාය- 145 පිටුව**

52 https://tipitaka.lk/ap-dhs-3-3-1/11-8/sinh - **උපාදාරූප- රූපවිභත්ති- රූපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 279 පිටුව**

~ ඇහැ ගැන නිමිති හැදුණු හැටි ~

එහෙනම් ඕගොල්ලොන්ගේ ඇහැ ඕගොල්ලො අතීතයේ දී දැකලා නැති නම්, දැන් ද දකින්නේ නැති නම්, අනාගතයට ද දකින්නේ නැති නම් 'මේ මගේ ඇහැයි' කියලා දුක් වෙන්න නිමිත්තක් කොහෙන්ද? අන්න ඕක තමයි පංච උපාදානස්කන්ධයේ දෝෂය.

රූපය පෙනෙන කොට ටක්ගාලා ඇහැ නියෝජනය වෙනවා. මේ ඇහැ තියෙන හින්දයි, 'මට පෙනීම වෙන්නේ' කියන හැඟීමකින් ඕගොල්ලෝ ඇහැ අල්ලගෙන ඉන්නේ. ඇහැට පේන්නේ රූප. රූප ඇතුළේ ඇස් තියෙනවා ද? නැහැ. රූප ඇතුළේ තියෙන්නෙ ම රූප විතරයි.

එහෙනම් රූපායතනයෙන් ම තමයි අපි චක්ඛායතනය ගැන නිමිති අරගෙන තියෙන්නේ. බලන්න අපි කෙලෙස්වල කොච්චර දුරට ගිහිල්ලා ද කියලා. කණ්ණාඩියකින් බලලා, 'මේ තමයි මගේ ඇහැ' කියලා නිමිති අරගෙන තියෙන්නේ.

අපි කණ්ණාඩියක් ගාවට ගියහම අපේ මුණේ ඡායාව කණ්ණාඩියේ දකිනවා. ඒ ඡායාව කියන්නේ මොකක්ද? රූපයක්. අපි ඒ රූපය දිහා බලන්නේ මොකක් කියලා ද? ඇහැ දිහා බලනවා කියලා. එහෙම කණ්ණාඩියට වැටිලා තියෙන ඡායාව දිහා බැලුවහම, 'මගේ ඇහැත් මෙහෙමයි' කියලා ඕගොල්ලොන්ගේ මනසට නිමිත්තක් හිටලා තියෙනවා ඇහැ ගැන.

භවය කියලා කියන්නේ දැන් ඇහැ ගැන නිමිත්තක් තියෙනවා. ඒ මොකද? පංච උපාදානස්කන්ධයක හැසිරෙන්න ගියහම ඕකයි වෙන්නේ. ඔය ගතිය තිබුණේ නෑ පොඩි ළමයා සන්ධියේ දී. එතකොට එහෙනම් පුංචි ළමයා කාලේ ඇහැ, කන, නාසය, දිව, ශරීරය තියෙනවා කියන දැනුමක් ඇතුව ද ඉඳලා තියෙන්නේ? නැහැ.

'මම' කියලා ඕගොල්ලොන්ට නිමිත්තක් ගන්න පුළුවන් ඇහැ ගැන. කන ගැන, නාසය ගැන, දිව ගැන, කය ගැන, සිත ගැන. නමුත් ඕගොල්ලො

දන්නවා ද ඇහැ, කන, නාසය, දිව, කය, සිත කියන ආධ්‍යාත්මික ආයතන හය කවදාවවත් අතීතයේවත්, වර්තමානයේවත්, අනාගතයේදීවත් පෙනිලත් නැහැ, පේනවත් නෙමෙයි, පෙනෙන්නේ ද නැහැ කියන එක.

ඇහැට පේන්නේ මොනවා ද? රූප. ඇහැට සාපේක්ෂව හම්බ වෙන්නේ රූප (වර්ණ රූපය) විතර ම නම් අපිට ඇහෙන් කය දකින්න පුළුවන් ද? බැහැ, කයේ යථාර්ථය අනිදස්සන යි. භවය කියලා කියන්නේ/ පංච උපාදානස්කන්ධ ලෝකය කියලා කියන්නේ කෙලේසයකින් මවපු සිද්ධියක් තියෙන්නේ.

අවිද්‍යාව නැමති ධර්මතාව සක්‍රීය වුණාට පස්සෙයි අපි මේ පඹගාලේ පැටලුනේ මිසක පුරාණ කර්මයට හටගත්ත විපාක ටිකේ දී එහෙම නොපෙනුන දේ (ආධ්‍යාත්මික ආයතන) නොපෙනුන තැනක ම තිබුණා මිසක, නොපෙනුන දේ මට පෙනුණා කියන තැනක මනෝමය නිමිති තිබුණේ නැහැ අපිට.

එහෙම නම් උප්පත්ති වශයෙන් එන කොට ඇහැ, කන, නාසය, දිව, කය, සිත කියන එක ආයතනයක් ගැන හෝ අපිට නිමිති තිබිලා තියෙනවා ද? නැහැ. එහෙම නිමිති නැතුව සීමා නොකරන ලද මනසක් තිබුණා නම් හිතන්නකෝ ඒක මොන තරම් ශූන්‍යතාවයක් ද කියලා.

අද ඕගොල්ලොන්ට සීමා නොකරන ලද මනස ගැන අමුවට තේරෙනවා. නමුත් තාම 'මම ඉන්නවානේ' කියන කෙලෙස් අදහස ඕගොල්ලොන්ට තියෙනවා. ඒ කෙලෙස් අදහස ඇතුව ඉන්න කොට පවා සීමා නොකරන ලද මට්ටමක දී පෙනීම, ඇහීම වෙන කොට ඒ තුළ නිමිත්තක් පනවන්න බැරිවෙන කොට පුද්ගලභාවය නැති කාලේ දී කොච්චර ගැඹුරු ශූන්‍යතාවයක් තියෙන්න ඇද්ද කියලා පොඩ්ඩක් හිතලා බලන්නකෝ. අන්න එහෙම තැනකින් තමයි අපි ඉපදුණේ.

ඔය පුරාණ කර්මයට හටගත්ත විපාක ටික ගැන පෙන්වන්නේ; ගෙවල්, දොරවල්, යාන වාහන, ඉඩකඩම්, මිළ මුදල්, අම්මා තාත්තා, සහෝදරයෝ සහෝදරියෝ ඉන්න ලෝකයක් තියෙනවා නම් ඒ ලෝකයට

නෙමෙයි අපි උප්පත්ති වශයෙන් ඇවිල්ලා තියෙන්නේ කියන එක පෙන්වන්න. ඒ ලෝකේ හැදිලවත් නැහැ එතකොට. අපි ඇහැ විතරක් අරගෙන ශූන්‍යතාවයක් තියෙන තැනකට නම් ඇවිල්ලා තියෙන්නේ එහෙනම් අපිට ඇහැ ගැන, රූප ගැන නිමිති නැහැ.

ඇහැ දුක යි, රූපය දුක යි, චක්ඛු විඤ්ඤාණය දුක යි, චක්ඛු සම්ඵස්සය දුක යි, චක්ඛු සම්ඵස්සයෙන් උපන් වේදනාවක් තියෙනවා නම් එය ද දුක යි. කන දුක යි, ශබ්දය දුක යි, සෝත විඤ්ඤාණය දුක යි, සෝත සම්ඵස්සය දුක යි, සෝත සම්ඵස්සයෙන් උපන් වේදනාවක් තියෙනවා නම් එය ද දුක යි…..” [53] කියලා දකිනකම තමයි *“දුක්ඛෙ ඤාණං”* කියන එකේ නියම අර්ථය මිසක අනේ මම ඉපදෙනවා, ලෙඩ වෙනවා, මැරෙනවා නේද කියලා හිතන එක නෙමෙයි.

“දුක්ඛෙ ඤාණං” කියලා ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයාට දුක්ඛ සත්‍යය ගැන නුවණ ඇති වුණොත් ඇතිවෙන්න ඕනේ කොහොමද? ඉපදීම, ලෙඩවීම, මහලු බව, මරණය කියලා යම් තාක් දුක් මේ ලෝකේ දුක් තියෙනවා නම්, මේ දුක් ටික ඔක්කොම කියන්න වෙනවා ඇහැට, රූපයට, චක්ඛු විඤ්ඤාණයට, චක්ඛු සම්ඵස්සයට, චක්ඛු සම්ඵස්සයෙන් උපන් වේදනාවක් තියෙනවා නම් මේවායි දුක කියලා.

කන, ශබ්දය, සෝත විඤ්ඤාණය, සෝත සම්ඵස්සය, සෝත සම්ඵස්සයෙන් උපන්න යම් වේදනාවක් වේ නම් මේකයි දුක කියලා *“දුක්ඛෙ ඤාණං”* කියන කොට පංච උපාදානස්කන්ධයක්, ආයතන දොළහක්, අටළොස් ධාතුවක් තියෙනවා නම් මෙන්න මේ ටික දකිනවා දුක හැටියට.

ඇයි ඒ ටික ගැන දුකක් හැටියට නුවණක් තියෙන්නේ එයාට? ඇහැ තිබුණොත්, රූප තිබුණොත්, චක්ඛු විඤ්ඤාණය තිබුණොත්, කන තිබුණොත්, ශබ්දය තිබුණොත්, සෝත විඤ්ඤාණය තිබුණොත් තණ්හාව කියන එක උපදින්න හා පවතින්න පුළුවන් ක්ෂේත්‍රය ඒක.

---

[53] https://tipitaka.lk/sn-4-1-15-3/sinh - **දුතිය සප්පාය සූත්‍රය- නවපුරාණ වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 269 පිටුව**

තණ්හාව ඇති වුණොත් හා පැවතුනොත්; 'මම', 'මගේ', 'මගේ ආත්මය' ලෙස දැඩිව ගන්න එක වළක්වන්න බැහැ ම යි. එහෙම වුණොත් භවය හිටිනවා. භවය කියන්නේ මොකක් ද? මෙහෙම ඉන්න කොටත් 'මේ මම තමයි ඉඳගෙන ඉන්නේ', 'මට තමයි පේන්නේ' වගේ තැනකින් නිමිති හිටිනවා, ලෝකය හිටිනවා.

එහෙම ලෝකය ඇති බවට හම්බ වුණොත් ඉපදෙනවා. ඉපදුණොත් නැවත ජරා මරණ දුක එනවා කියලා දුක්ඛ සමුදයේ ඥානය එයා දන්නවා. තණ්හාව තමයි දුකට හේතුව කියලා. දුක්ඛ සමුදය (දුක ඇතිවෙන හේතුව) හැටියට දකින්නේ මොකක් ද? තණ්හාව. ඇයි ඒ? ඇහැ, රූප තිබුණොත් තණ්හාව ඇතිවෙනවා. තණ්හා වුණොත් උපාදාන වෙනවා. උපාදාන වුණොත් භවය ඇතිවෙනවා. භවය වුණොත් ජරා මරණ දුක ඇතිවෙනවා කියලා දන්නවා.

"දුක්ඛනිරොධෙ ඤාණං" - දුක නැතිවීම ගැන නුවණින් දන්නවා. ඇහැට තණ්හාව නැති වුණොත්, රූපයට තණ්හාව නැති වුණොත් උපාදාන වෙන්න බැහැ. ඒ කියන්නේ මම, මගේ, මගේ ආත්මය කියලා ගන්න බැහැ. එහෙම වුණොත් භවය නැහැ. භවය නැති වුණොත් ඉපදීම, ජරා මරණ ආදී දුක නැහැ.

එහෙනම් දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාව මොකක් ද? උපාදානයට හිත විදිහට ඇහැ නූපැද්දවිය යුතුයි. රූපය නූපැද්දවිය යුතුයි. ඉපැද්දුවොත් නේ තණ්හාව උපදින්නේ හා පවතින්නේ. එහෙනම් තණ්හාව නැති වෙන්න නම් මොකක්ද කරන්න ඕනේ? මුල් න්‍යායෙන් පෙන්නුවා ඇහැ තිබුණොත්, රූපය තිබුණොත් තණ්හාව ඇති වෙනවා කියන එක නවත්තන්න ම බැහැ කියලා.

එහෙනම් තණ්හාව නැති වෙන්නත් ඕනේ ඇහේ, රූපේ නම්; උපාදානයට හිත විදිහට ඇහැ, රූප නූපැද්දවිය යුතුයි. ඇහැ නූපැද්දුවොත්, රූපය නූපැද්දුවොත් මොකද වෙන්නේ? තණ්හාව කියන එකට ඉඩ නැහැ. තණ්හාව ගැන කවර කතා ද, තණ්හාව ඇතිවෙන්න තියෙන පොළොව ද

නැති වෙනවා. ඕකට කියනවා, ***"සෙතුඝාතො"*** [54] - හේතුව ම නැති කරනවා, තණ්හා අනුසය ම නැති කරනවා කියලා.

ඇහැ, රූපය තියෙද්දී තණ්හාව විෂ්කම්භන වශයෙන් නැති කරන්න පුළුවන් වුණත් තණ්හාව ඇතිවෙන හේතුව නැතිවෙලා නැහැ තාම. ඇයි ඒ? තණ්හාව ඇතිවෙන්නේ කොහෙ ද? ඇහැට නම්, රූපයට නම්; ඇහැ, රූප තියෙද්දී තණ්හාව විෂ්කම්භන වශයෙන් නැති කළත් තණ්හාව ඇතිවෙන හේතුව නැති වෙලා ද? නැහැ. උපාදානයට හිත වූ ඇහැ, රූපය නැති කළොත් තණ්හාව තියා තණ්හාව ඇතිවෙන හේතුවත් නැහැ කියනවා. එතකොට කියනවා තණ්හා මූලය ම ගලවලා දැම්මා කියලා.

"උච්ඡින්නමූලං" [55] - මුල ම උගුල්ලලා දැම්මා.
"තාලාවත්ථුකතං" - හිස් සුන් තල් කඳක් වගේ කළා කියලා.

එතකොට ප්‍රතිපදාව එනවා එහෙනම් මොකක් ද? ඇහේ නිරෝධය සාක්ෂාත් කළ යුතුයි, රූපයේ නිරෝධය සාක්ෂාත් කළ යුතුයි. කුමක් සඳහා ද? තණ්හා නිරෝධය සඳහා. එයා නිවන හැටියට දකින්නේ පංච උපාදානස්කන්ධයේ අනුප්පාද නිරෝධය.

පංච උපාදානස්කන්ධය මතු නූපදින ස්වභාවයට පත් කළ ගමන් ම තණ්හාව කියන එක මතු නූපදින ස්වභාවයට පත් වෙනවා. එයා දන්නේ ඇහැ නැති වුණොත්, රූපය නැති වුණොත් තණ්හා උපාදාන වෙන්න තැනක් නැහැ. එහෙම වුණොත් භවය නැහැ. භවය නැති වුණොත් ජාති ජරා මරණ දුක නැහැ කියලා.

ඒ හින්දා උපාදානයට හිත විදිහට ඇහැ උපද්දන්න හොඳ නැහැ, රූපය උපද්දන්න හොඳ නැහැ කියලා දන්න හින්දා එයා ඇහෙන් රූප දැකලා නිමිති අනුනිමිති වශයෙන් ගන්නේ නැහැ. ඇහැ රැකගන්නවා. කනෙන් ශබ්ද අහලා නිමිති අනුනිමිති වශයෙන් ගන්නේ නැහැ. කන

---

[54] https://tipitaka.lk/kn-nc-17 - **පාරායණානුගීති නිද්දේශය- පාරායණ වර්ගය- චූලනිද්දේශය- ඛුද්දක නිකාය- 422 පිටුව**

[55] https://tipitaka.lk/sn-4-10-1-1 – **බේමා සූත්‍රය- අබ්‍යාකත වර්ගය- අබ්‍යාකත සංයුක්තය- සංයුත්ත නිකාය 4- 674 පිටුව**

රැකගන්නවා. කය කෙරෙහි, වේදනාව කෙරෙහි, හිත කෙරෙහි හෝ ධර්ම කෙරෙහි සිහිය පිහිටුවාගෙන නිමිති අහුවෙන්නේ නැති විදිහට කටයුතු කරනවා.

උපාදානයට හිත විදිහට, තණ්හාව ඇතිවෙන විදිහට ඇහැ උපද්දන්න හොඳ නැහැ, රූපය උපද්දන්න හොඳ නැහැ කියන නුවණයි ආවේ. එතකොට දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාව මොකක්ද මෙයාගේ? ඇහැ තිබුණොත් රූපේ තිබුණොත් නේ තණ්හාව එන්නේ. ඇහැ නැත්නම් රූපය නැත්නම් තණ්හාවට උපදින්න හෝ පවතින්න පුළුවන් ද? බැහැ. ඒ හින්දා තණ්හාව ඇතිවෙන්න පුළුවන් විදිහට ඇහැ උපද්දන්නේ නැතුව රූපය උපද්දන්නේ නැතුව ජීවත් වෙනවා කියන ක්‍රමය තමයි මෙයාගේ දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාව.

ඒ හින්දා රූපයක් බැලුවත් තණ්හාව ඇතිවෙන විදිහට, උපාදානයට හිත විදිහට බලන්නේ නැහැ. සතිපට්ඨානයට හිත තියාගෙන තමයි බලන්නේ. රූපයක් දිහා බලන්න ඕනේ වුණොත් කනබොන ආහාරයෙන් හැදුණු කුණාප කොටස් ටිකක්, සතර මහා ධාතුයි කියන නුවණ තියාගෙන රූපය දිහා බැලුවහම එයා හැසිරෙන්නේ රූපයේ නෙමෙයි, සතිපට්ඨානයේ.

රහතන් වහන්සේ නමක් අපි වගේ පෙනෙන වර්ණ සටහනේ ‘පුද්ගලයෙක්’ කියලා හිත තබන්නේ නැහැ උපාදාන වෙන්න. රූපය දිහා බැලුවත් යථාභූත ඥානයෙන් බලන්නේ. කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූපයක් නේ කියලා බලන කොට ම පේන්නේ නෑ ‘රූපය මනුස්සයෙක්’ කියලා. එතකොට උපාදානයට හිත නැහැ.

අපි සතිපට්ඨානයට හා යථාභූත ඥානය නැතුව රූපය විතරක් බලපු ගමන් ම ‘කෙනෙක්’ හෝ ‘වටිනා හෝ නොවටිනා දෙයක්’ කියන අදහස එනවද නැද්ද? එනවා. ඒ නිසා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා ඇහැ පරිහරණය කරනවා උපාදානයට හිත නොවෙන විදිහට සතිපට්ඨානය තුළ වාසය කරමින්.

"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" - උපාදානයට හිත ස්කන්ධ විතරයි දුක කිව්වේ. එහෙම නැතුව උපාදානයට හිත නොවන විදිහට ස්කන්ධ පරිහරණය කරන්න ගියා කියලා ඒකේ දෝෂයක් නැහැ. කෙනෙක් රත්වෙච්ච යකඩයක් අතින් අල්ලගත්තොත් මොකද වෙන්නේ? පිච්චෙනවා. ඒක ම තව කෙනෙක් අල්ලනවා අඬුවකින්. එතකොට මොකද වෙන්නේ? පිච්චෙන්නේ නැහැ.

ඒ වගේ රූපය කියන්නේ තණ්හාව උපදින්න පවතින්න පුළුවන් එකක්. කෙලින් ම ඔය රූපයට හිත තිබ්බ ගමන් රත්වෙච්ච දේ අතින් ඇල්ලුවා වගේ තණ්හා, උපාදාන වෙනවා කියන එක නවත්තන්න බැහැ. සතිපට්ඨානය නැතුව බලපු ගමන් ම, 'මේ රූපය මනුස්සයෙක්' කියන අදහස එනවා ක්ෂණිකව.

එතැනින් පැත්තකට යන කොට භවය හිටිනවා. ඒ කිව්වේ 'මනුස්සයෙක් අහවල් තැන ඉන්නවා' කියන අදහස මනසේ හිටිනවා ම යි. මරණාසන්න මොහොතේ ඒ ඉන්න මනුස්සයා සිහි කරලා ප්‍රතිසන්ධි වශයෙන් යන්නත් පුළුවන් එතකොට.

ඒ රූපය ම බලනවා රහතන් වහන්සේලා, රත්වෙච්ච යකඩේ අඬුවකින් අල්ලගන්නවා වගේ. කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක් සතර මහා ධාතුයි කියන නුවණ තියාගෙන. එතකොට රූපයේ හැසිරිලා ද? නැහැ. රහතන් වහන්සේ රූප බැලුවත් රූපයෙන් මිදිලා.

සීමා කරලා බැලුවත් උන්වහන්සේ බලන්නේ කායානුපස්සනාව අනුව සිහි නුවණින්. එතකොට රූපයේ හැසිරෙන්නේ නැතුව නුවණින් විනිවිද ගිහින් තියෙන්නේ රූපයේ යථාභූත ස්වභාවයට. ඒ හින්දා රූපය උන්වහන්සේට උපාදානයට හිත විදිහට නැහැ.

අර පෙන්වන්නේ කුරුරට වාසී යටත් පිරිසෙයින් දැසිදස් කම්කරුවොත් වතුර කළයක් ගේන්න ගියත් සතිපට්ඨානයෙන් ගියා කියලා. ඕගොල්ලො දැන් දන්නවා සතිපට්ඨානය නැතුව රූප බලන්න ගියොත්, ශබ්ද අහන්න ගියොත් ජරා මරණයට ම නියත වෙනවා කියලා.

මොකද, ඇහැ කියන එක දුක ම යි, රූපය කියන එක දුක ම යි කියලා ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා දන්නවා. ඇයි ඒ දුක? ඇහැ තිබුණොත්, රූපය තිබුණොත් තණ්හාව උපදිනවා හා පවතිනවා කියන එක නවත්තන්න බැහැ. තණ්හාව ඇති වුණොත් උපාදාන වෙනවා කියන එක නවත්තන්න බැහැ.

උපාදාන වුණොත් භවය හැදෙනවා කියන එක නවත්තන්න බැහැ. භවය හැදුණොත් ඉපදෙනවා කියන එක නවත්තන්න බැහැ. ඉපදුනොත් ජරා මරණ දුක එනවා කියන එක නවත්තන්න බැහැ. උපාදානයට හිත විදිහට ඇහැ උපද්දන කොට රූපය උපද්දන කොට සියළු ගතිවලට තියෙන හේතුව හැදිලා ඉවරයි. ඒ හින්දා දුක්ඛ සමුදයත් එයා දන්නවා.

දුක්ඛ නිරෝධයත් දන්නවා. ඇහැට රූපයට තණ්හාව නැත්නම්, කනට ශබ්දයට තණ්හාව නැත්නම් උපාදාන වෙන්න බැහැ. එහෙනම් භවය නැහැ. භවය නැති නිසා ඉපදීම නැහැ. ඉපදීම නැති නිසා ජරා මරණ දුක නැහැ. ඒ හින්දා තණ්හාව ඇතිවෙන විදිහට ඇහැ නූපද්දවිය යුතුයි, රූපය නූපැද්දවිය යුතුයි කියලා.

~ රහතන් වහන්සේ සහ අපි ~

රහතන් වහන්සේ සීමා කරලා බැලුවත් සතිපට්ඨානය තුළ වාසය කරමින් බැලුවා මිසක ලෝකයා වගේ රූපයේ හැසිරෙන්නේ නැහැ. අපි උදාහරණයක් කිව්වොත් පිටතින් ලස්සනට සිතුවම් කළ ලියවැලක් තියෙන මැටි කළයක් තියෙනවා. ඒ මැටි කළය ඇතුළේ පණුවෝ ගහපු ගඳ ගහන අසුචි පුරවලා තියෙන්නේ. කෙනෙකුට ඒක හරි ලස්සන මැටි කළයක් නේද කියලා අතගාලා ගෙදරත් ගෙනිහින් තියා ගන්න පුළුවන්. හැම වෙලාවේ ම තණ්හාවෙන් ම ඉන්න පුළුවන්.

තව කෙනෙකුට පුළුවන් ඒ දිහා ම බලන්න, මෙච්චර ලස්සනට සිතුවම් කරලා තිබ්බත් මේකේ ඇතුළේ පුරවලා තියෙන්නේ පණුවෝ නලියන

මහා ගන්ධස්සාර අසුචියක් නේද කියලා ඇහැට පෙනෙන දේ තුළ නවතින්නේ නැතුව, පෙනෙන දේ විනිවිද නුවණින් ඇතුළට ගිහින් බලන්න.

කලින් කෙනා වගේ මෙයා ලියවැලේ සතුටු වෙමින් හැසිරෙනවා ද? නැහැ. දෙන්නම මැටි කළය දිහායි බැලුවේ. එක් කෙනෙක්ගේ දැක්ම සීමා වුණා කොතැනට ද? මැටි කළයේ පිටත පොත්තේ වූ ලියවැලට. ඒක තමයි උපාදානයට හිත. ඒ කියන්නේ පෙනෙන වර්ණ සටහනට පමණක් සීමා කළා එයා. අනෙක් කෙනා මැටි කළය දිහා බැලුවා, එයාගේ දැක්ම සීමා වුණේ කොතැනට ද? රූපයේ යථාභූත ස්වභාවයට, අසුචියක් ම තියෙනවා කියලා.

ඒ හින්දා එයාට තණ්හාව ආවද පිටත සිතුවම ගැන? නැහැ. එයාට උපාදානය ආවා ද? නැහැ. ඒ හින්දා ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා දන්නවා; උපාදානයට හිත විදිහට ඇහැ උපද්දලා, රූපය උපද්දලා නිදුකින් හිටියේ නැහැ කවුරුත්. ඒ කියන්නේ සතිපට්ඨානයේ නොපිහිටා රූපය දිහා බලලා සුවපත් වෙන්න බැහැ කිසි වෙලාවකවත්. බලනවා නම් බලන්න ඕනේ කොහොමද? සතිපට්ඨානය තුළ වාසය කරමින්.

"අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති, බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති" - කය කෙරෙහි සිහිය නුවණ පිහිටුවා ගෙන පරිහරණය කරනවා එයා. ඒ මොකද ඒ? උපාදානයට හිත විදිහට ඇහැ උපද්දන එක, රූපය උපද්දන එක දුක ම යි කියලා එයාට *"දුක්ඛෙ ඤාණං"* තියෙන හින්දා.

තණ්හාව ඉපදුනොත් උපාදාන වෙලා භවය හැදිලා ජරා මරණ දුක එනවා කියලා දුක්ඛ සමුදය ගැන නුවණ තියෙන හින්දා. ඇහැට, රූපයට තණ්හාව නැති වුණොත් උපාදාන වෙන්නේ නැහැ. උපාදානය නැති වුණොත් භවය නැහැ. භවය නැති වුණොත් ජරා මරණ දුක නැහැ කියලා දුක්ඛ නිරෝධයේ ඥානයත් දන්න හින්දා.

ඒ නිසා දුක්ඛ නිරොධගාමිණී ප්‍රතිපදාව හැටියට එයා දන්නවා සතර සතිපට්ඨානයෙන් වාසය කළ යුතුයි කියලා. හැම වෙලාවේ ම සතර සතිපට්ඨානය වඩන්නේ ඇයි? උපාදානයට හිත විදිහට ඇහැ උපද්දන්නේ

නැති වෙන්න, රූපය උපද්දන්නේ නැති වෙන්න. එයා අටළොස් ධාතුව, ලෝකය දකින්නේ මහා ගින්දරක් හැටියට.

ඒ නිසා උපාදානයට හිත විදිහට අලුතෙන් ඇහැ උපද්දන්නේ නැති වෙන්න, රූපය උපද්දන්නේ නැති වෙන්න පුළුවන් තරම් සීමා නොකරන ලද මනසෙන් හෝ සතිපට්ඨානයෙන් සිහි ඇතුව වාසය කරනවා. රූපයක් බලන්න ඕනේ නම් රූපයක් බලන්නේ කොහොමද? උපාදානයට හිත නොවෙන විදිහට සතිපට්ඨානය තුළ වාසය කරමින්.

උපාදානයට හිත විදිහ හා උපාදානයට හිත නොවන විදිහ මතකයි නේද? මැටි කළයේ පිටත පොත්තට විතරක් හිත තබලා බැලුවොත් ඒක මොකක් ද? උපාදානයට හිතයි. ඒ මැටි කළය දිහා ම බලනවා පිටත පොත්තේ තියෙන සිතුවමේ හිත රැඳෙන්නෙ නැතුව, මෙහෙම සිතුවමක් තිබුණට මේකේ ඇතුළේ තියෙන්නේ 'අසුචි ගොඩක් නේද' කියලා නුවණින් අර පිටත පොත්ත කඩාගෙන යනවා ඇතුළට.

එතකොට ඒ කළය උස්සලා කරට ගත්තත් එයාට තණ්හාව ඇති වෙලා නැහැ. ඒ වගේ යමක් දිහා බලන කොට යථාභූත නුවණෙන් දැක්ම අරගෙන පරිහරණය කරනවා. තණ්හාව උපදින හා පවතින විදිහට පිටත පොත්තේ/ වර්ණ රූපයේ හැසිරෙන්න නොදී ජීවත් වෙනවා.

ඒකට උපකාර පිණිස ඇහෙන් රූප බලලා නිමිති අනුනිමිති වශයෙන් ගන්නේ නැතුව ඉන්ද්‍රිය සංවර කර ගන්නවා. සතිපට්ඨානයට තියෙන සිහිය හා නුවණින් එදිනෙදා ජීවිතයේ වැඩ කටයුතු ටික කරනවා. ඔන්න ඔය විදිහට ජීවත් වුණොත් අලුතෙන් පංච උපාදානස්කන්ධ ලෝකය හැදෙන්නේ නැහැ. ඒ හින්දා සතිපට්ඨානය තුළ ම වාසය කරන්න ඕනේ.

දැන් ඕගොල්ලොන්ට දුකත් තේරුණා, දුක්ඛ සමුදයත් තේරුණා, දුක්ඛ නිරෝධයත් තේරුණා. ඒ කියන්නේ ඇහැ, රූප ආදී දොළොස් ආයතන තණ්හාවට හිත විදිහට ඉපැද්දවිය යුතු නැහැ ම යි කියලා නිරෝධයත් තේරුණා. බලනවා නම්, අහනවා නම් සතිපට්ඨානයෙන් වාසය කළ යුතුයි කියලා ප්‍රතිපදාවත් තේරුණා, ඒක නිසැකයි දැන්.

ඒ වුණාට ඒ විදිහට ඕගොල්ලොන්ට ඉන්න බැහැ. ඇයි ඒ? මෙච්චර කාලයක් විද්‍යාව නැතිව අවිද්‍යාව නිසා ලෝකය උපද්වාගෙන පරිහරණය කළ හුරුවක් තියෙනවා. ඒ කියන්නේ ආස්‍රව තියෙනවා දැන්. ආස්‍රව ගෙවිලා නැති හින්දා කොච්චරවත් දරුවා සිහි වෙනවා, ගෙදර සිහි වෙනවා, ගමේ ගිය එක සිහි වෙනවා.

දැන් මේ චතුරාර්‍ය සත්‍යය දර්ශනය ඇත්තයි කියලා දැනගත්තත් ඒ තුළ ඉන්න බැහැ ඒ නිසා. එහෙනම් ඕගොල්ලොන්ට දෙවෙනි කොටසක් මතු වෙනවා ආස්‍රව ක්ෂය කර ගත යුතුයි කියලා. තේරෙනවා නේද?

"දුකෙඛ ඤාණං දුකඛසමුදයෙ ඤාණං දුකඛනිරොධෙ ඤාණං දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං" [56] කියන ලෝකෝත්තර සම්මාදිට්ඨිය ආවට පස්සේ දෙවනුවට එනවා; ***"ආසවඤඳව පජානාති, ආසවසමුදයඤඳව පජානාති, ආසවනිරොධඤඳව පජානාති, ආසවනිරොධගාමිනිං පටිපදඤඳව පජානාති"*** [57] කියන එක.

මොකද, සීමා නොකරන ලද මනසෙන් හෝ සතිපට්ඨානයෙන් වාසය කළ යුතුයි කිව්වට එහෙම කරන්න බැරි ඕගොල්ලොන්ට තියෙනවා;

කාමාස්‍රවය -

කාම භාණ්ඩ ඇසුරු කළ හුරුව. උදා:- දරුවෝ එක්ක, දෙමව්පියෝ එක්ක, යානවාහන, ඉඩකඩම්, මිළ මුදල් එක්ක ගනුදෙනු කළ හුරුවක් තියෙනවා. ඕකට කියනවා 'කාමාස්‍රවය' කියලා.

භවාස්‍රවය -

කොළඹ ගියා, නුවර ගියා, මාතලේ ගියා, අනුරාධපුරේ ගියා, ගමේ ගියා, ගෙදර ගියා, කඩේ ගියා කියලා ලෝකේ ඇතුළේ එහාට මෙහාට ගිය පාරවල් පවා ඇති බවට පේන හුරුවක් තියෙනවා. ඕකට කියනවා 'භවාස්‍රව' කියලා.

---

[56] https://tipitaka.lk/sn-5-1-1-8 - **විභඞ්ග සූත්‍රය- අවිජ්ජා වර්ගය- මග්ග සංයුත්තය- සංයුක්ත නිකාය 5- 14 පිටුව**

[57] https://tipitaka.lk/mn-1-1-9 - **සම්මාදිට්ඨි සූත්‍රය- මූලපරියාය වර්ගය- මජ්ඣිම නිකාය 1- 132 පිටුව**

දිට්ඨාස්‍රව -

සත්ත්වයෝ, පුද්ගලයෝ, ආත්මයන් තියෙනවා කියලා හුරුවක් තියෙනවා. ඒකට කියනවා 'දිට්ඨාස්‍රවය' කියලා.

අවිද්‍යාස්‍රව -

චතුරාර්ය සත්‍යය නොදන්නාකමත් හුරුවක් වෙලා තියෙනවා. ඒකට කියනවා 'අවිද්‍යාස්‍රවය' කියලා.

ආස්‍රව කියලා කියන්නේ මෙච්චර කාලයක් ලෝකය උපද්දවලා ඇසුරු කරපු හුරුව හින්දා ලෝකේ තුළ තියෙන එක එක ඒවා සිහි වෙනවා. ආස්‍රව ක්ෂය පිණිස දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාව දැන් ඕගොල්ලොන්ට තියෙනවා තණ්හාව උපදින්න හා පවතින්න හේතුවෙන විදිහට නිමිති ගන්නේ නැතුව ජීවත් විය යුතුයි කියන එක. එහෙනම් සතිපට්ඨානය තුළ ම වාසය කරන්න වෙනවා.

~ ආස්‍රව ක්ෂය යනු ~

දැන් නේ අපි විද්‍යාව ගැන අහලා දැන ගත්තේ. මෙච්චර කල් අවිද්‍යාව නිසා, ඒ කියන්නේ ඇත්ත නොදන්නාකම නිසා ඇහැ උපද්දලා, රූපය උපද්දලා, කන උපද්දලා, ශබ්දය උපද්දලා භවය හදාගෙන ඒ තුළ ගනුදෙනු කළ හුරුව (ආස්‍රව) තියෙනවා. ඒ ආස්‍රව ගෙවෙන්නේ නෑ නේ විද්‍යාව ගැන අහලා දැනගත්තා කියලා. මං තව කාරණාවක් කියන්නද. භවයට තව නමක් කිවුවනේ ලෝකය කියලා. ඕකට තව නමක් ආස්‍රව.

ඒ කියන්නේ මිලමුදල් පරිහරණය කරපු, දුවා දරුවෝ, දෙමව්පියෝ එක්ක ගනුදෙනු කෙරුව ඕගොල්ලොන්ගේ මනසේ තියෙනවා හුරු ටිකක්. ඒකට කියනවා 'කාමාස්‍රවය' කියලා. ඊට පස්සේ අරෙහේ ගියා, මෙහේ ගියා, අහවල් තැනට මෙහෙමත් යන්න පුළුවන්, අරමත් යන්න පුළුවන් කියලා හිතෙන් පාරවල් කියවන්න පුළුවන් හුරු ටිකක් තියෙන්නේ. ඒකට කියනවා

‘භවාස්‍රවය’ කියලා. ඔය මනසේ තියෙන ආස්‍රව ටික ගෙවුනොත් ලෝකේ කියලා එකක් නැහැ. ආස්‍රව ක්ෂය වෙන කොට ලෝකය නිරුද්ධ වෙනවා.

ආස්‍රව ටිකකින් තමයි ලෝකය කියන එක පවතින්නේ. රහතන් වහන්සේට ආස්‍රව ක්ෂය යි. ආස්‍රව ක්ෂය (ක්ෂීණාස්‍රව) වුණ ගමන් උන්වහන්සේ ලෝකෝත්තර වෙලා. ලෝකය කියලා එකක් ඉතුරු වෙන්නේ නැහැ.

ආස්‍රව ක්ෂය කර ගන්න තියෙන්නේ කොහොමද දන්නවා ද? පංච උපාදානස්කන්ධයේ උදයවැය පෙන්නන්න ඕනේ. ඒ කියන්නේ ඕගොල්ලොන්ට බැහැර මොනවා හරි කෙනෙක් හෝ දෙයක් හෝ තැනක් හෝ සිහිවෙන කොට ඉස්සෙල්ලා ම ඕගොල්ලො ආස්‍රව හඳුනා ගන්න ඕනේ.

දෙමව්පියෝ හෝ දරුවෝ හෝ සහෝදරයෙක් හෝ ඉඩකඩමක් හෝ ඇඳ, පුටු, මේස හෝ මොනවා ම හරි බඩු භාණ්ඩයක් හෝ පුද්ගලයෙක් සිහි වුණොත් ඒකට කියනවා ‘කාමාස්‍රව’ කියලා. කාමය ඇසුරු කරපු හුරුවක් ඒ. අම්මා, තාත්තා, දුව, පුතා කියන්නේ කාම ලෝකේ නෑදෑකමක් නේ. කාම සහගත සංඥා මනසිකාරයක් නේ තියෙන්නේ. ඒත් කාම භාණ්ඩ ම තමා. ගෙවල් දොරවල්, ඉඩකඩම්, රන්, රිදී, මුතු, මැණික්, කබඩ් එකක් මේසයක් පුටුවක් කිව්වොත් මොනවා ද ඒවා? කාම ලෝකෙට අයිති බඩුමුට්ටු. ඒවා ඇසුරු කරපු හුරුවට කියනවා ‘කාමාස්‍රවය’ කියලා.

ඊටපස්සේ ලෝකේ ඇතුළේ යන්න එන්න පුළුවන් හුරු ටිකක් තියෙන්නේ නුවර ගියා, කොළඹ ගියා, මාතලේ ගියා, අනුරාධපුරේ ගියා කියලා අපිට පාරවල් ඇති බවට පේන්නේ. ඒකට කියනවා ‘භවාස්‍රවය’ කියලා. ***“කම්මං භෙතනං”***[58] කියලා කියන්නේ භවයට.

ඕවා එකක්වත් අපි කුඩා කාලේ මනසේ තිබුණේ නැහැ. ඔක්කොම ටික උපාදානයට හිත ස්කන්ධ ටික අරගෙන හැසිරෙන්නට ගත්තට පස්සේ ඇති වුණ දෝෂ ටිකක්. කාම භාණ්ඩ ඇසුරු කරපු හුරුවට කියනවා

---

[58] https://tipitaka.lk/an-3-2-3-7/pali - **3. 2. 3. 7- ආනන්ද වර්ගය- දෙවන පණ්ණාසකය- අඞ්ගුත්තර නිකාය 01- 396 පිටුව**

‘කාමාස්‍රවය’ කියලා. ලෝකේ තුළ එහාට මෙහාට ගිය හුරුවක් තියෙනවා නම් ඒකට කියනවා ‘භවාස්‍රවය’ කියලා.

සත්ත්වයෙක්, පුද්ගලයෙක්, ආත්මවල් ඉන්නවා කියන හැඟීමක් තියෙනවා නම් ඒකට කියනවා ‘දිට්ඨාස්‍රවය’ කියලා. ඕගොල්ලෝ පුද්ගලයෝ ගැන සිහි කරනවා, අතන අහවල් ගොඩනැගිල්ල තියෙනවා, ඒ ගොඩනැගිල්ලේ ඉඳන් අහවල් ගොඩනැගිල්ලට අච්චර දුරයි කියලා පාරවල් ගැන පොළොව ගැන කතා කරනවා, සිහි කරනවා. ඒ කතා කරන දේවල්, සිහි කරන දේවල් ආස්‍රව නේද කියලා නොදන්නාකමකුත් තියෙනවා. ඒකට කියනවා ‘අවිජ්ජාස්‍රවය’ කියලා.

කාමස්‍රව, භවාස්‍රව, දිට්ඨාස්‍රව, අවිජ්ජාස්‍රව කියන ඔය හුරු ටික තමයි ඕගොල්ලෝ නිතර ම හිත හිතා ඉන්නේ. ඔය හිත හිතා ඉන්න එකට තමයි ලෝකය කියලා එකක් නිර්මාණය වෙලා තියෙන්නේ. වෙන ලෝකේ කියලා එකක් නැහැ. ඕගොල්ලොන්ගේ ඔය හුරු ටික මතයි ලෝකේ තියෙන්නේ. ඒකයි ආස්‍රව ගෙවුණාහම ලෝකය කියලා එකක් නැහැ, භවය කියලා එකක් නැහැ. ඒ හින්දා දැන් ඕගොල්ලොන්ට වෙනවා මොකක් ද? ආස්‍රව ක්ෂය කරන්න.

ආස්‍රව ක්ෂය කර ගන්න ස්කන්ධයන්ගේ උදය වැය පෙන්වනවා. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර නිසා පංච උපාදානස්කන්ධ ලෝකය හටගත්තා කියලා පෙන්වනවා. අපි කියමුකෝ අපිට දරුවෙක් සිහි වෙනවා කියලා. දැන් අපිට හිතෙන්නේ ම දරුවා ඉන්නවා කියලා.

‘දරුවා ඉන්නවා’ කියලා විතරක් සිහි වෙනවා නෙමෙයි, උදේ එන කොට ඔළුවත් අතගාලා, මූණත් ඉඹලා, ‘පුතේ මම ගිහින් සිල් අරගෙන එන්නම්’ කියලා මෙතනට ආවේ කියලා හිතන්නකෝ. දැන් අපිට, ‘දරුවා ඉන්නවා’ කියන එක ඇත්ත වෙලා. කෙලේසයෙන් එච්චරට සජීවී කරනවා. එතකොට ඕගොල්ලො පෙන්වන්න ඕනේ හොඳට බර කරලා ඇත්ත යථාර්ථය.

~ සීමා නොකරන ලද මනසේ සිට කළ යුතු පර්යේෂණය ~

දැන් ඔය පයෝෂණය කරන්න ඕනේ ඕගොල්ලෝ සීමා නොකරන ලද මනසේ ඉඳලා. ඇඟේ මස්, ලේ, නහර පසාරු කර ගෙන යන්න තරමේ දරු සෙනෙහස තියෙනවානේ ඕගොල්ලොන්ට. එතකොට ඕගොල්ලෝ පෙන්වනවා ඉස්සෙල්ලා රූපයේ ඇත්ත. පොළොවේ තියෙන මැටි ටිකකට, ගඩොල් කැටයක තියෙන පස් ටිකකට, හුඹහක තියෙන මැටි ටිකකට මම 'දරුවා' කියලා කිව්වොත් හරි ද? වැරදි.

'දරුවා' කියන නිමිත්ත සිහි කරලා අරගෙන ඇස් ඉදිරිපිටට ආපු කනබොන ආහාරයෙන් හැදෙන රූපයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, සම් ආදී කොටස් ටික පස්වල තියෙන තද ස්වභාවයට සමාන යි. ළිඳක, වැවක, පොකුණක තියෙන වතුර ටිකකට මම 'දරුවා' කිව්වොත් හරි ද? නැහැ.

එහෙනම් ඇස් ඉදිරිපිටට ආපු කනබොන ආහාරයෙන් හැදෙන රූපයේ තියෙන පිත, සෙම, සැරව, ලේ, දහඩිය ආදී කොටස්වල ආපෝ ධාතු ස්වභාවයත් ළිඳක, වැවක, පොකුණක තියෙන වතුර ටිකක තියෙන ආපෝ ධාතු ස්වභාවයත් සමාන යි.

බාහිර ගිනි ගොඩක තියෙන රස්නයට මම 'දරුවා' කියලා කිව්වොත් හරි ද? නැහැ. එහෙනම් කනබොන ආහාරයෙන් හැදෙන රූපයේ තියෙන උෂ්ණයත්, බාහිර ගිනිගොඩක තියෙන රස්නයත් තේජෝ ධාතු. බාහිර වායෝ ධාතුවට මම 'දරුවා' කිව්වොත් හරි ද? නැහැ. එහෙනම් කනබොන ආහාරයෙන් හැදෙන ඇස් ඉදිරිපිටට ආපු රූපයේ තියෙන වායෝ කොටස් ටිකත්, බාහිර වායෝ ධාතුවට සමාන යි.

කනබොන ආහාරයෙන් හැදුණු රූපමිටිය අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විදිහට අල්ලගෙන තණ්හා උපාදාන වශයෙන් 'කෙනෙක්', 'පුද්ගලයෙක්', 'මගේ දරුවා' කියලා හිත හසුරුපු නිසා ඒ රූපය දරුවා කියලා මනසේ නිමිත්තක් හිටියා.

මගේ මනසේ ‘දරුවා’ කියන නිමිත්තක් ඇවිල්ලා තියෙන්නේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ප්‍රත්‍යවලින්. බැහැරින් තියෙනවා කනබොන ආහාරයෙන් හැදුණු රූපය. අවිද්‍යා කර්මයෙන් කරන්නේ උපාදානයට හිත විඳිහට රූපයක් සීමා කරලා අල්ලගන්න එක. රූපයක් සීමා කරලා අල්ලගෙන ඊට පස්සේ තණ්හා උපාදාන වශයෙන් ‘පුද්ගලයෙක්’, ‘දරුවා’ කියලා හැසිරුණු නිසයි ‘මට දරුවෙක් ඉන්නවා’ කියන නිමිත්තක් තියෙන්නේ. .

මොකද එහෙම කියන්නේ? උපාදානයට හිත විඳිහට රූපයක් සීමා කරලා අල්ලගත්තේ නැත්නම් ඒ රූපය ‘මගේ දරුවා’ කියලා හැසිරෙන්න බැහැ. එහෙනම් උපාදාන වශයෙන් හැසිරෙන්න නම් ඊට ඉස්සර වෙලා කරන්න වෙනවා කනබොන ආහාරයෙන් හටගත්ත රූපය උපාදාන වශයෙන් හැසිරෙන්න පුළුවන් විදිහට අල්ලගන්න.

සීමා නොකරන ලද මනසේ හෝ සතිපට්ඨානය තුළ හෝ වාසය කළා නම් රූප දිහා බලමින් ‘මගේ දරුවා’, ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියලා උපාදාන වෙන්න පුළුවන් ද? බැහැ. එතකොට කනබොන ආහාරයෙන් හැදුණු රූපයක් අරහයා අපි ඉස්සෙල්ලාම කළේ මොකක් ද? අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විඳිහට රූපයක් සීමා කරලා අල්ලගන්න එක..

ඒ කියන්නේ සතිපට්ඨානය තුළ වාසය කරන්නේ නැතුව හෝ සීමා නොකරන ලද මනසේ ඉන්නේ නැතුව සීමා කරලා රූපය දිහා බැලුවා. උපාදානයට හිත විඳිහට රූපය සීමා කරලා අල්ලගත්තා කියන කොට සතිපට්ඨානය තුළත් අපි වාසය කරන්නේ නැහැ. ඒ වගේ ම සීමා නොකරන ලද මනසේ වූ ශූන්‍යතාවයත් බිඳලා කියන වැරදි දෙක ම කරලා.

ඒක කළේ මොකෙන් ද? අවිද්‍යාව හා සංඛාර කියන දෙකෙන්. උපාදානයට හිත විඳිහට ඇහැ උපද්දන්න එපා. රූපය උපද්දන්න එපා. ඒක දුකයි. එහෙම ඉපැද්දුවොත් උපාදාන වෙනවා ම යි කියලා නොදන්නා අවිද්‍යාව නිසා ම ඇහැ සීමා කරගත්තා කනබොන ආහාරයෙන් හැදුණු රූපයට.

ඊට පස්සේ 'මේ මගේ දරුවානේ', 'පුතා නේ' කියලා හිත හැසිරෙව්වහම දැන් ඔන්න නිමිත්තක් තියෙනවා 'මට දරුවෙක් ඉන්නවා' කියලා. එතකොට 'මට දරුවෙක් ඉන්නවා' කියන නිමිත්ත හැදිලා තියෙනවා මොකෙන් ද? අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ධර්මතා හතරක් මත තමයි ඕක තියෙන්නේ.

කනබොන ආහාරයෙන් හැදුණු රූපය බාහිර පැත්තෙන් ඇවිල්ලා තියෙනවා. ආධ්‍යාත්මික පැත්තේ තියෙනවා කර්ම හා කෙලෙස් (අවිද්‍යාව හා තණ්හාව) කියලා ගති දෙකක්. කනබොන ආහාරයෙන් හැදුණු රූපය උපාදානයට හිත විදිහට අපි සීමා කරලා අල්ලගත්තේ නැති වුණොත් ඒත් උපාදාන වෙන්න බැහැ. එහෙම නැතිනම් සතිපට්ඨානය තුළ වාසය කළොත් ඒත් උපාදාන වෙන්න බැහැ.

සතිපට්ඨානයෙන් පෙන්නන්නේ යථාභූත ස්වභාවය. යථාභූත ස්වභාවයට නුවණ නැතුව සීමා නොකරන ලද මනස බිඳලා ළමයාගේ මූණ බලනවා කියලා අපි කරන්නේ මොකක් ද? ඇහැ සීමා කර ගන්නවා රූපයට. දැන් එහෙම රූපය බලන අපිට කුණප වශයෙන් හෝ ධාතු වශයෙන් හෝ අසුභ වශයෙන් සතිපට්ඨානයට සිහි නුවණක් තියෙනවා ද? නැහැ. ශූන්‍යතාවයත් බිඳලා රූපය අල්ලගත්තට පස්සේ ඉඹේම ක්ෂණිකව 'මගේ පුතා', 'දරුවා' කියන හැඟීම් ටික එනවා.

හොඳට බලන්නකෝ, මෙන්න මේ සිද්ධිය. ඇයි මේ රූපයට උපාදානස්කන්ධයක් කියලා කියන්නේ කියලා. *"උපාදානක්ඛන්ධා දුක්ඛා"* - උපාදානයට හිත වූ ස්කන්ධයෝ දුකයි. රූපයේ යථා ස්වභාවය කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක්, සතර මහා ධාතුයි. ඒ යථාභූත ස්වභාවය අපි අමතක කරලා රූපයක් දිහා බැලුවොත් අපේ මනසේ මේ 'තව මනුස්සයෙක්', 'සත්ත්වයෙක්' කියන අදහස එනවා.

'සත්ත්වයෙක්', 'පුද්ගලයෙක්' කියන අදහස ඇති වුණේ කාගාව ද? ඒ රූපය දිහා බලන කෙනාගේ මනසේ නෙමෙයි ද කියලා බලන්න. ඒ කෙනා

කෙනාගේ මනසේ ‘සත්ත්වයෙක්’, ‘පුද්ගලයෙක්’ කියනකම ඇති වුණා එකට කියනවා ‘අත්තවාද උපාදානය’ කියලා.

උපාදානයට හිත වුණේ මොකක් ද? රූපය. දැන් අපි මේ රූපය දකින කොට ම ‘මේ තවත් සත්ත්වයෙක්’ හෝ ‘මනුස්සයෙක්’ කියලා හැඟීමක් එනවා ද? නැද්ද? එනවා. ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියන හැඟීම ආවේ කාගාව ද කියලා බලන්න. ඕගොල්ලෝ දහදෙනෙක් ඉන්නවා නම් ඒ දහදෙනාගේ ම මනසේ නේද ඇතිවෙලා තියෙන්නේ ‘මේ තව කෙනෙක්’, ‘පුද්ගලයෙක්’ කියන එක.

මේ රූපය දකින කොට කෙනා කෙනාගේ මනසේ ‘කෙනෙක්’, ‘සත්ත්වයෙක්’ කියලා ඇති වෙච්චකමට කියනවා ‘අත්තවාද උපාදානය’ කියලා. ඒ මනසේ ඇතිවෙන ගතියට උපාදානය කියලා කිව්වා. රූපය උපාදානීයයි (උපාදානයට හිතයි) යි කියලා කිව්වා. රූපය උපාදානයට හිත නිසා ඕගොල්ලොන්ගේ මනසේ උපාදානය ඇති වුණා.

ඕගොල්ලෝ රූපය දිහා බලනවා; කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක්, සතර මහා ධාතුයි, කෙස්, ලොම්, නිය, දත් ආදී කොටස් ටිකක් නේද තියෙන්නේ කියන නුවණින් යුක්තව. එහෙම රූපය දිහා බැලුවොත් ‘පුද්ගලයෙක්’, ‘කෙනෙක්’ කියන හැඟීම උපදිනවා ද? නැහැ. එතකොට උපාදානයට හිත ද ඒ ස්කන්ධ ටික? නැහැ. උපාදාන වෙන්න බැහැ.

සතිපට්ඨානයෙන් වාසය කරන කොට මාරයාට අහුවෙන්නේ නැහැ කියලා පෙන්වන්නේ ඒකයි. ඇහැ මාරයා, රූපය මාරයා කියලා කියන්නේ බේරෙන්න නම් බැහැ උපාදානයට හිත විදිහට ඇහැ උපද්දලා, රූපය උපද්දලා. සතිපට්ඨානය තුළ වාසය කළොත් මොකද වෙන්නේ? තණ්හා උපාදාන වෙන්නේ නැහැ. එහෙම වුණොත් භවය හිටින්නේ නැහැ.

රූපය උපාදානයට හිත යි. රූපය දකින කොට ම ඕගොල්ලොන්ගේ මනසේ පහළ වෙනවා ‘සත්ත්වයෙක්’ කියලා. ඒක රූපයේ දෝෂයක් නෙමෙයි.

ඕගොල්ලොන්ගේ මනසේ දෝෂයක්. රූපය දකින කොට 'තව සත්ත්වයෙක් නේ' කියලා කෙනා කෙනාට හිතෙන්නේ.

ඊගාවට තියෙන දෝෂය මොකක් ද දන්නවා ද? රූපය දකින කොට මගේ මනසේ 'සත්ත්වයෙක්', 'ආත්මයක්' කියන අත්තවාද උපාදානය ඇති වුණා නේද කියලා දන්නේ නැහැ. අවිද්‍යාව යෙදුණු ගමන් ම මොකද වෙන්නේ? 'රූපය සත්ත්වයා' කියලා අත්තවාද උපාදානයෙන් ගන්නවා කනබොන ආහාරයෙන් හැදෙන රූපය. එතකොට රූපය උපාදාන වශයෙන් ගත්තා වෙනවා. එතකොට ඕගොල්ලෝ 'මේ ඉන්නේ සත්ත්වයා' කියලා බාහිර රූපයට අත දික් කරනවා.

ඒ කිව්වේ දැන් මේ රූපය දකින කොට ඕගොල්ලොන්ටයි හිතෙන්නේ 'රූපය සත්ත්වයෙක්' කියලා. 'රූපය සත්ත්වයා' කියලා ඇතිවෙන එක කෙනාගේ මනසේ ඇතිවෙච්ච සිද්ධියක්. ඒකට රූපය පළි නැහැ. ඒ මනසේ ඇතිවෙච්ච 'රූපය සත්ත්වයෙක්' කියන උපාදාන ගතිය බාහිර කනබොන ආහාරයෙන් හැදෙන රූපයට පතිත කරනවා. ඒකට තමයි *"උපාදානපච්චයා භවෝ"* කියලා කියන්නේ.

~ උපාදානය හඳුනා ගනිමු ~

සම්මාදිට්ඨි සූත්‍රයේ දී පෙන්වන්නේ; "උපාදානය දනී ද, උපාදාන සමුදය දනී ද, උපාදාන නිරෝධය දනී ද, උපාදාන නිරෝධගාමිණී ප්‍රතිපදාව දනී ද එපමණකින් සම්මා දිට්ඨි වේ" කියලා. උපාදානය කියන්නේ මොකක් ද, උපාදානය ඇති වුණේ කොහොමද, උපාදානය නැති වෙන්නේ කොහොමද, උපාදානය නැති කරන මාර්ගය මොකක්ද කියන සම්මා දිට්ඨිය අපි ගාව නැති නම් එතකොට ඒක ආයේ අවිද්‍යාව වෙනවා.

එතකොට මොකද වෙන්නේ? ඕගොල්ලො උපාදාන වශයෙන් ගන්නවා කනබොන ආහාරයෙන් හැදෙන බාහිර රූපය. එහෙම බාහිර රූපය උපාදාන

වශයෙන් ගත්ත ගමන් ම *"උපාදානපච්චයා භවෝ"- උපාදානය නිසා භවය වෙනවා.* උපාදානය පතිත වෙනවා කනබොන ආහාරයෙන් හැදුණු රූපයට.

උපාදානය නැමති කෙලේසය කනබොන ආහාරයෙන් හැදෙන අනාත්ම වූ රූපයට තබපු ගමන් බාහිර තව සත්ත්වයෝ, පුද්ගලයෝ, වස්තු මිළ මුදල් ආදිය තියෙනවා කියන භවය (ලෝකය) හැදෙනවා. රූපය වෙන ම එකක්. රූපය සතර මහා ධාතුයි. හැබැයි ඒකට ඕගොල්ලොන්ට නුවණ නැහැ.

ඒකයි රූපයේ හැසිරෙන්න එපා කියලා කියන්නේ. රූපය විතර බිය උපදවන දෙයක් තව නැහැ. රූපයට හිත තබපු ගමන් ම රූපය සත්ත්වයෙක් කියන අත්තවාද උපාදානය හෝ ඇතිවෙනවා ම යි. ඊට පස්සේ උපාදානස්කන්ධය නිසා තමන්ගේ මනසේ උපාදානය ඇති වුණා නේද කියන එක නොදන්න කොට ම, තමන්ගේ මනසේ තියෙන උපාදානයෙන් බාහිර සතර මහා ධාතු රූපය ඇසුරු කරනවා.

එතකොට බාහිර සතර මහා ධාතු රූපය 'කෙනෙක්', 'පුද්ගලයෙක්' කියන තැනකින් තමයි අපිට තේරෙන්නේ. එතකොට රූප දැකලා පැත්තකට ගියහම භවය හැදෙනවා කියන්නේ බාහිරයේ මිනිස්සු ඉන්නවා, සත්ත්වයෝ ඉන්නවා වගේ තැනකින් හැඟෙනවා අපට.

සල්ලි කියන්නේ සම්මතයක්. සල්ලි කියලා ලෝකයා ව්‍යවහාර කරන තැනක කඩදාසියකුයි, තීන්ත ටිකකුයි තියෙන්නේ. ඒ තීන්ත ටික හා කඩදාසිය උපාදානීය යි (උපාදානයට හිතයි). ඒක දකින කොට ම, 'මේක මෙච්චර වටිනවා, රුපියල් පන්දාහක් නේද' කියන අදහස ඇතිවෙනවා ඒක දකින කෙනා ගාව. ඒකට කියනවා 'කාම උපාදානය' කියලා.

උපාදානය දැනී ද, උපාදානයේ ඇතිවීම දැනී ද කියන එක අපි නොදන්නවා නම් උපාදානයට හිත රූපය දකින කොට ම 'රුපියල් පන්දාහක්, හරි වටිනවා' කියලා මං ගාව කාම උපාදානය මේ ඇතිවෙලා නේද කියලා දකින්නේ නැතිවෙන කොට උපාදානය ආරෝපණය කරනවා කඩදාසි කොළේට. එතකොට වටින්නේ මේ කොළේ කියලා හිතනවා.

ඕගොල්ලෝ දන්නේ නැහැ කොළේ දකින කොට මනසේ වටිනාකමක් පහළ වුණා කියලා. *"උපාදානපච්චයා භවෝ"* කියලා කියන්නේ 'රුපියල් පන්දාහක්, හරි වටිනවා' කියන උපාදාන ගතිය උපාදානස්කන්ධය පැත්තට තබන එකට. එතකොට බාහිර වටිනා සල්ලි ඇති බවට හැඳෙනවා. දැන් එතකොට කඩදාසිය වටිනවා වගෙයි පෙනෙන්නේ.

ඒ හින්දා මිරිස් මුට්ටිවලත් දානවා, ඇතිලි අස්සෙත් හංගනවා, බිමත් වළලනවා, කැටවලත් දාලා හංගනවා. කඩදාසි කොළේ වටින්නේ නැහැ. කොළේ දකින කොට වටිනාකම තමන් ගාවයි සිහි වෙන්නේ කියලා දැක්කා නම් ඕගොල්ලොන්ට මොකක්ද කරන්න වෙන්නේ? එහෙනම් හිත තමයි හංගන්න වෙන්නේ. ඇයි ඉතින් යථාර්ථ වශයෙන් කොළේ නෙමෙයි නේ වටින්නේ. ඒ කොළේ දකින කොට වටිනවා කියලා හිතෙන්නේ තමන්ට කියලා දැක්කොත් කොළේ වටිනාකමක් දකිනවා ද? නැහැ.

ඇත්ත ඒක වුණාට ඇත්ත අපිට පෙනෙන්නේ නැහැ. කඩදාසි කොළේ උපාදානයට හිත යි. උපාදානය කියලා කියන්නේ ඒක දකින කොට දකින කෙනාගේ මනසේ පහළ වෙනවා 'මෙච්චර වටිනවා' කියලා. ඒකට කිවුවා මොකක් ද? කාම උපාදානය.

"උපාදානපච්චයා භවෝ" - උපාදාන වුණොත් එතැනින් නතර වෙන්නේ නැහැ ප්‍රශ්නය. උපාදාන ගතිය උපාදානස්කන්ධයට බහාලන එක වෙනවා ම යි. වටිනාකම කියන උපාදාන ගතිය පෙනෙන රූපයට බැසගත්ත ගමන් ම නිර්මාණය වෙනවා වටිනා කොළයක්. දැන් රුපියල් පන්දාහක් නිර්මාණය වෙයි.

තීන්ත ටිකකින් යුක්ත කඩදාසිය දකින කොට ම දකින කෙනාගේ මනසේ ඇති වෙන්නේ, 'රුපියල් පන්දාහක්, වටිනවා' කියලා. ඔන්න ඒකට කිවුවා 'කාම උපාදානය' කියලා. *"තණ්හාපච්චයා උපාදානං"* කියන්නේ එකට.

ඊට පස්සේ *"උපාදානපච්චයා භවෝ"* කියන එකෙන් කියනවා, තමන්ගේ මනසේ ඒ උපාදාන ගතිය තිබුණොත් එතනින් නවත්තන්නේ නැහැ.

ඒකයි මේකේ දෝෂය. ඒ මනසේ තිබුණා උපාදාන ගතිය රූපය පැත්තට බැහැලෙනවා කියන එක වෙනවා ඉබේ ම.

එහෙම වෙච්ච ගමන් ඕගොල්ලොන්ට හිතෙන්නේ වටිනා සල්ලි කොළ බාහිර තියෙනවා වගේ තැනකින් නිර්මාණය වෙලා තියෙයි මිසක රූප දකින කොට මගේ මනසේ වටිනාකම යෙදිලා තියෙනවා කියන එකක් හම්බ වෙන්නේ නැහැ කවදාවත්. එහෙම හම්බ වුණා නම් ලෝකය නැහැ. එහෙම හම්බ වුණා නම් වටිනා සල්ලි කොළ බාහිර හම්බ වෙන්නේ නැහැ.

රූප දකින කොට තමන්ගේ මනසේ වටිනාකම කියන එක ඉපදුනේ කියලා අහුවුණා නම් එයා උපාදානය දන්නවා කියන තැනකට ඇවිල්ලා. එතකොට ඒ එක්ක ම උපාදානයේ ඇතිවීමත්, නැතිවීමත්, නැති කරන මාර්ගයත් නුවණින් දන්න කොට ම සම්මා දිට්ඨි. එතකොට භවය වෙන්නේ නැතුව නතර වෙනවා.

සම්මාදිට්ඨි සූත්‍රයේ දී පටිච්චසමුප්පාදයේ එකින් එක අංගයන් වෙන වෙන ම අරගෙන පෙන්වන්නේ මෙතනින් හරි මෙතනින් හරි සම්මා දිට්ඨිය ඇති කර ගන්න පුළුවන් කියලා. *“උපාදානපච්චයා භවො”* කියලා කියන්නේ මනසේ තියෙන උපාදානය, උපාදානයට හිත වස්තුව කෙරෙහි පතිතවෙන එක නවත්තන්න බැහැ ම යි කියන තැනකට ගහගෙන යනවා. එතකොට වෙන්නේ බාහිර සල්ලි කොළ ඇති බවට අපේ මනසේ නිමිති හැදෙනවා.

ඒ වගේ ම මේ රූපය ද කනබොන ආහාරයෙන්; බත්, පාන්, කවුපි, මුං ඇටවලින් හැදෙන කුණප කොටස් ටිකක්, සතර මහා ධාතු ම යි. නිකන් ම හිස් රූපයක්. ඒක දකින කොට ම මගේ මනසේ ඇති වෙනවා. ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියන අත්තවාද උපාදානය.

රූපය දකින කොට මගේ මනසේ ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියන අදහස පහළ වුණේ කියලා නුවණින් දැක්කා නම් ඕගොල්ලොන්ට බාහිර රූපය පැත්තේ පුද්ගලයෝ, සත්ත්වයෝ හම්බවෙනවා ද? නැහැ. නමුත් උපාදාන වුණොත් එතනින් නතර වෙන්නේ නැහැ අපේ මනස.

උපාදානය වුණොත් ඊගාවට වෙන දේ තමයි *"උපාදානපච්චයා භවෝ"* - සත්ත්වයෙක්, පුද්ගලයෙක් කියන ගතිය අපේ මනසේ ඇති වුණ ගමන් ඒ ගතිය බැස ගන්නවා ඒ ගතිය එන්න හේතු වෙච්ච රූපය පැත්තට. ඒ උපාදාන ගතිය බැසගත්ත ගමන් මොකක් වෙයි ද? කනබොන ආහාරයෙන් හැදෙන අනාත්ම වූ රූපය සත්ත්වයෙක්, ආත්මයක් වගේ පෙනෙයි.

දැන් එතකොට බාහිර සත්ත්වයෝ ඉන්නවා කියලා තේරෙයි ඕගොල්ලොන්ට. ඔහොම තමයි ඕගොල්ලොන්ට මිල මුදල්, රන්, රිදී, මුතු, මැණික්, ගෙවල් දොරවල්, මිනිස්සු, පුද්ගලයෝ ඇති බවට හැඳිලා තියෙන්නේ. *"උපාදානපච්චයා භවෝ"* කිවුවේ ඕකට.

සල්ලි තියෙනවා, මිනිස්සු ඉන්නවා, ළමයි ඉන්නවා කියලා සිහි කර කර ඉන්නවා මිසක උපාදාන ප්‍රත්‍යයෙන් හැදුණු භවය නේද මේ සිහි කරන්නේ කියලා දන්නෙත් නැහැ. භවය කියලා නොදන්න කොට ඒක නැවත නැවත සිහි කරනවා. එතකොට ඒක ආස්‍රව වෙනවා. සිහි කර කර දුක් විඳලා, මතු ප්‍රතිසන්ධියටත් යන්න වෙනවා.

සතිපට්ඨානයෙන් වාසය කරන්න. එතකොට අලුතෙන් පංච උපාදානස්කන්ධය රැස්වෙන්නේ නැහැ. ඒ කියන්නේ අලුතෙන් භවය හැදෙන්නේ නැහැ, නතර වෙනවා. දැනට හැඳිලා තියෙන භවය ගෙවලා දාන්න ඕනේ. ඒ සඳහා පංච උපාදානස්කන්ධයේ උදය වැය බල බලා උපන් ආස්‍රව ක්ෂය කර ගන්න ඕනේ.

ආස්‍රව ක්ෂය වූ රහතන් වහන්සේ කියලා කියන්නේ උප්පත්ති වශයෙන් ආපු තැනට ම ආයේ එනවා. ඒ කිවුවේ සීමා නොකරන ලද මනසට එනවා අවිද්‍යා අනුසය ද නැතුව. සතිපට්ඨානයට සිහි සහ නුවණ ඇතුව වාසය කරමින් ජීවත් වෙනවා. **"සෝපාදිසේස නිර්වාණය"** [59] කියලා කියනවා ඕකට.

සෝපාදිසේස නිර්වාණය කියලා කියන්නේ භව නිරෝධයට, තණ්හා නිරෝධයට, උපාදාන වශයෙන් නොගෙන මිදෙන එකට. තව පැත්තකින්

[59] https://tipitaka.lk/kn-petk-6/sinh - **ෂඞ්ධ භූමි – සුත්තපටිසමුච්චය- පෙටකෝපදේශ- බුද්දක නිකාය- 174 පිටුව**

ගත්තහම ආස්‍රව ක්ෂයට. සම්පූර්ණයෙන් ආස්‍රව ක්ෂය වුණොත් නැති වෙන්නේ ලෝකය, භවය. භවය කිවුවත්, ආස්‍රව කිවුවත්, ලෝකය කිවුවත් වචන තුනක්, අර්ථ එකයි. ලෝකය නැති වුණහම ඉන්නේ මොකේ ද? අපි උප්පත්ති වශයෙන් ආපු තැන.

කල් ඇතුව ම භවයත් නැති කරලා හින්දා මේ පීවිතේ ආයුෂ ටික ඉවරවෙන කොට ම යන්න තැනකුත් නැහැ. ඉන්න තැනත් නැතිවෙන හින්දා පහනක් නිවෙනවා වගේ නිවෙනවා. **“අනුපාදිසේස නිර්වාණය”** කියලා කියනවා ඕකට.

ඉතින් බුදුරජාණන් වහන්සේලා පහළ වුණොත් විතරම ම යි මේ දුක් සහගත සසරෙන් එතෙර වෙන්න පුළුවන් වෙන්නේ කියලා කියන්නේ වෙන කිසිම දවසක, කිසිම තැනක මේ විද්‍යාව හොයාගන්න නැහැ. ලෝකය ඇතුළේ ම ලෝකයෙන් මිදෙන්න තැනක් හොයනවා මිසක, දුක ඇතුළේ දුක නැති කරන්න දඟලනවා මිසක දුකෙන් නිදහස් වීමක් නම් වෙන්නේ නැහැ.

ලෝකය දුකයි නම් ලෝකය ඇතුළේ දුකේ නිවීමක් තියෙන්න පුළුවන් ද? බැහැ. ඒ හින්දයි ලෝකෝත්තර මඟක් ඕනේ වුණේ. ලෝකෙන් එතෙරවන මඟක් පෙන්නන්නේ ම ලෝකය තුළ දුකයි, දුක ඇති කරන හේතුවයි කියන දෙක ම තියෙන නිසා ලෝකය ඇතුළේ දුක නැතුව වාසය කරන්න බැරි නිසා යි. ඔන්න ඔය විදිහට බුදුරජාණන් වහන්සේ ධර්මය පෙන්වනවා.

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.03.06 මැදින් පොහොය දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසනයේ දී දහවල සිදු කළ ධර්ම දේශනාව ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අපේ භාග්‍යවතුන් වහන්සේ නිතරම මේ ලෝකය දුකයි කියලා කියන්නේ මනුෂ්‍ය මට්ටමේ පවතින දුක නිසා ම නෙවෙයි. ඒ කියන්නේ අපට ලැබෙන ඉපදීම, ලෙඩවීම, මහලු බව, මරණය වගේ දුක් ටිකක් තියෙනවානේ. ඒ හින්දා ම නෙවෙයි සසර දුකයි කියලා කියන්නේ. සසරේ හිටියොත් විශේෂයෙන් ප්‍රේත ලෝකය, නිරය වගේ තැන්වල ඉපදෙන්න වෙනවා.

ඒවා තුළ තියෙන දුක අතිශය කටුක යි. ඒ කියන්නේ මනුෂ්‍ය ලෝකයේ කෙනෙක් උපන්න දවසේ ඉඳලා ම මුළු ජීවිත කාලයේ ම ඔත්පල වෙලා, තමන්ගේ ම මළ මූත්‍ර ගොඩේ වැටිලා, ශරීරයට සමහරවිට පණුවොත් ගහලා, හොරි කුෂ්ඨත් හැදිලා හිටියොත්, එතකොට අපිට හිතෙන්නේ ඒ ජීවිතය මොන තරම් දුක්ඛිත ද, කාළකණ්ණි ද කියලා නේ. නමුත් අපායේ තියෙන දුකට සාපේක්ෂව ඒකත් දිව්‍යලෝකෙ වගේ වෙන මට්ටමේ දුකක් තමයි දුගතියේ තියෙන්නේ.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, **“ආනන්ද, මේ ලෝකයා පටිච්චසමුප්පාදය නමැති එක ම ධර්මය අවබෝධ කර නොගැනීම නිසා මීයන් විසින් කපා අවුල් කරන ලද රෙදිවියන්නන්ගේ නූල් කැටියක් වගේ අවුල් කර ගෙන, ගෙතුණු තණබිස්සක් වගේ එකට ගොතාගෙන, පැටලුණු පඹගාලක් වගේ පටලවාගෙන අපාය සංඛ්‍යාත මේ දුක් සහගත සසර නොඉක්මනවා”** [60] කියලා.

එතකොට ඒ වගේ අනන්ත අපරිමාණ සංසාරයේ දුක් විඳින්න වෙන්නේ ද, මේ ජීවිතයේ ඉපදීම, ලෙඩවීම, මහලු බව, මරණය, ප්‍රිය දෙයින්

60 https://tipitaka.lk/sn-2-1-6-10/sinh - **නිදාන [පටිච්චසමුප්පාද] සූත්‍රය- දුක්ඛ වර්ගය- අභිසමය සංයුත්තය-සංයුත්ත නිකාය 2- 145 පිටුව**

වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම ආදී යම්තාක් මේ ලෝකේ තුළ දුකක් විඳින්න වෙනවා නම් ඒ සියලු දුක් විඳින්න වෙන්නේ ද අපි ඉපදෙන නිසා නේ. ඉපදෙනවා කියන ධර්මතාවය නැති කරන්න මොන විදියටවත් පුළුවන්කමක් නෑ භවය කියන ධර්මතාවය තියෙන කල්.

~භවය හඳුනා ගනිමු ~

භවය කියන එක අපි හඳුනගන්නට ඕන. භවය කියලා කියන්නේ ලෝකෙට තව නමක්. ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම්, මිලමුදල්, ගොඩනැගිලි, ස්ථාන තියෙන, ගම්පළාත්, රටවල් තියෙන, අහවල් තැන අහවල් නෑදෑයෝ ඉන්නවා, අහවල් ගම තියෙනවා කියලා අපිට කතා කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් තියෙනවා නේ. ඒක තමයි ලෝකය කියන්නේ.

එහෙම ලෝකය තියෙන තාක් කල් අපිට කර්ම රැස්වෙන එක නවත්වන්න බෑ. ඒ ඉන්න අය, තියෙන දේවල් නිසා නිතරම කුසල සහගත හෝ අකුසල සහගත කර්ම රැස් වෙනවා ම යි. එහෙම කර්ම රැස්වෙන කොට කර්ම නිමිත්තකට අනුව ප්‍රතිසන්ධියට යන තැනකුත් හම්බවෙනවා ම යි අපිට භවය (ලෝකය) තියෙන කොට.

එතකොට ලෝකය/ භවය කියන එක නැති වුණොත් තමයි ඉපදීම කියන එක නැති කරන්න පුළුවන්. ඉපදීම කියන එක නැති වුණේ නැති නම් දුක නැති කරන්න බෑ. එතකොට දුක නැති කරන්න නම් ඉපදීම නැති කරන්න වෙනවා. ඉපදීම නැති කරන්න නම් ලෝක නිරෝධයක් එහෙම නැත්නම් භව නිරෝධයක් කරන්නට වෙනවා.

“භව නිරෝධය නිවනයි” [61] කියලා කියන්නේ ඒකට යි. භවය කියලා කියන්නෙත් ලෝකය කියලා කියන්නෙත් දෙක ම එකකට. මොකද බුදුරජාණන් වහන්සේලා පහළ වෙන්නේ සත්ත්වයෝ විඳින භව දුක නැති කරන්න. ‘සත්

[61] https://tipitaka.lk/sn-2-1-7-8/sinh - **කෝසම්බි සූත්‍රය- මහා වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය 2- 183 පිටුව**

හට වන භවදුකට වෙදාණන්' කියලා කියන්නේ ඒ හින්දයි. එතකොට මේ ලෝකයට තව නමක් තමයි 'භවය' කියලා කියන්නේ.

පොඩි කාලේ අපි ඉස්කෝලේ ගියා කියලා, ඉස්කෝලේ තියෙන්නේ අහවල් තැන කියලා, ඒ කාලේ ඇසුරු කරපු යාලු මිත්‍රයන් හිටියා කියලා තියෙන ලෝකයක් තියෙනවා නේ අපිට. ඒකට තමයි 'භවය' කියන්නේ. ඊළඟට අපි බලමු ඔය ලෝකය (භවය) හැදුණු හැටි කොහොමද කියලා.

අපි පෙර කර්මයට ඉපදෙන කොට ඒ පුරාණ කර්මයට විපාකයක් හැටියට අපිට හම්බ වුණා ඇස, කන, දිව, නාසය, කය, මනස කියන ආධ්‍යාත්මික ආයතන ටික. එතකොට ඇහැ හැදිලා අපිට රූප පේනවා. කන හැදිලා අපිට ශබ්ද ඇහෙනවා. හැබැයි රූප පෙනෙන කොට ඒකේ තිබුණා ලොකු විශේෂණයක්.

විශේෂණයක් කියලා කියන්නේ කිසිම නිමිත්තකට සීමා වෙලා නැති සීමා නොකරන ලද මනසක් තමයි අපිට තිබුණේ රූප පෙනෙන, ශබ්ද ඇහෙන තැනක. ඒ කියන්නේ අපිට එක වස්තුවක් විතරක් අරමුණු වෙන්නේ නැතුව මේ හැම දෙයක් ම පේන විදියට බලන්න පුළුවන්නේ.

එහෙම පේන විදියට බැලුවොත් අපිට මේ පෙනෙන කිසිම දෙයක් අරහයා කුසල් සිතක්වත්, අකුසල් සිතක්වත් ඇති කර ගන්න බෑනේ. ඇයි දැන් අපිට කා ගැන ද, මොකක් ගැන ද හිතන්නේ කියලා නිමිත්තක් නෑනේ, එක දෙයක් තනි කරලා අල්ලගෙන නැති නිසා. ඒකට දහමේ කියන්නේ ***"විමරියාදීකතෙන චෙතසා විහරාමි".***[62] සීමා නොකරන ලද මනසෙන් වාසය කරනවා කියලා.

එතකොට උප්පත්ති වශයෙන් පැමිණෙන කොට සීමා නොකරන ලද විදිහට පේනවා කියන තැනක තිබුණා රූපයක්. ආහාර ප්‍රත්‍යයෙන් හටගත්ත සතර මහා ධාතුව නිසා පවතින වර්ණ රූපය නැමති උපාදාය රූපයක් තිබුණා.

---

62 https://tipitaka.lk/mn-3-2-2 - **ජබ්බිසෝධන සූත්‍රය- අනුපද වර්ගය- මජ්ඣිම නිකාය 3- 142 පිටුව**

ඒ එක්ක ම පෙනෙනවා කියන සිද්ධියටත් වේදනාවක්, සංඥාවක්, චේතනාවක්, විඤ්ඤාණයක් තියෙනවා. එතකොට 'පේනවා' කියන එක නිර්මාණය වෙන්න නාම රූප කියන ධර්මතා දෙකක් තියෙනවා. ඒ කිවුවේ පොදුවේ සීමා නොකරන ලද මට්ටමෙන් පේන කොට එතනත් රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකයක් තියෙනවා.

නමුත් මාස දෙක තුනක කුඩා දරුවෙක්ට ඔතන ස්කන්ධ පංචකයක් තියෙන්නේ ආදී කිසිම දෙයක් දන්නේ නෑ. පේනවා කියන කම විතරයි දන්නේ. බෞද්ධ වේවා, අබෞද්ධ වේවා යමක් තමන්ට පෙනෙනකම දන්නවා. ඒ පෙනෙන්න තියෙන හේතු ටික නැතිවෙන කොට ඉබේ ම පෙනෙනකම නැති වෙනවා. දැකපු දේ ඇතිකමට නිමිති හිටින්නේ නෑ. අපි ඉපදෙන කොට ඉපදුණේ ඔන්න ඔහොම තැනකින්. එතකොට ශබ්ද ඇහෙන කොට පොදුවේ තමයි ශබ්ද ඇහෙන්නේ. ඇහෙන කිසිම ශබ්දයකට එක නිමිත්තක් අහුවෙලා නෑ.

එහෙම ඉපදෙන අපිට අම්මලා, තාත්තලා, ගෙවල් දොරවල්, නෑදෑයෝ, යානවාහන, ඉඩම්, අහවල් තැන පොලීසිය, ඉස්පිරිතාල, කාර්‍යාල තියෙනවා කියලා ලෝකයක් හැදිලා තිබුණෝ නෑ. ඔය කර්ම භව මට්ටමක් තිබුණේ නෑ. ඇහැ හැදිලා රූප පේනවා. එහෙම පේන රූපයක තියෙන යථාභූත ස්වභාවය තමයි සත්ත්ව පුද්ගල ආත්ම නොවූ ශූන්‍යතාවයක්.

ඒ කියන්නේ ඇස් ඉදිරිපිට පහළවන රූපයක තියෙන්නේ වර්ණ සටහනක්. ඒ වර්ණ සටහනේ තියෙන යථාභූත ස්වභාවය තමයි සත්ත්ව පුද්ගල ආත්ම නොවූ ශූන්‍යතාවයක්. කනට ඇහෙන ශබ්ද තුළ තියෙන්නේ ද ඒ වගේ සත්ත්ව පුද්ගලභාවයෙන් තොර ශූන්‍යතාවයක්.

නොදන්නා භාෂාවකින් කතා කළා ම අපිට ඒ ශබ්දය ඇහෙනවා. නමුත් ඒ කියන්නේ හොඳක් හෝ නරකක් කියලා එකක් ගැන නිමිති නැහැ නේ අපිට. අන්න ඒ වගේ ශබ්ද ඇහෙන මට්ටමක් තමයි තිබුණේ. දැන් අද නම් අපිට සීමා නොකරන ලද මනසේ ඉන්න කොට පෙන්නද්දිත් අපිට බාහිර පැත්තේ නිමිත්තක් අහුවෙලා නැති වුණාට 'මේ මටයි පේන්නේ' වගේ දෙයක්

හැඟෙනවනේ. නමුත් යථාර්ථ වශයෙන් ආධ්‍යාත්මික පැත්තේ තමන් හිටියේ නෑ.

ඒ කියන්නේ ඇහැ කවදාවත් දකින්න බැහැ. ඇහෙන්, ඇහැ බලන්න බෑනේ. ඇහෙන් බලන්න පුළුවන් රූප විතරයි. එතකොට අතීතයේ දීත් ඇහැට ඇහැ පෙනිලා නෑ. වර්තමානයේ දීත් ඇහැට ඇහැ පෙනෙන්නේ නෑ. අනාගතයේ දීත් ඇහැට ඇහැ පේන්නෙත් නෑ.

ඒ වගේ ම තමයි කන, නාසය, දිව, කය, මනස අපිට පේන්නේ නෑ, පෙනිලත් නෑ කවදාවත්. කවදාවත් නොපෙනුණ දෙයක් ගැන අපිට නිමිති තියෙන්න බෑ. ඒත් අපේ ඇහැ ගැන අපිට දැනුමක් තියෙනවා. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වේ ම 'ඇස් තියෙනවා' කියන හැඟීම අපිට තියෙනවා. ඕක තමයි 'භවය' කියන්නේ.

එතකොට ඒ ඇහැ හැදුණේ කොහොම ද? උප්පත්ති වශයෙන් එන කොට එහෙම ඇහැක් නැතුවයි ආවේ. ඇහැක් නැතුව කියලා කිව්වේ පෙනෙනකම නැතිකම නෙවෙයි. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන. ඇවිදින හතර ඉරියව්වේ ම 'මට ඇස් තියෙනවා' කියන හැඟීම තියෙනවනේ. අන්න ඒ ගතිය නැතුව තමයි උප්පත්ති වශයෙන් ආවේ.

රූපයක් පෙනුනට ඇහැ ගැන නිමිති නැතුව තමයි ආවේ. ඇහැ ගැන නිමිති තියෙනවා කියන්නේ ඒ තමයි 'පුද්ගලයා' (පුද්ගලභාවයේ හටගැන්ම). පුද්ගලයාට තමයි එහෙම සතර ඉරියව්වේ ම ඇහැ පවතිනවා කියන හැඟීම තියෙන්නේ. අපි පොඩ්ඩක් බලමු ඒක වෙන හැටි.

ඇහැට පේන්නේ මොනවා ද? රූප. හොඳට බලන්න ඇහැට පෙනුණොත් පේන්න පුළුවන් රූපයක් විතරයිනෙ. එතකොට ඇහැට, ඇහැ පේන්න පුළුවන් ද? බෑ. ඇහැට බලන්න පුළුවන් රූප විතර ම යි. එතකොට අපි ඇහැට පේන රූප දිහා බලලා රූප ඇතුළේ මේ තමයි ඇහැ. ඔය ඇහැ වගේ ම තමයි එහෙනම් මගෙ ඇහැත් කියලා හිතනවා.

ඊළඟට කණ්ණාඩිය ළඟටත් ගිහින් කණ්ණාඩියේ වැටෙන රූපය දිහා බලලා මේක තමයි ඇහැ කියලා බාහිර රූපායතනයකින් ඇහැ ගැන නිමිති

හදාගෙන ඒ නිමිත්ත මනෝමයෙන් ආදේශ කරගෙන ඉන්නවා මගෙ ඇහැත් මෙහෙම තමයි කියලා. ඔහොම තමයි අපිට ඇහැ ගැන දැනුම ඇවිත් තියෙන්නේ.

එදා ඉඳන් අපි හිතාගෙන ඉන්නවා මං ගාව ඇහැ ගැන දැනුමක් තියෙන්නේ මට තියෙන ඇහැ ගැන ම තමයි කියලා. ඒ නිසා ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වේ දී ම 'මගේ ඇස් තියෙනවා' කියලා අපි අර දැනුම භාවිතා කරමින් තමයි ඉන්නේ.

එතකොට බාහිර රූපායතනයකින් බලලා 'ඇහැ තියෙනවා' කියලා මනසට ගත්ත නිමිත්තක් කුඩා දරුවාට තිබුණේ නෑ. එහෙනම් එයා ඉඳලා තියෙන්නේ අපි වගේ ඇස් ඇතුව ද, නැතුව ද? ඇස් නැතුව. පෙනෙනවා, හැබැයි 'හතර ඉරියව්වේ ම ඇහැ තියෙනවා කියලා එකක් නැහැ එයාට. යථාර්ථ වශයෙන් තියෙන්නේ දකින්නට බැරි (අනිදස්සන වූ), ඒ ඒ අවස්ථාවට පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නැතිවෙන ඇහැක්. පෙනෙන දේ පෙනීමෙන් පස්සේ ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා.

එතකොට හිතන්න ඇහැ ගැන අත්දැකීමක් නැතුව සීමා නොකරන ලද මනසක් වුණොත් මොන තරම් ගැඹුරු ශූන්‍යතාවයක් තියෙයි ද කියලා. අතිශය ගැඹුරු ශූන්‍යතාවයක් තමයි මම මේ කතා කරන තැන තියෙන්නේ. අද ඒකේ ගැඹුර අපිට තේරෙන්නේ නෑ, මොකද ආස්‍රව ගොන්නකින් පිරිලා අපේ මනස.

මේ මම ඉන්නවා, මගේ නම මේකයි, ගම මේකයි කියලා ලොකු විස්තර ගොඩකුත් එක්කයි අපි මේ ඉන්නේ. එච්චර විස්තර ගොඩක් පුරවාගෙනත් සීමා නොකරන ලද මනසකින් බලන කොටත් රාග, ද්වේශ, මෝහ ඇති කර ගන්න බැරි බව පේනවා අපිට. එතකොට බලන්න අර වගේ නිමිති නැති තැනක කොහොම ශූන්‍යතාවයක් තියෙනවා ඇතිද කියලා.

එතකොට පුරාණ කර්මයට ඔය වගේ සීමා නොකරන ලද මනසක් ඇතිව තමයි අපි හැම කෙනෙක් ම උපන්නේ. ඒ වගේ සීමා නොකරන ලද මට්ටමකින් තමයි පෙනීම වුණේ. එතකොට පේන්න තියෙන හේතු ටික, එනම්

නාමරූප දෙක යෙදෙන කොට පෙනෙනවා. නාමරූප දෙක නැතිවෙන කොට පේන දේ ඉතුරු නැතිව නැති වෙනවා.

නාමරූප දෙක ඇතිවෙන කොට ඇහෙනවා. ඒ නාමරූප දෙක නිරුද්ධ වෙන කොට ඇහෙන දේ නිරුද්ධ වෙනවා. (ස්පර්ශ ආයතන හය ම එහෙම යි). ඕකට කියනවා 'ප්‍රතිසන්ධි විපාක නාමරූප' දෙක කියලා. එතකොට ඔය මට්ටමේ දී තිබුණේ නැහැ අපිට අද විඳින්න වෙන ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහලුවීමේ දුක, මරණ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක, කැමති දේ නොලැබීමේ දුක කියන මේ දුක් තිබුණේ නැහැ.

ඒ වගේ ම ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම්, මිලමුදල්, අහවල් ගම්, නගර තියෙනවා කියලා නිමිති අපිට පොඩි කාලේ තිබුණේ නෑ. ඒ කියන්නේ අද අපිට තියෙන කර්ම භවය හැදිලා තිබුණේ නැහැ උප්පත්ති වශයෙන් එන කොට. එතකොට ඔය සීමා නොකරන ලද මනස කියන තැන ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "මහණෙනි, මේ සිත ස්වභාවයෙන් ම ප්‍රභාශ්වරයි". ඒ කියන්නේ මේ මුල් සිත ප්‍රභාශ්වරයි. ඉතින් මෙහෙම මනසකින් අපි ටික ටික ලොකුවෙන කොට, අපේ ඉන්ද්‍රිය ටික ටික මුහුකුරණ කොට ඔතන එක ම එක දෝශයක් තිබුණා.

මොකක්ද? විද්‍යාව ඉපදිලා තිබුණේ නැහැ. අවිද්‍යානුසය අනුසය වෙලා තිබුණා. හැබැයි කෙලෙස් කියන මට්ටමට ඒ අවිද්‍යාව තව ම සක්‍රිය වෙලා නැහැ. අවිද්‍යාව කියන්නේ, ***"දුකෙඛ ඤාණං, දුකඛසමුදයෙ ඤාණං, දුකඛනිරොධෙ ඤාණං, දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං"*** [63] කියන එක.

එතකොට චතුරාර්ය සත්‍යය ධර්මාවබෝධය නොමැතිකම නිසා කියන මුල් ඇද වැටීම තියෙන තැනට අපි එනවා. ඉස්සෙල්ලා ම ඒ ගැන පොඩ්ඩක් කතා කරලා ඉන්න වෙනවා. ඔතනින් තමයි මේ ලෝකය හැදෙන චක්‍රය පටන් ගන්නේ.

---

63 https://tipitaka.lk/sn-5-12-2-7 - **අවිජ්ජා සූත්‍රය- ධම්මචක්කප්පවත්තන වර්ගය- සච්ච සංයුක්තය- සංයුත්තනිකාය 5- 282 පිටුව**

~ චතුරාර්ය සත්‍යය දර්ශනය හා න්‍යාය ~

චතුරාර්ය සත්‍යය දර්ශනය සහ න්‍යාය කියලා දෙකක් තියෙනවා. *"ඉදං දුකඛං අරියසච්චනති, ඉදං දුකඛසමුදයො අරියසච්චනති, ඉදං දුකඛනිරොධො අරියසච්චනති, ඉදං දුකඛනිරොධගාමිනී පටිපදා අරියසච්චනති"* කියන තැන දී පෙන්වන්නේ චතුරාර්ය සත්‍යය දර්ශනය නෙවෙයි. ඒකෙන් දර්ශනය උපදින්නේ නැහැ.

ඒ කිවුවේ, ලෝකේ ඉන්න කෙනෙකුට ඉපදීම දුකයි, ලෙඩවීම දුකයි, මහලු බව දුකයි, මරණය දුකයි, ප්‍රියයන්ගෙන් වෙන්වීම දුක යි, අප්‍රියයන් හා එකතුවීම දුක යි, කැමති දේ නොලැබීම දුක යි. කෙටියෙන් කියනවා නම් පංච උපාදානස්කන්ධය ම දුකයි. දුකට හේතුව තණ්හාව. තණ්හාව නැති කළොත් දුක නැති වෙනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගය දුක් නැති කරන මඟයි කියන තැන මේ ශාසනයේ බුදුරජාණන් වහන්සේ දේශනා කරන දර්ශනය නැහැ.

උදාහරණයක් ගත්තොත් දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු කෙලෙස් එනම් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන කෙලෙස් ටික ගෙවන දර්ශනය ඔය තුළ නැහැ. ඕක මාර්ගයට එන්න උපකාරවන න්‍යායක්. න්‍යායන් 1000 ක් තියෙනවා. දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සෝවාන් ඵලය කියලා කියන්නේ.

ඒ කියන්නේ දුක දැකලා, දුකට හේතුව තණ්හාව දැකලා, තණ්හාව නැති කළොත් දුක නැති වෙනවා කියලා දැකලා, ඒ න්‍යාය ඔස්සේත් මාර්ගයට එන්න පුළුවන් කෙනෙකුට. තව කෙනෙකුට රූපය දැකලා, රූපයේ ඇතිවීම දැකලා, රූපයේ නැතිවීම දැකලා මාර්ගයට එන්න පුළුවන්. තව කෙනෙකුට සක්කාය දැකලා, සක්කාය සමුදය දැකලා, සක්කාය නිරෝධය දැකලා මාර්ගයට එන්න පුළුවන්. ඒ වගේ වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය, අවිද්‍යාව වගේ ඕනම පරියායක් දැකලා මාර්ගයට එන්න පුළුවන්.

න්‍යායක් තුළ දර්ශනයක් නෑ. රූපය දැකලා, රූපයේ ඇතිවීම දැකලා, රූපයේ නැතිවීම දැකලා මාර්ගයට එන්න පුළුවන් කියන තැනක

දර්ශනයක් නෑනේ. ඒ වගේ දුක, දුක ඇතිවීම, දුක නැතිවීම කියන එකත් න්‍යායක් මිසක් දර්ශනයක් නැහැ.

ඊටපස්සේ මාර්ගය විස්තර කරන කොටයි දර්ශනය මතුවෙන්නේ. මාර්ග සම්මා දිට්ඨියේ දී; ***"දුකෙඛ ඤාණං දුකඛසමුදයෙ ඤාණං දුකඛනිරොධෙ ඤාණං දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං"*** [64] කියලා පෙන්නන තැනදි තමයි දර්ශනය මතුවෙන්නේ. එනම් මාර්ග සම්මා දිට්ඨියේ දී තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කළ දර්ශනය මතුවෙන්නේ. ඒකට තමයි සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන කෙලෙස් ටික දුරු වෙන්නේ. මොකද, න්‍යාය තුළ චතුරාර්ය සත්‍යය ධර්මය පරිපූර්ණ නැහැ.

"ජාතිපි දුකඛා, ජරාපි දුකඛා, ව්‍යාධිපි දුකෙඛා, මරණම්පි දුකඛං, අපපියෙහි සම්පයොගෙ දුකෙඛා, පියෙහි විපපයොගෙ දුකෙඛා, යම්පිච්ඡං න ලහති තම්පි දුකඛං, සඞඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුකඛා" කියලා කිව්වට පංචඋපාදානස්කන්ධයට ඇයි දුකක් කියන්නේ කියන විස්තරය පුරවලා නැහැ න්‍යාය තුළ.

ඊළඟට දුකට හේතුව තණ්හාව කියලා කිව්වට තණ්හාව දුකට හේතු වෙන්නේ කොහොමද කියලා විස්තර කරලා නැහැ න්‍යාය තුළ. හැබැයි මාර්ග සම්මා දිට්ඨියේ දී/ දර්ශනයේ දී ඔය ටික ඔක්කොම දිගහරිනවා. ඔය ප්‍රශ්නය ලෙහනවා.

ඒ විතරක් නෙවෙයි න්‍යාය තුළ දුක්ඛ සත්‍යය වෙනම ම කියනවා. සමුදය සත්‍යය වෙනම ම කියනවා. නිරෝධ සත්‍යය වෙනම ම කියනවා. මාර්ග සත්‍යය වෙනම ම කියනවා. නමුත් දර්ශනයේ දී චතුරාර්ය සත්‍යය ම එකට බැඳෙනවා. ඒ කියන්නේ දුක පිරිසිඳ දකින්නට වෙන්නේ සමුදය සත්‍යය උදවු කරගෙන. නිරෝධ සත්‍යය දකින්නට වෙන්නේ සමුදය සත්‍යය උදවු කරගෙන. මාර්ග සත්‍යය වඩන්නට වෙන්නේ නිරෝධ සත්‍යය උදවු කරගෙන.

"යමෙක් දුක දැක්කොත් සමුදය දැක්ක කෙනෙක්, නිරෝධය දැක්ක කෙනෙක්, මාර්ගය දැක්ක කෙනෙක් බවට පත්වෙනවා. යමෙක් දුක්ඛ සමුදය

---

64 https://tipitaka.lk/mn-3-4-11 - **සච්චවිභඞ්ග සූත්‍රය- විභඞ්ග වර්ගය- මජ්ඣිම නිකාය 3- 516 පිටුව**

දැක්කොත්, එයා දුක දැක්ක කෙනෙක්, නිරෝධය දැක්ක කෙනෙක්, මාර්ගය දැක්ක කෙනෙක් යන අර්ථයකට යන විදියට එකට බැඳෙනවා".[65]

දර්ශනයේ දී සත්‍ය හතර වෙන්වෙන්නේ නෑ. මම මේ කියන්නේ නියම දර්ශනයක ලක්ෂණ. එතකොට සීමා නොකරන ලද මනසකින් හැඳෙන අපිට අවිද්‍යාව තිබුණා කියලා කිව්වේ දර්ශනය තිබුනේ නෑ, මාර්ග සම්මා දිට්ඨිය තිබුනේ නෑ කියන එකයි. අපිට චතුරාර්‍ය සත්‍යයට එන්න ක්‍රම දෙකක් තියෙනවා. සම්මා දිට්ඨිය දෙපැත්තකින් තියෙන්නෙත් ඒකයි.

ඒ කියන්නේ ලෝකේ ඇතුළේ ඉන්න කෙනෙකුට ලෝකය දුකයි කියලා දැකලා මාර්ගයට එන්න ක්‍රමයකුත් තියෙනවා. ඒ වගේ ම බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාගෙන් මාර්ගය අහගෙන ලෝකය දුක නිසා ලෝකෙට යන්නේ නැති වෙන්න මාර්ගයෙන් පටන් ගන්නත් පුළුවන් කියලා මෙහෙම ක්‍රම දෙකක් තියෙනවා.

දැන් මම මේ කියන්නේ මාර්ගය වඩන ක්‍රමය. ඒ කියන්නේ සීමා නොකරන ලද මනසකින් උප්පත්ති වශයෙන් එන කොට කර්ම භවය හැදිලා තිබුණේ නැහැ. භවය නිසානේ ඉපදෙන්නේ. ඉපදුනොත්නේ සියලු දුක් එන්නේ. සීමා නොකරන ලද මනසකින් තමයි අපි උපන්නේ. එහෙම උපන්න අපිට දුක ගැන, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැති කරන මාර්ගය ගැන දර්ශනයක් තිබුණේ නැහැ.

දර්ශනය කියන්නේ මොකක්ද කියන එක අපි පොඩ්ඩක් බලමු. ඒ දර්ශනය තුළ විස්තර කෙරෙන *"දුක්ඛෙ ඤාණං"* (දුක පිළිබඳ නුවණ) කියන එක අපිට තිබුණේ නැහැ. ඒ කියන්නේ ඉපදීම දුකයි, ලෙඩවීම දුකයි, මහලු බව දුකයි, මරණය දුකයි, ප්‍රියයන්ගෙන් වෙන්වීම දුක යි, අප්‍රියයන් හා එකතු වීම දුක යි, කැමති දේ නොලැබීම දුක යි. කෙටියෙන් කියනවා නම් පංච උපාදානස්කන්ධය දුක යි කියන නුවණ තිබුණේ නැහැ අපිට.

ඇයි පංච උපාදානස්කන්ධයට දුකක් කියන්නේ? සමුදය සත්‍යය මාර්ග සම්මා දිට්ඨියේ දී අනෙක් සත්‍ය තුනත් සමග එකට බැඳෙනවා.

---

65 https://tipitaka.lk/sn-5-12-3-10/sinh - **ගවම්පති සූත්‍රය- කෝටිගාම වර්ගය- සච්ච සංයුක්තය- සංයුත්ත නිකාය 5- 293 පිටුව**

එතකොට තණ්හාව දුකට හේතු වුණ හැටි පෙන්නනවා. තණ්හාව තිබුණොත් උපාදාන වෙනවා. උපාදාන වුණොත් භවය හැදෙනවා. භවය හැදුනොත් ඉපදෙනවා. ඉපදුනොත් ජරාමරණ දුක එනවා. ඒ නිසයි පංච උපාදානස්කන්ධයට දුකක් කියන්නේ කියන කාරණාව හොඳට විස්තර කරලා පෙන්වනවා.

පංච උපාදානස්කන්ධය කියන්නේ මොකක් ද? යමක් ලෝකයේ ප්‍රියයි, මධුරයි නම් එහි තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන්. ඒකට තමයි පංච උපාදානස්කන්ධය කියන්නේ. උපාදානයට හිත වූ ස්කන්ධ පංචකයට කියනවා 'පංච උපාදානස්කන්ධය' කියලා. උපාදානයට හිත වූ ස්කන්ධ නිසා තමයි තණ්හාවට උපදින්න හා පවතින්න පුළුවන්.

~ තණ්හාව උපදින්නේ හා පවතින්නේ කොහෙද ~

පංච උපාදානස්කන්ධය එනම් තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් තැන් කියක් තියෙනවා ද? 60ක් තියෙනවා. ***"චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති".***[66] - ඇහැ ලෝකයේ ප්‍රියයි, මධුරයි. එහි තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන්. ඇහැ වගේ ම කන, නාසය, දිව, ශරීරය, මනස යන ආධ්‍යාත්මික ආයතන හය තියනවනේ. ඒවායෙත් තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන්. මේවා පංච උපාදානස්කන්ධයට අයිතියි.

"රූපං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති," - රූපය ලෝකයේ ප්‍රියයි, මධුරයි. එහි තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන්. බාහිර ආයතන කීයක් තියෙනවා ද? 6ක් තියනවා. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම.

ඊළඟට තියෙනවා විඤ්ඤාණ 6ක්. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ

66 https://tipitaka.lk/sn-2-1-7-6 - **සම්මසන සූත්‍රය- මහා වර්ගය- අභිසමය සංයුත්තය- සංයුක්ත නිකාය 2- 168 පිටුව**

විඤ්ඤාණ. තව තියෙනවා ස්පර්ශ 6ක්. චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්ස, ඝාන සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස, මනෝ සම්ඵස්ස.

ඊටපස්සේ තියෙනවා වේදනා 6ක්. චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා. ඊළඟට තියෙනවා සංඥා 6ක්. රූප සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, ඵොට්ඨබ්බ සංඥා, ධම්ම සංඥා.

ඊළඟට තියෙනවා චේතනා 6ක්. රූප සංචේතනා, ශබ්ද සංචේතනා, ගන්ධ සංචේතනා, රස සංචේතනා, ඵොට්ඨබ්බ සංචේතනා, ධම්ම සංචේතනා. ඊටපස්සේ තියෙනවා තණ්හා 6ක්. රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා.

ඊටපස්සේ තියෙනවා විතක්ක 6ක්. රූප විතක්ක, ශබ්ද විතක්ක, ගන්ධ විතක්ක, රස විතක්ක, ඵොට්ඨබ්බ විතක්ක, ධම්ම විතක්ක. ඊටපස්සේ තියෙනවා විචාර 6ක්. රූප විචාර, ශබ්ද විචාර, ගන්ධ විචාර, රස විචාර, ඵොට්ඨබ්බ විචාර, ධම්ම විචාර.

හයේ හයේ ගොඩවල් 10 ක් මම ඔය කිව්වේ. එතකොට ඔක්කොම 60 යි. ඔහොම දීර්ඝව විස්තර කළාට ඔතන තියෙන්නේ හරි සරල සිද්ධියක්. ඒ කිවුවේ; ආධ්‍යාත්මික ආයතන හයෙන් ඇහැ ගන්නවා. බාහිර ආයතන හයෙන් රූපය ගන්නවා. විඤ්ඤාණ හයෙන් චක්ඛු විඤ්ඤාණය ගන්නවා. ස්පර්ශ හයෙන් චක්ඛු සම්ඵස්සය ගන්නවා. වේදනා හයෙන් චක්ඛු සම්ඵස්සජා වේදනාව ගන්නවා. සංඥා හයෙන් රූප සංඥාව ගන්නවා. චේතනා හයෙන් රූප සංචේතනාව ගන්නවා. තණ්හා හයෙන් රූප තණ්හාව ගන්නවා. විතක්ක හයෙන් රූප විතක්කය ගන්නවා. විචාර හයෙන් රූප විචාරය ගන්නවා.

ඒ කියන්නේ ඇහෙන් රූපයක් බලලා ඒ අරමුණ විඳලා, හඳුනලා, හිතලා, ඒකට කැමැත්තක් ඇති කර ගෙන, ඒක ගැන නැවත සිහිකර කර ඉන්නවා කියන සිද්ධියයි මේ කිව්වේ. යමක් බලලා ඒක නැවත සිහි කරනවා

කියන සිද්ධිය වෙන්න කාරණා 10ක් තියෙනවා. ඔය ක්ෂේත්‍රය ගත්තහම තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් ක්ෂේත්‍රයක්.

ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයාට *"සඩ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"* කියන කොට උපාදානයට හිත වූ ස්කන්ධයෝ දුකයි කියන නුවණයි ඔහුට ඇති වෙන්නේ. මොනවද උපාදානයට හිත වූ ස්කන්ධ? යමකට තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් ද, ඒ තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් ස්කන්ධය උපාදානස්කන්ධය යි.

පංච උපාදානස්කන්ධය තිබුණොත් තණ්හාව උපදිනවා හා පවතිනවා. තණ්හාව තිබුණොත් උපාදාන වෙනවා. උපාදානය වුණොත් භවය හැදෙනවා. භවය හැදුනොත් ඉපදෙනවා. ඉපදුනොත් ජරාමරණ දුක එනවා. ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහලු බවෙහි දුක, මරණ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක, හිතන බලාපොරොත්තුවන දේ නොලැබීමේ දුක, කෙටියෙන් කිව්වොත් පංච උපාදානස්කන්ධය දුක යි කියලා නේ දුක්ඛ සත්‍යයේ දී විස්තර කරන්නේ.

පංච උපාදානස්කන්ධයට අයිති එකක් තමයි ඇහැ කියලා කියන්නේ. එතකොට ඒ කියලා තියෙන්නේ මොකක්ද? ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහලු බවෙහි දුක, මරණ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක, හිතන බලාපොරොත්තුවන දේ නොලැබීමේ දුක, කෙටියෙන් කියනවා නම් ඔය දුක් ටික කියන්න වෙනවා ඇහැට. ඕක තමයි දුක්ඛ සත්‍යයට එන්නේ.

"දුක්ඛෙ ඤාණං" කියන කොට **"ඇහැ කියන එක ජාතිය, ජරාව, ව්‍යාධිය, මරණය, ශෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස, ස්වභාව කොට ගෙන ඇති ධර්මයක්. රූපය කියන්නේ ඉපදීම, ලෙඩවීම, මහලු බව, මරණය ශෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස ස්වභාව කොට ගෙන ඇති ධර්මයක්. චක්ඛු විඤ්ඤාණය කියන්නේ ඉපදීම, ලෙඩවීම, මහලු බව, මරණය ශෝක පරිදේව,**

දුක්ඛ දෝමනස්ස ස්වභාව කොට ගෙන ඇති ධර්මයක්” [67] කියන නුවණයි එන්නේ.

සමුදය සත්‍යයෙන් පෙන්නනවා ඇහැ ලෝකයේ ප්‍රියයි මධුරයි. තණ්හාව උපදින්නේ පවතින්නේ එහි. ඇහැ දුකයි කියන්න හේතුව තමයි ඒ පෙන්වන්නේ. ඇහැ යම් තැනක තිබුණොත් තණ්හාව උපදින්න පවතින්න පුළුවන්. තණ්හාව තිබුණොත් උපාදානය වෙනවා. උපාදානය වුණොත් භවය වෙනවා. භවය වුණොත් ඉපදීම වෙනවා. ඉපදීම වුණොත් ජරාමරණ ශෝක පරිදේව දුක් දොම්නස් ඇති වෙනවා ම යි.

එහෙනම් ඇහැ කියන එක පරිහරණය කරලා ජරා මරණවලින් මිදිලා ඉන්න තැනක් නෑ කියන එකයි කියන්නේ. ඇහැට දුකයි කියලා කිව්වේ ජරාමරණ දුක තියෙනවා කියලා නිකන් ම හින්දා නෙමෙයි. ඇහැ තිබුණොත් ඇහැ ඇසුරු කර ගෙන තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් නිසා.

“චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති”- ඇහැ ලෝකයේ ප්‍රියයි මධුරයි. තණ්හාව උපදිනවා නම් උපදින්නේ එහි. තණ්හාව පවතිනවා නම් පවතින්නේ එහි. එතකොට ඇහැ තිබුණොත් තණ්හාව කියන එක ඇතිවෙනවා.

න්‍යායේ දී තණ්හාව නිසා දුක එනවා කිව්වට, තණ්හාව නිසා දුක එන විදිහ විස්තර කෙරුවේ නැහැ නේ. මාර්ගය විස්තර කරන තැන දී පෙන්වනවා තණ්හාව දුකට හේතුව වුණේ කොහොම ද කියලා. තණ්හාව ඇති වුණොත් උපාදාන වෙනවා ම යි. උපාදානය වුණොත් භවය හැදෙනවා ම යි. භවය හැදුනොත් ඉපදෙනවා. ඉපදුනොත් ජරාමරණ දුක එනවා ම යි. ඒ නිසයි දුකට හේතුව තණ්හාව කියන්නේ. ඒ නිසයි පංච උපාදානස්කන්ධය දුකයි කියලා කියන්නේ කියන උත්තර දෙක ම එනවා එකට.

---

[67] https://tipitaka.lk/sn-4-1-4/sinh - **ජාතිධම්ම වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 57 සහ 59 පිටු**

~ තණ්හාව නැති වෙන්න ඕන කොහෙද ~

එහෙනම් මේ තණ්හාව නැති වෙන්න ඕනේ කොහෙද? ඇහැ ලෝකයේ ප්‍රියයි, මධුරයි. තණ්හාව කියන එක නොපවතින්න ඕනේ එහි. ඇහැට රූපයට තණ්හාව නැති වුණොත් උපාදාන වෙන්න බැහැ. උපාදානය වුණේ නැත්නම් භවය නැහැ. භවය නැති වුණොත් ජාතිය නැහැ. ජාතිය නැති වුණොත් ජරාමරණ නැහැ. එහෙනම් තණ්හාව උපදින විදියට ඇහැ නූපැද්දවිය යුතුයි, රූපය නූපැද්දවිය යුතුයි කියන උත්තරයක් එනවා මාර්ග සම්මා දිට්ඨියෙන්.

ඇහැ ඉපැද්දුවේ නැත්නම්, රූපය ඉපැද්දුවේ නැත්නම් තණ්හාව උපදින්න පවතින්න තැනක් තියෙනවා ද? නෑ. එහෙනම් තණ්හාව නිරෝධ කරන්නට නම් ඇහැ, රූපාදී පංච උපාදානස්කන්ධය නොහටගන්න තැනට පත් කළ යුතුයි කියන උත්තරය එනවා.

ඇහැ, රූපය උපදවා ගත්තොත් තියෙන දෝශය මොකක් ද? ඇහැ උපදවා ගත්තොත් තණ්හාව ඇති වෙනවා. තණ්හාව ඇති වුණොත් උපාදාන වෙනවා. උපාදාන වුණොත් භවය වෙනවා. භවය වුණොත් ඉපදෙනවා. ඉපදුනොත් ජරාමරණ දුක විඳින්න වෙනවා ම යි කියලා දැක්කා. ඒ නිසා ඇහැ කියන එක දුකක් ම යි කියලා දැක්කා.

ඇහැ දුකයි කියන එක දැක්කේ සමුදය සත්‍යයත් එක්ක එකතු කරලා ම යි. එහෙනම් ඇහැ ඉපැද්දුවොත් රූපය ඉපැද්දුවොත් නේ තණ්හාව උපදින්නේ සහ පවතින්නේ. ඇහැ, රූපාදී පංච උපාදානස්කන්ධය ඉපැද්දුවේ නැති වුණොත් තණ්හාවට උපදින්න හා පවතින්න තැනක් නැහැ.

ඒ නිසා ඇහැ නොහටගන්න විදියට රූපය නොහටගන්න විදියට කටයුතු කරන්න කියන උත්තරය නැතිවෙන කොට, සීමා නොකරන ලද මට්ටමකින් අපිට පෙනීම සිද්ධවන තැනක, *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"* කියලා කියන්නේ, අවිද්‍යාව නිසා අපි පෙනෙන අරමුණට හිතන්න ගත්තා. පෙනෙන අරමුණට හිතන කොට අරමුණේ විඤ්ඤාණය පිහිටනවා.

"යඤ්ච භිකඛවෙ, චෙතෙති යඤ්ච පකපෙපති, යඤ්ච අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා".[68] හිතන කොට, කල්පනා කරන කොට, අනුසය වශයෙන් පවතින කොට අරමුණේ විඤ්ඤාණය පිහිටනවා.

චක්ඛු විඤ්ඤාණය පිහිටියාම, *"විඤ්ඤාණපච්චයා නාමරූපං"* කියන්නේ විඤ්ඤාණය පේන නාමරූප දෙක පැත්තට බැසගන්නවා. *"නාමරූපපච්චයා සළායතනං"* කියන්නේ එතකොට උපාදානයට හිත විදිහට ඇහැ හැදෙනවා. *"සළායතනපච්චයා ඵස්සො"* කියන්නේ ඇහැ හැදුනහම රූප ස්පර්ශ වෙනවා.

ඔය පටිච්චසමුප්පාද සිද්ධියෙන් කිව්වේ ශූන්‍යතාවයක් තියෙන තැනක උපාදානයට හිත විදියට ඇහැ උපද්දවන්න එපා රූපය උපද්දවන්න එපා කියන උපදේශය ඉගෙනගෙන නැතිවෙන කොට, සීමා නොකරන ලද මට්ටමකින් පෙනෙන තැනක එක රූපයක් අරමුණු කර ගෙන හිතලා, ඒ රූපය ගැන දැනුම අරගෙන, හිත ඊට නමලා බලන කොට උපාදානයට හිත විදිහට ඇහැ, රූප ඉපදිලා කියලා.

ඇහෙන් එක රූපයක් සීමා කරලා ගත්තාට පස්සේ ඇහැත් තියෙනවා, රූපයත් තියෙනවා, චක්ඛු විඤ්ඤාණයත් තියෙනවා. ඔන්න දැන් උපාදානයට හිත විදියට තියෙන්නේ. ඇහැ උපන්නා ම, රූපය උපන්නා ම, චක්ඛු විඤ්ඤාණය උපන්නා. දැන් චක්ඛු සම්ඵස්සය ඉපදෙනවා.

ඉන්පසු චේතනාව ඉපදෙනවා. 'මේක කෝප්පයක්', 'මේක ගොඩක් වටිනවා ඇති' කියලා මට හිතන්න පුළුවන්. හිතලා පැත්තකට යන කොට බාහිර වටිනා කෝප්පයක් තියෙනවා කියන නිමිත්ත හිටිනවා. පංච උපාදානස්කන්ධය දුකයි. පංච උපාදානස්කන්ධය උපන්නොත් තණ්හාව යෙදෙනවා ම යි. එහෙම වුණොත් උපාදාන වෙලා භවය හැදිලා ජරාමරණ දුක එනවා ම යි. ඇහැට, රූපයට තණ්හාව නැති වුණොත් විතරයි උපාදාන වෙන්නේ නැත්තේ, භවය හැදෙන්නේ නැත්තේ, ජරාමරණ දුක එන්නෙ

---

[68] https://tipitaka.lk/sn-2-1-4-8 - **චේතනා සූත්‍රය- කළාරබත්තිය වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය 2- 102 පිටුව**

නැත්තේ. ඒ නිසා ඇහැ උපද්දවන්න එපා. රූපය උපද්දවන්න එපා කියන උපදෙස හම්බ වුණේ නැහැ සීමා නොකරන ලද මනසකින් උප්පත්ති වශයෙන් ආපු අපිට.

ඒ නුවණ නැති නිසා එනම් අවිද්‍යාව නිසා සීමා නොකරන ලද මනස බිඳගෙන උපාදාන වෙන්න පුළුවන් විදියට ඇහැක්, රූපයක් එනම් පංච උපාදානස්කන්ධයක් හදාගත්තා. ඒ පංච උපාදානස්කන්ධයට තණ්හා, උපාදාන වුණහම භවය හැදෙනවා. භවය නිසා ජාති, ජරා මරණ ආදී සියළු දුක් විඳින්න වෙනවා.

නමුත් එක දේකට සීමා කරන්නේ නැතුව සීමා නොකරන ලද විදිහට බැලුවා ම අපේ හිතේ 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්', 'දෙයක්' පිළිබඳව නිමිත්තක් යෙදිලා තියෙනවා ද? නැහැ. නමුත් සතිපට්ඨානයෙන් තොරව එක රූපයකට හිත යොමු කරලා බලපු ගමන් ම 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්', 'දෙයක්' කියන අදහස එනවා.

අද අපි සීමා කරලා ඇහෙන් රූපයක් දිහා බලද්දී ම චක්ඛු විඤ්ඤාණය උපදිනවා. එතන චක්ඛු සම්ඵස්සය තියෙනවා. චක්ඛු සම්ඵස්සයෙන් උපන්න වේදනාව තියෙනවා. එතකොට ම ඒ වේදනාව අරහයා තණ්හා, උපාදානය යෙදෙනවා ම යි. එහෙම සීමා කරලා බලන්නේ ම අවිද්‍යාව නිසා ම යි.

ඇහැ දුකයි, රූපය දුකයි, චක්ඛු විඤ්ඤාණය දුකයි. ඒවා දුකයි කියන්නේ; ඇහැ උපන්නොත්, රූපය උපන්නොත්, චක්ඛු විඤ්ඤාණය උපන්නොත් තණ්හා උපාදානය වෙලා භවය හැදෙනවා ම යි. භවය හැදුනොත් ජාති ජරා මරණ ආදී දුක එනවා ම යි. ඒ නිසා උපාදානයට හිත විදිහට ඇහැ උපද්දවන්න එපා. රූපය උපද්දවන්න එපා කියන උපදේශය අහලා නැති කෙනෙක් ම යි සතිපට්ඨානයෙන් තොරව රූපයක් දිහා බලන්නේ.

සීමා නොකරන ලද මනසකින් උප්පත්ති වශයෙන් ආපු අපි අවිද්‍යාව නිසා උපාදානයට හිත වූ ස්කන්ධ ටිකක් හදාගෙන ඒවාට උපාදාන වුණාට පස්සේ අපි දකින (දිට්ඨ), අහන (සුත), දැනෙන (මුත), දැන ගන්න

(විඤ්ඤාත) දේවල් දකින්න, අහන්න, දැනෙන්න, දැන ගන්න කලිනුත්, දැක්කට, ඇහුවට, දැනුනට, දැන ගත්තට පස්සෙත් බාහිර ඇති බවට භවය හැදුණා.

~ උපාදානය නිසා භවය හැදෙන හැටි ~

අපි *"උපාදානපච්චයා භවෝ"* කියන එක වුණ හැටි බලමු. මේ රූපයේ යථාභූත ස්වභාවය තමයි බත්, පාන්, කව්පි, මුංඇට කියන කනබොන ආහාරයෙන් හැදුණේ. පොළොවේ තියෙන පස් ටිකක්, ගඩොල් කැටයක්, හුඹහක තියෙන මැටි ටිකක් ගත්තොත් ඒවා 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක් නෙවෙයි නේ. ඒ වගේ තමයි මේ කයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර ආදී කියන පඨවි ධාතු කොටස් 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක් නෙවෙයි.

ළිඳක, වැවක, පොකුණක තියෙන ජලය 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක් නෙවෙයි නේ. ඒ වගේ තමයි මේ කයේ තියෙන පිත, සෙම, සැරව ආදී ආපෝ ධාතු කොටස් 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' නෙවෙයි. ගිනි ගොඩක, හිරු එළියේ ආදී බාහිර උෂ්ණයක් තියෙනවා නම් ඒවා 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' නෙවෙයි නේ. ඒ වගේ තමයි මේ කයේ යම් උෂ්ණයක් තියෙනවා නම් ඒවා 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' නෙවෙයි.

බාහිර සුළඟක තියෙන වායෝ ධාතුව 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' නෙවෙයි නේ. ඒ වගේ ම යි මේ කයේ තියෙන වායෝ ධාතුව 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' නෙවෙයි. නමුත් දෝශය තමයි සතිපට්ඨානයෙන් තොරව රූපය දිහාට හිත යොමු කරපු ගමන් ම අපිට 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' කියන අදහස උපදිනවා.

මේ රූපය දිහා බලන ලෝකේ ඕනෑ ම කෙනෙක්ගේ හිතේ පහළ වෙනවා මේ තව 'පුද්ගලයෙක්' 'සත්ත්වයෙක්', 'ආත්මයක්' කියලා. මේ

විදියට හිතේ පහළවෙන ගතියට තමයි 'අත්තවාද උපාදානය' කියලා කියන්නේ.

අපි මේ රූපය දිහා බලන කොට රූපය කියන්නේ සතර මහා ධාතු නැමැති ඒ යථාර්ථය අපිට පේන්නේ නැහැ. රූපය බලපු ගමන් ම අපිට පේන්නේ 'පුද්ගලයෙක්' 'සත්ත්වයෙක්', 'ආත්මයක්' කියන එක. එනම් රූපය උපාදානයට හිත වෙලා. මේ රූපයට කියනවා 'උපාදානීය' යි කියලා. උපාදානයට හිත වූ මේ රූපයට කියනවා 'රූප උපාදානස්කන්ධය' කියලා. මේ රූපය දිහා බලන කොට ඕගොල්ලොන්ගේ හිතේ ඇතිවෙනවා; මේ තව 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' කියන හැඟීම. 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්', 'ආත්මයක්' කියන හැඟීම කෙනා කෙනාගේ මනසේ පහළ වුණ 'අත්තවාද උපාදානය'.

රූපයක් දිහා බලන කොට රූපය 'සත්ත්වයෙක්', 'පුද්ගලයෙක්' කියලා තමන්ගේ මනසේ උපාදානය පහළ වෙලා නේද කියලා ඕගොල්ලෝ දන්නේ නෑ. එතකොට මොකද කරන්නේ? ඔය උපාදානය බහාලනවා කනබොන ආහාර ප්‍රත්‍යයෙන් හැදෙන සතර මහා ධාතු රූපයට. කනබොන ආහාරයෙන් හටගත්ත රූපයට මනසේ උපන්න උපාදානය බහාලපු ගමන් භවය හැදෙනවා කියන්නේ 'බැහැර සත්ත්වයෙක් ඉන්නවා' කියන ගතියක් හැදෙනවා. ඕකට කියනවා *"උපාදානපච්චයා භවො"* කියලා.

අපි තව උපමාවක් බලමු. කඩදාසියක් ගන්නවා. සායම් ටිකකින් අකුරු ටිකකුත් ලියනවා. ඔය කඩදාසිය දකින කෙනාගේ මනසේ සිහි වෙනවා මේක රුපියල් 1000ක් වටිනවා කියලා. මාස තුන හතරක පොඩි ළමයෙක් හිටියොත් ඒ පොඩි ළමයාටත් ඒ කඩදාසිය පේනවා. නමුත් පොඩි ළමයට වටිනාකම සිහි වෙනවද? නැහැ.

ඒ රූපයට (තීන්ත සායම් ටිකකින් යුක්ත කඩදාසියට) කියනවා රූප උපාදානස්කන්ධය කියලා. ඒ කඩදාසිය දකින කොට ම දකින කෙනාගේ හිතේ මේක රුපියල් 1000ක් වටිනවා කියලා ඇතිවෙන ගතියට කියනවා 'කාම උපාදානය' කියලා.

උපාදානය ඇති වුණේ කොහෙද? කෙනා කෙනාගේ මනසේ. එනම් උපාදානයට හිත රූපය අරමුණු කර ගෙන ඉන්න කෙනාගේ මනසේ. රූපය දකින කොට අපි ගාව මේ රූපය වටිනාකමට පෙන්වන කාම උපාදානය උපන්නා නේද කියලා නොඳකින කොට වටිනාකම බහාලනවා තීන්ත සායම් ටිකකින් යුක්ත කඩදාසියට/ රූපයට.

එතකොට බාහිර වටිනා සල්ලි කොළ තියෙනවා කියලා භවය හැදෙනවා. භවය කියලා කියන්නේ බාහිර; සත්ත්වයෝ පුද්ගලයෝ ඉන්නවා, මිලමුදල් තියෙනවා, රන් රිදී තියෙනවා කියලා හැඟෙනකමට. අපිට වටිනා දේවල්, කාම භාණ්ඩ, පුද්ගලයෝ බැහැර ඉන්නවා තියෙනවා කියන කම හැදුණේ ඔන්න ඔය විදිහට *"උපාදානපච්චයා භවෝ"* නිසා.

ඔහොම කාලයක් යන කොට සීමා නොකරන ලද මනසේ ගතිය මැකිලා සල්ලි, පුද්ගලයෝ බාහිර ඉන්නවා කියන භවය හැදුණේ පෙනෙන, ඇහෙන, දැනෙන, දැන ගන්න දේ මත අපේ ම කෙලෙස් පතිත වෙලා ස්කන්ධ සහ කෙලෙස් කියන දෙක එකට එකතු වෙලා නේද කියලා නොඳකින කොට අපිට හිතෙන්නේ බාහිර සල්ලි ගොඩක් තියෙනවා. මට ඒවා නැතිව යි ඉන්නේ කියලා. බාහිර මිනිස්සු ගොඩක් ඉන්නවා. මට ඒ අයව ගිහින් ඇසුරු කරන්න පුළුවන් වගේ තැනකින් තමයි අපිට ලෝකය හැදිලා තියෙන්නේ.

ඔය විදිහට සල්ලි තියෙන ලෝකය හැදිලා තිබුණොත් ඒක හොයාගෙන නොයා ඉන්නේ නෑ. මිනිස්සු හිටියොත් ඒ අය හම්බවෙන්න නොයා ඉන්නේ නෑ. මේක තමයි *'භවපච්චයා ජාති'* කියලා කියන්නේ. එතකොට පටිච්චසමුප්පාදයෙන් පෙන්නුවේ අපිට ලෝකේ හැදුන හැටි.

ඇහැ, රූපාදී දොළොස් ආයතනය දුක යි. ඒ නිසා උපාදානයට හිත විදිහට ඇහැ උපද්දන්න එපා. රූපය උපද්දන්න එපා. ඒ මොකද? ඇහැ, රූපය ඉපැද්දුවොත් තණ්හාව ඇති වෙනවා. තණ්හාව නිසා උපාදානය වෙනවා. උපාදානය ඇතිවෙලා භවය හැදෙනවා. භවය හැදුණොත් ආයෙත් ඉපදෙන්න වෙනවා. උපන්නොත් ජරාමරණ දුක එනවා.

ඒ නිසා ඇහැ උපදින විදියට, රූපය උපදින විදියට හිතන්න නම් එපා කියලා අපිට චතුරාර්ය සත්‍යය පිළිබඳව පරිපුර්ණ නුවණක් (විද්‍යාව) ලැබිලා තිබුණා නම්, අපි සීමා නොකරන ලද මනසින් හෙල්ලෙන්නෙවත් නෑ. එහෙනම් සතර සතිපට්ඨානයෙන් තොරව උපාදානයට හිත විදිහට ඇහැ රූපයක් මුල් කරලා බලන්නේ නෑ අපි. එහෙම නොබැලුවා නම් මේ ලෝකය නෑ අඳ අපිට.

~ ලෝකය පිළිබඳව බුදුරජාණන් වහන්සේගේ විවරණය ~

බුදුරජාණන් වහන්සේ තවත් පැත්තකින් අපිට පෙන්නනවා ගෙවල්දොරවල්, මිලමුදල්, ඉඩකඩම්, යානවාහන තියෙන ලෝකයට නුඹලා උප්පත්ති වශයෙන් ආවේ නැහැ. උප්පත්ති වශයෙන් ආවේ ඇහැ, කන, නාසය, දිව, කය හදාගෙන සීමා නොකරන ලද මනසකින් යුක්ත ශූන්‍යතාවයක් තියෙන තැනකට. එහෙම ආවට පස්සේ අවිද්‍යාව නිසා මෙන්න මේ වගේ ලෝකය හදාගත්තා කියන එක පෙන්නනවා පටිච්චසමුප්පාදයෙන්.

"අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධෝ" [69]

කියන්නේ ඇහැ, රූප දුකයි. ඇහැ, රූපය කෙරෙහි තියෙන තණ්හාව තමයි දුකට හේතුව. තණ්හාව දුකට හේතුව කිව්වේ තණ්හාව තිබුණොත් උපාදාන වෙනවා. උපාදානය වුණොත් භවය ඇති වෙනවා. භවය වුණොත් ඉපදෙනවා. ඉපදුනොත් ජරාමරණ දුක එනවා කියන ටික ඔක්කොම තියෙන හින්දා කැටි කරලා තණ්හාව දුකට හේතුව කියලා කියනවා.

තණ්හාව තිබුණොත් අවසාන ප්‍රතිඵලය වෙන්නේ දුක. මොකද, මෙතන පරාසයක් තියෙනවා. ඇහැ රූපාදී පංච උපාදානස්කන්ධය උපන්නොත් තණ්හාව උපදිනවා. තණ්හාව ඇති වුණොත් උපාදානය වෙනවා. උපාදාන වුණොත් භවය හැදෙනවා. භවය හැදුණොත් ඉපදෙනවා.

[69] https://tipitaka.lk/sn-2-1-1-3 - **පටිපදා සූත්‍රය- බුද්ධ වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය 2- 3 පිටුව**

ඉපදුනොත් ජරා මරණ දුක එනවා ම යි. එතකොට එහෙම වෙන සිද්ධියක තණ්හාව ආරම්භය නිසා දුකට හේතුව තණ්හාවයි කියලා කියනවා.

තණ්හාව නැති වුණොත් දුක නැති වෙනවා කියලා කියන්නේ නිකම් නෙවෙයි. තණ්හාව නැති වුණොත් උපාදානය නැහැ. උපාදානය නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ඉපදෙන්නේ නැහැ. ඉපදුනේ නැති වුණොත් දුක නැති වෙනවා.

ඒ නිසා තණ්හාව උපදින හා පවතින විදියට ඇහැ රූපය උපද්දවන්න එපා කියන නුවණ තිබුණා නම් අපි උපාදානයට හිත විදිහට ඇහැ උපද්දලා රූපයක් දිහා බලන්නේ නැහැ. රහතන් වහන්සේ නමක් කිසි ම දවසක උපාදානයට හිත විදිහට ඇහැ උපද්දලා රූපයක් දිහා බලලා රූපයේ හැසිරෙන්නේ නැහැ. බැලුවත් බලන්නේ සතිපට්ඨානය තුළ වාසය කරමින් යථාභූත ඥානයෙන්.

උදාහරණයක් ගත්තොත් දැන් මම නේ මේ රූපය දිහා බලන්නේ. රූපය දිහා බැලුවොත්නේ 'කෙනෙක්' 'පුද්ගලයෙක්' කියන අදහස මට එන්නේ. රහතන් වහන්සේ නමක් මේ දිහා බලන්නේ සතිපට්ඨානය තුළ වාසය කරමින් යථාභූත ඥානයෙන්. කනබොන ආහාරයෙන් හැදුණ කුණප කොටස් ටිකක් නැත්නම්, පඨවි ආපෝ තේජෝ වායෝ සතර මහා ධාතු රූපයක් නේද මේ කියලා බැලුවොත් රූපයේ හැසිරෙන්නේ නැහැ රහතන් වහන්සේ. රහතන් වහන්සේ නමක් අපි වගේ රූප නිමිති ගන්නේ නැහැ. රූප නිමිති ගත්තොත් උපාදානය වෙනවා කියන එක නවත්තන්න බැහැ ම යි.

ඕකට මම උදාහරණයක් කිව්වේ; පිටතින් හොඳට සිත්තම් කරපු චිත්‍රයක් ඇඳපු කළයක් තියෙනවා ඇතුළේ අසූචි පුරවලා. ලෝකේ කෙනා පිටත සිත්තම දිහා විතරක් බලනවා හරි ලස්සන සිත්තමක් කියලා. එතකොට එයාට තණ්හාව උපදිනවා. තණ්හාව වැඩෙනවා.

අනිත් කෙනා බලනවා ඒ කළය දිහා ම පිටතින් සිත්තමක් තිබුණාට මේකේ ඇතුළේ අසූචි පුරවලා පණුවො ගහලා නේද තියෙන්නේ කියලා. එහෙම බලන කොට පෙනෙන දේ තුළ හිත රැඳෙන්නේ නැහැ එයාට. පෙනෙන

දේට ඔබ්බෙන් නුවණ අරගෙන යනවා. එතකොට එයාට අර සිතුවම ගැන තණ්හාව හිතෙන්නේ නැහැ. ඒ සිත්තම තියෙන්නේ මේ වගේ තැනකනේ කියන යථාභූත ඥානය එයාට ඇවිත් තියෙනවා.

එතකොට පෘථග්ජන ලෝකයා රූපයක් දිහා බලනවා වගේ තමයි කළය ඇතුළේ තියෙන අසූචි බලන්නේ නැතුව පිටතින් තියෙන සිත්තම දිහා විතරක් බලන එක. එහෙම බලපු ගමන් ම තණ්හාව ඇතිවෙන එක නවත්වන්න බැහැ. එහෙම පිටත සිත්තම දිහා විතරක් බලන කොට 'මේක හොඳයි', 'ලස්සනයි' කියලා නොහිතුනොත්නේ පුදුමේ.

ඒ වගේ සාමාන්‍ය ලෝකයා කරන්නේ කෙලින් ම රූපයට හිත තබනවා. එහෙම හිත තබපු ගමන් 'සත්ත්වයෙක්', 'පුද්ගලයෙක්', 'මිලමුදල්', 'වටිනවා' කියනකම මනසේ ඇති වෙනවා. එතකොට ඒ ගති ටික රූපය දකින කොට ම තමන්ට ආවා කියලා දන්නේ නැති වුණා ම ඒවා මිලමුදල්, ඒවා පුද්ගලයෝ කියලා හිතාගෙන ආයෙත් සතර මහා ධාතු රූපය පැත්තට යනවා. ඒ විදිහට අපි භවය හදාගන්නවා.

නමුත් රහතන් වහන්සේ නමක් සීමා නොකරන ලද මනසේ ජීවත් වෙනවා. යමක් දිහා බලන්න ඕන වුණා ම සතිපට්ඨානයට සිහියෙන් තමයි වාසය කරන්නේ. ආධ්‍යාත්මික කයේ කය අනුව පිහිටි සිහියකින් වාසය කරමින් පවතින ඇත්ත ඇති හැටියෙන් බලනවා.

රූපය කනබොන ආහාරයෙන් හැදුණා සතර මහා ධාතුයි නේ කියන තැනකින් බැලුවොත් රූපය උපාදානයට හිත නැහැ. දැන් එහෙම නුවණින් බැලුවොත් මේ රූපය දිහා, 'මේ රූපය පුද්ගලයෙක්' කියන උපාදාන ගතිය මගේ මනසේ එන්නේ නැහැ. එතකොට බාහිර සත්ත්වයෝ, පුද්ගලයෝ ඉන්නවා කියන භවය හැදෙන්නේ නැහැ.

හැබැයි රූපය පරිහරණය කරලා නම් බේරෙන්න බැහැ. රහතන් වහන්සේලා කවදාවත් රූපය පරිහරණය කරන්නේ නැහැ. රහත් බවට පත් වුණොත් එහෙම පරිහරණය නොකළ නිසයි. ඒ කියන්නේ ඇහැ, රූපය

පරිහරණය කරන එක දොස් සහිතයි. ඒක දුකක් කියන එක තමයි ආර්ය ශ්‍රාවකයා දකින්නේ.

"දුක්ඛෙ ඤාණං" කියන කොට; අපි උදාහරණයකට කියමු, සිත්තම් කළ මැටි කළයක් තියෙනවා ඇතුළේ අසුචි පුරවලා. එයා දකින්නේ ඇහැ දුකක් හැටියට. අර ලස්සනට පේන සිත්තම දුකක් හැටියට. මොකද ඒවා පරිහරණය කරලා කවදාවත් සුවයක් ලබන්න බැහැ. ඒකට තණ්හාව ඇතිවෙන හින්දා උපාදාන වෙනවා ම යි. උපාදාන වුණොත් භවය වෙනවා. භවය වුණොත් ජාතිය වෙලා, ජරාමරණ දුකට පත්වෙනවා ම යි. .

තණ්හාව ඇතිවෙන විදිහට ඇහැ රූපයේ හැසිරුණේ නැති වුණොත් උපාදාන වෙන්නේ නැහැ. උපාදාන නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ජරා මරණ ආදී දුක නැහැ . එහෙනම් සිත්තමේ හිත රැඳවන්නේ නැතුව පණුවෝ ගහපු අසුචි ටිකක් තියෙන්නේ කියලා බලන්න ඕන.

එතකොට ඒ අරමුණත් බැලුවා, මාරයාටවත් අහුවෙන්නේ නැහැ කියලා පෙන්නනවා බුදුරජාණන් වහන්සේ. එතකොට බේරිලා යන්න තියෙන එක ම උපාය ඔච්චරයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ මත හැසිරෙන කිසිම කෙනෙක් මාරයාට අහුනොවී බේරෙන්නේ නැහැ. පංච කාමය කියලා කියන්නේ මාරයා විසින් වියන ලද දැලක්.

මාරයා විසින් වියන ලද පංච කාමය නැමැති දැලෙන් බේරිලා යන්න තියෙන එකම උපාය තමයි රූප ඇස් හමුවට එද්දිත් ඒ රූපවල හිත හසුරුවන්නේ නැතුව එක්කො සීමා නොකරන ලද මනසෙන් ජීවත් වෙන්න ඕන. යමක් දිහා බලනවා නම් සතිපට්ඨානයට සිහියෙන් ම බලන්න ඕන.

මොකද එයා අත්විඳිනවා තමන්ගේ ජීවිතයෙන් සතිපට්ඨානයෙන් තොරව රූප දිහා බලපු ගමන් ම 'පුද්ගලයෙක්', 'මනුස්සයෙක්', 'ගැහැණු කෙනෙක්', 'ළමයෙක්' කියන අදහස් එනවා ම යි. හැබැයි ඒ රූප දිහා කුණප කොටස් ටිකක්, සතර මහා ධාතුයි, කනබොන ආහාරයෙන් හැදිලා තියෙන්නේ කියලා ඇත්ත ඇති සැටියෙන් බැලුවොත් ඒ රූප; පුද්ගලයෙක්, මනුස්සයෙක්,

ගැහැණු කෙනෙක්, ළමයෙක් කියන අදහස් එන්නේ නැහැ කියලා එයා ජීවිතයෙන් අත්දකිනවා.

සතිපට්ඨානය වඩන්නේ නැතුව රූප දිහා බලපු ගමන් තණ්හා උපාදාන ආදී කෙලෙස් ඕන තරම් ඇති වෙන්න ඉඩ තියෙනවා. හැබැයි සතිපට්ඨානයෙන් බැලුවොත් කෙලෙස් ඇති වෙන්න ඉඩක් නැහැ. අර මැටි කළයේ පිටත සිත්තම දිහා විතරක් බැලුවොත් තණ්හාව කියන එක ඇතිවෙන එක වළක්වන්න බැහැ.

මේකට තියෙන එක ම විසඳුම තමයි රූපයක් දිහා බලන්න ම ඕන නම් සතිපට්ඨානයෙන් යථාභූත ඥාණෙන් ඒ දිහා බලන්න ඕන. එතකොට මොකද වෙන්නේ? මැටි කළය ම අරමුණු කළත් මේකේ ඇතුළේ තියෙන්නේ පණුවො ගහපු අසූචි ගොඩක් නේද කියන ඥාණය එයාව අරගෙන යනවා පිටත රූපයේ හිත රැඳෙන්නේ නැතුව යථාර්ථයට. එතකොටත් තණ්හාව යෙදෙන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඒකයි, අවිද්‍යාව නැති වුණා නම් විද්‍යාව ඉපදිලා තිබුණා නම් අද ඕගොල්ලෝ මේ විදිහට උපාදානයට හිත විදිහට ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ උපදවාගෙන ඒවාට තණ්හා උපාදාන වෙලා භවය හදාගන්නේ නැහැ කියලා.

ඒ නොදැනුවත්කම නිසා ම යි අපි ඇහැ පරිහරණය කළේ. රූපය පරිහරණය කළේ. ඒ නිසා ම යි අපි දැන් ගිරයකට අහුවෙලා වගේ මාරයාට අහුවෙලා ඉන්නේ මාරයාගෙන් මිදීගන්න බැරුව. බලපු, බලපු දේ එකතු වෙලා අපිට අද; අම්මලා ඉන්න, තාත්තලා ඉන්න, ගෙවල්දොරවල් යානවාහන, ඉඩකඩම් මිලමුදල් තියෙන ලෝකය හැදිලා.

~ ලෝකය හැදුනහම වෙන දේ ~

ලෝකය හැදුනහම ඊට පස්සේ යුතුකම් තියෙනවා, වගකීම් තියෙනවා. ඒවා දාලා යන්න බැරි වෙන්න සංයෝජන/ බැඳීම් ඇති වෙනවා.

‘මම නැති වුණොත් කොහොමද ඒවා පවතින්නේ’. ‘මම නැති වුණොත් කොහොමද ඒ අය ජීවත් වෙන්නේ’, ‘ඒ අය නැති වුණොත් මම කොහොමද ජීවත් වෙන්නේ’ කියලා දාලා යන්න බැරි බැඳීම් ඇති වෙනවා.

තව තියෙනවා ‘ඕඝ’. ඕඝ කියන්නේ කෙලෙස් සැඩ පහරට. දරුවෝ ගැන ම හිතනවා, ගෙදර ගැන ම හිතනවා, මුදල් ගැන ම හිතනවා. සැඩ පහරකට වැටුණු කෙනාට ගොඩට එන්න ඕනේ වුණාත් ගොඩ එන්න බැහැ ගහගෙන ම යනවා වගේ ලෝකේ හැදුණාට පස්සේ ලෝකේ දේවල් පැත්තට ම ගහගෙන යනවා.

ඊලඟට තියෙනවා ‘යෝග’. යෝග කියලා කියන්නේ ලෝකය තුළ ම ම යොදවන ගතිය. ඒ කියන්නේ මුදල් ම හොයනවා, දරුවෝ ම බලනවා ආදී ඒවායේ ම යොදවන ගතිය. ‘ග්‍රන්ථ’ කියලා තව කෙලෙස් වර්ගයක් තියෙනවා. ‘ග්‍රන්ථ’ කියලා කියන්නේ ගොතවනවා. ඒ වගේ ම කාමච්ඡන්ද, ව්‍යාපාද ආදී වූ ඒ නීවරණ වලින් ම මනස වහනවා.

ලෝකෙ හැදුණාට පස්සේ මේ විදිහට ඒ ලෝකේ ඇතුළේ හොඳට සංයෝජනවලින් දැලකුත් වියනවා. භවය හදලා, භවය ඇතුළේ යුතුකම් වගකීම් කියලා ඔහොම ගති ටිකකුත් හැදුණාට පස්සේ ආයේ ලෝකය කියන එක බොරුවක් වෙන්නේ නැහැ, ඇත්ත ම වෙලා අපිට.

ඔතන තියෙන හොඳ ම කාරණාව බලන්න. තණ්හාව තිබුණොත් උපාදාන වෙනවා කියන්නේ, රූපය දකින කොට කෙනාගෙ මනසෙයි උපාදානය යෙදෙන්නේ. *“උපාදානපච්චයා භවෝ”* කියන කොට ලොකු අර්ථ තියෙන්නේ මේවාගේ. තමන්ගේ මනසේ ඒ උපාදාන ගතිය එහෙම්පිටින් ම ඔසවලා තබනවා උපාදානයට හිත වූ සතර මහා ධාතු රූපයට. ඒකට තමයි *“උපාදානපච්චයා භවෝ”* කියන්නේ.

තීන්ත ටිකකින් යුක්ත කඩදාසිය දකින කෙනාටයි හිතෙන්නේ ‘වටිනවා’ කියලා. ඊටපස්සේ තමන් දන්නේ නැහැ ඒ කඩදාසිය දකින කොට තමන්ගේ මනසේ වටිනාකමක් (කාම උපාදානය) යෙදුණා නේද කියලා. ඒ නිසා අපි ම ඇද වැටෙනවා අපේ ම කෙලෙස් ටිකට.

මනසේ යෙදුණ කාම උපාදානය ඔසවලා කඩදාසියට තබපු ගමන් බාහිර මෙච්චර වටිනාකමෙන් යුත් සල්ලි කොළ තියෙනවා වගේ තැනකින් අපි ම රැවටෙනවා. ඒ කඩදාසි කොළේ වටිනා නිසයි ඒක වටිනවා කියලා තේරුණේ කියලා තමයි අපිට හිතෙන්නේ.

දැන් අපිට ඒ කඩදාසිය වටිනා නිසා ඊටපස්සේ ඒ කඩදාසිය නැති වෙයි කියලා බයයි. ඒ කඩදාසිය දකින කොට මගේ හිතේ වටිනාකම පහළ වෙන්නේ කියලා දැක්කොත් කඩදාසිය මම රකින්නට යන්නේ නැහැ. කඩදාසිය දකින කොට මනසේ උපදින වටිනාකම කඩදාසිය පැත්තට තබන එකට තමයි *"උපාදානපච්චයා භවො"* කියලා කියන්නේ.

ඊට පස්සේ ඉතින් ඔය කඩදාසිය පරිස්සම් කරන්න සේප්පුත් හදන්න ඕන. සේප්පු හදලා යතුරු දාලා ඒ සේප්පුව වහලා, ඒ සේප්පුව තියෙන කාමරේ දොරත් වහලා, කාමරේ දොර තියෙන ගෙදර දොරත් වහලා, ගේට්ටු දොරත් වහනවා. එච්චර වටිනාකමක් දෙන කොට ඕකට ආශාවේ ප්‍රතිසන්ධි වශයෙන් නොගියොත් තමයි පුදුමේ.

එච්චර වටිනාකමින් යුත් මුදලක් හැදුණේ කොහොම ද? උපාදානය නිසා. උපාදානය වුණේ කොහොමද? උපාදානයට හිත තණ්හාව යෙදුණු රූපය නිසා. තණ්හා වුනේ කොහොම ද? ඇහැ එක රූපයකට පමණක් සීමා කරලා එල්ල කරපු හින්දා. ඇහැ එක රූපයකට පමණක් සීමා කරලා එල්ල කළේ ඇයි? සිහි සහ නුවණ නැතුව එක රූපයක් විතරක් එල්ලවෙන විදිහට හිතපු හින්දා. එහෙම හිතුවේ ඇයි? ඇහැ කියන එක උපද්දවන්න එපා, රූපය උපද්දවන්න එපා. ඒක දුකක් කියලා උපදේශයක් ලැබුණේ නැති හින්දා. එනම් අවිද්‍යාව දුරු වෙලා නැති හින්දා.

පටිච්චසමුප්පාදය අවබෝධ වුණොත් තණ්හා උපාදාන වෙන්න පුළුවන් ඇහැ, රූපයට දුකක් ම යි කියන්න වෙන්නේ කියලා දන්නවා. ඇහැ උපද්දන්න එපා, රූපය උපද්දන්න එපා දුක එනවා ම යි. පංච උපාදානස්කන්ධය දුකයි කියලා ආර්‍ය ශ්‍රාවකයාට දුක ගැන නුවණයි කියන

කොට කෙළින් ම දකින්නේ ඇහැ දුකයි, රූපය දුකයි, චක්ඛු විඤ්ඤාණය දුකයි කියන එකයි. (අටළොස් ධාතුව ම දුකයි කියන එකයි)

ඒ කියන්නේ සතර සතිපට්ඨානයෙන් තොරව ඇහෙන් රූපයක් බලන එක දුක ම යි කියන එකයි දකින්නේ. එහෙම බැලුවොත් බේරෙන්න ම බැහැ දුකෙන්. ඇයි දුක ම යි කියලා කිවුවේ? එහෙම ඇහැ, රූප ඉපද්දුවොත් ඒ රූප; 'අනේ මගේ දරුවානේ', 'මුණුබුරානේ' 'අම්මානේ', 'අප්පච්චිනේ' කියන ගතිය හරි මනසට එයි. 'වටිනා මුදලක්නේ' කියන මොනවා ම හෝ උපාදාන ගතියක් තමන්ගේ මනසේ උපදී.

උපාදානයට හිත විදිහට ඇහැ රූප ඉපද්දුවහම තණ්හා උපාදානය යෙදෙනවා ම යි, නවත්තන්න බැහැ ම යි. ඊට පස්සේ මනසේ උපදින ඒ උපාදාන ගතිය ඔසවලා රූපය පැත්තට තබනවා කියන ටික වේගයෙන් වෙනවා. අන්තිමට නතර වෙන්නේ තමන් ජරා මරණයට හිමිකාරයෙක් වෙනවා කියන තැනින් ම විතරයි. ඒ නිසා ම යි ඇහැ දුක ම යි කියලා කියන්නේ. තණ්හාව දුකට හේතුවයි කියලා කියන්නේ ඔය හින්දා ම යි. මොකද, තණ්හාව ඇති වුණොත් නතර වෙන්නේ ජරා මරණ ආදී දුකකින් ම යි කියන සිද්ධිය නිසයි.

බුදුරජාණන් වහන්සේ ඔය විදිහට ලෝකය හැදුණ හැටි පෙන්නලා දුක් නැති කරන ප්‍රතිපදාව හැටියට පෙන්වනවා; ඒ නිසා තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් විදියට; ඇහැ, රූපය, කන, ශබ්දය, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම උපද්දවන්න එපා.

එහෙම වුණොත් නුඹලාට උපාදාන වෙන්න හේතු නැහැ. උපාදාන නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ජරා මරණ දුක නැති වෙනවා. ඉදින් නුඹලාට යමක් බලන්න ඕනේ නම් රූපයේ යථාභූතයට නුවණ තියාගෙන රූපය දිහා බලන්න. කායගතාසතියෙන්, එනම් සතිපට්ඨානයට සිහියෙන් බලන්න. වේදනාවක් දිහා බලන්න ඕන නම් වේදනාවේ යථාභූත ස්වභාවයට හිත තියාගෙන බලන්න. නුඹලාට මාරයාගෙන් බේරෙන්න තියෙන

එක ම ක්‍රමය ඔච්චරයි. ඊට මෙහා නම් බේරෙන්න තැනක් නැහැ කියලා තමයි බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ.

ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා, *"දුක්ඛෙ ඤාණං"* කියන කොට දන්නවා; ඇහැ, රූප, කන, ශබ්ද ආදී මේ දොළොස් ආයතන ටික දුක ම යි. ඇහෙන් රූප බලපු ගමන්, කනෙන් ශබ්ද අහපු ගමන් තණ්හා උපාදාන වෙනවා ම යි. මනසේ යෙදෙන උපාදානය ආපහු සතර මහා ධාතු රූපය පැත්තට ඔසවා තබන නිසා භවය හැදෙනවා ම යි. භවය හැදුණොත් ඉපදෙනවා ම යි. ඉපදුනොත් ජරා මරණ දුක එන එක නවත්වන්න ම බැහැ කියලා දුක්ඛ සමුදයත් දන්නවා.

තණ්හාව උපදින හා පවතින විදිහට ඇහැ, රූප, කන, ශබ්ද ආදී දොළොස් ආයතන උපද්දවන්නේ නැතුව හිටියොත් විතරයි මේ ප්‍රශ්නෙන් බේරෙන්න පුළුවන්. එහෙනම් ඒ නිසා මම සතර සතිපට්ඨානයෙන් වාසය කළ යුතුයි කියලා නුවණක් එනවා.

කායගතාසතියෙන් තොරව මේ කය දිහා බලපු ගමන් 'මම' කියන අදහස එන්නේ. ඒ නිසා කුණප කොටස් ටිකක්, සතර මහා ධාතුයි, කනබොන ආහාරයෙන් හැදිලා තියෙන්නේ කියලා කායගතාසතියෙන් යුක්තව ම තමයි මේ කය දිහා බැලුවොත් බලන්න ඕන. බාහිර රූප දිහා බැලුවොත් බලන්නේ එහෙමයි. වටපිට බලනවා නම් බලන්නේ තමන්ගේ කය කෙරෙහි ම සිහිය තබාගෙන වටපිට බලනවා කියන දැනුම් සහගත බවකින් මගේ සිතට ඇහැ හසු නොවේවා, රූපය හසු නොවේවා කියන තැනක සිහි නුවණින්.

ඇහැ දුකයි, රූපය දුකයි. උපාදානයට හිත වූ ඇහැ, රූපය ඉපැද්දුවොත් නතර වෙන්නේ නැහැ එතනින්. තණ්හා උපාදාන වෙලා දුක කරා ගෙනයනවා ම යි. ඇහැට, රූපයට තණ්හාව උපන්නේ නැත්නම් තමයි උපාදාන නොවී භවය හැදෙන්නේ නැතුව දුක නැති වෙන්න තියෙන්නේ.

එහෙනම් එක ම උපායයි තියෙන්නේ. තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් විදිහට ඇහැ පරිහරණය නොකර යුතුයි. රූපය පරිහරණය නොකර යුතුයි. එහෙනම් කළ යුත්තේ සතිපට්ඨානයෙන් වාසය

කිරීමයි කියන එක තමයි සම්මාදිට්ඨිය. එනම් ඔහුට දර්ශනයක් තියෙනවා. ඔහු දුකත් දන්නවා, දුක ඇති වුණ හේතුවත් දන්නවා, දුක නැතිවීමත් දන්නවා, දුක නැති කර ගන්න යන්න ඕන මාර්ගයත් දන්නවා.

සතිපට්ඨානයෙන් වාසය නොකළොත් තිබෙන දෝශය/බය මොකක් ද? තණ්හාව උපදින්න හා පවතින්න පුළුවන් විදිහට ඇහැ උපදී, රූපය උපදී කියන බය. සතිපට්ඨානයෙන් වාසය නොකර ඇහෙන් රූපයක් බලපු ගමන් 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්', 'වටිනවා' කියන උපාදාන ගති මැවෙනවා හිතට.

ඒ උපාදාන ගතිය අපේ මනසේ පහළ වුණා ම, අපේ මනසෙයි ඒ උපාදාන ගතිය පහළ වුණේ කියලා පේන්නේ නැතිව *"උපාදානපච්චයා භවෝ"* කියන්නේ, උපාදාන ගතිය උස්සලා බාහිර සතර මහා ධාතු රූපයට තබපු ගමන් භවය හැදෙනවා. මේ තමයි ජීවිතයේ සැබෑ කතාව. දැන් දුක දන්නවා, දුක ඇති වෙන්න හේතුව තණ්හාව කියලත් දන්නවා, තණ්හාව නැති කළොත් දුක නැති වෙනවා කියලත් දන්නවා. ඒ නිසා තණ්හාව ඇති නොවෙන විදිහට ජීවත් වෙනවා. තණ්හාව ඇතිවෙන විදියට ඇහැ, රූප උපද්දන්නේ නැහැ. සතිපට්ඨානයෙන් වාසය කරන්නේ ඒකට.

උපාදානයට හිත විදිහට ඇහැ, රූපය උපද්දවන්න ඵපා කියලත් දන්නවා. ඇහැ, රූප ඉපැද්දුවොත් ඒ හේතුවෙන් තණ්හාව උපදිනවා කියලත් දන්නවා. තණ්හාව ඇති නොවෙන විදිහට ජීවත් වුණොත් විතරයි බේරෙන්න පුළුවන් කියලත් දන්නවා. ඒකට කරන්න ඕන සතිපට්ඨානයට සිහියෙන් නිතර වාසය කිරීම බවත් දන්නවා.

~ ආස්‍රව ක්ෂය ඥාණ ~

දැන් එහෙම සතිපට්ඨානයෙන් වාසය කළ යුතුයි කියලා දැන ගත්තට චතුරාර්ය සත්‍ය නොදන්නා කාලේ අවිද්‍යාවෙන් ලෝකය හදාගෙන ඇසුරු කරපු හුරු තියෙන නිසා අපිට සතිපට්ඨානයෙන් නිරන්තරයෙන් ම වාසය කරන්න

බැරි වෙනවා. ක්ෂණිකව ළමයා මතක් වෙනවා, ගෙදර මතක් වෙනවා, රස්සාව මතක් වෙනවා, වැඩපොළ මතක් වෙනවා. මේවා තමයි ආස්‍රව.

දැන් එහෙනම් ආස්‍රව ක්ෂය කරන්න ඕන. දුක දැක්කා, දුක ඇතිවීම දැක්කා, දුක නැතිවීම දැක්කා, දුක් නැති කරන මඟ දකින කොට ම එයාට පේනවා ආස්‍රව. රන්, රිදී, මිලමුදල්, ගෙවල්දොරවල්, දුවා දරුවෝ පරිහරණය කළ හුරුවලට කියනවා 'කාමාස්‍රව' කියලා.

කොළඹ ගියා, යාපනේ ගියා, ඉන්දියාවේ ගියා, අහවල් තැන ඉඳලා අහවල් තැනට මෙච්චර දුරයි කියලා හිතට පාරවල් එහෙම පේන්නේ ඇති බවට. ඒ පොළොව පේන එකට කියනවා 'භවාස්‍රව' කියලා. තව 'සත්ත්වයෝ ඉන්නවා', 'පුද්ගලයෝ ඉන්නවා', 'ආත්මයන් තියෙනවා' කියලා හිතෙන එකට කියනවා 'දිට්ඨාස්‍රව' කියලා.

චතුරාර්ය සත්‍යය නොදන්නා නොදක්නා වූ අවිද්‍යාව කියන එක හුරුවක් වෙලා. තව විදිහකින් කිව්වොත් ඉහත විස්තර කළ ඒවා ආස්‍රව කියලා නොදන්නා නොදක්නා අවිජ්ජාස්‍රවයත් තියෙනවා. ඒ නිසා ලෝකය ඇත්ත ම දෙයක් කියලා හිතාගෙන ඉන්නවා. ඔන්න ඔය ආස්‍රව ටික ගෙවන්න ඕන. ඒ ආස්‍රව ටික ගෙවන්න තමයි පංච උපාදානස්කන්ධයේ උදයවැය බලන්න ඕන.

දැන් අපි දැක්කානේ සීමා නොකරන ලද මනසේ හිටියා නම් ප්‍රශ්න මොකුත් නෑනේ. අවිද්‍යා කර්මයෙන් කළේ මොකක් ද? උපාදානයට හිත විදිහට රූපයක් සීමා කරලා අල්ලගත්තා. එහෙම අල්ලගත්ත ගමන් ම, 'රූපය දරුවා' කියන කාම උපාදානය යෙදුණා මගේ මනසේ. ඒ මනසේ ඇති වුණ ගතිය ඔසවලා තැබුවා කනබොන ආහාරයෙන් හැදෙන රූපය පැත්තට. එතකොට උපාදාන ප්‍රත්‍යයෙන් භවය හැදුණා.

දැන් මට 'දරුවෙක් ඉන්නවා' කියලා සිහිවෙන තැන තමයි භවය. ඒකට තමයි පංච උපාදානස්කන්ධ ලෝකය කියලා කියන්නේ. එතකොට පෙන්නන්න ඕන ඕක මට හැදුණේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ගති ටිකකින් නේද කියලා. ඒ පෙන්නුවේ පටිච්චසමුප්පාදය කෙටි කරලා.

එනම් අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විදිහට ආහාරවලින් හැදුණ රූපය සීමා කරලා අල්ලගත්තාම තමන්ගේ මනසේ තණ්හා උපාදානය යෙදුණා. ඒ උපාදාන ගතිය ඔසවලා රූපය පැත්තට තිබ්බ ගමන් 'දරුවා ඉන්නවා' කියලා භවය හැදුණා.

සල්ලි තියෙන ලෝකෙක අපි ඉපදුණා ද....?
සල්ලි තියෙන ලෝකයක් අපි හදාගත්තා ද...?

අපි තව උදාහරණයක් බලමු, බාහිර පැත්තේ වටිනා මුදලක් තියෙනවා කියන එක හැදුණු ආකාරය. පිදුරු, සිලිකන් වගේ දේවල්වලින් හැදුණු කඩදාසියකට තීන්ත ටිකක් යොදපු රූපය තමයි බාහිර පැත්තේ තිබුණේ.

එතකොට අවිද්‍යා, කර්මයෙන් කඩදාසියේ චිත්‍රයට විතරක් හිත යොමු කළා. එහෙම යොමු කළා ම ඒ කඩදාසිය දකින කොට, 'රුපියල් 1000ක්, ගොඩක් වටිනවා' කියන තණ්හා, උපාදාන කියන ක්ලේශය මගේ මනසට ආවා. මනසට ආපු ඒ උපාදාන ගතිය කඩදාසි කොළය පැත්තට තැබුවහම තමයි බාහිර රුපියල් දාහක් තියෙනවා කියනකම හැදුණේ.

භවය කියන්නේ රුපියල් දාහක් තියෙනවා කියලා සිහිවෙන එකට. එහෙම සිහිවෙන කොට ම මම පෙන්නනවා; අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ගති ටික එකතු වෙලානේ රුපියල් දාහක් තියෙනවා කියන නිමිත්ත මගේ මනසේ හැදිලා තියෙන්නේ කියලා. පංච උපාදානස්කන්ධ ලෝකයේ හටගැන්ම බලන්නේ ඔහොම.

තව උදාහරණයකින් කිව්වොත්, 'මට දරුවෙක් ඉන්නවා' කියලා බැහැර නිමිත්තක් හැදුණේ මං ගාව තියෙන කර්ම කෙලෙස් කියන ගති ටිකකුයි, බාහිර ආහාර රූපයයි කියන දෙක එකතුවෙලා නේද කියන එකයි පෙන්නන්නේ. බාහිරින් ආවේ කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූපය. සීමා නොකරන ලද මනසේ ඉඳලා මම අවිද්‍යා, කර්ම දෙකෙන් කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූපය විතරක් පෙනෙන

මට්ටමට හිත යොමු කරනවා. ඒ රූපය දකින කොට ම මේ රූපය 'පුද්ගලයෙක්', 'දරුවා නේ' කියන උපාදාන මට්ටම මගේ මනසේ යෙදෙනවා. එතකොට ඒ උපාදාන ගතිය කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූපයට තැබුවහම තමයි, 'මට දරුවෙක් ඉන්නවා' කියන බැහැර නිමිත්තක් හැදුණේ.

එතකොට අනික් පැත්තෙන් පෙන්වනවා, අවිද්‍යාව නැත්නම්, කර්මය නැත්නම්, තණ්හාව නැත්නම්, ආහාර නැත්නම් ඔහොම නිමිත්තක් නැහැ. පංච උපාදානස්කන්ධ ලෝකයේ නැතිවීමට බලන්නේ ඔහොම යි. ඒ කියන්නේ මම සීමා නොකරන ලද මනසේ ම හිටියා නම්, නැත්නම් සතිපට්ඨානයට සිහියෙන් මම රූපය දිහා බැලුවා නම් රූපය දරුවෙක් හැටියට පෙනෙන ගතිය මගේ මනසේ යෙදෙන්නේ නැහැ. එහෙම වුණොත් බාහිර දරුවා කියලා කෙනෙක් මට ඉඳී ද? නැහැ.

දැන් දරුවා කියලානේ සිහිවෙන්නේ. එතකොට මම දන්නවා සතිපට්ඨානයෙන් තොරව රූපය දිහා බලපු ගමන් ම රූපය දරුවා කියන උපාදාන ගතිය ආවා. ඒ උපාදාන ගතිය රූපයට බහාලලා බලපු හින්දා තමයි මට දරුවෙක් ඉන්නවා කියන අදහස තියෙන්නේ. ඒක තමයි භවය.

දැන් මම විදර්ශනා කරන්න ගියොත් මම පෙන්වනවා; සීමා නොකරන ලද මනසෙන් හිටියොත් හෝ උපාදානයට හිත විදිහට ඇහැ උපද්දන්න එපා, රූපය උපද්දන්න එපා කියන උපදේශයට අනුව සතිපට්ඨානයට අනුව ඒ රූපය දිහා බැලුවා නම් මගේ මනසේ මේ 'මගේ දරුවානේ' කියන තණ්හා උපාදාන ගතිය යෙදෙයි ද? යෙදෙන්නේ නැහැ.

එහෙනම් මට ඒ රූපය දරුවා කියන නිමිත්ත හිටී ද? නැහැ. එහෙනම් මට බාහිර දරුවෙක් ඇති බවට සිහි කරන්න පුළුවන් ද කියලා පෙන්වනවා අනික් පැත්තට. ඒකයි අවිද්‍යාව නොවුණේ නම්, කර්මය නොවුණේ නම්, තණ්හාව නොවුණේ නම්, ආහාර නොවුණේ නම් මෙබඳු නිමිත්තක් නැහැ කියන එක කියන්නේ. අපිට කෙනෙක්, පුද්ගලයෙක්, ඕනෑ ම

දෙයක් සිහිවෙන කොට ඒක හැදුණු හැටි පෙන්නනවා, *"සමුදයධම්මානුපස්සී වා"*. නැතිවෙන හැටි හෝ පෙන්නනවා, *"වයධම්මානුපස්සී වා"*.

අපිට පාරවල් ඇති බවට හිතට මැවිලා පේනවානේ. අපිට හිතෙන්නේ පාර තියෙන හින්දා ම යි පාරවල් ඇති බවට හිතට මැවිලා පේන්නේ කියලා. නමුත් තමන් දන්නවා ඒ තමයි භවාස්‍රව කියලා. මෙතනින් ලබුනෝරුව ගමට ගියා. එතනින් මරදන්කඩවලට ගියා කියලා පාරවල් ගැන හිතෙන් කියන්න පුළුවන් නේද අපිට. අපි හිතන්නේ එතන තියෙන දේ ම යි අපි දන්නේ කියලනේ. නමුත් එහෙම නැහැ, ඕක තමයි භවාස්‍රව කියලා කියන්නේ.

එතකොට දන්නවා අවිද්‍යාවෙන් කර්මයෙන් මොකද කරන්නේ? රූපයක් තනි කරලා අල්ලගන්නවා. එහෙම අල්ලගන්න කොට ම මේ අහවල් පාරනේ කියලා හිතලා ඒ අදහස පෙනෙන රූපයට තබපු නිසා බාහිර මෙහෙම පාරක් තියෙනවා කියන නිමිත්ත අපේ මනසේ හිටලා තියෙනවා.

මෙතන මහාභූතයන්ගේ උපාදාය රූපයක් වූ වර්ණ සටහනක් නේද තියෙන්නේ කියලා සතිපට්ඨානයෙන් යථාභූතයට හිත තබලා බැලුවොත් සතර මහා ධාතු ඇතුළේ පාරවල් තියෙනවා ද? නෑ. චිත්‍ර ඇතුළේ පාරවල් තියෙනවා ද? නැහැ. ඇස් ඉදිරිපිටට එන්නේ චිත්‍ර. ඒකයි ලෝකය කියන එක විඤ්ඤාණයේ මායාවෙන් හදලා තියෙන්නේ අවිද්‍යාව නිසා. අවිද්‍යාව නැති වුණොත් විඤ්ඤාණය නැමැති මායාකාරයාට රඟපාන්න බැහැ.

කෙනෙක් හෝ බඩුමුට්ටුවක් හෝ වාහනයක් හෝ ද්‍රව්‍ය කාරණාවක් සිහි වුණොත් 'කාමාස්‍රවය' කියලා හඳුනාගන්න. තැනක්, ස්ථානයක් සිහි වුණොත් 'භවාස්‍රවය' කියලා හඳුනා ගන්න. 'සත්ත්වයෙක්', 'පුද්ගලයෙක්', ආත්මයක් සිහි වුණොත් 'දිට්ඨාස්‍රවය' කියලා හඳුනාගන්න. එතකොට 'දරුවා, අන්න අරෙහෙ ඉන්නවා' කියලා සිහි වුණොත් කාමාස්‍රවය යි භවාස්‍රවය යි දෙක ම යෙදිලා තියෙනවා. 'අන්න අරෙහෙ ඉන්නවා' කියලා දුර පෙන්වන එක භවාස්‍රවය. දරුවා ඉන්නවා කියලා පෙන්වන එක කාමාස්‍රවය.

‘ගහ අන්න අතන තියෙනවා’ කියලා සිහි වුණොත් කාමාස්‍රවය යි, භවාස්‍රවය යි දෙක එකට යෙදිලා තියෙනවා. ‘අතන තියෙනවා’ කියලා දුර පෙන්වන එක භවාස්‍රවය. ‘ගහ තියෙනවා’ කියලා පේන එක කාමාස්‍රවය. ඔය වගේ ආස්‍රව දෙක තුනක් එකට යෙදෙන අවස්ථා තියෙනවා. එතකොට ඒ ගාණෙ එයා පෙන්නන්න ඕනේ වර්ණ සටහනක් තුළ, සතර මහා ධාතුව තුළ ගස්කොළන් නැහැ කියන එක.

එතකොට ඔහොම විදර්ශනා කරන කොට මේ ඇත්ත ම වෙලා තියෙන භවය ටික ටික කැපෙනවා. යම් දවසක් එනවා බාහිරයට හිත නැමෙන ගතිය සම්පූර්ණයෙන් ම මැකෙන. කොච්චර හරි තමන්ට මෙහෙම සිහි කරද්දී මේ වටපිටාව තියෙනවා කියලා ඇති බවට හැඟෙන එකත් කැපෙනවා. ඒකත් භවය. ඊළඟට තමන්ට අත පය තියෙනවා කියලා ඇති බවට හැඟෙන එකත් කැපෙනවා. ඒකත් භවය නේ.

මෙහෙම භවය ටික ටික කැපි කැපී එද්දී යම් දවසක් එනවා, යමක් සිහි කරද්දී සිහි කරනවා කියනකම ම පේනවා. තමන්ගේ හිත නැමෙන්නේ නැහැ සිහි කරන දේ බාහිර ඇති බවට කියන තැන දක්වා. ඕගොල්ලෝ භවයට ගිහින් නම් දැන් තියෙන්නේ සමථ විදර්ශනා වඩන කොට භවය කැපි කැපී එන්න ඕන, යමක් සිහි කරද්දී, සිහි කරන දේ සිහි කිරීමෙන් පස්සේ නිරුද්ධයි කියන තැන දක්වා.

හැබැයි හිතලා මනසිකාරයකින් ගන්න බැහැ ඒ මට්ටම. ඒ කිවුවේ, යමක් සිහිවෙන කොට ඒක සිතේ ඇතිවෙන සිතිවිල්ලක් නේ. ඒක සිත තුළ ම ඉපදිලා නැති වෙනවා නේ කියලා ඕගොල්ලෝ හිතුවත් ඒක මනසිකාරයක් විතරයි. පිහිටා හිටින්න බැහැ. ඒ කරන මනසිකාරය අතහැරුණු ගමන් බාහිර ඇති බවට ආයේ සිහි වෙනවා.

හැබැයි කෙලෙස් අඩුවෙලා නීවරණ චිත්තය ගෙවෙන කොට නිරායාසයෙන් ම ***“යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති”*** [70] - යමක් හේතු ප්‍රත්‍යයෙන් හටගත්ත ද, ඒ සියල්ල හේතු නිරෝධයෙන් නිරුද්ධ

[70] https://tipitaka.lk/an-8-1-3-2 - **හත්ථිගාමක උග්ග සූත්‍රය- ගහපති වර්ගය- අට්ඨක නිපාතය- අඞ්ගුත්තර නිකාය 5- 108 පිටුව**

වෙනවා කියන කෙලෙස් රජස් නැති දහම් ඇස පහළ වෙනවා. අන්න ඒ දහම් ඇස පහළවීමත් සමග හිතන දේ හිතීමෙන් පස්සේ නිරුද්ධ වෙනවා කියන එක නුවණින් දකිනවා. එතකොට භවය අතහැරෙනවා.

කාම භවය සම්පූර්ණයෙන් ම අතහැරුණහම අනාගාමී කියලා කියනවා. ඊටපස්සේ රූප, අරූප භූමිවල ගති මතු වෙනවා. ඒකෙත් තියෙනවා ගෙවන්න ටිකක්. ඒ ටිකත් ගෙවලා ආපහු උප්පත්ති වශයෙන් ආපු තැනට එනවා අපි. සීමා නොකරන ලද මනසක් තියෙනවා. එතකොට ආධ්‍යාත්මික පැත්තේ තමන් නැහැ.

අපි ඉපදෙන කොට සතිපට්ඨානයට සිහියෙන් වාසය කළ යුතුයි කියන උත්තරය තිබුණේ නැතිකම යි තිබුණේ. ඒ වගේ ම චතුරාර්ය සත්‍යය නොදන්නාකම කියන සම්මා දිට්ඨිය තිබුණේ නැති අඩුව විතරයි තිබුණේ. දැන් ඒ අඩුව ද පුරවගෙන සීමා නොකරන ලද මනසට එනවා ආපහු. ඒ කිවුවේ, *“දුකෙඛ ඤාණං දුකඛසමුදයෙ ඤාණං දුකඛනිරොධෙ ඤාණං දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං”* කියලා චතුරාර්ය සත්‍යය ගැන නුවණත් එක්ක සීමා නොකරන ලද මනසට එනවා.

පුරාණ කර්මයට හටගත්ත ස්කන්ධ ටිකෙත් ආයුෂ ඉවරවෙන දවසක් එනවා. අලුතින් භවයක් ඇතිවීම කල් ඇතුව ම නතර කරලා තියෙනවා. ඒ නිසා ඒ ධීරයන් වහන්සේ පහනක් නිවෙනවා වගේ නිවිලා යනවා. ඒක තමයි රහතන් වහන්සේගේ අනුපාදිසේස පරිනිර්වාණය.

ඇහැ උපදින්නේ, රූපය උපදින්නේ නැති විදියට හැමදාම හිත හිතා සංවර වෙන්න ඕනේ නැහැ. ඇහැ නූපදින ස්වභාවයට, රූපය නූපදින ස්වභාවයට පත්වෙන දවසක් එනවා. ඕගොල්ලොන්ට ආස්‍රව ටික ගෙවන තැන දක්වා විතරයි කටයුතු කරන්න තියෙන්නේ. ආස්‍රව ක්ෂය කරපු ගමන් උපාදානයට හිත විදියට ඇහැ උපදින එක රූපය උපදින එක නතර ම වෙනවා.

එතකොට තණ්හාව කියන එක හිස සුන් තල්කඳක් වගේ කළා වෙනවා. තණ්හාව කියන එක මතු නූපදින ස්වභාවයට පත් වුණා වෙනවා.

තණ්හාවට ඇති වෙන්න පොළොවවත් නැති වෙනවා. ඒ හින්දා කියනවා සෝපාදිසේස නිබ්බාන / රහත් වුණා කියලා.

ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා *"දුක්ඛෙ ඤාණං"* (දුක ගැන නුවණක් තියෙනවා) කියන කොට ඇහැ දුකයි, රූපය දුකයි, කන දුකයි, ශබ්දය දුකයි ආදී ලෙස ආයතන දොළහ දුක ලෙස දකින්නේ. සතිපට්ඨානයෙන් තොරව ඇහෙන් රූපයක් බැලුවොත් ඇයි ඒකට දුකයි කියන්නේ? එයා දුක්ඛ සමුදය දන්න නිසා. සතිපට්ඨානයෙන් තොරව ඇහෙන් රූපයක් බැලුවොත් තණ්හාව උපදින එක පවතින එක නවත්වන්න බැහැ ම යි.

රූපය දිහා බැලුව ගමන් 'මගේ දරුවනේ' කියන තැනකින් හෝ, 'වටිනවනේ' කියන තැනකින් හෝ තණ්හාව නිසා උපාදානය හිතේ යෙදෙනවා ම යි. උපාදානය වුණොත් භවය වෙනවා ම යි. රූපය දකින කොට, 'මගේ දරුවනේ' කියන ගතිය තමන්ගේ මනසේ පහළ වුණේ කියන එක කවදාවත් පේන්නේ නැහැ අශ්‍රැතවත් පෘථග්ජනයට. ඒ කෙලේසය ඒච්චරට ගැඹුරුයි.

ඒ උපාදාන ගතියෙන් ගිහිල්ලා සතර මහා ධාතු රූප මිටිය වඩාගෙනත් ඉවරයි 'මගේ දරුවානේ' කියලා. ඒකයි *"උපාදානපච්චයා භවෝ"*- උපාදාන වුණොත් භවය වෙනවා ම යි. *'භව පච්චයා ජාති'* - භවය වුණොත් ඉපදෙන එක නවත්වන්න බැහැ ම යි ප්‍රතිසන්ධි වශයෙනුත්, දැනුත්. පුද්ගලභාවයේ ඉපදීම නිසා දැනුත් දුක් විඳින්න වෙනවා. දැනුත් දරුවා උපන්නොත්; දරුවා ලෙඩවීම නිසා, මැරීම නිසා දුක් විඳින්න වෙනවා. මතු ප්‍රතිසන්ධියටත් යන්න වෙනවා කියලා එයා දන්නවා.

ඒ හින්දා ඇහැට, රූපයට, කනට, ශබ්දයට ආදී දොළොස් ආයතනයට තණ්හාව නැති වුණොත් උපාදාන වෙන්න තැනක් නැහැ. උපාදාන නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ජාති ජරා මරණ ආදී සියළු දුක නැති වෙනවා. ඒ නිසා තණ්හාව ඇතිවෙන විදියට ඇහැ, රූප, කන, ශබ්ද ආදී ආයතන දොළහ උපද්දවන්නේ නැතුව සිටිය යුතුයි කියන එකයි එයා ප්‍රතිපදාව හැටියට දන්නේ.

ඒ නිසා දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව හැටියට එයා දන්නවා ඇහැට, රූපයට, කනට, ශබ්දයට ආදී දොළොස් ආයතනයට තණ්හාව ඇති නොවෙන විදිහට සතිපට්ඨානයෙන් වාසය කළ යුතුයි කියලා. යමක් දිහා බලන කොට බැලිය යුත්තේ රූපය දිහා විතරක් හිත තියලා නෙවෙයි කියලා දන්නවා. මොකද, එහෙම කරලා බේරෙන්න බැහැ.

එහෙනම් බලන්න ඕන රූපය විතරක් අහුවෙන විදිහට හිත තියලා නෙමෙයි කියන එක දන්නවා. මොකද එහෙම වුණොත් ජරා මරණ දුකෙන් බේරෙන්න බැහැ කියලා දන්නවා. මට රූප පැත්තේ හම්බවෙන්න බැහැ ස්ත්‍රියක්, පුරුෂයෙක්, මහල්ලෙක්, ළමයෙක්, වැඩිහිටියෙක්. එහෙම හම්බවෙන්නේ රූපයට හිත තැබුවොතින් විතරයි. බේරෙන්න එක ම ක්‍රමයයි තියෙන්නේ. යමක් දිහා බලන්න ඕනේ නම් සතිපට්ඨානය තුළ වාසය කරමින් ම බලනවා.

රූපය දැනට වඩාගන්න ඕන නම් ධාතු මාත්‍රයක් විසින් තව ධාතු මාත්‍රයක් ඔසවනවා නේද කියන සිහියකින් නුවණකින් උපාය කරන්න වෙනවා. එහෙම නැත්නම් කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූප මිටියක් දිහා බලන කොට 'දරුවා' කියන අදහස මගේ මනසේ යෙදෙනවා නේද. එතකොට ඒ කෙලේසය රූපයට තබලා මේ රූප මිටිය මම ඔසවලා ගන්නවා නේද කියන තැනකින් හෝ පෙන්නනවා.

නමුත් ආස්‍රව බලවත් කියන්නේ ඔය ඇත්ත දැනගත්තට කනබොන ආහාරයෙන් හැදුණු රූපය 'දරුවා' කියලා ඇසුරු කරපු හුරුව තියෙනවා බලවත්ව. ඒ හුරුව ගෙවලා දාන්න ඕනේ. සිහිවෙන ගානේ පෙන්නන්න ඕන, 'එහෙම දරුවා කියලා කෙනෙක් හිටියට නෙමෙයි ඇත්තට ම වුණේ මේකයි' කියලා පංච උපාදානස්කන්ධයේ හටගැනීම හා වැය වීම පෙන්වන්න ඕනේ.

මොකද, දැන් අපි ඔය ඇත්ත නොදන්නා කාලේ 'රූපය දරුවා' කියලා ඇසුරු කරලා අපිට දැන් හුරුවක් තියෙනවා නැහැ, බැහැ කියන්න බැරි විදියට. මේ උදේ ළමයාගේ මූණත් ඉඹලා, ඔලුවත් අතගාලා තමයි මං අද සිල් සමාදන් වෙන්න ආවේ කියන තරමට අපිට හුරුයි.

එතකොට දැන් අපි ඇත්ත ම ඇත්ත පෙන්නන්න ඕනේ වෙච්ච සිද්ධිය මෙන්න මේකයි කියලා පංච උපාදානස්කන්ධයේ උදය වැය. රූපයට හිත තියන්න එපා කිවුවේ ඒකයි. රූපයට විතරක් හිත තිබ්බ ගමන් ම 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්', 'වටිනවා' කියන උපාදාන ගතිය මනසේ යෙදෙනවා ම යි. එතනින් නතර වෙන්නේ නැහැ. ඒ මනසේ යෙදිච්ච උපාදාන ගතිය සතර මහා ධාතු රූපය පැත්තට තබනවා ම යි. 'දරුවා ඔසවලා ගත්තා' කියන තැනකින් තමයි අන්තිමට නතර වෙන්නේ.

ඒකයි ඇහැ දුකයි, රූපය දුකයි කියලා කියන්නේ. ඇහෙන් රූපය බලපු ගමන් ම 'දරුවා' කියන තැනකින් තමයි නතර වෙන්නේ. ඊටපස්සේ දරුවා ලෙඩ වෙලා, මැරිලා එන දුක්, ප්‍රිය විප්‍රයෝග දුක්, අප්‍රිය සම්ප්‍රයෝග දුක් කියන තැන ඉඳලා දැනුත් දුක් විඳලා ඊළඟට සසර නැවත ප්‍රතිසන්ධිය නිසා විඳින්න සිද්ධ වෙන සතර අපා ආදී දුක් ඔක්කොම ටික තියෙනවා.

සතර සතිපට්ඨානය තුළ අඛණ්ඩව වාසය කිරීම තමයි බේරෙන්න තියෙන එක ම එක උපාය. සතර සතිපට්ඨානය තුළ ම වාසය කිරීම අමාරු 'රූපය දරුවා' කියලා මෙච්චර කල් ඇසුරු කරපු හුරුව ගෙවන තැනට විතරයි. දැන් තියෙන්නේ පරණ ඇසුරු කරපු හුරුව (ආස්‍රව) ගෙවන එක විතරයි.

ආස්‍රව ක්ෂය වුණාට පස්සේ එයාට කරන්න දෙයක් නැහැ. එතකොට එයාට පේන්නේ නිවැරැදි විදිහට ම යි. උපාදානයට හිත විදිහට ඇහැ, රූප ආදී දොළොස් ආයතන මට්ටම උපදින්නේ ම නැහැ. රහතන් වහන්සේ නමක් ජීවත් වෙන්නේ ම යථාභූත ඥානයෙන්.

~ පංච උපාදානස්කන්ධය දැකිය යුතු ආකාර ~

ඒ නිසා **පංච උපාදානස්කන්ධය අනිත්‍ය දෙයක්, දුක් දෙයක්, රෝගයක්, හුලක්, ගඩක්, වධකයෙක් හැටියට යෝනිසෝ මනසිකාරය කරන්න**

ඕනේ.[71] හතුරෙක් හතුරෙකුට කරන හානියට වඩා හානියක් උපද්දවන ලද ඇහැ, උපද්දවන ලද රූපය කරනවා මට. හතුරෙක් මාව එක්කො මරයි නැත්නම් මරණ හා සමාන දුකකට පත් කරයි. ඔව්වරයි හතුරෙකුට උපරිම කරන්න පුළුවන් මට.

නමුත් ඇස් දල්වලා රූපයක් දිහා බැලුව පමණකින් ම මට මේ ජීවිතයේ දී ම ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස් දීලා කල්ප ගණාන් පැහෙන අපායටත් ගෙනයනවා. හතුරට බැහැ කවදාවත් මාව අපායට දාන්න. උපරිම මේ ජීවිතයේ මරන්න පුළුවන්, එච්චරයි.

හැබැයි රූපයට පුළුවන් මාව අපායට දාන්න. ඒ වගේ ම පංච උපාදානස්කන්ධය මහා විෂඝෝර සර්පයෙක්ට වඩා විසයි කියන එක පෙන්නනවා. විෂඝෝර සර්පයෝ ඇතිවෙලා තියෙන්නෙත් පංච උපාදානස්කන්ධයකට තණ්හා කරලා. පංච උපාදානස්කන්ධය දිහා බලන්න හතළිස් ආකාරයක් තියෙනවා.

"අනිච්චතෝ දුක්ඛතෝ රොගතෝ ගණ්ඩතෝ සල්ලතෝ අඝතෝ ආබාධතෝ පරතෝ පලොකතෝ ඊතිතෝ උපද්දවතෝ භයතෝ උපසඝගතෝ චලතෝ පභඞ්ගුතෝ අද්ධුවතෝ අතාණතෝ අලෙණතෝ අසරණතෝ රිත්තතෝ තුච්ඡතෝ සුඤ්ඤතෝ අනත්තතෝ ආදීනවතෝ විපරිණාමධම්මතෝ අසාරකතෝ අඝමූලතෝ වධකතෝ විභවතෝ සාසවතෝ සඞ්ඛතතෝ මාරාමිසතෝ ජාතිධම්මතෝ ජරාධම්මතෝ ව්‍යාධිධම්මතෝ මරණධම්මතෝ සොකධම්මතෝ පරිදෙවධම්මතෝ උපායාසධම්මතෝ සඞ්කිලෙසිකධම්මතෝ" [72]

අනිත්‍ය දෙයක්, දුක් දෙයක්, රෝගයක්, ගඩක්, හුලක්, පාපයක් වැනි, ආබාධයක්, අනුන්ගේ දෙයක්, විනාශවන දෙයක්, ව්‍යසනයක්, උපද්‍රවයක්, භය විය යුතු දෙයක්, දෝෂයක්, සැලෙන දෙයක්, බිඳෙන සුළු දෙයක්, අස්ථිර දෙයක්, පිහිටක් නැති දෙයක්, ආරක්ෂා ස්ථානයක් නොවේ, අසරණ දෙයක්, හිස් දෙයක්, පහත් දෙයක්, සත්ත්ව පුද්ගලභාවයෙන් ශූන්‍ය දෙයක්, අනාත්ම

---

[71] https://tipitaka.lk/sn-3-1-3-2-11/sinh - **සුතවන්ත සූත්‍රය**- ධම්මකථික වර්ගය- බන්ධ සංයුත්තය- සංයුක්ත නිකාය **3**- **297** පිටුව

[72] https://tipitaka.lk/kn-ps-3-9 - **විපස්සනා කථා**- ප්‍රඥා වර්ගය- පරිසම්භිදාමාර්ගය- බුද්දක නිකාය- **228** පිටුව

දෙයක්, ආදීනවයක්, පෙරළෙන ස්වභාව ඇති දෙයක්, හරයක් රහිත දෙයක්, පාපයට මූලයක්, වධකයෙක්, එක දිගට පැවැත්මක් නැති දෙයක්, ආස්‍රව සහිත දෙයක්, ප්‍රත්‍ය සමවායෙන් සැකසුණු දෙයක්, මාරයාට අයිති දෙයක්, ඉපදීම ස්වභාව කොට ඇති දෙයක්, දිරන ස්වභාව ඇති දෙයක්, මරණය ස්වභාව කොට ඇති දෙයක්, ශෝක කරවන ස්වභාව කොට ඇති දෙයක්, හඬවන ස්වභාව කොට ඇති දෙයක්, දැඩි වෙහෙස ඇති කරවන දෙයක්, කෙලෙසෙන ස්වභාව කොට ඇති දෙයක් යනාදී විදියට බලන්න කියනවා පංච උපාදානස්කන්ධය දිහා.

ඇහැ දිහා, ඇහැට පේන රූපය දිහා වධකයෙක්, හතුරෙක්, රෝගයක්, හුලක්, ගඩක් ආදී වශයෙන් දකින්න කියනවා. ඇයි ඒ? කරන්න තියෙන උපරිම හතුරුකම කරනවා පංච උපාදානස්කන්ධය. චතුරාර්ය සත්‍යය විග්‍රහයේ දී, *"පංචුපාදානක්ඛන්ධා දුක්ඛා"* කියන මාතෘකාව ඉස්සෙල්ලාම තැබුවේ ඒකයි.

මොකද, දුක්ඛ සමුදය සත්‍යයෙන් පෙන්නනවා ඇහැට, රූපයට තණ්හාව ඇති වෙනවා. තණ්හාව නිසා උපාදානය ඇති වෙනවා. උපාදානය නිසා භවය (ලෝකය) හැදෙනවා. එහෙම වුණා ම ලෝකය ඇත්ත ම වෙනවා. ආයේ හොයන්නවත් බැහැ ස්කන්ධ ටිකකට කෙලෙස් ටිකක් එකතු වෙලා පංච උපාදානස්කන්ධ ලෝකය හැදිලා තියෙන්නේ කියන එක.

ඒ භවය හැදෙන්නේ නිකන් නෙවෙයි; යුතුකම් කියලා, වගකීම් කියලා දාලා යන්න බැරි බැඳීම් සමුදායක් එක්ක. ඒකයි ප්‍රශ්නය. මේ බැඳීම්/ සංයෝජන කියන එකේ බලවත්කම කියන්නේ අපිට හිතන්නවත් ඉඩ දෙන්නේ නැහැ ඒවා සංයෝජන කියලා. ලෝකය හැදුණාහම ඕඝ, යෝග, නීවරණ, ග්‍රන්ථ කියලා ගති ටිකක් යෙදෙනවා. භවය (ලෝකය) හැදුණාම තියෙන දෝෂ ඕවා. ඉතින් ඒ නිසා ලෝකයෙන් මිදෙනවා කියන එක ලේසි නැහැ.

හරියට පෙන්නන්නේ **බිලිය ගිලපු මාලුවා වගේ කියලා.**[73] ගිලගන්න පහසුයි. හැබැයි ඒක වමාරගන්න ගියොත් බඩ බොකුත් එක්කම තමයි

[73] https://tipitaka.lk/sn-4-1-18-3/sinh - **බාලිසිකෝපම සූත්‍රය- සමුද්ද වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 315 පිටුව**

එන්නේ. ඒ වගේ තමයි භවය හදාගන්න ලේසියි. ඒක ගලවගන්නවා කියන එක ලේසි නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "මහණෙනි මේ කාමයේ තියෙන භයානකකම තමයි කාමනීය බව/ සිත අලවන ගතිය" කියලා.

භිස ජාතකයේ [74] පෙන්නනවා, "ඔබේ නෙලුම් අල කොටස හොරා කෑවා නම් සුවච කීකරු මම කියන දේ අහන පුත්තු මට බොහෝ ලැබෙන්න ඕන. රන් රිදී මුතු මැණික්වලින් පිරුණු මාළිගාවන් මට ලැබෙන්න ඕන කියලා". එතකොට ශක්‍රයා අහනවා, මුළු ලෝකයක් ම ප්‍රාර්ථනා කරන දේ ඇයි ඔබලා සාපයක් කොට කියන්නේ කියලා.

තමන් කියන දේ අහන සුවච කීකරු දරුවෝ බොහෝ සිටියොත්, 'මගේ දරුවෝ මට මෙච්චර කීකරුයි සුවචයි' කියන එකෙන් එයාගේ හිත ඒවායේ බැඳෙනවා, ඇලෙනවා. ඒ නිසා එයාට කල්ප ගාණක් ගියත් සසර දුකෙන් මිදෙන්න බැරි වෙනවා. ඊට වඩා දරුණු විසක් වෙන නැහැ කියනවා.

ඊටපස්සේ කියනවා; රන්, රිදී. මිල මුදල් ආදී ධන ධාන්‍ය මහා ගොඩක් ලැබුණා ම ඒ හේතුවෙන් එයා ගොඩක් ඒවායේ ඇලෙනවා, බැඳෙනවා. ඒ හේතුවෙන් එයාට කල්ප ගාණක් ගියත් සසර දුකෙන් මිදෙන්න බැරි වෙනවා. ඊට වඩා දරුණු සාපයක් තව නැහැ කියලා කියනවා.

අපි මේ දකින දේට වඩා ආර්ය දර්ශනය වෙනස්. බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා දකින්නේ බැඳීම් තරම් සාපයක් තව නැහැ කියලා. මොකද, ඒ බැඳීම් නිසා අපි ජරා මරණයෙන් මිදෙන්නෙත් නැහැ, ඒ අය ජරා මරණයෙන් මිදෙන්නෙත් නැහැ.

ඒ අයත් මේ වගේ ම පංච උපාදානස්කන්ධ දුකක බැඳිලා ඉන්නේ. ඒ කියන්නේ ගිනිගෙන දැවෙන අපාය සංඛ්‍යාත ලෝකෙන් මිදෙන්නේ නැත්තේ. මේ සංයෝජන/ බැඳුම් නිසා කල්ප ගණන් පැහෙන නිරයෙන් මිදෙන්න දෙන්නේ නැත්තේ.

---

74 https://tipitaka.lk/kn-jat-14-5/sinh - **භිස ජාතකය - පකිණ්ණක නිපාතය- ජාතකපාළි- බුද්දක නිකාය- 495 පිටුව**

අපිට පේන්නේ ස්වාමියාගෙන් වෙන්වෙලා, බිරිඳගෙන් වෙන්වෙලා, දරුවන්ගෙන් වෙන්වෙලා, ගෙදරින් වෙන්වෙලා යන්න අපහසුයි වගේ තැනකින් නේ. නමුත් ඔය දෙන්නේ නැත්තේ ඔය තැන්වලින් මිදෙන්න නෙමෙයි. ඇත්තට ම ගත්තොත් අපායෙන් තමයි මිදෙන්න දෙන්නේ නැත්තේ.

ඉතින් මේ දුක් සහගත ලෝකයෙන් මිදෙන්න බැහැ; ඇහැ උපද්දලා, රූපය උපද්දලා. ඒ තාක් කල් සසරට කොටු වෙනවා. එක උපායයි තියෙන්නේ. ඇහැ නූපද්දවලා, රූපය නූපද්දවලා ඉඳලා තමයි බේරෙන්න පුළුවන්. ඊගාව දේ තමයි අපි උපාදානයට හිත විදිහට ඇහැ උපද්දවලා, රූපය උපද්දවලා ඇති කර ගත්ත දෝශය ටික ටික ගෙවාගන්න ඕන. ඔය ටික තමයි මට කියන්න තියෙන්නේ.

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.02.14 දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසන වාසී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සිදු කළ ධර්ම දේශනාවක් ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

චතුරාර්ය සත්‍යය විග්‍රහය කෙනෙකුට දුක්ඛ සත්‍යයෙන් පටන් අරගෙන දුකට හේතුව, දුකේ නැතිවීම, දුක නැති කරන මාර්ගය කියන්නත් පුළුවන්. තණ්හාව තමයි සමුදය සත්‍යය කියලා කියන්නේ. ඒ හේතුව නිසා හටගන්නේ දුක. තණ්හාව නැති වුණොත් දුක නැති වෙනවා කියලා චතුරාර්ය සත්‍යය විග්‍රහය සමුදය සත්‍යයෙන් පටන් ගන්නත් පුළුවන්.

කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා කියන මේ තුන් තණ්හාවගේ ඉතුරු නැතිව නැති කිරීමෙන් සියලු දුක් නැති වෙනවා කියලා චතුරාර්ය සත්‍යය විග්‍රහය තණ්හා නිරෝධයෙන් (නිරෝධ සත්‍යයෙන්) පටන් අරගන්නත් පුළුවන්. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කොට දුකේ නිරෝධය සාක්ෂාත් වෙනවා. ඒ දුකට හේතුව වූ කෙලෙසුන්ගෙන් මිදීම නිසා කියලා චතුරාර්ය සත්‍යය විග්‍රහය මාර්ගයේ ඉඳලා විස්තර කරන්නත් පුළුවන්.

මේ වගේ ඕනෑ ම තැනකින් පටන් අරන් චතුරාර්ය සත්‍යය විග්‍රහ කරන්න පුළුවන්. ගාථාවක් හෝ සූත්‍රයක් හෝ ගත්තහම බොහොම කලාතුරකින් තමයි චතුරාර්ය සත්‍යය ම තියෙන්නේ. ගොඩක් සූත්‍රවල, ගාථාවල එක සත්‍යයක් තමයි තියෙන්නේ. ඒ සත්‍යය අරගෙන අනෙක් සත්‍යය තුන ආධ්‍යාහාරයෙන් දාලා දේශනා කරන්න ඕනේ.

යම්කිසි කෙනෙක් දුක පිරිසිඳ දැක්කොත්, එයා සමුදය දුරු කරපු කෙනෙක්, නිරෝධය සාක්ෂාත් කළ කෙනෙක්, මාර්ගය වඩපු කෙනෙක් යන ගණයට යනවා. පංච උපාදානස්කන්ධය දුකක් කියන එක පිරිසිඳ දකින කොට එයා හොඳට දැකලා තියෙනවා පංච උපාදානස්කන්ධය දුකක් කියලා

කියන්නේ පංච උපාදානස්කන්ධය තිබුණොත් තණ්හාව ඇති වෙලා උපාදාන වෙලා භවය හැදිලා ජාති ජරා මරණ ආදී දුක එන හින්දා ම යි කියලා.

පංච උපාදානස්කන්ධය නැති වුණොත් තණ්හා උපාදාන වෙන්නේ නැහැ. එහෙම වුණොත් ජරා මරණ දුක නැති වෙනවා කියන එක දැකලා තියෙනවා. එතකොට ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩලා තියෙනවා කියන ගණයට යනවා.

~ තණ්හාව දුක්ඛ සත්‍යය භජනය කරන පරියායක් ~

"තණ්හඤ්ච පජානාති. තණ්හාසමුදයඤ්ච පජානාති. තණ්හානිරොධඤ්ච පජානාති. තණ්හානිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති. එතතාවතාපි බො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨි හොති. උජුගතාසස දිට්ඨි. ධම්මෙ අවෙච්චපපසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති." [75] - යමෙක් තණ්හාව දනී ද, තණ්හාවගේ ඇතිවීම දනී නම්, තණ්හාවගේ නැතිවීම දනී නම්, තණ්හාව නැති කරන මඟ දනී නම් එපමණකින් සම්මාදිට්ඨි වේ. ධර්මයේ ගුණ දැන පැහැදුන, නොසෙල්වෙන ශ්‍රද්ධාවෙන් යුක්ත, මේ සද්ධර්මයට ආව කෙනෙක් කියලා කියන්න සුදුසු යි.

"තණ්හඤ්ච පජානාති" කියන කොට හොඳට දන්නවා තණ්හාව කියන්නේ මොකක් ද කියලා? රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා. එතකොට දන්නවා, තණ්හාව තිබුණොත් උපාදාන වෙනවා ම යි. උපාදාන වුණොත් භවය වෙනවා ම යි. භවය වුණොත් ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව දුක් දොම්නස් ඇතිවෙනවා ම යි. තණ්හාව කියන්නේ දුකක් ම නේද කියලා ටක්ගාලා ගත්ත හැකි එයාට.

එතකොට **තණ්හාව දුක්ඛ සත්‍යය කොට ගන්නවා ඒ පරියායේ දී.**[76] දුක්ඛ සත්‍යය ප්‍රකට කරන්න ඕනේ තැනකින් පුළුවන්. ඇයි තණ්හාව ඒ

---

[75] https://tipitaka.lk/mn-1-1-9 - **සම්මාදිට්ඨි සූත්‍රය- මූලපරියාය වර්ගය- මජ්ඣිම නිකාය 1- 122 පිටුව**

[76] https://tipitaka.lk/kn-ps-2-2/sinh - **සත්‍ය කථා- යුගනද්ධ වර්ගය- පටිසම්භිදාමාර්ගය- ඛුද්දක නිකාය- 37 පිටුව**

වෙලාවේ දී දුක්ඛ සත්‍යය වෙන්නේ? තණ්හාව තිබුණොත් උපාදානය වෙනවා. උපාදාන වුණොත් භවය වෙනවා. භවය වුණොත් ජාතිය වෙනවා. ජාතිය වුණොත් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් එන නිසා තණ්හාවට කියන්න වෙනවා දුකයි කියලා.

වේදනාව නිසයි තණ්හාව ඇති වෙන්නේ. වේදනාව නැති වුණොත් තණ්හාව නැති වෙනවා. තණ්හාව නැති කරන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා ගත්තහම ඒ පරියායේ දී දුක්ඛ සත්‍යය නියෝජනය වෙන්නේ තණ්හාවෙන්. සම්මාදිට්ඨි සුත්‍රයේ පෙන්වන විදිහට පටිච්චසමුප්පාදයේ ඔක්කොම අංග ටිකෙන් එන්න පුළුවන් නේ චතුරාර්ය සත්‍යයට.

කෙනෙක් දුක දැකලා, දුකේ ඇතිවීම දැකලා, දුකේ නැතිවීම දැකලා, දුක නැති කරන මාර්ගය කියලා ආර්ය අෂ්ටාංගික මාර්ගයට ආවා වගේ; මෙයා තණ්හාව දැකලා, තණ්හාවගේ ඇතිවීම දැකලා, තණ්හාවගේ නැතිවීම දැකලා, තණ්හාව නැති කරන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය යි කියලා ආර්ය අෂ්ටාංගික මාර්ගයට ආවා.

එතන දී තණ්හාව දැක්කා දුක දක්වා ම. තණ්හාව තියෙනකන් ඉන්න නම් හම්බ වෙන්නේ නැහැ මට නිදහසේ කියලා දකිනවා. තණ්හාව තියෙනවා කියලා කියන්නේ ජරා, මරණ, ශෝක, පරිදේව සියලු දුක් ගෙනත් දෙන ධර්මයක් හැටියට යි එයා දකින්නේ.

පටිච්චසමුප්පාදයේ හැම අංගයක් ම එහෙමයි. මැක්කාගේ කතාව වගේ අන්තිමට පටිච්චසමුප්පාදයට ඇවිල්ලා තමයි විස්තර කරන්නේ. කොතැනකින් ගත්තත් ආයේ එන්න වෙනවා පටිච්චසමුප්පාදයට. මේ වගේ පටිච්චසමුප්පාදයේ ඕනෑ ම අංගයක් අරගෙන මාර්ගයට එන්න පුළුවන්. මාර්ගයේ දී දුක දැකලා ආපු කෙනත්, තණ්හාව දැකලා ආපු කෙනත් කරන්න ඕනේ එක ම වැඩේ ආස්‍රව ක්ෂය කිරීම.

~ අටළොස් මූලපද ~

සාසනපට්ඨානය[77] කියලා කියන්නේ මේ සාසනය පිහිටලා තියෙන්නේ පද දහඅටක. ඒවාට කියනවා **'අටළොස් මූලපද'**[78] කියලා. සමුදය සත්‍යය භජනයවන වචන නවය යි. මාර්ග සත්‍යය භජනයවන වචන නවය යි. සමුදය සත්‍යයේ ඵලය දුක. මාර්ග සත්‍යයේ ඵලය නිවන. දුක ඇතිවෙන හේතුව තිබ්බොත් දුක ලැබෙනවා. මාර්ග සත්‍යය තිබ්බොත් නිවන ලැබෙනවා.

- **දුක්ඛ සමුදය සත්‍යය භජනය කරන වචන නවය තමයි;**

අවිජ්ජා, භව තණ්හා, ලෝභ, ද්වේශ, මෝහ, නිත්‍ය, සැප, ආත්ම, සුභ.

ඔය කෙලෙස් බෙදනවා ත්‍රිකට තුනකට.[79]

- ✓ මූලක්ලේශ - *අවිජ්ජා, භව තණ්හා*
- ✓ අකුසල මුල් - *ලෝභ, ද්වේශ, මෝහ*
- ✓ විපල්ලාස - *නිත්‍ය, සැප, ආත්ම, සුභ*

නිත්‍ය යි, සැප යි, ආත්ම යි, සුභ යි කියන විපල්ලාස ඇති වෙලා තියෙන්නේ ලෝභ, ද්වේශ, මෝහ කියන අකුසල මුල් නිසා යි. ලෝභ, ද්වේශ, මෝහ කියන අකුසල මුල් ඇතිවෙලා තියෙන්නේ අවිද්‍යා, භව තණ්හා කියන මූලක්ලේශ දෙක නිසා.

පටිච්චසමුප්පාද සිද්ධියේ *"අවිජ්ජාපච්චයා"* කියන තැන අවිද්‍යාව හා භව තණ්හා කියන දෙක ම තියෙනවා. 'සංඛාර' කියන එකට තමයි ලෝභ, ද්වේශ, මෝහ කියන අකුසල මුල් අයිති වෙන්නේ. ඒ හින්දා නිත්‍ය යි, සැප යි, ආත්ම යි, සුභ යි හැටියට හිතන එක තමයි 'උපාදාන' කියන තැනින් හම්බ වෙන්නේ. අපිට ලෝකය හම්බ වෙන්නේ එතකොට විපල්ලාස මට්ටමෙන්. ඔය පද නවයේ ඵලය තමයි 'ලෝකය', 'දුක'.

---

[77] https://tipitaka.lk/kn-nett-3-4/sinh - **ශාසනප්‍රස්ථානය- පටිනිද්දේසවාරය- නෙත්තිප්‍රකරණය- බුද්දක නිකාය- 183 පිටුව**

[78] https://tipitaka.lk/kn-petk-1/sinh - **ප්‍රථම භූමි – අරියසච්චප්පකාසනා- පෙටකෝපදේශ- බුද්දක නිකාය- 7 පිටුව**

[79] https://tipitaka.lk/kn-petk-6/sinh - **ෂෂ්ඨ භූමි – සුත්තපථසමුච්චය- පෙටකෝපදේශ- බුද්දක නිකාය- 155 පිටුව**

- **මාර්ග සත්‍යය භජනය කරන වචන නවය තමයි;**

විපස්සනා, සමථ, අලෝභ, අද්වේශ, අමෝහ, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ

විපල්ලාස හතර වෙනුවට සතර සතිපට්ඨානය. අකුසල මුල් වෙනුවට අලෝභ, අද්වේශ, අමෝහ කියන කුසල මූලය. මූලක්ලේශ නැති කරන්න සමථ හා විපස්සනා. සමථ විදර්ශනා වඩන කොට කෙලින් ම අනුසය කියන මට්ටමෙන් ම අතහැරෙනවා කෙලෙස්.

අවිද්‍යාව හා භව තණ්හා කියන අනු සහගත කෙලෙස් දෙක (ක්ලේශ අනුසය) ලෝකයාට හම්බ වෙන්නේ නැහැ. ලෝකයාට හම්බ වෙන්නේ පරියුට්ඨාන මට්ටමෙන්. පරියුට්ඨානය කියන්නේ; රාග සහගත අරමුණු ඇති වෙනවා, ද්වේශ සහගත අරමුණු ඇති වෙනවා, මෝහ සහගත අරමුණු ඇති වෙනවා. එහෙම රාග, ද්වේශ, මෝහ අරමුණු ඇති වුණහම ඒවාට ක්‍රියාත්මක වීම තුළ තමයි නිත්‍ය, සැප, ආත්ම, සුභ කියන විපල්ලාස ඇති වෙන්නේ.

ලෝභ, ද්වේශ, මෝහ සහගත කෙලෙස් ටික ඇති කරන හේතුව (මූල ක්ලේශ) පැත්ත ගැන ලෝකයා නොදන්නා මට්ටමකින් තියෙන්නේ. ඔතනදි අපි පංච උපාදානස්කන්ධයේ උදය වැය බැලුවොත්; අවිද්‍යා, තණ්හා, කර්ම, ආහාර කියන න්‍යායයක් එන්නේ.

අපි උප්පත්ති වශයෙන් ආවේ කෙලෙස් නැති සීමා නොකරන ලද මනසක් තියාගෙන. ***"පකතිපරිසුදධමිදං චිත්තං"*** [80] මහණෙනි, සිතේ ප්‍රකෘතිය ප්‍රභාශ්වර යි. අපි ලොකුවෙන කොට චතුරාර්ය සත්‍යය නොදන්නාකම වූ අවිද්‍යාව තියෙනවා.

~ ත්‍රිවිධ තණ්හාව ~

ඊට පස්සේ තණ්හාව ගත්තහම; කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා කියන තුන් තණ්හාව තියෙනවා.

---

80 https://tipitaka.lk/kn-ps-1-1-18 - **චය්‍යානානාත්ව ඥානය- ඥාන කතා- පටිසම්භිදාමාර්ගය- බුද්දක නිකාය- 154 පිටුව**

කාම තණ්හාව කියන්නේ කාම වස්තු කෙරෙහි තියෙන තණ්හාව. භව තණ්හාව කියන්නේ භවයට ඇති තණ්හාව. විභව තණ්හාව කියන්නේ භවයෙන් මිදීම සඳහා නොයෙක් ව්‍රත සමාදන් වෙනවා වගේ උච්ඡේද දෘෂ්ඨිය අනුව ගිය තණ්හාව[81].

ඔන්න ඔය තුන් ආකාර තණ්හාව කියන එක නැති වුණොත් දුක නැති වෙනවා. ඔය තුන් ආකාර තණ්හාව නිසා තමයි අපි ස්පර්ශ ආයතන නැවත නැවත උපද්දවන්නේ. කාම තණ්හාව කියන්නේ රූප බලන්න, ශබ්ද අහන්න ආදී පංච කාමය පිළිබඳ තියෙන ඕනෑකම, තණ්හාව නිසා තමයි රූප බලන්න යන්නේ, ශබ්ද අහන්න යන්නේ, ස්පර්ශ විඳින්න යන්නේ.

භව තණ්හාව නිසා තමයි; නැන්දලාගේ ගෙදර යනවා, මාමලාගේ ගෙදර යනවා, අරහේ යනවා, මෙහෙ යනවා කියලා යන්නේ. ඒ වගේ ම සසරටත් ඔය භව තණ්හාව තියෙනවා. 'මම දෙවියෙක් වේවා', 'බ්‍රහ්මයෙක් වේවා' කියලා හිතන එකත් භව තණ්හාවට අයිති. ලෝකේ ඇතුළේ සක්මන් කරන්න තියෙන කැමැත්තත් අයිති. භව තණ්හාව කිව්වහම ඒ ඔක්කොම අයිති.

ඌරෙක් වගේ, බල්ලෙක් වගේ, එළුවෙක් වගේ හැසිරුනොත් කියලා මේ ව්‍රතයෙන්, මේ සීලයෙන් මේ මේ විදිහට හිටියහම මට විමුක්තිය ලැබෙනවා කියලා ඒ විදිහට කටයුතු කරනවා වගේ තැන්වලින් උච්ඡේද දිට්ඨිය අනුව යන විභව තණ්හාව කියන එකත් යෙදෙනවා.

ඔන්න ඔය තුන් තණ්හාව නිසා තමයි අපි නැවත නැවත ආයතන ටික උපද්දවන්නේ. කාම වස්තු සිහි කර කර යන කාම තණ්හාව නැති වුණොත්, භවය සිහි කර කර ඒ තුළ හැසිරෙන භව තණ්හාව නැති කළොත්, විභව තණ්හාව නැති කළොත් අපි ප්‍රකෘති මනසේ/ සීමා නොකරන ලද මනසේ ඉන්නවා.

---

81 https://tipitaka.lk/ap-vbh-17-4/sinh - **ත්‍රික ය – බුද්දකවත්ථු විභඞ්ගය- විභඞ්ගප්‍රකරණය- 223 පිටුව**

හැබැයි ප්‍රශ්නයක් තියෙනවා; තණ්හාව නැති වෙන්නේ නිකන් නෙමෙයි. ***"විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා"*** [82] - විසංඛාර ස්වභාවයට ගියා වූ සිතට තණ්හාවගේ ක්ෂය බව තථාගතයන් වහන්සේ, අවබෝධ කළා. විසංඛාර ගත සිත කියන්නේ මොකේට ද? සංඛාර නොවුණු සිතට. සංඛාර වුණු සිත කිව්වේ කර්ම භවයට.

කර්ම භවය සම්පූර්ණයෙන් නැති වෙච්ච දවසට තණ්හාව නැති වෙනවා කියන එක අවබෝධ කර ගත්තා. කාම තණ්හාව නැහැ කියන්නේ; ගෙවල් දොරවල්, දූදරුවෝ කියලා කාම වස්තු හොයන තණ්හාව නැහැ. භව තණ්හාව නැති වෙනවා කියන කොට දෙවියෙක් වෙන්න ඕනේ, බ්‍රහ්මයෙක් වෙන්න ඕනේ, අරහේ යන්න ඕනේ, මෙහෙ යන්න ඕනේ කියන තණ්හාව නැහැ.

අන්තිමට හිස් වෙලා තියෙන්නේ කොතැන ද? භවය ම තමයි. තණ්හා නිරෝධය පැනෙච්චත් අන්තිමට භවය ම තමයි නැති වෙන්නේ. විසංඛාරගත ස්වභාවයට සිත පත්වුණාහම යි තණ්හාව ක්ෂය වෙන්නේ. ඒක තමයි මාර්ගයෙන් කරන්නේ.

කාමාස්‍රවය තියෙනකන් කාම තණ්හාව නැති කරන්න බැහැ, භවාස්‍රවය තියෙනකන් භව තණ්හාව නැති කරන්න බැහැ, අවිජ්ජාස්‍රවය තියෙනකන් විභව තණ්හාව නැති කරන්න බැහැ. ආස්‍රව ක්ෂය කළ රහතන් වහන්සේ විතරයි තණ්හාව සම්පූර්ණයෙන් ම ඉතුරු නැතිව නැති කළා වෙන්නේ.

රහත් වුණා කියලා මොකද වෙලා තියෙන්නේ? ආස්‍රව ක්ෂය වෙලා. ආස්‍රව ක්ෂය වුණාහම මොකද වෙලා තියෙන්නේ? භවය /ලෝකය ඇතුළේ සක්මන් කළ හුරුවයි ඒ ගෙවිලා තියෙන්නේ. එතකොට මොකද වෙලා තියෙන්නේ? විසංඛාරගත ස්වභාවයට සිත පත්වෙලා. සංස්කාර නිමිති මුකුත් නැහැ කියන තැනකට පත්වෙච්ච එකටයි විසංඛාරගත ස්වභාවයට සිත පත් වුණා කියන්නේ.

---

[82] https://tipitaka.lk/kn-dhp-11 - **ජරා වර්ගය- ධම්මපදපාළි- ඛුද්දක නිකාය- 64 පිටුව**

එහෙම නැතුව අම්මා, තාත්තා, දුව, පුතා, නංගී, මල්ලී, ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩකඩම් තියෙනවා කියලා සංස්කාර නිමිති ගොන්නක් පුරවාගෙන ඒවා සිහි කර කර ඉඳලා තණ්හාව නැති කරනවා කියලා එකක් නැහැ.

'මම කිසි දේකට තණ්හා කරන්නේ නැහැ නේ' කියලා කිව්වට මනසින් හොඳට දරුවෝ, ගෙවල්, යානවාහන, ඉඩම් ආදී සංස්කාර නිමිති ගැන සිහි කර කර ඉන්නවා නම් එහෙම සංස්කාර නිමිති සිහි කර කර ඉන්නේ තණ්හාව නිසා ම යි.

එහෙම සංස්කාර නිමිති තියාගෙන නම් ඉන්නේ තණ්හාව නැති කළා වෙන්නේ නැහැ. ආස්‍රව ක්ෂය වෙච්ච මනසකයි තණ්හාව නැති වෙන්නේ. තණ්හාව කියලා කියන්නේ ම ආස්‍රවයන්ගේ ලක්ෂණ. ආස්‍රව ක්ෂයට තව නමක් තමයි තණ්හා නිරෝධය කියලා කියන්නේ.

"යො තසසායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිසසග්ගො මුත්ති අනාලයො" [83] - මේ තුන් ආකාර තණ්හාවගේ ඉතුරු නොකොට නැති කිරීමක් වෙයි නම්, අතහැර දැමීමක් වේ නම්, ගෙවා දැමීමක් වේ නම්, ආලය නොකිරීමක් වේ නම් මේකයි දුකේ නිරෝධය කියලා කියන්නේ.

ප්‍රශ්නයක්:-

ස්වාමීන් වහන්ස, **පංච උපාදානස්කන්ධයට කියනවනේ "සාසවා උපාදානියා"** [84] කියලා. ඒක විස්තර කරන කොට, උපාදානයන්ට හිතයි කියලා ආස්‍රවයන්ට හිතයි නොකියා ආස්‍රව සහිතයි කියලා ගන්නේ ඇයි?

---

[83] https://tipitaka.lk/sn-5-12-2-3 - **බන්ධ සූත්‍රය- ධම්මචක්කප්පවත්තන වර්ගය- සච්ච සංයුක්තය- සංයුත්ත නිකාය 5- 276 පිටුව**

[84] https://tipitaka.lk/sn-3-1-1-5-6 - **බන්ධ සූත්‍රය- අත්තදීප වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 84 පිටුව**

පිළිතුරු:-

කාමාස්‍රව, භවාස්‍රව, අවිද්‍යාස්‍රව, දිට්ඨාස්‍රව කියන ආස්‍රව නිසා ම යි අපි ඇහැ, රූප, කන, ශබ්ද, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම උපද්දන්නේ. එහෙම උපද්දන ආයතන තමයි උපාදානයට හිත. *"සාසවා උපාදානියා"* කියලා ආස්‍රව සහිතයි, උපාදානයට හිතයි කියලා කියන්නේ කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය කියන තුන් භූමිය ම තියෙන්නේ ආස්‍රව ඇතුළේ.

ලෝකෝත්තර චිත්ත චෛතසික (මාර්ග සිත් හතර හා ඵල සිත් හතර) හා නිවන විතරයි අනාස්‍රව.[85] එයිට මෙහා කාම ලෝකේ, රූප ලෝකේ, අරූප ලෝකේ පැවැත්ම තියෙන්නේ ම ආස්‍රව මත. ආස්‍රව සහිත මනසකට ම යි රූපය හම්බ වෙන්නේ. *"ආසවානං ආරම්මණභූතා සාසවා"* - ආස්‍රවයන්ට අරමුණුවන නිසා *'සාසවා'* කියලා කියනවා.

රූපය කියලා යමක් හම්බ වෙනවා නම් හම්බ වෙන්නේ ආස්‍රව සහිත මනසකට. ඇහැ කියලා යමක් හම්බ වෙනවා නම් හම්බ වෙන්නේ ම ආස්‍රව සහිත මනසකට. කන, ශබ්දය, නාසය, ගන්ධය, රස, දිව, කය, ඵොට්ඨබ්බ හම්බ වෙන්නේ ම ආස්‍රව සහිත මනසකට.

ආස්‍රව සහිතකම නිසා ම යි ඕවා උපද්දන්නේ, ඒ උපද්දන ඒවා උපාදානයට හිත ම යි කියන එකක් තමයි *"සාසවා උපාදානියා"* කියන එකෙන් කියන්නේ. ලෝකෝත්තර මට්ටමේ අනාස්‍රව මනසකට; ඇහැ, රූප, කන, ශබ්දය, නාසය, ගන්ධය, රස, දිව, කය, ඵොට්ඨබ්බ ඇති බවට නැහැ. ඒවායේ නිරෝධය ගැන තියෙන නුවණ තියෙන්නේ. මේ 'මම' කියලා පනවන්න ශරීරයක්වත් නැහැ.

ඕවා ගැන වැඩිය හිතන්න ඕනේ නැහැ, ඔය තැනට ඉබේම අපි එනවා ආස්‍රව දුරු කළහම. මොකද, ඒකට හේතුව; මේ ඇහැ, මේ කන, මේ නාසය, මේ දිව, මේ කය කියලා නිමිති නැහැ ඒ මනසට. ඒකයි

---

[85] https://tipitaka.lk/ap-dhs-5-4/sinh - **ආස්‍රවගොච්ඡකය- අට්ඨකථාකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 523 පිටුව**

"විප්පමුත්තස්ස සබ්බධි "[86] - සියලු තැනින් මිදිලා කියලා කියන්නේ. අපිට උඩ, යට, ඉස්සරහ, පිටිපස්ස, දකුණ, උතුර කියලා සදිසාවන් හෝ දසදිසාවන් නිර්මාණය වෙලා තියෙනවා නම් ඒ මේ කයට සාපේක්ෂව නෙමෙයි ද කියලා බලන්න.

කයේ නිමිති නැතිව මේ කයෙන් මිදුනොත් දස දිසාවෙන් ම මිදුණා වෙනවා. එතකොට මනින්න තැනක් නැහැ. කොහොමද මම ඒ දස දිසාවන්ගෙන් මිදෙන්න කයේ නිමිති නැතිකම හදාගන්නේ කියලා ඒ ගැන මහන්සි වෙන්න ඕනේ නැහැ. ආස්‍රව ක්ෂය කර ගන්නකොට, එතකොට ඒ දස දිසාවන්ගෙන් මිදීම ලැබෙනවා ඉබේට ම. එතනට ඉබේ ම අපේ මනස පත්වෙනවා.

අද අපිට අම්මා, තාත්තා, ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම්, සත්ත්වයෝ, පුද්ගලයෝ ගැන අපේ මනසේ මිම්මවල් තියෙනවා නම් ඒ තමයි කාම භවය. ඒ කාම භවය ඇසුරු කරනකම තමයි 'කාමාස්‍රවය' කියන්නේ. පාරවල් ඇති බවට පේනවා නම්, ස්ථාන ඇති බවට පේනවා නම්, ස්ථානවලට දුර පේනවා නම්, මිනිස්සු ඉන්න තැන් කියලා බාහිරයට අපේ මනස නැමිලා පෙනෙන ගතියක් තියෙනවා නම් ඒක තමයි අද අපිට 'භවාස්‍රවය'.

යමක් සිහි කරන කොට බලන්න සිහි කරන ඒ මනස අපිට අහුවෙනවා ද කියලා? ඇත්තට ම වෙන්නේ හිතින් ම සිතුවිල්ලක් සිහි කර ගන්න එකනේ. නමුත් කවදාවත් අපිට අහුවෙන්නේ නැහැ ඒ ඇත්ත. අපේ හිත නැමිලා පවතිනවා බාහිරයට. 'දරුවා', 'ගෙදර' කියලා සිහිපත් වුණාහම බාහිරයට නැමිලා පවතිනවා අන්න අරහේ ඈතක ඉන්නේ හෝ තියෙන්නේ වගේ තැනකින්. ඒක තමයි භවාස්‍රවය. භවය නිරුද්ධ වුණොත් ඔය වගේ නිමිති නැහැ.

එතකොට කට්ටියට හිතෙන්න පුළුවන් අපි ජීවත් වෙන්නේ, අපි යන්නේ එන්නේ කොහොමද එතකොට අපිට මතක නැත්නම් වගේ තැනකින්. මම පොඩිනමට උගන්වමින් හිටියේ හවස. මම කිවුවා. "පුතේ, දැන් ගෙදර

[86] https://tipitaka.lk/kn-dhp-7 - **අරහන්ත වර්ගය- ධම්මපදපාළි- ඛුද්දක නිකාය- 44 පිටුව**

තියෙනවා, ස්කොලේ තියෙනවා, එහෙට මෙහෙට ඔයාට යන්න පුළුවන් නේ. එහෙම යන්න එන්න පුළුවන්කම තියෙන්නේ මතකය/ සංස්කාර නිමිති තියෙන හින්දා නේ. ඕකට තමයි පුතේ 'භවය' කියන්නේ. ඔය මතකය නැති වුණොත් ඔයාට යන්න පුළුවන් ද" කියලා ඇහුවහම? යන්න බැහැ ලු. ඒ පොඩිනමටත් තේරෙනවා යන්න බැහැ කියලා.

~ භව නිරෝධය කළ රහතන් වහන්සේලාගේ හැසිරීම ~

එතකොට රහතන් වහන්සේලා යන්නේ එන්නේ කොහොමද? කොහෙවත් යන්නේ නැතුව එක ම තැන ඉන්නවා ද? අපි කණ්ණාඩියක් පරිහරණය කරනවා වගෙයි රහතන් වහන්සේලා හැසිරෙන්නේ. කණ්ණාඩියක් ගාවට යන්න ඉස්සෙල්ලා අපේ මූණ නැහැ කණ්ණාඩිය ඇතුළේ. අපි දන්නවා, කණ්ණාඩිය ගාවට ගියොත් ඒ වෙලාවට මූණ හදාගෙන බලන්න පුළුවන් කියලා.

ඒ වෙලාවට හදා ගත්තා කියලා පෙනෙන හින්දා බය නැහැ. 'අනේ මූණ, මම උඹට ආදරෙයි අප්පා' කියලා ඕනේ දෙයක් කියන්න. අහකට යන කොට මොකද වෙන්නේ? දන්නවා, කණ්ණාඩිය ඇතුළේ අපේ මූණ නැහැ කියලා. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නැති වෙනවා කියන එක පේනවා.

ඇයි ඒ? කණ්ණාඩිය ගාවට යන්න කලින් අපේ මූණේ ප්‍රතිබිම්බය කණ්ණාඩියේ තිබුණේ නැති නිසා කණ්ණාඩිය ගාවින් අහකට යන කොට ඒ ප්‍රතිබිම්බය ඉතුරු වෙන්නේ නැහැ. ඒක ද කණ්ණාඩිය ගාවට නිකන් යන්න පිස්සුද අපිට. අවශ්‍යතාවයක් වුණොත් විතරයි නේ යන්නේ. හැම වෙලාවේ ම කණ්ණාඩිය තියෙනවා කියලා කණ්ණාඩිය බලන්න යනවා ද අපි.

ඒ වගේ රහතන් වහන්සේ යන්නේ එන්නේ අවශ්‍යතාවයක් වුණොත් විතරයි. පිණ්ඩපාතයේ යන්න වගේ අවශ්‍ය දේකට විතරයි. එතන එතන ධාතු

නානත්වය නිසා අලුතෙන් ම හටගන්නා බව පෙනෙනවා. ආපහු එන කොට ඒක ද ඉතුරු නැතිව නැති වෙනවා කියන එක පේනවා.

මේවා චුට්ටක්වත් ගන්න මහන්සි වෙන්න ඕනේ නැහැ. ඒ ගැන හිතන්නත් ඕනේ නැහැ. ඕගොල්ලොන්ට නිරායාසයෙන් කිසිදු වෙහෙසක් නැතුව ඔය තැනට මනස පත්වෙයි ආස්‍රව ක්ෂය වුණාහම. එක දෙය යි කරන්න තියෙන්නේ ආස්‍රව ක්ෂය/ භවය ගෙවා ගන්න එක විතරයි කරන්න තියෙන්නේ. ඒක ඕගොල්ලොන්ට කරන්න පුළුවන් එකක්.

පුද්ගලයෝ, දේවල්, ස්ථාන සිහිවෙන ගානේ හොඳට සිහිය තබන්න තියෙන්නේ එතනට. ***"චිරකතමපි චිරභාසිතමපි සරිතා අනුස්සරිතා"*** [87] - බොහෝ කල් සිට කළා වූ හා කීවා වූ දේවල් සිහි කරන්න, මනාව සිහි කරන්න.

රහතන් වහන්සේ භවය නැති කරලා ඉන්නේ. රහතන් වහන්සේට දානශාලාවට යන්න කලින් දානශාලාව කියලා එකක් බාහිර ඇති බවට නැහැ. හැබැයි දන්නවා; ධාතු නානත්වය මත සංඥා පහළ වෙනවා කියලා. යන්න ඉස්සෙල්ලත් නිමිති නැති හින්දා ඒ වෙලාවේ දී පෙනීම වෙන කොට තේරෙනවා මේ හේතු ටික එකතුවෙලා තමයි ඒ වෙලාවට පෙනීම සිද්ධ වෙන්නේ කියලා. භවය නැති හින්දා ආපහු එන කොටත් හටගත්ත දේ නිරුද්ධයි කියන එක පේනවා.

පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නැති වෙනවා කියන එක බලන්න ඕන එකක් නෙමෙයි. බලන්නත් බැහැ. ඒක පිහිටා හිටින්න ඕන තැනක්, සාක්ෂාත් වෙන්න ඕන තැනක්. ආස්‍රව ක්ෂය වුණාහම හරි සරල කතාවක් තියෙන්නේ. කොයි තරම් සරල ද? වහින වෙලාවක අපි නොතෙමී යනවා වගේ.

මෙතන ඉඳන් දානශාලාවට යනකන් වහිනවා කියලා හිතන්නකෝ. එතකොට මුළු පාර ම තෙමෙනවා නේ. හැබැයි අපිට නොතෙමී යන්න බැරි ද? පුළුවන්. අපි කුඩයක් ඉහලගෙන යනවා. සරල කතාවක් නේ. එතකොට

---

87 https://tipitaka.lk/an-8-1-3-10 - **අනුරුද්ධ සූත්‍රය- ගහපති වර්ගය- අට්ඨක නිපාතය- අඞ්ගුත්තර නිකාය 5- 146 පිටුව**

ඉස්සරහෙනුත් වහිනවා, පිටිපස්සෙනුත් වහිනවා. ඉස්සරහත් තෙමෙනවා. පිටිපස්සත් තෙමෙනවා.

හැබැයි නොතෙමෙනකම අරගෙන අපි පොඩ්ඩක් ඉස්සරහට යනවා. දැන් එතන තෙමෙන්නේ නැහැ. හැබැයි ඊට ඉස්සරහත් තෙමෙනවා. ඊට පිටිපස්සත් තෙමෙනවා. ආයෙත් නොතෙමෙනකම අපි ම හදාගෙන ඉස්සරහට යනවා. හරියට සෘද්ධියකින් වගේ මෙච්චර වැස්සේ නොතෙමී ගිහිල්ලා අපි. ඒ වගෙයි රහතන් වහන්සේ යන්නේ එන්නේ.

එතන එතනට හොඳට සිහිය යි. ඉස්සරහ තව ම ඉපදිලා නැහැ, පිටිපස්ස නිරුද්ධ වෙලා. නමුත් එතන එතන හදාගෙන ගිහිල්ලත් තියෙනවා. නිවන අකොප්‍ය යි. ඒ හින්දා ඒ ගැන ප්‍රශ්නයක් හිතා ගන්නවත් එපා.

මම ඒක මතක් කළේ ඕගොල්ලොන්ට ප්‍රශ්න එයි නේ අපි කොහොමද එහෙනම් ජීවත් වෙන්නේ සංස්කාර නිමිති නැති වුණොත් කියලා. එහෙම නම් අපි කොහොමද නොතෙමී දාන ශාලාවට යන්නේ කියලා ප්‍රශ්නයක් ඇහුවා වගේ එකක් ඔය කියන්නේ. නමුත් නොතෙමී යන්න බැරි නැහැ නේ, පුළුවන්.

තමන් ම නොතෙමෙනකම හදාගෙන, තමන් ම නොතෙමී යනවා. තමන් එක්ක ම නොතෙමෙනකම හැදුණා මිසක තමන් යන්න කලින් නොතෙමෙනකම තිබුණාත් නෙමෙයි. ගියාට පස්සේ නොතෙමෙනකම තියෙනවත් නෙමෙයි. යන්න ඉස්සෙල්ලත් තෙමෙනවා. ගියාට පස්සෙත් තෙමෙනවා. ඒ විදිහට ම යි ජීවත් වෙන්නේ.

ඒවා එකක්වත් හිතන්නවත් ඕනේ නැහැ, ප්‍රශ්න නෙමෙයි ඒවා. ආස්‍රව ක්ෂය කර ගැනීම තමයි කර ගන්න ඕනේ. හොඳට දක්ෂ වෙන්න භවය හඳුනා ගන්න. බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය දේශනා නොකළේ නම් භවය/ ලෝකය කියන එක හොල්ලන්නවත් බැරි නියත ඉරණමකට පත් වෙච්ච පැවැත්මක් ඇත්තෝ වගේ තමයි අපි ජීවත් වෙන්නේ.

අනේ ඉතින් අපි ඉපදුණා නම් ලෙඩ වෙනවා, මහලු වෙනවා. අනේ ඉතින් අපි ඒකට මොනවා කරන්නද අප්පා කියන තැනකින් ඉන්න වෙන්නේ මේ ලෝකය හැදුණු හැටි තේරුම් ගත්තේ නැති වුණොත්. නමුත් අපි තේරුම්

ගන්න ඕනේ, භවය කියන එක හසුවෙන්නේ ලෝකෝත්තර දහමකට සාපේක්ෂව.

ඒ කියන්නේ මම උපන්න දවසේ ඉඳලා මගේ මනස සීමා නොකරන ලද මට්ටමක තිබුණා නම් මට පෙනෙන, ඇහෙන, දැනෙන, දැන ගන්න හැම එකක ම නිමිති නැහැ. එහෙනම් අද මනුස්සයෝ, ගොඩනැගිලි, ස්ථාන තියෙනවා. ඒවා අහවල් තැන තියෙන්නේ කියන බව හැඟෙනවා නම් හොඳට තේරෙනවා මේවා පහු කාලයේ දී හැදුණු ඒවා කියලා. ඕකට නේ අපි ලෝකේ කියන්නේ.

~ ලෝකය ගැන අනාර්ය දර්ශනය හා ආර්ය දර්ශනය ~

මේ සාසනය ගොඩක් වෙනස්. මේ දහමෙන් තොර ලෝකයා කියන්නේ අපි ඉපදෙන්නත් ඉස්සෙල්ලා ලෝකය තිබ්බා. ඒ ලෝකෙට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. එහෙම උප්පත්ති වශයෙන් ඇවිල්ලා අපි ජීවත් වෙලා මැරිලා යනවා. නමුත් ලෝකය තියෙනවා වගේ තැනකින් නේ හඳුන ගන්නේ.

ඒ කිව්වේ ගෙවල්, මිනිස්සු, යානවාහන, ඉඩකඩම්, බස්, පාරවල් තියෙන ලෝකයක් තමයි තියෙන්නේ. ඔය ලෝකෙට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. එහෙම උප්පත්ති වශයෙන් ඇවිල්ලා අපි ටික කාලයක් ඒ ලෝකේ තුළ ජීවත් වෙලා මැරිලා යනවා. නමුත් අපි ජීවත් වුණු ලෝකේ තියෙනවා වගේ තැනකින් නේ අශ්‍රැතවත් පෘථග්ජනයා (ලෝකයා) ලෝකය ගැන හඳුන ගන්නේ.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඒක එහෙම නෙමෙයි. ***"ජසසු ලොකො සමුපපනෙනා"*** [88] - ස්පර්ශ ආයතන හය උපන්න කල්හි ලෝකය උපන්නේ කියලා.

---

[88] https://tipitaka.lk/kn-snp-1-9 - **හේමවත සූත්‍රය- උරග වර්ගය- සූත්‍රනිපාතය- ඛුද්දක නිකාය- 52 පිටුව**

“ලෝකයත්, ලෝකයේ ඇතිවීමත්, ලෝකයේ නැතිවීමත්, ලෝකය නිරුද්ධ කර මාර්ගයත් මම මේ සංඥා සහිත සිත සහිත බඹයක් පමණ ශරීරයෙන් පනවමි” [89] කියලා නේ බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ. එතකොට තේරුම් ගන්න, භවය කියන්නේ පංච උපාදානස්කන්ධ ලෝකයට. ඔය ලෝකය කියන එක හැදිච්ච න්‍යාය තමයි පටිච්චසමුප්පාද සිද්ධියෙන් පෙන්වන්නේ.

කච්චානගොත්ත සුත්‍රයේ පෙන්වන්නේ; ***“දවයංනිසසිතෝ බෝ’යං කච්චාන ලොකෝ යෙභුය්‍යෙන අත්ථිතඤ්චේව නත්ථිතඤ්චේව”*** [90] -කච්චාන, බොහෝ සෙයින් මේ ලෝකයා ඇත සහ නැත කියන අන්ත දෙකේ ඉන්නවා. කෙනෙක් ‘ඇත’ කියනවා. කෙනෙක් ලෝකය නැහැ කියනවා.

ආර්ය දෘෂ්ඨියට අනුව ලෝකය ඇතිවෙන හැටි

“ලොකසමුදයඤ්චේව බෝ කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලොකෙ නත්ථිතා, සා න හොති” - ලෝකය ඇතිවෙන හැටි යම්කිසි කෙනෙක් මනා නුවණකින් දකිනවා නම් එයා ලෝකය නැහැ කියලා කියන්නේ නැහැ. ලෝකය ඇතිවෙන හැටි බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ කොහොම ද?

“අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණපච්චයා නාමරූපං. නාමරූපපච්චයා සළායතනං. සළායතනපච්චයා ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො. භවපච්චයා ජාති. ජාතිපච්චයා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති” කියලා පටිච්චසමුප්පාදය දේශනා කරනවා.

---

[89] https://tipitaka.lk/sn-1-2-3-6/sinh - **රෝහිතස්ස සූත්‍රය**- නානාතිත්ථිය වර්ගය- දේවපුත්ත සංයුත්තය- සංයුත්ත නිකාය **1**- **121** පිටුව

[90] https://tipitaka.lk/sn-2-1-2-5 - **කච්චානගොත්ත සූත්‍රය**- ආහාර වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය **2**- **28** පිටුව

ආර්ය දර්ශනයට අනුව ලෝකය නැතිවෙන හැටි

"ලොකනිරොධං බො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථිතා, සා න හොති" - ලෝකය නිරුද්ධවන ක්‍රමය යම්කිසි කෙනෙක් නුවණින් දකිනවා නම්, එයා ලෝකය ඇත කියලා කියන්නේ නැහැ. ලෝකය නැතිවෙන හැටි බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ කොහොම ද?

"අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො. විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො. නාමරූපනිරොධා සළායතනනිරොධො. සළායතනනිරොධා ඵස්සනිරොධො. ඵස්සනිරොධා වෙදනානිරොධො. වෙදනානිරොධා තණ්හානිරොධො. තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති."

මේ මම, මේ මගේ අතපය, මගේ හැඩය මෙහෙමයි, මගේ ඔළුව මෙහෙමයි, මගේ ඇහැ මෙහෙම යි කියලා තමන්වත්, තමන්ට ප්‍රතිපක්ෂ වූ ගෙවල් දොරවල්, අම්මා තාත්තා, දුව, පුතා, ආදී සවිඤ්ඤාණක හා අවිඤ්ඤාණක සියලු දේත් අයිති ලෝකෙට. ඒ ලෝකය හැදිච්ච හැටි තමයි පටිච්චසමුප්පාදයෙන් පෙන්වන්නේ. ප්‍රභාශ්වර මනසට සාපේක්ෂව ඔය කතා කරන්නේ.

ලෝකයේ ඇතිවීම ගැන කියන කොට තණ්හාව නැති නොකළ නිසා කියලා කියන්නත් පුළුවන්.[91] එහෙම නැතිනම් *"දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං"* කියන අවිද්‍යාවෙන් කියන්නත් පුළුවන්. තණ්හාවෙන් ලෝකය ඇති වෙනවා කියන කොට ආස්‍රව පැත්තෙන් කියනවා.

---

91 https://tipitaka.lk/sn-4-1-11-4/sinh - **ලෝකසමුදය සූත්‍රය- යෝගක්ඛේම වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය4- 185 පිටුව**

අවිද්‍යාව නිසයි ආස්‍රව. ආස්‍රව නිසයි අවිද්‍යාව.[92] දෙන්නම මුල් වෙනවා. ඒ නිසා දෙන්නගෙන් ම කියන්න පුළුවන්.

"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා" –

උපාදානයට හිත විදිහේ ඇහැ, රූප, කන, ශබ්දය, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මනස, ධම්ම උපදින විදිහට මෙනෙහි කළා.

"සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං" –

ඒ නිසා රූපය ගැන හෝ ශබ්දය ගැන හෝ ගන්ධය ගැන හෝ රස ගැන හෝ ඵොට්ඨබ්බ ගැන හෝ ධම්ම ගැන හෝ දැන ගැනීමක් ඇති වුණා.

"විඤ්ඤාණපච්චයා නාමරූපං" –

දැනගත්ත දේ; බලන්න හෝ අහන්න හෝ ආඝ්‍රහණය කරන්න හෝ රස ලබන්න හෝ පහස ලබන්න නාමරූප දෙක පැත්තට හිත නැඹුරු කළා.

"නාමරූපපච්චයා සළායතනං" –

ඒ හින්දා උපාදානයට හිත විදිහට ඇහැ හැදුණා, කන හැදුණා, නාසය හැදුණා, දිව හැදුණා, කය හැදුණා, මනස හැදුණා.

"සළායතනපච්චයා ඵස්සෝ" –

ඒ ආයතන හැදුණු නිසා රූප ගැටෙනවා, ශබ්ද ගැටෙනවා, ගන්ධ ගැටෙනවා, රස ගැටෙනවා, ඵොට්ඨබ්බ ගැටෙනවා, ධම්ම ගැටෙනවා.

"ඵස්සපච්චයා වේදනා" –

ඇහැට රූප, කනට ශබ්ද, නාසයට ගන්ධ, දිවට රස, කයට ඵොට්ඨබ්බ, මනසට ධම්ම ගැටෙන නිසා ඒ හේතුවෙන් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපේක්ෂා වේදනාවක් ඇති වෙනවා.

---

92 https://tipitaka.lk/mn-1-1-9 - **සම්මාදිට්ඨි සූත්‍රය- මූලපරියාය වර්ගය- මජ්ඣිම නිකාය 1- 131සහ 133 පිටු**

"වෙදනාපච්චයා තණ්හා"-

ඔතනත් පනවන්න පුළුවන් ත්‍රිවිධ තණ්හාව. සැප වේදනාව තබා ගන්න තියෙන තණ්හාවට කියනවා කාම තණ්හාව හා භව තණ්හාව. දුක් වේදනාවෙන් ඉවත් වෙන්න කැමතිකම විභව තණ්හාව. උපේක්ෂා වේදනා නිසා භව තණ්හාව. තව පැත්තකින් කිවුවොත් රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා ඇති වෙනවා.

"තණ්හාපච්චයා උපාදානං" –

මේ දරුවා මගේ, මේ රත්තරන් මගේ, මගේ මාලය, මගේ මුද්ද, මගේ කාර් එක, පුද්ගලයෙක්, සත්ත්වයෙක් කියලා වස්තුවට නම් කරලා ම අරගන්නකම ඇති වෙනවා.

"උපාදානපච්චයා භවෝ" –

උපාදානය නිසා භවය වෙනවා.

තිරිසන්ගත සතෙක්ව උදාහරණයට ගන්නකෝ. තිරිසන්ගත සතෙක්ට අම්මා, තාත්තා, අයියා, අක්කා, කාර් එක, බස් එක, ගෙවල් දොරවල්, නිමල්, කමල් කියලා ප්‍රඥප්ති තියෙනවා ද? නැහැ. බැලුවා මෙහෙම, ගහක කොළයක් හරි හෙලවුනා ද දිවුවා. ආපහු ඌ ඊගාවට එන්නේ පරිස්සමෙන් අර කෙනා තව ම එතන ඇති කියලා හිතලා.

ඇහැ පරිහරණය කරපු ගමන් දැකපු දේ ඇති බවට නිමිති හැදිලා ම යි නවතින්නේ. ඒ කියන්නේ ඇහැ ඉපැද්දුවා නම් එපමණකින් භවය වෙනවා. ඒ හින්දයි තිරිසන්ගත සතුන්ට සසර හිටින්නේ. අපිට වගේ නිමල්, කමල්, අම්මා, තාත්තා කියන ප්‍රඥප්ති නැහැ උන්ට. ඒකයි මේ ආයතන ටික තිබ්බොත් ඇති කියලා කියන්නේ. ඒ හින්දා භවය හැදෙනවා.

භවය කියන්නේ ලෝකය. ඒ ලෝකය ඇතුළේ; අම්මා, තාත්තා, දුව, පුතා, අයියා, අක්කා, නංගී, මල්ලී, සහෝදර සහෝදරියෝ, ඥාති හිතේෂීන්,

ගෙවල් දොරවල්, ඉඩකඩම්, වාහන, පොලිසි, ඉස්පිරිතාල, නැව්, ගුවන්යානා ඔක්කොම තියෙනවා. ඉතින් ඒවාගේ රස්සාවල් කරනවා, ජීවත් වෙනවා. ඕක තමයි ලෝකය/ භවය.

භවය නිසා ආපහු ලෝකේ තියෙන ඒවා සිහි කරලා නැවත ඒවා බලන්න, අහන්න යන්න හදන කොට නැවත උපාදානයට හිත ආයතන ටික උපදිනවා. ආයතන ටික උපදින කොට ම තණ්හා උපාදාන වෙලා දැකපු දේවල්, අහපු දේවල් ඇතිකමට හම්බ වෙනවා. ඔය දෙක කැරකෙන කොට *"භවපච්චයා ජාති"*. ලෝකය ම ඇත්ත වෙලා.

ඒ ඇත්ත වෙච්ච ලෝකේ කැඩෙනවා, බිඳෙනවා, පළුදු වෙනවා, වෙනස් වෙනවා, නැසෙනවා. ඒ නිසා ජරා මරණ ආදී සියලු දුක හටගන්නවා. *"භවපච්චයා ජාති"* කියන එක අපි උදාහරණයකින් කියමු; නිමල් කියන යහළුවා ඉන්නවා කියලා සිහි වුණා. භවය නිසා යි එහෙම අපිට සිහි වෙන්නේ. එතකොට භවය නිසා, භවය හේතුවෙන්, භවය ප්‍රත්‍යයෙන් ඉන්නවා කියනකම හැඟෙනකම නිසා බලන්න යන කොට විඤ්ඤාණය නාමරූප දෙකට බැසගෙන ආයතන ටික උපදිනවා.

එතකොට රූපය දකින කොට ම, 'අනේ ඔයා කෙට්ටු වෙලානේ දැන්' කියයි. භවය තියෙන නිසා ඉස්ස මහතයි, දැන් කෙට්ටුයි කියලා පෙනෙයි. එතකොට කෙට්ටුකම මහතකම පෙනෙයි. ඉස්සර එන කොට ජීවත් වෙලා ඉඳලා, දැන් මැරිලා. ඉස්සෙල්ලා එන කොට තරුණයි. දැන් මහළුයි. ඒ හින්දා භවය ප්‍රත්‍යයෙන් ආයතන ටික උපදින කොට ජරා මරණ පේනවා. ඇයි ඉතින් නිමිති තියෙනවා නේ භවය ඇතුළේ. මෙන්න මෙහෙම ලෝකේ හැදෙනවා කියලා දකින කෙනා කවදාවත් ලෝකය කියලා එකක් නැහැ කියන්නේ නැහැ

අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධෝ

අවිද්‍යාව නැති වුණොත් තණ්හාව (කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා) නැති වුණොත් ඇහැ රූපය, කන, ශබ්දය ආදී දොළොස් ආයතන උපදින විදිහට මෙනෙහි කරන්නේ නැහැ.

සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො

මෙනෙහි නොකරන නිසා ඇහැ ගැන, රූපය ගැන, කන ගැන, ශබ්දය ගැන ආදී දොළොස් ආයතන ගැන දැන ගැනීමක් (විඤ්ඤාණය) නැහැ.

විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො

එහෙම දැන ගැනීමක් නොමැති නිසා පෙනෙන, ඇහෙන, දැනෙන තැනක තියෙන පුරාණ කර්මයට හටගෙන නිරුද්ධවන විපාක නාමරූප දෙක පැත්තට නැඹුරු වෙන්නේ නැහැ.

නාමරූපනිරොධා සළායතතනිරොධො

එහෙම නැඹුරු නොවුණොත් උපාදානයට හිත විදිහට ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන සළායතන හැදෙන්නේ නැහැ.

සළායතතනිරොධා ඵස්සනිරොධො

සළායතන හැදුනේ නැති වුණොත් රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම ස්පර්ශ වෙන්නේ නැහැ.

ඵස්සනිරොධා වෙදනානිරොධො

ස්පර්ශය නොවුණොත් වේදනාවක් ඇතිවෙන්නේ නැහැ.

වෙදනානිරොධා තණ්හානිරොධො

වේදනාව නැති වුණොත් රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා ඇතිවෙන්නේ නැහැ.

තණ්හානිරොධා උපාදානනිරොධො

තණ්හාව නැති වුණොත් කාම, දිට්ඨි, අත්තවාද, සීලබ්බත ආදී උපාදාන නැහැ.

උපාදානනිරොධා භවනිරොධො

උපාදාන නොවුණොත් භවය වෙන්නේ නැහැ. ඒ කියන්නේ නිමිති හිටින්නේ නැහැ. පංච උපාදානස්කන්ධ ලෝකය නැහැ.

භවනිරොධා ජාතිනිරොධො

භවය නැති වුණොත් භවය හේතුවෙන් භවය ප්‍රත්‍යයෙන් නැවත නැවත සිහි කර කර බාහිරට යාමක් වෙන්නේ නැහැ.

ජාතිනිරොධා ජරාමරණං, සොකපරිදෙවදුකඛදොමනසසුපායාසා නිරුජඣනති. එවමෙතසස කෙවලසස දුකඛකඛනධසස නිරොධො හොතීති

එහෙම වුණොත් කැඩෙනවා, බිඳෙනවා, පළුදු වෙනවා, ලෙඩ වෙනවා, මහළු වෙනවා, මැරෙනවා කියන එකක් පෙනෙන්නේ නැති වෙයි.

අවිද්‍යාව නැති වුණා නම් අපේ මනසට ම තේරෙනවා ලෝකය නිරුද්ධ වුණා කියලා. පොඩි කාලේ ස්කොලේ ගියා, මේ පාරවල්වල ගියේ, මේ මේ යාළුවො හිටියා, රස්සාවල් කෙරුවා, මේ මේ තැන්වල මෙහෙම මෙහෙම හිටියා කියලා බලන්නකෝ අපේ භවයේ කොච්චර දේවල් තියෙනවා ද කියලා. භවය කියන එකට අතීතයක් තියෙනවා, අනාගතයකුත් තියෙනවා, වර්තමානයකුත් තියෙනවා.

නමුත් අපි උප්පත්ති වශයෙන් ආපු පිරිසිඳු තැන අතීතය නිරුද්ධ වෙලා. අනාගතය ඉපදිලා නැහැ. වර්තමානයේ පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නැති වෙනවා කියන තැනක සත්‍යයක් විතරයි ඒ විපාක ස්කන්ධ ටිකේ තියෙන්නේ. භවය කියන එක හැදෙන්න අතීත, වර්තමාන, අනාගත තුන් කාලය ම තියෙන්න ඕනේ.

එතකොට නිරුද්ධ වෙච්ච දෙයක් ඇතිකමටත්, නූපන්න දෙයක් ඇතිකමටත් නිබුණොත් විතරයි ලෝකය ඇති බවට පනවන්න පුළුවන්. උදාහරණයකින් කිව්වොත් යන්නත් ඉස්සෙල්ලා ඔයාලට දානශාලාව හැදිලා තියෙනවා. භවය ඇතුළේ එහෙම තමයි. තුන් කාලයේ ම දානශාලාව ඇති බවට ම පෙනෙයි.

ලෝකය නැති වෙන්න තියෙන හේතු ටික යෙදුණොත් ලෝකය කියන එක තියෙන්නේ නැහැ කියලා දකින නිසා ලෝකය තියෙනවා ම යි කියලා ගන්නෙත් නැහැ. *"එතෙ තෙ කච්චාන උහො අනෙත අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති."* - ඇත සහ නැත කියන අන්ත දෙකට නොපැමිණ මධ්‍යම ප්‍රතිපදාවෙන් තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරනවා කියලා පෙන්නනවා.

අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥානය වේ. විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූපය ද වේ. නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතනය ද වේ. ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශය වේ. ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදානය වේ. උපාදාන ප්‍රත්‍යයයෙන් භවය වේ. භව ප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාති ප්‍රත්‍යයයෙන් ජරාමරණ, සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හටගනිත්. මෙසේ මේ හුදු දුක්ඛරැසේ හටගැනීම වේ කියන 'මෙය ඇති කල්හි මෙය වේ' කියන පටිච්චසමුප්පාද න්‍යාය පෙන්නුවා .

අවිද්‍යාවේ ම නිරවශේෂ විරාග නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. සංස්කාර නිරෝධයෙන් විඥාන නිරෝධය වේ. විඥාන නිරෝධයෙන් නාමරූප නිරෝධය වේ. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ. ෂඩායතන නිරෝධයෙන් ස්පර්ශ නිරෝධය වේ. ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධය වේ. වේදනා නිරෝධයෙන් තෘෂ්ණා නිරෝධය වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ. උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ. ජාති නිරෝධයෙන් ජරාමරණ, සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ කියන 'මෙය නැති කල්හි මෙය නොවේ' කියන එක පෙන්නුවා.

"මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ" කියන න්‍යායකින් තමයි ලෝකයේ හටගැනීම හා නැතිවීම පෙන්නුවේ. ඔන්න එතකොට හොඳට දන්නවා; මේ ලෝකය කියන එක ස්ථිරව තියෙන සිද්ධියක් නෙමෙයි. ලෝකය කියන එක ඒකාන්තයෙන් පිහිටි ස්වභාවයක් නම් මේ ජීවිතයේ දී ම ලෝකයේ ඇතිවීම හා නැතිවීම පෙන්නන්න බැහැ නේ.

අවිද්‍යාව නැමැති වැරැද්ද තිබුණොත් ලෝකය හටගන්නවා නම්, අවිද්‍යාව නැමැති වැරැද්ද නැති වුණොත් ලෝකය නැති වෙනවා නම් ඒක එහෙනම් සැබෑවට පිහිටි එකක් නෙමෙයි කියන එක කියනවා.

විපාක ස්කන්ධ ටිකේ සීමා නොකරන ලද මනසක් තියෙනවා නම් ඒකට ඔය කතාව කියන්න බැහැ. ඒ සීමා නොකරන ලද මනසේ කොච්චර වෙලාවක් හිටියත් ප්‍රශ්නයක් නැහැ නේ. සීමා නොකරන ලද මනසට සාපේක්ෂව ඉඳලා තමයි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා බලන්නේ, මට අද ලෝකයක් තියෙනවා නම් එහෙනම් මේ අවිද්‍යාව නැමැති වැරැද්ද නිසා තමයි ලෝකය හැදිලා තියෙන්නේ කියලා.

ධර්මය නොදන්නා පුහුදුන් ලෝකයා, මරණයට නියත වෙච්ච ගවයෝ වගේ මේක අපේ ඉරණම නේ කියලා ජීවත්වෙන ලෝකය තමන්ගේ අවිද්‍යාවෙන් මෙන්න මෙහෙම හැදුන එකක් ය කියලා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා දකිනවා. අවිද්‍යාව නැති කළොත් ලෝකය නිරුද්ධ කළ හැකි කියලා දකිනවා. අවිද්‍යාව නැති වුණොත් එයා දන්නවා සීමා නොකරන ලද මනසේ ඉන්නවා කියලා. එයාට පිහිටා හිටින්න තැනක් තියෙනවා.

අවිද්‍යාව නිසා ලෝකය හටගන්නවා නම් අවිද්‍යාව නැතිවෙන කොට ලෝකය නැති වෙනවා නම් ලෝකය සංඛත යි. (සකස් කර ගත්ත එකක්). හේතූන්ගෙන් ප්‍රත්‍යයන්ගෙන් හටගත්ත එකක්. ක්ෂයවෙන ධර්මයක්, වැයවෙන ධර්මයක්, නිරෝධ ධර්මයක් ලෝකය. ලෝකය දිය කරන්න පුළුවන් එකක් ය කියන නුවණක් එනවා එයාට.[93]

එතකොට දැන් අපිට ලෝකය නැති වෙන්නේ (ලෝක නිරෝධය වෙන්නේ) නැත්තේ මොකක් නිසා ද? ආස්‍රව නිසයි කියලා පේනවා. සීමා නොකරන ලද මනසකින් උප්පත්ති වශයෙන් ආපු අපි අවිද්‍යාවගේ සක්‍රිය වීම නිසා ලෝකය හදාගත්තා. අවිද්‍යාව නැති වීමෙන් විද්‍යාවගේ පහළ වීමෙන් සීමා නොකරන ලද මනසට ආවොත් ලෝකය නැති වෙනවා.

---

93 https://tipitaka.lk/sn-2-1-2-10/sinh - **පච්චය සූත්‍රය- ආහාර වර්ගය- අභිසමය සංයුක්තය- සංයුක්ත නිකාය 2- 43 පිටුව**

නමුත් අද අපිට සීමා නොකරන ලද මනසේ ඉන්න බැහැ. ඇයි ඒ? ලෝකේ ක්‍රියාකාරකම් සිහි කර කර ඒ පැත්තට අදිනවා. කාම තණ්හාවෙන්/ කාමාස්‍රවයෙන් පංචකාමය පැත්තට අදිනවා. භවාස්‍රවයෙන්/ භව තණ්හාවෙන් භවයට අදිනවා. දිට්ඨාස්‍රවයෙන් පුද්ගලයෝ බාහිර ඉන්නවා ම යි, සත්ත්වයෝ ඉන්නවා ම යි, කියලා ම පෙන්වනවා. අවිද්‍යාස්‍රවයෙන් ඉහත විස්තර කළ ඒවා ආස්‍රව කියලා පෙන්නන්නේ නැතුව දරුවා ම යි, ගෙදර ම යි කියලා ඒ පැත්තට පලයන් ම යි කියලා පෙන්වනවා. ඒ හින්දා සීමා නොකරන ලද මනසේ ඉන්න බැහැ අපිට.

ඒ හින්දා අපි භවය /පංච උපාදානස්කන්ධ ලෝකය විදර්ශනා කරන්න ඕනේ. පංච උපාදානස්කන්ධ ලෝකය කියන එක ඇත්තක් නොවෙන්නේ එතකොට. පංච උපාදානස්කන්ධ ලෝකය විදර්ශනා කරන කොට ඒ ලෝකය ඇත්ත වෙන්නේ නැහැ. ඒ විදර්ශනා කරන කොට ටික ටික ආස්‍රව ගෙවෙන්නේ.

විදර්ශනා කරන ගානේ ලෝකේ තියෙන බඩුමුට්ටු පරිහරණය කරන හුරුව ගෙවෙනවා. පුද්ගලයෝ, දේවල්, ස්ථාන පරිහරණය කරන එක මනසෙන් නවත්තන්න වෙනවා. ලෝකය තිබුණොත් නේ සක්මන් කරන්නේ. අවිද්‍යාව නිසා හැදුණු එකක්, අවිද්‍යාව නැති වුණොත් නැතිවෙන එකක් නේ මේ ලෝකය කියන්නේ කියලා පෙන්නන කොට එහෙනම් කොහොමද මම ලෝකේ ඇතුළේ සක්මන් කරන්නේ කියලා දැනෙයි.

දැන් අපිට ‘දානශාලාව තියෙනවා’ කියලා සිහිවෙන කොට ම පටිච්චසමුප්පාද න්‍යාය ඔස්සේ පෙන්වනවා; අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ටික නිසා හටගත්තා. අවිද්‍යාව නැති වුණොත්, කර්මය නැති වුණොත්, තණ්හාව නැති වුණොත්, ආහාර නැති වුණොත් මේ නිමිත්ත නැති වෙනවා කියලා පටිච්චසමුපාදයේ දෙපැත්ත පෙන්වනවා.

කච්චානගොත්ත සුත්‍රයේ පෙන්නුවා වගේ ලෝකය ඇතිවෙන හැටි හා නැතිවෙන හැටි පෙන්වන්න. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර ටික තිබුණොත්

ලෝකය තියෙනවා. හැබැයි ලෝකය තියෙනවා ම යි කියලා ඒකාන්ත කොට කියන්න බැහැ. ඒ මොකද?

අවිද්‍යාව, කර්ම, තණ්හා, ආහාර නැති වුණොත් ලෝකය නැතිවෙන නිසා කියලා කියන කොට ම අපිට හයියක් එනවා. එහෙනම් තියෙන ලෝකයකට අපි උප්පත්ති වශයෙන් ආවා නෙමෙයි. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හදාගත්ත එකක් ලෝකය කියන එක. එහෙනම් අවිද්‍යා භව තණ්හා කියන මූල ක්ලේශ දෙක නැති කරලා ලෝකය නැති කරන්න පුළුවන්ය කියලා ලෝක නිරෝධයට දැක්මක් එනවා.

ඊට පස්සේ ආස්‍රව ක්ෂය කර ගන්න තියෙන්නේ. ලෝකයේ කුමන නිමිත්තක් සිහි වුණත් හඳුනා ගන්න අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හැදිලා තියෙන්නේ කියලා. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ටිකෙන් පටිච්චසමුප්පාදයේ අංග ටික කෙටි කරලා මෙහෙම තමයි ලෝකය හටගත්තේ කියලා පෙන්නන්නේ.

අවිද්‍යාව නැති වුණොත්, කර්මය නැති වුණොත්, තණ්හාව නැති වුණොත්, ආහාර නැති වුණොත් ලෝකය නැති වෙනවා කියලා පෙන්වන කොට බාහිරයට අපේ මනස උලුක් වෙලා අම්මා, තාත්තා, ගෙදර ම කියලා පෙන්වන ගතිය අඩු වෙනවා.

අවිද්‍යා අන්ධකාරයේ ඉන්න අඳ අපිට ලෝකය නැති කිරීම පැත්තකින් තැබේවා, අපිට හිතෙන්නේ බාහිර තියෙන දේ ම සිහිවෙනවා කියලා නේ. බාහිර එහෙම දේවල් තියෙනවා ම යි කියලා සිහිවෙන එකට තමයි 'භවය' කියලා කියන්නේ. ඒ භවය කියලා කියන්නේ උපාදානය නිසා හැදිච්ච එකක් කියන එක නොදන්නාකම නිසා තමයි අපිට හිතෙන්නේ මේ ලෝකය නැති කරන්න තියා හොල්ලන්නවත් බැහැ කියලා. නමුත් පටිච්චසමුප්පාද සිද්ධියෙන් තේරෙනවා ලෝකය නිරුද්ධ කරන්න පුළුවන් කියලා.

ලෝකය කියන එක තේරුණා ද හැමෝටම? ලෝකය කියන්නේ මනෝමය සිද්ධියක් නෙමෙයි. ගෙදර ගිහින් අම්මාව බලන්න පුළුවන්, දරුවාගේ මූණ බලලා එන්න පුළුවන්, ඉස්පිරිතාල තියෙනවා, වැඩට එනවා,

වැඩට යනවා, දාන ශාලාව තියෙනවා, ලබුනෝරුව ආරණ්‍ය සේනාසනය තියෙනවා, කුටි තියෙනවා, හාමුදුරුවරු ඉන්නවා මේකට තමයි ලෝකේ කියන්නේ. මේක හරි මැජික් එකක් වගේ පුදුම සිද්ධියක් වෙන්නේ. තමන් ම යි පංච උපාදානස්කන්ධ ලෝකේ හදාගත්තේ. හැබැයි බාහිරයට සක්මන් කරන්නත් අද අපිට පුළුවන් වෙලා.

~ දරුණු ම හිරගෙදර ~

එතකොට එයා දන්නවා, ලෝකය කියන්නේ මොකේට ද? භවයට. භවය කියලා කියන්නේ මේ ලෝකේ තියෙන නරක ම හා දරුණු ම හිරගෙදර. ඕකෙන් මිදිලා යන්න ලෙහෙසියෙන් බැහැ කාටවත්ම මහා පතාක තාප්ප ගහලා තියෙන්නේ. තුන් භවය ම හිරගෙදරක් කියලා කියන්නේ.

අම්මා, තාත්තා, දුව, පුතා, ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම්, නැදෑයෝ කියන ඒවා මහා ප්‍රාකාරයක් නිවනට යන්න බැරි වෙන්න. භවය නැමති බන්ධනයෙන් බැඳිලා ඉන්නේ. භවය නැමති බන්ධනය කඩාගෙන මේ ලෝකේ තල්ලු කර ගෙන යන්න නම් මොන තරම් හයියක් තියෙන්න වෙයි ද? මේ ලෝකේ කඩාගෙන යන්න නම් හොඳ ජවයක් තියෙන්න ඕනේ.

ලේසි කෙනෙකුට භවය කියන එක අයින් කරන්න බැහැ. පොළොව ම උගුල්ලලා දාන්න නේ තියෙන්නේ. ඕක විතරක් නෙමෙයි; මේ මනුස්ස ලෝකේ ඔහොම නම් දිව්‍ය ලෝකේ කොහොම ඇති ද, ඒකත් මෙහෙම ලෝකයක්. ඒකත් උගුල්ලලා දාන්න ඕනේ. එතකොට බ්‍රහ්ම ලෝකේ කොහොම ඇත්ද, එකත් ලෝකයක්. ඒකත් උගුල්ලලා දාන්න ඕනේ. එකක් උගුල්ලලා ගලවන කොට තව එකක් මතු වෙනවා. ඒක උගුල්ලලා ගලවන කොට තවත් එකක් මතු වෙනවා. ඔය ඔක්කොම ටික ගලවාගෙන යන්න ඕනේ. ලෝක නිරෝධය කියන්නේ ඕකට.

"කො ඉමං පඨවිං විවෙසසති" [94] - එක්තරා අවස්ථාවක දෙවියෙක් අහනවා; නිදුකාණන් වහන්ස, කවුද මේ පොළොව දිනන්නේ? කාටද මේ පොළොව දිනාගන්න පුළුවන්? *"සෙඛො පඨවිං විවෙසසති"* - සේඛ පුද්ගලයා මේ පොළොව දිනා ගන්නවා. එයාට පුළුවන් පොළොව උගුල්ලලා දාන්න. මෙච්චර බස්, කාර්, ලොරි, මුහුදුවල් තියෙන මේ පොළොව උගුල්ලලා දානවා කියන එක ලෙහෙසි ද? නැහැ.

එතකොට රහතන් වහන්සේ (අසේඛ) කියන්නේ පොළොව දිනපු කෙනාට. ඒකයි ලෝකෝත්තර ඥාන දර්ශනය තියාගෙන අෂ්ට සමාපත්ති සෘද්ධිවිධ ඥාන උපදවා ගත්තොත් මේ මහා පොළොව (පෘථිවිය) සෘද්ධියෙන් ඇඟිල්ලකින් නටවන්න පුළුවන් කියන්නේ.

වේරඤ්ජාවේ එක වස් කාලයක් තථාගතයන් වහන්සේ බඩගින්නේ හිටියේ දුර්භික්ෂයක් හින්දා. එතකොට මුගලන් මහරහතන් වහන්සේ අහනවා; **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම මේ පොළොවේ යටට වෙලා තියෙන රස තට්ටුව උඩට ගන්නද කියලා".** [95]

"එතකොට මොග්ගල්ලාන, මේ සත්ත්වයන්ට මොකද කරන්නේ"? "ස්වාමීනි, මම එක අත්ලට සත්ත්වයෝ ඔක්කොම ටික අරගෙන ඊට පස්සේ පොළොව අනික් පැත්තට පෙරලන්නම් කියනවා. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "එහෙම කරන්න එපා. එතකොට මේ සත්ත්වයන්ගේ චිත්ත විපරියාසයක් වෙනවා" කියලා.

අපිට නිකන් ඕවා සුරංගනා කතා වගේ වුණාට, ඒවා ඇත්ත. මොකද, මුළු භවය ම, මේ ලෝකය ම එක සිත් යායට තියෙන්නේ. ඒ වගේ ලෝකය උඩු යටිකුරු කරන්න පුළුවන් හිත දියුණු කරපු කෙනෙකුට. හැබැයි ඉතින් මේ ශාසනයේ නැති කෙනාට භවය කියන එක බැම්මක් වෙලා, බන්ධනයක් වෙලා. "සත් හට වන භව දුකට වෙදාණන්" - සත්ත්වයන්ට ඇතිවෙන භව දුකට වෙදාණන් තමයි බුදුරජාණන් වහන්සේ. මේ මුළු ලෝක

---

[94] https://tipitaka.lk/kn-dhp-4 - **පුෂ්ප වර්ගය- ධම්මපදපාළි- බුද්දක නිකාය- 36 පිටුව**

[95] https://tipitaka.lk/vp-prj-1/sinh - **චේරඤ්ජකාණ්ඩය- පාරාජිකපාළිය- 17 පිටුව**

සත්ත්වයා ම භවය නිසා දුක් විඳිනවා. ජරා මරණ ශෝක පරිදේව සියලු දුක් දොම්නස්වලින් යුක්තයි මේ මුළු ලෝක සත්ත්වයා ම.

ඕගොල්ලොන්ට සමාධිය නැති හින්දයි මේ මමත් ඉන්නවා, මේ අනිත් ඒවත් තියෙනවා කියලා දෙකට බෙදිලා තියෙන්නේ. සමාධිය හොඳට ආවහම ඕගොල්ලොන්ට පෙනෙන නිමිත්ත විතරයි ඉතුරු වෙන්නේ. එහෙම පෙනෙන තැනක ඕගොල්ලෝ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයක් ගැන දන්නෙත් නැහැ. ඇහැක් ගැන දන්නෙත් නැහැ. නමුත් යමක් පෙනෙනවා. පෙනෙන දේ අරහයා හොඳට කතාබහ කරන්නත් පුළුවන්. රහතන් වහන්සේ නමකගේ චරිතය ඔය.

ඔතනට අපි පත් වෙන්න ඕනේ. ඔය වගේ තැනකට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. ඔතන ඉඳලා දැන් ගිහිල්ලා තියෙනවා අපි අවිද්‍යාව හා තණ්හාව නිසා වෙන ම පාරක, මිච්ඡා පථයක ගිහිල්ලා තියෙනවා. හරියට රේල්පීලි දෙක මාරු වෙලා ගියා වගේ ට්‍රැක් එකේ.

අවිද්‍යාව නිසා හැරිලා ගිහිල්ලා චක්ඛායතනය ආදී ස්පර්ශ ආයතන හය හරහා රූප දකිනවා, මතක තියා ගන්නවා, සිහි කරනවා. ආයේ රූප දකිනවා, මතක තියා ගන්නවා, සිහි කරනවා කියලා එක ම රවුමක කැරකෙනවා දැන් මේ. මේක තමයි වැරදි මාර්ගය (මිච්ඡා පථය).

"උජුකෝ නාම සෝ මග්ගෝ" [96] - ඒ මාර්ගය සෘජු යි, උජුපටිපන්න යි ඒ මාර්ගය. මෙහෙම කෙලින් තියෙන මාර්ගය හැරිලා ගිහිල්ලා තියෙන්නේ අවිද්‍යාව හා තණ්හාව නිසා දැන්. ඉතින් මේකේ දෝෂය අහගත්තා කෙලින් යන්න තියෙන එක හැරිලා ගිහින් තියෙන්නේ මෙහෙම යි කියලා. ඒ හින්දා වැරදි මාර්ගයේ යන්න හේතු වෙච්ච හේතු ටික නැති කළොත් ආපහු මෙතනට එනවා කියලා අහගත්තට ඒ රවුම කැරකිච්ච එකේ හුරුව ගෙවා ගන්න ඕනේ.

ඒ සඳහා තමයි ස්කන්ධයන්ගේ උදය වැය බලනවා කියලා කරන්නේ. ඒ කියන්නේ සිහිවෙන සිහිවෙන හැම නිමිත්තක් ම හොඳට තේරුම් ගන්න, ඒ

---

[96] https://tipitaka.lk/sn-1-1-5-6- **අච්ඡරා සූත්‍රය- ආදිත්ත වර්ගය- දේවතා සංයුත්තය- සංයුත්ත නිකාය I- 58 පිටුව**

තමයි පංච උපාදානස්කන්ධ ලෝකේ. භවය කියන එක බයක් හැටියට, රෝගයක් හැටියට, හුලක් හැටියට, හිරගෙයක් හැටියට, බන්ධනයක් හැටියට දකින්න.

නිවනට යන්න දෙන්නේ නැති ලොකු ම බන්ධනය භවය. ඒ බලන එකට තමා පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, හුලක් වශයෙන්, ගඩක් වශයෙන් බලනවා කියලා කිවුවේ. භවය යි ඒ විදර්ශනා කරන්නේ. එහෙම විදර්ශනා කරන කොට ලෝකෙන් මිදෙන්න කැමති වෙනවා හිත. ඉතින් ඒකට මහන්සි වෙන්න ඕනේ.

කෙනෙක්ව, දෙයක්ව සිහිවෙන කොට ඒක ඇත්ත වෙලා ඒ නිමිත්ත එක්ක හිතිම්, කිම්, කිරිම් කරන එකට ලැජ්ජා වෙන්න. මම තාම මගේ නිමිත්තක් එක්ක ම කතා කරන්න තරම් මෝඩයි නේද කියලා. ඒ කියන්නේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් මම ම නිමිත්තක් හදාගෙන, මම ම ආස්‍රවවලින් නැමිලා ඒකට හිතිම්, කිම්, කිරිම් කරන්න සක්‍රිය වෙලා නේද කියන එක පෙන්වන්න.

ඒ විදිහට නැවත නැවත පෙන්වන කොට කාමාස්‍රව කැපෙනවා, භවාස්‍රව කැපෙනවා, අවිද්‍යාස්‍රව කැපෙනවා. චතුරාර්ය සත්‍යය දර්ශනය දකින කොට ම දිට්ඨාස්‍රවය කැපිලා එයාට. ඒ හින්දා දිට්ඨාස්‍රවයක් ගෙවාගන්න ඉතුරු වෙන්නේ නැහැ. ඒ කිවුවේ දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැති කරන මඟ දැකලා පටිච්චසමුප්පාද න්‍යාය ඔස්සේ ලෝකය ඇතිවෙන හැටි හා නැතිවෙන හැටි දකින එක සම්මා දිට්ඨිය. සම්මා දිට්ඨියට එන කොට ම දිට්ඨාස්‍රවය නැහැ.

දිට්ඨාස්‍රවය තියෙන්නේ චතුරාර්ය සත්‍යය දන්නේ නැති හා දකින්නේ නැති කෙනාට. තව විදිහකින් කිව්වොත් අපි ඉපදෙන්නත් කලින් ලෝකය තියෙනවා. ඒ තියෙන ලෝකයට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. ඒ ලෝකේ තමයි අපි දැන් ජීවත්වෙමින් ඉන්නේ. ලෝකය තියෙද්දී අපි මැරිලා යනවා කියන මට්ටමට තමයි දිට්ඨාස්‍රවය ඇසුරු වෙන්නේ. පටිච්චසමුප්පාද න්‍යාය අවබෝධ වීමෙන් දිට්ඨාස්‍රවය කැපෙනවා.

පුද්ගලයෙක්, දෙයක් සිහිවෙන කොට මේක පංච උපාදානස්කන්ධ ලෝකය නේ, මේ භවය නේ, මේ ආස්‍රව නේ කියලා කැමති තැනකට හිත තියන්න. අපි උදාහරණයකට කියමු, දානශාලාව සිහි වුණා කියලා. හිත බාහිරයට නැමිලා දානශාලාවේ බිත්තියේ ගාපු හුණු ටිකත් එක්ක ම, දානශාලාවට යන පාරත් එක්ක ම සිහි වෙනවා. එතකොට ම මේක භවය, මේක ලෝකේ කියලා හොඳට දන්නවා. ඔය භවය, ඔය ලෝකය නැති කරන්න පුළුවන් එකක්.

මොකද ඔතන තිබුණොත් දැන් දානශාලාව විතරක් දීලා නතර කරන්නේ නැහැ. එහා පැත්තේ අනන්ත අපරිමාණ සසර. භවය තිබුණොත්, භවය හේතුවෙන්, භවය ප්‍රත්‍යයෙන් ජාතිය වෙනවා ම යි. ඉපදෙන කොට මනුස්සයෙක් ම වෙලා ඉපදෙන්නේ නැහැ. ප්‍රේත ලෝකේ, නිරය ලෝකේ, තිරිසන් ලෝකේ තමයි බොහෝ වශයෙන් ඉපදෙන්නේ.

පුතේ, මම ළඟදී දැක්කා **Youtube** එකේ ඒ වගේ සිද්ධියක්. මීහරකෙක් මඩ ගොහොරක ඌගේ කකුල් දෙකයි අත් දෙකයි දක්වා ම එරිලා. කොටියෙක් ඇවිල්ලා ඌගේ හොම්බ කඩා ගන්නවා. මීහරකාට මුකුත් කර ගන්න බැහැ. හරියට බැඳලා දීලා වගේ කොටියාට කන්න. ඒ කොටියා ආයේ ඇහැ කඩා ගන්නවා. කොටියා කෑල්ල කෑල්ල කඩාගෙන කනවා, අරූට මොකුත් කර ගන්න බැහැ එරිලා නිසා. ඔය භවයෙන් ලැබුණේ මගේ පුතේ.

මං ආමි (Army) එකේ ඉන්න කාලේ ඔය අම්පාර පැත්තේ දී බෝම්බයකට අහුවෙලා හමුදාවේ කට්ටිය මැරුණා. ඊට පස්සේ එක සාජන්ට් මහත්මයෙක්ගේ බොඩි එක සීල් කරලා මිනිය ගෙනාවා. ආමි quarters වල තමයි ඒ සාජන්ට් මහත්මයාගේ මිනිය තිබ්බේ. ඒ මිනිය වැඩි දවස් තියා ගන්න බැහැ.

මිනිය ගෙනල්ලා දවසක් විතරයි ගියේ. යටින් වැක්කෙරෙන්න ගත්තා ඕජස්. එයාගේ සහෝදරයෙක් ද කොහෙද ඈතක ඉඳන් ඇවිල්ලා අර ඕජස් ටික අතින් අරගෙන 'මගේ බුදු මල්ලී' කියලා ඇඟේ ගාගන්නවා. හිතන්නකෝ එතකොට දුක කොහොමද කියන එක. අර අප්‍රසන්නකම පේන්නේ නැහැ.

පුතේ, ඒ දුක භවයෙන් ලැබෙන්නේ. ඒ හින්දා හිතන්න එපා අම්මා සිහි කරලා යනවා, ගෙදර සිහි කරලා යනවා, දානශාලාව සිහි කරලා යනවානේ කියන චූටි තැනකින්. එහා පැත්තේ අනන්ත අපරිමාණ සසර. භවය තිබුණොත්, භවය හේතුවෙන්, භවය ප්‍රත්‍යයෙන් ජාතිය වෙනවා ම යි.

~ **ලෝකුඹු නිරයට වැටුණහම** ~

ලෝකුඹු නිරයේ උපන්නහම බත් ඇටයක් නටන්නේ පෙන දදා පැහි පැහී. ඒ වගේ පැහෙනවා අවුරුදු කෝටි ගණන්. ලෝදිය කියන්නේ ලෝහ දියවෙනවා ඒ වතුරට දැම්මහම. ඒ ලෝදිය වතුරේ එක පාරක් පිච්චි පිච්චි යටට යන කොට මනුස්ස ලෝකෙන් අවුරුදු තිස්දාහක් ගිහින්. ආයේ පිච්චි පිච්චි උඩට එන කොට මනුස්ස ලෝකෙන් අවුරුදු තිස්දාහක් ගිහින්. මනුස්ස ලෝකේ අවුරුදු හැටදාහක් යනවා ලෝකුඹු නිරයේ එක පාරක් යට ගිහින් උඩට එන්න.

අන්න ඒ නිරිසත්ත්වයෝ හතර දෙනෙක් ලෝකුඹු නිරයේ යට ගිහිල්ලා උඩට එනවත් එක්ක ම, අනේ මේ දුක කවද්ද ඉවර වෙන්නේ කියන වචන ටික කියා ගන්න බැරුව මුල් අකුර විතරක් කියද්දී ම ආපහු යටට ගිය එකට තමයි “දු ස න සො” කියන එක විතරක් කොසොල් රජ්ජුරුවන්ට ඇහුනේ.

“දුජ්ජීවිතං අජීවිම්හ යෙ සන්‍තෙත න දද්දමහසෙ,
විජ්ජමානෙසු භොගෙසු දීපං නාකම්හ අත්තනො”. [97]

(නරක ජීවිකාවෙන් ජීවත් වූයෙමු. තිබූ කල්හි නො දුන්නෙමු. සම්පත් ඇති කල්හි, ස්වකීය යහපතට යමක් නො කෙළෙමු.)

---

[97] https://tipitaka.lk/kn-jat-4-2-4 - **ලෝහකුම්භි ජාතකය- පුච්මන්ද වර්ගය- චතුක්ක නිපාතය- ජාතකපාළි- ඛුද්දක නිකාය- 174 පිටුව**

"සට්ඨී වස්සසහස්සානි පරිපුණ්ණානි සබ්බසෝ,
නිරයෙ පච්චමානානං කදා අන්තෝ භවිස්සති".

(නිරයෙහි පැසෙන අපට, මුළුමනින් වසර හැටදහසක් පිරුණි. මේ දුක කවදා අවසන් වන්නේද?)

"නත්ථි අන්තෝ කුතෝ අන්තෝ න අන්තෝ පතිදිස්සති,
තදා හි පකතං පාපං මමං තුයහඤ්ච මාරිස"

(එකල්හි වනාහි මා විසින්ද තා විසින්ද, පව් බොහෝ කොට කරන ලදී. එහෙයින් මේ ලෝකුඹු නිරයේ පැසෙන්නා වූ අපේ දුකෙහි කෙළවරෙක් නැත. කවර හෙයකින් කෙළවරෙක් පෙනේද, කෙළවරෙක් නොපෙනෙන්නේ ය)

"සොහං නූන ඉතෝ ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නෝ කාහාමි කුසලං බහු'න්ති".

(ඒකාන්තයෙන් මම මෙතනින් චුතව ගොස් මනුස්ස ආත්මභාවයක් ලැබුවොත්, මම ත්‍යාගශීලියෙක් වෙනවා. සිල්වත් වෙලා බොහෝ වූ කුසල් කරනවා.)

මෙහෙම කියා කියා පපුවේ අත්ගගහා අඬනවා ලු. භවයේ හැටි කියන්නේ මනුස්ස ලෝකෙට ආවහම ඒ ආපයන්හි වින්ද දුක් අපිට වැහෙනවා. ඒවා සිහි වෙන්නේ නැහැ. භවය නැමති ප්‍රකාරයෙන් වැහිලා. ඒකත් කරුමේ.

මනුස්ස ලෝකේ ඉඳලා නිරයට ගියාට පස්සේ පේනවා මෙච්චර යහපත් තැනක ඉඳලා නේද මම මෙතනට ආවේ කියලා. එතන ඉඳන් ආයේ මෙහේ ආවා ම මෙතන දී පෙන්වන්නේ නැහැ එතන ඉන්න කොට මෙහෙම දුකක් විඳලා නේද ආවේ කියලා. එහෙනම් ඔක්කොම අප්‍රමාදී වෙනවා නේ. ඒකත් කරුමේ. ඒ හින්දා හොඳට සිහි කරන්න මේ කතා කරන තැන සුළුපටු තැනක් නෙමෙයි. භව නිරෝධයට දේශනා කරන ධර්මයක් අහගන්න නැතිකම නිසා අපි ආපු සසර මෙන්න මෙච්චරයි කියලා හිතන්න බැහැ.

"අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො, පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං" [98] - මහණෙනි, අවිද්‍යාවගේ වැස්මෙන් තණ්හාවගෙන් යුක්ත වෙලා ඒ මේ අත දුවන සැරිසරන සත්ත්වයාගේ සසර මුල් කෙළවරක් පෙනෙන්නේ නැහැ, පනවන්න පුළුවන්කමක් නැහැ. එච්චර දීර්ඝ සංසාරයක් ආවේ, යන්නේ මොකක් හින්දා ද? අවිද්‍යාවෙන් හා තණ්හාවෙන් හැදුණු භවය නිසා, ලෝකය නිසා. ඒ හින්දා මේක විහිළුවකට ගන්න සුළුපටු කාරණාවක් නම් නෙමෙයි. භවය පරිහරණය කරන්න එපා.

~ රාහුල තෙරුන්ට දුන් වටිනා අවවාද ~

බුදුරජාණන් වහන්සේ රාහුල තෙරුන් වහන්සේට දේශනා කරන්නේ, ***"නිබ්බිදා බහුලෝ භව"*** [99] – "රාහුල, භවයට කළකිරුනෙක් වෙන්න" කියලා රාහුල සුත්‍රයේ තියෙන්නේ. ඉස්සර නම් හැමදාම උදේ, හවස රාහුලොවාදය කියනවා මෙහේ. දැන් කට්ටිය කියන්නේ නැද්ද? රාහුලොවාදයේ එන කරුණු ටික සිහි කළා නම් හරි ම වටිනවා.

"සති කායගතාත්‍යෂ්තු නිබ්බිදා බහුලෝ භව" - නිතර ම කායගතාසතියේ එළඹ ඉන්න, භවයේ කලකිරෙන්න. භවයට යන්න නොදී කය කෙරෙහි පිහිටි සිහියක් පවත්වන්න කියනවා නිතර ම. අපි යද්දී, එද්දී හැම වෙලාවේ ම සතිපට්ඨානයේ පිහිටුවා ගෙන යන්නේ ඇයි? මොකක් හින්දා ද? බැරිවීමකින් මෙනෙහි කරලා උපාදානයට හිත විදිහට ඇහැ උපදී, රූපය උපදී කියන බයට.

මොකද, භවයට එච්චර බය යි. භවය ගිනි ගත්ත යකඩ ගොඩක් වගේ දකින්නේ. අලුතෙන් අලුතෙන් භවය හැදෙයි කියන බයට කය කෙරෙහි වේදනාව කෙරෙහි, හිත කෙරෙහි, ධර්මය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන

---

[98] https://tipitaka.lk/sn-2-3-1-1 - **තිණකට්ඨ සූත්‍රය- තිණකට්ඨ වර්ගය- අනමතග්ග සංයුක්තය- සංයුත්ත නිකාය 2- 276 පිටුව**

[99] https://tipitaka.lk/kn-snp-2-11 - **රාහුල සූත්‍රය- චූල වර්ගය- සූත්‍රනිපාතය- ඛුද්දක නිකාය- 100 පිටුව**

යනවා එනවා කටයුතු කරනවා. සතර සතිපට්ඨානය නැමැති පියා සතු ඉඩමේ වාසය කරන්නේ ඇයි?

කායගතාසතිය නැතිව අසිහියෙන් ගියොත් මොකක් වෙයි ද? ඇස්, කන්, නාසය ආදී ආයතන ටික ඇතුව ජීවත් වෙනවා අපි. හොඳට රූප බලනවා, හොඳට ශබ්ද අහනවා, ගඳ සුවඳ, රස, ස්පර්ශ විඳිනවා. ඒ ගානේ කර්ම භවය හැදෙනවා. ඒ නිසා අලුතෙන් භවය හැදෙන්නේ නැති වෙන්න කායගතාසතිය වඩනවා. ඒ එක්ක ම ඉන්ද්‍රිය සංවරයේ පිහිටනවා. කායගතාසතිය නිතර ම හුරු කරන්න. යද්දී, එද්දී හැම වෙලාවේ ම කය කෙරෙහි පිහිටි සිහියකින් කටයුතු කරන්න. කායගතාසතිය තුළ වාසය කරමින් යන එන ගානේ එයාට සම්මා දිට්ඨිය වැඩෙනවා.

එයා දන්නවා මේ දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැති කරන මඟ කියන සම්මා දිට්ඨිය අතහැරුනොත් මොකක් වෙයි ද? අවිද්‍යාවෙන් උපාදානයට හිත වූ අරමුණු උපදිනවා. එහෙම වුණොත් උපාදාන වෙලා භවය හැදෙනවා ම යි කියලා භවයට බය හින්දයි සතිපට්ඨානයෙන් වාසය කරන්නේ.

එහෙම යද්දී එද්දී ආදී ඉරියව් පවත්වන අවස්ථාවල දී සතිපට්ඨානයෙන් වාසය කරනවා. එක තැන ඉඳගෙන ඉන්න කොට භවය විදර්ශනා කරනවා. සිහිවෙන සිහිවෙන හැම නිමිත්තක් ම හඳුනා ගන්නවා අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හැදුණු ලෝකේ නේද මේ. ලෝකේ කියන්නේ ම නිමිති ගොන්නක්.

ලෝකය අතහැරුනොත් ඉතුරු වෙන්නේ නිවන. අපිට නිවන අරමුණු වෙන්නේ නැහැ නේ තවම. එහෙනම් අපිට සිහි වෙන්නේ ම ආස්‍රවයන්ගෙන් යුක්ත දේවල් ම යි. ඔය ටික තමයි මට කියන්න තියෙන්නේ. දැන් කරන්න ඕනේ දේ දන්නවා ද කට්ටිය?

වෙන මොකුත් ම නෙමෙයි, මම මේ නැවත නැවත කිවුවේ මේ දුක, මේ දුක ඇතිවීම කියන එකෙන් අහගත්තේ ලෝකය ගැන. ඔය ලෝකය ඇතුළේ තමයි ජරා මරණ ආදී සියලු දුක තියෙන්නේ. අවිද්‍යා, සංඛාර

නොකළොත් ලෝකය උපදින්නේ නැහැ. ඒ හින්දා අවිද්‍යා, සංඛාර නොකර සතිපට්ඨානය තුළ වාසය කරන්න කියලා කිව්වා.

ඔය කිව්වේ වර්තමානයක සංවර වෙන්න ඕනේ ආකාරය. ඒකට උපාය සතිපට්ඨානයේ පිහිටන එක. එතකොට ලෝකය අලුතෙන් උපදින්නේ නැහැ. චතුරාර්ය සත්‍යය අහගත්තේ නැති කාලේ පරණ අවිද්‍යාව නිසා කාමය ඇසුරු කරපු, භවය ඇසුරු කරපු හුරු තියෙනවා. එනම් අවිද්‍යාව නිසා හටගත්ත ආස්‍රව තියෙනවා. ඒ හින්දා ඒ උපන් ආස්‍රව ක්ෂය කර ගන්නත් ඕන.

ඒ උපන් ආස්‍රව ක්ෂය කර ගැනීමට ස්කන්ධයන්ගේ උදය වැය පෙන්නන්න ඕනේ. තව විදිහකින් කිව්වොත් භවය/ පංච උපාදානස්කන්ධ ලෝකය විදර්ශනා කරන්න ඕනේ. මිනිස්සු, සත්ත්වයෝ, පුද්ගලයෝ, ස්ථාන සිහිවෙන කොට මේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හටගත්ත නිමිත්තක් නේද කියලා පෙන්වන්න. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර නැති වුණොත් නැති වෙනවා නේද කියලා පෙන්වන්න.

මේ පංච උපාදානස්කන්ධයක් නේද කියලා හිත තබන්න. මේක භවය නේ කියලා හිත තබන්න. මේක ලෝකේ නේ කියලා හිත තබන්න. උප්පත්ති වශයෙන් එන කොට මේක තිබුණේ නැහැ. අවිද්‍යා, කර්ම, තණ්හා කියන ටිකෙන් ඇහෙන් රූප බලලා උපාදාන වෙච්ච නිසා හැදුණු නිමිති නේද මේ කියන එක පෙන්වනවා.

එහෙම තවම විදර්ශනා කරන්න (ධම්මානුපස්සනාව) බැරි නම් කායාගතාසතිය වඩන්න. යද්දී, එද්දී කය කෙරෙහි සිහිය තියාගෙන ජීවත් වෙන්න. කෙනෙක්ව සිහි වෙනවා නම් ඒ සිහිවෙන කෙනාව ඇත්ත වෙලා හිතීම්, කිම්, කිරීම් කරන්න යන්න එපා, ගනුදෙනු කරන්න එපා. කායගතාසතියෙන් කුණප කොටස් වශයෙන් හෝ ධාතු වශයෙන් හෝ නවසීවථික වශයෙන් හෝ කනබොන ආහාරයෙන් හැදෙන රූපයේ ඇත්ත පෙන්වන්න.

එහෙම කායගතාසතිය වඩමින් ටික දවසක් යන කොට අපිට කවුරු හරි කෙනෙක්ව සිහිවෙන කොට ම අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හටගත්ත නිමිත්තක් නේද කියලා බලන්න පුළුවන් මට්ටමට මනස ලිහිල් වෙනවා. සිහිවෙන සිහිවෙන එකක්වත් පිළිගෙන හිතිම්, කිම්, කිරීම් කරන්න එපා.

මට අහවලා බැන්නා, ගැහුවා කියලා සිහි වෙනවා නම් ඒ සිහිවෙන කිසිම දෙයක් ඇත්ත වෙන්න දෙන්න එපා. නරක මිනිස්සු, නරක කරපු මිනිස්සු, වැරදි කරපු මිනිස්සු, වැරදි වෙච්ච මිනිස්සු කියලා පසුතැවිලි වෙන්න කාවවත් ඉතුරු කරන්න එපා. එහෙම අය හිටියේ නැහැ යථාර්ථ වශයෙන්.

අරමුණ විදර්ශනා කරන්නේ මෙහෙමයි. කෙනෙක්ව සිහිවෙන කොට ස්පර්ශ ආයතන හය පැත්තේ යථාර්ථ වශයෙන් පුද්ගලයෙක් අතීතයේ හිටියෙත් නැහැ, දැන් ඉන්නවත් නෙමෙයි, අනාගතයට ද නැහැ කියලා මුලින් ම ස්පර්ශ ආයතන හයේ සත්ත්ව පුද්ගල ආත්ම නොවන ශූන්‍යත ස්වභාවය පෙන්වන්න.

ඒ කිව්වේ අම්මා කියලා, දරුවා කියලා සිහිවෙන කොට ම ක්ෂණිකව දන්නවා, රූපයේ යථාභූත ස්වභාවය. සතර මහා ධාතුයි, ***"චක්ඛුං අනත්තා, රූපා අනත්තා"*** [100] (ඇහැ අනාත්ම යි, රූපය අනාත්ම යි). කනබොන ආහාරයෙන් හැදෙන රූපය පැත්තේ සත්ත්වයෙක්, පුද්ගලයෙක් අතීතයේවත් ඉඳලා නැහැ, දැනුත් ඉන්නවා නෙමෙයි, අනාගතයට ඉන්නේ ද නැහැ.

එහෙනම් මේ අවිද්‍යා, කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදිහට රූපයක් සීමා කරලා අල්ලගෙන ඒකට 'අපේ අම්මා', 'දරුවා', කියලා හිත හසුරුපු (උපාදාන වෙච්චකම) හින්දා මේ රූපය අහවල් කෙනා ය. එයා ඉන්නේ අන්න අතනයි කියලා ගතියක් මගේ මනසේ ඇතිවෙලා නේද කියලා පෙන්වනවා.

එහෙම නුවණින් පෙන්නුවාට හිත එක පාර පිළිගන්නේ නැහැ. එහෙම අය බාහිර ඉන්නවා ම යි කියලා ආයේ හිත කියනවා. එතකොට අපි නැවත

---

100 https://tipitaka.lk/mn-3-5-6 - **ජ ජක්ක සූත්‍රය- සළායතන වර්ගය- මජ්ඣිම නිකාය 3- 586 පිටුව**

නුවණින් පෙන්වන්න ඕනේ බාහිර ආයතන හය පැත්තේ එහෙම අය ඉන්නවා නෙමෙයි, හිටියෙත් නැහැ, ඉන්නේ ද නැහැ කියන එක.

අපිට නිමල් කියන යහළුවෙක් සිහි වුණා කියලා හිතමු. එතකොට පෙන්වන්න ඕනේ එහෙම අය බාහිර ඉන්නවා කියලා නිමිත්තක් හැදුණේ අවිද්‍යා කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විඳිහට රූපයක් සීමා කරලා අල්ලගෙන ඒකට 'නිමල්' කියලා අපි හිතුවහම, 'ඒ රූපය නිමල්' කියන නිමිත්තක් අපේ මනසේ හැදුණා නේද කියලා පෙන්වනවා.

එහෙම නුවණින් පෙන්නුවාට හිත එක පාර පිළිගන්නේ නැහැ. ඒ වුණාට නිමල් ඉන්නවා නේ, මාත් එක්ක ස්කොලෙත් ගියා නේ කියලා ආයෙත් හිතෙයි. ඔහොම තමයි කෙලෙස් ආස්‍රව එන්නේ. හැබැයි අපි නැවත නුවණින් පෙන්වන්න ඕනේ ස්පර්ශ ආයතන හය පැත්තේ කෙනෙක් අතීතයේවත් ඉඳලා නැහැ. දැනුත් ඉන්නවා නෙමෙයි, අනාගතයට ඉන්නේ ද නැහැ කියලා.

ඇයි එහෙම කියන්නේ? එතකොට රූප කියලා යමක් තියෙනවා නම් සතර මහා ධාතුයි, කනබොන ආහාරයෙන් හැදුණු වර්ණ සටහනක්. අවිද්‍යා, කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විඳිහට ඒ රූපය සීමා කරලා අල්ලගෙන 'නිමල්' කියලා හිතුවහම නිමල් කියලා කෙනෙක් බාහිර ඉන්න බවට ගතියක් මගේ මනසේ ඇතිවෙලා නේද මේ කියලා පෙන්වනවා.

ඔහොම පෙන්නන කොට ටික දවසක් යන කොට හිත පිළිගන්න මට්ටමක් එනවා. මේ කියන දේ ඇත්ත තමයි කියලා පොඩ්ඩක් කීකරු වෙලා ඉන්න ගතියක් එනවා. ඔහොම තමයි ගෙවා ගන්න වෙන්නේ ආස්‍රව. මුල දී පිළිගන්නේ ම නැහැ. නිමල් ඉන්නවා ම යි, මාත් එක්ක ස්කොලේ ගියේ, මාත් එක්ක අතන දී ගහගත්තේ කියලා ඔහොමයි ආස්‍රවවලින් පෙන්වන්නේ.

අවිද්‍යා, කර්මයෙන් උපාදානයට හිත විඳිහට තනි කරලා ඒ රූපය අල්ලගෙන 'නිමල් නේද', 'කමල් නේද', කියලා හිතුවහම, ඒ හිතපු දේ කනබොන ආහාරයෙන් හැදුණු රූපය පැත්තට තබපු ගමන් නිමල් කියලා කෙනෙක් බාහිර ඉන්නවා ම වෙලා, කමල් ඉන්නවා ම යි කියන තැනකින් භවය හැදිලා තියෙන්නේ.

එහෙම මනසෙන් නිමිති සිහි කරන කොට හොඳට නුවණින් ඇස් ඉදිරිපිටට ආපු රූපයේ යථාභූත ස්වභාවය පෙන්වනවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ සතර මහා ධාතුයි කියලා. බත්, පාන්, කවුපි, මුංඇට ආදී කනබොන ආහාරයෙන් හැදුණු රූපයක්. ඒ රූපේ තිබුණොත් කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර ආදී කුණප කොටස් ටිකක් කියලා.

සැරියුත් මහරහතන් වහන්සේ දේශනා කරන්නේ, **“කණු හිටවලා, කෝටු බැඳලා, මැටි ඔබ්බලා අවකාශ ධාතුව අනුරාගෙන රාශි වෙච්ච රූපය ‘ගෙයක්’ යන ප්‍රඥප්තියට යනවා. ඒ වගේ ඇටකුරු නැමැති කණු හිටවලා, නහරවැල් නැමැති රැහැන්වලින් බැඳලා, මස් ඔබ්බලා අවකාශ ධාතුව අනුරාගෙන රාශි වෙච්ච කනබොන ආහාරයෙන් හැදුණු රූපය ‘කය’ යැයි යන ප්‍රඥප්තියට යනවා”.**[101]

එබඳු වූ රූපයක් ඇස් ඉදිරිපිටට එන කොට අවිද්‍යා, කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදිහට හිතෙන් අල්ලගෙන ‘පුද්ගලයෙක්’, ‘කෙනෙක්’ කියලා උපාදාන වශයෙන් හිත හසුරුපුකම හින්දා මෙහෙම කෙනෙක් බාහිර ඉන්නවා කියන නිමිත්තක් ඇති වෙලා නේද තියෙන්නේ කියන එක පෙන්වනවා. එතකොට එයාගේ හිතට බැසගන්න බැහැ කෙනෙක් ඉන්නවා කියලා බාහිරයට යන්න.

මම අවිද්‍යාවෙන් උපාදාන වෙන්න පුළුවන් විදිහට රූපයක් තනි කරලා අරගෙන ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියලා රූපයේ හැසිරුනේ නැති වුණා නම් කනබොන ආහාරයෙන් හැදුණු ඇටකුරු හිටවලා, මස් ඔබ්බලා, ලේ නහරවලින් ගැට ගහපු කය ගැන කෙනෙක්, පුද්ගලයෙක් කියන අදහස ඇති වෙන්නේ නැහැ කියලා පෙන්වනවා හොඳට. ඒ විදිහට සිහිවෙන සිහිවෙන අයව විදර්ශනා කරන්න.

යන කොට, එන කොට හොඳට සතිපට්ඨානයේ ඉන්න. කය කෙරෙහි එළඹ සිටි සිහිය ඇති තරමට ඕගොල්ලොන්ට රැකවරණය යි. ඉක්මනට ආස්‍රව ක්ෂය කර ගන්න ඕනේ නම් හොඳට සතිපට්ඨානය ජීවිතය කර ගන්න

---

101 https://tipitaka.lk/mn-1-3-8/sinh - **මහාහත්ථිපදෝපම සූත්‍රය- ඕපම්ම වර්ගය- මජ්ඣිම නිකාය I- 459 පිටුව**

වෙනවා යද්දී, එද්දී, වැඩ කටයුතු කරද්දී. එහෙම සිහිය පිහිටුවා ගෙන ඉන්ද්‍රිය සංවරයෙනුත් යුක්ත වෙනවා.

"චකඛුනා රූපං දිසවා න නිමිත්තගගාහී හොති න අනුබ්‍යඤජනගගාහී, යත්වාධිකරණමෙනං චකඛුන්ද්‍රියං අසංවුතං විහරනතං අභිජඣාදොමනසසා පාපකා අකුසලා ධමමා අනවාසසවෙය්‍යුං, තසස සංවරාය පටිපජජති, රකඛති චකඛුන්ද්‍රියං, චකඛුන්ද්‍රියෙ සංවරං ආපජජති" [102]

ඇහෙන් රූප දැකලා නිමිති අනුනිමිති නොගන්නා සුළ වන්න. යමක් හේතු කොට ගෙන චක්ඛු ඉන්ද්‍රිය අසංවෘත කොට වාසය කිරීම තුළින් ලෝභ, ද්වේශ ළාමක අකුසල ධර්මයෝ ලුහු බඳී නම් චක්ඛු ඉන්ද්‍රියේ සංවරය පිණිස පැමිණෙන්න. කන, නාසය, දිව, කය, මනස කියන අනික් ඉන්ද්‍රිය ටිකත් සංවර කර ගන්න වෙනවා ඒ වගේ.

යන කොට එන කොට කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන යෑම් ඊම් කරනවා. එක තැනක ඉඳගෙන ඉන්න කොට නිමල්, කමල් කියලා පුද්ගලයෝ සිහිවෙන කොට කනබොන බත්, පාන්, කවුපි, මුං ඇටවලින් හැදුණු හෝ කණු හිටවලා කෝටු බැඳලා මැටි ඔබ්බපු බිත්තියක් වගේ ඇටකූරු හිටවලා ලේ නහරින් බැඳලා මස් ඔබ්බපු අවකාශ ධාතුව අනුරාගෙන පවතින රූපය අවිද්‍යා, කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් මට්ටමට සීමා කරලා අරගෙන 'පුද්ගලයෙක්', 'කෙනෙක්' හැටියට මම නේ හිතුවේ.

එහෙම හිතපු ගතිය ඔසවලා කනබොන ආහාරයෙන් හැදුණු රූපයට තබපු නිසා නේද බාහිර පුද්ගලයෙක්, කෙනෙක් ඉන්නවා කියනකම මෙන්න මෙහෙම නේද හැදුණේ කියලා පෙන්වනවා.

අවිද්‍යා කර්මයෙන් මම උපාදානයට සුදුසු විදිහට රූපය අල්ලගත්තේ නැති වුණා නම් මට පංච උපාදානස්කන්ධයක් නැහැ. හදාගත්ත පංච උපාදානස්කන්ධයට 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' කියලා උපාදාන නොවුණා නම් සත්ත්වයෝ පුද්ගලයෝ ඉන්නවා කියන පංච උපාදානස්කන්ධ ලෝකය හැදෙන්නේ නැහැ කියලා පෙන්වනවා.

---

102 https://tipitaka.lk/mn-1-4-9 - **මහාඅස්සපුර සූත්‍රය- මහා යමක වර්ගය- මජ්ඣිම නිකාය 1- 636 පිටුව**

සිහි ඇතුව ආනාපානසතිය වඩනවා. ටිකක් වෙලා ආනාපානසතිය වඩලා සිහිවෙන අරමුණු ඔය වගේ විදර්ශනා කරනවා ටිකක්. එක දිගට ම විදර්ශනා කරන්නෙත් නැහැ. ආයෙත් හිතාමතා ම නතර කරලා සති නිමිත්තේ හිත තියාගෙන ආනාපානසතිය වඩනවා.

විශේෂයෙන් ම සවිඤ්ඤාණක අරමුණු තමයි ගොඩක් සිහි වෙන්නේ. නිතර ම කතා කරපු අය යි, කතා කරන අය යි, වැරදිච්ච අය, වරදපු අය, බැනපු අය, ගහපු අය, නින්දා කරපු අය, තමනුත් අනික් අයට ගහපුවා, බැනපුවා, නින්දා කරපුවා, හොඳ කියපුවා, ගුණ කියපුවා, ආදරේ කරපුවා, තරහා වෙච්ච ඒවා ඕවා තමයි සිහි වෙන්නේ. අවිඤ්ඤාණක තැන් සිහි වෙන්නේ බොහොම ටිකයි.

අවිඤ්ඤාණක අරමුණු සිහිවෙන කොට විදර්ශනා කරන්නේ සතර මහා ධාතූන්ගෙන් හටගත්ත වර්ණ සටහනක් තියෙන තැනක උපාදාන වෙන්න පුළුවන් විදිහට අවිද්‍යා, කර්මයෙන් සීමා කරලා අරගෙන 'ගහක්', 'කෝප්පයක්', 'මේසයක්' කියලා හිතලා, ඒ හිතපු එක බාහිර සතර මහා ධාතු රූපය පැත්තට තබපු නිසා බාහිර ගස් තියෙනවා, කෝප්ප තියෙනවා කියන භවය ඇතිවෙලා තියෙනවා නේද කියලා පෙන්වනවා.

ආපහු දාන ශාලාවට යන්න ඕනේ වුණහම වටපිට බල බලා එක එක ඒවා හිත හිතා යන්නේ නැහැ. කය කෙරෙහි ම සිහි ඇතුව යනවා. එහෙම නැතිනම් යන අඩියක් අඩියක් ගානේ කකුල පොළොවේ ස්පර්ශ වෙන කොට කකුලේ තියෙන 'පඨවි' (තද ගතිය) පොළොවේ තියෙන 'පඨවි' (තද ගතිය ට) හිත තබමින් 'පඨවි', 'පඨවි' කියමින් මෙනෙහි කරමින් හෝ යනවා.

එහෙම කරන කොට නීවරණ අඩු වෙනවා, හිත සමාධි වෙනවා. භවයට යන්න තියෙන ඉඩත් නැති වෙනවා. ඒ විදිහට සතිපට්ඨානයෙන් වාසය කරනවා. අවශ්‍ය ම කටයුත්තක් තිබ්බොත් කය කෙරෙහි සිහිය තබාගෙන ඒක කරනවා. එක තැනක ඉඳගත්තොත් සමථ කමටහනකින් හිත වඩමින් භවය විදර්ශනා කරනවා. තියෙනවා, ඉන්නවා කියලා හැඟෙන ලෝකය විදර්ශනා කර කර සමථ නිමිත්ත වඩනවා. ආයෙත් සමථ නිමිත්ත

වඩමින් විදර්ශනා කරනවා මාරුවෙන් මාරුවට. ආයෙත් භාවනා කරලා නැගිටලා යන කොට, එන කොට සතිපට්ඨානයෙන් ඒ ඒ ඉරියව් පවත්වනවා.

~ ආදීනව මෙනෙහි කිරීම ~

කලින් කලට ලෝකයේ ආදීනව මෙනෙහි කරනවා. අද මේ කාලේ, මේ මොහොතේ, මේ දැන් වෙන කොට මරණයේ ප්‍රභේද කොච්චර ඇත් ද. භවයේ හිටියොත් ඔය හැම ප්‍රභේදයකට ම මැරෙන්න තියෙන හේතුව තියෙනවා නේද, ඒ මළ ගෙවල්වල මොන මොන විදිහට අඬන අය ඇත් ද.

අම්මා මැරිලා දරුවෝ අඬනවා. දරුවෝ මැරිලා අම්මා අඬනවා. අම්මා යි, දරුවෝ යි අඬනවා තාත්තා මැරිලා. තාත්තා යි, අම්මා යි අඬනවා දරුවෝ මැරිලා. කෑගහනවා, විලාප දෙනවා, හූ කියනවා, අනේ අපේ තාත්තා ගෙනියන්න එපා අම්මෝ කියලා අඬනවා නේ. මළ ගෙවල්වලට ගිහින් පොඩ්ඩක් පැත්තකට වෙලා බලන්න අඬ අඬා විලාප දෙමින් කියන දේවල්.

විහිලු නෙමෙයි, ඒ දුක. ඒ විදිහට අඬන හේතුව තියාගෙන නේද මම මේ ඉන්නේ කියලා පෙන්වනවා. ඔහොම ආදීනව පෙන්වන කොට උත්සාහවත් වෙනවා පංච උපාදානස්කන්ධ ලෝකයෙන් මිදෙන්න. පංච උපාදානස්කන්ධ ලෝකය කියලා කියන්නේ හතුරෙක්, දුකක්, රෝගයක්, හුලක්, ගඩක් හැටියට දකිනවා.

ඔය කියපු කමටහන් ටිකේ මාරුවෙන් මාරුවට කුමන හෝ කමටහනක ඉන්න කොට ආස්‍රව ක්ෂය වෙනවා. තමන් හොඳට ම දන්නවා සිහිය පිහිටුවනවා, විදර්ශනා කරනවා, සමථ කමටහනකින් හිත වඩනවා, ඉන්ද්‍රිය සංවර කර ගෙන ඉන්නවා, ආදීනවයෙන් බලනවා කියන මේ සේරම උපායයන් ටික භවයෙන් මිදෙන්න කියලා.

තව විදිහකින් කිව්වොත් කාමය ඇසුරු කරපු හුරුව, භවය ඇසුරු කරපු හුරුව, අවිද්‍යාව ඇසුරු කරපු හුරුව ගෙවාගන්න කියලා. එනම් මේ ඔක්කොම ටික කරන්නේ ආස්‍රව ක්ෂය කර ගන්න. ක්ෂීණාස්‍රව වුණු දවසට

එනම් ආස්‍රව ක්ෂය වුණු දවසට නුවණ එනවා ඔබ වහන්සේලාට ම මගේ ආස්‍රවයන් සියල්ල ගෙවිලා ඉවරයි කියලා.

ආස්‍රව ඉවරයි කියන්න හේතුව මොකක්ද දන්නවා ද? භවය නැහැ. එතකොට ටක් ගාලා දන්නවා ***"ඛීණා ජාති"*** [103] - ඉපදීම ඉවරයි. අපිට වගේ අම්මා, තාත්තා, ගෙවල් දොරවල් මතක් වෙවී පිච්චෙනකන් දුක්වෙන ඒවා මේ ජීවිතයේ ම නැහැ එතකොට. ප්‍රතිසන්ධි වශයෙනුත් නැහැ.

ආස්‍රව ක්ෂය යි නම් සතිපට්ඨානයේ පිහිටියා වෙනවා. සිහිය ඇති කර ගන්න ඕනේ කියලා උත්සාහවත් වෙන්න ඕනේ නැහැ. ස්වභාවයෙන් ම අකොප්‍ය යි. ඔබවහන්සේලාගේ සිහිය එතකොට කායගතාසතියේ ම පිහිටනවා. වෙනස් වෙන්නේ ම නැහැ.

ඉබේම ඉන්නේ සතිපට්ඨානයේ ම යි. රහතන් වහන්සේ කියන්නේ සිහිය පිහිටිලා ම තියෙන තැනක්. සිහියෙන් වෙන්වෙන්නේ නැහැ. සිහිය යි විමුක්තිය යි කියන එක වෙනස් වෙන්නේ නැහැ, අකොප්‍ය යි. රහතන් වහන්සේ අනික් අයට උපකාරී පිණිසයි ජීවත් වෙන්නේ.

හොඳට ත්‍රිපිටකය ඉගෙන ගන්නවා, හදාරනවා භාණ්ඩාගාර පර්යාප්තිය හැටියට. පශ්චිම ජනතාවට අනුකම්පා පිණිස මේ පණිවිඩය ඉතුරු කරලා දෙන්න ඕනේ හින්දා හොඳට ත්‍රිපිටකය ඉගෙන ගන්නවා. සාසනය භාණ්ඩාගාරයක් හැටියට රැකලා දෙන්න ඕනේ හින්දා.

මට පුළුවන් ටික පුතේ, මම කියලා දෙනවා. තම තමන් ම ඉතින් තම තමන්ට පිහිටක් සරණක් කර ගන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ***"අත්තදීපා භිකඛවෙ, විහරථ අත්තසරණා අනඤ්ඤසරණා ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා."*** [104] - මහණෙනි, තමා තමාට පිහිටක් කොට, තමා තමාට සරණක් කොට වාසය කරන්න. වෙන සරණක්, වෙන පිහිටක් නැහැ. ධර්මය පහනක් කොට, ධර්මය ආලෝකයක් කොට වාසය කරන්න. වෙන සරණක්, වෙන පිහිටක් නැහැ කියලා. තමන්වයි, ධර්මය යි පිහිටක්

---

103 https://tipitaka.lk/an-4-4-5-8 - **තප සූත්‍රය- මහා වර්ගය- චතුක්ක නිපාතය- අඞ්ගුත්තර නිකාය 2- 402 පිටුව**

104 https://tipitaka.lk/sn-3-1-1-5-1 - **අත්තදීප සූත්‍රය- අත්තදීප වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 76 පිටුව**

කරගෙන වාසය කරන්න කියලා දේශනා කරනවා. “මහණෙනි, මම මට පිහිටක් කර ගත්තා. නුඹලා නුඹලාට පිහිටක් කර ගන්න”.

“වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථා”ති.[105] – “මහණෙනි, මේ සියලු සංස්කාරයෝ නැසෙන සුළුයි. අප්‍රමාදීව නිවන සම්පාදනය කර ගන්න”. මොකද, මේ සංස්කාර ලෝකයේ හැම දෙයක් ම නැසෙනවා.

“සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො’ති” [106] - මේ ලෝකේ ඇතුළේ ප්‍රිය වූ, මනාප වූ යම්තාක් දෙයක් තියෙයි නම් ඒ හැම දෙයින් ම වෙන්වෙන්න සිද්ධවෙන දවසක් එනවා ම යි. මොන තරම් ප්‍රිය වුණත්, මොන තරම් මනාප වුණත්, මොන තරම් වටිනවා වුණත්, හොඳ වුණත් ඒවා නොයෙක් ස්වභාවයට වෙනස් ස්වභාවයට යනවා ම යි. ඒ හින්දා ආස්‍රව ක්ෂය කිරීම අප්‍රමාදීව සම්පාදනය කර ගන්න.

ඔබ වහන්සේලා මම මේ කියන අර්ථය ගැන සැක කරන්න එපා. කරලා බලන්නකෝ. ඔය ආස්‍රව ටික ගෙවෙන්නේ නැද්ද කියලා. වැඩි දවස් යන්න ඕනේ නැහැ. **දුක්කර සූත්‍රයේ දී**[107] සැරියුත් මහරහතන් වහන්සේගෙන් අහන්නේ, මේ ශාසනයේ දුෂ්කර ම දේ මොකක් ද? පැවිද්ද. පැවිද්දාට දුෂ්කර ම දේ මොකක් ද? පැවිද්දේ ඇලෙන එක. පැවිද්දේ ඇලෙන කෙනාට දුෂ්කර ම දේ මොකක් ද? ධර්මානුධර්ම ප්‍රතිපත්තියේ හැසිරෙන එක. ධර්මානුධර්ම ප්‍රතිපත්තියේ යෙදෙන කෙනාට නොබෝ කාලෙකින් ආස්‍රව ක්ෂය වෙනවා කියලා උත්තර දෙන්නේ.

මාර්ගය හම්බ වෙලා මාර්ගය වඩන කෙනා ගැන පෙන්වන්නේ ආස්‍රව ක්ෂය වෙන්න යන්නේ උපරිම අවුරුදු හතයි කියලා. දින හතයි, අවුරුදු හතයි ඇතුළත අනාගාමී හෝ රහත් ඵලයට පත්වෙනවා කියලා.[108] අනන්ත සංසාරයට සාපේක්ෂව අවුරුදු හත නෙමෙයි, මේ ජීවිතයේ අන්තිම මොහොතේ හෝ අධිගමයක් ලබා ගන්න පුළුවන් වුණොත්, රහත් වෙන්න

---

105 https://tipitaka.lk/sn-1-6-2-5 - **පරිනිබ්බාණ සූත්‍රය- පරිනිබ්බාණ වර්ගය- බ්‍රහ්ම සංයුත්තය- සංයුත්ත නිකාය 1- 282 පිටුව**

106 https://tipitaka.lk/an-5-2-1-7 - **ඨාන සූත්‍රය- නීවරණ වර්ගය- පඤ්චකනිපාතය- අඞ්ගුත්තර නිකාය- 116 පිටුව**

107 https://tipitaka.lk/sn-4-4-16/sinh - **දුක්කර සූත්‍රය- ජම්බුඛාදක සංයුක්තය- සංයුත්ත නිකාය 4- 487 පිටුව**

108 https://tipitaka.lk/dn-2-9/sinh - **මහා සතිපට්ඨාන සූත්‍රය- දීඝ නිකාය 2- 499 පිටුව**

පුළුවන් වුණොත් ශීඝ්‍රව නිවන් දැක්කා, වහා නිවන් දැක්කා වගේ. එච්චරට දුක් විඳිමින් ආපු අතිදීර්ඝ සසර ගමනක් මේ.

ඒ හින්දා හොඳට පෙන්වන්න භවයේ තියෙන ආදීනව. මම දවසක් එළදෙනක් දැක්කා. ඒ එළදෙනගේ පිට මැද්දේ ලොකු තුවාලයක්. ඒ තුවාලෙට පණුවෝ ගොඩ ගහලා. කපුටෝ රැිනක් වහලා කොට කොට පණුවෝ ගන්නවා. අර එළදෙන එහාට දඟලනවා, මෙහාට දඟලනවා, එහාට දුවනවා, මෙහාට දුවනවා, වල්ගෙන් ගහනවා. හෙට දවසේ අපේ කතාව ඒ. භවයේ නැඳෑකම්. ඒ හින්දා අප්‍රමාදී වෙන්න.

~ මනෝ විතර්ක හකුළුවා ගන්න ~

“ඉබ්බා සිය කබලෙහි අවයව බහා ගත්තා වගේ මනෝ විතර්ක හකුළුවා ගන්න”.[109] කතාව දන්නවා ද ඔක්කොමලා. කියන්න ඕනේ ද ආපහු? ගංගා නම් ගඟේ උඩ ඉඳලා පහතට එනවා ඉබ්බෙක්. පහත ඉඳන් උඩහට එනවා නරියෙක්. නරියා දැක්කා ඉබ්බාව. ඉබ්බා දැක්කා නරියාව ඈත ඉඳලා ම.

නරියා කල්පනා කරනවා “වරෙන් ළඟට උඹේ ඔළුව හෝ කඩාගෙන කනවා, කකුලක් හෝ කඩාගෙන කනවා, අතක් හෝ කඩාගෙන කනවා කියලා. ඉබ්බත් දැක්කා නරියාව. ඉබ්බා හිතනවා මෙහෙම; උඹ ඔළුව හරි කඩාගෙන කන්න, කකුලක් හරි කඩාගෙන කන්න, අතක් හරි කඩාගෙන කන්න නේ එන්නේ. මම නම් දාන්නේ නැහැ එකක්වත් එළියට කියලා, නරියා ළං වෙන කොට ම ඉබ්බා ඔළුවයි, කකුල් දෙකයි, අත් දෙකයි ටක්ගාලා දාගත්තා කටුවේ ඇතුළට.

නරියත් සද්දු නැතුව බලාගෙන ඉන්නවා, ඔළුව එළියට දැම්මොත් ඔළුව කඩාගෙන කන්න. අතක් එළියට දැම්මොත් අත කඩාගෙන කන්න. කකුලක් එළියට දැම්මොත් කකුල කඩාගෙන කන්න. *“භූතපුබ්බං භික්ඛවෙ”*

---

109 https://tipitaka.lk/sn-4-1-19-3/sinh - **කුම්මොපම සූත්‍රය- ආසීවිස වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 351 පිටුව**

කියලා බුදුරජාණන් වහන්සේ පෙර වූ සිද්ධියක් මේ කියන්නේ “මහණෙනි, පෙර වූවක් කියමි” කියලා.

ඉබ්බා හිතනවලු, උඹ දැන් හිතාගෙන ඇති මම ඔළුව දැම්මොත් ඔළුව කඩාගෙන කන්න. කකුල දැම්මොත් කකුල කඩාගෙන කන්න. අත දැම්මොත් අත කඩාගෙන කන්න. ඒ හින්දා මම නම් දාන්නේ නැහැ එක අවයවයක්වත් එළියට කියලා ඉබ්බා දැන් අවයව ටික හකුලාගෙන කටුව ඇතුළේ ම ඉන්නවා. නරියා බලාගෙන ඉන්නවා එකක් හරි දාපං කඩාගෙන කනවා කියලා. ඉබ්බා එක අවයවයක්වත් කටුවෙන් එළියට දැම්මේ නැහැ. නරියාට ම හිටියා ඇතිවෙලා මූ නම් අවයව කබලෙන් එළියට දාන්නෙ නැහැ කියලා නරියා හෙම්බත් වෙලා ගියාලු.

“මහණෙනි, නරියා වගේ තමයි මාරයා. ඉබ්බාගේ කෑලි පහ වගේ තමයි ඇහැ, කන, දිව, නාසය, කය. මහණෙනි, ඇහැ නම් එළියට දාන්න එපා, කන නම් එළියට දාන්න එපා, නාසය නම් එළියට දාන්න එපා, දිව නම් එළියට දාන්න එපා, කය නම් එළියට දාන්න එපා මාරයාට අහුවෙනවා ම යි. ඉබ්බා කබලෙහි සිය අවයව බහාගත්තා වගේ මනෝ විතර්ක හකුළුවා ගන්න. ඇහැ, කන, නාසය, දිව, කය එළියට දාන්න එපා. එහෙම වුණොත් මාරයා ඉඩක් අවකාශයක් ලබන්නේ නැහැ.

ඒ හින්දා ඉබ්බා සිය කබලෙහි අවයව බහාගත්තා වගේ ඇහැ, කන, දිව, නාසය, කය එළියට දාන්නේ නැතුව සතර සතිපට්ඨානය තුළ වාසය කරන්න. නොබෝ දවසකින් ඔබ වහන්සේලා යමක් සඳහා පැවිදි වුණා නම් ඒ ශ්‍රමණ කෘත්‍ය සාක්ෂාත් කර ගන්න ලැබෙයි. ඒ සඳහා මේ දේශනාව හේතු උපනිශ්‍රය වේවා!

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.02.15 දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසන වාසී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සිදු කළ 01 වන ධර්ම දේශනාව ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අපි උප්පත්ති වශයෙන් පැමිණෙන කොට ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන ආධ්‍යාත්මික ආයතන ටික ඇතුව ආවේ. නමුත් ඒවායේ නිමිති තිබුණේ නැහැ අපිට. මේ තමයි ඇහැ, කන, දිව, නාසය, කය, මනස කියලා කියන්න අපි දන්නේ නැහැ. මාස තුන හතරක පොඩි ළමයෙක් ගත්තොත්, ඒ ළමයාට ‘මේ මගේ වකුගඩුව, වකුගඩුවේ හරස්කඩ මෙහෙමයි, වකුගඩුව දන් දෙන්න ඕන’ වගේ සිතිවිලි පහළ වෙන්නේ නෑනේ. එයාගේ ලෝකේ එහෙම එකක් නැහැ. වකුගඩුව එයාට ජීවත් වෙන්න උදව් වෙලා තියෙනවා, එච්චරයි.

ඒ වගේ තමයි අපි උප්පත්ති වශයෙන් පැමිණෙන කොට ඇහැ, කන, දිව, නාසය, කය, මනස කියන ආයතන ටික ගැන නිමිති නැහැ. ඇහැ කියන්නේ අනිදස්සන යි. ඇහැ කවදාවත් දකින්න බැහැ. කන, දිව, නාසය, කය, මනස කවදාවත් දකින්න බැහැ. දැකලා නැති දෙයක් අරහයා අපිට කෙලෙස් ඇති වෙන්න පුළුවන් ද? බැහැ.

නමුත් අපි ටික ටික ලොකුවෙන කොට රූප සටහනක් දිහා බලාගෙන ඉගෙන ගන්නවා මේ තමයි වකුගඩුව, වකුගඩුවේ හරස්කඩ මෙහෙමයි කියලා. ඔන්න එතකොට ඒ ගැන දැනුමක් එනවා. ඊට පස්සේ හිතා ගන්නවා මං ගාව තියෙන වකුගඩුවත් මෙහෙම තමයි කියලා.

ලොකුවෙන කොට කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා කණ්ණාඩියේ වැටිලා තියෙන ඡායාව දිහා බලලා මේ තමයි ඇහැ කියලා හිතා ගන්නවා. නැත්නම් තව රූපායතනයක් දිහා බලලා ‘ආ මගේ ඇස් දෙකත් මේ වගේ තමයි’ කියලා හිතා ගන්නවා. ඔහොම තමයි අපි ඇහැ ගැන නිමිති ගන්නේ,

භවය හදා ගන්නේ. ඔහොම කන, නාසය, දිව, කය, මනස ගැන නිමිති ගන්න කොට පරිපූර්ණ අඟපසඟ සහිත මනුස්සයෙක් හැදෙනවා.

නමුත් අපි උප්පත්ති වශයෙන් පැමිණෙන කොට ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන ආධ්‍යාත්මික ආයතන ගැන නිමිති තිබුණේ නැහැ. හැබැයි ජීවිතය වෙලා පෙනෙනවා (දිට්ඨ), ඇහෙනවා (සුත), දැනෙනවා (මුත), දැන ගන්නවා (විඤ්ඤාත) කියන සිද්ධි ටික වෙනවා.

හේතු නිසා පෙනෙනවා, ඇහෙනවා, දැනෙනවා, දැන ගන්නවා කියන සිද්ධියක් තියෙනවා. පෙනෙන්න, ඇහෙන්න, දැනෙන්න, දැන ගන්න තියෙන හේතු ටික නැතිවෙන කොට පෙනෙන, ඇහෙන, දැනෙන, දැන ගන්න එක නැති වෙනවා කියන ධර්මතාවය සිද්ධ වෙනවා.

ඔය තුළ දී බාහිර ආයතනයක් රැස්වෙලා නැහැ. ඒ කියන්නේ අද අපිට තියෙනවානේ 'භවය' කියලා එකක්. අරෙහෙට යන්න පුළුවන්, මෙහෙට යන්න පුළුවන්, අනුරාධපුරය මෙහෙමයි, ගම මෙහෙමයි කියලා අපිට දැනුමක් (නිමිති) එකතු වෙලා තියනවානේ. එහෙම අපිට නිමිති තිබුණේ නැහැ, අපි උප්පත්ති වශයෙන් එන කොට.

එතකොට චතුරාර්ය සත්‍යය අවබෝධය ඇතුව පුරාණ කර්මයට හටගත්ත ආයතන ටික ගැන නිමිති නැතිව කෙනෙක් හිටියා නම්, යම් දවසක් එනවා ඒ පුරාණ කර්මයට හටගත්ත ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන ආයතන ටිකේ ආයු සන්තතිය ඉවරවෙන. රතන සූත්‍රයේ කියන්නේ *"ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං"* කියලා. පුරාණ කර්ම ක්ෂය වෙනවා, අලුතින් භවයකුත් නැහැ. *"විරත්තචිත්තා ආයතිකෙ භවසම්"* නැවත භවයකට නොඇලුණු සිතින් පිරිනිවෙනවා කියලා.

ආයතන ගැන නිමිති නැතුව උප්පත්ති වශයෙන් ආපු අපි, *"ඉධ පරිපක්කතත්තා ආයතනානං මොහෝ අවිජ්ජා"* - ආයතන ටික මුහුකුරා යන කොට අවිද්‍යාව නිසා පංච උපාදානස්කන්ධයක් හදාගෙන ඊට උපාදාන වෙලා භවය හදාගන්නවා. භවය වුණොත් ඉපදීම, ජරා, මරණ නවත්වන්න බැහැ ම යි.

පංච උපාදානස්කන්ධය නැති වුණොත් උපාදාන වෙන්න බැහැ. උපාදාන නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ජාති, ජරා, මරණ නැහැ. ඒ හින්දා පංච උපාදානස්කන්ධයේ නිරෝධයට කටයුතු කිරීම පිණිස කාය, වේදනා, චිත්ත, ධම්ම කියන ටිකට සිහිය පිහිටුවා ගෙන වාසය කරන්න කියලා කියනවා.

අවිද්‍යාව හින්දා අපි රූපය හෝ, ශබ්දය හෝ, ගන්ධය හෝ, රසය හෝ, ඵොට්ඨබ්බය හෝ, ධම්ම පැත්තට හිතනවා. ඒකට තමයි *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"* කියලා කියන්නේ. එහෙම හිතන කොට රූපය ගැන, ශබ්දය ගැන, ගන්ධය ගැන, රසය ගැන, ඵොට්ඨබ්බය ගැන, ධම්ම ගැන දැනුම ඇති වෙනවා. එතකොට හිත නාම රූප දෙක පැත්තට නැඹුරු වෙනවා.

අපි යමක් බලනවා කියන්නෙ ම පෙනෙන පැත්තට හිත නැඹුරු වෙනවා. එතකොට උපාදානයට හිත විදිහට ආධ්‍යාත්මික ආයතන ටික හැදිලා රූප පේනවා, ශබ්ද ඇහෙනවා, ගඳ සුවඳ දැනෙනවා, රස දැනෙනවා, ඵොට්ඨබ්බ දැනෙනවා. එතකොට ඒවාට තණ්හා උපාදාන වෙලා අපිට ඒ නිමිති හිටිනවා.

ඊට පස්සේ අපි දන්නේ නැහැ ඒ නිමිති අපි හදාගත්ත ඒවා කියලා. අපිට ඒක සාමාන්‍ය දෙයක් වෙනවා. එතකොට වෙන්නේ පුරාණ කර්මයෙන් හටගත්ත විපාක ටික ගෙවිලා යන දවසට නැවත භවයකට ඇලුණු සිතින් ආපහු ප්‍රතිසන්ධියට යනවා.

බුදුරජාණන් වහන්සේ මේ විදියට ඔය කාරණාව පෙන්නලා, සීමා නොකරන ලද මනසේ වාසය කරන එක තමයි නිර්භය ම ස්ථානය කියලා පෙන්නනවා. එතන ඉන්න පෙන්නුවට අපිට දැන් එතන ඉන්න බැහැ. ඇයි ඒ? පංච උපාදානස්කන්ධ ලෝකය හදාගෙන ගනුදෙනු කරපු එකේ හුරු පුරුදු ටිකක් තියෙනවා.

කාම බඩු භාණ්ඩ ඇසුරු කරපු, පුද්ගලයන් ඇසුරු කරපු, ස්ථාන ඇසුරු කරපු හුරු පුරුදු ටිකක් තියෙනවා. නිතර ම ඒවා සිහි කර කර බාහිර

ආයතන පැත්තට යනවා. නොයන්න බැරි වුණොත් වෙහෙසයි. ඒ හින්දා කොහොම හරි ඒවා එක්ක ගනුදෙනු කරමින් ඉඳලා අන්තිමට ඒවාට ඇලුණු සිතින් නැවත සසරට යනවා.

ඉතින් ඒ නිසා හොඳට සීලයක පිහිටලා සමාධිමත් මනසකින් ආස්‍රව ක්ෂය කර ගන්න ඕන. ආස්‍රව ක්ෂය කර ගත්තහම ඉබේම සීමා නොකරන ලද මනසට එනවා චතුරාර්ය සත්‍යය අවබෝධය ඇතුව. එතන ඉඳන් කළ යුත්තක් නැහැ. ජීවත් වෙන්න විතරයි තියෙන්නේ. එතන ඉන්න කෙනා එහෙම ම පිරිනිවෙනවා මිසක යන්න තැනක් නැහැ. අපි හැමෝම උපදින කොට හිටියේ නිමිති නැති තැනක. ඉන් පස්සේ මේ ආයතන ටික ඇසුරු කරන්න ගිහින් තමයි නිමිති හැදුණේ.

ඔබ වහන්සේගේ ගම විලේගොඩ නේද? දැන් ඔබ වහන්සේට හිටපු ගෙදර, ගමේ තියෙන තැන්, ආපු ගියපු තැන් ගැන කියන්න පුළුවන් නේ. දැන් බලන්න ඒ නිමිති ටික අපිට තියෙනවා ද කියලා? නැහැ. දැන් ඒ ගම හේතුවෙන්, ඒ ස්ථාන හේතුවෙන් සිහි කරලා දුක් විඳින්න හෝ වෙහෙසකර බව ඇති කරන නිමිත්තක් අපිට තියෙනවා ද? නැහැ.

දැන් අපිට ඒ ගම ගැන, ගමේ ස්ථාන ගැන, ආපු ගියපු තැන් ගැන නිමිති මොකුත් නැහැ වගේ, මුන්වහන්සේ ඉපදෙන කොටත් එබඳු නිමිති නැති තැනක තමයි හිටියේ. ඊට පස්සේ ආයතන ටික ඇසුරු කරන්න ගිහිල්ලයි ඔය නිමිති හැදුණේ.

දැන් ඒ ගමට තව එක් කෙනෙක් යනවා සතිපට්ඨානයට සිහියක් නැතුව විසිරුණු මනසක් සහිතව. මුන්වහන්සේ එක්ක ම ගිහිල්ලා, ගමේ ඇවිදලා විවිධ තැන් බලලා ආවාම එයාගේ මනසෙත් ඒ ගම පිළිබඳ නිමිති තියෙයි. මුන්වහන්සේට වගේ ම ඉන්ද්‍රිය අසංවරයෙන් ලෝකේ ජීවත්වෙන විදිහට අරමුණු අරගෙන ආපු අනික් කෙනාටත් ලෙඩේ බෝවුණා. මේක වෛරස් එකක් වගේ එකක්.

ඊට පස්සේ තව අයෙක් ඒ ගමට ම, හොඳින් කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන කිසිම දෙයක් නිමිති අනුනිමිති වශයෙන් ගන්නේ නැතුව සීමා

නොකරන ලද මනසින් යුක්තව මුන්වහන්සේත් එක්ක ම ගමේ ඇවිදලා එන්න ගියොත් එයාගේ මනසේ අර ගම ගැන නිමිති තියෙයි ද? නැහැ.

කොහේහරි යද්දි එද්දි බෝඩ්වල තියෙන අකුරු ඉබේ ම කියවෙනවා නේද. ඒද හොඳ මිම්මක් විඤ්ඤාණය නාමරූප දෙක පැත්තට බැසගෙන එනම් *"ඔක්කන්ති නාමරූපං"* වෙලා තියෙන්නේ කියන එකට. පෙනුනට අකුරු කියවෙන්නේ නැත්නම් ඒකෙන් කියන්නේ හිත නැඹුරු වෙලා නැහැ. ඒ කියන්නේ සති නිමිත්තේ හොඳින් හිත පිහිටුවා ගෙන හොඳ සමාධිමත් මනසකින් ඉන්න කෙනාට බෝඩ්වල අකුරු දැක්කට ඉබේ ම කියවෙන්නේ නැහැ.

රූප පේනවා, නමුත් ඉබේ ම කියවෙන්නේ නැහැ. ඒ කියන්නේ බාහිර පැත්තට හිත නැඹුරු වෙලා නැහැ. එයා හොඳින් සිහිය පවත්වාගෙන ගම හැමතැන ම ගිහින් ආවත් එයාගේ හිතේ ඒ ගම ගැන නිමිති හිටින්නේ නැහැ. මොකද, එයා පංච උපාදානස්කන්ධය ඇතිවෙනවට බය යි. භවයට බය යි.

භවය තිබුණොත් ජරාමරණ දුක එනවා ම යි කියලා දන්නා නිසා එයා හිත රැක ගන්නවා. එයා සිහියෙන් නුවණින් (සති සම්පජඤ්ඤයෙන්) යනවා, එනවා හැමතැන ම. හැබැයි උපායශීලියි. ඒ නිසා දැකපු, අහපු තැන්වල නිමිති හිටින්නේ නැහැ. රහතන් වහන්සේ නමක් කියන්නේ ඔය වගේ ම තමයි.

දැන් ලෝකයක් (භවය) තියෙන කෙනාට ගම සිහි කරලා, ගෙවල් සිහි කරලා, ගෙවල්වල ප්‍රශ්න ගැටලු සිහි කරලා ඒවා ඇත්ත ම වෙලා, ඒක ගෙවාගන්න බැරුව ඉන්නවා. දැන් ඔය අපිට ගම ගැන දැනුමක් තියෙනවානේ. ඒක සිහිවෙන සිහිවෙන ගානේ පිළිගන්නේ නැතුව පටිච්චසමුප්පාද ධර්මතාවය පෙන්නන්න ඕනේ.

උපාදානයට හිත විදිහට පංච උපාදානස්කන්ධයක් උපද්දලා ඒකට උපාදානය වුණ හින්දා හැදුණු භවය නේද. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර නැති වුණොත් පංච උපාදානස්කන්ධ ලෝකය (භවය) නැති වෙනවා නේද.

කියලා පංච උපාදානස්කන්ධයේ උදයවැය බලමින් ආස්‍රව ක්ෂය කිරීම කරන්නට ඕන. ඒ කියන්නේ ඒ 'ගම' කියලා හම්බවෙන නිමිති ටික ඔක්කොම දිය කරන්න පුළුවන්.

දැන් අපිට මුන්වහන්සේගේ ගම ගැන කිසිම නිමිත්තක්, හැඟීමක්වත් නෑනේ. අන්න ඒ වගේ අපේ ගම ගැන සිහි කරන කොට නිමිත්තක් නැති තැනක් ආවොත් අපිට එහෙම ඒවා බාහිර තියෙනවා කියන තැනට මනස නැමෙන්නේ නැහැ. කලින් දැකපු, අහපු අත්දැකීම් සිහි කරන්න පුළුවන්. සිහි කෙරුවත් සිහි කරන මනස හසුවෙයි මිසක එහෙම ඒවා බාහිර තියෙනවා කියන තැනට මනස නැමෙන්නේ නැහැ.

~ භවය නැති වුණොත් සිහි කරන්න බැරි ද ~

දැන් මට අම්මා කියලා සිහි කරන කොට හිතෙන් ම සිතිවිල්ලක් සිහි කරාට, මම මගේ සිතින් ම සිතිවිල්ලක් සිහි කරනවා කියන එක මට අහුවෙන්නේ නැහැ. භවය නිසා බාහිරයට හිත නැමෙනවා 'අම්මා අරහේ ඉන්නවා' කියලා.

භවය කැපුණාම තමන් දැකපු, අහපු, දැනුණු, දැන ගත්ත දෙයක් සිහි කරන කොට, සිහි කරන දේ තමන් තුළ ම හටගෙන නිරුද්ධ වෙනවා පේනවා මිසක ඒ දැකපු, අහපු, දැනුණු, දැන ගත්ත දේවල් බාහිරයේ ඇති බවට හිත නැමෙන්නේ නැහැ. සිහි කරන්න පුළුවන්. සිහි කළ දේ ඇත්ත නෙවෙයි. භවය කැපුණාම යන්න එන්න තැනක් නැති මට්ටමට පත් වෙනවා. නිවන් දැකලා කියන්නේ ජීවත්ව ඉද්දී ම නූපදින බව සාක්ෂාත් කරලා.

මතු ඉපදෙනකම නැති කළා කියන්නේ මරණයෙන් පස්සේ කතාවක් නෙමෙයි. මේ ජීවිතයේ ම මේ මොහොතේ ඉඳලා ම ඉපදෙන්න තියෙන පොළොව (භවය) අයින් කරලා. නැවත ඉපදෙන්න තියෙන පොළොව අයින් කරලා පුරාණ කර්මයට හටගත්ත ආයතන ටිකේ ජීවත් වෙනවා.

අවශ්‍යතාවයක් වුණොත් සිහි ඇතුව නුවණ ඇතුව යනවා. ඒ වගේ දර්ශනයක් මම ඔය කියන්නේ.

~ පංච උපාදානස්කන්ධ ලෝකය හඳුනා ගන්න උදාහරණයක් ~

දානේ ගෙනල්ලා නන්දක හාමුදුරුවෝ ඇවිල්ලා කිව්වා, ලබුනෝරුවේ මෙන්න මෙහෙම ඇති කියලා, අත දික් කරලා පෙන්නුවා. මම එතකොට කිව්වා, ඒ ඔබ වහන්සේගේ තියෙන ලබුනෝරුව කියලා. එතකොට විශුද්ධි හාමුදුරුවොත් ඇවිල්ලා කතා කරලා කිවුවා ලබුනෝරුවේ ඇති කියලා. මම එතකොට කිවුවා ඔය දෙන්නාගේ තියෙන ලබුනෝරු ගම් දෙක සමාන කරලා බලන්නකෝ කියලා.

විශුද්ධි හාමුදුරුවන්ට ලබුනෝරුව ගම ගැන දැනුමක් තියෙනවා නම් ඒකේ අම්මා, තාත්තා ඉන්නවා ආදී ඒ ගම ගැන තියෙන දැනුම නෙමෙයි, නන්දක හාමුදුරුවන්ට ලබුනෝරුව ගැන තියෙන නිමිති ටික. නන්දක හාමුදුරුවන්ට ලබුනෝරුව ගම ගැන නිමිති තිබුණාට, ඒ ගමේ උන්වහන්සේගේ අම්මලා, තාත්තලා, නෑදෑයෝ ඉන්නවා කියලා නිමිති නැහැ.

එතකොට විශුද්ධි හාමුදුරුවන්ටත්, නන්දක හාමුදුරුවන්ටත් ලබුනෝරුව ගම ගැන තියෙන නිමිති වෙනස්. තේරෙනවා නේද? දැන් ඕගොල්ලොන්ටත් ලබුනෝරුව කියලා සිහි කරන්න පුළුවන් නම්, තව අයටත් ලබුනෝරුව ගැන සිහි කරන්න පුළුවන් නම්, ඒ දෙපිරිසට ලබුනෝරුව ගැන තියෙන දැනුම වෙනස්.

විශුද්ධි හාමුදුරුවන්ට ලබුනෝරුව ගම කියලා සිහි කරන කොට අම්මා ඉන්නවා, තාත්තා ඉන්නවා, නෑදෑයෝ ඉන්නවා, සහෝදරයෝ ඉන්නවා. නමුත් අපි ඒ ගම සිහි කෙරුවට අපිට එහෙම කවුරුවත් නැහැ ඒ ගමේ. එතකොට ඒකෙන් තේරෙනවා මේ තමයි පංච උපාදානස්කන්ධ ලෝකය කියන එක කියලා.

~ භවයට කළකිරුනෙක් වන්න ~

එතකොට අපි මේ සිද්ධියෙන් අන්තිමට කතා කරන්නේ භවය නැමැති බන්ධනාගාරයෙන් එතෙර වෙලා යන්න තියෙන එක ම ක්‍රමය. එක ම දේ තමයි භවය පරිහරණය නොකිරීම. භවයට කළකිරුනෙක් වෙන එක. භවය තුළ තමයි ඉන්න බැරි වෙහෙසකර අරමුණු තියෙන්නේ. පංච උපාදානස්කන්ධ දුක ඔය ලෝකේ ඇතුළේ තියෙන්නේ.

ඉපදීමේ දුක, ලෙඩවීමේ දුක, මහලුවීමේ දුක, මරණ දුක, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක, අප්‍රියයන් හා එක්වීමේ දුක, හිතන බලාපොරොත්තුවන දේ නොලැබීමේ දුක, කායික මානසික වෙහෙස කියන මේ ඔක්කොම ටික තියෙන්නේ ඔය ලෝකේ. එතකොට ඒ දුක් ඔක්කොම ගලවලා දාන්න පුළුවන්.

ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වේ දී ම අපිට ඇහැ, කන, නාසය, දිව, කය, මනස තියෙනවා කියලා දැනෙන හැඟීමත් ඔය වගේ එකතු වෙච්ච එකක්. ආස්‍රව ගෙවෙන කොට ඒ ටිකත් නැති වෙනවා. එතකොට 'මේ මම යි' කියලා පනවන්න පුළුවන්කමක් නැහැ. භවය නිරුද්ධ වීමෙන් ශූන්‍යතාවයට ආවාම තමන් ඉන්නවා කියලා එකකුත් නැහැ, අනුන් ඉන්නවා කියලා එකකුත් නැහැ.

ඒකනේ අර මධුපිණ්ඩික සූත්‍රයේ පෙන්නන්නේ යම් වෙලාවක දී මේ ප්‍රපංච සංඥා කොට්ඨාසයෝ පුරුෂයා තුළ ලැග නොසිටී නම් ඒක ම යි මේ දුකේ අවසානය කියලා. එතකොට ප්‍රපංච සංඥා කොට්ඨාස ඇති වෙන්නේ කොහොම ද?

"චකඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උපපජ්ජති චකඛුවිඤ්ඤාණං තිණ්ණං සඞගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. යං වෙදෙති, තං සඤ්ජානාති. යං සඤ්ජානාති තං විතකෙකති. යං විතකෙකති තං

පපඤ්චෙති. යං පපඤ්චෙති තතොනිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසඛා සමුදාචරන්ති අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු".[110]

ඇහැත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණය උපදිනවා. ඒ තුන්දෙනාගේ එකතුව ස්පර්ශය. ස්පර්ශ වෙච්ච අරමුණා විඳිනවා. විඳපු අරමුණා හඳුනනවා. හඳුනපු අරමුණාට හිතනවා. යමක් හිතයි නම් ඒක ම ප්‍රපංච වෙනවා. එක සැරයක් ප්‍රපංච හදාගත්තාට පස්සේ ඒ ප්‍රපංච සංඥාවෙන් ඒ පුද්ගලයාව යට කරනවා ඇහෙන් බලා දතයුතු රූපය කෙරෙහි අතීත, වර්තමාන, අනාගත වශයෙන්.

'ප්‍රපංච' කියලා කියන්නේ 'ප්‍රමාද කරවනවා' කියන එක. තණ්හා, මාන, දිට්ඨි හැටියට සසර ප්‍රමාද කරවනවා කියන එක. ඇහෙන් රූපයක් බලලා 'කෙනෙක්' කියලා ප්‍රපංච සංඥාවක් හිටියොත්, 'මම අහවල් කෙනාව දැක්කා', 'මට එයාව දැන් පේනවා', 'මට එයාව බලන්න යන්න ඕනේ' කියලා අතීත, වර්තමාන, අනාගත කියන තුන් කාලයෙන් ම ඒ ප්‍රපංච සංඥාවෙන් ම අපිව යට කරනවා. ආයේ නැගිටින්න ම බැහැ.

ඔය වගේ ම තමයි, කනත්, ශබ්දයත් නිසා සෝත විඤ්ඤාණය උපදිනවා. ඒ තුන්දෙනාගේ එකතුව ස්පර්ශය. ස්පර්ශ වෙච්ච අරමුණා විඳිනවා. විඳපු අරමුණා හඳුනනවා. හඳුනපු අරමුණාට හිතනවා; 'මේ අමරදේව මහත්මයාගේ සිංදුවක්', 'මේ නන්දා මාලනී මහත්මියගේ සිංදුවක්' කියලා.

යමක් හිතයි නම් ඒක ම 'ප්‍රපංච' වෙනවා. අමරදේව මහත්මයාගේ සිංදු, නන්දා මාලනී මහත්මියගේ සිංදු තියෙනවා ම වෙනවා එතකොට. අතීතයෙත් මම ඒ සිංදු අහලා තියෙනවා, ඒ සිංදු මම දැනුත් අහනවා, අහවල් තැනට ගිහිල්ලා අහවල් දේ මේ මේ විදිහට කළහම අනාගතයේ දී ඒ සිංදු නැවත අහන්නත් පුළුවන් කියලා අතීත, වර්තමාන, අනාගත කියන තුන් කාලයෙන් ම ප්‍රපංච සංඥාවෙන් ම අපිව යට කරන නිසා ලෝකය ඇත්ත ම වෙනවා එතකොට අපිට.

---

110 https://tipitaka.lk/mn-1-2-8 - **මධුපිණ්ඩික සූත්‍රය- සීහනාද වර්ගය- මජ්ඣිම නිකාය 1- 280 පිටුව**

එතකොට ප්‍රපංච නොවන්නේ කොහොමද?

“සො වතාවුසො චක්ඛුසම්ං අසති රූපෙ අසති චක්ඛුවිඤ්ඤාණෙ අසති ඵස්සපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. ඵස්සපඤ්ඤත්තියා අසති වෙදනාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. වෙදනාපඤ්ඤත්තියා අසති සඤ්ඤාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සඤ්ඤාපඤ්ඤත්තියා අසති විතක්කපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති. විතක්කපඤ්ඤත්තියා අසති පපඤ්චසඤ්ඤාසඞ්ඛාසමුදාචරණාපඤ්ඤත්තිං පඤ්ඤාපෙස්සතීති නෙතං ඨානං විජ්ජති”.

ඇහැ නැති නම්, රූපය නැති නම්, චක්ඛු විඤ්ඤාණය නැති නම් ස්පර්ශය යන පැනවීමක් විද්‍යමාන වෙන්නේ නැහැ. ස්පර්ශය යන පැනවීමක් නැති නම් වේදනාව යන පැනවීමක් විද්‍යමාන වෙන්නේ නැහැ. වේදනාවගේ පැනවීමක් නැති නම් සංඥාව යන පැනවීමක් විද්‍යමාන වෙන්නේ නැහැ. සංඥාවගේ පැනවීමක් නැති නම් විතර්කනය යන පැනවීමක් විද්‍යමාන වෙන්නේ නැහැ. විතර්කනයේ පැනවීමක් නැති නම් ප්‍රපංච යන පැනවීමක් විද්‍යමාන වෙන්නේ නැහැ.

එතකොට ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය තියාගෙන, නොහිතා ප්‍රපංච නොකර ඉන්නවා කියන තැනකින් පෙන්නලා තියෙනවාද? නැහැ. මේ සියල්ල ගලවලා ඉවත් කරන්න තියෙන්නේ.

මාස තුන හතරක පොඩි ළමයෙක්ට අඬන එක නතර වෙන්න අර පාට පාට ඒවා එල්ලනවානෙ. එතකොට පොඩි ළමයාට පාට පේනවා නමුත් වර්ණයකටවත් ප්‍රඥප්ති කරන්න බැහැ මේ නිල්, රතු කියලා. නමුත් පාට පේනවා. අන්න එබඳු මට්ටමකයි ඇහැට පෙනෙන රූපයක යථාභූත ස්වභාවය තියෙන්නේ.

~ ශබ්දයේ යථාභූත ස්වභාවය ~

අපි නොදන්නා භාෂාවකින් කෙනෙක් කතා කරගෙන ගියොත් අපිට ශබ්දයක් ඇහෙනවා. හැබැයි ඒ ශබ්දය ශබ්ද මාත්‍රයක් විතරයි. සක්‍රීය වෙන්න මොකුත් නිමිති නැහැ අපි ගාව. මට තවම මතකයි, එක සැරයක් තායිවානයට ගියහම එක සුද්දෙක් මට කිව්වා තායිවාන් ජාතිකයෙක්ව පෙන්නලා අන්න අරයට ගිහින් මෙන්න මේ තායිවාන් භාෂාවේ වචනය කියලා එන්න කියලා.

මම ගිහින් ඒ වචනය කිව්වාම ඒ තායිවාන් ජාතික කෙනා අත් දෙකෙන් කට වහගෙන ලැජ්ජාවෙන් දිව්වා. මම ඒ වචනේ තේරුම අදටත් දන්නේ නැහැ. සමහරවිට ඒ භාෂාවෙන් අසභ්‍ය වචනයක් වෙන්න ඇති. නමුත් අදත් මට ඒ වචනය ශබ්ද මාත්‍රයක් විතරයි. ඒකෙන් හොඳක් කිව්වා කියලා එකකුත් නැහැ, නරකක් කිව්වා කියලා එකකුත් නැහැ, අසභ්‍ය දෙයක් කිව්වා කියලා එකකුත් නැහැ මට.

ඒ ශබ්ද මාත්‍රය ගැන මට මොකුත් දැනුමක් නැහැ නේ. ඒ වගේ ම ශබ්ද මාත්‍රයක් තමයි ඒ තායිවාන් ජාතික කෙනාගේ කනටත් ගියේ. ආස්‍රව කියන්නේ ඒ ඒ ශබ්ද සංඥාවලට මීට පෙර අපි හිතලා තියෙනවා. ශබ්ද ඇහෙන කොට ඒ හිතපුවා ටග් ගාලා වේගෙන් සිහි කර ගන්නවා.

අපිට කෙනෙක් බනින කොටත් එහෙමයි. ශබ්ද මාත්‍රයක් විතරයි කන ගාවට එන්නේ. ඒ ශබ්ද සංඥාවලට අපි කලින් හිතලා තියෙනවා. අපි ඒ වචනවලට මීට පෙර හිතලා තිබුණොත් භවය ඇතිවෙලා තියෙනවා. ශබ්දය ඇහෙනවත් එක්ක ම වේගයෙන් භවය සිහිකර ගන්නවා. රූපයක නම් අපිට භවය ඇතිවෙලා තියෙනවා කියන එක හඳුනාගන්න පුළුවන් නේ. නමුත් ශබ්දයක අපිට හොයන්නවත් බැහැ නේ භවය වෙච්ච එක.

සුද්දෙක් ගන්නකොා. 'පොල්' කියන වචනය එයා දන්නේ නැහැ. එයාට 'පොල්' කියන ශබ්දය ඇහුණාට නිමිති නැහැ. එතකොට 'පොල්' කියලා කියන්නේ මොකක්ද කියලා හොඳට උපාදාන වෙන්න පුළුවන් රූප නිමිත්තක් එනම් ගෙඩියක් එහෙම පෙන්නලා මේකට තමයි පොල් කියලා කියන්නේ,

Coconut, Coconut same name කියලා භාෂාවකිනුත් ගැටගහලා කිව්වහම ඔන්න දැන් 'පොල්' කියලා ඇහෙන කොට ම එයාටත් තේරෙනවා. අපි ඔය භාෂාවල් ඉගෙන ගන්නවා කියන්නේ භවය හොඳට හදා ගන්නවා කියන එක.

ශබ්දය කලින් භවය නොවී තිබුණොත් ශබ්දය ඇහුනට ඒ ගැන නිමිති නැහැ එතකොට. සීමා නොකරන ලද මනසේ ඉන්න කොට ශබ්ද මාත්‍රයක් ඇහෙන්නේ. ශබ්දය එන කොට ම අවිද්‍යාව නිසා ඊට නැඹුරු කරලා ශබ්දය අහලා මේකට තමයි 'පොල්' කියලා කියන්නේ, ඒක මෙහෙම දෙයක් නේද කියලා අපි ඒ විතර්ක කළ දේ ශබ්දයට ගැට ගහලා හදලා තියෙනවා. එහෙම භවය හැදුණාට පස්සේ අලුතින් හදන්න ඕන නැහැ. නැවත ශබ්දය ඇහෙන කොට ම ඒ ආස්‍රවය සිහි කර ගන්න එක කරන්නේ අපි.

රහතන් වහන්සේ නමකට එහෙම ඒවා නැහැ. ඒකයි උන්වහන්සේලා අට ලෝ දහමින් කම්පා වෙන්නේ නැහැ කියන්නේ. කනට ශබ්ද මාත්‍රයක් එන කොට අපි ම බැනුම හදාගෙන බැනුම් අහලා තියෙන්නේ. තමන් හදා ගත්තේ නැත්නම් දුක් විඳින්න පුළුවන් විදිහට, දුක ගෙනත් දෙන ශබ්ද නැහැ.

කච්චානගොත්ත සූත්‍රයේ තියෙන්නේ ලෝකය හැදෙන හැටි දන්න කෙනා නැහැ කියන්නේ නැහැ. ලෝක නිරෝධය දන්න කෙනා තියෙනවා කියන්නේ නැහැ. එතකොට මගේ මේ අවිද්‍යාව නැමැති වරදෙන් නම් ලෝකය හදාගත්තේ, ඒ වරද නැති කළොත් ලෝකය නැති කරන්න පුළුවන් නම් ලෝකය කියන එක අපි උප්පත්ති වශයෙන් එන කොට තිබුණු එකක් නෙවෙයි, කෙලේසයකට හදාගත්තු එකක් ය කියලා උත්තරයක් එනවා. ඒ නිසා ආර්ය ශ්‍රාවකයාට ලෝකය ගලවලා දාන්න පුළුවන් වෙනවා.

පටිච්චසමුප්පාද ධර්මය දන්නේ නැති අශ්‍රැතවත් පෘථග්ජන කෙනාට හිතෙන්නේ අපි උප්පත්ති වශයෙන් ආපු බිම තමයි ලෝකය කියලා කියන්නේ. ඒ ලෝකයේ අපි ඉපදුණු ගම තියෙනවා. අපි උපන්න ගමේ මේ මේ දේවල් තියෙනවා. ඒ ගමේ ඉතින් අපි පුළුවන් තරම් හොඳින් දැහැමින් ජීවත් වෙන්න ඕන. එහෙම ජීවත් වෙලා අපි මැරිලා යනවා නමුත් ලෝකය තියෙනවා වගේ තැනකින් තමයි එයා ලෝකය හඳුනා ගන්නේ.

පටිච්චසමුප්පාද සිද්ධියෙන් පෙන්නන්නේ උඹලා උප්පත්ති වශයෙන් ගෙනාවේ නැහැ භවය (ලෝකය). මෙන්න මේ වගේ දෝශයකටයි ලෝකය හැදුණේ කියන එක පෙන්නලා, ඒ දෝශය අද නැති කළොත් ලෝක නිරෝධය කරන්න පුළුවන් කියලා.

ලෝක නිරෝධය කරන්න කියන්නේ ඇයි? මේ ජීවිතයේ ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස් සියල්ල ම එනවා විතරක් නෙවෙයි, අනන්ත අපරිමාණ සසරට යන්න වෙනවා භවය (ලෝකය) තිබුණොත් හින්දා. ඒ නිසා අපි මොකද කරන්න ඕන? ආස්‍රව ක්ෂය කර ගැනීම.

ආස්‍රව කියක් තියෙනවා ද ? හතරයි. කාමාස්‍රව, භවාස්‍රව, දිට්ඨාස්‍රව, අවිද්‍යාස්‍රව. ආස්‍රව කියන්නේ බොහෝ කල් සිට පැවත එන කෙලෙස් හුරු පුරුදුවලට. පිරිසිදු මනසක් ඇතුව උප්පත්ති වශයෙන් ආපු තැනක පවතින යථාර්ථය නොදකින අවිද්‍යාවගේ හටගැනීමට හේතු වුණා සසරේ බොහෝ කල් සිට පැවත එන කාමාස්‍රව, භවාස්‍රව, දිට්ඨාස්‍රව, අවිද්‍යාස්‍රව කියන ආස්‍රව.

අවිද්‍යාවේ හටගැනීම නිසයි මාරයාගේ භූමියට යන්න හේතු වුණේ. නිමිති හදාගත්තට පස්සේ නැවත ආස්‍රව සක්‍රිය වෙලා කටයුතු කරන හින්දා ම යි අවිද්‍යාව එළිපෙහෙළි නොවෙන්නෙත්.

~ ලෝකය සජීවී කරන ආස්‍රව ~

ඕගොල්ලෝ දැන් ඉදිරිය බලන කොට පේන රූපය ඇත්ත ම වෙලානේ. ඒ කියන්නේ හාමුදුරුවෝ බණ කියනවා. මාත් බණ අහනවා. තවත් ගොඩක් අය මේ ශාලාවේ බණ අහනවා කියලා අදහසක් තියෙනවා නේද? අපි දැන් මේ ඔක්කොම අහුවෙන විදිහට ෆොටෝ එකක් ගහලා බිත්තියේ එල්ලනවා.

දැන් ඔය පින්තූරය දිහා බලද්දී ඕගොල්ලොන්ට මොකක් හිතෙයි ද? ඒක චිත්‍රයක් කියලා දන්නවා හොඳට ම. ඒත් ඕගොල්ලොන්ට හිතෙනවා, ‘හාමුදුරුවෝ ඉන්නවා. මෙන්න මෙතන තමයි මම ඉන්නේ’ කියලා. ඒත් ඒවා

එක්ක ගනුදෙනු කරන්න යන්නේ නැහැ. දැන් මෙතන ඉන්න අයත් එක්ක ‘මෙහෙ එන්නකෝ, මේක ගන්නකෝ’ කියලා ගනුදෙනු කරනවානේ ඕගොල්ලෝ. ඒත් අර ෆොටෝ එකත් එක්ක ගනුදෙනු කරන්නේ නැහැ. ඇයි ඒ?

පින්තූරය දිහා බලද්දී ඕගොල්ලොන්ට අනුමානෙට යථාභූත ඥානයක් තියෙනවා මේ චිත්‍රයක් පේන්නේ කියලා. ඒ හින්දා ආස්‍රව යෙදිලා නැහැ. ඕගොල්ලෝ ඉගෙනගෙන නැහැ, මෙහෙම පෙනෙන තැනකත් චිත්‍රයේ වගේ ම වර්ණ සටහනක් පෙනෙන්නේ කියලා. ඒ නිසා මේ පෙනෙන අරමුණේ දී යථාභූත ඥානය නැහැ ඕගොල්ලොන්ට. එතකොට ආස්‍රව යෙදිලා හොඳට ම. ආස්‍රව ටිකෙන් තමයි සසීවී කරන්නේ. ආස්‍රවවලට හේතුව මොකක් ද? අවිද්‍යාව/ යථාභූත ඥානය නැතිකම.

රහත් වුණා කියලා කියන්නේ අර ෆොටෝ එකේ ස්වභාවය ගැන තිබුණු සත්ත්ව පුද්ගල නොවූ වර්ණ සටහනක් කියන නුවණ මේ පෙනෙන එකටත් එනවා. ඒ මට්ටමට ම නුවණ ආවාම මේ පෙනෙන දේ එක්කත් ඕගොල්ලො පුද්ගලභාවයකින් ගනුදෙනු කරන්න යන්නේ නැහැ.

අතන චිත්‍රය ඇතුළේ ‘හාමුදුරුවෝ ඉන්නවා. මෙන්න මෙතන තමයි මම ඉන්නේ’ කියලා හිතුවට ඒක චිත්‍රයක් කියන එක ඕගොල්ලො දන්නවා. චිත්‍රයක් තියෙන්නේ කියන කොට ඒක එක්තරා මට්ටමක නුවණක්. ඒ මට්ටමේ නුවණක් හෝ තියෙන තැනක කෙලෙස් යෙදෙනවා අඩුයි.

තිරිසන්ගත සත්ත්වයෙකුට ඔය චිත්‍රය පෙන්නුවොත් ඕකේ ඉන්න මිනිස්සුන්ටත් පනී. ඒ මොකද? එයාට යථාභූත ඥානය නැහැ. එතකොට ආස්‍රව සක්‍රීය වෙනවා. වීදුරුවලට කොටන කුරුල්ලන්, ටීවී එකේ සතෙක් දැක්කම පනින පූසෝ, බල්ලෝ එහෙම ඉන්නවා දැකලා තියෙනවා නේද?

දැන් මේ ෆොටෝ එක වගේ ම තමයි ටීවී එකෙත් අපිට පුද්ගලයෝ සත්ත්වයෝ පෙනුණාට යථාභූත ඥානය ටිකක් තියෙන හින්දා ඒ එක්ක ගනුදෙනු කරන්න යනවා අඩුයි. දැන් මෙතන මේ ඇහැට පෙනෙන එකෙත් යථාභූත ස්වභාවය තමයි මහාභූතයන්ගේ උපාදාය රූපයක් වූ වර්ණ

සටහනක් කියන එක. ඔය යථාභූත ඥානය නැති හින්දා හොඳට ම අපිට ආස්‍රව යෙදෙනවා.

එතකොට ලෝකය සජීවී කරන්නේ ආස්‍රවයන්ගෙන්. ඕගොල්ලො ආස්‍රව ක්ෂය කරපු දවසට යථාභූත ඥානයේ මනස හෙල්ලෙන්නේවත් නැතුව පවතිනවා. එතකොට පෙනෙන, ඇහෙන, දැනෙන, දැන ගන්න දේවල් එක්ක සත්ත්ව පුද්ගලභාවයෙන් ගනුදෙනු කරන්න යන්නේ නැහැ. සිහි ඇතුව මේ අරමුණේ මෙබඳු ප්‍රඥප්තියක් තියෙනවා කියන තැනක ප්‍රඥප්තියක පිහිටලා කටයුතු කරනවා.

~ කර්ම භවය හා උප්පත්ති භවය ~

භවය දෙයාකාරයි.

- කර්ම භවය
- උප්පත්ති භවය

කර්ම භවය කියන්නේ මොකක් ද?

"චෙතනා භවෝ".[111] වේදනා, සංඥා, චේතනා කියන සියුම් චෛතසික ටිකකින් තමයි කර්ම භවය තියෙන්නේ. මම ඉන්නවා, දාන ශාලාව තියෙනවා, ගම තියෙනවා, පාරවල් තියෙනවා කියලා හැඟෙන ටික ඔක්කොම 'කර්ම භවය'. ඕකේ තියෙන්නේ සියුම් චේතනා ස්වභාවයක්, *'චෙතනා භවෝ'*. තව පැත්තකින් ඕකට කියනවා, 'චිත්තානු පරිවත්තන විතක්ක' - හිත අනුව ම පෙරළෙන විතර්ක කියලා. හිතත් එක්ක ම ඒ නිමිත්ත පෙරළෙනවා. එතකොට ඒක තමයි කර්ම භවය.

111 https://tipitaka.lk/kn-ps-1-1-4 - **ධම්මට්ඨිති ඥානය- ඥාන කතා- පටිසම්භිදාමාර්ග- බුද්ධක නිකාය - 98 පිටුව**

උප්පත්ති භවය කියන්නේ මොකක් ද?

කර්ම භවය හින්දා ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන ආයතන ටික උපදිනවා නම් නම් ඒකට කියනවා 'උප්පත්ති භවය' කියලා.

එතකොට මේ කර්ම භවය හා උප්පත්ති භවය දෙපැත්තට තියෙන හින්දා තමයි ජාතිය කියන එක හැදිලා තියන්නේ. *"භවපච්චයා ජාති"* කියලා කියන්නේ ඒකයි. එතකොට මේ කාරණා දෙක තියෙන කොට ලෝකය ඇත්ත වෙලා තියෙන්නේ.

ඕගොල්ලොන්ට උප්පත්ති භවයේ ආස්‍රව යෙදෙන එක නතර කරන්න තියෙන්නේ සතිපට්ඨානයේ සිහිය පිහිටුවාගෙන. එක තැනකට වෙලා ඉන්න කොට අපේ මනසට බොහෝ කල් සිට කිව්වා වූ, කළා වූ දේවල් ගැන, පුද්ගලයෝ ගැන, තැන් ගැන නිමිති සිහි වෙනවා නේ. අන්න ඒක තමයි භවය කියලා කියන්නේ.

ඒ භවය තුළ අම්මා, තාත්තා, දුව, පුතා කියන සවිඤ්ඤාණක වස්තු හරි ඒ වගේ ම බඩුමුට්ටු, ගස්කොළන් හරි තියේ නම් ඕවට තමයි කාම භාණ්ඩ කියලා කියන්නේ. ඕවා ඇසුරු කරපු හුරුවට තමයි 'කාමාස්‍රවය' කියලා කියන්නේ.

එතකොට අහවල් දුරින් පාරවල්, ගම්, නියම්ගම් තියෙන්නේ කියලා හැඟෙනවා නම් ඕකට කියන්නේ 'භවාස්‍රවය' කියලා. පුද්ගලයෙක්, සත්ත්වයෙක්, ආත්මයක් දකිනවා නම් ඕකට කියන්නේ 'දිට්ඨාස්‍රවය' කියලා. මේවා ආස්‍රව කියලා නොදන්නාකම 'අවිද්‍යාස්‍රව' නේද කියලා හඳුනගත්තම ඕගොල්ලොන්ගේ මනසට හම්බවෙන්නේ පැත්තකට ගියාම ආස්‍රව ගොන්නක්ම විතරක් වෙන්න ඕනේ. මොකද පංච උපාදානස්කන්ධය ලෝකය තියෙන්නේ *"සාසවා"*- ආස්‍රව සහිත යි කියන තැනකින්. ආස්‍රව සහිත මනසකට ම යි ලෝකය හම්බ වෙන්නේ.

~ ආස්‍රව ක්ෂය පිණිස ප්‍රතිපදාව ~

දැන් අපි ආස්‍රව ක්ෂය කර ගන්නවා කියලා කියන්නේ මොකක් ද? *“ආසවඤ්ඤව පජානාති, ආසවසමුදයඤ්ඤව පජානාති, ආසවනිරොධඤ්ඤව පජානාති, ආසවනිරොධගාමිනිං පටිපදඤ්ඤව පජානාති”.* - ආස්‍රව දන්නවා නම්, ආස්‍රව ඇතිවීම දන්නවා නම්, ආස්‍රව නැතිවීම දන්නවා නම්, ආස්‍රව නැති කරන ප්‍රතිපදාව දන්නවා නම් එපමණකින් ම සම්මා දිට්ඨියට පත් වුණා වෙනවා.

ආස්‍රව කියලා කියන්නේ අවිද්‍යාව නිසා හැදුණ එකක්. අවිද්‍යාව නැති කළොත් ආස්‍රව නැති කරන්න පුළුවන් කියලත් දන්නවා. එතකොට දුකේ කළකිරුණු තැනට එයා එනවා ම යි. ඒ හින්දා දැන් හොඳට හැමදෙනා ම පුළුවන් විදියට සීලයක පිහිටලා සති නිමිත්තේ හිත තියාගෙන සිහියෙන් ම ආශ්වාස කරන්න, සිහියෙන් ම ප්‍රාශ්වාස කරන්න. හිත අහකට ගියොත් ආපහු සති නිමිත්තේ හිත තියාගෙන සිහියෙන් ම ආශ්වාස ප්‍රාශ්වාස කරන්න. සති නිමිත්ත තුළ තමයි හැමවෙලාවෙ ම ඉන්නේ. ආශ්වාසය ප්‍රාශ්වාසය එක්ක හිත ගෙනියන්නේ නැහැ.

එහෙම සිහියෙන් ඉන්නවා හිත කොහේටවත් යන්න නොදී. එහෙම ඉන්න කොට ආපහු බැරිවෙලා හරි හිත අහකට ගියොත් ආයේ මතක් කරලා සති නිමිත්තේ හිත තියාගෙන සිහියෙන් ම ආශ්වාස ප්‍රාශ්වාස කරන්න. හිත වේගවත් නම්, හිතේ හිතේ කතා කරන ගතිය වැඩි නම් සමථ නිමිත්තට දෙන කාලය වැඩි කරන්න ඕන. සති නිමිත්තේ හිත තියාගත්තාම හිතෙන එක නතර වෙන්නේ නැහැ. හිතෙන එක තියෙනවා. සති නිමිත්තේ හිත තියාගත්තාම හිත සෑහෙන්න තමන්ට කීකරුයි නම් හිත සති නිමිත්තේ තියාගෙන ඉන්න පුළුවන් නම් එතකොට විදර්ශනාවට දෙන කාලය වැඩි කරන්න.

අරමුණක් හිතනවා ඒකේ හැසිරෙන එකට තමයි විතක්ක, විචාර කියලා කියන්නේ. මනුස්සයෙක් කියලා හිතනවා, මනුස්සයාගේ ගුණ අගුණ

බලනවා. ගම කියලා සිහි කරනවා, ඒ අරමුණේ හැසිරෙනවා. කෙනෙක් කියලා හිතනවා එයාගේ හොඳ නරක බලනවා. ඕක තමයි විතක්ක, විචාරවල හැටි.

හිතන ගතිය දැන්ම ම නැති වෙන්නේ නැහැ පුතේ. ඒක ගැන බයවෙන්න එපා. ප්‍රථම ධ්‍යානයට ගියත් හිතන ගතිය නැති වෙන්නේ නැහැ. ප්‍රථම ධ්‍යානයේ දී කාම සහගත විතක්ක විචාර තමයි නැති වෙන්නේ. ඒත් ප්‍රථම ධ්‍යාන සිතේ ද ධ්‍යාන අංග විතක්කන විචාරන ගතිය තියෙනවා. ඔය හිතෙන ගතිය නැති වෙන්න නම් ඕගොල්ලොන්ට දුතිය ධ්‍යානයටවත් සමවදින්නට වෙනවා.

"අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති".[112] කියන තැනට හිත පත්වෙන්න වෙනවා. චතුෂ්ක නයෙන් ගත්තහම දුතිය ධ්‍යානයේ දී තමයි විතක්ක විචාර නැති වෙන්නේ. පංචක නයෙන් ගත්තහම දුතිය ධ්‍යාන සිතේ විතක්කන කම නැති වුණාට සියුම්ව විචාරනකම ඒ සිතේ තියෙනවා. - ***"අවිතක්කවිචාරමත්තං"*** [113] පංචක නයෙන් ගත්තහම නියම ආයී තුෂ්ණීම්භූතභාවය (හිත නිහඬයි) කියලා කියන්නේ තෘතීය ධ්‍යානයෙන් පස්සේ තමයි. ඒ කියන්නේ අරමුණු හිතනකමයි, අරමුණුවල හැසිරෙනකමයි සම්පූර්ණයෙන් ම අතහැරෙන්නේ එතනින් පස්සේ.

ඒ හින්දා හිතෙන එක නතර කරන එකට දැන්ම ම යන්න එපා. ඒක වෙන්නේ නැහැ. නමුත් අපිට යම් මට්ටමකට හෝ හිත කීකරු කර ගන්නට ඕන. ඒ කියන්නේ සති නිමිත්තේ හිත තියාගෙන ඒ ඔස්සේ ම හිත ගමන් කරන්න සලස්වනවා. එහෙම ඉඳලා තමන්ට දැනෙන තේරෙන අරමුණු ටික ටික විදර්ශනා කරන්න ඕන.

ඔය ආස්‍රව ක්ෂයට යන පාර තමයි සතිපට්ඨානය, සම්‍යක්ප්‍රධාන, ඍර්ධි පාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන සත්තිස් බෝධි පාක්ෂික ධර්ම කියලා කියන්නේ. ඔය ගමන් මාර්ගයේ ඉදිරියට යන කොට සිහිය නුවණ වැඩෙනවා, තීව්‍ර වෙනවා.

---

112 https://tipitaka.lk/sn-4-6-2 - **අවිතක්ක සූත්‍රය- මොග්ගල්ලාන සංයුක්තය- සංයුත්ත නිකාය 4- 492 පිටුව**

113 https://tipitaka.lk/ap-dhs-5-1 - **ත්‍රිකධම් - අට්ඨකථාකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 502පිටුව**

මම දැන් සතිපට්ඨානය වඩනවා, කොහොමද සම්‍යක්ප්‍රධාන වඩන්නේ, කොහොමද ඍර්ධි පාද වඩන්නේ, කොහොමද ඉන්ද්‍රිය වඩන්නේ, කියන එක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඕගොල්ලන්ට මොකක්ද කරන්න තියෙන්නේ? හොඳට සීලයක පිහිටලා සමථ කමටහනකින් හිත වඩමින් ස්කන්ධයන්ගේ උදයවැය බලමින් භාවනා කරන්න විතරයි තියෙන්නේ.

ඒ පාරේ යන කොට අනුක්‍රමයෙන් හම්බවෙන මඟ සළකුණු තමයි සත්තිස් බෝධි පාක්ෂික ධර්ම කියලා කියන්නේ. මුලින් ම පටන් ගන්නේ සතිපට්ඨානයෙන්. ඒ සතිපට්ඨානය වඩන එක අරගෙන යයි ඔයාලගේ අරමුණට. දැන් අපි මේ කරන්නේ ආස්‍රව ක්ෂය කිරීමට හුරුවෙන එක. අපිට දැන් පුද්ගලයන් ඇසුරු කරපු හුරුව ඇත්ත ම වෙලා තියෙනවා. අම්මා ඉන්නවා, තාත්තා ඉන්නවා, ගෙවල් දොරවල් තියෙනවා කියලා අපි ඇසුරු කරපු හුරුව ඇත්ත ම වෙලා තියෙනවා. ඒ හුරු ගෙවන්න ඕන.

එතකොට කෙනෙක්ව මතක්වෙන කොට ස්පර්ශ ආයතන හයේ අතීතයේවත් කෙනෙක් හිටියේ නැහැ, වර්තමානයේදිත් කෙනෙක් ඉන්නවා නෙමෙයි, අනාගතයේදිත් කෙනෙක් ඉන්නේ නැහැ කියලා ඉස්සෙල්ලා ම යථාර්ථය පෙන්නනවා. ඇයි?

රූපය කනබොන ආහාරයෙන් හැදුණු පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතු යි. ඒ රූපය පුද්ගලයෙක් නෙවෙයි නේ. අතීතයේ ද තිබුණා නම් තිබුණේ එහෙම රූප. වර්තමානයේදිත් තියෙන්නේ එහෙම රූප. අනාගතයේදිත් තියෙනවා නම් තියන්නේ එබඳු රූප.

ඔහොම රූප තියෙන තැනක අවිද්‍යා, කර්ම කියන එකෙන් කළේ රූපයක් තනි කරලා අල්ලගන්න එක. එහෙම ආහාරයෙන් හැදුණු රූපයක් අල්ලගෙන 'පුද්ගලයෙක්', 'කෙනෙක්' කියලා හිතපු හින්දා 'පුද්ගලයෙක් ඉන්නවා', 'සත්ත්වයෙක් ඉන්නවා' කියන ගතියක් ඇතිවෙලා නේද තියෙන්නේ කියලා පංච උපාදානස්කන්ධ ලෝකයේ හටගැනීම පෙන්වනවා. මේ විදියටයි භාවනා කරන්න ඉඳගත්තම සිහිවෙන නිමිති විදර්ශනා කරන්නේ.

එතකොට කෙනෙක්ව ඇසුරු කළා කියන නිමිත්ත තිබුණාට මේ විදියට පංච උපාදානස්කන්ධ ලෝකයේ හටගැනීම හා වැයවීම පෙන්නන කොට ආස්‍රව ගතිය ටික ටික ගෙවෙනවා. ඕගොල්ලන්ගේ හිත ටික ටික යථාර්ථයට කිඳා බහිනවා. මුලින් එක පාරක් දෙපාරක් එහෙම පංච උපාදානස්කන්ධ ලෝකයේ හටගැනීම හා වැයවීම පෙන්නුවට හිත ඒ ඇත්ත පිළිගන්නේ නැහැ.

එකට ජීවත් වුණ ඒවා, කතාබහ කරපු ඒවා සිහි වෙනවා. පංච කාමය ම ඇසුරු කරපු හුරුවක්නේ තියෙන්නේ. අම්මලා, තාත්තලා එක්ක ජීවත් වුණ, දරුමල්ලෝ එක්ක ජීවත් වුණ, මිනිස්සු ඇසුරු කරලා හොඳට හුරුයි. ඒ හින්දා පංච උපාදානස්කන්ධ ලෝකයේ හටගැනීම නැවත නැවත පෙන්නන්න ඕන.

කෙලෙස් කපන තාක්ෂණය

හැමවෙලාවේ ම මනසිකාරයෙන් එක අරමුණක් අල්ලගෙන ප්‍රඥාවෙන් තමයි කෙලෙස් හිඳින්නේ. හරියට ගොයම් කපනවා වගේ. කුඹුරට ගිහින් දෑකැත්ත දාලා කොහොමද ගොයම් කපන්න ඕන? ඉස්සෙල්ලා ම වම් අතින් ගොයම් මිටක් අල්ලගන්නවා. ඊට පස්සේ දකුණු අතින් දෑකැත්ත අරගෙන ගොයම් මිට දෑකැත්තෙන් කපනවා. ඒ ගොයම් මිට කපලා පැත්තකින් තියලා තමයි ආයේ අලුත් ගොයම් මිටක් අල්ලගෙන කපන්නේ.

ඒ වගේ එක අරමුණක් අරගෙන, ඒ අරමුණ විදර්ශනා කරලා ඉවර වුණාට පස්සේ තමයි තවත් අරමුණක් අරගෙන විදර්ශනා කරන්න ඕනේ. ඒ හින්දා මනසිකාරය ඌහන ලක්ෂණයි ප්‍රඥාව ඡේදන ලක්ෂණයි කියලා කියනවා. ඒ කියන්නේ මනසිකාරයෙන් එක අරමුණක් අල්ලගෙන ප්‍රඥාවෙන් කෙලෙස් කපලා දානවා.

ඒ කියන්නේ තමන්ට වැඩිම ආදරේ සෙනෙහස ඇතිවෙන කැඩුනොත්, බිඳුනොත් දුක එන්න පුළුවන් අරමුණු තියනවානේ. ඒ වගේ බලවත්ව තියෙන එක අරමුණක් අල්ලගන්නවා. දරුවා කියලා සිහි වුණා කියලා හිතන්නකෝ.

ඔන්න දැන් මනසිකාරයෙන් ඒ දරුවා කියන නිමිත්ත අල්ලගන්නවා. ප්‍රඥාව ඡේදන ලක්ෂණ කියන්නේ ප්‍රඥාවෙන් කෙලෙස් සිඳීම කරනවා.

රූපය බත්, පාන්, කව්පි, මුංඇට වගේ කනබොන ආහාරයෙන් හැදුණු අනාත්ම වූ සතර මහා ධාතු රූපයක් නේ කියලා බලනවා. තව ඕන නම් කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර වගේ කුණප කොටස්වලින් හැදුණු රූපයක් නේ කියලා බලනවා. මම ඊයේ රෑ කිව්වා වගේ, ඒ රූපය වරිච්චි බිත්තියකට උපමා කරලා හෝ පෙන්වනවා.

එහෙම රූපයේ යථා ස්වභාවය පෙන්නලා, අවිද්‍යා කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදියට ඇහෙන් බලලා එක රූපයක් විතරක් අල්ලගෙන තණ්හා උපාදාන වශයෙන් ‘මේ මගේ දරුවා’ නේද කියලා අපි හිත හසුරපු හින්දා ‘දරුවෙක් ඉන්නවා’ කියන අදහසක් මට ඇතිවෙලා තියෙනවා නේද කියන එක පෙන්නනවා.

මෙහෙම නේද, ‘මට දරුවෙක් ඉන්නවා’ කියන එක හැදිලා තියන්නේ කියන උත්තරය එනවා පංච උපාදානස්කන්ධ ලෝකයේ හටගැනීම පෙන්නන කොට. මෙහෙම ‘දරුවා’ කියන නිමිත්ත හදා ගත්තේ මම ම යි කියලා දන්නේ නැතුව මේ දරුවා කියන නිමිත්ත ඇත්ත කර ගෙන ඒ එක්ක ම නේද මම ගනුදෙනු කරලා තියෙන්නේ කියන උත්තරය එනවා. ලෝකේ තුළ වාසය කරනවා කියලා කියන්නේ නිමිත්ත එක්ක ගනුදෙනු කරන එකට.

ලෝකේ හේතුඵල දහමක් නේ. ‘දරුවා’ කියලා නම් අපිට සිහි වෙන්නේ ඒ දරුවා හැදුණු ක්‍රමයක් තියෙන්න ඕනේ නේ. ඒ මගේ දරුවා කියන නිමිත්ත හැදුණු ක්‍රමය තමයි මේ පෙන්නුවේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හැදුණේ කියලා.

බත්, පාන්, කව්පි, මුං ඇට කියන ඒවා සත්ත්ව, පුද්ගල, ආත්මවල් නෙමෙයි නේ. බත්, පාන්, කව්පි, මුං ඇට වගේ කනබොන ආහාරවලින් හැදෙන ශරීරයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර ආදී කුණප කොටස් සත්ත්ව, පුද්ගල, ආත්ම නෙමෙයි.

ඒ ශරීරයෙන් විඤ්ඤාණය නිරුද්ධ වුණොත් ඉදිමිලා නිල්වෙලා පුපුරලා පොළොවට පස් වෙනවා. ඒ ශරීරයේ තිබුණු පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතු කොටස් බාහිර සතර මහා ධාතුවට එකතු වෙනවා නේද කියලා පෙන්වනවා.

ඒ රූපයේ කෙස්, ලොම්, නිය, දත්, සම්, මස් ආදී කොටස් ටිකක් තියෙනවා නම් ඒවා පඨවි ධාතු. පොළොවේ තියෙන පස් ටිකකට, හුඹහක තියෙන මැටි ටිකකට, ගඩොල් කැටයක තියෙන මැටි ටිකකට මගේ පුතා කියලා කිව්වොත් හරි ද? මැටි ටික මගේ පුතා ද? නැහැ.

එහෙනම් බත්, පාන්, කව්පි, මුංඇටවලින් හැදුණු ශරීරයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර ආදී තද ස්වභාවයෙන් යුක්ත (පඨවි) කොටස් ටිකයි ගඩොල් කැටයක තියෙන, හුඹහක තියෙන මැටි ටිකේ පඨවි ස්වභාවයයි සමාන යි.

ළිඳක, වැවක, පොකුණක තියෙන වතුර ටිකකට මගේ පුතා කියලා කිව්වොත් පිස්සු ද නැද්ද? පිස්සු. එතකොට මේ ශරීරයේ තියෙන පිත, සෙම, සැරව, ලේ, දහඩිය, කඳුළු, මුත්‍රා ආදී ගලන, වැගිරෙන, ඇලෙන, බැඳෙන ස්වභාවයෙන් යුක්ත ආපෝ ධාතු කොටස් ටිකයි ළිඳක, වැවක, පොකුණක තියෙන ජලයේ ආපෝ ස්වභාවය යි සමානයි.

ගිනි ගොඩක තියෙන දවන තවන දිරවන පැසවන උෂ්ණ ගතියක් (තේජෝ ස්වභාවයක්) තියේ නම් ඒ ගින්නට 'මගේ පුතා' කිව්වොත් හරි ද? නැහැ. එහෙනම් ඒ ශරීරයේ තියෙන කනබොන ආහාරය දිරවන, ශරීරයේ ඉන්ද්‍රිය මුහුකුරවන, ශරීරයේ පැවැත්මට උපකාර කරන තේජෝ ධාතුවත් ගිනි ගොඩක තියෙන තේජෝ ධාතුවත් සමානයි.

ගස් පෙරළමින්, සොලවමින් හමන හුළඟ තමයි මගේ දුව, මගේ පුතා, අම්මා, තාත්තා කියලා කිව්වොත් හරි ද? නැහැ. ඒ වගේ මේ ශරීරයක තියෙන උද්ධංගම වාතය, අධෝගම වාතය, කුච්ඡිසය වාතය, කොට්ඨාසය වාතය, අංගමංගානුසාරී වාතය, ආශ්වාස ප්‍රශ්වාස වාතය කියන මේ වාත

කොටස් හයේ තියෙන වායෝ ස්වභාවය සහ බාහිර හමන හුළඟක තියෙන වායෝ ස්වභාවය සමාන යි.

කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූප මිටියක් තියෙන්නේ. අවිද්‍යා කර්මයෙන් කළේ ඔය රූප මිටිය තනි කරලා අල්ලගෙන ඒ දිහා බලාගෙන 'මේ මගේ දරුවා', 'දරුවාගේ නම නිලන්ත', 'මට ඉන්න එක ම පුතා', 'මගේ පරම්පරාව ගෙනියන්න ඉන්න එක ම පුතා' කියලා හොඳට තණ්හා උපාදාන වශයෙන් පරිකර්ම කළහම අර කනබොන ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූප මිටිය දැන් මට පේන්නේ 'පුතා' වගේ.

අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ටිකේ ප්‍රතිඵලය පංච උපාදානස්කන්ධ ලෝකයක් නිර්මාණය වීම. පුතෙක් හැදිලා තියෙනවා දැන්. දැන් අපි ම හදාගත්තේ කියලා දන්නේ නැතුව පුතා ගැන ම සිහි කරනවා, පුතාව බලන්න යනවා, පුතාව දකිනවා කියලා ලෝකේ ඇතුළේ ම කටයුතු කරනවා. ඒ කියන්නේ භවය. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ටිකෙන් තමන් ම යි 'පුතා' කියන නිමිත්ත හදාගත්තේ කියන එක දන්නේ නැහැ. ඒ නිසා පංච උපාදානස්කන්ධ ලෝකය ඇත්ත වෙලා ගනුදෙනු කරනවා.

ඉතින් පුතා ලෙඩවෙන කොට දුකයි, පුතා මැරෙන කොට දුකයි. පුතා නිසා අනන්ත අපරිමාණ දුක් විඳිනවානෙ. පුතෙක් හදාගෙන දැන් දුක් විඳී. ඒ පුතා කෙරෙහි තණ්හාවෙන් සසරටත් යනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ඕක. දැන් ඔය පුතා කියලා ඇසුරු කරන එක 'කාමාස්‍රවය' අපේ. ඕක ගෙවන්න කියනවා.

මේ පුතා ම යි කියලා පුතාව ඇත්ත කර ගෙන ඇසුරු කරන එක වෙනුවට පුතා හැදුණේ කොහොමද කියලා පෙන්වනවා. ඔය විදිහට ම අම්මාව හැදුණේ කොහොමද, දුව හැදුණේ කොහොමද, බිරින්දෑ හැදුණේ කොහොමද කියලා පෙන්වන්න. වෙනදා කරන්නේ පුතා සිහි කර කර අම්මා සිහි කර කර බාහිරයට යන එකනේ.

දැන් ඒ වෙනුවට කරන්නේ මොකක් ද? පුතා සිහිවුණා ගමන් පුතා හැදුණේ කොහොමද කියන එක පෙන්නනවා. අම්මා කියලා සිහි කරලා යන්න

හදන එක වෙනුවට දැන් මොකද කරන්නේ? අම්මා හැදුණේ කොහොම ද කියන එක පෙන්නනවා.

ඒ වගේ ම තමයි 'මම' කියලා සිහි වෙන කොටත්, 'මම' එක්ක ගනුදෙනු නොකර මාව හැදුණු හැටිත් පෙන්වන්න. මේ ශරීරයේ තියෙන පඨවි කොටස් විස්ස බාහිර පඨවි ධාතුවට සමානයි. ආපෝ කොටස් දොළහ බාහිර ආපෝ ධාතුවට සමානයි. තේජෝ කොටස් හතර බාහිර තේජෝ ධාතුවට සමානයි. වායෝ කොටස් හය බාහිර වායෝ ධාතුවට සමානයි කියලා මුලින් ම පෙන්වනවා.

ඒ සතර මහා ධාතු රූප මිටිය අවිද්‍යා, කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදියට අල්ලගෙන මේ මම, මගේ, මගේ ආත්මය විදියට හොඳට පරිකර්ම කළා ම මේ හැඩය 'මම' කියලා නිමිත්තක් හැදුණා. මෙන්න මෙහෙම නේද මාව හැදුණේ කියලා දන්නේ නැහැ. ඒ නිසා මටත් ඉතින් ජීවිතයක් තියෙන්න එපැයි, මටත් පිහිටක් තියෙන්න එපැයි, මම දැන් මහළුයි අප්පා, මම දැන් ලෙඩවෙලා කියලා ඉතින් දුක ප්‍රශ්න. ඒ නිමිත්ත එක්ක ම ගනුදෙනු කරනවා. ඒ නිසා ම දුක ගෙනදෙනවා.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ 'මම' කියන්නේ කාමාස්‍රවයක්. 'මම' එක්ක ගනුදෙනු කරලා මාව පෝෂණය කරලා මාව ආරක්ෂා කරන එක වෙනුවට මොකද කරන්න ඕනේ අපි? මම හැදුණේ කොහොමද, මම නැති වෙන්නේ කොහොමද කියන එක ගැන බලනවා. මාව රකින්න තාක්, මාව ජීවත් කරවන්න හදන තාක්, මාව හොඳ තැනක තියාගන්න හදන තාක් ඒ අපි රකින්නේ මොකක් ද? ආස්‍රව, කෙලෙස්.

මේ ලෝකේ තියෙන බඩුමුට්ටු ටික ඔක්කොම ඔහොම හැදිලා තියන්නේ. අපි පංච උපාදානස්කන්ධයේ උදයවැය දන්නේ නැති නිසා එනම් මේ ලෝකේ ඇතිවීම, නැතිවීම නොදන්නා නිසා ලෝකය එක්ක ගනුදෙනු කරනවා. දරුවෝ, ගෙවල් දොරවල්, බඩුමුට්ටු සිහි කරනවා. 'මම' ගැන සිහි කරනවා. මගේ අනාගතය කොහොම වෙයි ද දන්නේ නැහැ, මගේ අනාගතය

සුභදායක කරගන්න ඕන යනාදී වශයෙන් ලෝකේ තුළ කටයුතු කරනවා. එතකොට ආස්‍රව තවත් වැඩි වෙනවා.

අවිද්‍යාවෙන් එක තැනකින් වැරදුනාම ආස්‍රවවලින් අපිව යට කරලා ම දානවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "මහණෙනි, සූදු කෙළින මිනිහා පළවෙනි පැරදුමෙන් සියල්ලන්ගෙන් ම පැරදුනා වෙනවා. ඒ වගේ අවිද්‍යාවෙන් යුක්ත කෙනා පළවෙනි වැරැද්දෙන් ම ජීවිතය වරද්ද ගන්නවා" කියලා.

ඒ කියන්නේ රුපියල් 500ක් අරගෙන සූදු කෙළින්න ගිය මිනිහෙක් මුලින් ම කීයක් හරි දිනාගන්න ඕනේ කියලා රුපියල් 100ක ඔට්ටුවක් දානවා. ඒ පාර පරාද වුණාම ඊළඟ සැරේ ඔට්ටු දාන්නේ පරාද වුණ රුපියල් 100 ගන්න. දෙවනුවට 200ක් පරාද වෙනවා. ඔහොම පරාද වුණ සල්ලි ගන්න ගිහින් දිගට ම තමන් ගාව තියෙන රුපියල් 500 ඉවර වෙනකන් සල්ලි දානවා.

ඒ රුපියල් 500 පැරදිලා ගෙදර ගියහම ඊගාවට රුපියල් 500ක් අරගෙන එන්නේ දිනන්න ද? නැහැ. ඉස්සෙල්ලා පරාද වෙච්ච 500 ගන්න. දෙවනියට ඒ රුපියල් 500 ත් පරාද වුණොත් ඊට පස්සේ එදා ඉඳලා ඒ මිනිහා ඔට්ටු තියන්න සල්ලි ගේන්නේ මොකක් හින්දා ද? දිනන්න නෙමෙයි, පරාද වෙච්ච ටික බේරගන්න.

ඒ වගේ අපිට අවිද්‍යාව නමැති පළවෙනි වැරදුමෙන් වැරදුනහම දැන් ඒකෙන් ම අපිව යට කරලා දානවා. බලන්නකෝ බුදුරජාණන් වහන්සේ දෙන උපමා. එතකොට ස්කන්ධයන්ගේ උදයවැය නොදන්නවා කියන පළවෙනි තැන වැරදුනා විතරයි ඒ වැරදුමෙන් හැමදාම වරදිනවා. 'දරුවා' කියලා නිමිත්තක් හදා ගත්තා විතරයි ඊට පස්සේ දරුවට උගන්නන්න ඕන, උස්මහත් කරන්න ඕන, ආදී වශයෙන් කෙළවරක් නැති ප්‍රශ්න. ඕක තමයි ජීවිතේ හැටි.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, **"මහණෙනි, ස්කන්ධයන්ගේ උදයවැය නොදැක යම් කිසි කෙනෙක් අවුරුදු සියයක් ජීවත් වුණත් ඒ ජීවිතය හිස් ජීවිතයක්. ස්කන්ධයන්ගේ උදයවැය දැකලා එක**

දවසක් ජීවත් වුණත් වටිනවා" [114] කියන්නේ එයා ආස්‍රව ක්ෂය කර ගන්න දන්න නිසා.

හැබැයි මේ උදයවැය නිකන් බැලුවට වැඩක් නැහැ. මේක කරන්නේ ඇයි කියලා දැන ගන්න ඕන. මොකක් සඳහා ද අපි මේ ස්කන්ධයන්ගේ උදයවැය බලන්නේ? ආස්‍රව ක්ෂය කර ගන්න. ඇයි ආස්‍රව ක්ෂය කර ගන්නේ? භව නිරෝධයක් කරන්න.

ඇයි භව නිරෝධයක් කරන්නේ? භවය නැති වුණා කියන්නේ මේ ලෝකයෙන් නිදහස් වුණා කියන එක. ලෝකයෙන් මිදෙනවා කියන්නේ ආපහු අපි උප්පත්ති වශයෙන් ආපු සීමා නොකරන ලද මනසට ඇවිත් ඉන්නවා, චතුරාර්ය සත්‍යය නැමැති විද්‍යාව ද සමගින්. එදාට තමයි අපි ආපහු ගෙදරට එන්නේ. දැන් ඒ ගෙදරින් පිටට ඇවිල්ලා ඉන්නේ අපි.

අර මම කිව්වේ ප්‍රභාශ්වර මනසක්, සීමා නොකරන ලද මනසක් තියෙනවා කියලා. අලුතෙන් කර්ම භවයක් නැති, පුරාණ කර්මයෙන් හටගත්ත විපාක ලෙස ආයතන ටිකක් උරුම වෙච්ච, හිතිමි කිමි කිරිමි කරන්න බැරි යථාභූතය ඝටිත වුණු තැනකටයි අපි උප්පත්ති වශයෙන් ආවේ. එතන නුවණ නැතිකම (අවිද්‍යාව) යි තිබුණේ.

චතුරාර්ය සත්‍යය ගැන පරිපූර්ණ අවබෝධයක් තිබුණා නම් මාරයාගේ භූමිය පැත්තට එන්නේ ම නැහැ. එතන නුවණ නැතිකම කියන දෝශය නිසා තමයි අපි ලොකුවෙන කොට ක්‍රමයෙන් මාරයාගේ භූමිය පැත්තට ආවේ. එහෙම ආවේ මාරයාගේ භූමිය පැත්තට ගියොත් සිද්ධවන දෝෂය දන්නේ නැති අවිද්‍යාව නිසා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන සූත්‍රයක් තියන්නේ **කුම්ම සූත්‍රය**[115] කියලා කැස්බෑවෙකු ගැන. කැස්බෑ පැටියෙකුට ඌගේ තාත්තා කියනවා පුතේ උඹ කවදාවත් ම අන්න අර සීමාවෙන් එහාට නම් යන්න එපා

---

[114] https://tipitaka.lk/kn-dhp-8/sinh - **සහස්‍ර වර්ගය- ධම්මපදපාළි- බුද්දක නිකාය- 51 පිටුව**

[115] https://tipitaka.lk/sn-2-5-1-3/sinh - **කුම්ම සූත්‍රය- දාරුණ වර්ගය- ලාභසක්කාර සංයුක්තය- සංයුක්ත නිකාය 2- 347 පිටුව**

කියලා. දැන් ඉතින් මේ පැටව් නේ, තරුණා කාලෙනේ. ඉතින් මේ පැටියා ගිහින් එනවා ඒ පැත්තට.

තාත්තා අහනවා, 'කොහෙද ගියේ' කියලා. මම අර පැත්තට ගියා කියලා පැටවා උත්තර දෙනවා. තාත්තා පුදුම වෙලා අහනවා, 'උඹ ආවද පුතේ නිරුපද්‍රිතව ඔහෙට ගිහිල්ලා' කියලා. ඔව් කියලා උත්තර දෙනවා. මම ගිහින් ආවට මගේ පිටිපස්සෙන් නූලක් වගේ එකක් නම් එල්ලෙනවා කියලා කියනවා.

එහෙනම් පුතේ, දැන් උඹව අපිට අයිති නැහැ කියලා තාත්තා කියනවා. බලන කොට එහෙට ගිහිල්ලා මේ ඇමක් ගිලලා ඇවිත් තියන්නේ. දැන් තව ටිකකින් ඇදලා ගන්නවා. ඒ වගේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහණෙනි මේ මාරයාට අයිති ඉඩමට යන්න ම එපා. ගියොත් උඹලා මට අයිති නැහැ කියනවා. මාරයාගේ ඉඩමට නම් යන්න ම එපා. ගියොත් කෙනෙක් නිරුපද්‍රිතව එන්නෙ ම නැහැ කියනවා බුදුරජාණන් වහන්සේ.

එහෙම එපා කියද්දි හිතුවක්කාරෙට ගිය කැස්බෑ පැටියත් විනාශ වුණා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන සූත්‍රයක් තියෙනවා. ඒ හින්දා ඕගොල්ලන්ටත් කියන්න තියන්නේ ඇහැ, රූපය, චක්ඛු විඤ්ඤාණය ආදී අටළොස් ධාතුව පැත්තට යන්න ම එපා කියලා. ඒක මහා විසක්. අටළොස් ධාතුව පැත්තට ගිය හුරුවත් ගෙවාගන්න ඕන.

දැන් අම්මා, තාත්තා, දුව, පුතා ආදී සිහිවෙන නිමිති එක්ක ගනුදෙනු කරන්නේ නැතිව කරන්න ඕන මොකක්ද කියලා තේරුනා ද? අර මම කලින් කිව්ව විදිහට බලන්න. එතකොට හොඳට පොල්ලෙන් වදිනවා වගේ වදිනවා. සතිපට්ඨාන භාවනාව වඩනවා කියලා කියනවා ඕකට.

'දරුවා' කියලා සිහිවෙන කොට තමන් ම හිතනවා; හුඹහක තියෙන මැටි ටිකකට, ගඩොල් කැටයක තියෙන මැටි ටිකකට 'දරුවා' කිව්වොත් හරි ද? නැහැ. ඒ පඨවි ගතිය ම නේද ඒ ශරීරයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර ආදී තද කොටස් ටිකේ තියෙන්නේ.

ළිඳක, වැවක තියෙන වතුරකට මගේ පුතා, මගේ අම්මා, දුව කියලා හිතුවොත් හරි ද? ඉතින් ශරීරයේ තියෙන පිත, සෙම, සැරව, ලේ, දහඩිය කියන්නේ ඒ ආපෝ ගතිය ම නේ. ගිනි ගොඩකට මගේ අම්මා, තාත්තා, දුව, පුතා කිව්වොත් හරි ද? ශරීරයේ තියෙන තේජෝ ගතියට ඒ තේජෝ ගතිය සමානයි නේ.

හමන සුළඟකට මගේ දුව, පුතා, අම්මා, තාත්තා කිව්වොත් හරි ද. තමන්ට ම තේරෙනවා හරි නැහැ කියන එක. එහෙනම් ශරීරයේ තියෙන හමන, පිම්බෙන, සොලවන, තල්ලු කරන වායෝ ගතියක් තියේ නම් බාහිර හුළඟක තියෙන වායෝ ගතියත් සමානයි නේ.

එබඳු වූ සතර මහා ධාතුවෙන් යුක්ත රූප මිටියක් අපි ම අවිද්‍යා කර්මයෙන් තනි කරලා අල්ලගෙන 'මගේ පුතා', 'පුතාට අපි මෙහෙම නම තියමු', 'දුවට මෙහෙම නම තියමු' කියලා හිත හැසිරෙව්වාම අන්තිමට ඒ රූප මගේ දුව, මගේ පුතා, කියලා හොඳට නිමිත්තක් හිටිනවා.

අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන මේ හේතු ටික එකතු කරලා නේද මම මේ 'පුතා' කියන එක හදාගෙන තියන්නේ කියලා පෙන්නනවා. මේ සිද්ධිය දන්නේ නැතුව මම කෙනෙක්ව ම සිහි කරනවා නම් මම මොන තරම් මෝඩ ද?

යමෙකුට ආනාපානසතිය වඩන්න දැනට බැරි නම්, සිහිවෙන සිහිවෙන පුද්ගලයන් එකක්වත් ඉතුරු කරන්න එපා. දැන් මේ කියලා දුන්න විදිහට ඒ නිමිති විදර්ශනා කරන්න ඕනේ. මේකට මහන්සි වෙන්න ඕන පුතේ. කම්මැලි වෙන්න හොඳ නැහැ. දිගයි තමයි මුල දී. හැබැයි පස්සේ කෙටි වෙනවා.

එකක් එකක් ගානෙ හොඳට හිතන්න. දරුවා හෝ අම්මා හෝ තාත්තා හෝ කියන නිමිත්තක් හොඳට අල්ලගෙන ඒ රූපයේ අඩංගු ආධ්‍යාත්මික පඨවි ධාතුව බාහිර පඨවි ධාතුවට ආදේශ කරලා පෙන්නනවා. ***"යා චෙව බො පන අජ්ඣත්තිකා පඨවීධාතු යා ච බාහිරා පඨවීධාතු***

පඨවීධාතුරෙවෙසා".[116] – ආධ්‍යාත්මික පඨවි ධාතුවක් තියේ නම් බාහිර පඨවි ධාතුවක් තියේ නම් ඒ පඨවි ධාතු සමාන කොට පෙන්වනවා.

හුඹහක තියෙන මැටි ටික, ගඩොල් කැටයක තියෙන මැටි ටික, පොළොවේ තියෙන පස් ටිකට 'කෙනෙක්' කිව්වොත් හරි ද කියලා හිතෙන් ඇහුවහම, ඒක වැරදියි කියලා හිත ම කියනවා. ඒ තද ගතිය ම නේ කනබොන ආහාරයෙන් හැදෙන රූපයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, හම්, මස් නහර කියන කොටස්වලත් තියන්නේ කියලා පෙන්නනවා. එතකොට හිතට නැහැ, බැහැ කියන්න බැරුව හිතට ඒ රූපයේ ඇත්ත පිළිගන්න ම වෙනවා.

මම මේ ඕගොල්ලන්ට උගන්වන්නේ යම් සේද ඒවගේ තමන් තමන්ගේ හිතට උගන්නන්න ඕන. තව කෙනෙක්ට කියලා දෙනවා වගේ ඕගොල්ලෝ ඕගොල්ලොන්ගේ හිතට කියලා දෙන්න වෙනවා. අවිද්‍යා සම්ඵස්සයෙන් හටගත්ත හිතට ප්‍රඥාවෙන් කියලා දෙන්න ඕනේ.

සීමා නොකරන ලද මනසේ ඉන්නේ නැතුව සතිපට්ඨානයෙන් තොරව ආහාරයෙන් හැදුණු රූපයක් අවිද්‍යා කර්මයෙන් තනි කරලා අල්ලගෙන 'මගේ දුව', 'මගේ පුතා' නැත්නම් 'මේ මම' කියලා තණ්හා, උපාදාන නැමති සායම් ගෑවා හොඳට. ඒකේ ප්‍රතිඵලය විඳියට භවය හැදුණා.

ආයතනවල සේවය කරලා ලෝකය තනන අපි

චක්ඛායතන, රූපායතන ආදී ආයතන කියන්නේ හරියට ෆැක්ටරි වගේ බඩුමුට්ටු හද හදා දානවා. එහෙන් සතර මහා ධාතු නැමැති අමුද්‍රව්‍ය ගන්නවා. මෙහෙන් අවිද්‍යා, කර්ම, තණ්හා කියන කර්ම කෙලෙස් ටික අරගෙන මිනිස්සු, වාහන, කාර්, ඉඩකඩම්, ගස් හද හදා තියා ගන්නවා.

උදේ ඉඳන් රෑ වෙනකල් ලෝකයා කරන්නේ මේ ආයතන ටිකේ බඩුමුට්ටු හදලා තියලා නිදාගන්න එක. ආයෙත් උදේ ම නැගිටලා පටන්

116 https://tipitaka.lk/mn-2-2-2 - **මහාරාහුලෝවාද සූත්‍රය- භික්ඛු වර්ගය- මජ්ඣිම නිකාය 2- 142 පිටුව**

ගන්නවා. ජීවිතේ පුරාවට ම කරන්නේ ඔය ෆැක්ටරියේ වැඩේ තමයි. ඒ නිසා හෙලවෙන්නවත් බැහැ ලෝකෙන්.

ආස්‍රව ක්ෂය කර ගන්න නම් සමථ කමටහනකින් හිත වඩමින් ස්කන්ධයන්ගේ උදයවැය පෙන්නන්න ඕන. 'කෙනෙක්', 'දෙයක්' සිහි වුණොත් ඒ කෙනා, ඒ දේ හැදුණේ කොහොමද, ඒ කෙනා, ඒ දේ නැති වෙන්නේ කොහොමද කියලා ස්කන්ධයන්ගේ උදයවැය පෙන්නන්න ඕන.

බාහිර අචේතනික වස්තු ඇති බවට සිහි වෙනවා නම්; අවිද්‍යා, කර්මයෙන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතුවෙන් හැදුණු වර්ණ සටහනක් තනි කරලා අල්ලගෙන මේක වැව, මේක පොකුණ, මේ ගම කියලා අපේ හිත හැසිරෙව්වාම ඒ රූපය ගම, පොකුණ, වැව කියන තැනක නිමිත්තක් හැදිලා තියෙනවා නේද කියලා පෙන්නනවා.

මේ තමන්ට තියෙන ලෝකය සුළුපටු ලේසි එකක් කියලා හිතන්න එපා පුතේ. භවය අයින් කර නොගත්තොත් යන්න තියෙන සසර මෙන්න මෙච්චරයි කියලා හිතන්න එපා, අතිදීර්ඝයි. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, **"මහණෙනි, මේ මහමුහුද සිඳෙන දවසක්, මහපොළව නැසෙන දවසක් මට කියන්න පුළුවන්. නමුත් අවිද්‍යාවෙන් යුක්ත පුද්ගලයාගේ දුක හිඳෙන දවසක් මට කියන්න බැහැ"** [117] කියලා.

ඇයි එහෙම බුදුරජාණන් වහන්සේ දේශනා කළේ? පටිච්චසමුප්පාද චක්‍රය නතර වෙන්නේ නැහැ අවිද්‍යාව තිබුණොත්. මේ භවය (ලෝකය) හදාගත්තේ අවිද්‍යාව, කර්ම, තණ්හා, ආහාර කියන හේතූන්ගෙන් ප්‍රත්‍යයන්ගෙන්. ඒ නිසා ලෝකය එක්ක ගනුදෙනු කරන්න එපා කියලා නොදන්නා කෙනා කරන්නෙ ම ඉන්න අය සිහි කර කර ඉන්න අය ඉන්න තැන් බලන්න යන එක. ඒක ස්වභාවයක් ම වෙලා නේ එයාට.

ඒ ගානේ එයාට සසරෙන් මිදෙනවා තියා සසරෙන් හෙල්ලෙන්නවත් බැරි වෙනවා. ඇයි ඒ? ඉන්න අය ඉන්න තැන් බලන්න යන ගානේ කෙලෙස්

---

117 https://tipitaka.lk/sn-3-1-2-5-7/sinh - **ගද්දූලබද්ධ සූත්‍රය- පුප්ඵ වර්ගය- බන්ධ සංයුත්තය- සංයුක්ත නිකාය 3- 257 පිටුව**

කර්ම රැස්වෙලා නැවත කර්ම භවය සැකසෙනවා. ඒ නිසා ආයෙත් උපදිනවා. නැවත නැවත මේ පටිච්චසමුප්පාද චක්‍රය ම යි සිදු වෙන්නේ.

ඉතින් එහෙම මනසේ තියෙන නිමිති ටික භවය කියලා හඳුනාගෙන අර මම පෙන්නුවා වගේ හොඳට උපායශීලී වෙන්න ඕනේ පුතේ. හොඳ දක්ෂ ලෙස යථාර්ථය පෙන්නන්න ඕන. කෙලෙස් හුරතල් නැහැ. ඒ බව හොඳට මතක තියාගන්න.

දුබල කෙනෙක්ට 'අම්මා' කියලා සිහිවෙන කොට පුළුවන්කමක් නැහැ මේ නිමිත්ත අනිත්‍යයි නේද, මේ නිමිත්ත හැදුණේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ප්‍රත්‍යයයන්ගෙන් නේද. ඒ හේතු ප්‍රත්‍යයයන් නැති වුණොත් මේ නිමිත්ත නැති වෙනවා නේද කියලා තේරුම් ගන්න. එහෙම තේරුම් ගන්න හදන කොට, කෙලෙස් විසින් කනේ පහරක් ගහනවා වගේ එකයි ගහන්නේ ඒ කෙනාව කැරකිලා වැටෙන්න.

ඒ දුබල කෙනාව කෙලෙස්වලින් වටලලා, 'ඇයි උඹ එහෙම කියන්නේ' කියලා කෙලෙස්වලින් තව මොකක් හරි පෙන්නුවහම ඒ නිමිත්ත ඇත්ත ම වෙලා යනවා එයාට. ඒ හින්දා හොඳට සිහිය තියාගෙන, හොඳට නුවණ තියාගෙන මේක කරන්න ඕන. කෙලෙස් යුද්ධය කියන්නේ ලේසි එකක් නම් නෙවෙයි පුතේ. කෙලින් ම මාර සටන කියලා කියන්නේ. *"සං නාහකං මාර රණෙ විසෙසං"* කියලා කියන්නේ. ධර්මය කියලා කියන්නේ හොඳ සන්නාහයක්, හොඳ හැට්ටයක් කියනවා මාර යුද්ධයට.

~ ස්කන්ධයන්ගේ උදයවැය බලන්නේ ඇයි ~

කාම බඩු භාණ්ඩ ඇසුරු කරපු හුරුව (කාමාස්‍රව) ගෙවන්නයි එහෙම කරන්නේ. ස්ථාන, තැන් පොළොව තියෙනවා කියලා ඇසුරු කළ හුරුව (භවාස්‍රව) ගෙවන්න තමයි මේක කරන්නේ. කුසල අකුසල කර්ම කරලා ආපු, කුසල අකුසල කර්ම කරලා යන ආත්මයන් තියෙනවා කියන දිට්ඨාස්‍රවය ගෙවන්නයි මේක කරන්නේ. මේ ආස්‍රව නේද කියලා නොදන්නාකමින් ලෝකය

ඇසුරු කරන ඒ අවිද්‍යා ආස්‍රවය ගෙවන්නයි මේක කරන්නේ කියන තැනක ඉඳගෙන ස්කන්ධයන්ගේ උදයවැය බලන්න ඕන.

ආස්‍රව ක්ෂය වුණහම උපාදානයට හිත විදිහට හටගන්න ස්පර්ශ ආයතන හය මතු නූපදින ස්වභාවයට පත් වෙනවා. එදාට කළයුත්ත කළා වෙනවා. ආස්‍රව ක්ෂය වුණහම ස්පර්ශ ආයතන හය හිස් වූ තල් කඳක් වගේ කළා වෙනවා. **සළායතන නිරෝධය**[118] කියලා කියන්නෙත් මේකටයි. අන්න ඒ පංච උපාදානස්කන්ධ දුකේ නිරෝධය සාක්ෂාත් කරන්නයි ස්කන්ධයන්ගේ උදයවැය බලන්නේ කියලා දැනගෙන කරනවා.

දැන් සතිපට්ඨානයෙන් පටන් ගන්නකො. එහෙනම් කට්ටිය තැන් තැන්වලට ගිහිල්ලා පොඩ්ඩක් හුරු වෙන්න ආස්‍රව ක්ෂයට. සමථ කමටහනකින් හිත වඩමින් සිහිවෙන නිමිති විදර්ශනා කරනවා නම් පහසුයි. එහෙම ආනාපානසතිය වගේ සමථ කමටහනකින් හිත වඩන්න බැරි කෙනෙක් ඉන්නවා නම් අඛණ්ඩව කෙලෙස්වලට යන්න නොදී නිමිති සිහිවෙන ගානේ ඒවා විදර්ශනා කරන්න. අතහරින්න එපා එකක්වත්.

මුල් කාලේ දී ඕගොල්ලොන්ගේ හිත දුවන වේගය වැඩියි. එක නිමිත්තක් විදර්ශනා කරන්න හදන කොට තව ලොරියක් විතර එනවා පිටිපස්සෙන්. ඒ නිසා එක නිමිත්තක් අල්ලගත්තහම අනිත් ඒවා කොච්චර ආවත් ඒවා නොසලකා හැරලා තමන් මුලින් අල්ලගත්ත නිමිත්ත විදර්ශනා කරන්න ඕන.

'දරුවා' කියලා අල්ලගත්ත නිමිත්ත විදර්ශනා කරන්න පටන් ගත්තහම දරුවෙක් බාහිර ඉන්නවා නෙවෙයි කියන එක ඔප්පු වෙන තැනට හිතලා මිසක අතහරින්න එපා. එකක් ගැන හොඳට හිතන්න පැය කාලක් භාගයක් ගියත් කමක් නැහැ, කිසිම පාඩුවක් නැහැ. සීයක් ගැන හිතනවාට වඩා එකක් හරියට හිතන එක වැදගත්. එකක් තුළින් දකින දැක්ම සියල්ලට ම එනවා. එකක් තුළින් ඇතිවෙන ප්‍රඥාව සියලුම නිමිතිවල කෙලෙස් හිඳින්න උදව් වෙනවා.

---

118 https://tipitaka.lk/sn-4-1-12-4/sinh - **කාමගුණ සූත්‍රය- ලෝකකාමගුණ වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 211 පිටුව**

ඒකෙදිත් පටන් ගන්න ඕන සතිපට්ඨාන භාවනාවෙන්. හොඳට මතක තියාගන්න. අස්ථානයේ හිතන්නේ නැහැ. එක නිමිත්තක් හොඳට අල්ලගෙන ඒ ගැනයි විදර්ශනා කරන්න ඕන. තමන්ට ජීවිතයේ දුක ගෙනත් දෙන්න පුළුවන් ආදරණීය අය කියලා නිමිති තියෙනවා නේ. ඒවා ඉස්සෙල්ලා අල්ලගන්න.

අම්මා ම යි, තාත්තා ම යි, දුව ම යි, පුතා ම යි, බිරින්දෑ ම යි, කියලා හිතෙන නිමිති තියෙනවානේ නේ. අන්න ඒ නිමිත්තක් අල්ලගත්තා. ඊට පස්සේ බාහිර පඨවියේ හිත හසුරුවනවා. හුඹහක, ගඩොල් කැටයක, පොළොවක තියෙන මැටි ටිකකට කෙනෙක් කිව්වොත් හරි ද? වැරදි. පොළොවේ මැටිවල තියෙන පඨවි ස්වභාවය (තද ගතිය) යි, කනබොන බත්, පාන්, කව්පි, මුං ඇටවලින් හැදුණු ඒ ශරීරයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, හම්, මස් කියන කොටස්වල තියෙන තද ගතිය යි සමානයි. පොඩ්ඩක්වත් වෙනසක් නැහැ.

ළිදේ, වැවේ, පොකුණේ තියෙන වතුර ටිකක තියෙන ආපෝ (ගලන, වැගිරෙන) ස්වභාවය යි; පිත, සෙම, සැරව, ලේ, දහඩිය, වුරුණු තෙල් කඳුලු, කෙළ, සොටු, මූත්‍රා කියන ඒවායේ ආපෝ ස්වභාවයයි සමානයි. ගිනිගොඩක තියෙන උෂ්ණ ගතිය යි මේ ශරීරයේ තියෙන උෂ්ණ ගතිය යි සමානයි. බාහිර වාතයයි ශරීරයේ තියෙන වාතයයි සමානයි.

එබඳු රූපයක් උපාදාන වෙන්න පුළුවන් විදියට සීමා කරලා අල්ලගෙන කෙනෙක් හැටියට හෝ ආත්මයක් හැටියට මනසින් හැසිරෙනවා නම් ඒ තමයි ‘අත්තවාද උපාදානය’. අම්මා හැටියට, දරුවා හැටියට ගත්තා නම් ඒක තමයි ‘කාම උපාදානය’. නියත මිථ්‍යා දිට්ඨිය ඇතුළුව කිසියම් ම හෝ මිථ්‍යා දිට්ඨියකින් ගත්තා නම් ඒ තමයි ‘දිට්ඨි උපාදානය’.

මේ උපාදානය නේද, උපාදාන වෙනවා කියන්නේ මේකට නේද කියන්නේ කියලා අපි දන්නේ නැහැ. රූපය දකින කොට ‘කෙනෙක්’ කියලා හැඟෙන බව මනසේ ඉපදිලා තියෙන්නේ. මම දන්නේ නැහැ ඒ රූපය දකින

කොට ‘කෙනෙක්’ කියලා ගතියක් මනසේ උපන්නා කියලා. රූපය කෙනෙක් වගෙයි මට තේරෙන්නේ.

උපාදානස්කන්ධය නිසා උපාදාන වෙනවා කියන්නේ, රූපය දකින කොට ම ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියලා හැඟීමක් එන එකට. දැන් බලන්න රූපය එතන ම තියෙද්දි ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියන ගතිය තේරුණේ කාට ද? තමන් ගාව උපන්නා ‘පුද්ගලයෙක්’, ‘සත්ත්වයෙක්’ කියන ගතිය. මේකට කියනවා ‘අත්තවාද උපාදානය’ කියලා.

ඒ කිව්වේ රූපය උපාදානයට හිතයි. රූපය දකින කොට හිතෙනවා මේ ‘පුද්ගලයෙක්’ කියලා. ඊටපස්සේ රූපය උපාදාන වශයෙන් ගන්නවා කියන්නේ ඒ ‘පුද්ගලයෙක්’ කියන අදහසින් රූපය ස්පර්ශ කරනවා. ‘පුද්ගලයෙක්’ කියලා රූපය ගන්න කොට උපාදාන වශයෙන් ගත්තා වෙනවා. ගත්තේ මොකක් ද? සතර මහා ධාතු රූපය.

දැන් මේ වස්තුව දිහා බලන කොට ඒක හොඳයි කියලා හිතෙනවා. ඒක හොඳයි කියලා හිතුණෝ කාට ද? තමන්ගේ හිතේ නේද ඒ ගතිය ඇති වුණේ. තණ්හාව කියන්නේ ඒකයි. මේ රූපය තණ්හාව ඇති වෙන්න හිතයි. වස්තුවක් පරිහරණය කරන්න කැමැත්තක් ඇතිවෙලා තියන්නේ තමන් ගාව නේද.

ඊට පස්සේ අපි දන්නේ නැහැ රූපය දකින කොට තමන්ගේ හිතේ ‘වටිනවා’ කියන උපාදාන ගතිය ඇති වෙනවා කියලා. ඒ ‘වටිනවා’ කියලා හිතේ ඇති වුණු උපාදාන ගතිය රූපය පැත්තට තැබුවහම ‘මේ රූපය වටිනවා’ කියන තැනකින් පේන්නේ.

රූපය උපාදානයට හිතයි. ඒ හින්දා මට රූපය දකින කොට ම බොහෝ කල් සිට හුරු කළ ආස්‍රවත් හින්දා ‘කෙනෙක්’ කියන ගතිය සිහි වෙනවා. එහෙම දැනුණා කියන්නේ මං ගාව ‘අත්තවාද උපාදානය’ උපන්නා කියන එක. ඒ හින්දයි මට රූපය කෙනෙක් වගේ තේරෙන්නේ.

‘රූපය කෙනෙක්’ කියලා පෙන්නනකම උපදින්න හිතයි මේ රූපය. නමුත් රූපය කෙනෙක් නෙවෙයි. රූපය දකින කොට ‘රූපය කෙනෙක්’

කියනකම උපදිනවා. කාගාව ද? රූපය දකින මං ගාව. රූපය උපාදානයට හිතයි (උපාදානීයයි). උපාදානය කියන්නේ 'කෙනෙක්' කියලා සිහිවෙනකම.

ඊටපස්සේ උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙනවා කියලා කියන්නේ මොකක් ද? මනසේ ඇති වුණු 'රූපය කෙනෙක්' කියන උපාදාන ගතිය ඔසවලා තබනවා බාහිර සතර මහා ධාතු රූපය පැත්තට. හොඳට දකින්න, උපාදානය කියන එක මගේ මනසේ යෙදිලා මනසේ ම තියෙන එකක් නෙමෙයි. උපාදානයට හිත ධර්මයන් කෙරෙහි උපාදානය උපදින්නේ. රූපය ආත්ම වශයෙන් හැඟෙන කම තමයි 'අත්තවාද උපාදානය' කියලා කියන්නේ. ඒ උපාදානයට හිත වෙලා තියෙන්නේ මොකක් ද? සතර මහා ධාතු රූපය

ඔය ගතිය තියෙනවා ද බලන්න සීමා නොකරන ලද මනසේ දී? එහෙම පුද්ගලයෙක් ය කියන ගතියකට අවදි වෙන්න ඉඩ නැහැ සීමා නොකරන ලද මනසේ දී. සීමා කරලා ගත්තාම උපාදානයට හිත විදියට රූපය හදපු ගමන් ම උපාදානය ඇති වෙනවා කියන එක නවත්වන්න බැහැ.

අපි දන්නේ නැහැ රූපය දකින කොට අපේ හිතේ 'කෙනෙක්' කියන ගතිය ඇති වුණා කියලා. ඊට පස්සේ සතර මහා ධාතු රූපය කෙනෙක් කියන තැනකින් අපි හිතීම්, කීම්, කිරීම් කරනවා. නමුත් සතර මහා ධාතුව සතර මහා ධාතුව ම යි. ඒක හෙල්ලෙන්නේවත් නැහැ.

පුද්ගලයෙක් කියන ගතිය සිහි කර ගෙන 'පුද්ගලයෙක් තමයි මේ' කියලා ඒක සතර මහා ධාතුවට ආදේශ කර ගෙන තනිව ම මහා පිස්සුවක් නටනවා අපි. ඊට පස්සේ ඉතින් මේ හැඩය පුද්ගලයා ම තමයි කියන එකෙන් ආයේ ගලවගන්න ම බැහැ. ඇම කෑවම ආයේ ඒක ගලවගන්න ම බැහැ, බොකුත් එක්කනේ එළියට එන්නේ. ඒ වගේ දෙයක් තමයි වෙන්නේ.

අපි කාමය ගිල්ලහම ආය වමාර ගන්න ම බැහැ. භවය හැදිලා තිබුණහම හොල්ලගන්නවත් බැරුව මේ තියෙන්නේ. අපි ආස්‍රව හඳුනන්නේ නැතිකම තියෙන්නේ. ඒ කියන්නේ උදාහරණයකට අපි කියමුකෝ අසූචි ටිකක් තියෙනවා කියලා. ඕක දකින කොට 'අපෝ මේක හොඳ නැහැ' වගේ අදහසක් අපිට හිතෙනවා. අපිට හිතෙන්නේ නැහැ 'මේක හොඳ නැහැ'

කියන ගතිය මගේ මනසේ ඇති වුණේ කියලා. 'ඒ වස්තුව හොඳ නැහැ' වගේ තැනකින් තමයි අපිට තේරෙන්නේ.

ඒක අපිට හිතාගන්න පුළුවන් බල්ලෙක් වගේ සතෙක් ආවොත්. ඒකා ඒ අසුචි ගොඩ දකින කොට එයාට හිතෙනවා මේක හොඳයි වගේ තැනකින්. ඒකා දන්නේ නැහැ ඒකාගේ මනසෙයි හොඳයි කියනකම ඇති වුණේ කියලා. ඒ නිසා එයා වස්තුවට පනිනවා.

ඒ වස්තුව හොඳයි නම් ඒක හැමෝටම හොඳ වෙන්න ඕනේ නේ. කෙනෙක්ට හොඳයි, තව කෙනෙක්ට හොඳ නැහැ කියලා හිතෙන්නේ ඒ ඒ කෙනාගේ මනසෙයි හොඳයි හෝ හොඳ නැහැ කියන එක ඇතිවෙන්නේ මිසක වස්තුවේ නැහැ එහෙම එකක්.

ඇහැ, රූපය සංයෝජනීය යි (සංයෝජයන්ට හිතයි).[119],[120] ඒවා තිබුණා ම සංයෝජන ඇති වෙනවා. **සංයෝජනීය ධර්ම කෙරෙහි රස විඳගැනීම අනුව බලන කෙනාට තණ්හාව වැඩෙනවා. තණ්හාව නිසා උපාදානය ඇති වෙනවා. උපාදානය නිසා සියලු දුක් රැසේ හට ගැනීම ඇතිවෙනවා** [121] කියලා පෙන්වන්නේ. පංච උපාදානස්කන්ධ ලෝකයේ හටගැනීම තුළින් ඔන්න ඔය කාරණාව පෙන්නන්නේ.

අපිට සිහිවෙන නිමිත්තක රේල් පීල්ලක දෙපැත්තක් වගේ දෙපැත්තක් තියන්නේ. බාහිරින් ආහාරයෙන් හැදුණු සතර මහා ධාතු රූප මිටියක් තියෙනවා. ආධ්‍යාත්මික පැත්තෙන් අවිද්‍යා කර්මයෙන් ඒක උපාදාන වෙන්න පුළුවන් විදියට තනි කරලා අල්ලගන්නවා. එහෙම තනි කරලා අල්ලගන්න ඕන. එහෙම අල්ලගත්තේ නැතුව සීමා නොකරන ලද මනසේ හිටියොත් හෝ සතිපට්ඨානයෙන් හිටියොත් අපිට උපාදානය ඇති වෙනවා ද? උපාදාන වෙන්නේ නැහැ. ඒ හින්දා රූපය හොඳට උපාදාන වෙන්න පුළුවන් විදිහට සීමා කරලා අල්ලගන්නවා.

---

119 https://tipitaka.lk/sn-4-1-12-9/sinh - **සංයෝජන සූත්‍රය- ලෝකකාමගුණ වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 225 පිටුව**

120 https://tipitaka.lk/ap-dhs-4-5/sinh - **සංයෝජනගොච්ඡකය- නික්ඛේපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 427 පිටුව**

121 https://tipitaka.lk/sn-2-1-6-3/sinh - **සංයෝජන සූත්‍රය- දුක්ඛ වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය 2- 135 පිටුව**

එහෙම අල්ලගන්න විතරයි ඕන. ‘කෙනෙක්’, ‘පුද්ගලයෙක්’ කියන අදහස ක්ෂණිකව යෙදෙනවා. ඊටපස්සේ කෙනා එක්ක ම ගනුදෙනු කරලා පැත්තකට වුණාම ආය හොල්ලන්නවත් බැහැ, බාහිර එහෙම කෙනෙක් ඉන්නවා ම වෙනවා අපිට. ඒක ඇත්ත ම වෙනවා අපිට.

දැන් භවය ගලවන්න මහන්සි වෙන්න වෙනවා. සතර මහා ධාතු රූපයේ ඇත්ත පෙන්නලා, ඒ රූපයට කෙලෙස් වශයෙන් මෙහෙම ගිහිල්ලා නේද මේ නිමිත්ත හදාගත්තේ කියලා. එහෙම පෙන්නුවාට මුලින් ම හිත පිළිගන්නේ ම නැහැ. ඒ නිසා නැවත නැවත මේ ඇත්ත පෙන්නනවා, හිතට නැහැ, බැහැ කියන්න බැරි වෙන්න ම.

රූපය සතර මහා ධාතුයි, එබඳු රූපයට උඹ මෙහෙම හිතලයි මේ නිමිත්ත හැදුණේ කියලා. මේ විදිහට දිගින් දිගට ම ඇත්ත හිතට පෙන්නලා දෙන කොට ටික කලක් යන කොට හිත පිළිගන්න මට්ටමක් එනවා. හිතට බැරි ම තැන කෙලෙස් පොඩ්ඩක් බුරුල් කරනවා එයා ම.

මුලින් ම අපි ඇත්ත පෙන්වන එකට ප්‍රතිවිරුද්ධව කෙලෙස්වලින් අනික් පැත්තට කරකවන්න හදනවා ම යි. කොච්චර ඇත්ත පෙන්නුවත් පිළිගන්නේ ම නැහැ හිත. කෙනෙක් ම යි කියනකම ම තමයි පිළිගන්නේ. එතකොට තමනුත් පස්සට යන්න එපා. ආපහු ඇත්ත පෙන්නන්න. එතකොට පොඩ්ඩක් එයා අඩියක් පස්සට ගන්නවා.

ඒ කියන්නේ ඇත්ත පෙන්නන කොට රූපය කෙනෙක් නෙවෙයි කියලා හිත පිළිගන්න මට්ටමට එනවා. සත්ත්ව පුද්ගල නොවූ කය (රූපය) පමණක් ඇත්තේ ය යන සිහිය හොඳින් එළඹ සිටියහම සතිපට්ඨානයේ කෘත්‍ය ඉවරයි. එතකොට එනවා සම්‍යක්ප්‍රධානයේ කෘත්‍ය.

ඔහොම ඊට පස්සේ සම්‍යක්ප්‍රධාන ඉඳලා ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, ආර්ය අෂ්ටාංගික මාර්ගය උපදින තැන දක්වා ම අනුක්‍රමයෙන් මාර්ගය වැඩෙනවා. යම් දවසක් තියෙනවා සියලු ම ආස්‍රව ගෙවිලා, අනුසයත් ගෙවිලා උපන් ගෙදරට (සීමා නොකරන ලද මනසට) ම එන්න පුළුවන්. ගිය විදියට ම

හිටපු තැනට එන්න පුළුවන්. ඒ හින්දා එහෙම කරන්න. එහෙම නම් අපි ටිකක් භාවනා කරමු ද?

~ අප්‍රමාදී වෙන්න ~

මගේ පුතේ, මම ඊයෙත් අර මීහරකාගේ කතාව කිව්වේ. මේ සසර නම් ලේසි නැහැ. හිතන්න මේ වගේ දහම් ටිකක් අහගන්න නැතුව සසර ආපු ගමන කොච්චර ද කියන එක. මුල් කෙළවරක් පනවන්න බැහැ. ඒච්චරට දිගයි අපි ආපු සසර ගමන. ආයේ සසරට වැටුණොත් පුතේ, පිහිටක් පිළිසරණක් වෙන්න කිසිම කෙනෙක් නැහැ. බුද්ධෝත්පාද කාලයක මනුස්ස ජීවිතයක් ලබලා සුගතියක ඉපදිලාත් මෙච්චර ප්‍රශ්න, ගැටළු, දුක නම් තියෙන්නේ, හිතන්න අබුද්ධෝත්පාද කාලයක මනුස්සයෙක් වෙලා උපන්නොත් හෝ දුගතියක උපන්නොත් කොහොමද කියලා.

මේ නෑදෑයෝ, ගෙවල් දොරවල්, ඉඩකඩම් මේ කිසි දෙයක් එන්නේ නැහැ අපි එක්ක. තව අවුරුදු පනහකින්, හැටකින් මේවා බොරුම ම තමයි. අපි සමහරවිට බුදුරජාණන් වහන්සේගේ කාලෙත් මනුස්සයෙක් වෙලා ඉපදිලා ඉන්න ඇති. එදා අපිට බණ ටිකක් අහන්න යන්නවත් වෙලාවක් තියෙන්න නැතුව ඇති.

ගෙදර වැඩ, දරුවන්ට උගන්වන්න තියෙනවා, කන්න බොන්න හොයන්න ඕන මේ වගේ වැඩ කටයුතු හින්දා බණ අහන්නවත් වෙලාවක් නැති වෙන්න ඇති. ධර්මයේ මූණ බැලුවේ නැහැ. ගෙවල් දොරවල්, දරුවන්ගේ මූණවල් දිහා බල බල හිටියා. ඒ හින්දා ම ඒවාට තණ්හාවෙන් නැවත උපන්නා. අනේ අපේ අම්මා, අප්පච්චි අපි හින්දානේ සසරට වැටුණේ කියලා දැන් ඒ අය එනවද අපිව බේරගන්න? නැහැ.

දැන් අඳත් ගොඩක් දෙනෙකුට බණක් භාවනාවක් කරන්න වෙලාවක් නැහැ. ළමයිගේ වැඩ, ගෙවල් දොරවල්වල වැඩ, යුතුකම් නිසා. ඒ නිසා

ධර්මය පැත්තකට දාලා. සසරට වැටුණාම ඔය ගෙවල් දොරවල්වල මිනිස්සු එනවද බලන්න? එන්නේ නැහැ.

ඊගාවට හොඳට මතක තියා ගන්න, ඔබවහන්සේලා අප්‍රමාදීව කටයුතු කළොත් ඒ අහිංසක මිනිස්සුන්වත් සුවපත් කර ගත්ත හැකි. ඔබ වහන්සේලා මහණ වෙලා මනසේ තියෙන විතර්කවලට අනුගතව ගෙවල් දොරවල් ගැන හිත හිතා හිටියොත් අපි හරියට මැද අසුවි ගෑවිච්ච දෙපැත්තේ ගින්දර තියෙන ගිනිපෙනෙල්ල වගේ වෙයි.

මැද අසුවි ගෑවිච්ච දෙපැත්තේ ගින්දර තියෙන ගිනිපෙනෙල්ල ගමේ වැඩකට ගන්නෙත් නැලු, ආරණ්‍යයේ වැඩකට ගන්නෙත් නැලු.[122] ඇයි ඒ? දෙපැත්තේ ගින්දර හින්දා අල්ලන්න බැහැ. මැද අසුවි හින්දා අල්ලන්න බැහැ. ඒ වගේ අපි මහණ වෙලත්, මෙතන ඉඳගෙන ගෙවල් ගැන, මිනිස්සු ගැන, දරුවෝ ගැන තළුමර මරා සතුටු වෙමින් හෝ දුක් වෙවී ඉන්නවා නම් අපිට නින්දා කළ යුතුයි.

අපි ගිහි ගෙදරක වැඩක් කරන්නෙත් නැහැ කයින් වෙන්වෙලා හින්දා. පැවිදි ජීවිතයේ වැඩක් කරන්නෙත් නැහැ හිතින් ගිහිගෙයින් වෙන්වෙලා නැති හින්දා. අන්තිමට අපි භික්ෂු ජීවිතයෙනුත් පිරිහෙයි, ගිහි ජීවිතයෙනුත් පිරිහෙයි. අපි දෙපැත්තෙන් ම පිරිහෙයි.

ඒ හින්දා හොඳට පැත්තකට ගිහිල්ලා අප්‍රමාදීව රෑ දවල් දෙකේ වෙහෙසෙන්න මගේ පුතේ. උඹලා පුතේ හරියට වෙහෙසුණොත් දවස් පහ හයකට වඩා වෙහෙසෙන්න ඕනේ නැහැ පරප්‍රත්‍ය රහිත බවට. පරප්‍රත්‍ය රහිත බව කියන්නේ අනුන්ගේ උදව්වක් නැති තැනකට නිසැක වෙනවා. (සෝවාන් වෙනවා.)

---

122 https://tipitaka.lk/kn-iti-3-5-2/sinh - **ජීවිකා සූත්‍රය- පඤ්චම වර්ගය- තික නිපාතය- ඉතිවුත්තකපාළි- බුද්දක නිකාය- 441 පිටුව**

~ සෝතාපත්ති අංග[123] ~

දැන් මම ධර්මය කියලා දෙන එකෙන් ඕගොල්ලන්ට ලැබෙන්නේ සුතමය ඥානයක් විතරයි. අහලා දැන ගත්ත නුවණක් විතරයි. කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය, පරතෝඝෝෂය කියන එක අනුන්ගෙන් ලැබෙන්න ඕන. ඊට පස්සේ ධර්මානුධම්ම ප්‍රතිපත්තිය, යෝනිසෝමනසිකාරය කියන අංග දෙක ඕගොල්ලන්ගෙන් එකතු වෙන්න ඕන.

කළ්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් චතුරාර්‍ය සත්‍යය ඝටිත වූ දේශනාවක් තමයි අහන්න ඕනේ. එතකොට දැන් කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය ලැබුණා කියන්නකෝ. ඕගොල්ලො ගාවින් අංග දෙකක් එකතු වෙන්න ඕන. මොකක්ද ඒ දෙක? යෝනිසෝමනසිකාරය යි, ධම්මානුධම්ම ප්‍රතිපත්තිය යි. ධම්මානුධම්ම ප්‍රතිපත්තිය කියලා කියන්නේ හොඳට සීලයක පිහිටලා සතිපට්ඨානය තුළ වාසය කිරීම.

යෝනිසෝ මනසිකාරය කියන්නේ නුවණින් හිතන්න ඕන. යෝනිසෝ මනසිකාරය එක විදිහකින් අර්ථ දක්වන්න බැහැ. ඒ නිසා යෝනිසෝ මනසිකාරය කියන එක අර්ථ දක්වන්නේ අර්ථයකින්. නූපන් ආස්‍රව නූපදින විදියට උපන් ආස්‍රව ගෙවෙන විදියට මෙනෙහි කරන එකට කියනවා ‘යෝනිසෝ මනසිකාරය’ කියලා.

නූපන්නා වූ කාමාස්‍රවය නූපදින විදිහටත්, උපන් කාමාස්‍රවය ගෙවෙන විදිහටත්, නූපන්නා වූ භවාස්‍රවය නූපදින විදිහටත්, උපන් භවාස්‍රවය ගෙවෙන විදිහටත්, නූපන්නා වූ අවිද්‍යාස්‍රවය නූපදින විදිහටත්, උපන් අවිද්‍යාස්‍රවය ගෙවෙන විදිහටත් මෙනෙහි කරන එකට කියනවා ‘යෝනිසෝ මනසිකාරය’ කියලා.

“ජානතෝ අහං භික්ඛවෙ පස්සතෝ ආසවානං බයං වදාමි, නෝ අජානතෝ, නෝ අපස්සතෝ. කිඤ්ච භික්ඛවෙ ජානතෝ කිං පස්සතෝ

---

123 https://tipitaka.lk/sn-5-11-5-10/sinh - **අඞ්ග සූත්‍රය- සෝතාපත්ති සංයුක්තය- සංයුත්ත නිකාය 5 - 241 පිටුව**

ආසවානං බයො හොති? යොනිසො ච මනසිකාරං අයොනිසො ච මනසිකාරං.” [124]

මහණෙනි, දන්න කෙනාට දකින කෙනාට ආස්‍රව ක්ෂය වීම කියමි. නොදන්න කෙනාට නොදකින කෙනාට නෙවෙයි. කුමක් දන්න, කුමක් දකින කෙනාටද ආස්‍රව ක්ෂය වෙන්නේ? යෝනිසෝ මනසිකාරය යි, අයෝනිසෝ මනසිකාරය යි දෙක දන්න දකින කෙනාට ආස්‍රව ක්ෂය වීම කියමි. තව පැත්තකින්, **ස්කන්ධයන්ගේ උදයවැය දන්න කෙනාට ආස්‍රව ක්ෂය වීම කියමි කියලත් පෙන්නලා තියෙනවා.**[125] ඒ හින්දා ඕගොල්ලන්ට තියෙන්නේ ආස්‍රව ක්ෂය කර ගන්න.

මනසින් සිහි කරන කොට හෝ ඇහැට රූපයක් පෙනෙන කොට සතර මහා ධාතුව පැත්තේ බඩුමුට්ටු, ගෙවල් දොරවල්, මිනිස්සු නැහැ යථාර්ථ වශයෙන්. එහෙම හම්බ වෙනකමට තමයි ‘කාමාස්‍රවය’ කියන්නේ. ඒක තමයි ගෙවන්න ඕනේ කියලා දන්නවා. යමක් සිහි කරන කොට හිත බාහිරයට නැමිලා අන්න අතන අරෙහේ තියෙන්නේ කියලා දුර, ළඟ, ඈත, දිග, පළල, රවුම් හතරැස් කරලා පෙන්වන ගතියට තමයි භවාස්‍රවය කියලා කියන්නේ. ඒක තමයි ගෙවන්න ඕනේ කියලා දන්නවා.

පංච උපාදානස්කන්ධය තුළ ආත්මයක් තියෙනවා කියලා දැනෙනකම තමයි දිට්ඨාස්‍රවය. මේවාට කියන්නේ ආස්‍රව නේද කියලා නොදන්නාකම අවිද්‍යාස්‍රවය කියලා දන්නවා එයා. මේ ටික ගෙවන්න ඕනේ කියලා මහන්සි වෙන කොට දියවෙලා ඇති පංච උපාදානස්කන්ධ ලෝකේ.

ආස්‍රව ක්ෂය යි කියලා කියන කොට පංච උපාදානස්කන්ධ ලෝකයට මොනවා වෙලා ඇති ද? නිරුද්ධ වෙලා ඇති. අනුත්පාද ස්වභාවයට ගිහින් ඇති. පංච උපාදානස්කන්ධ ලෝකය දියවෙලා. *“ඛීණා ජාති”* - ඉපදීම නතර වුණා. කළ යුත්ත කළා. පංච උපාදානස්කන්ධ ලෝකය උපදින්නේ ම නැහැ. ආස්‍රව ක්ෂය යි.

---

[124] https://tipitaka.lk/mn-1-1-2 - **සබ්බාසව සූත්‍රය- මූලපරියාය වර්ගය- මජ්ඣිම නිකාය 1- 18 පිටුව**

[125] https://tipitaka.lk/sn-2-1-3-3/sinh - **උපනිස සූත්‍රය- දසබල වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය 2- 47 පිටුව**

උපන් ගෙදරට (සීමා නොකරන ලද මනසට) ඇවිත් බොහෝම විවේකයෙන් වාසය කරනවා. එයාට තමයි රහතන් වහන්සේ කියලා කියන්නේ. ඒ හින්දා ආපහු උපන් ගෙදරට එන්න කවුරුත් මහන්සි වෙන්නකෝ. එහෙනම් දැන් ගිලන්පස ටිකක් වළඳලා, හැම කෙනෙක් ම පුළුවන් විදිහට හොඳට වීර්‍ය කරන්න පැත්තකට ගිහිල්ලා. එහෙම වීර්‍ය කරලා පැයකින් එන්න. ආවහම කමටහන් සුද්ද කරලා දෙන්නම්. ඒ කියන්නේ භාවනා කරන අයට භාවනාව සම්බන්ධ ප්‍රශ්න ගැටළු තිබ්බොත් මං කියලා දෙන්නම්.

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.02.15 දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසන වාසී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සිදු කළ 02 වන ධර්ම දේශනාව ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ප්‍රශ්නයක්:

දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග කියන චතුරාර්ය සත්‍යය පෙන්නලා, මාර්ග සත්‍යය ඇතුළේ සම්මා දිට්ඨිය විස්තර කරන තැන ඇයි චතුරාර්ය සත්‍යය ගැන ආපහු කියන්නේ ස්වාමීන් වහන්ස?

පිළිතුර:

අර මම උදාහරණයකින් කිවුවේ; මේ ශාලාව වටපිටාවේ ඉන්න එක දුක. ඒ දුක් විඳින්න වෙන්නේ මෙතන තණ්හාවෙන් ඉන්න හින්දයි. මම මෙතනට ආශා නොකර මේ ශාලාවෙන් ගියොත් මේ දුක නැහැ. ඒ හින්දා මම කුස්සියට යන්න ඕනේ කියලා කුස්සියට ගියා. දැන් මම දුකත්, දුකට හේතුවත්, දුකේ නැතිවීමත්, දුක නැති කරන මඟත් දන්නවා.

එතකොට ඇයි කුස්සියට වෙලා ඉන්නේ කියලා මගෙන් ඇහුවහම කියන්න වෙනවා ශාලාවේ ඉන්න කොට මැසි මදුරු, අව් සුළං ආදී දුක් විඳින්න වෙනවා. එතකොට ශාලාවේ හිටියොත් නේ දුක. එතනට ගියේ නැති වුණොත් දුක නැති නිසා මම කුස්සියට වෙලා ඉන්නවා කියලා ආපහු කියන්න වෙනවා.

මුලින් චතුරාර්ය සත්‍යය න්‍යායයෙන් කියන්නේ ලෝකයෙන් මිදිලා නිවන් දකින්න කැමති වෙන්න කියලා. ලෝකය දුකයි කියලා දකින හින්දා ලෝකෝත්තර මාර්ගයේ ඉන්නේ කියන කාරණාව පෙන්වන්න ඕනේ නිසා

දෙවනුවට චතුරාර්ය සත්‍යය දර්ශනය මාර්ග සම්මා දිට්ඨියේ දී හොඳට විස්තර කරලා පෙන්වනවා.

ඒක තමයි මෙතන තියෙන හයිය. චතුරාර්ය සත්‍යය දෙපැත්තට නොකිවුවොත් තමයි ප්‍රශ්නය තියෙන්නේ. මුලින් ම චතුරාර්ය සත්‍යය න්‍යාය විස්තර කරන තැන දී තමයි දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැති කරන මඟ කියලා කිව්වේ. එතන දී දුක කියන වචනය භාවිතා නොකර වෙනත් වෙනත් වචන භාවිතා කරලත් මාර්ගයට එන්න පුළුවන්. න්‍යායන්වල දී වචන වෙනස් වෙනවා.

රූපයත්, රූප සමුදයත්, රූප නිරෝධයත්, රූප නිරෝධගාමිණී ප්‍රතිපදාවත් දන්නවා කියන තැනක දී රූපය කියන එක නියෝජනය වෙන්නේ දුක හැටියට. නමුත් එතන දී දුක කියන වචනය කියන්නේ නැහැ. හැබැයි ප්‍රතිපදාවේ දී දුක දැකලා ආපු කෙනාටත්, රූපය දැකලා ආපු කෙනාටත් මාර්ග සම්මාදිට්ඨිය අර්ථ දක්වන කොට එක ම යි. එනම්, *"දුකෙඛ ඤාණං දුකඛසමුදයෙ ඤාණං දුකඛනිරොධෙ ඤාණං දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං"* කියන එක.

"දුකෙඛ ඤාණං" කියන කොට *"සඬඛිත්තෙන පඤ්චුපාදානකඛන්ධා දුකඛා"*. ඇයි පංච උපාදානස්කන්ධයට දුකයි කියන්නේ? න්‍යායේ දී දුකට හේතුව තණ්හාවයි කියලා පෙන්නුව එක මාර්ග සම්මා දිට්ඨියේ දී හොඳට දිගහැරලා පෙන්වනවා. පංච උපාදානස්කන්ධය තිබුණොත් තණ්හාව යෙදෙනවා ම යි. තණ්හා වුණොත් උපාදාන වෙනවා. උපාදාන වුණොත් භවය වෙනවා. භවය වුණොත් ජාති ජරා මරණ ආදී සියලු දුක් රැසේ හටගැනීම වෙනවා. ඒ නිසයි පංච උපාදානස්කන්ධයට දුකයි කියන්නේ කියලා හොඳට දිගහැරලා පෙන්වනවා මාර්ග සම්මා දිට්ඨියේ දී.

පංච උපාදානස්කන්ධය නැති වුණොත් තණ්හා කරන්න තැනක් නැහැ. එහෙම වුණොත් උපාදානය නැහැ. උපාදාන නොවුණොත් භවය නැහැ. භවය නැති නිසා ජරා මරණ දුක ආදී සියලු ම දුක නැහැ. ඒ නිසා පංච උපාදානස්කන්ධයේ අනුත්පාද නිරෝධය සඳහා කටයුතු කළ යුතුයි

කියන එක තමයි දර්ශනය/ සම්මාදිට්ඨිය. ***"සම්මාදිට්ඨී පුබ්බඞ්ගමා හොති"*** [126] - සම්මාදිට්ඨිය පෙරටුව යනවා.

එහෙම දැක්ම තියාගෙන පංච උපාදානස්කන්ධයේ නිරෝධය සාක්ෂාත් කර ගන්න උපකාරවන විදිහට සම්මා සංකප්පයට අනුව හිතනවා. පංච උපාදානස්කන්ධයේ නිරෝධය සාක්ෂාත් කර ගන්න උපකාර පිණිස සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන සීලයක පිහිටනවා. පංච උපාදානස්කන්ධයේ නිරෝධය සාක්ෂාත් කර ගන්න උපකාරවන විදිහට උත්සාහයෙන් (සම්මා වායාම) සිහිය (සම්මා සති) පිහිටලා සමාධිය (සම්මා සමාධි) වඩනවා.

සම්මා දිට්ඨිය මුල්වෙලා ඔය ටික කරන කොට සම්මා සමාධිය එනවා. සම්මා සමාධියට පංච උපාදානස්කන්ධය දුකයි කියන ඇත්ත ඇති හැටිය දකිනවා. ඇත්ත ඇති හැටිය දකින නිසා කළකිරෙනවා. කළකිරෙන නිසා නොඇලෙනවා. නොඇලෙන නිසා මිදෙනවා. මිදුනහම කළ යුක්ත කළා කියන නුවණ පහළ වෙනවා.

තව ම අපිට සම්මා සමාධිය ඉපදිලා නැති නිසා පංච උපාදානස්කන්ධය දුක ම බව පෙනෙන්නේ නැහැ. ඒ නිසා අපි පංච උපාදානස්කන්ධය ගැන නුවණින් සම්මර්ශනය කරලා බලනවා. ඒකට තමයි මාර්ගය වඩනවා කියලා කියන්නේ. සම්මා සමාධියට ආවහම ප්‍රාර්ථනාවක් උත්සාහයක් නැතුව ම පංච උපාදානස්කන්ධය දුක ම බව පෙනෙනවා. එහෙම පෙනෙන කොට තමයි කළකිරෙන්නේ.

~ සමාධිය වැඩිය යුත්තේ ඇයි ~

"සමාධිං භික්ඛවෙ, භාවෙථ. සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති" [127] - මහණෙනි, සමාධිය වඩන්න. සමාධිමත් සිතට ඇත්ත ඇති

---

126 https://tipitaka.lk/mn-3-2-7 - **මහාචත්තාරිසක සූත්‍රය- අනුපද වර්ගය- මජ්ඣිම නිකාය 3- 212 පිටුව**

127 https://tipitaka.lk/sn-3-1-1-1-5 - **සමාධිභාවනා සූත්‍රය- නකුලපිතු වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 22 පිටුව**

හැටිය පෙනෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. ***"අථ නිබ්බින්දති දුක්ඛෙ"*** [128] ඇත්ත දකින කොට දුකේ කළකිරෙනවා.

ඒ කියන්නේ ඇහේ, රූපයේ, චක්ඛු විඤ්ඤාණයේ කළකිරෙනවා. කනේ, ශබ්දයේ, සෝත විඤ්ඤාණයේ කළකිරෙනවා. නාසයේ, ගන්ධයේ, ඝාන විඤ්ඤාණයේ කළකිරෙනවා. දිවේ, රසේ, ජිව්හා විඤ්ඤාණයේ කළකිරෙනවා. කයේ, ඵොට්ඨබ්බයේ, කාය විඤ්ඤාණයේ කළකිරෙනවා. මනසේ, ධර්මයන්ගේ, මනෝ විඤ්ඤාණයේ කළකිරෙනවා.

කළකිරෙන හින්දා නොඇලෙනවා. ඇහේ, රූපේ, චක්ඛු විඤ්ඤාණයේ නොඇලෙනවා. කනේ, ශබ්දයේ, සෝත විඤ්ඤාණයේ නොඇලෙනවා. නාසයේ, ගන්ධයේ, ඝාන විඤ්ඤාණයේ නොඇලෙනවා. දිවේ, රසේ, ජිව්හා විඤ්ඤාණයේ නොඇලෙනවා. කයේ, ඵොට්ඨබ්බයේ, කාය විඤ්ඤාණයේ නොඇලෙනවා. මනසේ, ධර්මයන්ගේ, මනෝ විඤ්ඤාණයේ නොඇලෙනවා.

නොඇලෙන නිසා මිදෙනවා. ඇහෙන්, රූපෙන්, චක්ඛු විඤ්ඤාණයෙන් මිදෙනවා. කනෙන්, ශබ්දයෙන්, සෝත විඤ්ඤාණයෙන් මිදෙනවා. නාසයෙන්, ගන්ධයෙන්, ඝාන විඤ්ඤාණයෙන් මිදෙනවා. දිවෙන්, රසෙන්, ජිව්හා විඤ්ඤාණයෙන් මිදෙනවා. කයෙන්, ඵොට්ඨබ්බයෙන්, කාය විඤ්ඤාණයෙන් මිදෙනවා. මනසෙන් ධර්මයන්ගෙන්, මනෝ විඤ්ඤාණයෙන් මිදෙනවා.

ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය, කන, ශබ්දය, සෝත විඤ්ඤාණය, නාසය, ගන්ධය, ඝාන විඤ්ඤාණ, දිව, රස, ජිව්හා විඤ්ඤාණය, කය, ඵොට්ඨබ්බය, කාය විඤ්ඤාණය, මනස, ධර්මය, මනෝ විඤ්ඤාණය කියන අටළොස් ධාතුව උපාදාන වශයෙන් නොගෙන මිදුණා. අනුපාදා පරිනිර්වාණය කියන්නේ ඒකට.

ලෝකයාට අටළොස් ධාතුව උපාදාන කර නොගෙන ජීවත් වෙන්න බැහැ. අටළොස් ධාතුවේ ඇසුරට පැමිණ වාසය කරන්නේ නැතුව ජීවත්

128 https://tipitaka.lk/kn-dhp-20 - **මාණි චණීය- ධම්මපදපාළි- ඛුද්දක නිකාය - 94 පිටුව**

වෙන්න පුළුවන් ද ලෝකයාට? බැහැ. උපාදානය කියන්නේ අටළොස් ධාතුව අල්ලගෙන පීවත්වෙන එකට ම යි.

කලින් කලට තෙලුයි, තිරයයි දැම්මහම පහනක් ඇවිලෙනවා. කලින් කලට තෙලුයි තිරයි නොදැම්මොත් ඒ පහන අනුපාදාව නිවෙනවා. තෙලුයි තිරයයි තියෙනකන් උපාදාන කර ගෙන පහන් දැල්ල ඇවිලෙනවා. තෙලුයි තිරයයි තියෙනකන් පහන් දැල්ල නිවෙන්නේ නැහැ. එතකොට ඒ පහන් දැල්ල උපාදාන සහිතව බොහෝ කාලයක් දැල්වෙනවා.

තෙලුයි තිරයයි නැති වුණොත් මොකද වෙන්නේ? උපාදාන රහිතව පහන නිවෙනවා. ඇහැ, රූප, කන, ශබ්ද, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම උපාදාන කරගෙන මේ ලෝකය/ දුක පවතිනවා. නිවෙන්නේ නැහැ දුක. එතකොට ආයතන ටික උපාදාන වශයෙන් නොගත්තොත් ලෝකය අතහැරෙනවා.

අපි දැන් මුහුදකට වැටිලා ගිලෙන්න හදන කොට ලී කොටයක් අහුවුණොත් ටක්ගාලා අල්ලගන්නවා නේ. ලී කොටය උපාදාන කරගෙන ඉන්න තාක් මුහුදේ ගිලෙන්නේ නැහැ වගේ ආයතන ටික පරිහරණය කරන එක ම උපාදාන සහිත යි. අනුපාදා කියලා කියන්නේ ආයතන ටික උපාදාන වශයෙන් අල්ලගෙන නැහැ. ඒ හින්දා කෙලෙස් පිරිනිවෙනවා.

~ පංච උපාදානස්කන්ධ ලෝකය විදර්ශනා කරන හැටි ~

පංච උපාදානස්කන්ධ ලෝකය විදර්ශනා කරන්න යන කොට මුලින් ම සත්ත්වයෝ, පුද්ගලයෝ, ආත්මව විදිහට පෙනෙන අරමුණු ටික විතරක් ගන්න. එකේ දී අපිට ඒ පුද්ගලයෝ එක්ක කියපු කරපු හුරු හම්බ වෙනවා. ඒ කියන්නේ දැන් 'අම්මා' කියලා සිහිවෙන කොට අම්මා බත් උයලා දුන්නා, මෙහෙම ව්‍යංජන හැදුවා, ස්කොලේ ගිහිල්ලා එන කොට රෙදි ටික හෝදලා දුන්නා. ඔය වගේ හිතට නැහැ, බැහැ කියන්න බැරි වෙන්න ලෝකේ ඇත්ත

ම වෙලා තියෙන්නේ අපිට. එතකොට එච්චරට තියෙන හුරුව තමයි ගෙවන්න තියෙන්නේ අපිට.

මුල් කාලයේ දී සතිපට්ඨානය ම වඩන්න. සතිපට්ඨානයෙන් බලනවා කියන්නේ මුලින් ම සවිඤ්ඤාණක අරමුණු ටික විතරක් ගන්න. අම්මා කියන නිමිත්ත හිතෙන් සිහි කර ගන්නවා. සිහි කර ගෙන පඨවි සංඥාව අරගෙන පඨවියේ තියෙන තද කර්කශ ස්වභාවයට සමාන කරලා පෙන්වනවා ඒ කයේ තියෙන කෙස්, ලොම්, නිය, දත්, සම්, මස් ආදී තද ස්වභාවයෙන් යුක්ත කොටස්.

ආපෝ සංඥාව හොඳට අරගෙන ඒ කයේ තියෙන පිත, සෙම, කෙළ, සොටු ආදී ආපෝ ස්වභාවයෙන් යුක්ත කොටස් ටිකට සමාන කරමින් බලනවා. ඒ වගේ ම බාහිර ගිනි ගොඩක තියෙන තේජෝ ස්වභාවය, හමන හුළඟක තියෙන වායෝ ස්වභාවය ඒ කයේ තියෙන තේජෝ, වායෝ ස්වභාවයට සමාන කරමින් බලනවා.

උපාදානයට හිත නැති සීමා නොකරන ලද මනසේ හිටියා නම් රූපයක් අල්ලගෙන උපාදාන වශයෙන් හැසිරෙන්න බැහැ. නමුත් අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විදිහට කුණප කොටස් ටිකක් තියෙන රූපය සීමා කරලා අල්ලගත්තා. ඒ රූපය දකින කොට ම මගේ මනසේ 'කෙනෙක්' කියන හැඟීම (අත්තවාද උපාදානය) යෙදෙනවා ම යි. 'ඒ කෙනා අම්මා' කියලා ආපහු ප්‍රඥප්ති වශයෙන් ඇසුරු කරලා තියෙන්නේ මේ. අත්තවාද උපාදානය කියන්නේ කෙනෙක්, ආත්මයක් කියනකම. ඒ පිටට ම 'රූපය අම්මා' කිව්වහම කාම උපාදානය.

දැන් එතකොට අත්තවාද උපාදානය හා කාම උපාදානය එකට යෙදිලා. කුසල් කරගෙන මෙහෙට ආපු, කුසල් අකුසල් කරගෙන පරලොව යන සත්ත්වයෙක් තමයි අම්මා කියන්නේ කියලා කිවුවොත් දිට්ඨි උපාදානයත් යෙදිලා.

එහෙම හිතුවහම පිරිසිඳු සුදු රෙද්දකට හොඳට සායම් වදිනවා වගේ නික්ලේශී මනසට අර කෙලෙස් කහට ටික හොඳට උරා ගන්නවා. මනසේ

තියෙන පුද්ගල ගතිය රූපයට බැසගත්තට පස්සේ ඒ රූපය කෙනෙක් ම යි, රූපය අම්මා ම යි කියන තැනකින් තමයි තියෙන්නේ.

අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ටික නිසා හැදුණු එකක් නේද 'අම්මා' කියන්නේ කියලා දන්නේ නැති හින්දා ඊට පස්සේ අම්මා ඉන්නවා කියන තැන පිහිටා සිටිමින් හිතීම්, කීම්, කිරීම් කරනවා. 'අම්මා' කියන එක මෙහෙම හදාගත්තේ නේද කියන එක නොදන්නා අවිද්‍යාව නිසා ආස්‍රව සක්‍රීය වෙනවා.

කාමාස්‍රවය කියන්නේ අම්මා ඉන්නවා කියනකම. භවාස්‍රවය කියන්නේ අම්මා මෙතන හිටියා, අතන හිටියා, අරහේ ගියා කියලා පෙන්වනකම. දිට්ඨාස්‍රවය කියන්නේ 'අම්මා පුද්ගලයෙක්' ය, 'අම්මා සත්ත්වයෙක්' ය කියන හුරුවට ම ගනුදෙනු කරනවා. එහෙම පුද්ගලයෙක්, සත්ත්වයෙක් ඉන්නවා කියලා ඇසුරු කළේ අවිද්‍යාව නිසා.

කනබොන ආහාරයෙන් හැදෙන කුණප කොටස් ටිකකින් යුක්ත රූපය අවිද්‍යාව හා කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදිහට සීමා කරලා අල්ලගෙන තණ්හා උපාදාන වශයෙන් හැසිරුණුකම නිසා නේද අම්මා ඉන්නවා කියනකම හැදුණේ.

උපාදාන කියලා කියන කොට ඒකේ තියෙනවා අත්තවාද උපාදානය, කාම උපාදානය, දිට්ඨි උපාදානය, සීලබ්බත උපාදානය. වේගයෙන් මේ ගති ටික මනසේ යෙදෙනවා. ඒ රූපයට උපාදාන වශයෙන් හැසිරෙනවා කියන කොට මනසේ ඔය ගති ටික යෙදෙන්නේ. එහෙම හැසිරිච්ච නිසයි අම්මා හැදුණේ. ඒකට තමයි භවය කියන්නේ. අම්මා කෙනෙක් හැදුණු එක තමයි පංච උපාදානස්කන්ධයේ උදය (හටගැනීමෙන්) පෙන්වන්නේ.

එතකොට 'අම්මා' ඉන්නවා නෙමෙයි, අපි අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ප්‍රත්‍යයයන්ගෙන් 'අම්මා' කියන එක හදාගෙන යි පරිහරණය කරලා තියෙන්නේ කියන එකක් කියනවා. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ප්‍රත්‍යයන් නැති වුණොත් අම්මා කියන නිමිත්ත නැතිවෙන බව පෙන්වනවා.

ඔහොම පංච උපාදානස්කන්ධයේ උදය වැය බලන කොට ඉන්න කෙනෙක් එක්ක ජීවත් වෙච්ච ගතිය හිඳෙනවා. තියෙන පොළොවක ජීවත් වෙච්චකම හිඳෙනවා. ඒ නිසයි මොනවට දුක් ගෙවීම පිණිස පවතින ස්කන්ධයන්ගේ උදයවැය කියලා කියන්නේ. මේ පංච උපාදානස්කන්ධ ලෝකේ තිබුණහම වෙන්නේ අම්මා ලෙඩ වෙච්ච නිසා, මහළු වෙච්ච නිසා, මැරිච්ච නිසා මොනවා ම හෝ දුක් දොම්නස් විඳින්න වෙනවා.

මහණෙනි, මවට පුතා අහිමිවන, පුතාට මව අහිමිවන දවසක් එනවා ම යි[129] කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. එදාට ඉතින් දුක එනවා ම යි. මෙහෙම ස්කන්ධයන්ගේ උදය වැය බලන කොට දුක නිරුද්ධ වෙනවා කියලා කියන්නේ ඒ අම්මා කියන නිමිත්ත අතහැරෙනවා. ඒ කියන්නේ ආස්‍රව බොරු වෙනවා.

එතකොට එයාට දෝෂය හසුවෙනවා ඇහැ තිබුණොත්, පරිහරණය කළොත් උපාදාන වෙලා කෙනෙක්, පුද්ගලයෙක්, දෙයක් හඳනවා කියන එක නතර නම් වෙන්නේ නැහැ කියන එක. එතකොට දුක හදාගෙන දුක් විඳ එක ගැන කළකිරෙන දවසක් එනවා. ආස්‍රව ගෙවෙමින් යන කොට එයාට භය එනවා ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය ආදී අටළොස් ධාතුව උපද්දවන්න.

එතකොට පුද්ගලයෝ ඇසුරු කරපු හුරු ටික ඔහොම ම ගෙවලා දාන්න ඕනේ. ස්ථානවලට ආගිය තොරතුරු ටික ගෙවලා දාන්න ඕනේ. ඒක ගෙවාගන්න නම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතූන්ගෙන් හැදුණු තැනක වර්ණ සටහනක් අවිද්‍යා, කර්මයෙන් උපාදානයට හිත විදිහට අල්ලගෙන ඒකට මේ අහවල් භාණ්ඩය, අහවල් තැන කියලා අපි හිතලා, ඒ හිතපු දේ සතර මහා ධාතු රූපය පැත්තට ඔසවලා තබපු හින්දා ඒ අරමුණ දෙයක් හරි, තැනක් හරි, වස්තුවක් හරි වුණා නේද කියන කාරණාව පෙන්නනවා.

ඔහොම පෙන්වන කොට තියෙන දෙයක් ය කියන එක අතහැරිලා හදාගෙන පරිහරණය කරලා තියෙනවා කියන නුවණක් එනවා. එතකොට

129

තියෙන ලෝකෙක පීවත් වුණා, තියෙන දෙයක් ඇසුරු කළා වෙනුවට ඒ ඒ වෙලාවට හදාගෙන හිතීම්, කීම්, කිරීම් කරලා තියෙන්නේ කියන නුවණ එනවා. එතකොට තිබුණා දෙයක් ඇසුරු කරපු හුරුව ටික ටික ගෙවෙන කොට, සිහි කර කර බාහිරයට යන එක අඩු වෙනවා. ආස්‍රව ක්ෂයයි කියන කොට ලෝකය ම දියවෙලා සීමා නොකරන ලද මනසට ඇවිල්ලා ඉන්නවා.

අවිඤ්ඤාණක වස්තු, ස්ථාන සිහි වුණාත් දැනට නොසලකා හරින්නකෝ. සත්ත්ව පුද්ගලභාවයට ඇසුරු කළ හුරු ටික විදර්ශනා කරන්න ගන්න. පුංචි කාලේ ඉඳන් මේ දක්වා අම්මා, තාත්තා, සහෝදර, සහෝදරියන්ගේ ඉඳලා ඇසුරු කරපු යම් තාක් පුද්ගලයෝ තියෙනවා ඉන්නවා කියලා හිතෙනවා නම් ඒවා විදර්ශනාවට ගන්න.

හොඳට සමථ කමටහනකින් සිත වඩලා නම් ඒ සමාධිය නිසා ඉබේ ම සිහි වෙන්නේ නැහැ පුද්ගලයෝ ගැන. සිහි වෙන්නේ නැති නම් සිහි කරලා ගන්න. මොකද සිහි වුණේ නැති වුණාට ඔය නික්ලේශිකම තියෙන්නේ කෙලෙස් ටික හැංගිලා තියෙනකන්. පුද්ගලයෝ, සත්ත්වයෝ ඉන්නවා කියනකම සිහි වෙන්නේ නැති එක වෙලා තියෙන්නේ ඒ නිසයි.

ඒක දියුණුවක් නෙමෙයි, ඒ කෙලෙස් හැංගිලා තියෙන්නේ. ඒ නිසා රොඩු ගොඩක් පුච්චන කොට උඩ ටික පිච්චිලා ඉවරවෙන කොට යට ටික අවුස්ස අවුස්ස පුච්චන්නේ. අන්න ඒ වගේ අවුස්ස අවුස්ස පුච්චන්න කෙලෙස් ටික. එතකොට සිහි කරලා නිමිත්තක් අල්ලගන්නවා හොඳට. නිමිත්තක් කියන්නේ එක කෙනෙක්ව මතක් කර ගන්නවා.

එක කෙනෙක් මතක් කර ගත්තට පස්සේ තව අයව සිහි වුණාත් නොසලකා හරින්න. හොඳට පෙන්වනවා, ඒ කයේ සතර මහා ධාතුව බාහිර සතර මහා ධාතුවට සමාන කරමින්. පඨවි ධාතුවට මම ‘අම්මා’ කියලා කිවුවොත් හරි ද? ජලයට ‘අම්මා’ කියලා කිවුවොත් හරි ද? හුළඟට, ගින්නට ‘අම්මා’ කියලා කිවුවොත් හරි ද?

කනබොන ආහාරයෙන් හැදෙන රූපයේ ඔය වගේ ධාතු කොටස් ටිකක් නේ තියෙන්නේ. ඊට පස්සේ සීමා නොකරන ලද මනසේ ඉඳලා කියන

කතාවට එනවා. අවිද්‍යා, කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදිහට රූපයක් තනි කරලා ගන්න කොට ම අපේ මනසේ 'කෙනෙක්', 'පුද්ගලයෙක්' කියනකම යෙදිලා ඉවරයි. එනම් උපාදානය යෙදෙනවා ම යි.

රූපය උපාදානයට හිතයි කියන්නේ ඒකයි. උපාදානය දුරු නොකළ කෙනා රූපය දකින කොට ම උපාදානයට හිතයි ඒ රූපය. සීමා නොකරන ලද මනසින් බැලුවොත් තමන්ගේ මනසේ මේ 'කෙනෙක්' 'පුද්ගලයෙක්' කියනකම ඇති වෙන්නේ නැහැ නේ.

අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විදිහට යම් රූපයක් සීමා කළ ගමන් අපේ මනසේ යෙදෙනවා 'කෙනෙක්', 'පුද්ගලයෙක්' කියනකම (තණ්හා උපාදානය). ඊට පස්සේ ඒ කෙනා මල්ලි නේ, එයාගේ නම මේකනේ, මට වඩා මෙච්චර බාල නේ කියලා හොඳට විස්තර කරන්න පුළුවන්. එහෙම හොඳට පරිකර්ම කළහම ඔන්න මට මල්ලි කෙනෙක් ඉන්නවා කියන තැනකින් තමයි තියෙන්නේ දැන්.

එතකොට 'මල්ලි' කියන එක අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන මෙන්න මෙහෙම හේතු ටිකකින් හැදුණේ, මේ හේතු නැති වුණොත් මල්ලි කියන නිමිත්ත නැති වෙනවා නේද කියලා පංච උපාදානස්කන්ධයේ උදය වැය දන්නේ නැහැ. ඒ අවිද්‍යාව නිසා මල්ලි ගැන හිතනවා, කියනවා, කරනවා.

'මල්ලි' කියන්නේ තවත් ආත්මයක්, සත්ත්වයෙක් කියලා හැඟෙනවා නම් නම් එතන 'දිට්ඨාස්‍රවය'. මල්ලි අරහේ මෙහෙ හිටියේ ඉන්නේ කියලා හැඟෙනවා නම් 'භවාස්‍රවය'. ඒ රූපය මල්ලි කියලා හැඟෙනවා නම් 'කාමාස්‍රවය'. මේ විදිහට 'මල්ලි' එක්ක ගනුදෙනු කරපු හුරුවක් තියෙයි.

ඔය ආස්‍රව ගෙවන්න නම් එහෙම මල්ලි කියලා කෙනෙක් ඉඳලා ඇසුරු කළා නෙමෙයි. මෙන්න මෙහෙමයි මල්ලිව හැදුණේ කියලා අවිද්‍යා, කර්ම, තණ්හා කියන මගේ මනසේ යෙදුන කර්ම කෙලෙස් ටිකත් ආහාර ප්‍රත්‍යයෙන් හටගත්ත ස්කන්ධ ටිකයි දෙක එකට එකතු වෙලා තමයි 'මල්ලි'

හැදිලා තියෙන්නේ කියන එක පෙන්වනවා. එතකොට අපි මල්ලිව හදාගෙන පරිහරණය කරලා තියෙන්නේ.

මල්ලි ලෙඩ වුණොත්, මල්ලි අකීකරු වුණොත්, මල්ලි මැරුණොත් දුක එනවා. එහෙනම් දුක හදාගෙන දුක් විඳලා නේද තියෙන්නේ කියලා පේනවා. හොඳයි, කනබොන ආහාරයෙන් ඔය සතර මහා ධාතු රූප මිටිය හැදුනේ නැති වුණා නම් ඒත් මල්ලි කෙනෙක් නැහැ. අවිද්‍යාවෙන් කර්මයෙන් උපාදානයට හිත විදිහට රූප නිමිත්තක් අල්ලගෙන තණ්හා උපාදාන නොවුණේ නම් ඒත් මල්ලි හැදෙන්නේ නැහැ කියලා පෙන්නුවා.

එතකොට ඉන්න කෙනෙක් ඇසුරු කළා නෙමෙයි, මේ වගේ කෙලේසයකට හදාගෙන යි කියලා හොඳට පෙන්වන්න. එකක් පෙන්වන්න කොච්චර වෙලාවක් ගියත් කමක් නැහැ. ඉස්සෙල්ලා ම සතිපට්ඨානය වඩනවා කියලා කියන්නේ, මුලින් ම රූපයේ ඇත්ත පෙන්වනවා. කුණප කොටස් ටිකක් හෝ, ධාතු වශයෙන් හෝ නවසීවථික වශයෙන් පෙන්වන්න.

නවසීවථික වශයෙන් පෙන්නන කොට මැරිලා, ඉදිමිලා, නිල්වෙලා පුපුරලා ඕජා ගලන්න පුළුවන් විදිහේ රූපයක් නේද මේ තිබුණේ කියන තැනකින් පෙන්වන්න. ඊට පස්සේ සතිපට්ඨාන භාවනාව වඩනවා; ඒ රූපයට අවිද්‍යා, කර්ම, තණ්හාවෙන් හැසිරුණා නිසා නේද මෙහෙම පුද්ගලයෙක්/ මල්ලි ඉන්නවා කියනකම හැදිලා තියෙන්නේ කියලා පංච උපාදානස්කන්ධ ලෝකය විදර්ශනා කරනවා.

"විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං" - ලෝභ ද්වේශ දෙක නික්මවා ගන්නවා. ඒ සිහිවෙන පුද්ගලයා ගැන කැමැත්තක් හෝ අකමැත්තක් ඇතිවෙන්න නොදී හොඳට කය කෙරෙහි සිහිය පිහිටුවාගෙන නුවණින් කය ගැන බලනවා. *"බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති"*- කුණප කොටස් වශයෙන් හෝ ධාතු වශයෙන් හෝ නවසීවථික වශයෙන් කයේ කය අනුව බලනවා.

ඊට පස්සේ *"සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති"* - ඇතිවීමට බලනවා. *"වයධම්මානුපස්සී වා කායස්මිං විහරති"*- නැතිවීමට බලනවා.

"අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති" - හොඳට ආධ්‍යාත්මික මේ ශරීරයේ කුණප කොටස් ගැන බලනවා. මේ ශරීරයේ පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු කොටස් ගැන බලනවා. මැරුණහම ඉදිමිලා නිල්වෙලා පුපුරලා පස් වෙන්න පුළුවන් කය නේද කියලා කයේ කය අනුව බැලුවා.

"සමුදයධම්මානුපස්සී වා කායසමිං විහරති"- ඒ 'මම' කියපු රූප නිමිත්ත (පංච උපාදානස්කන්ධය) ඇතිවෙච්ච හැටි බලනවා. එබඳු වූ ආහාර ප්‍රත්‍යයෙන් හටගත්ත සතර මහා ධාතු මිටිය උපාදාන වෙන්න පුළුවන් විදිහට අවිද්‍යාවෙන් කර්මයෙන් අල්ලගත්තා. අවිද්‍යා ප්‍රත්‍යයෙන් කර්ම ප්‍රත්‍යයෙන් කියන කොට ම උපාදාන වෙන්න පුළුවන් විදිහට රූපය අල්ලගත්ත කමයි කිවුවේ කියන එක තියෙන්න ඕනේ. ඊට පස්සේ මේ 'මම', මගේ, මගේ ආත්මය නේ කියලා අපි හිත හැසිරුවහම 'මේ රූපය මම', 'මේ තමයි මගේ හැඩය' කියලා ගතියක් අපිට ඇවිල්ලා ඇති. එහෙම මාව හදාගත්ත හැටි පෙන්වන්න.

"වයධම්මානුපස්සී වා කායසමිං විහරති" - අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ප්‍රත්‍ය නැති වුණා නම් මම කියලා නිමිත්තක් හිටින්නේ නැහැ නේද කියලා බලනවා. *"අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති"* - තමන්වත්, බාහිරත් පුද්ගලභාවයට හසුවෙන නිමිති ගැන බලනවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතු වශයෙන් බලමින් උදය වැය බලන්නත් පුළුවන්. අසුභ වශයෙන් බල බලා උදය වැය බලන්නත් පුළුවන්. නවසීවථික වශයෙන් බල බලා උදය වැය බලන්නත් පුළුවන්.

'සති සම්පජඤ්ඤ' කියන්නේ ඉදිරියට පසුපසට යන කොට, වටපිට බලන කොට ආදී ක්‍රියාකාරකම් පවත්වන කොට කය කෙරෙහි සිහි ඇතුව ඒ දේවල් දැනුම් සහගත බවකින් ම කරන එකට. අසංවරව අසිහියෙන් රූපයක් බැලුවොත් පංච උපාදානස්කන්ධය හටගන්න බව දන්නවා. ඒ නිසා පංච උපාදානස්කන්ධයක් නූපදින විදිහට කටයුතු කළ යුතුයි නේද කියන සිහි නුවණින් යනවා එනවා, වැඩ කටයුතු කරනවා.

හොඳට කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන යමක් දිහා සීමා කරලා බලන්න වුණොත් යථාභූත ඥානය තියෙනවා නම්, සිහිය තියෙනවා නම් උපාදානයට හිත නැහැ ඒක. ඕනෑම තැනක යථාභූත ඥානය තිබුණොත් උපාදානයට හිත නැහැ. ඒ කියන්නේ පුද්ගලයෙක්, කෙනෙක්, වටිනා දෙයක් ආදී කෙලෙස් ගති යෙදෙන්නේ නැහැ මනසේ.

සතිපට්ඨානයට සිහි නුවණින් යුක්තව කුණප කොටස් ටිකක්, සතර මහා ධාතුවෙන් යුක්ත රූපයක් නේද කියලා බලනවා. මොකද එයා එහෙම බැලුවට රූපයේ නෙමෙයි හැසිරෙන්නේ ඒකයි ඒ. නුවණින් බලන කොට එයාට ප්‍රඥාවට හසුවෙලා තියෙන්නේ රූපයේ යථාභූත ස්වභාවය. නුවණ තමයි රූපයට යොමු වෙලා තියෙන්නේ.

නුවණ නැති වුණහම කෙලින් ම රූපය එක්ක ගනුදෙනු කරන්නේ. නුවණ තියාගෙන යමක් දිහා බැලුවහම කුණප කොටස් ටිකකින් හැදුණු සතර මහා ධාතු නේද කියන කොට රූපය ඉලක්ක වුණාට එයා හැසිරිලා තියෙන්නේ නුවණේ. ඒ නිසා එයාට රූපය අහුවෙන්නේ ම නැහැ.

අපි උදාහරණයක් හැටියට කිවුවොත් පිටතින් හොඳට සිතුවම් කරපු ලියවැල් අල්ලපු කළයක් තියෙනවා ඇතුළේ අසුචි පුරවලා. පිටින් බැලුවහම හරි ලස්සන ලියවැල් තියෙන කළයක් නේද කියලා මම බදාගත්තහම අසුචි මිටිය තමයි බදාගෙන ළඟට ගත්තේ.

මෙහෙම ලියවැලක් පිටින් තිබුණාට මේකේ ඇතුළේ පණුවෝ නලියන, ගඳ ගහන අසුචි නේද පිරිලා තියන්නේ කියලා පෙනෙන දේ තුළ රැඳෙන්නේ නැතුව පෙනෙන දේට ඔබ්බෙන් නුවණ අරගෙන ඒක දිහා බලනවා. එතකොට එයා මේ ලියවැලේ හිත හසුරනවා නෙමෙයි.

ඒ ඇයි? නුවණ ගෙනිහින් තියෙන්නේ පෙනෙන ලියවැලේ රැඳෙන්නේ නැතුව ඊට ඔබ්බෙන් තියෙන අසුභ ස්වභාවයට. එහෙම දකින කොට ලියවැලේ හිත රැඳිලා නැහැ. රූපයේ හැසිරෙන්නේ නැහැ එයා. සීමා කරලා රූපය බැලුවත් එයාට රූපය අහුවෙන්නේ නැහැ.

කළය ඇතුළේ තියෙන දෙයට නුවණ නැතුව අසුචි සංඥාවෙන් තොරව බලන්න ගියොත්, කෙලින් ම පිටත තියෙන සිතුවම අහුවෙනවා. අනේ හොඳයි, මනාප යි කියලා ඒ පෙනෙන රූපයේ හැසිරුණා ගමන් ඒ රූප නිමිත්ත මනසේ හිටිනවා ක්ෂණිකව. ඇතුළේ අසුචි තියෙන්නේ කියලා බලන කොට වර්ණ සටහන හිතට අහුවෙන්නේ නැහැ. එහෙම නැතුව රහතන් වහන්සේලාටත් සීමා කරලා බලන්න බැරිකමක් නැහැ. බැලුවත්, රූපයේ නම් හැසිරෙන්නේ නැහැ.

අනිකෙතසාරී, අනොකසාරී

රහතන් වහන්සේලාට කියන ගුණ නාමයක් තියෙනවා නේ - ***"අනිකෙතසාරී"*** [130]**.** නිකේතන කියලා කියන්නේ මොකක් ද? අපි ඔය ගමනක් ගියහම නතර වෙන්න තියෙන තැන්. ඒ නිවාඩු නිකේතන වගේ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම. මේ නිකේතනවල රස්තියාදු වෙන්නේ නැහැ රහතන් වහන්සේලා. ඇහෙන් රූප බල බලා, කනින් ශබ්ද අහ අහා ඉන්නේ නැති නිසා රහතන් වහන්සේලාට කියනවා, *"අනිකෙතසාරී"* කියලා. නිකේතනවල හැසිරෙන්නේ නැහැ. රහතන් වහන්සේලා යමක් දිහා සීමා කරලා බැලුවත් උන්වහන්සේලා රූපයේ හැසිරෙන්නේ ම නැහැ.

"අනොකසාරී" [131] - විඤ්ඤාණයට බැසගන්න ඔකයක් මේ කය. 'මේ මම' කියලා මේ කයට අපි බැහැගෙන ඉන්නවා. රහතන් වහන්සේලා කියන්නේ කයට බැසගෙන නැහැ. *"ඔක්කන්ති නාමරූපං"* වෙලා නැහැ. විඤ්ඤාණය නාමරූප දෙකට බැසගෙන නැහැ. ඒ හින්දා *"අනොකසාරී"* කියලා කියනවා.

රූප උපාදානස්කන්ධය කියන එක *"සාසවං උපාදානියං"*. ඒ කියන්නේ රූපයේ හැසිරෙනවා නම් ආස්‍රව සහිත යි උපාදානයට හිත ම යි.

---

130 https://tipitaka.lk/sn-3-1-1-1-3 - **භාලිද්දිකානි සූත්‍රය- නකුලපිතු වර්ගය- බන්ධ සංයුක්තය- සංයුක්ත නිකාය 3 - 16 පිටුව**

131 https://tipitaka.lk/kn-mn-9 - **මාගණ්ඩියසූත්‍රනිර්දේශය- මහානිද්දේසපාළි- ඛුද්දක නිකාය- 270 පිටුව**

අර මැටි කළයේ පිටතින් තියෙන සිතුවම කෙනෙක්ට හසුවෙනවා නම් හසුවෙන්නේ නුවණක් නැතිකම නිසා.

~ රහතන් වහන්සේ සහ අපි අතර වෙනස ~

රත්වෙච්ච යකඩයක් තියෙනවා නම් අපි අතින් ඇල්ලුවොත් අත පිච්චෙනවා නේ. ඒ යකඩය ම අල්ලනවා අඬුවකින් හෝ රෙදි කෑල්ලකින්. එතකොට අත පිච්චෙන්නේ නැහැ. අපි රත්වෙච්ච යකඩේ කෙලින් ම අතින් අල්ලලා අත පුච්චගන්නවා වගේ පෘථග්ජනයා කෙලින් ම රූපය ම යි බලන්නේ.

ආර්යයන් වහන්සේලා බලනවා රූපයේ යථාභූත ස්වභාවයට හිත තියලා. රූපය කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක්, සතර මහා ධාතුයි. මැරුණහම ඉදිමිලා නිල්වෙලා පුපුරා යන ශරීරයක් නේද තියෙන්නේ කියලා බලනවා.

ඒ නුවණින් යුක්තව රූපය දිහා බලලා 'මේ විසුද්ධි හාමුදුරුවෝ හොඳයි නේ' කියලා පරිකර්ම කරන්න. එතකොට එයාට පිටින් තියෙන වර්ණ සටහන හසුවෙන්නේ නැහැ. එහෙම නැතුව රහතන් වහන්සේලා රූප නොබලනවා නෙමෙයි. රූප බැලුවට කිසි කලෙකවත් උපාදානයට හිත විදිහට හිටින්නේ නැහැ. රහතන් වහන්සේලා රූපයේ හැසිරෙනවා නෙමෙයි ම යි.

නුවණක් භාවිතා කරන්න බැරිකමක් නැහැ. රූපය ගැන නුවණක් තියෙනවා. අඬුවක් හරි රෙදි කෑල්ලක් වගේ අල්ලන්න එකක් නැතුව රත්වෙච්ච යකඩය අතින් ඇල්ලුවොත් මොකද වෙන්නේ? පිච්චෙනවා ම යි. යථාභූත ඥානය නැතුව සතිපට්ඨානයට සිහියෙන් නැතුව රූපයක් දිහා බලන්න ගියොත් මොකද වෙන්නේ? උපාදාන වෙනවා ම යි.

ඒ කියන්නේ මේ රූපය දකින කොට ම 'මම' කියන අදහස එනවා ම යි. ඒ නිසා සති සම්පජඤ්ඤ- සිහිය තියාගන්න නුවණට. නුවණ තියා ගන්න

සිහියට. සිහි නුවණින් ම ජීවත් වෙන්න. යමක් දිහා බලන කොට සතිපට්ඨානයට සිහියෙන් ම බලන්න.

ඕගොල්ලොන්ගේ සිහිය හැම වෙලාවේ ම පිහිටා හිටින්න ඕනේ යථාභූත ඥානය එක්ක. ඒ හින්දා යමක් දිහා බලන කොට රූපය අහුවෙන විදිහට බැලුවොත් නම් මාරයාට අහුවුණා ම තමයි කියලා දන්නවා. සතිපට්ඨානය තුළ වාසය කරමින් යමක් සීමා කරලා ගත්තට කමක් නැහැ. නමුත් ඒ ද ඕගොල්ලොන්ට රූපය අහුවෙලා නැහැ. එතකොට තියෙන්නේ සිහිය සහ නුවණ.

චතුරක ඡායාවක් වැටිලා තියෙනවා නම් ඡායාව චිතරක් ගත්තොත් නිමිත්ත. චතුර මත ඡායාවක් වැටිලා තියෙනවා කියලා ගත්තහම චතුරටයි හිත තියලා තියෙන්නේ. ඒ විදිහටයි ජීවත් වෙන්නේ. එතකොට රාගාදී ඇකොළොස් ගින්නෙන් පිච්චෙන්නේ නැහැ.

උපාදානස්කන්ධය කියන්නේ රූපයත් එක්ක ගනුදෙනු කරන එක. රහතන් වහන්සේ සීමා කරලා යමක් දිහා බැලුවත් ඒ ද රහතන් වහන්සේ උපාදානස්කන්ධයක හැසිරෙනවා නෙමෙයි එතකොට. ගනුදෙනු කරන්නේ නැහැ රූපය එක්ක. අනික් කෙනාට පේන්නේ මම වගේ ම මෙයත් බලාගෙන නේ ඉන්නේ කියලා. නමුත් රහතන් වහන්සේ කළයේ තියෙන පිටත සිතුවම ඉක්මවලා, උපාදාන කර ගන්නේ නැතුව නුවණින් ගිහිල්ලා අසුචි තියෙන්නේ කියලා දකිනවා. අහුවෙලා නැහැ පිටත සිතුවමට. ඒ නිසා උපාදාන වෙලා නැහැ රූපය.

පණුවෝ ගහපු අසුචි ටිකක් තියෙන්නේ කියලා අපිත් එහෙම බැලුවොත් වර්ණ සටහනේ හිත රැඳිලා ද තියෙන්නේ? එතකොට පිටත සිතුවමේ ලස්සන ගතියක් දැනෙන්නේ ම නැහැ හිතට, අප්‍රසන්න ගතියක් තමයි තියෙන්නේ. මම ළඟට ගත්තොත් ගන්නේ පණුවෝ ගහපු අසුචි ටිකනේ වගේ තැනකින් දකින්නේ.

බැරිවෙලා ඇතුළත තියෙන්නේ මෙහෙම දෙයක් නේද කියලා ඇත්ත ඇති හැටිය පවතින නුවණ නැතුව ලස්සනට සිතුවම් කළ මැටි කළය දිහා

බැලුවොත් හිතට අහුවෙන්න තියෙන්නේ මොකක් ද? ඇහැට පෙනෙන දේ විතරයි. එතකොට කෙලින් ම හිත රැඳෙනවා ලියවැලේ.

එතකොට කවුද දන්නේ නැහැ මේක හැදුවේ, මාර දක්ෂ කෙනෙක්, හරි ලස්සනයි නේද, අනේ අපේ ගෙදර ගිහිල්ලා තියාගන්න තිබුණා නම් කියලා උස්සගෙන ගිහින් ගේ ඉස්සරහෙන් ම තියනවා. බලන කොට අසුචි ගොඩක් තමයි ඉස්සරහෙන් ම තියලා තියෙන්නේ. බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා දකින්නේ මේ මිනිහා පෙරටුව අසුචි ටිකක් තියාගෙන දඟලනවා නේද කියලා.

ඒ නිසා සතිපට්ඨානය වඩන්න. තමන්ට පිහිටක් කර ගන්න. යන්න නම් එපා පුතේ, සතිපට්ඨානයට සිහියකින් නැතුව. බලන්න එපා රූපයට හිත තබලා නම්. ඔය ප්‍රශ්න ගැටළු ඔක්කොම ඇතිවෙන්නේ උපාදානස්කන්ධයක හැසිරෙන නිසා.

මේ ප්‍රතිපදාවට ආවහම ***"සාමීචිපටිපන්න"*** [132] *යි* - සමගි ප්‍රතිපදාවකට එනවා ඔක්කොම. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ **"මහණෙනි, මේ සාසනයට ආවා වූ, නවක වූ භික්ෂූන් වහන්සේලාව සතිපට්ඨානයේ හික්මවන්න"** [133] කියලා.

සතිපට්ඨානය තුළ වාසය කරන කොට නොබෝ කලෙකින් 'ගෙහ නිශ්‍රිත විතර්ක' මැකෙනවා. සතිපට්ඨානය වැඩුවේ නැති වුණොත් කය මහණ වුණාට හිත ගිහිනේ තාම. එතකොට ගෙහ නිශ්‍රිත විතර්ක හිතෙනවා. සතිපට්ඨානයට හිත තැබුවහම යථාභූත ඥානය නිසා ඉක්මනට ඒ ගෙහ නිශ්‍රිත විතර්ක මැකෙනවා.

ඒ හින්දා ඔය භවය කියන තැන; අම්මා, තාත්තා ඉන්නවා ම යි කියලා දැනෙන ගතියට හොඳට හිත තබන්න. කනබොන ආහාරයෙන් හැදෙන කුණප කොටස් ටිකක් තියෙන තැනක් අවිද්‍යා කර්මයෙන් සීමා කරලා අරගෙන ඒකට තණ්හා උපාදාන වුණු නිසා නේද අම්මා, තාත්තා ආදී නිමිති ඇතිවෙලා

---

132 https://tipitaka.lk/an-10-2-5-2/sinh - **භය සූත්‍රය- උපාලි වර්ගය- දසක නිපාතය- අඞ්ගුත්තර නිකාය 6- 331 පිටුව**

133 https://tipitaka.lk/sn-5-3-1-4/sinh - **සාලා සූත්‍රය- අම්බපාලි වර්ගය- සතිපට්ඨාන සංයුක්තය- සංයුත්ත නිකාය 5- 265 පිටුව**

තියෙන්නේ. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර නැති වුණොත් මේ නිමිත්ත නැති වෙනවා නේද කියලා උදය වැය පෙන්වනවා.

ඉරියව් පවත්වද්දි මේ කයේ සිහිය පිහිටුවාගෙන සිදු කරනවා. යන කොට එන කොට වටපිට බලන කොට සති සම්පජඤ්ඤ නුවණින් දැනගෙන කරනවා කියලා කියන්නේ යමක් දිහා බලන කොට, බලනවා කියන ක්‍රියාවට දැනුම් සහගතව ම වර්ණ සටහනේ /රූපයේ හිත හැසිරෙන්නේ නැති විදිහට යථාභූත ඥානයෙන් මහාභූතයන්ගේ උපාදාය රූපයක් වර්ණ සටහනක් නේද තියෙන්නේ වගේ තැනකින් රූපයේ ඇත්ත පෙන්වනවා. අන්න ඒ විදිහට තමයි සතිපට්ඨානය වඩන්නේ.

~ ඉක්මනට ආස්‍රව ගෙවාගන්න ඕනේ නම් ~

ඔන්න ඔය ගැජ්මැටික් ටික කර ගන්නකො. බලන්න, ඉක්මනට ම නොබෝ දවසකින් අපි භවයෙන් මිදෙන්නේ නැති වෙයි ද කියලා එතකොට. ඒකට යෝනිසෝ මනසිකාරයට ප්‍රතිපදාවත්, ප්‍රතිපදාවට යෝනිසෝ මනසිකාරයත් එක විදිහට සහයෝගය දෙන්න ඕනේ.

නුවණින් ආස්‍රව හිඳින්න යෝනිසෝ මනසිකාරය කරනවා වගේ ම යෝනිසෝ මනසිකාරයට රුකුල්වෙන විදිහට අපි ධම්මානුධම්ම ප්‍රතිපත්තියෙන් ජීවත් වෙන්න ඕනේ. කිසි බයක් නැතුව උපාදානස්කන්ධයක හැසිරි හැසිරි ආස්‍රව ක්ෂය කරන්න හැදුවට වෙන්නේ නැහැ, ප්‍රමාද යි එතකොට.

වළක වතුර හිඳින්න හිඳින්න ගලාගෙන ආයේ වේගයෙන් එනවා නම් ඒ වළේ වතුර හිස් වෙන්නේ නැහැ. ගලාගෙන එන්නේ නැති වෙන්න බැමි ටිකක් ගහලා ඉස්සුවොත් වළේ වතුර ටික ඉක්මනට ඉහින්න පුළුවන් වගේ සතිපට්ඨානයෙන් හොඳට සිහිය පිහිටුවාගෙන වාසය කරන්න.

කෙනෙක් දිහා බලන්නේ නම් නැහැ. කෙනෙක් දිහා බලන්නේ නැහැ කියන කොට ඇස් වහගෙන ඉන්නවත් නෙමෙයි. කුණප කොටස් ටිකකින්, සතර මහා ධාතුවෙන්, කනබොන ආහාරයෙන් හැදුණු රූපයක් නේ කියන සිහි

නුවණ තියාගෙන කොහොමද ඔබ වහන්සේට, ඔබ වහන්සේ කොහෙද ගියේ කියලා වචනත් කතා කරනවා.

සතිපට්ඨානය නැති කෙනත් ඔබ වහන්සේ කොහෙද ගියේ කියලා අහනවා. එයාට හිතෙන්නේ මේ මම වගේ ම තමයි කියලා. නමුත් වෙනස්. අසුචි පුරවපු මැටි කළය තියෙනවා. සිහි නුවණක් නැති කෙනත් හරි ලස්සන ලියවැලක් කවුද දන්නේ නැහැ හැදුවේ කියලා පෙනෙන රූපයේ හැසිරෙනවා.

සතිපට්ඨානය වඩන කෙනා මේක මෙහෙම තිබ්බට පණුවෝ පිරුණු ගඳ ගහන අසුචි ගොඩක් දරාගෙන නේද ඉන්නේ කියලා හිත තියාගෙන ඉන්නවා එහෙම. සතිපට්ඨානය වඩන කෙනා ඇහැට පෙනෙන රූපයේ හැසිරෙන්නේ නැහැ එතකොට.

සතිපට්ඨානය නොවඩන කෙනා හිතන්නේ මේ මම වගේ ම මෙයත් ලස්සනට පේන ලියවැල දිහා බලාගෙන නේ ඉන්නේ කියලා. මේ ලියවැල ලස්සනයි නේද කියලා ඇහුවොත් 'අනේ ඔව් හරි ලස්සනයි ලියවැල' කියලා සතිපට්ඨානය වඩන කෙනා අසුචියට හිත තබාගෙන උත්තරත් දෙයි. විෂම ලෝකේ සමව හැසිරෙනවා කියන්නේ ඒකට.

සතිපට්ඨානය වඩන්නේ නැති කෙනා කියන එකට පරස්පර වෙලා ගැටෙන්නේ නැති විදිහට, 'අනේ ඔව් ලියවැල හරි ලස්සනයි තමා' කියලා උත්තරත් දෙනවා. දන්නවා මෙයා මේ දුකට යන්න හේතුවක් හදාගෙන ඉන්නේ කියලා. නමුත් මම මේ වචන කතා කෙරුවත් උපායශීලිවයි කියලා එයා දන්නවා.

ඕකට තමයි දැන දැක කතා කරනවා කියලා කියන්නේ. සිහියෙන් කතා කරනවා කියලා කියන්නේ. නුවණින් කතා කරනවා කියලා කියන්නේ. කතා කෙරුවට ඒක වචනයක් විතරයි එයාට. එයාගේ සම්පූර්ණ දැක්ම තියෙන්නේ මේකේ අසුචි ගොඩක් තියෙන්නේ කියන තැනක යි. සතිපට්ඨානය නොවඩන කෙනා වගේ රූපය එක්ක සංයෝජනයක් නැහැ සතිපට්ඨානය වඩන කෙනාට. එයා ලෝකේ උපාදාන වෙලා නැහැ.

මේ මහණා වෙලා කැලේකට වෙලා ඉන්න එකේ තේරුමක් නැහැ, උපාදානයට හිත විදිහට නිමිති අරගෙන ආපහු ආපහු භවය රැස්කර ගෙන භවය ගොඩගහ ගන්නවා නම්. ඒ හින්දා රෑ දහවල් දෙකේ ආස්‍රව ක්ෂය කර ගන්න හොඳට හාත්පසක වටලලා අරන් තමන්ව සංවර කර ගන්න.

~ ආර්ය ශ්‍රාවකයාට ජීවත් වෙන්න තියෙන භූමිය ~

සතිපට්ඨානය කියන්නේ පුතේ, වාසය කරන තැන, ජීවත් වෙන්න තියෙන තැන කියලා හොඳට මතක තියා ගන්න. ඔතන පිහිටලා තමයි ආස්‍රව ටික හිඳින්නේ. සතිපට්ඨානය කියන්නේ අවස්ථාවට මෙනෙහි කරලා අයින් කරන එකක් නෙමෙයි. ආර්‍ය ශ්‍රාවකයාට ජීවත් වෙන්න තියෙන භූමිය.

යන කොට, එන කොට, කතා කරන කොට, වටපිට බලන කොට ඕගොල්ලොන්ට සතිපට්ඨානයේ සිහිය පිහිටුවා ගෙන ම යි කරන්න වෙන්නේ. අපිට රැකෙන්න තියෙන එක ම තැන තමයි සතිපට්ඨානය. ඒක ලෝකයට අයිති නැහැ. ඇහැ පරිහරණය කළත් අහුවෙලා නැහැ. සතිපට්ඨානයෙන් කරලා තියෙනවා ඕගොල්ලොන්ව චුට්ටක්වත් රූපය උපාදාන නොවන්න හරි උපායයක්.

ලෝකයා දකින රූපය ම දැක්කත්, දශමයක්වත් රූපය උපාදාන වශයෙන් අහුවෙන්නේ නැහැ. ඒ මට්ටමට කියන්නේ ‘අනුපාදානීය’ යි කියලා. ලෝකයා රූපයේ හැසිරෙන නිසා රූපය උපාදානීය යි. රහතන් වහන්සේ හිත තියෙනවා රූපයේ යථාභූත ස්වභාවයට නිසා අනුපාදානීය යි. **සතිපට්ඨානය කියන්නේ මොන ධර්මයක් ද? අනුපාදානීය ධර්මයක්.**[134]

ඕගොල්ලෝ සතිපට්ඨානයේ පිහිටලා ඉන්න කොට උපාදාන වෙන්න පුළුවන් ද? බැහැ, උපාදානයට හිත නැහැ. සතිපට්ඨානය නැතුව රූපය දිහා බැලුවොත් රූපය උපාදානීය යි - උපාදානයට හිත යි. සීමා නොකරන ලද මනසේ හිටියත් උපාදානයට හිත නැහැ.

---

134 https://tipitaka.lk/ap-vbh-7-6/sinh - **පඤ්හපුච්ඡකය- සතිපට්ඨාන විභඞ්ගය- විභඞ්ග පෙළ- 363 පිටුව**

යමක් බලන්න වුණොත් සතිපට්ඨානයේ සිහිය පිහිටුවාගෙන බලන්න රූපයේ යථාභූත ස්වභාවයට හිත තබමින්. එතකොට සීමා කරලා රූපයක් දිහා බැලුවත් රූපයේ නෙමෙයි හැසිරෙන්නේ. රූපය අහුවෙන්නේ ම නැහැ. මට මැටි කළයේ ලියවැල ද බලන්න ඕනේ, ලියවැලේ හිත රැඳෙන්නේ නැතුව අසුචිය ද බලන්නේ කියන එක ක්ෂණිකව චේතනාවෙන් කෙරුව හැකි.

සතිපට්ඨානයෙන් හඳාගන්න වාසය කරන්න භූමියක්. රූපයේ යථාභූත ස්වභාවය හිතෙන් ආරෝපණය කර ගෙන රූපය පැත්තට යොමු කළහම වර්ණ සටහනේ/ පිට පොත්තේ හැසිරෙන්නේ නැහැ. රූපයේ ජීවත් වෙන්නේ නැහැ එයා. ඒක නිසා නේ ලෝකෝත්තර සිතකට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ ආදී ලෝකේ කිසිවක් අරමුණු වෙන්නේ නැහැ කියන්නේ.

සතිපට්ඨානයෙන් කරන්නේ ම ලෝකේ කිසිවක් අරමුණු කරන්න දෙන්නේ නැති එක. රූපය සතර මහා ධාතුයි, කුණප කොටස් ටිකක් කියලා ගත්තොත් පෙනෙන වර්ණ සටහන පිහිටලා තියෙන තැන ගැන නුවණින් දකිනවා.

කඩදාසියයි චිත්‍ර ටිකකුයි තියෙන්නේ කියලා බැලුවොත් වර්ණ රූපේ හැසිරෙනවා ද එයා? නැහැ. නුවණ නැතුව බැලුවොත් නම් ලස්සන රූපයක් පෙනෙයි. කඩදාසියකුයි චිත්‍ර ටිකකුයි තියෙන්නේ කියලා හිතාගෙන බලන්න එතකොට චුට්ටක්වත් වර්ණ සටහනේ හැසිරෙන්නේ නැහැ. කඩදාසිය යි, චිත්‍ර ටිකක් තියන්නේ කියලා දන්නේ නැතුව බැලුවොත් හොඳට නිමිත්තක් අහුවෙලා තියෙයි ලස්සන මූණක් නේ, ලස්සන කෙනෙක් නේ කියලා.

ඔය වගේ පරීක්ෂණ කරලා බලන්න. එතකොට වෙනසක් තේරෙයි හොඳට. සතිපට්ඨානය තියෙන කෙනාට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ අරමුණු වෙලා ම නැහැ. ඒවා අරමුණු වෙන්නේ නැති නම් අරමුණු වෙලා තියෙන්නේ මොකක්ද මෙහෙම සතිපට්ඨානය වඩන කොට? යථාභූත ස්වභාවය, ඇත්ත ඇති හැටිය දකිනකම. අන්න ඒ වගේ උපායශීලි වෙන්න

ඕනේ. උපාය කෞශල්‍යයෙන් යුක්ත වෙලා තමයි මාරයාව මුලා කරන්න තියෙන්නේ.

සතිපට්ඨානය මාරයාව මුලා කරනවා. මාරයාගේ භූමියට නොගිහින් ම අවශ්‍ය දේත් අරගෙන එනවා මාරයාට අහුවෙන්නේ නැතුව. **නිවාප සූත්‍රයේ**[135] පෙන්වන්නේ, "එක මුව රංචුවක් සෘද්ධියකින් වගේ මාරයාගේ තණ කොටුවේ තණ කාලත් යනවා. ඒත් මාරයාට හොයාගන්නත් බැහැ කියලා. මුව කණ්ඩායම් තුනක් ම මාරයාට අහුවෙනවා. හතරවෙනි මුව කණ්ඩායම සෘද්ධියක් තියෙන අය වගේ. තණ කොටුවට නෑවිත් ම තණ කාලත් යනවා, අල්ලන්නත් බැහැ මාරයාට.

ඒ වගේ රහතන් වහන්සේට යමක් බලන්න ඕනේ වුණොත් මාරයාගේ භූමියට නොයාම ඒ දේ කරනවා. ඒ කියන්නේ උපාදානයට හිත විදිහට ඇහැ රූප උපද්දනවා නෙමෙයි. එතන දී සිහි නුවණ යෙදිලා තියෙන්නේ. චක්ඛු විඤ්ඤාණය උපදින්නේ නැහැ.

චක්ඛු විඤ්ඤාණයට රූපය ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය යි.[136] සතිපට්ඨානය තුළ වාසය කරන කෙනාට රූපය අරමුණු නොවේ නම්, එහෙනම් එයාට අරමුණු වෙන්නේ මොකක් ද? නුවණ/ රූපයේ යථාභූත ස්වභාවය.

එතකොට ප්‍රඥා චෛතසිකය යෙදුණු විඤ්ඤාණයක් තියෙන්නේ. එබඳු විදිහකටයි යමක් බලන්නේ. මේ ලෝකයා දකින සිද්ධිය ම දැකලත් යනවා. හැබැයි මාරයාට අහුවෙන්නෙත් නැතුව. සතිපට්ඨානය තරම් පීවත් වෙන්න වටිනා තැනක් ආයේ නැහැ.

---

135 https://tipitaka.lk/mn-1-3-5/sinh - **නිවාප සූත්‍රය- ඕපම්ම වර්ගය- මජ්ඣිම නිකාය 1- 375 පිටුව**

136 https://tipitaka.lk/ap-pat-1-2/pali - **පච්චය නිද්දෙසය- තිකපට්ඨානය- පට්ඨානප්‍රකරණය- 01 පිටුව**

ආනන්ද මහරහතන් වහන්සේ කල්පනා කරනවා, **“පළමු පිරිනිවියා වූ ශාස්තෘන් වහන්සේ ඇති හට, පහව ගිය කළණ මිතුරන් ඇති හට කායගතාසතිය වැනි කළණ මිතුරෙක් තවත් නැහැ”** [137] කියලා.

මගේ ශාස්තෘන් වහන්සේත් මට කලින් පිරිනිවන් පාලා. එකට හිටපු සැරියුත් මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ ආදී කළ්‍යාණ මිත්‍ර වූ සබ්‍රහ්මචාරීන් වහන්සේලාත් දැන් නැහැ මට. මට අද දවසේ දී ඉන්න හොඳ ම කළ්‍යාණ මිත්‍රයා කායගතාසතියයි කියනවා.

ඒ හින්දා අපිටත් ඒක ම යි. දුකෙන් එතෙර වෙන්න මඟ පෙන්නපු ශාස්තෘන් වහන්සේත් අපිට කලින් ම පිරිනිවන් පාලා. එදා භික්ෂූන් වහන්සේලාව උත්සාහවත් කරලා, මඟ නොමඟ කියලා දීලා සද්ධර්මයේ යොදවපු සැරියුත්, මුගලන් මහරහතන් වහන්සේලා ආදී සත්පුරුෂ සබ්‍රහ්මචාරී මහොත්තමයන් වහන්සේලාත් අපිට කලින් ම පිරිනිවිලා. අද දවසේ දී අපිටත් තියෙන එක ම පිහිට, එක ම කළ්‍යාණ මිත්‍රයා කායගතාසතිය යි.

ගොඩාක් යහළුවෝ නැහැ පුතේ. ගණසඞ්ගණිකායට යන්න එපා. අප්‍රමාදීව හුදෙකලාවේ නිවන් කෙරෙහි මෙහෙය වූ සිත් ඇතිව වාසය කරන්න. ඕගොල්ලොන්ට වෙන පිහිටක් නැහැ. ඒ හින්දා මේ කයට හොඳට සිහිය තබාගන්න. යමක් දිහා බලනවා නම් රූපයේ හිත රැඳෙන්නේ නැති විදිහට සතිපට්ඨානයට සිහිය තබාගෙන බලන්න.

ආස්‍රව සිහිවෙන කොට ඒකට හොඳට හිත තබලා මේ ආස්‍රව නේද කියලා පෙන්වලා ඒ පංච උපාදානස්කන්ධ ලෝකය ඇතිවෙච්ච හැටි හොඳට පෙන්වන්න. එහෙම පෙන්වමින් සතිපට්ඨානයෙන් වාසය කරන්න. අප්‍රමාදීව වාසය කරනවා නම් යමක් සඳහා කුලපුත්‍රයෝ ශ්‍රද්ධාවෙන් මේ සාසනයට ආවා නම් ඒ උතුම් වූ අරහත්වය මේ ජීවිතයේ දී ම තමන් විසින් ම විශිෂ්ඨ ඥානයෙන් දැන දැක ප්‍රත්‍යක්ෂ කොට වාසය කරනවා කියන තැනකට නොබෝ දිනකින් පැමිණිය හැකි.

---

137 https://tipitaka.lk/kn-thag-17-3/sinh - **ආනන්ද ස්ථවිරගාථා- තිංසතිනිපාතය- ථේරගාථා- ඛුද්දක නිකාය- 237 පිටුව**

ආයේ මේකේ සැක කරන්න එපා. මීට එහා තැනක් නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් ලෝකේ පහළ වෙලා අද හිටියා නම්, ඒ මගේ බුදුරජාණන් වහන්සේ මීට වඩා ඉතා දක්ෂව දේශනා කරයි. නමුත් මූලික හරය මේක ම තමා. සත්ත්වයාට වෙන භව දුකට වෙදකම් කරන්න නේ බුදුරජාණන් වහන්සේ වැඩියේ.

භව දුකේ ප්‍රශ්නය ඇතිවෙලා තියෙන හැටි මම පෙන්නුවේ. ඒකට තියෙන ප්‍රතිකර්මය සතිපට්ඨානය තුළ වාසය කරලා තමයි මිදෙන්න වෙන්නේ. භවය ගෙවුනහම ඒ රහතන් වහන්සේගේ ජීවිතය සතිපට්ඨානය තුළ ම යි වාසය කරන්නේ.

~ රහතන් වහන්සේ පංච උපාදානස්කන්ධයක් පරිහරණය කරනවා ද ~

දුතිය ගද්දුලබද්ධ සූත්‍රයේ [138] දී පෙන්වන්නේ කණුවක දම්වැලකින් බඳින ලද බල්ලා ඇවිද්දොත් ඒ බැඳලා ඉන්න කණුව වටා ම ඇවිදිනවා. හිටගත්තොත් ඒ කණුව වටා ම හිටගන්නවා. නිදාගත්තොත් ඒ කණුව වටා ම නිදාගන්නවා. ඉඳගත්තොත් ඒ කණුව වටේ ම ඉඳගන්නවා.

මහණෙනි, ඒ වගේ අශ්‍රැතවත් පෘථග්ජනයා ඇවිදිනවා නම් පංච උපාදානස්කන්ධයක ම ඇවිදිනවා. හිටගෙන ඉන්නවා නම් පංච උපාදානස්කන්ධයක ම හිටගන්නවා. නිදාගන්නවා නම් පංච උපාදානස්කන්ධයක ම නිදාගන්නවා. ඉඳගන්නවා නම් පංච උපාදානස්කන්ධයක ම ඉඳගන්නවා. පංච උපාදානස්කන්ධයකින් තොරව වාසය කරන්නේ නැහැ ම යි කියලා භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනවා.

රහතන් වහන්සේ නමක් (අසේඛ) නම් පංච උපාදානස්කන්ධය පරිහරණය කරන්නේ ම නැතුව සතිපට්ඨානය තුළ ම වාසය කරනවා. සේඛ කෙනෙක් වුණත් පංච උපාදානස්කන්ධයේ ඕනෑවට වැඩිය සක්මන් කරන්නේ නැතුව සතිපට්ඨානය තුළ යි වාසය කරන්නේ.

---

138 https://tipitaka.lk/sn-3-1-2-5-8/sinh - **දුතිය ගද්දුලබද්ධ සූත්‍රය - පුස්ව වර්ගය- බන්ධ සංයුත්තය- සංයුක්ත නිකාය 3- 259 පිටුව**

ජීවත්වෙන කොට සතිපට්ඨානයෙන් යන්නේ එන්නේ, කටයුතු කරන්නේ, කතාබහ කරන්නේ ක්ෂිණාස්‍රව රහතන් වහන්සේ නමක් හෝ ඒ උතුම් අරිහත්වය බලාපොරොත්තුවෙන් හික්මෙන සේඛ කෙනා විතරයි. පෘථග්ජනයෙක් කවදාවත් ම සතිපට්ඨානයෙන් වාසය කරන්නේ නැහැ, එයා හැසිරෙන්නේ පංච උපාදානස්කන්ධයක ම යි.

රහතන් වහන්සේත් පංච උපාදානස්කන්ධයක් පරිහරණය කරනවා කියලා නම් ගන්න එපා. එහෙම වුණොත් ඒක මහා ලෝක අපරාධයක්. රහතන් වහන්සේ ලෝකේ තුළ ජීවත් වෙන්නේ නැහැ කියලා කියන්නේ ඒකයි. ලෝකේ කියන්නේ ඇහැ, රූප, කන, ශබ්ද, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම.

නෙළුම් මලක් දණ්ඩ කාලේ, පොහොට්ටුව කාලේ, වතුරේ ම යි හැදුනේ. ටික ටික ලොකුවෙලා ඇවිල්ලා නෙළුම් මල පිපුනහම ඒ වතුර මැඩගෙන වතුරෙන් උඩට ඇවිත් ඉන්නවා වතුරේ ගෑවෙන්නේවත් නැතුව.

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ; **“බුදුරජාණන් වහන්සේ කියන්නේ, රහතන් වහන්සේ නමක් කියන්නේ නෙළුම් මලක් වගේ. ලෝකයේ ම ඉපදිලා, ලෝකයේ ම හැදිලා වැඩිලා, ලෝකයෙන් මිදිලා ජීවත් වෙනවා ලෝකය හා සම්මිශ්‍ර නොවී. ලෝකය එක්ක ගෑවෙන්නේ නැහැ”.**[139]

රූපයක් දිහා බැලුවත් වර්ණ රූපයේ දශමයක්වත් හැසිරෙන්නේ නැහැ. සති සම්පජඤ්ඤ එළඹ සිටිනවා ම යි. සිහි නුවණින් තොරව වාසය කරන්නේ නැහැ ම යි.

මේ උපායයන් ටික ළං කරගත්තහම අමාරු නැහැ අපිට මාර්ගය වඩන්න. එහෙම නැතුව මේ පැයක් භාවනා කළා, පැය දෙකක් භාවනා කළා කියනවා වගේ තැනක් නෙමෙයි ජීවත් වෙන්න තැනක් සතිපට්ඨානය කියලා කියන්නේ.

---

139 https://tipitaka.lk/an-4-1-4-6/sinh - **ලොණ (ලෝක) සූත්‍රය- චක්ක වර්ගය- චතුක්ක නිපාතය- අඞ්ගුත්තර නිකාය 2- 79 පිටුව**

~ බුදුරජාණන් වහන්සේලා ලෝකේ පහළ වෙන්නේ ඇයි ~

බුදුරජාණන් වහන්සේ දැක්කා මේ ලෝකයා හරි ම අසරණයි. පිහිටක්, සරණක් නැහැ. ලෝකයා ජීවත් වෙන්න කියලා කරන දේවල්වලට ම කර්ම කෙලෙස් රැස්වෙනවා. මේ කිසිම කෙනෙක් ඔන්න මම අවිද්‍යාව ඇති කර ගන්නවා. ඔන්න මම තණ්හාව ඇති කර ගන්නවා. ඔන්න මම උපාදාන වෙනවා. ඔන්න මම ආස්‍රව ඇති කර ගන්නවා. ඕඝ, යෝග, ග්‍රන්ථ, නීවරණ ඇති කර ගන්නවා කියලා හිතලා නැහැ. පොඩ්ඩක් ඉන්න, මම පැයක් විතර කෙලෙස් ටිකක් ඇති කර ගෙන එන්නම් කියලා යනවා ද? නැහැ.

මොකද කරන්නේ ලෝකයා? ජීවත්වෙන එක විතරයි. උදේ නැගිට්ටා. මූණ කට හොඳගත්තා. වැසිකිළි කැසිකිළි ගියා. තියෙන කෑමක් කෑවා. බෑග් එක ගත්තා වැඩට ගියා. කාර්‍යාලයේ තියෙන වැඩ කටයුතු කළා. බස් එකක හෝ කෝච්චියක හෝ වාහනේක නැගලා ආයේ ගෙදර ආවා. ඔහොම ජීවත්වෙන ටික විතරයි කරන්නේ.

ඔය ජීවත්වෙන විදිහට තියෙන කෙලෙස් ටිකත් ඔක්කොම ඇතිවෙලා, ජීවිතයට එන්න තියෙන ඔක්කොම දුකත් ඇවිල්ලා, පංච උපාදානස්කන්ධයත් හැදිලා, තණ්හාවත් වැඩිලා, දැනුත් දුකත් විඳලා සසර දුකට හිමිකාරයෙක් වෙනවා කියන ඔක්කොම වෙලා ඇති.

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, නුඹලා ජීවත්වෙන ක්‍රමය වැරදි. ඔය විදිහට ජීවත්වෙන කොට නුඹලාට දුකත් හැදිලා, දුකට හේතුවත් හැදෙනවා. ඒ නිසා කෙලෙස් කර්ම රැස් නොවී, දුකත් ගෙවිලා, සසරටත් යන්නේ නැති විදිහට ජීවත් වෙන්න ක්‍රමයක් හොයලා දෙන්නයි බුදුරජාණන් වහන්සේලා ලෝකේ පහළ වෙන්නේ.

මම පැයක් විතර පැත්තකට ගිහිල්ලා තණ්හාව ඇති කර ගෙන ආවා නම් ඔන්න සුදුසුයි ඒ විදිහට ම මම පැයක් භාවනා කරලා තණ්හාව ගෙවන එක. නමුත් අපි ජීවත්වෙන ක්‍රමයට නම් කර්ම කෙලෙස් රැස් වෙන්නේ පැයක් හෝ දෙකක් භාවනා කරලා හරි යනවා ද? නැහැ.

භික්ෂුවක් නම් දානශාලාවට යනවා, දානය වළඳනවා, කුටියට යනවා, මිදුල අමදිනවා, සිවුරු හෝදගන්නවා, වැඩ කටයුතු කරනවා, කවුරු හරි ආවහම කතාබහ කරනවා. ඔහොම නෙමෙයි ද ජීවත් වෙන්නේ. ජීවත් වෙනවා කියන්නේ ඉඳගෙන ඇස් දෙක වහගෙන භාවනා කරන එක විතර ද? එහෙමත් භාවනා කරන්න.

නමුත් කර්ම රැස්වෙන්නේ නැති, කෙලෙස් රැස්වෙන්නේ නැති, දුක නිවෙන, මතු දුකට හේතුවක් නොවෙන ජීවත් වෙන්න ක්‍රමයක් හොයලා දෙන්නයි බුදුරජාණන් වහන්සේ ලෝකේ පහළ වුණේ. සතිපට්ඨානය කියන්නේ ජීවත් වෙන්න, වාසය කරන්න තැනක්, බිමක්, පොළොවක් හැටියට දකින්න.

ඇහැ, රූප, කන, ශබ්දය, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම කියන්නේ ලෝකයාට වාසය කරන්න, හිටගෙන ඉන්න තියෙන පොළොව. අපරියාපන්න භූමියේ රහතන් වහන්සේලාට හා සේඛ පුද්ගලයාට පොළොව තමයි සතිපට්ඨානය. ඒ භූමියේ තමයි ජීවත් වෙන්නේ. එතන තමයි ආර්යන් වහන්සේලාට පිහිටා හිටින්න තියෙන තැන.

සතිපට්ඨානයේ වාසය කරන කොට ඉන්න තියෙන තැනට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. එතන දෝෂයකට තිබුණේ අපිට සිහි නුවණ තිබුණේ නැතිකම. අවිද්‍යාව ගෙවිලා තිබුණේ නැහැ. තව විදිහකින් මාරයාගේ ක්ෂේත්‍රයට නම් යන්න එපා කියන එක අහලා තිබුණේ නැහැ. ඔච්චරයි තිබුණු අඩුව. තව විදිහකින් කිව්වොත් චතුරාර්ය සත්‍යය පරිපූර්ණ ලෙස අවබෝධ වෙලා නොතිබුණුකම විතරයි අඩුවකට තිබුණේ.

ආස්‍රව ක්ෂය කළ රහතන් වහන්සේ කියන්නේ උප්පත්ති වශයෙන් ආපු සීමා නොකරන ලද මනසට ම ආපහු එනවා සිහිය නුවණ ඇතුව. මාරයාගේ ක්ෂේත්‍රයට ගියොත් ඉවර ම තමයි කියන නුවණ ඇතුව. ඒ හින්දා මාරයාගේ ක්ෂේත්‍රයට යන්නේ ම නැහැ.

~ රහතන් වහන්සේගේ විමුක්තිය අකෝප්‍ය වෙන හේතුව ~

"නසස සා විමුත්ති සවෙව ඨිතා අකුපපා හොති" [140] - ඔහුගේ විමුක්තිය සත්‍යයේ පිහිටියා අකෝප්‍ය. කෙලෙසුන්ගෙන් ආස්‍රවයන්ගෙන් මනස මිදුනහම ඒ විමුක්ති මනස සත්‍යයේ තමයි පිහිටලා තියෙන්නේ. ඒ හින්දා ඒ විමුක්තිය අකෝප්‍ය.

ඒ කියන්නේ රූපය ගැන හොඳට ඇත්ත ඇති හැටිය දකින නුවණේ හිත පිහිටලා සිටින්නේ. ස්පර්ශය නිසා වේදනා හටගන්නවා. ස්පර්ශය නැති වෙන කොට වේදනාව නැති වෙනවා නේද කියන සත්‍යයේ හිත පිහිටියාම වේදනාව හසු වෙන්නේ නැහැ හිතට. එතකොට වේදනාව පිළිබඳ තියෙන යථාභූත නුවණ තමයි හිතට අහුවෙලා තියෙන්නේ. ස්පර්ශය නිසා වේදනාව හටගෙන ස්පර්ශය නැතිවෙන කොට වේදනාව නැති වෙනවා කියන යථාභූත නුවණ තමයි හිතේ ගැටිලා තියෙන්නේ. ඒ යථාභූත නුවණ යොමු කරලා තියෙන්නේ වේදනාවට.

මේ රූපයේ තියෙන්නේ පණුවෝ ගහන, දුගඳ හමන අසුචි ටිකක් නේද කියලා බලන නුවණ තමයි හිතේ හැපිලා තියෙන්නේ. ඒ නුවණ සහිත චෛතසික අරමුණු වෙලා තියෙන්නේ මැටි කළයේ ලියවැලට ඔබ්බෙන් වූ යථාර්ථයට. එතකොට රූපය හාත්පසක මොකුත් අහුවෙලා නැහැ හිතට. ඒ හිතට අසුභය බලන අසුභ වූ සිද්ධියක්වත් හසුවෙලා නැහැ. නුවණ තමයි හසුවෙලා තියෙන්නේ හිතට. නුවණ අරමුණු වෙලා තියෙන්නේ යථාර්ථයට. එතකොට රූපය උපාදාන වශයෙන් අහුවෙලා නැහැ.

සුර්ය ග්‍රහණයක් දිහා බලනවා වගේ බලන්න. කෙලින් ම ඉර දිහා බැලුවොත් ඇහැ අන්ධ වෙනවා. ඒ හින්දා චතුර බේසමක් තියලා බලනවා. ඉර වැටෙනවා චතුර බේසමට. අපි චතුර බේසම දිහා බලනවා. එතකොට සුර්ය ග්‍රහණයත් බලලා, ඇහැත් පරිස්සම් කරගෙන.

---

[140] https://tipitaka.lk/mn-3-4-10 - **ධාතුවිභඞ්ග සූත්‍රය- විභඞ්ග වර්ගය- මජ්ඣිම නිකාය- 506 පිටුව**

අපි සිහි නුවණින් තොරව කෙලින් ම රූපය දිහා බැලුවොත්, කෙලින් ම සුර්ය ග්‍රහණය බලන්න ගිහින් ඇහැ අන්ධ වෙනවා වගේ මාරයාට හසුවෙනවා. ඒ හින්දා සිහි නුවණින් රූපයේ යථාර්ථයට හිත යොමු කරලා බලන්න. මාරයාට හසු නොවී ජීවත් වෙන්න තියෙන එක ම ඉඩම කියලා කිවුවේ සතිපට්ඨානයට. කැටකුරුල්ලාගේ උපමාවෙනුත් පෙන්නුවේ.

කැටකුරුල්ලෙක් දවසක් ගලක් උඩ අව්ව තැප තැප ඉන්න කොට උකුස්සෙක් ඇවිල්ලා ඩැහැගෙන උඩින් අරගෙන පියාඹගෙන යනවා. දැන් අපි නම් බනින්නේ අපිට පීඩාවක් කරදරයක් කරන කෙනාට නේ. නමුත් කැටකුරුල්ලා බනිනවා තමන්ට ම. හොඳ වැඩේ තොට, තොට ඔහොම වෙලා මදි. තෝව කන්න ම තමයි තියෙන්නේ කියලා කැටකුරුල්ලා උඹ උඹට ම බැන ගන්නවා.

උකුස්සා අහනවා, “උඹව මරන්න ගෙනියන්නේ මම. උඹ මට බනින්නේ නැතුව උඹ උඹට ම බැනගන්නේ මොකද” කියලා. එතකොට කැටකුරුල්ලා කියනවා, “මට නුසුදුසු තැන හිටපු හින්දා නේ මාව උඹට අහුවුණේ. මට අයිති තැන මම හිටියා නම් උඹට මාව අහුවෙන්නේ නැහැ නේ” කියලා. හරි උඹට සුදුසු තැන මොකක් ද? කැට සහිත කුඹුර කිවුවා.

ආහ් හරි, මම උඹව කැට සහිත කුඹුරකට ගෙනිහින් දානවා. ඒත් මම උඹව අල්ලනවා කියලා උකුස්සා කිවුවා. ඒකට කැටකුරුල්ලා හා කිවුවා. උකුස්සා කැටකුරුල්ලාව කන්නේ නැතුව කැට සහිත කුඹුරට ගෙනල්ලා දැම්මා. කැටකුරුල්ලා නියරේ රිංගන්න පුළුවන් හොඳ කැටයක් බලාගෙන නියර උඩට ගිහින් දැන් එන්ඩ කියලා උකුස්සට කිවුවා. උකුස්සා වේගයෙන් ආවා. කැටකුරුල්ලාගේ ක්ෂේත්‍රය නේ කැට සහිත කුඹුර, උකුස්සා ළං වෙන කොට ම ටක්ගාලා කැටයක් ඇතුළට රිංගුවා. ආව වේගෙට උකුස්සාගේ හොට බිම වැදිලා උකුස්සා මැරුණා.

ඉතින් ඒ වගේ මහණොනි, කැටකුරුල්ලා තමන්ට අයිති නැති තැන ඉඳලා උකුස්සට අහුවුණා වගේ නුඹලාට නුසුදුසු තැන හිටියොත් මාරයාට

අහුවෙනවා. මොනවාද නුසුදුසු තැන්? රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ. මේවා නුසුදුසු තැන්. ඔතන හිටියොත් මාරයාට හසු වෙනවා ම යි.

මහණෙනි, කැටකුරුල්ලාට අයිති තැන කැට සහිත කුඹුර වගේ මාරයාට අහුවෙන්නේ නැතිව උඹලට වාසය කරන්න තියෙන තැන මොකක් ද? මහණෙනි, මේ සතර සතිපට්ඨානය යි. ඒ නිසා සතර සතිපට්ඨානය තුළ වාසය කරන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

~ ආර්ය ශ්‍රාවකයාට ජීවත් වෙන්න තියෙන පොළොව ~

අපි සතිපට්ඨානය පැය භාගයක් වඩනවා කියන එක අවස්ථාවකට විතරක් කරන සිද්ධියක් නෙමෙයි සතිපට්ඨානය කියන්නේ. ජීවත් වෙන්න තැනක්, පොළොවක්. හොඳට මතක තියාගන්න ආර්ය ශ්‍රාවකයාට සතිපට්ඨානය කියන්නේ පොළොව. යන්න එන්න ජීවත් වෙන්න තියෙන තැන.

සතිපට්ඨානය නැමති පියාගෙන් ලැබුණු ඉඩමේ නොසිට අනික් ඉන්න හැම වෙලාවක ම ඉන්නේ මාරයාගේ ඉඩමේ. ඒක හොඳට මතක තියාගන්න ඕනේ. *“ගොචරෙ භික්ඛවෙ, චරථ සකෙ පෙතතිකෙ විසයෙ”* - මහණෙනි, පියාගෙන් උරුම වෙච්ච බිම් කොටසේ ම හැසිරියල්ලා. එතකොට මාරයාට අහුවෙන්නේ නැහැ.

පියාගෙන් උරුමවෙච්ච බිම් කොටස තමයි සතර සතිපට්ඨානය. යන කොට, එන කොට, කන කොට, බොන කොට වටපිට බලන කොට ආදී ක්‍රියාකාරකම් කරන කොට සිහියෙන් ම කරන්න වෙනවා. ඇයි ඒ උපාදානස්කන්ධයක හැසිරෙන්නේ නැති වෙන්න.

ඇහැ මාරයා, රූපය මාරයා, චක්ඛු විඤ්ඤාණය මාරයා, කන මාරයා, ශබ්දය මාරයා, සෝත විඤ්ඤාණය මාරයා, නාසය මාරයා, ගන්ධය මාරයා, ඝාන විඤ්ඤාණය මාරයා, දිව මාරයා, රස මාරයා, ජිහ්වා විඤ්ඤාණය මාරයා, කය මාරයා, ඵොට්ඨබ්බය මාරයා, කාය විඤ්ඤාණය

මාරයා, මනස මාරයා, ධම්ම මාරයා, මනෝ විඤ්ඤාණය මාරයා කියලා ම දන්නවා.

~ භයානක ම විෂ සහිත හතුරා ~

මාරයාට අහුවුණොත් බේරෙන්න නම් බැහැ පුතේ. හතුරෙක් හතුරෙකුට යමක් කරයි ද, ඊට වඩා අතිශය හතුරුකමක් කරනවා උපාදානයට හිත විදිහට උපද්දන ඇහැ, රූපය. හතුරෙක් ගාවට හෝ විෂඝෝර සර්පයෙක් ගාවට ගියාට වඩා මහා හානියක් කරනවා පංච උපාදානස්කන්ධය.

හතුරෙක් ඕනේ නම් අපිට ගහයි, උපරිම වුණොත් අපිව මරයි. සර්පයෙක් අපිට දෂ්ඨ කළොත් මරණ සමාන දුකකට හෝ මරණයට හෝ අපි පත්වෙයි. නමුත් අපිව අපායට දාන්නේ නැහැ. අපිව කල්ප ගණාන් පැහෙන දුගතියකට යවන්න බැහැ හතුරෙක්ට හෝ විෂඝෝර සර්පයෙක්ට.

නමුත් රූපය අපිව මේ ජීවිතයෙත් මරනවා. මරණ හෝ මරණ සමාන දුකට පත් කරනවා විතරක් නෙමෙයි කල්ප ගණාන් පැහෙන නිරි, තිරිසන්, ප්‍රේත, අසුර කියන සතර අපායට ඇද දමනවා. කවුද විෂ සර්පයා ද? රූපය ද? රූපය එච්චරට විෂයි. ලෝකය කියන එක හැදිලා තියෙන්නේ ඒ තරම් විෂ තැනක. අනන්ත සංසාරේ පපුවේ අත් ගගහා අඬ අඬා එන්න වුණේ මෙයාගේ තියෙන විෂ සහිතකම හින්ද ම යි.

බජ්ජනීය සූත්‍රයේ[141] පෙන්වන්නේ; “මහණෙනි, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා නුවණින් මෙහෙම හිතනවලු. වර්තමාන රූපය විසින් මාව කාලා දානවා, විනාශ කරනවා. අතීත රූපයත් මාව කාලා දැම්මා, මාව විනාශ කරලා දැම්මා. අනාගත රූපය විසින් මාව කාලා දාවී, විනාශ කරලා දාවී.

141 https://tipitaka.lk/sn-3-1-2-3-7/sinh - **බජ්ජනීය සූත්‍රය- බජ්ජනීය වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 149 පිටුව**

වර්තමාන වේදනාව, සංඥා, සංඛාර, විඤ්ඤාණ විසින් මාව කාලා දානවා, විනාශ කරනවා. අතීත වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ද මාව කාලා දැම්මා. මාව විනාශ කරලා දැම්මා. අනාගත වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ද විසින් මාව කාලා දාවී, විනාශ කරලා දාවී කියලා".

බලන්න සංයුත්ත නිකායේ තියෙනවා බජ්ජනීය කියලා සුත්‍රයක්. බජ්ජනීය (කන ලද) ඒ කියන්නේ පංච උපාදානස්කන්ධය පරිහරණය කරන කෙනාව කාලා දාලා, චප කරලා ඒ ජීවිතය ගන්න දෙයක් නැති කරනවා. සසර ජරා මරණයට ගහගෙන යන දුකට නියත වෙච්ච නීච පුද්ගලයෙක් කරලා දානවා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ.

~ පස් මරුන් ~

"පඤ්ච මාරෝ ජිනෝ නාථෝ" - බුදුරජාණන් වහන්සේ පස්මරුන් දිනුවා කියලා කියන්නේ. බුදුරජාණන් වහන්සේ බන්ධ මාර, ක්ලේශ මාර, අභිසංස්කාර මාර, මච්චු මාර, දේවපුත්ත මාර කියන පස් මරුන්ගෙන් ම දිනුවා.

- **ඛන්ධ මාර**

ඛන්ධ මාර කියලා කියන්නේ පංච උපාදානස්කන්ධයට. ඇහැ මාරයා, රූපය මාරයා, චක්ඛු විඤ්ඤාණය මාරයා, කන මාරයා, ශබ්දය මාරයා, සෝත විඤ්ඤාණය මාරයා, නාසය මාරයා, ගන්ධය මාරයා, ඝාන විඤ්ඤාණය මාරයා, දිව මාරයා, රස මාරයා, ජිහ්වා විඤ්ඤාණය මාරයා, කය මාරයා, ඵොට්ඨබ්බය මාරයා, කාය විඤ්ඤාණය මාරයා, මනස මාරයා, ධම්ම මාරයා, මනෝ විඤ්ඤාණය මාරයා කියලා කියන්නේ. ඒ කියන්නේ පංච උපාදානස්කන්ධ මාරයාගෙනුත් දිනුවා.

- **ක්ලේශ මාර**

ක්ලේශ මාර කියන්නේ අවිද්‍යා, තණ්හා, උපාදාන, ඕඝ, යෝග, ග්‍රන්ථ, පරාමාස, නීවරණ, ආස්‍රව ආදී කෙලෙස්වලට. ඒ ක්ලේශ මාරයාගෙනුත් දිනුවා.

- **අභිසංස්කාර මාර**

අභිසංස්කාර මාර කියලා කියන්නේ පුණ්‍යාභි සංස්කාර (පින්), අපුණ්‍යාභි සංස්කාර (පව්), ආනෙඤ්ජාභි සංස්කාර (අරූපාවචර කුසල්) කියන්නේ කර්ම. ඒ අභිසංස්කාර මාරයාගෙනුත් දිනුවා.

- **මච්චු මාර**

මච්චු මාරයාගෙන් දිනුවා කියන්නේ ලෝකයා මරණය යැයි කියලා අඬන විලාප දෙන නිමිත්තක් තියෙනවා නම් ඒකෙනුත් දිනුවා.

- **දේවපුත්ත මාර**

අධර්මයට කැමති ධර්මයෙන් වළක්වන පරිනිම්මිත වසවත්ති කියන දිව්‍ය ලෝකයේ උපන්න 'දේවපුත්ත' කියලා මාරයෙක් ඉන්නවා. එයත් මිනිස්සු සුගතියකට යනවට කැමති නැහැ. දුගතියට යනවට කැමති කියන අසත්පුරුෂ ගතියක් තියෙනවා. පිනට ලැබිලා තියෙන්නේ එබඳු තැනක්. හැබැයි දැන් කරන්නේ පව්. එබඳු කෙනෙකුත් ඉන්නවා.

ඒ කියන්නේ ධර්මයට හික්මෙනවා නම් ඒක වළක්වලා අධර්මයට ගන්න උත්සාහවත් වෙනවා. හැම තැන ම නෙමෙයි, එයාගේ මට්ටම අභිබවා යන්න උත්සාහ කරන අයට තමයි කරදර කරන්නේ. එයාට වඩා පහත

කට්ටියට කරදර කරන්නේ නැහැ. මගේ වැඩේ ඒ අය විසින් ම කර ගන්නවා කියලා දේවපුත්ත මාරයා දන්නවා.

ධ්‍යාන මට්ටමට එන කොට, ඒ කියන්නේ පරනිම්මිත්ත වසවත්ති මට්ටම ඉක්මවන්න යන කොට අන්න මට ඉහළින් යන්න යනවා කියලා තමයි කරදර කරන්න එන්නේ. ඒ කිව්වේ කාම භූමි මට්ටම ඉක්මවා යන්න පුළුවන් වුණොත් තමයි එයා එන්නේ කරදර කරන්න.

පංච උපාදානස්කන්ධයෙන්, කෙලෙස්වලින්, කර්මවලින්, මරණයෙන්, දේවපුත්ත මාරයාගෙන් කියන පහෙන් ම දින්න නිසා බුදුරජාණන් වහන්සේට කියනවා පස්මරුන් දිනුවා කියලා. බන්ධ මාර කියන එක තමයි පංච උපාදානස්කන්ධය කියන්නේ. කෙනෙක් රහත් වෙනවා කියන්නේ එයත් පස්මරුන් දිනනවා කියන එක ම යි.

'අනුබුද්ධ' කියලා කියන්නේ ඒකනේ. බුදුරජාණන් වහන්සේව අනුකරණය කරලා ඒ විදිහට ම රහත්වෙන අයට. රහත්වෙන අයටත් කියනවා 'බුද්ධ' කියලා. සම්මා සම්බුද්ධ, පච්චෙක බුද්ධ, අර්හත් බුද්ධ. ඒ වගේ ම තව ඉන්නවා එක් කෙනෙක්. "ශ්‍රැත බුද්ධ" කියලා. එයා තවම රහත් වෙලත් නැහැ. නමුත් හොඳට ස්කන්ධ, ධාතු, ආයතන ආදී ධර්මයන් ගැන දන්නවා. පර්යාප්තිය (පෙළ දහම) ගැන හොඳ දක්ෂ කෙනාට කියනවා "ශ්‍රැත බුද්ධ" කියලා. සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහත් බුද්ධ, ශ්‍රැත බුද්ධ.

වාසය කරන්න සතර සතිපට්ඨානය නැමැති පොළොවත් පෙන්නුවා. ලෝකය හැදුණු හැටිත් කියලා දුන්නා. ලෝකය නැතිවෙන හැටිත් කියලා දුන්නා. ලෝකෙන් ඉවත් වෙන්න මෙහෙම කරන්න කියලත් කියලා දුන්නා. එතකොට තව මොකක් ද ඕනේ? තම තමන් බේරගන්න එකයි තියෙන්නේ. දැන් කරන්න තියෙන ඔක්කොම ටික කියලා දීලා තියෙන්නේ.

සාසනය කියලා කියන්නේ ඒකනේ. භාග්‍යවතුන් වහන්සේගේ පණිවිඩය මම කියලා දුන්නා. සාසන කියලා කියන්නේ පාලි වචනයක්. සාසනය කියන්නේ පණිවිඩය කියන එක. දැන් පණිවිඩය අහගෙන කෙනා කෙනා තුලනය කරන්න මාරයාගේ භූමියට නොයාම ඉන්නවා ද, විටෙක

මාරයාගේ භූමියට ගිහිල්ලා විටෙක නොගිහින් ඉන්නවා ද නැත්නම් මාරයාගේ භූමියේ ම ඉන්නවා ද කියලා.

~ තීරණය ඔබ සතු යි ~

දැන් දෙපැත්තක් තියෙයි. මාරයාට අහු නොවෙන සතිපට්ඨාන භූමිය තියෙනවා. පංච උපාදානස්කන්ධ ලෝකය මාරයාගේ භූමිය. සතිපට්ඨානයට සිහියෙන් නැතුව ඇහැ, රූප ආදී දොළොස් ආයතන ඉපද්දුවොත් උප්පත්ති භවය. හිතෙන් සිහි කරන කොට දැකපු, අහපු, දැනුණු, දැනගත්ත දේ ඇති බවට දැනෙනවා නම් කර්ම භවය. ඔය දෙයාකාර භවය හොඳයි නම් එහෙම ම ඉන්න.

ඔය දෙක ම එපා දුකයි නම් ඒ දෙක ම අයින් කරලා දාන්න සතිපට්ඨානයේ වාසය කරන්න. සතිපට්ඨානය කියන්නේ වෙන ම ඉඩමක්, පොළොවක්. ඒක වෙන ම භූමියක් ම යි. ආර්ය භූමිය කියලා කියන්නේ. මෙතන ලෝකයෙන් එතෙර වෙන්න කැමති අය හා එතෙර වුණු අය විතරයි වාසය කරන්නේ.

ලෝකේ ඇතුළේ ඉඳගෙනත් ඇතැම් අය සතිපට්ඨානය වඩනවා. ඒක ලෞකික සතිපට්ඨානය කියලා කියනවා. දර්ශනය අහන්නේ නැතුව නිතර ම පංච උපාදානස්කන්ධ ලෝකයේ ඉන්න ගමනුත් රූපයේ ඇත්ත බලනවා. නමුත් එයා ලෝකෙන් වෙන්වෙලා නැහැ. දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැති කරන මඟ ගැන අහගෙන නැහැ. ආස්‍රව ක්ෂය වෙන්නේ කොහොමද කියලා අහගෙන නැහැ.

ලෝකයේ හටගැනීම හා නැතිවීම වෙන් කරන්න ඕනේ කියලා ඒ නුවණ නැතුව ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය ආදී අටළොස් ධාතුව පරිහරණය කරන මට්ටමක නම් ඉන්නේ එතකොට භූමි දෙකක් නැහැ, කාම භූමියේ ම යි එතකොට.

ලෞකික භූමිය හා අපරියාපන්න භූමිය කියලා භූමී දෙකක් නැතුව එක ලෝකයක් හම්බ වෙද්දී ඒ ලෝකය ඇතුළෙත් රූපයක් අරගෙන ඒ රූපය කනබොන ආහාරයෙන් හැදුණු කුණප කොටස් ටිකක්, සතර මහා ධාතුයි කියලා බලනවා.

ඒ අවස්ථාවට එයා රූපයෙන් අයින් වෙනවා. ඒ අයින් වුණාට එයා දන්නේ නැහැ ඇයි අයින් වුණේ කියලා. ඒ මොහොතට රූපයෙන් අයින් වුණාට වැඩකුත් නැහැ. මොකටද අයින් වුණේ කියලා එකක් නැහැ නේ එයාට. අනෙක් මොහොතක දී ආයේ රූපය උපද්දනවා. එහෙම වඩන සතිපට්ඨානය නිසා කුසලය සිද්ධ වෙනවා, හැබැයි ලෞකික යි.

චතුරාර්ය සත්‍යය අහලා නැහැ. ඇහැ පරිහරණය කිරීමේ, රූපය පරිහරණය කිරීමේ දොස් දන්නේ ම නැහැ. පංච උපාදානස්කන්ධ ලෝකය අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හටගත්තේ කියලා දන්නේ ම නැහැ. අපි උප්පත්ති වශයෙන් ආවේ තියෙන ලෝකෙට තමයි. ඒ ලෝකයේ තමයි ඉන්නේ කියන තැනින් ජීවත් වෙමින් රූප බල බලා, ශබ්ද අහ අහා ඉන්නවා.

එහෙම ඉන්න ගමන් සතිපට්ඨාන සුත්‍රයේ වර්ණනාවත් අහලා තියෙන හින්දා සතිපට්ඨාන භාවනාව කරනවා. ලෝකයේ ඇතුළේ ම මිසක ලෝකෝත්තර වෙන්නේ නැහැ. වෙනස තේරෙනවද කියන එකේ. එයාට වෙන්වෙන්න තැනක් නැහැ නේ. පොළොව එකයි නේ.

අංගුලිමාල තෙරුන් වහන්සේ දේශනා කරන්නේ, ***"යතොහං භගිනි, අරියාය ජාතියා ජාතො නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා"*** [142] - ආර්ය ජාතියේ ඉපදුණු දා පටන් මම සත්තු මැරුවේ නැහැ කියලා. මේක වෙන ම ම උප්පත්තියක් ම තමයි. ආර්ය ජාතියේ ඉපදීම කියන්නේ ම වෙන ම ම ඉපදීමක් ම තමයි. 'ද්විජ' කෙනෙක් තමයි එයා. ඉස්සෙල්ලා ලෝකයේ ඉපදිලා. නැවත ආර්ය ජාතියේ ඉපදෙනවා.

142 https://tipitaka.lk/mn-2-4-6 - **අඞ්ගුලිමාල සූත්‍රය- රාජ වර්ගය- මජ්ඣිම නිකාය 2- 524 පිටුව**

පෘථග්ජන කියලා කියන්නේ ***"පුථු කිලෙසෙ ජනෙනතීති පුථුජ්ජනා"*** [143] - බොහෝ කෙලෙස් උපද්දන නිසා පෘථග්ජන කියනවා. එයා කරන්නේ ම රූප බලන ශබ්ද අහන ආදී ආයතන පරිහරණය කරන එක ම යි. ඒ ගානේ උපාදානය වැඩෙනවා, ආස්‍රව වැඩෙනවා.

සේඛ පුද්ගලයාට දැනට තියෙන කෙලෙස් ගතිය නිසා එයා තව ගහගෙන යනවා මිසක අලුතෙන් ඕනෑවට වඩා කෙලෙස් උපද්දන්නේ නැහැ කියනවා. ඒ හින්දා තමයි අන්තිම අඩු කෙනාත් කොහොම ප්‍රමාද වුණත් භවයේ හත් වතාවකට වඩා උපදින්නේ නැහැ කියන තැනකින් තියෙන කෙලෙස් ටික ක්ෂය වෙනවා කියලා කියන්නේ.

සංවේගයක් ඇති කර ගන්න ඕනේ පුතේ මේ සසර දුක වගේ ම, මේ ජීවිතයේ මෙතනට එන කොට මේ නිවන් මඟ හොයා ගන්න බැරුව මොන තරම් නම් මහන්සි වුණා ද, දුක් වින්දා ද කියන එක. මේ අඩුපාඩුව අනාගතයට පහළ වෙන දරුවන්ට ඉතුරු නොකරන්න අපිට පුළුවන් නම් ඒක හරි සත්පුරුෂකමක් පුතේ.

ඒක අපිට කරන්න පුළුවන් වෙන්නේ ගොඩක් කතා කර කර ඉන්න එකෙන් නෙමෙයි. කෙනා කෙනා අප්‍රමාදී වීමෙන්. බුදුරජාණන් වහන්සේ දේශනා කරපු මේ ටික තමයි මටත් කියන්න තියෙන්නේ. මම කියනවා නෙමෙයි, තථාගතයන් වහන්සේගේ වචනය පෙන්වනවා. බුදුරජාණන් වහන්සේ අපට හැම වෙලාවේ ම දේශනා කරනවා,

"යං වො භිකඛවෙ, සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි භිකඛවෙ රුකඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි. ඣායථ භිකඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විපටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති". [144]

මහණෙනි, ශ්‍රාවකයන්ට හිතෙෂී වූ ශ්‍රාවකයන්ට අනුකම්පා කරන ශාස්තෘන් වහන්සේ නමක් විසින් යමක් කළ යුතු නම් ඒ සියල්ල ම මම

---

143 https://tipitaka.lk/kn-mn-7 - **තිස්සමෙත්තෙය්‍ය සූත්‍රනිර්දේශය- මහානිද්දෙස පාළි- බුද්දක නිකාය- 202 පිටුව**

144 https://tipitaka.lk/mn-1-2-9 - **ද්වේධා විතක්ක සූත්‍රය- සීහනාද වර්ගය- මජ්ඣිම නිකාය- 298 පිටුව**

නුඹලා වෙනුවෙන් කරලා තියෙනවා. මේ හිස් ගෙවල් තියෙනවා, ගස් මුල් තියෙනවා. අප්‍රමාදීව ධ්‍යාන වඩන්න. ප්‍රමාද වෙන්න එපා. ප්‍රමාද වෙලා පසුව විපිළිසර වෙන්නත් එපා. මේ නුඹලාට මාගේ අනුශාසනාව යි කියලයි මගේ භාග්‍යවතුන් වහන්සේ හැමදාම මතක් කළේ.

ඒ ටික මාත් මතක් කරනවා බුදුරජාණන් වහන්සේ අපිට මෙහෙම දේශනා කරලා තියෙනවා කියලා. මම කියනවා නෙමෙයි, මට එහෙම කියන්න බැහැ. මගේ ශාස්තෘන් වහන්සේ අපිට මෙන්න මෙහෙම හැමදාම පෙන්නලා තියෙනවා. ඒක හොඳට සිහිය තබාගෙන කටයුතු කරන්න කියලා මතක් කරනවා.

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.02.15 දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසන වාසී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සිදු කළ 03 වන ධර්ම දේශනාව ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

භවස කට්ටිය ටිකක් භාවනා කළා ද? එහෙම කාට හරි භාවනා කරන්න මොන විදිහටවත් තේරෙන්නේ නැත්නම්, අපහසු නම් ඕනේ වෙලාවක මගෙන් ඇවිල්ලා අහන්න. තියෙන ප්‍රශ්න විසඳගන්න. මේ අවස්ථාව නම් පුතේ, අතහැර ගන්න නම් එපා. භවයේ හිටියොත් ආයේ පිහිටක් පිළිසරණක් ඇත්තේ ම නැහැ. අර **පිඟ්ගල**[145] කියලා සූත්‍රයක් තියෙන්නේ.

~ මිනිසත් භවේ ඇති දුර්ලභ බව ~

බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ගොවියෙක් ගොවිකම් කරලා හාලා වියගහක් පැත්තකට දාලා තියෙනවා. ඉතින් ඒකත් වේයෝ කන්නේ නැතුව, මීයෝ කන්නේ නැතුව දිරන් නැතුවත් තිබ්බලා, ඒක පාවෙලා යන විදිහට මහා වැස්සක් වැහැලා ගහගෙන ගිහින් ඇළකට වැටිලා, ඇළකින් කොහොම හරි ගඟකට වැටිලා, ගඟෙන් මුහුදටත් වැටිලා, මුහුදේ එහාට මෙහාට පාවෙවී තියෙනවා.

ඒ මුහුදේ ඉන්නවා කන කැස්බෑවෙක් (එක ඇහැක් තියෙන කැස්බෑවෙක්) ඒකා අහස බලන්නේ අවුරුදු සියයකට සැරයක්. ඉතින් අවුරුදු සියයකට සැරයක් අහස බලන්න උඩට එන කොට හරියට ම අර පාවෙලා ආපු වියගහේ සිදුරෙන් ම අහස බැලුවොත් එහෙම මොන තරම් දුර්ලභ දෙයක් ද ඒක. වෙන්න පුළුවන් දෙයක් ද? වෙන්න බැහැ වගේ දෙයක් නේ.

---

145 https://tipitaka.lk/sn-5-12-5-7/sinh - **පිඟ්ගල සූත්‍රය- පපාත වර්ගය- සච්ච සංයුක්තය- සංයුත්ත නිකාය 5- 319 පිටුව**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහණෙනි, ඒ වගේ දෙයක් වෙන්න පුළුවන් සීඝ්‍රයෙන්. ඒත් තිරිසන්ගත සතෙක් මනුස්සයෙක් වෙනවා කියන එක එහෙමවත් වෙන්නේ නැහැ කියනවා. තිරිසන්ගත ලෝකේ ස්වභාවය තමයි හැම වෙලාවේ ම දුබලයා යට කරගෙන ඉන්නේ බලවතා විසින්. ලෝකේ ඉතින් හැම තැන ම එහෙම තමයි. නමුත් ඒක බොහොම ප්‍රකටයි තිරිසන් භවයේ.

ඉතින් ඔන්න කොටියෙක් හෝ දිවියෙක් හෝ සිංහයෙක් වෙලා උපන්නා කියලා හිතන්නකෝ. ඌගේ පැවැත්මට ජීවත් වෙන්න තියෙන්නේ ම ආහාරයට තව සතෙක්ව මරාගෙන කන එක. ඒ නිසා සත්තු මරාගෙන කනවා. ඒ අකුසලයෙන් මරණයෙන් මත්තේ යනවා නිරයට.

ගොඩක් වෙලාවට අවීචී මහා නරකයේ තමයි ඉපදෙන්නේ. ඒවා බොරු එහෙම නෙමෙයි. යොදුන් සියයක් උස, යොදුන් සියයක් දිග, යොදුන් සියයක් පළල මහා ප්‍රාකාරයකින් වටවෙච්ච උතුරෙන් හටගන්න ගින්න දකුණෙන්, දකුණෙන් හටගන්න ගින්න උතුරෙන්, බටහිරෙන් හටගන්න ගින්න නැගෙනහිරෙන්, නැගෙනහිරෙන් හටගන්න ගින්න බටහිරෙන්, උඩින් හටගන්න ගින්න යටින්, යටින් හටගන්න ගින්න උඩින් විහිදෙනවා.

ඉතින් ඒකේ උපන්න සත්ත්වයෝ ඔය ගින්න ඇතුළේ පැහෙනවා. ඒ ගින්නට හසුවෙලා දුවන කොට හම ද දැවෙනවා, මස් ද දැවෙනවා, නහර ද දැවෙනවා, ඇට ද දැවෙනවා, ඇටමිඳුළු ද දැවිලා දුම් දානවා. ඒත් කර්මය නිසා මැරෙන්නේ නැහැ.

එහෙම පිච්චි පිච්චි ඉන්න කොට නැගෙනහිර පැත්තේ දොරටුව ඇරෙනවා. අනේ මේ දුකෙන් ගැලවෙන්න ඕනේ කියලා ඒ දොරටුවෙන් එළියට යන්න ඕනේ කියලා දුවන්න හැදුවට දිවෙන්නේ නැහැ, එක තැන එක තැන වගේ පියවර තැබෙන්නේ. ඔහොම ඉතින් අවුරුදු දහස් ගාණක් දුවලා දුවලා නැගෙනහිර දිශාවේ දොරටුවට ළංවෙන කොට ම දොර වැහෙනවා.

එතකොට ම බටහිර දිශාවේ දොර ඇරෙනවා. එතකොට ඒ පැත්තට දුවන්න අරන් ඒ දොරටුව ගාවට යන්න මනුස්ස ලෝකේ ආයුෂවලින් අවුරුදු

දහස් ගණනක් ගිහින්. ඒ දොරටුවට කිට්ටුවෙන කොට ම ඒ දොරත් වැහෙනවා. එතකොට ම උතුරු දිශාවේ, දකුණු දිශාවේ ආදී දොරවල් අර විදිහට ම වරින්වර ඇරෙනවා. ඔහොම වෙවී බුද්ධාන්තර ගණන් දුක් විඳ විඳ ඉඳලා එක දොරටුවකින් එළියට යනවා.

එළියට යන කොට ම ඊට සමනාන්තරව තියෙනවා, 'ගූථ නරකය'. මහා අසුචි ගොඩක්. නිරිසත්ත්වයාව ඒකට වැටුණාහම හිසේ ඉඳන් ඒ අසුචි ගොඩේ යටට යනවා. ඒකේ ඉන්නවා ඉදිකටු වගේ තුඩු තියෙන පණුවෝ. උන් මේ නිරිසත්ත්වයාගේ හම ද විදිනවා, මස් ද විදිනවා, නහර ද විදිනවා, ඇට ද විදිනවා, ඇටමිඳුළු ද කනවා. ඒ හේතුවෙන් කෘර වූ කටුක වූ තියුණු වූ දුක් වේදනා විඳිනවා, ඒත් මැරෙන්නේ නැහැ.

ඒකෙන් එන කොට ම ඊට සමනන්තරව තියෙනවා, 'කුක්කුල නරකය'. කුක්කුල කියන්නේ ගිනියම් වෙච්ච අළු. ඒකට වැටුණාහම හිස ඉඳන් යටට යනවා පිච්චිගෙන. ඒකේ පැහිලා පැහිලා බොහෝ කාලයකට පස්සේ ගොඩට ආවහම ඊට සමනාන්තරව තියෙනවා 'කටුඉඹුල'.

ගැහැණු කෙනෙක් හරි ලස්සන මිහිරි හඬින් සිංදු කියනවා වගේ ඇහෙනවා. ඉතින් අධික රාග දාහයක් මේ නිරිසත්ත්වයාට ඇති වෙනවා. එතකොට ඒ ගැහැණු කෙනා හොයාගෙන මේ නිරිසත්ත්වයා යනවා. ගිනිගෙන දැවෙන කටු තියෙන්නේ වක්‍රවෙලා පල්ලෙහාට. ඉතින් ඇඟ ඉරාගෙන පලාගෙන අර කටුඉඹුලේ නගිනවා. උඩට යන කොට පහත ඉඳන් කතා කරනවා වගේ ඇහෙනවා. එතකොට ම කටු උඩු අතට හැරෙනවා. ආපහු පල්ලෙහාට බහිනවා මුළු ඇඟ ම කටුවලට ඉරාගෙන.

එතනින් අවුරුදු සිය දහස් ගණනක් පැහිලා පැහිලා ඒකෙන් ගොඩ එන කොට ම තියෙනවා 'අසිපත්‍ර වනය'. ඒ කැලේ ගස්වල කොළ කඩු වගේ. ඉතින් ඒ කැලේ මැදින් යන කොට හුළඟට ඒ කොළ ඇවිල්ලා වදිනවා. කන් ද කැපෙනවා, නාස ද කැපෙනවා. අත් ද කැපෙනවා. කකුල් ද කැපෙනවා. ඒ හේතුවෙන් අවුරුදු සියදහස් ගාණක් දුක් විඳිනවා.

ඊට පස්සේ 'වේතරණී නම් ගඟට' වැටෙනවා. ඒකේ තියෙන්නේ කරදිය (ලුණු වතුර). ලෝදියට පිච්චෙනවා, ඒ පිච්චුණු එකට ම ලුණු වතුර ගෑවෙනවා. ඒ ගඟේ එහාට මෙහාට පාවෙලා යන මේ නිරිසත්ත්වයාව යමපල්ලෝ මාළු බානවා වගේ බිලී කොකුවලින් උස්සලා ගොඩට ගන්නවා.

උස්සලා ගොඩට අරගෙන "උඹට මොනවද ඕනේ" කියලා යමපල්ලෝ අහනවා. එතකොට අර නිරිසත්ත්වයා කියනවා, "බඩගිනි ස්වාමීනී" කියලා. එතකොට යමපල්ලෝ බලෙන් අර නිරිසත්ත්වයාගේ කට ඇරලා රත්වෙච්ච ලෝහ ගුලි ගිල්ලනවා. ඒ හේතුවෙන් හම ද පිච්චෙනවා, තොල් ද පිච්චෙනවා, බඩ ද පිච්චෙනවා, බඩවැල් ද පිච්චෙනවා. බඩවැල්, බඩවැල් බොකුත් පුච්චගෙන අධෝමාර්ගයෙන් පිටවෙනවා. ඒත් කර්මය හේතුවෙන් මැරෙන්නේ නැහැ.

"දැන් උඹට මොනවා ද ඕනේ" කියලා යමපල්ලෝ අහනවා. "පිපාසයි ස්වාමීනී" කියලා නිරිසත්ත්වයා උත්තර දෙනවා. එතකොට අර වගේ ම යකඩ අඬුවලින් කට ඇරලා ගිනියම් වෙච්ච ලෝදිය වක් කරනවා. ඒ හේතුවෙන් නොලත් පිච්චෙනවා, දිවත් පිච්චෙනවා, උගුරත් පිච්චෙනවා, බඩවැල්, බඩවැල්දරණත් අරගෙන එළියට පිටවෙනවා. ඊට පස්සේ මේ නිරිසත්ත්වයාව අරගෙන ආපහු දානවා, වේතරණී නම් ගඟට.

ඔහොම පැහිලා පැහිලා සමහර කෙනෙක් ආයේ නිරයට ම වැටෙනවා. සමහර කෙනෙක් තිරිසන් ලෝකෙට එනවා. තිරිසන් ලෝකෙට එන කොට නිරයට යන්න කලින් සිංහයෙක්, කොටියෙක් වෙලා නේ හිටියේ. එතකොට ඒ සිංහයෙක්, කොටියෙක් වෙලා ඉන්න කොට කාපු හාවෝ, මුවෝ ආදී සත්තු ඉන්නවා බලාගෙන, 'මමත් දවසක උඹව කනවා' කියලා.

අපි හිතමුකෝ, නිරයෙන් මිදිලා ඉපදුනේ හාවෙක් හෝ මුවෙක් වෙලා කියලා. එතකොට එහෙම උපන්නහම අනික් සත්තු බලන් ඉන්නේ මරාගෙන කන්න. ඒ හේතුවෙන් කොළයක් හෙල්ලුනත් පන බයේ ගැහි ගැහී එහාට මෙහාට දුවමින් තමයි ඉන්නේ.

අපි හිතමුකෝ සිංහයෙක්ට කොටියෙක්ට මේ හාවා හෝ මුවා අහුවුණා කියලා. එහෙම පන පිටින් කන කොට ඒ මුවාට හෝ හාවාට හිතෙන් නැහැ, “අනේ උඹ මාව කෑවට මම උඹට මෛත්‍රී කරනවා” කියලා. අර සිංහයා හෝ කොටියා ගැන තරහෙන් ද්වේශයෙන් තමයි මැරෙන්නේ. එතකොට කබලෙන් ලිපට වැටුණා වගේ තිරිසන් භවයේ ඉඳන් ආයෙත් වැටෙනවා නිරයට.

ඒ නිරයේ සමහරවිට කල්ප ගණාන් පැහිලා එන කොට ආයෙත් එනවා තිරිසන් ලෝකෙට. තිරිසන්ගත සතෙක්ට දන් දෙන්න ඕනේ, සිල් රකින්න ඕනේ, බණ භාවනා කරන්න ඕනේ කියලා කුසල් සිත් පහළ වෙනවා කියලා එකක් නැහැ. (එහෙම කුසල් සිතක් පහළවෙන එක ඉතා විරල දෙයක්) බොහෝ සෙයින් අකුසල් සහගත සිත් තමයි උපදින්නේ.

ඉතින් ඒ නිසා ආපහු නිරයට වැටෙනවා, එක්කෝ ආයේ තිරිසන් ලෝකෙට වැටෙනවා. වරක් තිරිසන් ලෝකෙට ගියහම එතනින් ගොඩ එනවා කියන එක ලෙහෙසි නැහැ. ඔහොම දුගතීන්ගේ ඉපදෙමින් මැරෙමින් තියෙද්දී අපරාපරිය වේදනීය කර්මයක් හැටියට යම් කුසල කර්මයක් ඉදිරිපත් වෙලා මනුස්ස ලෝකෙක ඉපදෙනවා.

අනේ උපදින කොට බුද්ධෝත්පාද කාලයක් නෙමෙයි, එහෙම එකක් දන්නෙත් නැහැ. දුගතියක ඉඳන් එන කෙනෙක්ට බොහෝවිට ලැබෙන්නේ හීන ආත්මභාවයක්. බොහෝ දුක සේ; ආහාරපාන හොයා ගන්නවන, ඇඳුම් පැළඳුම් හොයා ගන්නවන, ඉන්න හිටින්න තැන් හදාගන්න එක දුක සේ තමයි කර ගන්න වෙන්නේ.

එහෙම නැතිනම් මාළු අල්ලන කුලයක හෝ එක්කෝ මත්පැන් පෙරනවා වගේ මොකක් හරි දුගතියකට යන්න පුළුවන් රස්සාවක් තමයි බඩවියත වෙනුවෙන් කරන්න වෙන්නේ. හරක් මරලා ජීවත්වෙන පවුලක ඉපදුනොත් ඒ තාත්තා රස්සාවට කරන්නේ හරක් මරණ එක නේ. “පුතේ ගනින්කෝ කඹය, ගනින්කෝ කැත්ත. යමං අද තියෙනවා හොඳ හරකෙක් මරන්න”.

ඉතින් මේ දරුවත් බැහැ කියන්නේ නැහැ. තාත්තාගේ රස්සාව නේ, පුතත් යනවා තාත්තා එක්ක. “හරකාගේ අතපය හතර හොඳට බැඳලා අල්ලපන් පුතේ, බෙල්ල පාත් කරලා, ආහ් දැන් කොටහන් බෙල්ලට” කියලා තාත්තා කියන විදිහට හරක් මරලා විකුණනවා. බොහෝ කල්ප ගාණකින් සුගතියකට එක මොහොතකට ආවේ. සත්ත්ව ඝාතන ආදී අකුසල කර්ම හේතුවෙන් ආයෙත් අවීචි මහා නරකයට වැටෙනවා. එබඳු වූ කෙළවරක් නැති සසරක් පුතේ මේක.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා **“මහණෙනි, පටිච්චසමුප්පාදය අවබෝධ කර නොගත් නිසා මීයන් විසින් කපා අවුල් කරන ලද රෙදි වියන්නන්ගේ නූල් කැටියක් මෙන් අවුල් කරගෙන, ගෙතුණු තණබිස්සක් වගේ එකට ගෙතිලා, පැටලුණු පඹගාලක් වගේ පටලවාගෙන අවුල් කරගෙන මේ ලෝකයා අපාය සහිත දුක් සහගත සසර නොඉක්මනවා”** [146] කියලා

බුදුරජාණන් වහන්සේ සසර දුකයි කියන්නේ, අපි බඩගින්නේ ඉන්නවා, ලෙඩ වෙනවා කියන තැනකින් වගේ මනුස්ස ලෝකේ තියෙන දුක් ටික විතරක් නිසා ම නෙමෙයි. අපාය කියන එක බොරුවක් එහෙම නම් නෙමෙයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවානේ, **“මහණෙනි, මම දෙවි කෙනෙක්ගෙන් අහලා කියනවා නෙමෙයි. කවුරුවත් මට කියපු දෙයකුත් නෙමෙයි. මිනිස් ඇස ඉක්ම වූ දිවැසින් මම දැකලා කියන්නේ”** [147] කියලා.

එහෙම කියලා විතරක් නෙමෙයි, කාටවත් නැහැ බැහැ කියන්න බැරි වෙන්න බුදුරජාණන් වහන්සේ පෙන්වනවා, මෙන්න මේ සමාධිය උපදවාගෙන මෙන්න මේ සමාපත්තියට ඇවිල්ලා මිනිස් ඇස ඉක්ම වූ දිවැස උපදවා ගෙන බලන්න ඇත්ත ද බොරු ද කියලා. ඕගොල්ලෝ බුදුරජාණන් වහන්සේ පෙන්වන ඒ සමාධියත් වඩලා සමාපත්තිය උපදවාගෙන දිවැසත් උපදවා

146 https://tipitaka.lk/dn-2-2/sinh - **මහානිදාන සූත්‍රය- දීඝ නිකාය 2- 81 පිටුව**

147 https://tipitaka.lk/an-10-1-3-1/sinh - **සිංහනාද සූත්‍රය- මහා වර්ගය- දසක නිපාතය- අඞ්ගුත්තර නිකාය 6- 67 පිටුව**

ගෙන පෙනුණේ නැති වුණොත් චෝදනා කරන්න එහෙම අපාය කියලා එකක් නැහැ, ඒක බොරුයි කියලා.

මම දැන් කිවුවොත්, අපේ ගමේ මාන්කඩවල කියලා වැවක් තියෙනවා කියලා ඕගොල්ලොන්ට බැහැ චෝදනා කරන්න, මෙතන (ලබුනෝරුවේ) ඉඳලා වටපිට බලලා, බොරු කියන්න එපා තියෙනවා නම් පේන්න එපැයි කියලා. එහෙම කිවුවොත් හරි ද? මෙතනට මාන්කඩවල වැව පෙනුනා නම් තමයි පුදුමේ.

මං කියනවා, එහෙම වැවක් තියෙනවා. ඒකට යන්න ඕනේ මරදන්කඩවලට ගිහිල්ලා, එතැනින් අනුරාධපුරේට ගිහිල්ලා කියලා පාරකුත් මං කිවුවහම, ඕගොල්ලෝ මෙතන ඉඳන් වටපිට බලලා 'කෝ ඉතින් තියෙනවා නම් මෙතනට පේන්න එපැයි, මොන බොරු ද එහෙම එකක් නැහැ' කියලා ඕගොල්ලෝ චෝදනා කරනවා නම් හරි ද?

ඉතින් මේ වටපිටාවට මාන්කඩවල වැව පෙනුණොත් නෙමෙයි ද පුදුමේ. මං කියපු විදිහට මරදන්කඩවලටත් ගියා, අනුරාධපුරේටත් ගියා, එතනින් තව බස් එකක ගිහින් කියපු තැනින් බැස්සට පස්සෙත් මාන්කඩවල වැව කියලා එකක් නැති වුණොත් අන්න සුදුසුයි චෝදනා කරන්න මට. එහෙම නේද? එහෙම නැතුව මම කියපු දේ අහලා මෙතන ඉඳලා දෙපැත්ත බලලා මාන්කඩවල වැව කියලා එකක් නැහැ කියලා චෝදනා කරන්න සුදුසු ද මට? සුදුසු නැහැ.

ඒ වගේ බුදුරජාණන් වහන්සේ අපාය ගැන, දිව්‍යලෝක ගැන දේශනා කරනවා. මෙන්න මේ සමාධියට සමවැදිලා දිවැස උපදවා ගත්තොත් අපාය, දිව්‍යලෝක බලන්න පුළුවන් කියලා ඒ දිවැස අපිට උපදවා ගන්න මාර්ගයත් දේශනා කරනවා නම්, ඒ දේශනා කරන විදිහට අපි ඒ මාර්ගයේ නොයා අපි මේ මනුස්ස මට්ටමේ ඉඳන්, "අපාය නැහැ, දිව්‍ය ලෝකේ නැහැ. තියෙනවා නම් පෙනෙන්න එපැයි" කියන්නේ මෙතන ඉඳන් දෙපැත්ත බලලා මාන්කඩවල වැව කියලා එකක් නැහැ කියනවා වගේ දෙයක්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන දේ බොරු නෙමෙයි. ඒ හින්දා මගේ පුතේ සෙල්ලමක්, විහිළුවක් නම් නෙමෙයි. ඒ වගේ අපාය සංඛ්‍යාත සසරෙන් එතෙර වෙන්න පෙන්වන ශාස්තෘන් වහන්සේ නමක් ලෙහෙසියකට හම්බ වෙන්නේ නැහැ.

~ අපි ලද උතුම් අවස්ථාව ~

බුද්ධෝත්පාද කාලයක මනුස්සයෙක් වෙලා සද්ධර්මය තියෙන වටපිටාවක ඉපදෙනවා කියන එක තමයි ලෝකේ ලැබෙන්න තියෙන ඉහළ ම ක්ෂණ සම්පත්තිය. ඒ විතර භාග්‍යවන්තකමක් තව නැහැ. අනේ ඒ දුර්ලභ ක්ෂණ සම්පත්තියත් අපි ලබාගෙන; අම්මා, තාත්තා, ගෙවල් දොරවල්, දුවා, දරුවෝ ආදී ඉතා ම පරිත්ත වූ, චූටි වූ කාම සහගත අරමුණක් දෙකක් ගැන හිත හිතා නම් ඉන්නේ අපිට නින්දා කළ යුතුයි.

අනන්ත සංසාරේ අම්මලා, තාත්තලා ඕන තරම් ලැබිලා ඇති. ගෙවල් දොරවල් ඕන තරම් ලැබිලා ඇති. මහා ජල සාගරයක එක ජල බිංදුවක් විතරයි මේ එක ජීවිතයක තියෙන සිද්ධිය. කෙළවරක් නැහැ මේ සසර. ඒ හින්දා තම තමන් තම තමන්ට පිහිටක් පිළිසරණක් කර ගන්න.

~ කළ හැකි ඉහළ ම සත්පුරුෂකම ~

මනුස්සයෙක් හැටියට ඉපදිලා කරන්න පුළුවන් නම් ලොකු ම සත්පුරුෂකම තමයි තමනුත් ඇස් දෙක පාදගෙන, එක දහම් වචනයක් හෝ කියලා දීලා තව එක් කෙනෙක්ව හෝ මේ සසරෙන් ගොඩ දාන්න උත්සාහවත්වන එක. අතිශය දුක් සහගත අඬ අඬා එහාට මෙහාට ගහගෙන යන මේ සංසාර සාගරයෙන් එක මනුස්සයෙක් හරි සද්ධර්මය නැමැති පොළොව මතට ගන්න කටයුතු කරන්න පුළුවන් නම් ඒක තමයි පුතේ, සත්පුරුෂකමෙනුත් උතුම් ම සත්පුරුෂකම.

~ පුද්ගලයෝ හතරදෙනා ~

සත්පුරුෂයා, සත්පුරුෂතර, අසත්පුරුෂයා, අසත්පුරුෂතර කියලා පුද්ගලයෝ හතර දෙනෙක් ඉන්නවා.[148] යම්කිසි කෙනෙක් තමන් නොයෙක් අකුසල කර්ම කර ගෙන දුගතියට යන්න කටයුතු කර ගන්නවා නම් එයාට කියනවා 'අසත්පුරුෂයා' කියලා. තමනුත් අකුසල කර්ම කරමින් අනෙක් අයවත් ඒ අකුසල කර්මවල යොදවන කෙනාට කියනවා 'අසත්පුරුෂතර' කියලා. 'අසත්පුරුෂතර' කියන්නේ අසත්පුරුෂයාටත් වැඩි අසත්පුරුෂයා කියන එක.

යම්කිසි කෙනෙක් තමන් ධර්මයක හැසිරිලා, සුචරිතයේ හැසිරෙනවා නම් එයාට කියනවා 'සත්පුරුෂයා' කියලා. තමනුත් ධර්මයේ හැසිරෙමින් තව අයවත් සුචරිතයේ හැසිරෙන්න උගන්වනවා නම් එයාට කියනවා 'සත්පුරුෂතර' කියලා. ඒ කියන්නේ සත්පුරුෂයාටත් වැඩි සත්පුරුෂයා කියලා. ඉතින් අපිට පුළුවන් නම් 'සත්පුරුෂතර' වෙන්න ඒක හරි වටිනවා.

~ වීර්‍යය හා අප්‍රමාදය ~

අර එක රහතන් වහන්සේ නමක් කියන්නේ; **"සීත, උෂ්ණ, බඩගින්න, පිපාසය කියන ඒවා තණපතක් තරම්වත් ගණන් ගන්න එපා කියලා".**[149] ඊට වඩා අනන්ත දුක් විඳලා තියෙයි අපි මේ සසරේ ඉන්න කොට. ඒ හින්දා මේ චුට්ටක් නිදිමතක් හැදුනහම හුරතලේට නිදාගන්න එපා. හුරතල් කරන්න එපා තමන්ව. කෑලි කැඩිලා යනකන් අප්‍රමාදී ව වීර්‍යය කරන්න. එහෙම කළොත් තමයි සසර ගෙවා ගන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා; **"මහණෙනි, හීන වූ වීර්‍යයකින් මහත් වූ අර්ථයක් ලබන්න බැහැ. හීන වූ වීර්‍යයකින් ලබන්න**

---

148 https://tipitaka.lk/an-4-5-1-2/sinh - **දෙවන සප්පුරිස සූත්‍රය- සප්පුරිස වර්ගය- චතුක්ක නිපාතය- අඞ්ගුත්තර නිකාය 2- 417 පිටුව**

149 https://tipitaka.lk/kn-thag-3-5/sinh - **මාතඞ්ගපුත්ත ස්ථවිරගාථා- තික නිපාතය- ථෙරගාථාපාළි- බුද්දක නිකාය- 85 පිටුව**

පුළුවන් හීන වූ දෙයක් ම තමයි. මහත් වූ අර්ථයක් ලබන්න නම් මහත් ම වූ වීර්යයක් ඕනේ" [150] කියලා.

මේ මොහොතක් මොහොතක් ගානේ ගෙවෙන්නේ බුද්ධෝත්පාද කාලය, මනුස්ස ජීවිතය, සද්ධර්මය අවබෝධ කර ගන්න තියෙන වටපිටාව. හොඳට මතක තියාගන්න රැයක් ගෙවිලා, රැයක් එළිවෙනවා කියලා කියන්නේ මනුස්ස ජීවිතයෙන් ටිකක් අතහැරුණා. ක්ෂණ සම්පත්තියයි මේ ගෙවෙන්නේ.

"අජ්ජේව කිච්චං ආතපපං කො ජඤ්ඤා මරණං සුවෙ" [151] - අද ම වීර්යය කළ යුතුයි. කවුද දන්නේ හෙට මැරෙයි ද කියලා. ඕගොල්ලොන්ට Warranty එකක් තියෙනවා ද ජීවිතයේ මෙන්න මේ කාලේ වෙනකන් ඉන්න පුළුවන් මෙතැනින් පස්සේ තමයි මැරෙන්නේ කියලා? නැහැ.

ඒ හින්දා ඔයිට වඩා නම් වීර්යය කරන්න ඕනේ පුතේ. ඕගොල්ලෝ කෙලෙස්වල බර, කෙලෙස්වල ස්වභාවය දන්නේ නැහැ. මේ භවය කියන එක ලෙහෙසියකට හොල්ලන්න පුළුවන් දෙයක් නෙමෙයි. පොළොව උගුල්ලලා දානවා කියන එක ලෙහෙසි දෙයක් නම් නෙමෙයි. ඒ නිසා කට්ටිය එකට එකතුවෙලා හොඳ වීර්යයක් කරන්න වෙනවා. කෙලෙස්වල නම් ටික බලන්නකෝ. ඕඝ, යෝග, ග්‍රන්ථ, නීවරණ.

ඕඝ

ඕඝය කියලා කියන්නේ සැඩපහරක් කියන එක. විශාල ගහගෙන එන සැඩපහරකට වැටුණොත්, ඒ මිනිහට ඒකෙන් ගොඩට එන්න ඕනෙකම තියෙනවා. ගහගෙන යන්න කැමති ද කවුරුවත් සැඩපහරේ? නැහැ, නමුත් ගොඩයන්න බැහැ.

---

150 https://tipitaka.lk/sn-2-1-3-2/sinh - **දෙවැනි දසබල සූත්‍රය- දසබල වර්ගය- අභිසමය සංයුක්තය- සංයුක්ත නිකාය 02- 47 පිටුව**

151 https://tipitaka.lk/mn-3-4-2/sinh - **ආනන්ද භද්දේකරත්ත සූත්‍රය- විභඞ්ග වර්ගය- මජ්ඣිම නිකාය- 404 පිටුව**

චතුරට වැටිලා තියෙන යමක් අල්ලන්න හැදුවත්, එල්ලෙන්න හැදුවත් ඒවත් එක්ක ම කඩාගෙන ගහගෙන අපි පහළට යනවා. අපිට නතර වෙන්න ඕනෙකම තිබුණාත් ගහගෙන යනවා. සැඩපහරට නමක් තමයි ඕඝය කියලා කියන්නේ. ඒ සැඩපහර වගේ කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝ කියලා කියන්නේ.

අපිට කාම වස්තු පැත්තට යන්න වුවමනාවක් නැතුව හොඳට සති නිමිත්තේ හිත තියාගෙන කය කෙරෙහි සිහිය පිහිටුවාගෙන ඉන්න ඕනෙකම තියෙන්නේ. නමුත් එහෙම ඉන්න ඕනෙකම තිබ්බට ඉන්න බැහැ. කාම වස්තු පැත්තට ම අපේ මනස ගහගෙන යන එකට තමයි **'කාම ඕඝ'** කියලා කියන්නේ.

හොඳට කය කෙරෙහි සිහිය තියාගෙන ඉන්න හැදුවට ඉන්න දෙන්නේ ම නැහැ, **'භව ඕඝ'** කියන්නේ භවයට ම ගහගෙන යනවා. අරහේ යන්න මෙහෙ යන්න, අතන තියෙනවා, මෙතන තියෙනවා කියලා බාහිරයට ම ගහගෙන යනවා අපේ මනස.

අපි හොඳට සිහියෙන් ඉන්න හැදුවට පුද්ගලයෝ ඉන්නවා, සත්ත්වයෝ ඉන්නවා කියලා සක්කාය දිට්ඨිය ආදී මිථ්‍යා දිට්ඨි පැත්තට ම ගහගෙන යන එකට කියනවා **'දිට්ඨි ඕඝ'** කියලා. **'අවිජ්ජා ඕඝ'** කියන්නේ චතුරාර්ය සත්‍යය නොදන්නාකම පැත්තට ම ගහගෙන ම යනවා.

හොඳට සති නිමිත්තේ හිත තියාගෙන කය කෙරෙහි සිහිය පිහිටුවාගෙන විරාග මනසකින් ඉන්න අපිට දෙන්නේ නැතුව ලෝකය ඇතුළේ කාමය ඇසුරු කළ, භවය ඇසුරු කළ, දිට්ඨිය ඇසුරු කළ, අවිද්‍යාව ඇසුරු කළ හුරුව පැත්තට ම අපේ මනස ගහගෙන යන එකට තමයි 'ඕඝ' කියලා කියන්නේ.

ඉතින් මොන තරම් වීර්යයක් තියෙන්න ඕනෙද කියලා හිතන්න කෙලෙස් සැඩපහරින් කෙනෙකුට එතෙර වෙන්න නම්. හීන වීර්යයක් තියෙන කෙනෙකුට පුළුවන් ද? බැහැ.

<u>යෝග</u>

'යෝග' කියන්නේ යොදවනවා. කාම යෝග, භව යෝග, දිට්ඨි යෝග, අවිද්‍යා යෝග කියලා යෝග හතරක් තියෙනවා.

'කාම යෝග' - ඕගොල්ලොන්ව නිතර ම කාමයේ ම යොදවනකමයි 'කාම යෝග' කියලා කියන්නේ. ඒ කියන්නේ ගෙදර ගැන ම හිතනවා, දරුවෝ ගැන ම හිතනවා, ඉඩකඩම් ගැන ම හිතනවා, මුදල් ගැන ම හිතනවා, රස්සාවල් ගැන ම හිතනවා, ජීවිතය ගැන ම හිතන එකට තමයි 'කාම යෝග' කියන්නේ.

'භව යෝග' - අරහෙට යන්න ඕනේ, මෙහෙට යන්න ඕනේ, දෙවියෙක් වෙන්න ඕනේ, මනුස්සයෙක් වෙන්න ඕනේ, බ්‍රහ්මයෙක් වෙන්න ඕනේ කියලා ඒවා ගැන ම අපේ මනස හිතවන එකට තමයි 'භව යෝග' කියන්නේ.

'දිට්ඨි යෝග' - පුද්ගලයෝ ඉන්නවා, සත්ත්වයෝ ඉන්නවා කියලා ඉන්න පුද්ගලයෝ සත්ත්වයෝ ගැන ම හිතවන්න යොදවනවා අපේ මනස. ඒකට තමයි 'දිට්ඨි යෝග' කියලා කියන්නේ.

'අවිද්‍යා යෝග' - චතුරාර්ය සත්‍යය නොදන්නාකම පැත්තේ ම යොදවනවා. ඒකට තමයි 'අවිද්‍යා යෝග' කියලා කියන්නේ.

ඕඝ, යෝග වගේ ම ග්‍රන්ථ, නීවරණ, පරාමාස, ආස්‍රව කියලා ඕගොල්ලොන්ට ප්‍රතිපක්ෂව ඉන්න ගති ගොඩකුත් තියෙනවා.

~ අන්ධ ලෝකයා ~

"අන්ධභූතෝ අයං ලොකෝ තනුකෙත්ථ විපස්සති.
සකුනෙතා ජාලමුත්තෙතා'ව අප්පෝ සග්ගාය ගච්ඡති" [152]

152 https://tipitaka.lk/kn-dhp-13 - **ලෝක වර්ගය- ධම්මපදපාළි- ඛුද්දක නිකාය- 68 පිටුව**

ඒකයි, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, මේ ලෝකයා ඇත්ත ඇති හැටිය නොදැකීමෙන් අන්ධයි. ඕඝ, යෝග, ග්‍රන්ථ කියන්නේ මේවා නේද. මේවා භවයට ගහගෙන යන ගති කියලා දකින්නේ නැහැ. ධර්මය නැති කෙනාට හිතෙන්නේ ඒක සාමාන්‍ය දෙයක් නේ ඉතින් කියලා. නමුත් ඒක තමයි මෙතන තියෙන ප්‍රශ්නය.

දක්ෂ කොට වියන ලද වටුවැද්දෙක්ගේ දැලෙන් බේරිලා යන්නේ කලාතුරකින් වටුකුරුල්ලෙක්. අනික් ඔක්කොම වටුවැද්දාට අහුවෙනවා. එච්චර හොඳට දැල වියලා තියෙනවා. අන්න ඒ වගේ මාරයා විසින් මවන ලද පංච කාමය නැමැති දැලෙන් මහණොනි, මිදිලා යන්නේ බොහොම කලාතුරකින් කෙනෙක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අනික් ඔක්කොම පංච කාමය නැමැති දැලේ බැඳිලා ඉන්නේ. ඒ නිසා එතෙර වෙන්න බැහැ. හොඳට සිහි ඇතුව තේරුම් ගන්නට ඕනේ අද දවසේ දී අපි දරන උත්සාහය හරියට විහිළුවක් වගේ. ඒ නිසා පුතේ, ඔයිට වඩා නම් උත්සාහවත් වෙන්න ඕනේ.

වර්තමානයේ තියෙන ඇතැම් භාවනා ක්‍රම වගේ මේ සාසනයේ එහෙම කොටු කරලා භාවනා කරවන ක්‍රමයක් නැහැ. සමහරවිට මම ඉඳගෙන භාවනා කරන්න කියලා ඕගොල්ලො ඔක්කොටම කියනවා. නමුත් ඒ අවස්ථාවේ දී ඕගොල්ලො අතරින් කෙනෙක්ට ඉඳගෙන ඉන්න ඉරියව්වේ ඉන්න කොට හිත වැඩෙන්නේ නැති වෙන්න පුළුවන්.

නමුත් ඒ වෙලාවට එයාට සක්මන් කරන ඉරියව්වේ හෝ හිටගෙන ඉන්න ඉරියව්වේ හොඳට සති නිමිත්තේ හිත තියාගෙන යෝනිසෝ මනසිකාරය කළ හැකි කියලා හිතන්නකෝ. නමුත් මම පනවනවා මේ වෙලාවේ දී නම් ඉඳගෙන විතරයි භාවනා කරන්න ඕනේ කියලා, එතකොට ඒ හින්දා එයාගේ හිත වැඩෙන්නේ නැහැ.

ඒ වගේ ඊට පස්සේ මම කියනවා, හරි දැන් කට්ටිය සක්මන් භාවනාව කරන්න කියලා. හැබැයි ඒ වෙලාවේ දී ඉඳගෙන ඉන්න ඉරියව්වේ භාවනා කරමින් ඉන්න කෙනාට හොඳ සමාධියක් වැඩිගෙන එන වෙලාවක්

වෙන්න පුළුවන්. ඉතින් ඒක නවත්තලා සක්මන් භාවනාව පටන් ගත්තොත් ඒත් හිත වැඩෙන්නේ නැති වෙන්න පුළුවන්.

ඉතින් මේ සාසනේ තියෙන්නේ හොඳට කරුණු කාරණා කියලා දුන්නහම, තමන් තේරුම් ගන්න ඕනේ නීවරණ බල බලා රහින්න. නිදිමත ගතියක් එනවා නම් මට ඒ නිසා ඉඳගෙන ඉන්න ඉරියව්ව සුදුසු නැහැ. මම ඒ නිසා ටක්ගාලා නැගිටලා සක්මන් හෝ හිටගෙන භාවනා කරන්න ඕනේ කියලා තමන්ව බේරගන්න තමන් දක්ෂ වෙන්න ඕන.

මට පුළුවන් ඔක්කොමලා එකතු කර ගෙන වීර්යය කරවන්න උත්සාහවත් වෙන්න යොමු කරවන්න. නමුත් මේ වෙලාවේ දී මම ළඟ නැති වුණාට කමක් නැහැ ඔබ වහන්සේලා උත්සාහයක් අරගෙන කට්ටිය එකට එකතු වෙලා අපි මෙහෙම කරමු කියලා කට්ටිය කතා වෙලා වීර්යය කරන්න.

මම එන්නම් තව මාස එකහමාරකින් දෙකකින් ආයේ. එතකොට මාත් එක්ක ම කට්ටිය වීර්යය කරමු. මං ඉස්සර කට්ටියත් එක්ක එකට භාවනා කරන කාලයේ දී කට්ටියට නිදිමත හැදුනහම ඔක්කොම එක තැනකට ගෙනල්ලා සූත්‍රයක් කියලා දීලා වීර්යය ඇති කරවලා ආයේ යනවා භාවනා කරන්න. ඔහොම රෑ එළිවෙනකන් තියා ගන්නවා මම ඉන්න කොට.

ඉතින් ඕගොල්ලොත් පුතේ, පොඩි දරුවෝ නෙමෙයි. හැම පැත්තක් ම මම කියලා දීලා තියෙනවා. ඕගොල්ලෝ වීර්යය කර ගන්න කටයුතු කරන්න. මම ආයේ එන්නම් ටික දවසකින්. මමත් ඔහෙ තනියම ඉන්නවා නෙමෙයි. මම මේ හොයාගන්න එකකින් නේ අපි හැමෝම යැපෙන්නේ. මම එදා කිවුවා වගේ, මේ ඔක්කොමලා එක මිටට හිටියා නම් මේ දර්ශනය නිසා හරි වෙනදාටත් වඩා ඉක්මනින් සසර ගෙවෙනවා.

~ පටිච්චසමුප්පාද න්‍යායයෙන් කියවෙන දේ ~

“ඇවැත්නි, මම ලෝකයත්, ලෝකයේ ඇතිවීමත්, ලෝකයේ නැතිවීමත්, ලෝකය නැති කරන මඟත් සංඥා සහිත මනස සහිත බඹයක් පමණ ශරීරයෙන් පනවමි” කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

සීමා නොකරන ලද මනසක් ඇතුව උප්පත්ති වශයෙන් ආපු අපි, චතුරාර්ය සත්‍යය නොදන්නා අවිද්‍යාවෙන් ලෝකය හදාගත්ත හැටි තමයි පටිච්චසමුප්පාදයෙන් පෙන්නන්නේ. නැත්නම් අපිට හිතෙන්නේ තියෙන ලෝකෙට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. ඉතින් අපිට ඒ ලෝකෙට මුකුත් කරන්න බැහැ නේ කියන තැනකින් හිතෙන හින්දා තමයි, ලෝකය හදාගත්ත හැටි බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදයෙන් පෙන්වන්නේ,

“අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති” [153] කියලා ලෝකයත්, ලෝකයේ ඇතිවීමත් පටිච්චසමුප්පාද න්‍යාය හරහා පෙන්වනවා.

අවිද්‍යාව නැති වුණොත් සංඛාරය නැහැ, සංඛාරය නැති වුණොත් විඤ්ඤාණය නැහැ. විඤ්ඤාණය නැති වුණොත් නාමරූප නැහැ. නාමරූප නැති වුණොත් ආයතන හය නැහැ. ආයතන හය නැත්නම් ස්පර්ශය නැහැ. ස්පර්ශය නැත්නම් වේදනාව නැහැ. වේදනාව නැත්නම් තණ්හාව නැහැ. තණ්හාව නැත්නම් උපාදානය නැහැ. උපාදානය නැත්නම් භවය (ලෝකය) නැහැ. භවය නැත්නම් ජාති ජරා මරණ ආදී ලෝකේ ඇතුළේ තියෙන සියළු දුක නැති වෙනවා කියලා ලෝක නිරෝධයට, දුක්ඛ නිරෝධයට පෙන්වනවා.

එහෙම පෙන්නුවහම එයාට තේරෙනවා, ලෝකය කියන්නේ චතුරාර්ය සත්‍යය නොදන්නාකම නිසා හදාගත්ත එකක් මිසක උප්පත්ති වශයෙන්

153 https://tipitaka.lk/sn-3-1-2-4-8 - **ජන්න සූත්‍රය- රේර වර්ගය- බඹ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 230 පිටුව**

තියෙන ලෝකයකට ඇවිල්ලා කාලකණ්ණිකමෙන් ජීවත්වෙන එකක් නෙමෙයි කියලා. උප්පත්ති වශයෙන් ආවේ සීමා නොකරන ලද මනසක් ඇතුව. නමුත් චතුරාර්ය සත්‍යය නොදන්නා අවිද්‍යාව නිසා ලෝකය ඊට පස්සේ හැදුණ එකක් නිසා ඒ ලෝකය ගෙවාගන්න, ලෝකයෙන් අයින්වෙන්න පුළුවන් නේ කියන දැක්මක් එනවා එයාට.

ඒ දර්ශනය දන්නේ නැති වුණොත් අපි හිතාගෙන ඉන්නේ ගෙවල්, දොරවල්, යානවාහන, ඉඩකඩම්, මිල මුදල් තියෙන, මිනිස්සු ඉන්න ලෝකෙට තමයි උප්පත්ති වශයෙන් ආවේ. ඔය ලෝකේ තමයි අපිට ඉන්න වෙන්නේ. ඒ නිසා ඒ ලෝකය නැති කරන්න මොකුත් කරන්න බැහැ නේ කියලා වගේ.

නමුත් පටිච්චසමුප්පාද න්‍යායෙන් පෙන්වනවා අම්මා, තාත්තා, ගෙවල් දොරවල්, යානවාහන, මිනිස්සු ඉන්න මේ ලෝකය කියන එක හැදිච්ච හැටි. එතකොට පෙන්වනවා අපි උප්පත්ති වශයෙන් ආපු තැන සීමා නොකරන ලද මට්ටමේ මනසක් තිබුණේ. අපිට චතුරාර්ය සත්‍යය අවබෝධ නොවුණුකම නිසා පටිච්චසමුප්පාදය ඔස්සේ පෙන්වනවා මෙහෙමයි ලෝකය හැදුණේ කියලා.

චතුරාර්ය සත්‍යය නොදන්නා වූ අවිද්‍යාව නොවුණේ නම් කියලා ලෝක නිරෝධයට පෙන්වන කොට ලෝකය නැති වෙනවා කියලා කිවුවහම අපිට තේරෙනවා, ඇත්තට ම ලෝකය තියෙනවා කියලා අපිට හැඟුනට ලෝකය ගෙවන්න පුළුවන් එකක්, ලෝකය නැති කරන්න පුළුවන් එකක් ය කියලා.

උප්පත්ති වශයන් එන කොට ලෝකයක් තිබිලා නැහැ. මෙන්න මේ වගේ වැරැද්දට යි ලෝකය හැදිලා තියෙන්නේ, ඒ වැරැද්ද නැති වුණොත් ලෝකය නැති වෙනවා කිවුවහම, ඊට පස්සේ එහෙනම් මොකද කරන්න ඕනේ? මෙච්චර කල් ලෝකේ ඇතුළේ සක්මන් කළ හුරු ටික (ආස්‍රව) ගෙවන්න ඕනේ.

ඒ සක්මන් කරන හුරු ටික ගෙවෙන්න නම් ලෝකේ මෙහෙම නේද හැදුණේ, මෙහෙම නොවුණේ නම් ලෝකය නැති වෙනවා නේද කියලා පංච උපාදානස්කන්ධයේ උදය වැය බලන කොට ලෝකය නියත වශයෙන් පිහිටලා තියෙන එකක් ය කියන ගතිය අතහැරෙනවා අපිට. අපි පටිච්චසමුප්පාදය

දන්නේ නැතිනම් අපිට ලෝකය කියන එක නියත වශයෙන් පිහිටලා තියෙන එකක් ය කියන ගතියක් නේ තියෙන්නේ. ඒ ලෝකය නැති කරන්න අපිට මොකුත් කරන්න බැහැ කියලා නේ එතකොට හිතෙන්නේ.

පටිච්චසමුප්පාද සිද්ධිය කෙටි කරලා තමයි පංච උපාදානස්කන්ධයේ උදය වැය කියන එක තියෙන්නේ. අවිද්‍යා කර්මයෙන් නිමිත්තක් හදාගත්තා, ඊට පස්සේ ඒකට තණ්හා, උපාදාන වශයෙන් හැසිරුණු හින්දයි ලෝකය හැදුණේ කියලා පටිච්චසමුප්පාදයේ මුලිනුයි, මැදිනුයි, අගිනුයි අංග ටිකක් මේ පෙන්වන්නේ පංච උපාදානස්කන්ධයේ උදය වැය කියන කොට.

එහෙම පංච උපාදානස්කන්ධයේ උදය වැය දිගින් දිගට ම බලන කොට ලෝකය නියත වශයෙන් තියෙන එකක් ය කියලා ඇසුරු කරපු හුරුව ගෙවෙනවා. ඉන්න කෙනෙක් ඇසුරු කළ හුරුව ගෙවෙනවා ටික ටික. ආස්‍රව ක්ෂය යි කියන්නේ ලෝකය දියවෙලා, ආයේ ඉපදෙන්න භවයක් නැහැ. ආයේ තමන්ගේ නිවසට ආවා වගේ උප්පත්ති වශයෙන් ආපු සීමා නොකරන ලද මනසට ඇවිත් ඉන්නවා, කළ කිස ඇතිව.

ඒ හින්දා ඔතනට කියනවා සෝපාදිසේස නිබ්බාන. ස්කන්ධ ඉතිරියක් සහිතව නිවන් දැකලා, අජරාමර යි. ජරා මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස කියන සියළු දුක් නිරුද්ධ කරලා, ලෝකයෙන් එතෙර වෙලා (ලෝකෝත්තර යි).

ඊට පස්සේ එතන ඉන්න කොට පුරාණ කර්මයට හටගත්ත විපාක ටිකේ යම් ආයු සන්තතියක් තියේ නම් ඒකත් නැතිවෙලා යන දවසක් එනවා. කල් ඇතුව ම නව කර්ම භවය නසලා හින්දා නැවත භවයකට නොඇලුණු සිතින් ඒ ධීරයන් වහන්සේ පහනක් නිවිලා යනවා වගේ නිවෙනවා කියන සිද්ධියක් තියෙන්නේ.

පටිච්චසමුප්පාදයෙන් පෙන්වන සිද්ධිය වෙන මොකුත් ම නෙමෙයි. උඹලට හම්බවෙන ලෝකෙට උප්පත්ති වශයෙන් ආවා නෙමෙයි කියන එක කියන්නේ. උඹලට අයින් කරන්න බැරි පොළොවක (ලෝකයක) උපන්නා නෙමෙයි. සීමා නොකරන ලද මනසක් ඇතුව ශූන්‍යතාවයක් තියෙන තැනකට

උප්පත්ති වශයෙන් ආවේ. චතුරාර්ය සත්‍යය නොදන්නාකම නම් වැරැද්දෙනුයි උඹලා ලෝකය හදාගත්තේ කියන කොට ම, ඒ වැරැද්ද නොවුණා නම් අද ලෝකය කියලා එකක් නැහැ නේද, අද ඒ වැරැද්ද අයින් කළොත් ලෝකය අයින් කරන්න පුළුවන් එකක් ය කියන දැක්ම එනවා.

ඊට පස්සේ, තියෙන ලෝකෙක ජීවත් වෙච්ච හුරුව අයින් කරනවා පංච උපාදානස්කන්ධයේ උදය වැය බලමින්. ලෝකය කියන එක අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හදාගත්ත එකක්, අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර නොවුණේ නම් ලෝකය හැදෙන්නේ නැහැ නේද කියලා බල බලා තියෙන ලෝකයක ජීවත් වුණා කියන හුරුව ගෙවනවා.

තව විදිහකින් කිව්වොත් ඉන්න අයව ඇසුරු කරපු, තියෙන දෙයක් ඇසුරු කරපු හුරුව ගෙවනවා. බොහෝ කල් සිට පැවත එන ඒ කෙලෙස් හුරුව (ආස්‍රව) ගෙවෙන කොට ලෝකය කියලා යමක් ඉතුරු වෙන්නේ නැහැ. අයිස් කැටයක් අරගෙන අව්වේ තිබ්බහම දියවෙනවා වගේ ලෝකෝත්තර සම්මාදිට්ඨිය නැමැති උණුසුමට ලෝකය දිය වෙනවා. ලෝකෝත්තර සම්මාදිට්ඨිය නැති තාක් ලෝකය දිය කරන්න බැහැ ලෝකය ඇසුරු කරපු හුරු බලවත් නිසා. ඒ ආස්‍රව ධර්මයන් පැත්තට ම අපේ මනස ගහගෙන යනවා.

ඒ හින්දා අපි ගොඩක් උපායශීලි වෙන්න ඕනේ. විටෙක වීර්යයට හිතන්න ඕනේ. තව විටෙක සමාධි නිමිත්ත ඇසුරු කරන්න වෙනවා. තවත් විටෙක සිහිය පිහිටුවන්න වෙනවා. විටෙක නුවණින් මෙනෙහි කරන්න වෙනවා. ඔය වගේ හාත්පසක උපායශීලිකමකින් තමන් විසින් මාර්ගය වඩන්න වෙනවා.

~ වීර්‍ය ඇතිවීම පිණිස මෙනෙහි කළ යුතු කරුණු ~

උදාහරණයක් ගත්තොත්; නුවණත් තියෙනවා, දහමත් තේරෙනවා. ඒත් දැන් උත්සාහවත්වන ගතිය මගේ ළඟ නැහැ නේ. එහෙනම් මම වීර්‍ය

සම්බොජ්ඣඞ්ගය වඩන්න ඕනේ. තමාව උත්සාහවත්වන විදිහට වීර්යයට මෙනෙහි කළ යුතුයි නේද කියලා තමන් හිතට අල්ලලා දෙන්න ඕනේ.

"ජාති ජරා ව්‍යාධි චුති අපායා,
අතීත අපපතතක වටට දුකඛං,
ඉදානි ආහාර ගවෙටඨී දුකඛං,
සංවෙග වත්‍ථූනි ඉමානි අටඨ"

ජාති

භවය තිබුණොත් මේ මේ වගේ තැන්වල ඉපදෙන්න පුළුවන්. එහෙම ඉපදෙන්න තියෙන හේතුව මම නැති කරලා නැහැ නේද තවම කියලා හිතනවා.

ජරා

උපදින ඕනෑම තැනක කෙස් පැහෙන්න පුළුවන්, හම රැළි වැටෙන්න පුළුවන්, අතපය වලංගු නැතිවෙන, ඇස් පෙනෙන්නේ නැතිවෙන, තමන්ගේ ම මළ මුත්‍ර ගොඩේ වැටිලා ජීවත් වෙන්න වෙන විදිහේ පැවැත්ම මම තවම අයින් කරලා නැහැ නේද කියලා හිතනවා.

ව්‍යාධි

මේ ලෝකේ මොන මොන විදිහේ රෝග ප්‍රභේද තියේද, ඒ ඕනෑම රෝගයක් හැදෙන්න තියෙන හේතුව ඔඩොක්කුවේ තියාගෙන නේද මම මේ ඉන්නේ. හෙට මට මේ ලෙඩේ හැදෙන්නේ නැහැ කියන්න සහතිකයක් නැහැ. එබඳු පැවැත්ම මම ඉක්මවලා නැහැ නේද කියලා මෙනෙහි කරනවා.

මරණ

මෙච්චර අද හොඳට ජීවත් වුණාත් හෙටවෙන කොට මැරෙන්න පුළුවන් නේද කියලා හිතනවා.

අපාය

අපායේ ඉපදෙන්න තියෙන හේතුව තවම මම නැති කරලා නැහැ නේද කියලා හිතනවා.

අතීත දුක්

අතීතයේ මොන තරම් දුක් විඳලා ඇද්ද, **"මවු මළ දුකට පමණක් අඬපු කඳුළු සතර මහා සාගරයේ ජලයට වඩා වැඩි"** [154] කියලා නේද භාග්‍යවතුන් වහන්සේ දේශනා කළේ කියලා හිතනවා.

අප්පත්තක (අනාගත) දුක්

සසරේ හිටියොත්, ඉදිරියේදී මොන මොන දුක් කරදර එයි ද කියලා හිතනවා.

මේ ජීවිතයේ ආහාර සෙවීමේ දුක

දැන් මේ ජීවිතයේ ආහාර ටික හොයාගන්න මොන තරම් දුක් විඳින්න වෙනවා ද කියලා හිතනවා. පැවිද්දාට ඒ දුක අඩුයි. නමුත් ගිහි කෙනෙක්ට ලෙහෙසි නැහැ. සීතලෙන්, වැස්සෙන්, අව්වෙන්, පින්නෙන්, මැසි මදුරුවන්ගෙන් පීඩා විඳගෙන, නින්දා, අපහාස, ඇනුම් බැනුම් අහගෙන බඩවියත පෝෂණය කර ගන්න යමක් හොයාගන්න රස්සාවල් කරන්න වෙනවා. සංවේගය ඇති කර ගත යුතු මේ කාරණා අට ගැන හිතනවා. හිතලා තමන්ව උද්‍යෝගී කරවනවා. අපි තව කෙනෙක්ව උද්‍යෝගී කරවනවා වගේ තමන් තමන්ව ම උද්‍යෝගිමත් කරන්න ඕනේ.

"පාතෝ ච සායමපි වෙව ඉමං විධිඤ්ඤු
ආසෙවතෙ සතතමතථ හිතාභිලාසී
පපෙපානි සොති විපුලං හතපාරිපන්ථො
මොකඛං සුඛං මුනිවිසටඨමතං සුඛෙනවා"ති"

154 https://tipitaka.lk/sn-2-3-1-3/sinh - **අස්සු සූත්‍රය- තිණකට්ඨ වර්ගය- අනමතග්ග සංයුක්තය- සංයුත්ත නිකාය 2- 279 පිටුව**

හොඳ නුවණැති පුරුෂයෙක් උදේ හවස මේ කරුණු ටික සිහි කරනවා නම් එයා කෙලෙස් සතුරු මාර්ගයෙන් අයින්වෙලා ධර්මයට ඇවිල්ලා මහා සැපයකට පත්වෙනවා කියලා පෙන්වනවා.

වීර්‍යවත් කළාට පස්සේ හිතේ විසිරුණු ගතිය වැඩි වෙච්ච ගතියක් එන්න පුළුවන්. එහෙනම් සමථය අඩුයි. ඔන්න ඒ වෙලාවට සමථ නිමිත්ත ආසේවනය කරනවා. දැන් ඒ නිසා හිතත් වැඩෙනවා. ඇතැම් වෙලාවල්වලට නිමිති පැත්තට හිත ගහගෙන යන්න බලනවා. ඒ කියන්නේ යෝනිසෝ මනසිකාරය නැහැ දැන්. එහෙනම් ස්කන්ධයන්ගේ උදය වැය බැලිය යුතුයි.

දැන් ඔය ටික ඔක්කොම කරනවා. ඒ වුණාට අලුතෙන් අලුතෙන් නිමිති එකතු වෙනවා. ඒ කියන්නේ ඉන්ද්‍රිය සංවරය නැහැ. ඒ නිසා ඉන්ද්‍රිය සංවරය හදාගන්න ඕනේ. ඔය ටික කරන කොට කන්න දේවල්, බොන්න දේවල් ගැන හිතෙනවා. ඒ හින්දා භෝජනයේ පමණ දැනගෙන හික්මෙනවා. මේ වගේ හාත්පසක වටලලා අරන් තමයි තමන්ගේ හිත හදාගන්න ඕනේ.

වර්තමාන ක්‍රමයට භාවනා කමටහන් දෙනවා වගේ තැනක් නෙමෙයි තියෙන්නේ, හාත්පසක වට කරලා අරන් තම තමන් තම තමන්ගේ ඇද තැන රැහැගන්න වෙනවා. වඩුවෙක් මෝල් ගහක් හෝ වංගෙඩියක් හෝ හදන කොට යම් ඇද තැනක් තිබ්බොත් ටික ටික රැහැ රැහැ බලනවා නේ. තව ඇද තැනක් තිබ්බොත් ආයේ ඒ ටික රහිනවා. ආයෙත් බලනවා ඇද තැන් තියෙනවා ද කියලා. ඇද තැන් තිබ්බොත් ආයෙත් රැහැ රැහැ බලනවා වගේ ඒ ඒ කෙලෙස් රැහැ රැහැ තමයි අපේ හිත සෘජු කර ගන්න වෙන්නේ.

තුණුරුවන්ගේ සරණින් මේ හැමෝටම පින තියෙනවා. ඔය කිවුව විදිහට අපි කටයුතු කරන කොට, ***"විමුත්ති පරිපාචනීය ධම්ම"*** [155]- විමුක්තිය පිණිස මනස මුහුකුරනවා ටික ටික. අපි උදාහරණයක් ගත්තොත්; මේ මොහොතේ දීත් අපේ රූපය වෙනස් වෙනවා. අපිට ඒක පේනවා ද? නැහැ. හැබැයි අපේ මීට අවුරුදු විසිපහකට තිහකට කලින් ගත්ත ෆොටෝ එකකුයි දැන් ගන්න ෆොටෝ එකකුයි සසඳලා බැලුවොත් ලොකු වෙනසක් පෙනෙයි.

---

155 https://tipitaka.lk/an-5-3-4-4/sinh - **බත්තියරාජ සූත්‍රය- රාජ වර්ගය- පඤ්චකනිපාතය- අඞ්ගුත්තර නිකාය 3- 249 පිටුව**

හැබැයි එතන ඉඳලා මේ තැන දක්වා ක්‍රමයෙන් විපරිණාම බව වෙවී ආවාට, මොහොතක් මොහොතක් පාසා රූපයේ සිද්ධවන විපරිණාම බව අපිට පෙනුණේ නැහැ නේ, කාලයක් ගියහමනේ අපිට ඒක පෙනුණේ.

ඒ වගේ නුවණත් ඔය විදිහට ම වැඩෙනවා. දැනුත් නුවණ වැඩෙනවා කියලා පේන්නේ නැහැ. හැබැයි කාලයක් ගියහම අපිට ම පෙනෙනවා අපේ නුවණ වැඩිලා කියලා. ඒකට පරාසයක් තියෙනවා. සමහරවිට ඒක අවුරුද්දක් දෙකක් ගිහින් වෙන්න පුළුවන්. එදා මට නොතේරුනත් අනේ අද මට මේ ඔක්කොම තේරෙනවා, මගේ මේ මේ කෙලෙස් ගති දැන් නැහැ නේද කියලා තේරෙනවා. ඒ හින්දා ඔහොම කර ගෙන යං. මම කියලා දුන්නා වගේ පීවිතයේ ඇඳ තැන් බල බල රහින්න වෙනවා.

~ මේඝිය සූත්‍රය[156] ~

ඔන්න දැන් මේඝිය සුත්‍රයේ අර්ථය තියා ගන්නවා. මේඝිය සුත්‍රයේ කියන්නේ මොකක්ද?

1. කළ්‍යාණ මිත්‍රයන් ඇති බව, කළ්‍යාණ මිත්‍රයන් සහය කොට ඇති බව, තමාත් කළ්‍යාණ මිත්‍රභාවයට නැමුණු බව කියන පළමුවෙනි වස්තුව තමා සන්තකයේ තියා ගන්නවා.

2. සිල්වත් වෙනවා. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවරව, ආචාර ගෝචරයෙන් යුක්තව, ස්වල්ප මාත්‍ර වූ වරදට පවා බිය දකිමින් ශික්ෂාවන් දැඩිව ගෙන හික්මෙනවා.

3. දසකතා වස්තු නිදුකින් අහන්න ලැබෙන, අනුත්සාහයෙන් අහන්න ලැබෙන, අපහසුවකින් තොරව අහන්න ලැබෙන පරිසරයක ඉන්නවා. දසකතා වස්තු කියන්නේ මොනවා ද?

---

156 https://tipitaka.lk/an-9-1-1-3/sinh - **මේඝිය සූත්‍රය- සම්බෝධි වර්ගය- නවක නිපාතය- අඞ්ගුත්තර නිකාය 5- 373 පිටුව**

- **<u>අසංසඟ කථා</u>**

  පිරිස එක්ක නිතර ම ගැටිලා ඉන්න එකේ ආදීනව පෙන්නලා, නිතර ම පිරිස් එක්ක ගැටිලා නො සිටීමේ ආනිසංස ගැන අහන්න ලැබෙනවා.

- **<u>අප්පිච්ඡ කථා</u>**

  බොහෝ තණ්හාව නැතුව, බොහොම සීමා සහිත දෙයකින් ජීවත් වීමේ වටිනාකම ගැන කියවෙන අල්පේච්ඡ කතාවන් අහන්න ලැබෙනවා.

- **<u>සන්තුට්ඨි කථා</u>**

  ලැබෙන්නේ මොන විදිහේ දෙයක් ද ඒ දෙයින් සතුටු වෙන්නේ කොහොමද කියන කතාවන් ගැන අහන්න ලැබෙනවා. ඉරිච්ච සිවුරක් ද, කැඩිච්ච කුටියක් ද ලැබෙන්නේ ඒ ලැබිච්ච දේ ගැන ගුණ කියන කතාවන් අහන්න ලැබෙනවා.

- **<u>විරියාරම්භ කථා</u>**

  කෙලෙස් තවන එකට වීර්‍ය කළ යුතුයි ආයුෂ්මතුන්, සසර දුකයි. එදා පීතමල්ල තෙරුන් වහන්සේලා වීර්‍ය කළ හැටි ආදී කතාවන් ගැන අහන්න ලැබෙනවා. කොටියා කකුලේ ඉඳන් කකා එද්දිත් එක ස්වාමීන් වහන්සේ නමක් උත්සාහවත් වුණා කියලා ඒ වගේ වීර්‍ය කරවීමේ යොදවන කතා අහන්න හම්බ වෙනවා.

- **<u>පවිවේක කථා</u>**

  උතුම් විවේකය ගැන කතාවන් අහන්න ලැබෙනවා.

- **<u>සීල කථා</u>**

  සිල්වත් වීමේ වටිනාකම ගැන කතාවන් අහන්න ලැබෙනවා.

- **<u>සමාධි කථා</u>**

  සමාධිය ගැන කතාවන් අහන්න ලැබෙනවා.

- **<u>ප්‍රඥා කථා</u>**

  ප්‍රඥාව ගැන කතාවන් අහන්න ලැබෙනවා.

- **<u>විමුක්ති කථා</u>**

  විමුක්තිය ගැන කතාවන් අහන්න ලැබෙනවා.

- **<u>විමුක්ති ඥාන දර්ශන කථා</u>**

  විමුක්ති ඥාන දර්ශනය ගැන කතාවන් අහන්න ලැබෙනවා.

4. අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිසත්, කුසල ධර්මයන්ගේ වැඩීම පිණිස ඇරඹූ වෙර ඇතුව නොනැවැත්වූ උත්සාහයෙන් හා ශක්තියකින් යුතුව කටයුතු කරනවා.

5. නිදොස් වූ ආර්ය වූ මොනවට දුක් ගෙවීම පිණිස පවතින ස්කන්ධයන්ගේ උදය වැය දන්නා වූ නුවණින් යුක්ත වෙනවා.

ඔන්න ඔය ධර්ම පහ තමා සන්තකයේ තබාගෙන රාගය දුරු කරන්න අසුභය වඩන්න. ද්වේශය දුරු කිරීමට මෛත්‍රිය වඩන්න. විතර්ක දුරු කරන්න ආනාපානසතිය වඩන්න. අස්මිමානය දුරු කරන්න අනිත්‍ය සංඥාව වඩන්න. අනිත්‍ය සංඥාව වඩන කොට අනාත්ම සංඥාව එළඹ සිටිනවා. අනාත්ම සංඥාව එළඹ සිටි කෙනා මේ ජීවිතයේ ම සියලු දුකෙන් මිදෙනවා කියලා පෙන්වනවා නේද මේඝිය සූත්‍රයේ දී.

මුලින් සඳහන් කළ ධර්මතා පහ තමා සන්තකයේ තියාගෙන අනික් ධර්මතා හතර වඩන්න කියනවා. ඒ මේඝිය සූත්‍රයේ පෙන්වන විදිහට තමන්ගේ අඩුපාඩු බලමින් තම තමන් කෙලෙස් රැහැගන්න ඕනේ. දැන් කළ්‍යාණ මිත්‍ර ඇසුර තියෙනවා, සිල්වත්කම තියෙනවා. දසකතා වස්තු නිරන්තරයෙන් අහන්න ලැබෙන පරිසරයක් හදාගන්න. එක් කෙනෙක් ම කියනකන් ඉන්න එපා. කට්ටිය එකතු වෙලා දම්සභා මණ්ඩපයක් තියලා අපි දහම් කතා කරමු කියලා පටන් ගන්න. එතකොට හැමෝම දහම් කතා කරනවා.

හැමදාම බැරි නම් සතියකට දවස් තුනක් දම්සභා මණ්ඩපය තියන්න. කාගේ කාගේත් ප්‍රශ්න ගැටළු ඉදිරිපත් කරන්න. එතනදි කවුරු හරි එක් කෙනෙක් හෝ දෙන්නෙක් ප්‍රධාන වෙනවා. හරි, මේවා මම දන්නේ නැහැ,

ලොකු ස්වාමීන් වහන්සේලා ආව දවසට අපි ඒවා අහමු කියලා ඒ ප්‍රශ්න ලියලා තියා ගන්නවා වෙන ම.

අනික් ප්‍රශ්න ගැටළු කතා කරලා ඒවා විසඳලා දෙනවා. සුත්‍රත් කතා කරනවා. දිනෙන් දින දියුණු වෙනවා නේ එතකොට. ඊගාවට අපි ඉන්නවා නේ. ඔබ වහන්සේලා ඇත්තට ම අපි හැමෝටම වඩා හරි ම පින්වන්තයි. ඒ මොකද? ඔබ වහන්සේලාට මෙහෙම කියලා දෙන්න එක් කෙනෙක් හරි දෙන්නෙක් හරි ඉන්නවා.

අපි තමයි අවාසනාවන්තයෝ. අපි සාසනේට එන කොට මෙලෝ කෙනෙක් නැහැ උදව් උපකාර කරන්න. ඒ අතින් ගත්තහම ඔබ වහන්සේලා හරිම පින්වන්තයි. ඔබ වහන්සේලාට මඟ කියලා දෙන්න කෙනෙක් ඉන්නවා. වීර්යය කරවන්න, ඇස් දෙක පාදලා දෙන්න කෙනෙක් ඉන්නවා.

ඉතින් එහෙම ලැබිලත් උත්සාහවත් නොවේ නම් ඒක ඉතින් කාළකණ්ණිකම. ඒ හින්දා හොඳට උත්සාහවත් වෙන්න ඕනේ පුතේ. ඕගොල්ලෝ හොඳට වීර්යය කරන කොට අපි නෑවිල්ලා ඉන්නේ නැහැ නේ. මම මාස ගානකට පස්සේ ආවත්, ඒ ආපු දවසට අර ඔක්කොම පාඩුව මැකෙන්න හාත්පස කියලා දීලා තමයි නේ යන්නේ.

ඒ හින්දා තම තමන්ව වැටෙන්නේ නැති වෙන්න ඕගොල්ලෝ කටයුතු කරන්න. කට්ටිය එකතු වෙලා ධර්ම සාකච්ඡා කරන්න, එකේදි වයස් භේද තියාගන්න එපා. කිරිසප්පයෙක්ගේ වචනය අහලා හෝ මේ සසරෙන් එතෙර වීගන්න යි ඕනේ වෙන්නේ.

තව මාසයක් දෙකක් ගිහිල්ලා මං එන්නම්කෝ ආයේ. මට හිතිලා තියෙනවා මෙහෙම එකක්. මේ පිරිසට හොඳට උගන්වන්න ඕනේ කියලා. ඒ ඉගෙන ගැනීමටත් කෙලෙස් ගෙවෙනවා. සම්මාදිට්ඨි සුත්‍රයේ තියෙන කාරණා ටික මුල ඉඳන් ආයේ උගන්වන්න ඕනේ. නිබ්බේධික සුත්‍රය, මජ්ඣෙ සූත්‍රය ආදී සුත්‍ර ටික හොඳ පිරිසකට ඉගැන්නුවා නම් ආයේ මේ සාසනයට ගින්දරක් වගේ තමයි. ඒ හින්දා මම ආයේ එනවා. ඕගොල්ලෝ එතකන් හිත වඩන්න.

~ බහුශ්‍රැත වීමේ වටිනාකම ~

ඉස්සර බලන්න, මහණවන හැම කෙනෙක් ම වගේ රහත් වෙනවා. ඇයි ඒ? ඒ අයට පර්යාප්තිය (පෙළ දහම) ප්‍රගුණ කරන්න තියෙන හින්දා, කාම සංකල්පනා ගැන හිතන්න වෙලාවක් නැහැ. ත්‍රිපිටකය එතකොට ග්‍රන්ථාරූඩ කරලා තිබ්බේ නැහැ නේ.

දීඝභාණකලා දීඝ නිකාය කටපාඩමින් ගෙනියන්න ඕනේ. ඉතින් උදේ ඉඳන් රෑ වෙනකන් කටපාඩම් කරන්න ඕනේ. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඩ කරන්න කලින් ඒ කාලේ ඔක්කොමලා වගේ රහත් වෙනවලු. ඇයි ඒ? ගුරු හාමුදුරුවෝ යටතේ මහණ වුණහම දීඝභාණකගේ ප්‍රධාන කාර්යය වෙන්නේ දීඝ නිකායේ සූත්‍ර ටික කටපාඩමින් සජ්ඣායනා කරන එක.

එයාගේ වගකීමක් තමයි දීඝ නිකායේ සූත්‍ර ටික මඟහැරෙන්නේ නැති වෙන්න ඉස්සරහට (අනාගතයට) අරගෙන යන එක. මජ්ඣිම භාණකලගේ කාර්යය තමයි මජ්ඣිම නිකායේ සූත්‍ර ටික කටපාඩම් කරලා උදේ හවස සජ්ඣායනා කරන එක. මේ සූත්‍ර ටික ඉරිදා, මේ සූත්‍ර ටික සඳුදා, ඉතුරු ටික අඟහරුවාදා කියලා ඔහොම ඔහොම බෙදාගෙන සජ්ඣායනා කරනවා. එතකොට එහාට මෙහාට මඟහැරෙන්නේ නැහැ. ඔය හැම සූත්‍රයක් ම තිබිලා තියෙන්නේ සජ්ඣායනා ස්වරූපයෙන්.

සජ්ඣායනා ස්වරූපයෙන් කිවුවේ, කරණීයමෙත්ත සූත්‍රය අපි උදාහරණයට ගමු. ***"කරණීයමත්ථකුසලෙන යං තං සන්තං පදං අභිසමෙච්ච සක්කෝ උජූ ච සූජූ ච සුවචෝ අස්ස මුදු අනතිමානී....."*** [157] කියලා ඔහොම සජ්ඣායනා කරනවා. එතකොට උඩින් හෝ මැදින් හෝ යටින් හෝ කොටසක් මඟහැරුනොත් අනික් කෙනාට අඩුවක් පේනවද නැද්ද? පේනවා. ඔහොම සජ්ඣායනා කරන කොට ගිලිහෙන්නේ නැහැ.

ඒ වගේ හැම සූත්‍රයක් ම තෙරුන් වහන්සේලා ඉස්සර සජ්ඣායනා කරන්න ඕනේ. එතකොට කොහෙන්වත් ගිලිහෙන්නේ නැහැ කොටස්. කාගේ

---

157 https://tipitaka.lk/kn-khp-9 - **මෙත්ත සූත්‍රය- බුද්දකපාඨපාළි- බුද්දක නිකාය- 20 පිටුව**

අතින් හෝ යම් කොටසක් ගිලිහුනොත් ඒ සූත්‍රය කටපාඩම් කරපු අනෙක් තෙරුන් වහන්සේලාට ටක්ගාලා පේනවා කොටසක් අඩුයි කියලා. ඒ හින්දා ත්‍රිපිටකයෙන් කාටවත් කොටස් අයින් කරන්නවත්, අලුතෙන් කොටස් එකතු කරන්නවත් බැරි වුණා.

ඔය විදිහට සජ්ඣායනා කරලා තමයි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනකන් පර්යාප්තිය (පෙළ දහම) අරගෙන ආවේ. ඒ කාලේ ඔහොම දහම හැමවෙලාවේ ම හිතන හින්දා ඔක්කොමලාගේ වගේ කෙලෙස් ගෙවිලා තියෙනවා ඉක්මනට ම. එතකොට අඳත් අපි ඒ පෙළ දහම හොඳට අර්ථ පිරෙන විදිහට ඉගෙන ගත්තහම ඕගොල්ලොන්ගේ මනසට ඉඩ නැහැ කාමය ගැන හිතන්න, කෙලෙස් සහගත සිතුවිලි ගැන හිතන්න.

මම ඔය හැමදාම කියන්නේ ගිහි මනුස්සයෝ දාහක් හදනවට වඩා එක භාමුදුරු නමක් හදාගත්තොත් වටී කියලා. ඒ මොකද, භික්ෂුව ගිහි ගෙදරින් වෙන්වෙලානේ ඉන්නේ. ඒ නිසා ඒ භික්ෂුවගෙන් ඇත්තට ම ලෝකයට සාසනයට මහා සේවයක් වෙනවා. ඉතින් ඒ ටික උගන්වන්නත් එක්ක මම ආයේ එනවා. එතකන් ඕගොල්ලෝ වීර්යය කරන්න.

ඕඝ, යෝග, ග්‍රන්ථ, දිට්ඨි, නීවරණ, පරාමාස කිය කියා ඔය නම් ටිකෙන් කියන්නෙත් කෙලෙස් ම තමයි. ආස්‍රව ක්ෂයට බලන කොට ඕඝත්, යෝගත්, ග්‍රන්ථත්, දිට්ඨිත්, නීවරණත්, පරාමාසත් කියන ඔය ඔක්කොම කෙලෙස් නැති වෙනවා.

අපි වෙන වෙන ම සක්කාය දිට්ඨිය කියන්නේ මොකක් ද, ඒක ඇති වෙන්නේ කොහොමද, නැති වෙන්නේ කොහොමද කියලා ඔන්න බලන්න උත්සාහවත් වෙනවා. උපාදානය කියන්නේ මොකක් ද ඒක ඇති වෙන්නේ කොහොමද, නැති වෙන්නේ කොහොමද කියලා ඒකත් බලන්න උත්සාහවත් වෙනවා. නමුත් ඔය කෙලෙස් එකක් එකක් ගලවලා දාන්න වෙන වෙන ම උත්සාහවත් වෙන්න ඕනේ නැහැ. හරියට මාර්ගය වඩනවා නම් ඔක්කොම ටික ගෙවලා දාන්න පුළුවන්. මාර්ගය වඩන කොට කෙලෙස් ඔක්කොම ටික එක පඳුරට ම හේදිලා යනවා.

ඕගොල්ලෝ භාවනා කරන්න පස්සේ. ඕගොල්ලොන්ගේ දැනුම තව ටිකක් හොඳට ඔපමට්ටම් වෙන්න මම තව දහම් කරුණු ටිකක් කියලා දෙන්නම්. හොඳට බහුශ්‍රැතභාවය අපිට තියෙන්න ඕනේ. පෘථග්ජනයාට නමක් පෙන්වනවා නේ "අශ්‍රැතවත් පෘථග්ජන" - බොහෝ කොට ඇසු පිරූ නැති කියලා.

ශ්‍රැතවත් කියලා කියන්නේ හොඳට ධර්මය අහලා තියෙනවා, හොඳට ධර්මය හිතලා තියෙනවා. ඒක හරි වටිනවා ඉක්මනට ආස්‍රව ක්ෂය වෙන්න. දහම තුළින් පෙන්වන යථාර්ථය ගැන තියෙන අවබෝධය පුළුල්වන තරමට කෙලෙස් ගෙවාගන්න පහසුයි.

මඤ්ඤෙදාක්කා පඳුරක් වුණත් හොල්ලන කොට හොල්ලන කොටනේ උදුරන්න ලෙහෙසි. ඒ වගේ කෙලෙස් බුරුල් වෙනවා හොඳට ධර්මය අහලා ඒ අනුව හිතලා තියෙනවා නම්. කෙලෙස් බුරුල් වුණහම සහමුලින් ම උගුල්ලලා දාන්න ලෙහෙසියි.

අපි දන්නා දහම් පරාසය ලොකුවෙන කොට කෙලෙස් ගෙවාගන්න ලෙහෙසියි. දහම විවිධ පරියායන්ගෙන් කතා කරන කොට කෙලෙස් විවිධ විවිධ පැතිවලින් බුරුල් වෙනවා. මෙතන හරි වුණාට ඕගොල්ලෝ දන්නේ නැහැ තව එක එක පැතිකඩවලින් අපිට හිර වෙච්ච, පැහැදිලි නොවුණු තැන් තියෙනවා. විවිධ විවිධ පරියායන්ගෙන් දහම කතා කරන කොට හාත්පස ම කෙලෙස් බුරුල් වීම සිද්ධ වෙනවා. ඒ නිසා අපි තව එක දහම් ක්‍රමයක් කතා කරමු.

~ දස සංයෝජන ~

සංයෝජන කියන්නේ බැඳුම්. බැඳුනා කියන්නේ ආයේ හිතුමනාපෙට යන්න බැහැ. හරකෙක් වගේ සතෙක්ව කණුවක බැඳලා නම් ඌට හිතුන හිතුන තැනක ගිහින් තණකොළ කනවා, හිතුන හිතුන තැනක ගිහිල්ලා වතුර

බොනවා කියලා එහෙම එකක් බැහැ නේ. ඇයි ඒ? ළඟට යනවා නම් අර ලණුවේ දුරට විතරයි යන්න පුළුවන්. බැඳුම කියන්නේ අන්න ඒ වගේ එකක්.

සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිද්‍යා කියන්නේ මේ භවය ඇතුළේ බැඳිලා තියෙන බැඳුම්. ඕවා හින්දා භවයෙන් මිදීගන්න බැහැ ම යි. ඒ නිසා නිවනට යන්න බැහැ, භවයට බැඳිලා මේ සංයෝජන වලින්.

අපි ගිහි ජීවිතයක ඉන්න කෙනෙක්ව උදාහරණයට ගමු. ගිහි කෙනෙකුට කැමති වෙලාවක කැමති තැනකට ගිහිල්ලා භාවනා කරනවා, බණ අහනවා, කැමති කැමති තැනකට ගිහින් ඇවිදලා එනවා කියලා නිදහසක් නැහැ. ඇයි ඒ? ළමයින්ගේ ප්‍රශ්න, බිරිඳගේ ප්‍රශ්න, ගෙදර ප්‍රශ්න ආදිය නිසා.

කන්න බොන්න දෙන්න ඕනේ, විදුලි බිල ගෙවන්න ඕනේ, වතුර බිල ගෙවන්න ඕනේ, ගේ කෑල්ල හදන්න ඕනේ, ඔය වගේ ප්‍රශ්න නිසා යන්න බැහැ. ඒ ප්‍රශ්න ඇතිවෙලා තියෙන්නේ ඇයි? දාලා යන්න බැරි බැඳුම් හින්දා. ඔය වගේ දස සංයෝජනවලින් කරලා තියෙන්නෙත් අපිව භවයට බැඳලා තියෙන එක.

දස සංයෝජන කොටස් දෙකකට බෙදනවා

1. දිට්ඨිත් වෙන, සංයෝජනත් වෙන ධර්මයෝ

2. දිට්ඨි නොවන සංයෝජන පමණක් වෙන ධර්මයෝ [158]

- සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන තුන දිට්ඨිත්, වෙන සංයෝජනත් වෙන ධර්මයෝ (දිට්ඨි සහගත බැඳුම්).
- කාමරාග, පටිඝ, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිද්‍යා කියන ටික දිට්ඨි නොවන සංයෝජන පමණයි. (බැඳුමක්/ සංයෝජනයක් පමණයි)

158

මේ දෙක ගෙවන්න ක්‍රම දෙකක් තියෙනවා. දිට්ඨිත් වෙන සංයෝජනත් වෙන සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන ධර්මයෝ මොන තරම් වීර්යයක්, මොන තරම් සමාධියක් තිබුණත් ප්‍රඥාව නැතුව ගෙවන්න බැහැ. ඒ දිට්ඨි සහගත සංයෝජන ගෙවෙන්නේ දර්ශනයකට යි. ඒ සංයෝජන තුන ප්‍රඥාවෙන් අයින් කළ යුතු සංයෝජන තුනක්. දිට්ඨිත් වෙන සංයෝජනත් වෙන ධර්මයෝ ගෙවන දර්ශනය දකින තැනටත් සීලය, සමාධිය, වීර්යය ඕනේ. නමුත් වැඩි බලය තියෙන්නේ එතන දී ප්‍රඥාවට.

හැබැයි දර්ශනයක් ආවත් මොන තරම් ප්‍රඥාවක් තිබුණත්, ඒ ප්‍රඥාවෙන් පමණක් කාමරාග, පටිඝ, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිද්‍යා කියන දිට්ඨි නොවන සංයෝජන ටික ගෙවන්න බැහැ. ඒවා ගෙවන්න වෙන්නේ වීර්යය හා සමාධියෙන් ම යි. ඒ වීර්යයට හා සමාධියට දර්ශනය දැකීම තුළින් උපදවා ගත්ත ප්‍රඥාව උපකාරයක්. නමුත් වැඩි බලය තියෙන්නේ එතන දී වීර්යයට හා සමාධියට.

~ සෝවාන් වීම ~

මම අද කියලා දෙන්නම් දර්ශනයෙන් පහ කළ යුතු කෙලෙස් ධර්මයෝ ගැන. **සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන සංයෝජන තුන දර්ශනයකින් තමයි ප්‍රහාණය කරන්න තියෙන්නේ.**[159]

සක්කාය දිට්ඨිය, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන්නේ මේ ශාසනයේ දර්ශනය දකින කොට ම ඉබේම දුරු වෙන්න ඕනේ ඒවා මිසක සක්කාය දිට්ඨිය, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන්නේ මොකක් ද, ඒක අයින් කරන්න මොකක් ද කරන්න ඕනේ කියලා මෙනෙහි කරාට ඒ සංයෝජන අයින් කරන්න බැහැ. චතුරාර්ය සත්‍යය දර්ශනය දැකීමත් එක්ක ම යි ඒ සංයෝජන ධර්මයෝ දුරු වෙන්නේ.

159 https://tipitaka.lk/ap-dhs-4-1/sinh - **ත්‍රික නිර්දේශය - නික්ෂේපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 387 පිටුව**

සක්කාය දිට්ඨිය

අපි බලමු සක්කාය දිට්ඨිය කියලා කියන්නේ මොකක් ද කියලා. **'සක්කාය' කියලා කියන්නේ පංච උපාදානස්කන්ධයට නමක්,**[160] උපාදානයට හිත වූ ස්කන්ධ පංචකයට නමක්. ඒ උපාදානයට හිත වූ ස්කන්ධ පංචකය අරහයා පවතින දිට්ඨියට තමයි සක්කාය දිට්ඨිය කියලා කියන්නේ. **සක්කාය දිට්ඨිය විසි ආකාරයකට තියෙනවා.**[161] අපි උදාහරණයකට රූප උපාදානස්කන්ධය ගමු;

- *"රූපං අත්තතෝ සමනුපස්සති"*
  රූපය ආත්මයක් හැටියට දකිනවා. ඒ කිව්වේ සද්ධර්මය අහලා නැති කෙනෙකුට හිතෙනවා 'රූපය සත්ත්වයෙක්', 'රූපය ආත්මයක්' කියලා.

- *"රූපවන්තං වා අත්තානං සමනුපස්සති"*
  ආත්මය රූපවත් එකක් ලෙස දකිනවා. ඒ කිව්වේ සද්ධර්මය අහලා නැති කෙනෙකුට හිතෙනවා මගේ ආත්මය දැන් රූපවත්ව පවතිනවා. තව ටිකකින් මේ රූපය වෙනස්වන කොට මගේ ආත්මය වෙන රූපයකට හැරෙනවා වගේ තැනකින් හිතනවා.

- *"අත්තනි වා රූපං සමනුපස්සති"*
  රූපය ආත්මයට හිත එකක් ලෙස දකිනවා. ඒ කිව්වේ සද්ධර්මය අහලා නැති කෙනෙකුට හිතෙනවා රූපය ආත්මය නෙමෙයි. වේදනාව හෝ සංඥාව හෝ සංඛාරය හෝ විඤ්ඤාණය හෝ තමයි මගේ ආත්මය. ඒ ආත්මයට මේ රූපය හිත වූ එකක් ය කියලා හිතනවා.

---

160 https://tipitaka.lk/sn-4-4-15/sinh - **සක්කාය සූත්‍රය- ජම්බුඛාදක සංයුක්තය- සංයුක්ත නිකාය 4- 485 පිටුව**

161 https://tipitaka.lk/kn-ps-1-2-4/sinh - **සක්කාය දිට්ඨි- දිට්ඨිකථා- පටිසම්භිදාමග්ග- බුද්දක නිකාය- 283 පිටුව**

- *"රූපසම්ං වා අත්තානං සමනුපසසති"*
  රූපය ඇතුළේ ආත්මය තියෙනවා කියලා දකිනවා. ඒ කිව්වේ සද්ධර්මය අහලා නැති කෙනෙකුට හිතෙනවා වේදනාව හෝ සංඥාව හෝ සංඛාරය හෝ විඤ්ඤාණය හෝ තමයි මගේ ආත්මය. රූපය ඇතුළේ තමයි ඒ මගේ ආත්මය තියෙන්නේ කියලා හිතනවා.

රූපය ගැන වගේ ම වේදනාව ගැන, සංඥාව ගැන, සංඛාරය ගැන, විඤ්ඤාණය ගැන ඉහත විස්තර කරපු විදිහට එක උපාදානස්කන්ධයකට හතර ගානේ විසි ආකාරයක් තියෙනවා සක්කාය දිට්ඨිය.

<u>විචිකිච්ඡා</u>

විචිකිච්ඡා කියන්නේ බුද්ධාදී අට තැන් පිළිබඳව සැකය, කෙසේ ද කෙසේ ද කියන විමතිවලට.

- ***"සත්ථරි කඞ්ඛති විචිකිච්ඡති"*** – ශාස්තෘන් වහන්සේ (බුදුරජාණන් වහන්සේ) ගැන සැකය. බුදු වුණා කිවුවට ඉතින් බුදු වෙන්න ඇති ඉතින්. එච්චරයි, ඒ ගැන නිසැක බවක් නැහැ.
- ***"ධම්මෙ කඞ්ඛති විචිකිච්ඡති"*** - ධර්මය ගැන සැක යි.
- ***"සඞ්ඝෙ කඞ්ඛති විචිකිච්ඡති"*** - සංඝයා ගැන සැක යි.
- ***"සික්ඛාය කඞ්ඛති විචිකිච්ඡති"*** - ශික්ෂාව ගැන සැක යි.
- ***"පුබ්බන්තෙ කඞ්ඛති විචිකිච්ඡති"*** - මම පෙර හිටියා ද, හිටියා නම් කොහේ ඉන්න ඇද්ද, මොකෙක් වෙලා ඉන්න ඇද්ද, මොකෙක් වෙලා කොහොම ඉඳලා මෙහාට එන්න ඇද්ද කියලා පෙර ගැන ඇතිවෙන සැකය.
- ***"අපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති"*** - මම මැරිලා කොහේ යයි ද, මොකෙක් වෙලා උපදී ද, මොන මොන විදිහට උපදී ද කියලා අනාගතය ගැන ඇතිවෙන සැකය.

- ***"පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති විචිකිච්ඡති"*** - මොන මොන තැනක ඉඳලා ආපු මම, මොන මොන තැනකට යයි ද දන්නේ නැහැ කියලා අතීත අනාගත දෙක ම ගැන සැකයි.
- ***"ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති"*** [162] - පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳව ඇතිවෙන සැකය.

<u>සීලබ්බත පරාමාස</u>

මේ සස්නෙන් බැහැර මහණ බමුණන් මේ මේ ශීලයෙන්, මේ මේ ව්‍රතයෙන් මට විශුද්ධියකට පත්වෙන්න පුළුවන් කියලා දෘෂ්ඨිගතව සිල් ව්‍රත පරාමර්ශනය කිරීමට කියනවා සීලබ්බත පරාමාස කියලා.[163]

- අජව්‍රත - එළුවෙක් වගේ හිටියොත් මට විමුක්තියක් ලබන්න පුළුවන්.
- ගෝව්‍රත - හරකෙක් වගේ හිටියොත් මට නිවන් දකින්න පුළුවන්.
- කුක්කුරව්‍රත - බල්ලෙක් වගේ හිටියොත් මට නිවන් දකින්න පුළුවන්. කුක්කුරව්‍රත සමාදන් වෙච්ච අය කවදාකවත් පිඟානක කෑම කන්නේ නැහැ. බිමට දාපු කෑම විතරයි කන්නේ.

ඔය වගේ ව්‍රත සමාදන් වෙනවා. ඒ වගේ ම මේ ගඟෙන් නෑවා ම පිරිසිදු වෙනවා කියලා ගංගානම් ගඟට උදේ පාන්දර ගිහින් බහිනවා. සෙවල ජටා හදලා ඒවා ඔළුවේ පළඳිනවා. ගිනි දෙවියෝ පුදනවා. ඊට පස්සේ පංචතාපයෙන් තැවෙනවා.

පංචතාපයෙන් තැවෙනවා කියන්නේ ඉස්සරහිනුත් ගිනි ගොඩක් ගහනවා. දෙපැත්තෙනුත් ගිනි ගොඩවල් ගහනවා. පිටිපස්සෙනුත් ගිනි ගොඩක් ගහලා ගිනි අව්වේ නිදාගන්නවා. මේ විදිහට පංචතාපයෙන් තැවුනහම පුරාණ කර්ම ගෙවෙනවා, අලුත් කර්ම වෙන්නේ නැහැ කියන තැනකින් පුරාණ කර්ම තප තප අයින් කරන්න හදනවා. පුළුවන් තරම්

---

162 https://tipitaka.lk/ap-dhs-4-14/pali - **පිටිඨිදුකය- නික්ඛේපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 468 පිටුව**

163 https://tipitaka.lk/ap-dhs-4-6/sinh - **ඉතට් ගොච්ඡකය- නික්ඛේපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 433 පිටුව**

අමාරුවෙන් තවපු තරමට පුරාණ කර්ම ගොඩක් ගෙවෙනවා කියලා හිතනවා. ඔය වගේ ඒවාට තමයි සීලබ්බත පරාමාස කියන්නේ. ඔය සංයෝජන තුන තියෙන්නේ දර්ශනයක් නැතිකම නිසා.

මොකක් ද මේ ශාසනයේ දර්ශනය? *"දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං".* මෙන්න මේ චතුරාර්ය සත්‍යය ගැන නුවණ නැතිකම නම් අවිද්‍යාව නිසා තමයි සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස ඇති වෙන්නේ.

ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා දන්නවා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියලා යමක් හම්බ වෙයි ද, තියෙයි ද ඒවා දුක ම යි. ඉපදීම, ලෙඩවීම, මහළු බව, මරණය ආදී සියළු දුක ලැබෙන ධර්මයක් නේද පංච උපාදානස්කන්ධය කියන්නේ කියලා දන්නවා. ඇයි පංච උපාදානස්කන්ධයට දුකයි කියන්නේ?

පංච උපාදානස්කන්ධය තිබුණොත් උපාදාන වෙනවා. උපාදාන වුණොත් භවය ඇති වෙනවා. භවය වුණොත් ජාති ජරා මරණ ආදී දුක ඇති වෙනවා. පංච උපාදානස්කන්ධය නැත්නම් උපාදානය නැහැ. උපාදාන නොවුණොත් භවය නැහැ. භවය නොවුණොත් ජරා මරණ දුක නැති කළ හැකි නේද කියලා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා දන්නවා.

එහෙනම් පංච උපාදානස්කන්ධයේ නිරෝධයට කටයුතු කළ යුතුයි නේද කියලා දර්ශනය අහලා නැති හින්දා උපාදානයට හිත විදිහට රූපය හෝ වේදනාව හෝ සංඥාව හෝ සංඛාරය හෝ විඤ්ඤාණය අල්ලගෙන 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' කොට හිතනවා.

චතුරාර්ය සත්‍යය ගැන නොදන්න කොට, දැන් බය නැහැ පංච උපාදානස්කන්ධයට. ඒ නිසා රූපය උපද්දනවා, වේදනාව අල්ලගෙන තණ්හා උපාදාන වශයෙන් හැසිරෙනවා. ඉතින් සක්කාය දිට්ඨියෙන් යුක්ත වෙනවා නම් යුක්ත වෙන්නේ ම පංච උපාදානස්කන්ධයක් තණ්හා උපාදානයෙන් අල්ලගෙන ම නේ. අවිද්‍යාව නිසා තමයි මේක වෙන්නේ.

සක්කාය දිට්ඨිය ගෙවන්න පුළුවන්. ඒ කියන්නේ *"දුක්ඛෙ ඤාණං"* තිබුණොත්, පංච උපාදානස්කන්ධය දුකක් ම යි. පංච උපාදානස්කන්ධය තිබුණොත් තණ්හා උපාදාන වෙනවා. එහෙම වුණොත් භවය හැදෙනවා. භවය හැදුනොත් ජරා මරණ ශෝක පරිදේව ආදී සියළු දුක් දොම්නස් ගෙනත් දෙනවා ම යි කියලා, පංච උපාදානස්කන්ධයට දුකයි කියන්නේ ඇයි කියන එක ගැන දන්නවා.

පංච උපාදානස්කන්ධය නැති වුණොත් තණ්හා, උපාදාන වෙන්න තැනක් නැහැ. එහෙම වුණොත් මේ ලෝකය (භවය) හිටින්නේ නැහැ. භවය නැත්නම් ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස් උපදින්නේ නැහැ. දැනුත් පුද්ගලභාවය උපදින්නේ (ජාතිය) නැහැ. මතු ප්‍රතිසන්ධි වශයෙන් ස්කන්ධයන්ගේ පහළ වීම වෙන්නෙත් නැහැ.

ඉපදුනේ නැති වුණොත් ජරා මරණ දුක නැහැ. එහෙනම් පංච උපාදානස්කන්ධයේ නිරෝධයට (සක්කාය නිරෝධයට) කටයුතු කළ යුතුයි කියලා දර්ශනයක් තිබුණොත් එයාට රූපය, වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය කියන සක්කාය (පංච උපාදානස්කන්ධය) අහුවෙනවා ද? නැහැ.

එතකොට සක්කාය අහුවෙන්නේ නැති කොට සක්කාය දිට්ඨිය යෙදෙනවා ද? නැහැ. දර්ශනයෙන් පහ කළ යුතුයි මේ කෙලෙස්. දර්ශනය තියෙන කොට ඉඛේට ම මේ කෙලෙස් අතහැරෙනවා. දර්ශනය නැති වුණොත් සක්කාය දිට්ඨිය ගෙවාගන්න පුළුවන් ද?

පෘථග්ජනයට පංච උපාදානස්කන්ධය හම්බ වෙලා 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' හැටියට ගනුදෙනු කරනවා කියන එක නවත්තන්න බැහැ. පංච උපාදානස්කන්ධය කියන්නේ මහා බරපතල ප්‍රශ්නයක්. පංච උපාදානස්කන්ධයේ නිරෝධයට කටයුතු කළ යුතුයි කියන එක දන්න ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවකයා පංච උපාදානස්කන්ධය අල්ලගෙන 'පුද්ගලයෙක්', 'සත්ත්වයෙක්' කියලා හිත හිතා ඉන්න එක ගැන කවර කතා ද, පංච උපාදානස්කන්ධය උපද්දවන්නත් බයයි. සක්කාය නිරෝධයට දර්ශනය එන කොට ම සක්කාය දිට්ඨිය සම්පූර්ණයෙන් ම අතහැරෙනවා එයාට.

ඊට පස්සේ විචිකිච්ඡාවට අයිති *"පුබ්බන්තෙ කඩබනි"* නැහැ. ඒ කියන්නේ අපි පෙර හිටියා ද, හිටියා නම් කොහේ ඉඳලා එන්න ඇති ද කියලා කතාවක් නැහැ. එයා දන්නවා, නික්ලේශී මනසක් (සීමා නොකරන ලද මනසක්) ඇතුව ඉපදිලා අවිද්‍යා කර්මයෙන් උපාදාන වෙන විදිහට හිතලා තණ්හා උපාදාන වෙලා මේ ලෝකය හදාගත්තහම 'මේ මමත් ඉන්නවා', 'අනික් අයත් ඉන්නවා' කියන නිමිති ඇවිල්ලා නේද මේ තියෙන්නේ කියලා දකිනවා.

අවිද්‍යාව, කර්මය නොවුණා නම් තණ්හා උපාදාන වෙන්න බැහැ. එහෙනම් මේ ලෝකය නැහැ නේද කියලා දකිනවා. එහෙනම් සසරේ දීත් දිගින් දිගට ආපු කෙනෙක් කොහෙවත් ඉඳලා නැහැ. අතීතයේ දීත් පිරිසිදු නික්ලේශී මනසක් ඇතුව ඉපදිලා, අතීතයේදීත් අවිද්‍යාව නිසා සංඛාර වෙලා, සංඛාර නිසා විඤ්ඤාණය වෙලා උපාදානයට හිත විදිහට ස්කන්ධ ටික හදාගෙන, ඒ පංච උපාදානස්කන්ධයට තණ්හා උපාදාන වෙච්ච හින්දා එදත් ලෝකයක් හැදිලා, ඒ ලෝකේ තුළ ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස් විඳලා තියෙනවා.

ඒ අතීත කර්ම භවය නොසිඳුණු හින්දා ම කර්ම නිමිත්තක් හේතුවෙන් ප්‍රතිසන්ධි වශයෙන් මෙතනට බොහොම පිරිසිදු මනසක් (සීමා නොකරන ලද මනසක්) ඇතුව උපන්නා. අදත් අවිද්‍යාව නිසා උපාදානයට හිත විදිහට ස්කන්ධ ටික හදාගෙන තණ්හා උපාදාන වෙලා. ඔන්න අදත් ලෝකේ හදාගෙන දුක් විඳිනවා.

අද ද වර්තමාන කර්ම භවය නැති නොකළොත් නැවත විඤ්ඤාණය බැස ගනී. සීමා නොකරන ලද පිරිසිදු මනසක් ඇතුව උප්පත්ති වශයෙන් ආවහම ආයෙත් එදාට අවිද්‍යාව නිසා, සංඛාරය නිසා පංච උපාදානස්කන්ධය උපද්දවලා තණ්හා උපාදාන වෙලා ලෝකය හදා ගනී නේද, තමන්ව හදා ගනී නේද කියලා එයා දිගින් දිගට ම ආපු ආත්මයක් දකින්නේ නැහැ. එතන එතන පටිච්චසමුප්පාද සිද්ධියකින් ලෝකය හදාගෙන විඳපු දුකක් නම් තියෙයි කියලා දකිනවා.

විඤ්ඤාණය හීන ධාතුවේ හෝ ප්‍රණීත ධාතුවට ප්‍රතිසන්ධි වශයෙන් බැසගත්තහම සත්ත්ව පුද්ගලභාවයක් නැති සීමා නොකරන ලද මනසක් ඇතුව ආයතන ටිකක් උපන්නා. ඇහැ තිබුණාට ඇහැ ගැන නිමිති නැහැ. කන තිබුණාට කන ගැන නිමිති නැහැ. මේ මම යි කියලා පනවන්නවත් නිමිත්තක් නැහැ. පිරිසිදු මනසක් තියෙන්නේ. අළුත් කර්ම භවයක් හැදිලා නැහැ. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින 'තමන් ඉන්නවා' කියන නිමිති නැහැ ඒකේ. අතිශය ගැඹුරු ශූන්‍යතාවයක් තිබුණේ.

ඊට පස්සේ අඳ ද අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විදිහට පංච උපාදානස්කන්ධය උපද්දලා තණ්හා උපාදාන වුණොත් ලෝකය හැදෙනවා කියලා දන්නවා. ඔන්න එතකොට 'මම' ඉන්නවා වෙනවා. දැන් ඒ 'මම' කොහේ හෝ ඉඳලා ආවා ද? නැහැ. අවිද්‍යා කර්ම, තණ්හා, ආහාර නිසයි 'මම' කියන නිමිත්ත හැදුනේ කියලා දන්නවා. මේ ජීවිතය අවසානයේ දී භවය නොසිඳුණු නිසා ආපහු විඤ්ඤාණය හීන ධාතුවේ හෝ ප්‍රණීත ධාතුවේ පිහිටනවා. 'මම වූ ආත්මයක්' කොහාටවත් යන්නේ නැහැ කියලා එයා දකිනවා.

"පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු ඤාණං" [164] මම අතීතයේ හිටියා ද නැද්ද කතාවක් නැහැ. අතීතයේ දී වෙලා තියෙන්නෙත් පටිච්චසමුප්පාද සිද්ධිය, දැනුත් වෙන්නේ පටිච්චසමුප්පාද සිද්ධිය, අනාගතයට වෙන්නෙත් පටිච්චසමුප්පාද සිද්ධිය යි කියලා නුවණින් දන්නවා

~ සුවඳ මලකින් පටිච්චසමුප්පාදයට ~

මං අර උපමාවක් කියන්නේ, දාස්මල් ගහක ඇටයක් බිම හිටෙව්වාම ගහක් හැදිලා මලක් ආවා. දැන් මල සුවඳයි. ඒ මලෙන් තව ඇටයක් ආවා. ඒ ඇටේ පැළ කරලා ගහක් හැදිලා ආයේ මලක් පිපුණා. ඒ මලත් සුවඳ යි.

---

164 https://tipitaka.lk/kn-nett-3-2-14 - **අධිට්ඨානහාරසම්පාතය- පටිනිද්දේසවාරය- නෙත්තිප්‍රකරණය- බුද්දක නිකාය- 156 පිටුව**

දැන් මේ මලේ සුවඳ අර බීජයේ තිබුණා ද? නැහැ. ගහෙන් සුවඳ අරගෙන ආවා ද? නැහැ.

නමුත් මල හැදුනහම මල සුවඳයි. ආයෙත් ඒකෙන් ඇටයක් විතරයි ගන්නේ. මේ මලවත්, මලේ පෙතිවත්, මලේ සුවඳවත් කොහාටවත් යන්නේ නැහැ. ඒකෙන් ඇටයක් විතරක් අරගෙන ගහ හැදුවා. ගහ හැදුනහම ආයේ මල් පිපෙනවා. දැන් ඒ මලත් සුවඳ යි. දැන් ඉස්සෙල්ලා ගහේ මල හෝ මලේ සුවඳ මේ මලට චුට්ටක් හරි ආවා ද? නැහැ. හේතු ඵල දහමක් තියෙන්නේ.

බීජය කියන්නේ හේතුවක්. ඒ බීජය නිසා ගහක් හැදුණා. ඒ ගහේ මල් පිපුණා. ඒ මලත් සුවඳ යි. හේතු ඵල දහමක් තියෙන්නේ. බීජයක් පැළවෙලා ගහක් හැදිලා සුවඳ මලක් හැදුණා වගේ තමයි විඤ්ඤාණය නැමති බීජය රූපයට (මව් කුසක කළලයට) බැස ගත්තහම විපාක නාමරූප දෙක හැදිලා, එතන ඇත්ත නොදන්නාකම නම් අවිද්‍යාව යෙදිලා පටිච්චසමුප්පාද චක්‍රය සක්‍රිය වීමෙන් 'මම', 'අම්මා', 'තාත්තා', 'දුව', 'පුතා' ආදී වශයෙන් ලෝකය හැදිලා.

ඕකේ ම ආයේ බීජයක් වගේ තමයි කර්ම විඤ්ඤාණය නිසා නැවත ප්‍රතිසන්ධිය වෙලා විපාක නාමරූප දෙකක් හැදෙයි. ලෝකය කොහාටවත් යන්නේ නැහැ. උප්පත්ති වශයෙන් තියෙන ලෝකෙකට ආවා කියන්නවත්, ලෝකේ තියෙනවා අපි යනවා කියන්නවත්, මෙතන ඉන්න කෙනා කුසල අකුසල කර්ම කර ගෙන වෙන තැනකට යනවා කියන්නත් බැහැ.

~ පටිච්චසමුප්පාදය ගැන සත් සැත්තෑ ඥානය ~

එතකොට එයාට **"පටිච්චසමුප්පාදය පිළිබඳව සත් සැත්තෑ ඥානයක් උපදිනවා"** [165]**.** ඥාන හැත්තෑ හතක් උපදිනවා. මොකක්ද ඒ ඥාන හැත්තෑ හත?

---

165 https://tipitaka.lk/sn-2-1-4-4/sinh - **දුතියඤාණවත්ථු සූත්‍රය- කළාරඛත්තිය වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය02- 93 පිටුව**

අතීතයේ දීත් අවිද්‍යාව නිසා ම යි සංඛාර වුණේ. දැනුත් අවිද්‍යාව නිසා ම යි සංඛාර වෙන්නේ. අනාගතයටත් අවිද්‍යාව නිසා ම යි සංඛාර වෙන්නේ. (එතන සමුදය ගැන ඥානවල් තුන යි). අතීතයේ ද සංඛාර නැති වුණා නම් අවිද්‍යාව නැති වීමෙන් ම යි. වර්තමානයේ ද සංඛාර නැති වෙනවා නම් අවිද්‍යාව නැති වීමෙන් ම යි. අනාගතයට ද සංඛාර නැති වන්නේ නම් අවිද්‍යාව නැති වීමෙන් ම යි. (එතකොට එතන නිරෝධය ගැන ඥානවල් තුනක් තියෙනවා).

අවිද්‍යාව නිසා සංඛාර උපදිනවා, අවිද්‍යාව නැති වීමෙන් සංඛාර නැති වෙනවා කියලා යම් නුවණක් තියෙනවා නම් ඒ නුවණ ද අනිත්‍ය යි, සංඛත යි, පටිච්චසමුප්පන්න යි කියලා දන්නවා. එතකොට ඒ නුවණත් එක්ක අවිද්‍යා සංඛාරය පිළිබඳව ඥානවල් ඔක්කොම හත යි.

ඔහොම පටිච්චසමුප්පාදයේ අංග එකොළහට ම එකකට හත ගානේ නුවණවල් ආවහම කීයද? සත් සැත්තෑ ඥානයක් එනවා. එතකොට මේ දහම දකින කොට ඒකාන්තයෙන් බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ ම යි, ලෝකවිදූ ම යි- ලෝකය මනා කොට අවබෝධ කොට දේශනා කරලා තියෙනවා කියලා බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය ගැන සැක නැහැ.

ඒ වගේ ම මේ ධර්මය ස්වක්ඛාත ම යි, සන්දිට්ඨික යි, අකාලික යි (කල් නොයවා විපාක දෙන) දර්ශනයක්. ඒ ඇයි? මේ ධර්මය නිසා ලෝකය ම අයින් කරලා දාන්න පුළුවන් කියන එකක් තියෙනවා නේ. යම්කිසි කෙනෙක් මේ ලෝකයත්, ලෝක සමුදයත්, ලෝක නිරෝධයත් දැකලා, ලෝක නිරෝධය පිණිස පිළිපන්නා නම් එයා සුපටිපන්න ම යි (මනාව පිළිපන්නා), උජුපටිපන්න යි (සෘජු මාර්ගයට පිළිපන්නා) එයා ඤායපටිපන්න යි (දුක් නැති කරන න්‍යායයකට පිළිපන්න කෙනෙක්) කියලා සංඝයා කෙරෙත් සැක නැහැ. එතකොට විචිකිච්ඡාව නැහැ.

එබඳු දහමක් දකින කෙනා විමුක්තිය පිණිස එළුවෙක්, බල්ලෙක්, හරකෙක් වගේ හැසිරෙන්නේ නැහැ. එතකොට සීලබ්බත පරාමාසයත් නැහැ.

චතුරාර්ය සත්‍යය අවබෝධ වෙන කොට ඔය කෙලෙස් තුන සම්පූර්ණයෙන් ම නැතිවෙලා යනවා.

"දුකෙඛ ඤාණං දුකඛසමුදයෙ ඤාණං දුකඛනිරොධෙ ඤාණං දුකඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං පුබ්බනෙත ඤාණං අපරනෙත ඤාණං පුබ්බනතාපරනෙත ඤාණං ඉදපපච්චයතාපටිච්චසමුපපනෙනසු ධමෙමසු ඤාණං. අයං වුච්චති සමමාදිට්ඨි." [166]

දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැති කරන මඟ දැක්කා. දැනුත් මේ ජීවිතයේ දී භවය හදාගෙන දුක හදාගත්ත බව දකිනවා. ඒ කියන්නේ ගෙවල් දොරවල්, දරුවෝ, මම, නෑදෑයෝ හදාගත්තහම යුතුකම් වගකීම්වලින් පීඩා විඳින හැටි, දෙමව්පියෝ සහෝදරයෝ ඥාති හිතෛෂීන් මැරිලා අඬන හැටි, ණය තුරුස් නින්දා අපහාස විඳන හැටි වශයෙන් ලෝකය හදාගෙන දුක් විඳිනවා කියලා දකිනවා.

අතීතයේ දීත් ඕකම තමයි කර ගෙන තියෙන්නේ. කිසි කතාවක් නැහැ. එහෙන් පිටින් ම මේ පටිච්චසමුප්පාදයේ අංග සෙට් එක උස්සලා තියෙන එකයි තියෙන්නේ. අනාගතයේ දීත් වෙනවා නම් ඕක ම තමයි වෙන්නේ. ආයේ කිසි සැකයක් නැහැ මේ සිද්ධිය වෙනවා ම යි කියලා. ඒක ම යි බය එයාට.

ධර්මයක් අහලා නැති කාලේ මේ ලෝකේ ඇත්තම යි කියලා නෙමෙයිද අපි ජීවත් වුණේ. ගැහැණු, දරුවෝ, අසල්වැසියෝ, දන්න හඳුනන අය එක්ක ගනුදෙනු කරමින්, ගෙවල් හදමින්, ඉඩකඩම් ගනිමින්, ඒවා ගන්න බාධා කරන අයට ගහමින් බනිමින් ලෝකය ඇත්ත කරගෙන ම නේ අපි ජීවත් වුණේ.

ඒ ලෝකය ඒ විදිහට ම හැමදාම ඇත්ත වෙනවා අවිද්‍යාව තිබ්බොත්. ඒක ම දුකක් පුතේ. ඒ හින්දා, මෙහෙම අවස්ථාවක් (ක්ෂණ සම්පත්තියක්) ලැබෙනවා කියන්නේ ආයේ ඉතින් කියලා වැඩක් නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ චතුරංග සමන්නාගත වීර්‍යය ගැන.

---

166 https://tipitaka.lk/ap-dhs-4-2/pali - **හේතු ගොච්ජකය- නික්ෂේපකාණ්ඩය- ධම්මසඞ්ගණිප්‍රකරණය- 402 පිටුව**

"අපපටිවානං පදහිස්සාම, කාමං තචෝ ච නහාරු ච අට්ඨී ච අවසිස්සතු සරීරේ, උපසුස්සතු මංසලෝහිතං, යං තං පුරිසථාමෙන පුරිසවීරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා වීරියස්ස සන්ථානං භවිස්සතීති. එවං හි වෝ භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති".[167]

"මගේ ශරීරයේ මස් ලේ වියළේවා. සම් නහර ඇට ඉතිරි වෙතොත් ඉතිරි වේවා. පුරුෂ වීර්යයකින්, පුරුෂ ධෛර්යයකින්, පුරුෂ පරාක්‍රමයකින් යමකට පැමිණිය යුතු නම් ඊට නොපැමිණ මම මේ උත්සාහය නතර කරන්නේ නම් නැහැ ම යි කියලා වීර්ය කළ යුතුයි කියනවා. මහණෙනි, ඒ වගේ වීර්යයකින් හිටිය හින්දා තමයි මම එදා සම්මා සම්බුද්ධත්වයට පත් වුණේ" කියනවා.

හිතන්නකෝ එතකොට කොහොම වීර්යයක් ද යොදවන්න ඕනේ කියලා. එහෙම වීර්යවන්ත කෙනාට ජීවිතය කෙරෙහි, කය කෙරෙහි අපේක්ෂාවක් නැහැ. කාය, ජීවිත දෙකේ අපේක්ෂා රහිත යි. අන්න එහෙම උත්සාහවත් වෙලා තමයි පටිච්චසමුප්පාද චක්‍රය ගලවලා ඉවත් කරන්න වෙන්නේ.

ඔන්න ඔය සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන සංයෝජන තුන චතුරාර්ය සත්‍යය අවබෝධයත් සමඟ ම ප්‍රහාණය වෙනවා. ඒ සංයෝජන තුන චතුරාර්ය සත්‍යය අහන්නේ නැතුව, ඉගෙන ගන්නේ නැතුව, චතුරාර්ය සත්‍යය ගැන ප්‍රඥාවෙන් දකින්නේ නැතුව මොන තරම් උත්සාහ වුණත්, මොන තරම් සමාධියක් තිබ්බත් ඔය කෙලෙස් ටික නැති කරන්න බැහැ.

චතුරාර්ය සත්‍යය දකින කොට සක්කාය දිට්ඨිය, බුද්ධාදී අටතැන් ගැන සැකය (විචිකිච්ඡාව), සිල්ව්‍රත පරාමර්ශනය, ඉබේම වෙහෙසක් නැතුව ගෙවිලා යන කෙලෙස්. චතුරාර්ය සත්‍යය දැක්ක කෙනාට කියනවා 'සෝතාපන්න' යි කියලා.

---

167 https://tipitaka.lk/an-2-1-1-5 - **උපඤ්ඤාත සූත්‍රය- වස්සූපනායිකා වර්ගය- දුකනිපාතය- අඞ්ගුත්තර නිකාය- 100 පිටුව**

ඊට පස්සේ, කාම වස්තු කෙරෙහි ඇති රාගය, අමනාපයෙන් ගැටෙන ගතිය කියන කාමරාග හා පටිඝ කියන දෙක බොහොම උත්සාහයෙන් හා වීර්‍යයෙන් ගෙවාගන්න ඕනේ. කාමරාග, පටිඝ කියන සංයෝජන දෙක ගෙවාගන්න වෙහෙස වෙන කොට මුලින් ම ඕළාරික මට්ටමේ කාමරාග හා පටිඝ දෙක ගෙවෙනවා. එතකොට කියනවා 'සකෘදාගාමී' කියලා. කාමරාග පටිඝ දෙක ඉතුරු නැතිව ම සමුච්ඡේද ප්‍රහාණයට ලක් වුණා ම කියනවා 'අනාගාමී' කියලා.

ඊට පස්සේ ප්‍රහාණය කරන්න තියෙනවා රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිද්‍යා කියන කෙලෙස් ටික. කාම වස්තූන්ගේ රාගය වගේ ම රූප භවයේ උප්පත්තියට ඇලෙනවා. අරූප භවයේ උප්පත්තියට ඇලෙනවා. ඒකෙත් 'මම' කියලා මානය තියෙනවා.

ඒ මට්ටමෙත් තියෙනවා උඩඟුකමක්. ඒකට තමයි උද්ධච්ච කිවුවේ. ඒක හිතේ විසුරුණුකම නෙමෙයි, උඩඟුකම. ඒ කියන්නේ මට මේ වගේ තැනකට එන්න පුළුවන් වුණා, ලෝකේ ඔක්කොටම වඩා මම උසස් තැනකට ආවානේ කියලා සියුම් උඩඟුකමක් තියෙනවා අනාගාමී වුණත්. අනික් කෙනෙකුට ලෙහෙසියකට එන්න බැරි තැනකට මම ඇවිල්ලා ඉන්නවා නේ වගේ තැනකින් අනාගාමී කෙනාටත් සියුම් උඩඟුකමක් තියෙනවා. ඒකත් කෙලේසයක්.

කෙනෙක්ව මරන්න කපන්න කොටන්න තරම් උඩඟු චරිතයක් නෙමෙයි. හිතේ ප්‍රමෝදයත් එක්ක ඇතිවෙන ගතියක් ඒක. අනික් කෙනෙකුට පහසුවෙන් එන්න බැරි තැනකට මට එන්න පුළුවන් වුණා නේ කියන සියුම් උඩඟු බවක් තියෙනවා එතන. මෙන්න මේ සංයෝජන පහ හොඳට වීර්‍යය කරලා තව දුරටත් සමාධියෙන් ගෙවලා දානවා.

දස සංයෝජන ගෙවිලා තියෙන කොට ගෙවිලා තියෙන්නේ ආස්‍රව. ආස්‍රව ගෙවෙන කොට ගෙවිලා තියෙන්නේ පංච උපාදානස්කන්ධ ලෝකය. නිරුද්ධ වෙලා තියෙන්නේ පංච උපාදානස්කන්ධ ලෝකය.

රහතන් වහන්සේට මේ කය කෙරෙහි ඉඹේ ම පිහිටලා සිහිය. රහතන් වහන්සේගේ සිහිය කය අනුව ගිය සිහියක් ම යි. උන්වහන්සේට ලෝකේ නිමිති නැහැ, ආස්‍රව නැහැ, කෙලෙස් නැහැ. ලෝකේ කිසිම දෙයක් අල්ලගෙන නැහැ. භවයට අත තියාගෙන නැහැ. තමන් එක්ක ම ඉන්නවා. අන්න 'මුණි' කියලා කියනවා, 'බ්‍රාහ්මණයා' කියලා කියනවා තණ්හාව නැති කළ කෙනාට.

අන්න ඒ තැනට නුවණක් තියෙන වීර්‍ය තියෙන ඕනෑම කෙනෙකුට එන්න පුළුවන්, මාර්ගය හරියට පෙන්නන්න පුළුවන් ක්‍රමවේදය තිබ්බොත්. නිවැරදි ක්‍රමවේදය තිබ්බොත් මට කරන්න තියෙන්නේ මෙන්න මේකනේ කියන දැක්මක් එනවා. එයා ඊට පස්සේ වීර්‍ය කරනවා ඉක්මනට භවය ගෙවාගන්න. මොකද, භවය කියන එක එච්චරට හානිකරයි. ඔය භවය (ලෝකය) තිබුණොත් දැන් ද දුක් විඳිනවා.

භවය නිසා ආපහු විඤ්ඤාණය හීන ධාතුවේ හෝ ප්‍රණීත ධාතුවේ පිහිටනවා. හැබැයි ලෝකය අරගෙන යන්නේ නැහැ. විඤ්ඤාණය අකුසල සහගත නම් හීන ධාතුවේ පිහිටනවා. විඤ්ඤාණය කුසල සහගත නම් ප්‍රණීත ධාතුවේ පිහිටනවා. එතනත් එයා හිටියා නම් එහෙම ම ඉවරයි. නමුත් ආයෙත් අවිද්‍යාව සක්‍රීය වෙලා උපාදානයට හිත විදිහට හිතලා ඇහැ, කන, නාසය, දිව, කය උපද්දවාගෙන ඒකට තණ්හා උපාදාන වෙලා දිව්‍ය ලෝකේ හදා ගන්නවා, මනුස්ස ලෝකේ හදා ගන්නවා, බ්‍රහ්ම ලෝකේ හදා ගන්නවා.

ඊට පස්සේ මනුස්සයෙක් විදිහට හැසිරිලා හෝ දෙවියෙක් විදිහට හැසිරිලා හෝ බ්‍රහ්මයෙක් විදිහට හැසිරිලා ආයෙත් කර්ම රැස් කර ගන්නවා. ඒ කර්ම භවය නිසා ආපහු විඤ්ඤාණය හීන ධාතුවේ හෝ ප්‍රණීත ධාතුවේ පිහිටනවා. ඔන්න ඕකයි කතාව.

පටිච්චසමුප්පාදය මම තව පැත්තකින් කිවුවේ ඕගොල්ලොන්ට මනස තව ටිකක් නිබර වෙන්න. සෝවාන් ආර්‍ය ශ්‍රාවකයා දකිනවා, **"මට ඔය නැතුව**

ම කියන්න පුළුවන් මං දැන් අපායට යන්නේ නැහැ”[168] කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ සෝවාන් ආර්ය ශ්‍රාවකයා ගැන.

ඒ මොකද? එයා දුක, දුක ඇතිවීම, දුක නැතිවීම, දුක නැති කරන මඟ දකිනවා. පෙර ගැන සැක නැහැ. අනාගතය ගැන සැක නැහැ. දැන් ගැන සැක නැහැ. ලෝකයත්, ලෝක සමුදයත්, ලෝක නිරෝධයත් දකිනවා. එයා දකිනවා මම සේඛ භූමියට ඇවිල්ලා ඉන්නේ කියලා.

පෘථග්ජන ලෝකයාට දකින්න බැරි දුකේ නිරෝධය තියෙන තැනට මට දැක්මක් තියෙනවා කියන එක ගැන තමන්ට ම ප්‍රත්‍යවේක්ෂා කළ හැකි එයාට. තේරෙනවා නේද? අන්න එබඳු කෙනාට මාර්ගය උපන්නා. ඊට පස්සේ මාර්ගය වඩන්නයි තියෙන්නේ. මාර්ගය වඩන කොට ඉතුරු ආස්‍රව ධර්මත් ක්ෂය වෙනවා, අනුසය ගෙවිලා යනවා. කළ යුත්ත කළා, මත්තේ කළ යුත්තක් නැහැ කියන තැන දැක්මක් එයි.

මම තව ටිකක් කල් භාවනා කරලා එන්න කියලා හැදුවේ. ඒත් මට හිතුනා මිනිස්සුන්ගේ ජීවිතය ගැන කියන්න බැහැ නේ. මෙච්චර ළඟට ඇවිල්ලා මේ ටික අහගන්නේ නැතුව එක් කෙනෙක් හෝ මෙතනින් මැරුණොත් හරි අපරාධයක් නේ කියලා හිතිලා තමයි මම මේ ටික කියලා දෙන්න ආවේ.

මේ ටික පුතේ අහගත්ත පමණකිනුත්, උඹලාගේ ජීවිතවලටත් රැකවරණයක්. ලෙහෙසියකට දුගතියකට යන්නේ නැහැ. රත්තරන් කියන එක ගෑවෙන ගෑවෙන තැන රත්තරන් වෙනවා වගේ මේක අහගත්ත පමණකිනුත් යහපතක් වෙනවා. නමුත් ඊට වඩා වැඩි යහපතක් කර ගන්න හැමදෙනා ම උත්සාහවත් වෙන්න. දැන් මම හිතනවා ඕගොල්ලොන්ට ලොකු ප්‍රශ්න ගැටළු නැතිව ඇති කියලා. කළ යුත්තේ මොකක් ද කියලා තේරෙනවා ඇති නේද.

මම හෙට උදේ යන හින්දා මට අද තව ටිකක් හිටිය හැකි. එහෙනම් පැය කාලක් භාගයක් විතර පොඩ්ඩක් ඇවිදලා ගිලන්පස වළඳලා ආයේ එන්න. එතකොට ආයේ ටිකක් භාවනා කරමු. භාවනා කරලා ආයේ අවශ්‍ය

168 https://tipitaka.lk/an-5-4-3-9/sinh - **ගිහි සූත්‍රය- උපාසක වර්ගය- පඤ්චකනිපාතය- අඞ්ගුත්තර නිකාය 3- 343 පිටුව**

කාරණා කතා කරමු. මටත් ගිලන්පස ටිකක් හදාගෙන එන්න. ඔහොම ම කැමති කට්ටිය ගිලන්පස ටිකක් වළඳන්න. නැත්නම් කැමති කට්ටිය මෙතන හරි එළියේ තැන් තැන්වලට ගිහිල්ලා හරි භාවනා කරලා 09.30 ට එන්නකෝ.

හැම දෙනාට ම තෙරුවන් සරණයි!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2023.03.04 දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසන වාසී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සිදු කළ ධර්ම දේශනාවක් ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අපි ඔය කතා කරපු දර්ශනයේ මහා අමුතු අරුමයක් නෙමෙයි තියෙන්නේ. වෙනදාටත් වඩා ගොඩක් පහසුයි කියලයි මට නම් තේරෙන්නේ. ඒ කියන්නේ මහා විශාල ගොඩක් නැහැ අපිට දැන ඉගෙන ගන්න, සංකීර්ණ කිසිම දෙයක් නැහැ. අපිට අපේ ජීවිතය හඳුනා ගන්නයි තියෙන්නේ මෙතන දී මේ කතා කරන දේ තුළින්.

ඒකෙන් විශේෂයෙන් ම කාරණාවක් මම මතක් කළේ, අපිට හැම වෙලාවේ ම ජීවත්වෙන ලෝකයක් තියෙනවා නේ. ඒ කියන්නේ දෙමව්පියෝ, සහෝදරයෝ, නෑදෑ හිත මිත්‍රාදී කියලා අපිට යන්න එන්න වෙන පොළොවක්, ලෝකයක් තියෙනවා නේ.

ඔය හම්බවෙන ලෝකය තමයි කර්ම භවය කියලා කියන්නේ. ඕක අපි හැම කෙනෙක් ම උප්පත්ති වශයෙන් එන කොට තිබුණ එකක් නෙමෙයි. අපි උප්පත්ති වශයෙන් එන කොට අරගෙන ආවේ ඇහැ, කන, නාසය, දිව, කය, මනස කියන ආධ්‍යාත්මික ආයතන ටික විතරයි.

~ ලෝකය හැදෙන හැටි ~

මීට ඉස්සෙල්ලා දවසක මම දේශනාවක් කළා මතකද, පුරාණ කර්මයට හටගත්ත විපාක ටික හරියට නිවෙන්න ඔන්න මෙන්න තියෙන පහනක් වගේ කියලා. ඒ කියන්නේ ඇහැට රූපයක් පෙනෙනවා. ඒකට තියෙන හේතු ටික නැතිවෙන කොට නැති වෙනවා.

ඒ සිද්ධියේ දී අපිට එක දෙයක් අල්ලගෙන හිතීම්, කීම්, කිරීම් කරන මට්ටමක් අපිට තිබුණේ නැහැ. යමක් පෙනෙනවා කියන ටික වෙනවා. ඒ කියන්නේ සීමා නොකරන ලද මනසක්/ පොදු මනසක් තිබුණේ. අපි කුඩා කාලේ ඔය වගේ මට්ටමක් තිබුණේ.

ඊට පස්සේ අපි ටිකක් ලොකුවෙන කොට තමයි, අවිද්‍යාව නිසා තණ්හා උපාදාන කරන්න පුළුවන්වන විදිහට අරමුණු සීමා කරලා අරගෙන ඒවා තුළ හැසිරිච්ච හින්දයි මේ ලෝකය හැදිලා තියෙන්නේ කියන කතාවක් මේ කියන්නේ.

සීමා නොකරන ලද මනස කියලා කිවුවහම, අද අපිට ඒක තේරෙන්නේ නැහැ. අද අපිට තවම ආස්‍රව සහිත මනසක් තියෙන නිසා සීමා නොකරන ලද මනසක වූ ශූන්‍යතාවයේ තියෙන ගැඹුර ගැන තේරෙන්නේ නැහැ. කිසිම දෙයකට හසුවෙන්නේ නැතුව පොදුවේ පෙනෙනකම කියන එක අතිශය ගැඹුරු සිද්ධාන්තයක්.

ගැඹුරු සිද්ධාන්තයක් කියලා කියන්නේ සම්පූර්ණ ම පෙනෙනවා කියන සිද්ධිය විතරයි ඉතුරු වෙන්නේ. නමුත් අද එහෙම පෙනීම සිද්ධවන තැන ‘මම ඉන්නවා’ කියන හැඟීමක් අපිට Background එකකින් (පසුතලයකින්) තියෙනවා නම් ඒ ටික සම්පූර්ණයෙන් ම කෙලේසයක්. ඒ කෙලෙස් ගෙවුනහම සීමා නොකරන ලද මනස කියන තැන අතිශය ගැඹුරු ශූන්‍යතාවයක් බවට පත් වෙනවා.

එහෙම තැනකට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ. ඒ ශූන්‍යතාවය අද අපිට තේරෙන්නේ නැහැ. අපිට තේරෙන්නේ, ‘මේ මට කිසිම නිමිත්තක් නැති බවට පෙනෙනකම නේ’ වගේ තැනකින් නේ. නමුත් සීමා නොකරන ලද මනස කියන තැනදී, පෙනීම පෙනීම් මාත්‍රයක් විතරයි, ‘මට පෙනෙනවා’ නෙමෙයි, එතන තියෙන්නේ සත්ත්ව පුද්ගල ආත්මභාවයෙන් තොර අතිශය ගැඹුරු ශූන්‍යතාවයක්.

සීමා නොකරන ලද මනසේ ඉඳලා අපිට කිසිම අරමුණකට තණ්හා උපාදාන ආදී කෙලේසයක් ඇති කර ගන්න බැහැ, කර්ම රැස් කර ගන්න

බැහැ. පටිච්චසමුප්පාද සිද්ධියෙන් පෙන්වන අවිද්‍යා, සංඛාරයෙන් කළේ අපිට කෙලෙස් ඇති කර ගන්න පුළුවන් විදිහට අරමුණු සීමා කර ගන්න එක. තව විදිහකට කිවුවොත් අවිද්‍යා, සංඛාරයෙන් කරනවා, උපාදාන වෙන්න හිත විදිහට අරමුණක් හදන එක.

අවිද්‍යාවෙන් සීමා කරලා ගන්න කොට ම ආස්‍රව එනවා ගලාගෙන. අවිද්‍යාව නිසා බොහෝ කල් සිට පැවත එන කෙලෙස් හුරු (ආස්‍රව) ටික ටක්ගාලා එනවා. අපි උදාහරණයකට කියමු; සීමා කරලා අරන් බලන කොට ම ෆෝන් එක කියන එක ටක්ගාලා අපිට සිහි වෙනවා. මීට කලින් ෆෝන් එක කියලා ඉගෙනගෙන තිබුණේ නැතිනම් 'දෙයක්', 'හොඳයි නේ' කියන ගති ටික හෝ එනවා මනසට.

සීමා කර ගත්තට පස්සේ 'ෆෝන් එක' කියලා ප්‍රඥප්තියක් ඇති වුණත් එකයි, 'හොඳයි' කියනකම ඇති වුණත් දෙක ම එකයි. දෙක ම ප්‍රඥප්තියක්. මම ෆෝන් එක කියලා දන්නේ නැහැ, හැබැයි 'දෙයක්', 'මේක වටිනවා නේ' කියන තැනකින් හැඟුනහම මම එතනින් අහකට යන කොට බාහිර පැත්තේ මෙන්න මෙහෙම වටිනා කියන දෙයක් තියෙනවා වගේ කියන තැනකින් තමයි අපේ මනසේ නිමිත්ත තියෙන්නේ.

නමුත් ඇත්ත ම කතාව තමයි, තමන් ම යි පෙනෙනකම උපද්දන්නේ. තමන් ම පෙනෙනකම හදලා තමන් ම පෙනෙනකමට ඇලිලා මේ තියෙන්නේ. එතනින් අහකට යන කොට ම තමන් ම හදාගත්ත පෙනෙනකමත් නැති වෙනවා, තමන් හිතුව කියපු කරපු දේත් නැති වෙනවා. නමුත් අවිද්‍යාවට පෙන්නන්නේ තිබුණු දේකට මම ඇලුනා වගේ.

රූප ගොඩක් මෙහෙම තියෙන කොට, තියෙන එක රූපයක් සීමා කරලා අරගෙන තණ්හා කෙරුවා වගේ නම් හිතෙන්නේ, එහෙම සිද්ධියක් නෙමෙයි පටිච්චසමුප්පාදයෙන් පෙන්වන්නේ. අවිද්‍යා, සංඛාරයෙන් ඇහැයි, මේ විදිහට පෙනෙන රූපය යි තමන් ම හදා ගන්නවා. එතකොට ඒ විදිහේ සටහනක් ශූන්‍යතාවය තුළ (සීමා නොකරන ලද මනසේ හිටියා නම්) නැහැ.

තමන් ම සීමා කරලා දැන් වර්ණ සටහනක් පෙර නොතිබීම හදා ගන්නවා. හැබැයි තමන් තීන්දු තීරණ ගන්නේ බැහැර තියෙන දේකට වගේ යි.

එහෙම හිතලා ඉවරවෙලා අහකට යන කොට තමන්ට **දෙවැන්නෙක් නිර්මාණය වෙනවා.**[169] ඒ කියන්නේ තව බැහැර දෙයක් තියෙනවා වගේ තැනකින් තමයි තේරෙන්නේ. තමන් ම උපද්දලා, ඒ තුළ තමන් ම කෙලෙස් වශයෙන් ඇසුරු කරපු සිද්ධියක් නේද තියෙන්නේ කියන එක අහුවෙන්නේ නැහැ අපිට.

පටිච්චසමුප්පාද සිද්ධිය යි ඕගොල්ලෝ ඔය කෙටි කරලා විදර්ශනා කරන්නේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර නිසා පංච උපාදානස්කන්ධය හටගන්නවා කියලා බලන කොට. එතකොට දැන් ඕගොල්ලෝ දන්නවා, කෙටි කරලා කැටි කරලා සමස්තයක් වශයෙන් අද අපිට අම්මා, තාත්තා, ගෙවල් දොරවල් කියලා ගොඩක් වටිනාකමට සිහි කරන්න පුළුවන් ලෝකයක් තියෙනවා නම් ඒක උප්පත්ති වශයෙන් අපි එන කොට තිබුණේ නැහැ.

අපි උපාදානයට හිත විදිහට අවිද්‍යා සංඛාරයෙන් සීමා කරලා අරගෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම හදලා ඒවාට තණ්හා උපාදාන කරපු හින්දයි මෙහෙම මෙහෙම නිමිති හැදිලා තියෙන්නේ කියන කාරණාවක් දළ වශයෙන් පෙන්වනවා. ඒ කියන්නේ ඕගොල්ලොන්ට පෙන්වනවා, **පුරාණ කර්මයට විපාක වශයෙන් උප්පත්ති වශයෙන් එන කොට ආධ්‍යාත්මික ආයතන ටික විතරයි ගෙනාවේ.**[170] සීමා නොකරන ලද මනසක්, ශූන්‍යතාවයක් තිබුණේ. ඒක නිමිති රැස්වෙන තැනක් නෙමෙයි.

~ සීමා කළ මනස~

අපි නිකමට මෙහෙම ගත්තොත් පුතේ, ඔය ටයිල් කැටවල හතරැස්ව තියෙන විදියකට පෙනෙන්න අපි හිත තිබ්බොත් අපිට එහෙම නේ පේන්නේ.

---

169 https://tipitaka.lk/sn-4-1-7-1/sinh - **මිගජාල සූත්‍රය- මිගජාල වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 81 පිටුව**

170 https://tipitaka.lk/sn-4-1-15-1/sinh - **කම්ම සූත්‍රය- නවපුරාණ වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 267 පිටුව**

එතකොට මේ දිගට දිගට පෙනෙන විඳිහට හිත තැබුවොත් අර කොටු කොටු වගේ පෙනුණ රූපයට මොකද වුණේ? ඉතුරු නැතිව ම නැති වෙනවා.

එතකොට මේ දිගට දිගට පෙනෙන එක අලුතෙන් ම හදාගත්ත එකක්. හොඳට බලන්න, සීමා නොකරන ලද මනසින් ගත්තහම පෙනෙනවා මිසක අර වගේ හතරැස්ව ද පේන්නේ, දිගැට හැඩය ද පෙන්නේ කියලා එකක් නැහැ. නමුත් මට ඕනේ නම් හිත තියලා අලුවා කැටේ හැඩයට බලාගෙන යන්න පුළුවන් රූප ටිකක්.

ඊගාවට ඕනේ නම් දිගට බලාගෙන යන්න පුළුවන්. මේ අතට හතරැස් හැඩයට බලන්න පුළුවන්. කොටු දෙක දෙක අල්ලලා බලන්න පුළුවන්. කොටු හතර හතර අල්ලලා බලන්න පුළුවන්. එතකොට එක හැඩයකට අපි හිත හදලා එබඳු රූපයක් ඇහෙන් හදලා තමයි අපි බලන්නේ.

අළුත් විඳිහකට හිත හදලා බලන කොට ඉස්සෙල්ලා බලපු රූප සටහන නැහැ. මම ආපහු මේ ඔක්කොම පේන මට්ටමට (සීමා නොකරන ලද මට්ටමට) එන කොට කලින් යම් විඳිහකට ද සීමා කරලා බැලුවේ ඒ සිද්ධිය නැහැ එතකොට. ඒකෙන් මම කිවුවේ, සීමා නොකරන ලද මනසකින් අපි උප්පත්ති වශයෙන් ආවේ. ලෝකයක් හැදිලා තිබුණේ නැහැ එතකොට.

අවිද්‍යා කර්මයෙන් කරන්නේ උපාදානයට හිත විඳිහට රූප නිමිත්තක් තනි කරලා අල්ලගන්න එක. එතකොට ඒක අලුතෙන් ම හදන්නේ. ඇහැත්, ඇහැ සීමා කරලා හදන රූපයකුත්, පෙර නොතිබීම චක්ඛු විඤ්ඤාණයත්, ඒ තුන්දෙනාගේ එකතුව නිසා ස්පර්ශ ප්‍රත්‍යයෙන් හටගන්න වේදනා, සංඥා, සංඛාර කියන ස්කන්ධ පංචකය ම හදන්නේ අලුතෙන්.

එහෙම හදාගෙන, ඒකට තමයි අපි ‘පුද්ගලයෙක්’, ‘දෙයක්’, ‘ආත්මයක්’ කියලා තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ඇසුරු කරලා ආපහු සීමා නොකරන ලද මනසට එනවා.

~ අපි ම හදාගත්ත දෙයට තණ්හා කිරීම ~

මෙහෙම සිද්ධියක් වෙන කොට අපිට තේරෙන්නේ නැහැ අවිද්‍යාව නිසා අපි ම හදාගත්ත එකකට අපි තණ්හා කෙරුවා කියලා. අපි ඕක මෙහෙම ගත්තොත්; ඇහැත්, බාහිර ශුද්ධාෂ්ටක මට්ටමේ රූප කලාපවලට ආලෝකය වැටිලා අපේ ඇහැට එන වර්ණ රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණ මට්ටමෙන් පෙනෙනකම හඳුනවා.

අපි ම පෙනෙනකම හදාගෙන ඒකට අපි 'පුද්ගලයෙක්', 'කෙනෙක්', 'දෙයක්' හැටියට හිතනවා. එහෙම හිතලා එතනින් අපි අහකට යනවා. අපි ම පෙනෙනකම හදලා ඒකට අපි ම ඇලුනා නේද කියලා දන්නේ නැතුව, බැහැර තියෙන එකකටයි අපි ඇලුනේ වගේ තැනකින් තමයි අපිට භවය හිටින්නේ.

බාහිරයේ තියෙන රූප මේ ඇහෙන් බලන්න අරගෙන ඒවාට තණ්හා උපාදාන කරලා අපි අහකට යන කොට ඇහැ නැති වෙනවා, නමුත් රූපය ඉතුරු කරනවා වගේ සිද්ධියක් නෙමෙයි මේකෙන් කියන්නේ. ඒ කියන්නේ චක්ඛු විඤ්ඤාණ මට්ටමෙන් පෙනෙනකම තමන් ම යි හදාගන්නේ. එතකොට රූපයක් පෙනෙනවා කියන සිද්ධාන්තය තමන් ම සීමා කරලා හදාගෙන තමන් ම ඒ පෙනෙන දේට තණ්හා උපාදාන වශයෙන් 'පුද්ගලයෙක්', 'ආත්මයක්', 'සත්ත්වයෙක්', 'දෙයක්' කියලා හිතනවා.

හිතලා අපි එතනින් අහකට යනවා. එතකොට අපිට හිතෙන්නේ බාහිර සත්ත්වයෝ, පුද්ගලයෝ, දේවල් කාරණා තියෙනවා වගේ. ඕකට තමයි භවය කියන්නේ. එතකොට අපි බෝලයක් ඇතුළේ වගේ ඉන්නේ මේ. අපි ම පෙනෙනකම උපද්දලා, ඒකට කෙලෙස් ඇති කර ගත්තා කියලා පෙන්නන්නේ නැතුව බාහිර තියෙන රූපයකට යි මම 'කෙනෙක්', 'පුද්ගලයෙක්', 'දෙයක්' හැටියට හිතුවේ කියන තැනකින් තමයි අවිද්‍යාවෙන් පෙන්වන්නේ.

ඔය කතාව තමයි අන්තිමට බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ; **"ඇහැ ලෝකය යි, රූප ලෝකය යි, චක්ඛු විඤ්ඤාණය ලෝකය යි, කන ලෝකය යි, ශබ්දය ලෝකය යි, සෝත විඤ්ඤාණය ලෝකය යි, නාසය ලෝකය යි, ගන්ධය ලෝකය යි, ඝාන විඤ්ඤාණය ලෝකය යි, දිව ලෝකය**

යි, රස ලෝකය යි, ජිහ්වා විඤ්ඤාණය ලෝකය යි, කය ලෝකය යි, ඵොට්ඨබ්බය ලෝකය යි, කාය විඤ්ඤාණය ලෝකය යි, මන ලෝකය යි, ධම්ම ලෝකය යි, මනෝ විඤ්ඤාණය ලෝකය යි" කියන එකෙන්.[171]

සමස්තයක් වශයෙන් කෙටි කරලා, කැටි කරලා ගත්තහම ඕකෙන් කියන්නේ එක දෙය යි. කිසිම දේකට සීමා නොකරන ලද මනසක් ඇතුව ඇහැ, කන, නාසය, දිව, කය කියන අධ්‍යාත්මික ආයතන ටික ඇතුව අපි උපන්නේ. ඕකට කියනවා විපාක නාමරූප දෙක කියලා.

- **ඒ විපාක නාමරූප දෙක පරිහරණය කරන කොට, මේ ආයතන ටික එන්න එන්න මුහුකුරා යන කොට අවිද්‍යාව නිසා** [172]**,** අපි උපාදානයට හිත විදිහට ඇහැ උපදින, රූපය උපදින, කන උපදින, ශබ්දය උපදින විදිහට මෙනෙහි කරලා, *("අවිජ්ජාපච්චයා සඞ්ඛාරා")*
- ඇහැ උපදවාගෙන, රූපය උපදවාගෙන, කන උපදවාගෙන, ශබ්දය උපදවාගෙන, ඒවා ස්පර්ශයෙන් වේදනාව උපදවාගෙන, *("සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සෝ, ඵස්සපච්චයා වේදනා")*
- ඒවාට තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ඇසුරු කරපු හින්දයි භවය/ ලෝකය හැදුණේ *("වේදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවෝ")* කියන එක පෙන්වනවා.

එතකොට භවය/ ලෝකය කියන එක අපි උප්පත්ති වශයෙන් ආපු තැන නෙමෙයි. උපන්නට පස්සේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හදාගත්ත එකක් කියලා කියනවා ඔය න්‍යායයෙන්. ඒ හින්දා අපිට භවය නිරුද්ධ කරන්න පුළුවන්.

---

171 https://tipitaka.lk/sn-4-1-7-6/sinh - **සම්බුදු ලෝකපඤ්ඤ සූත්‍රය- මිගජාල වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 89 පිටුව**

172 https://tipitaka.lk/kn-ps-1-1-4/sinh - **ධම්මට්ඨිති ඤාණය- ඤාන කථා- පටිසම්භිදාමාර්ගය- බුද්ධක නිකාය- 101 පිටුව**

~ ලෝකය තිබ්බොත් තියෙන දෝෂය ~

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, භවය තිබුණොත් සිද්ධවන දෝෂය. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර ප්‍රත්‍යයෙන් භවය (ලෝකය) හදාගත්තට පස්සේ, ඔය හදාගත්ත ලෝකේ තිබුණහම තියෙන දෝෂය තමයි දැන් ද ඒ නිසා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස්, ප්‍රිය විප්පයෝග දුක්, අප්‍රිය සම්පයෝග දුක් ආදී සියලු දුක් විඳින්නත් වෙනවා.

මොකද ඔය ලෝකය ඇතුළේ නෑදෑයෝ ඉන්නවා, වටිනා කියන දේපළ වස්තුව තියෙනවා, ඉඩකඩම් මිල මුදල් තියෙනවා. ඒ විතරක් නෙමෙයි ඕක කර්ම භවය නිසා ඔය ලෝකේ තියෙන නිමිත්තක් මුල් කර ගෙන ප්‍රතිසන්ධි වශයෙන් නැවත උප්පත්තියක් කරා යන එක නවත්තන්න බැහැ ම යි. ඒ කියන්නේ ***"භවපච්චයා ජාති"*** [173] වෙනවා කියන එක නවත්තන්න බැහැ ම යි, ඒකයි ඕකේ තියෙන දෝෂය.

~ අපි උප්පත්ති වශයෙන් ආපු තැන තිබුණු යථාර්ථය ~

පුරාණ කර්මයට ඇහැ හැදිලා සීමා නොකරන ලද මට්ටමෙන් පෙනෙන, පුරාණ කර්මයට කන හැදිලා සීමා නොකරන ලද මට්ටමකින් ඇහෙන, පුරාණ කර්මයට නාසය හැදිලා සීමා නොකරන ලද මට්ටමෙන් ගන්ධයන් දැනෙන, පුරාණ කර්මයට දිව හැදිලා සීමා නොකරන ලද මට්ටමෙන් රස දැනෙන, පුරාණ කර්මයට කය හැදිලා සිමා නොකරන ලද මට්ටමෙන් ඵොට්ඨබ්බ දැනෙන යථාභූත වශයෙන් පවතින ස්කන්ධ ටිකක් තිබුණා.

ඒවා උපාදාන වෙන්න හිත බවක් තිබුණේ නැහැ. ස්කන්ධ ටිකක් තිබුණේ. එහෙම වූ තැනක අවිද්‍යාව නිසා උපාදානයට හිත විඳිහට අරමුණු උපදින විඳිහට හිතලා තමයි අපි මේ පෙනෙන, ඇහෙන, දැනෙන අරමුණු

---

173 https://tipitaka.lk/ap-vbh-6-1/pali - **සූත්‍රාන්තභාජනීය- පටිච්චසමුප්පාද විභඞ්ගය- විභඞ්ගප්‍රකරණය- 246 පිටුව**

උපද්දවාගෙන ඒවාට තමයි අපි 'පුද්ගලයෝ', 'දේවල්', 'අම්මලා', 'තාත්තලා' කියලා නිමිති හදාගෙන තියෙන්නේ කියන කාරණාව පෙන්වනවා.

කර්ම භවය කපලා, ආපහු පුරාණ කර්මයට හටගත්ත සීමා නොකරන ලද මනසට ඇවිල්ලා වාසය කරන්න පුළුවන් වුණොත්, අද ද ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස්වලින් මිදෙනවා. ඒ විතරක් නෙමෙයි මතු ප්‍රතිසන්ධියත් ඉවරයි. ඇයි?

පුරාණ කර්මයට හටගත්ත විපාක ටික ඉවරවෙන කොට නැවත ප්‍රතිසන්ධි වශයෙන් යන්න හේතුවන නව කර්ම භවයක් නැහැ, ලෝකයක් නැහැ, යන්න මව් කුසක් නැහැ, ඉපදෙන්න පොළොවක් නැහැ. නමුත් අද අපිට ලෝකය ඇතුළේ අම්මලා ඉන්නවා, තාත්තලා ඉන්නවා, ජීවත් වෙන්න ලෝකයක් තියෙනවා, ජීවත් වෙන්න පොළොවක් තියෙනවා. ඒ පොළොව නැති කරන්න ඕනේ. ඒ බිම නැති කරන්න ඕනේ.

"කම්මං බෙත්තං, විඤ්ඤාණං බීජං, තණ්හා සිනෙහො" [174]- කර්මය තමයි කෙත, විඤ්ඤාණය තමයි බීජය, තණ්හාව තමයි ස්නේහය. කර්මය නැමති කෙත තිබ්බොත් විඤ්ඤාණය නැමති බීජ පැළ නොවී තියෙන්නේ නැහැ. හොඳයි, විඤ්ඤාණය තිබුණත් කෙත නැති නම් කොහෙද පැළ කරන්නේ?

කර්මය කෙතයි කියන්නේ ඕගොල්ලොන්ට ඇති බවට හැඟෙන ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩකඩම්, මිල මුදල් කියන ක්ෂේත්‍රයට. විඤ්ඤාණයට තණ්හාව ඇතිවෙච්ච ගමන් අම්මා බලන්න යනවා, තාත්තා බලන්න යනවා, ගෙදර යනවා, අරහේ යනවා මෙහෙ යනවා කියලා කරන්නේ තෘෂ්ණාව නැමැති වැහි ජලය එක්ක විඤ්ඤාණය නැමති බීජය කර්මය නැමැති කෙතේ පැළ කරන එක කරන්නේ.

ඔන්න එතකොට ආපහු අම්මාව පේනවා, තාත්තාව පේනවා, ගෙදර පේනවා, පාර පේනවා කියලා උපාදාන ස්කන්ධයෝ උපදිනවා. ඒකයි, කර්ම භවය නැමැති කෙත නැති කළොත් ගති ආගති චුති උප්පත්ති නැහැ.

---

[174] https://tipitaka.lk/an-3-2-3-6/pali - **3. 2. 3. 6- ආනන්ද වර්ගය- තිකනිපාතය- අඞ්ගුත්තර නිකාය 1- 394 පිටුව**

~ කර්මය සහ සත්ත්වයා ~

බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ; ලෝකය කර්මය නිසා පවතිනවා, සත්ත්ව වර්ගයා කර්මය නිසා පවතිනවා, කර්මයෙන් බැඳුණු සත්ත්වයා රථයේ කඩඇණය වගේ කර්මයෙන් යනවා.

"කම්මනා වත්තති ලොකො කම්මනා වත්තති පජා
කම්මනිබන්ධනා සත්තා රථස්සාණීව යායතො".[175]

කරත්තේ රෝදේ කඩඇණය තියෙනකන් යනවා. කඩඇණය ගැලෙව්වොත් වැඩි දුර යන්න බැහැ රෝදේ ගැලවිලා වැටෙනවා. ඒ වගේ කර්මය නිසා කර්මය හේතුවෙන් ම යි යන්නේ. කර්මය නැමති කඩඇණය ගැලෙව්වොත් සංසාර චක්‍රය යන්නේ නැහැ, නවතිනවා.

ලෝකය ඇත්ත ම වෙලා තියෙන්නේ අපිට අද. එහෙම ඇත්ත ම නොවුණා නම් කාම භවයක් (කාම ලෝකයක්) නැහැ. ඔය කාම භවයේ/ කාම ලෝකයේ තියෙන විෂ දෝෂය තමයි ඕකේ ජරා මරණ ශෝක පරිදේව තියෙනවා විතරක් නෙමෙයි. ඕක ප්‍රතිසන්ධියට යන්න තියෙන දොරටුව. ඉතින් ලෝකය නැති නොකළොත් ප්‍රතිසන්ධියට යනවා කියන එක නවත්තන්න බැහැ.

ඒ හින්දා ලෝකය නැති කරන්න පුළුවන් කියන එක පෙන්නනවා බුදුරජාණන් වහන්සේ. ඔය ලෝකය අද අපි ජීවත් වෙලා ඉන්න තැන ම වෙලා වගේ අපිට පෙනුණට බුදුරජාණන් වහන්සේ යථාභූත තැන (විපාක නාමරූප දෙක) පෙන්නලා කියනවා, මෙතනයි උඹලා උප්පත්ති වශයෙන් ආවේ, එහෙම තැනකයි හැදුණේ කියලා.

එහෙම හැදෙන කොට දෙවනුවට මෝඩකම (අවිද්‍යාව), තණ්හාව කියන කෙලෙස් නිසයි ඔය ලෝකේ (භවය) හදාගත්තේ කියලා. ඔය ලෝකය ඇසුරු කරපු හුරුව ගෙවලා, ආපහු සීමා නොකරන ලද මනසට (උප්පත්ති

---

175 https://tipitaka.lk/mn-2-5-8 - **චාසෙට්ඨ සූත්‍රය- බ්‍රාහ්මණ වර්ගය- මජ්ඣිම නිකාය 2- 710 පිටුව**

වශයෙන් ආව තැනට) ඇවිල්ලා ඉන්න කියන කාරණාවක් කෙටියෙන් ගත්තහම මේ කතාවේ කියන්නේ.

එහෙම සීමා නොකරන ලද මනසේ ඉන්න කොට කල් ඇතුව ම කර්ම භවය පැත්ත (ලෝකය) නිරුද්ධ කරලා හින්දා ලෝකෝත්තර නිසා යන්න එයාට ලෝකයක් නැහැ. කාම ලෝකෙත් නැහැ ඉපදෙන්න, රූප ලෝකෙත් නැහැ ඉපදෙන්න, අරූප ලෝකෙත් නැහැ ඉපදෙන්න. එතකොට කොහෙද උපදින්නේ?

උපදින්න තැනක් නැහැ, කෙත නැහැ, භූමියක් නැහැ. ඒ හින්දා පුරාණ කර්මයට හටගත්ත විපාක සන්තතිය ද දවසක නැතිවෙලා යන කොට පහනක් නිවුණා වගේ ඒ ධීරයන් වහන්සේ නිවිලා යනවා. ඕක පාඩම් කරන්න තියෙන දෙයක් නෙමෙයි. සැබෑවට ම වෙලා තියෙන සිද්ධිය මේ කියන්නේ. ඊට පස්සේ ඕගොල්ලෝ හඳුනා ගන්න ඕනේ ඇත්තට ම මට 'අම්මා ම යි', 'තාත්තා' ම යි කියලා මේ පෙන්වන දේවල් තමයි ලෝකය, මේවා තමයි ආස්‍රව. මම ඒ ආස්‍රව ගෙවලා දාන්න ඕනේ කියලා හික්මෙන්න ඕනේ.

ඒ නිසා 'මේ අම්මා ම යි', 'මේ තාත්තා ම යි' කියලා ඇසුරු කරපු හුරුව මට ඇති වුණේ කොහොමද කියන එක හැම වෙලාවේ ම පෙන්වනවා. එනම් ලෝකය හැදුණු හැටි පෙන්වනවා පටිච්චසමුප්පාදයෙන්.

~ විදර්ශනා කරන ආකාරය ~

අපි උදාහරණයකට කියමුකෝ මට දැන් 'අම්මා' මතක් වුණා කියලා. එතකොට මම ටක්ගාලා දන්නවා. මේ තමයි මම උප්පත්ති වශයෙන් ආපු තැන නෙමෙයි. උප්පත්ති වශයෙන් ආවට පස්සේ අවිද්‍යා කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදිහට රූපයක් හදාගෙන ඒකට 'කෙනෙක්', 'පුද්ගලයෙක්' හැටියට උපාදාන වෙච්ච නිසා හැදුණු කර්ම භවය තමයි මේ.

'අම්මා ඉන්නවා' කියලා තේරෙනකම, අම්මා ඉන්නවා කියලා සිහි කරන්න පුළුවන්කම, අම්මා මෙච්චර මට උදව් කළා කියලා ආදරය

සෙනෙහස ගති ටික ඇතිවෙන නිමිත්තක් තියෙනවා නම් ඒ ටික ඔක්කොම කර්ම භවය කියලා දන්නවා දැන් අපි.

එතකොට පෙන්වන්න ඕනේ, මේක මගේ ළඟ තියෙන ආස්‍රවයක්. එහෙම පෙන්නුවේ නැත්නම්, අම්මා කියලා කෙනෙක් බාහිර ඉන්නවා ම වෙනවා මට. එහෙම ඉන්නවා ම වෙලා, ඒ ලෝකය ඇත්ත වෙනවා. එතකොට ඒ අම්මාව හොයාගෙන යන්න පුළුවන් වෙනවා මට.

ඒ හින්දා 'අම්මා' කියලා සිහිවෙන කොට ම මම පෙන්වනවා; මේ නිමිත්ත අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් නේද හැදුණේ කියලා. ඒ කියන්නේ මම හොඳට දන්නවා; බත්, පාන්, කවුපි, මුං ඇට ආදී කනබොන ආහාරයෙන් හැදුණු රූපය අවිද්‍යා කර්මයෙන් උපාදානයට හිත විදිහට අල්ලගන්නවා.

අල්ලගෙන තණ්හා, උපාදාන වශයෙන් 'පුද්ගලයෙක්', 'කෙනෙක්', 'මගේ අම්මා' කියන විදිහට හිත හසුරපු නිසා 'ඒ රූපය අම්මා' කියලා නිමිත්තක් ඇතිවෙලා මගේ ළඟ. ඒක ඇතිවෙලා තියෙන්නේ මොකක් හින්දා ද? අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ටිකකින්. ඒ පෙන්නුවේ මොකක් ද? පටිච්චසමුප්පාදය කෙටි කරලා, කැටි කරලා.

ඒ කිවුවේ අවිද්‍යා, කර්මයෙන් උපාදාන වෙන්න පුළුවන් විදිහට කනබොන ආහාරයෙන් හැදෙන අනාත්ම වූ රූපය අල්ලගෙන තණ්හා, උපාදාන වශයෙන් හැසිරිව්ව නිසයි භවය (ලෝකය) කියන එක හැදුණේ කියන එකයි ඔය කියන්නේ අන්තිමට.

එහෙම පෙන්නපු ගමන් ඒ තුළ තියෙනවා; මම ම අවිද්‍යා කර්මයෙන් සීමා කරලා පෙනෙනකම හදාගෙන ඒ පෙනෙන වර්ණ රූපයට 'අම්මා' කියලා නොයෙක් විස්තර සපයපුකම හින්දා, 'ඒ රූපය අම්මා' කියලා මං ගාව නිමිත්තක්/ දැනුමක් ඇතිවෙලා තියෙනවා නේද කියලා තමන් තුළ ම ලෝකයත්, ඒ ලෝකය හැදුණු ක්‍රමයත් ඔක්කොම ටික තමන්ට ම පෙනෙනවා.

එහෙම බලන්න, බලන්න, බාහිරයේ 'අම්මා ඉන්නවා' කියන ආස්‍රවය කැපෙනවා, අඩු වෙනවා. දැන් අපිට බැහැර 'මෙහෙම අය ඉන්නවා',

‘මෙහෙම දේවල් තියෙනවා’ කියලා වෙලා තියෙන්නේ ඔය පටිච්චසමුප්පාද සිද්ධිය නිසා. ඕක තමයි ලෝකය. ලෝකෝත්තරයි කියලා කියන්නේ ලෝකයෙන් මිදෙන්න ඕනේ, ලෝකය නිරුද්ධ කරන්න ඕනේ. ලෝක නිරෝධය නිවනයි කියලා කියන්නේ. පටිච්චසමුප්පාද සිද්ධිය හරහා මේ බඹයක් පමණ ශරීරය තුළ තමන්ට ම යි ලෝකය හැදිලා තියෙන්නේ කියන කාරණාවක් තේරෙනවා.

ඒ හින්දා ඕගොල්ලොන්ට එක ම එක තැනක වැඩක් විතරයි ඉතුරු වෙලා තියෙන්නේ. ඒ මොකක් ද? සවිඤ්ඤාණක වේවා, අවිඤ්ඤාණක වේවා මොනවා හරි දෙයක් බාහිර ඇති බවට, තියෙනවා කියලා මනසට දැනෙනවා නම් ඒ ඔක්කොම කර්ම භවය ම යි. එහෙම සිහි කරන්න යම්තාක් නිමිත්තක් තියේ නම් ඒ ඔක්කොම කර්ම භවය ම යි.

එබඳු නිමිති ටිකක් මනසේ හැදුණු හැටි තමයි පටිච්චසමුප්පාදය හරහා කියන්නේ. ***“අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණපච්චයා නාමරූපං. නාමරූපපච්චයා සළායතනං. සළායතනපච්චයා ඵස්සො. ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා. තණ්හාපච්චයා උපාදානං. උපාදානපච්චයා භවො.***[176] කියලා අපිට එකින් එක, එකින් එක නිමිති සහගත ලෝකය අපි තුළ හැදිච්ච සිද්ධිය ගැන පෙන්වනවා.

~ පටිච්චසමුප්පාද චක්‍රය නැති වීමට නම් ~

ඒකත් පෙන්වනවා අනික් පැත්තට, අවිද්‍යාව නොවුණා නම් සංඛාර නැහැ. ඒ කියන්නේ; ඇහැ, රූප, කන, ශබ්දය, නාසය, ගන්ධය, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම කියන ආයතන උපාදානයට හිත විදිහට හැදෙන ආකාරයට හිතන්නේ නැහැ. හිතුවේ නැති වුණොත්; චක්ඛු

176 https://tipitaka.lk/sn-3-1-2-4-8 - **ජන්න සූත්‍රය- රේර වර්ගය- බන්ධ සංයුත්තය- සංයුත්ත නිකාය 3- 232 පිටුව**

විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිහ්වා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ, මනෝ විඤ්ඤාණ නැහැ.

ඒවා නොවුණා නම් විපාක නාමරූප දෙක පැත්තට හිත බැසගන්නේ නැහැ. හිත බැසගන්නේ නැති හින්දා උපාදානයට හිත විදිහට ඇහැ, කන, නාසය, දිව, කය, මනායතනය උපදින්නේ නැති හින්දා ස්පර්ශයක් නැහැ. ස්පර්ශය නැති හින්දා වේදනාවක් නැහැ. වේදනාව නැති හින්දා තණ්හාවක් නැහැ. තණ්හාව නැති නිසා උපාදානය වෙන්නේ නැහැ. උපාදානය නොවෙන නිසා නිමිති (භවය) හැදෙන්නේ නැහැ.

අපේ මනස කොච්චර *"ඔක්කන්ති නාමරූපං"* වෙලා තියෙනවා ද කියන්නේ, අපි නිකමට උදාහරණයක් ගත්තොත්, ශබ්දයක් ඇහෙනවා නම් ඒ ශබ්දය ස්පර්ශ වුණේ සෝත ප්‍රසාදයට කියන එක නියම පිරිසිදු මනසට දැනෙන්න ඕනේ. ඒක තමයි යථාර්ථය.

නමුත් මට ශබ්දය එළියේ (සෝත ප්‍රසාදයෙන් බාහිර) කියලා දැනෙනවා කියන්නේ ම විඤ්ඤාණය නාමරූප වෙලා *(ඔක්කන්ති නාමරූපං)*. භවය හින්දා එහෙම වෙන්නේ. ඕගොල්ලොන්ට ආස්‍රව කැපෙන කොට රූපය චක්ඛු ප්‍රසාදයට ගැටුණේ කියලා නුවණින් දකින දවසක් ආවොත් ඕගොල්ලෝ ඇඟිල්ල දික් කරන්නේ නැහැ බාහිරයට. එතනට අපි එන්න ඕනේ.

එතනට එන්න නම් ආස්‍රව කපන්න ඕනේ ටික ටික. ඕගොල්ලොන්ට කනට ම යි මේ ශබ්දය ගැටෙන්නේ කියන එක හොඳට ම තේරෙනවා නම් ඕගොල්ලෝ කන යොමු කරනවා ද බාහිරයට? යොමු කරන්නේ නැහැ. ආස්‍රව, නීවරණ ආදී කෙලෙස් දුරුවෙන කොට ශබ්දය ගැටෙන්නේ සෝත ප්‍රසාදයටයි කියලා නුවණින් දකින දවසක් එනවා. එතකොට ඕගොල්ලෝ බාහිරයට නැමෙන්නේ නැහැ.

උපාදානයට හිත විදිහට ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය, කන, ශබ්දය, සෝත විඤ්ඤාණය ආදී අටළොස්ධාතුව ඉපදුණා කියන්නේ ම ආස්‍රව හා අවිද්‍යාව නිසා බාහිරයට බැසගෙන කියන එක. උපාදාන වෙන්න පුළුවන් එහෙම එකකට යි. ඕගොල්ලොන්ගේ කන ගාවට ම ඇවිල්ලා ශබ්දය වදිනවා

කියලා තේරුණොත් ඕගොල්ලොන්ට බැහැර ශබ්ද හම්බ වෙන්නේ නැහැ උපාදාන වෙන්න.

~ අපි උප්පත්ති වශයෙන් ආපු තැනක තිබුණු යථාර්ථය ~

ඕගොල්ලෝ ප්‍රතිසන්ධි වශයෙන් එන කොට තිබ්බේ රූපය ඇවිල්ලා චක්ඛු ප්‍රසාදයට වදිනවා කියන තැනකින් පෙනෙන මට්ටමක් (*"දිට්ඨේ දිට්ඨමත්තං"*) කියන එකයි මේකෙන් කියන්නේ. ශබ්දය ඇවිල්ලා කනට වදිනවා කියන තැනක සිද්ධවන ඇහෙන මට්ටමක් (*"සුතෙ සුතමත්තං"*) කියන එකයි කියන්නේ කෙටියෙන් ගත්තහම.

අපි ලොකු වුණාට පස්සේ පෙනෙන එක මෙහේ (එළියේ) තියෙන්නේ, ඇහෙන එක මෙහේ (එළියේ) තියෙන්නේ කියලා අවිද්‍යාව නිසා හිතලා බාහිරට නැඹුරු වෙලා කියලා මේ කියන්නේ. එහෙම වුණාට පස්සේ තමයි බාහිර යමකුත් තියෙනවා වගේ තැනකින් අපිට ලෝකයක් හැදුණේ.

ආපහු එන්න ඕනේ අපි උප්පත්ති වශයෙන් ආපු පරණ තැනට. ආස්‍රව ටික ගෙවුනහම හොඳට ම දැනෙනවා නම්, මේ කතා කරන ශබ්දය ඕගොල්ලොන්ගේ කන ගාවට ම යි ස්පර්ශ වෙන්නේ කියලා, ඕගොල්ලෝ කීයටවත් ඇහෙන ශබ්දය මෙහෙ කියලා බාහිරයට ඇඟිල්ල දික් කරන්නේ නැහැ කවදාවත්.

එදාට ඕගොල්ලොන්ට මේ කාමභූමියේ නෑදෑකම් නැහැ කවුරුවත්. අනාගාමී කියලා කියන්නේ වෙන මොකුත් හින්දා නෙමෙයි, *"ඔක්කන්ති නාමරූපං"* වෙන්නේ නැහැ. විඤ්ඤාණය නාමරූපයට බැසගන්න තාක් අපිට පෙනෙන්නේ මෙහෙ කියලා බාහිර සතර මහා ධාතුව පැත්තට නැඹුරු වෙනවා.

ශූන්‍යතාවය කියලා මෙහෙම කතා කළත් ආස්‍රව සහිත මනසක ඉඳලයි අපි අද මේ කතා කරන්නේ. නමුත් හොඳට නීවරණ ධර්ම දුරුවෙලා

භවය නැති වෙච්ච ගමන් ම ඕගොල්ලොන්ට බාහිර ඉඳලා තමන්ගේ පැත්තට එන අරමුණු ටික හම්බ වෙනවා.

ඒ කියන්නේ කන කරා එන ශබ්ද රූපය සෝත ප්‍රසාදයේ ගැටෙන සිද්ධිය නුවණින් දැන ගන්න කොට ඕගොල්ලෝ යන්නේ නැහැ ශබ්දය හොයාගෙන බාහිරයට. එහෙම යන්න බැහැ. ඒ මොකද? සෝත සම්ඵස්සජා වේදනාවක් ඕගොල්ලොන්ට හම්බ වෙන්නේ.

ශබ්දය සෝත ප්‍රසාදයට ගැටුනට පස්සේ ඒ ස්පර්ශය නිසා ඇතිවෙන වේදනාව බාහිරයේ හොයයි ද? හොයන්නේ නැහැ. සෝත සම්ඵස්සය කියන කොට ශබ්දය කොතැනද ස්පර්ශ වෙලා තියෙන්නේ? සෝත ප්‍රසාදයේ. සෝත සම්ඵස්සජා වේදනාවක් ඒ නිසා හටගන්නේ.

ඒ විඳින වේදනාව මොකක් නිසා ද? සෝත සම්ඵස්සයෙන් උපන්න වේදනාව කියලා නුවණින් දකින කොට ඕගොල්ලෝ ඇඟිල්ල දික් කරයි ද බාහිරයට? නැහැ. චක්ඛු සම්ඵස්සජා වේදනා කියන කොට වර්ණ රූපය චක්ඛු ප්‍රසාදයේ ගැටිලා චක්ඛු සම්ඵස්සයෙනුයි ඒ වේදනාව හටගන්නේ කියලා නුවණින් දකින කොට මේ රූපයෙනුයි සැප වේදනාවක් එන්නේ කියලා බාහිරයට ඇඟිල්ල දික් කරන්නේ නැහැ.

චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ කියන්නේ මාරයාගේ භූමිය. මාරයාගේ භූමිය කියන්නේ බාහිරයට බැහැගන්න එකෙන් ම තියෙනවා අවිද්‍යාව නැමැති කෝෂය ඇතුළේ අපි මේ ඉන්නේ කියන එක.

හුළඟට මහා ඝන පර්වතයක් හෙලවෙන්නේ නැහැ වගේ රහතන් වහන්සේලා රූප, ශබ්දයන්ගෙන් හෙලවෙන්නේ නැහැ කියලා කියන්නේ. හැම වෙලාවේ ම චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා මිසක බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ විඳලා නැහැ යථාර්ථ වශයෙන් කොහෙවත් කියන යථාර්ථයකට එනවා.

චක්ඛු සම්ඵස්සජා වේදනා කියලා කිවුවත්, අපේ මනස තාම යන්නේ බාහිරයට. චක්ඛු සම්ඵස්සජා වේදනාවක් විඳින්නේ එළියේ තියෙන රූපයෙන් නේ කියලයි අපි හිතන්නේ. බාහිර තියෙන රූපයෙන් කියලා අත දික් කරන්න කොහෙද කතාවක් තියෙන්නේ රූපය ඇවිල්ලා චක්ඛු ප්‍රසාදයට වැදුනට පස්සේ ඇතිවෙන ඒ ස්පර්ශය නම් වින්දේ, ආයෙත් ඒ විඳපු සිද්ධිය කොහෙද බැහැර තියෙන්නේ.

සෝත සම්ඵස්සජා වේදනා - හොඳට බලන්න කන මෙනන නම්, ශබ්දය කනට නම් ගැටුණේ, හිත එතනට නම් යොමු කළේ සෝත සම්ඵස්සයෙන් උපන්න වේදනාවක් නම් තමන් තුළ උපන්නේ, දැන් ඒ වේදනාව මොකක් හින්දා ද? සෝත සම්ඵස්සය නිසා නම් ඒ මිහිරි හෝ අමිහිරි වේදනාව බැහැර ශබ්ද රූපයක හොයලා හරි යයි ද ඒ වේදනාව? නැහැ. ඒ ශබ්දය සෝත ප්‍රසාදයේ ගැටුණු හින්දනේ සෝත සම්ඵස්සයක් උපන්නේ.

ඔන්න ඔතන තමයි අපි උපන් ගෙදර. ඔතන ඉන්නේ නැතුව ශබ්දය බාහිර තියෙනවා කියලා බැසගත්ත ඔන්න ඔය සිද්ධිය තමයි බුදුරජාණන් වහන්සේ විස්තර කරේ, *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං"* කියලා, අවිද්‍යාවෙන් ශබ්දයට අනුව මෙනෙහි කරන හින්දයි ඒ අරමුණේ විඤ්ඤාණය පිහිටන්නේ.

එතකොට වෙන්නේ මොකක්ද? *"ඔක්කන්ති නාමරූපං"* වෙනවා. ශබ්දයට අනුව හිත බැසගන්නවා. එතකොට උපාදානයට හිත විදිහට කන හැදෙනවා. උපාදානයට හිත විදිහට හැදුණු කනට ශබ්ද ගැටෙනවා. එතකොට ඒ ස්පර්ශය නිසා ඇතිවෙන වේදනාවට තණ්හා උපාදාන වෙනවා ම යි. එතකොට මට 'දෙවැන්නෙක්' නිර්මාණය වෙනවා ම යි.

මේ ඉන්න මට, බාහිර ශබ්දයක් ඇහුණා කියන තැනකින් තමයි තේරෙන්නේ. මම ආපහු එතනින් එන්නේ මෙහෙම ශබ්දත් තියෙනවා කියලා. නමුත් ඒ ශබ්දය සෝත ප්‍රසාදය ගාවට ම ආවා කියලා තේරුණා නම් මට

දෙවැන්නෙක් නිර්මාණය වෙයි ද? නිර්මාණය වෙන්නේ නැහැ. ඇහීම ඇහීම් මාත්‍රයක් වෙනවා විතරයි.

එතකොට මුලින් උප්පත්ති වශයෙන් එන කොට තිබුණේ එහෙම සිද්ධියක් විතරයි. අවිද්‍යාව නිසා ඊට පස්සේ මෙහෙම ලෝකය හැදිලා තියෙන්නේ කියන එකක් මේ කියන්නේ. මම කියන කතාව තේරෙනවා ද? එතකොට ඔය අම්මා, තාත්තා, දුව, පුතා කියන ලෝකය ම තියෙන්නේ *"ඔක්කන්ති නාමරූපං"* වෙච්ච නිසා.

ආධ්‍යාත්මික පැත්තට ආපු එකට ප්‍රතිපක්ෂව බාහිර පැත්තට ගියපු නිසා තමයි ලෝකය හැදෙන්නේ. ලෝකය තිබුණොත් තියෙන දෝෂය මේ ජීවිතයේ දුක් විඳින්න සිද්ධවන එක විතරක් නෙමෙයි. අවිද්‍යාව නිසා බැහැර තියෙන යමක් විඳිනවා වගේ පෙනෙන කොට විඤ්ඤාණය ඊට අනුගතව පහළ වෙනවා ම යි. ප්‍රතිසන්ධියට යන එක නවත්තන්න බැහැ ම යි එතකොට.

උදාහරණයකට ගත්තොත්; කන ගාවට ආපු ශබ්දය ගැන අවිද්‍යා සංඛාරයෙන් බැහැර (සෝත ප්‍රසාදයෙන් එළියේ/ බඹයක් පමණ වූ ශරීරයෙන් බාහිර) තියෙන ශබ්දයක් හැටියට අරමුණු කරලා ඒ ශබ්දයට තණ්හා උපාදාන වෙච්ච හින්දා නේද මෙබඳු වූ ශබ්දයක් බැහැර තියෙනවා වගේ තේරුණේ කියන එකයි පටිච්චසමුප්පාදයෙන් මෙනෙහි කරන්න කියන්නේ.

කනට ගැටෙන ශබ්දය කනට ම ඇවිත් ස්පර්ශ වුණා කියන තැනක අපේ නුවණ තිබුණා නම් අවිද්‍යාව නැහැ. එහෙම අවිද්‍යාවක් නොවුණා නම් ශබ්දය පැත්තට හිතන්නේ නැහැ. හිතන්නේ නැති වුණොත් ශබ්දය අනුව විඤ්ඤාණය පිහිටන්නේ නැහැ. එහෙම වුණොත් විඤ්ඤාණය නාමරූපයට බැස ගන්නේ නැහැ.

විඤ්ඤාණය නාමරූපයට බැස ගත්තේ නැති වුණොත් බාහිර ශබ්දයක් ඇහෙනවා කියන එකක් වෙන්නේ නැහැ. එහෙම ශබ්ද නොවුණේ නම් තණ්හා උපාදාන වෙලා මෙහෙම ශබ්ද තියෙනවා කියලා බැහැර

නිමිත්තක් හිටිනවා ද මට? හිටින්නේ නැහැ කියලා පටිච්චසමුප්පාදයේ නිරෝධයට පෙන්වනවා.

~ අවිද්‍යාවේ තරම ~

එතකොට එයා පෙන්වනවා, මට යම්තාක් නෑදෑයෝ ඉන්න ලෝකයක් හැදුණා නම් හැදුණේ *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා..."* කියන පටිච්චසමුප්පාදය නිසයි කියලා. ඒ කියන්නේ චක්ඛු සම්ඵස්සජා, සෝත සම්ඵස්සජා, ඝාන සම්ඵස්සජා, ජිහ්වා සම්ඵස්සජා, කාය සම්ඵස්සජා, මනෝ සම්ඵස්සජා කියන යථාර්ථයේ මගේ මනස නොතිබුණුකම නැමැති අවිද්‍යාව නිසා යි.

අවිද්‍යාව දුරුවෙලා නෙමෙයි නේ අපි පුංචි කාලේ උප්පත්ති වශයෙන් ආපු තැන හිටියේ. මාස දෙක තුනක පොඩි ළමයෙකුට බැහැගෙන විඳින්න අරමුණු තිබ්බේ නැහැ. රූපය චක්ඛු ප්‍රසාදයට ගැටිලා චක්ඛු සම්ඵස්සජා වේදනාවක්, ශබ්දය සෝත ප්‍රසාදයට ගැටිලා සෝත සම්ඵස්සජා වේදනාවකට, බඩගින්න හින්දා කාය සම්ඵස්සජා වේදනාවකට තමයි පොඩි ළමයා ප්‍රතික්‍රියා දැක්වුයේ මිසක අද අපි වගේ බැහැර ශබ්දයකට, බැහැර රූපයකට නෙමෙයි ළමයා ප්‍රතික්‍රියා දැක්වුයේ.

කරුමයකට ඒ ගැන දන්නේ නැතුව යි හිටියේ. ඒ නොදන්නාකම තමයි අවිද්‍යාව කියන්නේ. උප්පත්ති වශයෙන් ආපු තැන පවතින යථාභූත ස්වභාවය ගැන දන්නෙත් නැහැ. බැහැර තියෙන විඳිහට නිමිති ගන්න නම් එපා කියන එක, පංච උපාදානස්කන්ධයක් උපදින විඳිහට හිතන්න නම් එපා කියන එකට අහලත් නැහැ. එහෙම මෝඩකම ඇතුළේ ටිකෙන් ටික ළමයා ලොකුවෙන කොට ආස්‍රව සක්‍රිය වෙනවා.

අවිද්‍යාව හා ආස්‍රව සක්‍රියවෙන කොට මොකද වෙන්නේ? රූපය චක්ඛු ප්‍රසාදයට ම ඇවිත් චක්ඛු සම්ඵස්සයෙන් පෙනීම වෙන කොට බැහැර රූපයක් පෙනෙන්නේ කියලා හිතන්න ගියා. කනට (සෝත ප්‍රසාදයට) ශබ්දය ඇවිල්ලා

සෝත සම්ඵස්සය වෙලා ශබ්දය ඇහෙන එකට බැහැර තියෙන ශබ්දයක් ඇහෙන්නේ කියලා හිතන්න ගියා.

අවිද්‍යාව නිසා එහෙම හිතන්න ගියහම අන්තිමට වෙලා තියෙන්නේ මොකක් ද? නැති ප්‍රශ්නයක් ඇතිවෙලා. ලෝකය නිර්මාණය වෙලා, ඒ ලෝකේ ඇතුළේ ජරා මරණ ශෝක පරිදේව, ප්‍රිය විප්පයෝග, අප්‍රිය සම්පයෝග ආදී දුක් කන්දක් විඳින්න වෙලා.

අදටත් රූපය පෙනෙන්නේ චක්ඛු සම්ඵස්සයෙන් ම තමා. ශබ්දය ඇහෙන්නේ සෝත සම්ඵස්සය නිසා ම තමයි. නමුත් ඒ ඇත්ත අපිට පේන්නේ නැහැ. අද දවසේදී අපිට ටක්ගාලා වෙන්නේ මොකක් ද? *"ඔක්කන්ති නාමරූපං"* වෙලා.

විඤ්ඤාණය නාමරූප දෙකට බැස ගත්ත ගමන් ම උපාදානයට හිත විදිහට ඇහැ හැදිලා රූප බලන, කන හැදිලා ශබ්ද අහන සිද්ධියක් වෙන්නේ අන්තිමට අපිට. එහෙම පෙනෙන රූපවලට රූප තණ්හාව ඇති නොවී තියෙන්නේ නැහැ. ඇහෙන ශබ්දවලට ශබ්ද තණ්හාව ඇති නොවී තියෙන්නේ නැහැ.

අපිට අද තේරෙන මට්ටමෙන් කතා කරන සීමා නොකරන ලද මනස කියන එක ගොඩ යන්න තැනක් ඕනේ නිසා දැනට පොඩි මුක්කුවක් විතරයි ඕක. ඒ මොකද, අපි අද අපිට තේරෙන මට්ටමෙන් සීමා නොකරන ලද මනස ගැන කිවුවට ඒකේ අවිද්‍යා අනුසය එහෙම ම තියෙනවා. ආස්‍රව එහෙම ම තියෙනවා.

සීමා නොකරන ලද මනසේ ඉඳලා ආස්‍රව ක්ෂය කර ගන්න කියන්නේ වෙන මොකුත් හින්දා නෙමෙයි. ඇහෙන ශබ්දය බාහිර තියෙන්නේ කියලා එබිච්ච හුරුව ගෙවාගන්න, පෙනෙන රූපය බාහිර තියෙන්නේ කියලා එබිච්ච හුරුව ගෙවාගන්න කියන එකක් කියන්නේ. ඒ ආස්‍රව ගෙවිච්ච ගමන් ම ආපහු බාහිර පැත්තට නැඹුරුවෙන විදිහට හිතන්නත් එපා කියන උපදේශයත් එක්ක සීමා නොකරන ලද මනසට ආවහම දැනුම් සහගත ව ඉන්නේ.

එතකොට එයා සෝත ප්‍රසාදයටයි ශබ්දය වදින්නේ කියලා නුවණින් දකිනවා නම්, බාහිරයට කන නමන්න බයකුත් තියෙනවා නම් ශබ්ද හොයාගෙන මාරයාගේ ක්ෂේත්‍රයට යන්න හේතු නැහැ. ශබ්දයක් අහන්න ඕනේ නම් සෝත සම්ඵස්සයට සිහියෙන් නුවණින් කටයුතු ටික කරනවා. හැබැයි අපි වගේ නැති ප්‍රශ්න ඇති කර ගන්නේ නැහැ එතකොට.

මම මේ කතා කරන සිද්ධියේ වටිනාකම තේරුම් ගන්න. මේ දර්ශනයට මුළු දුක ම එහෙන් පිටින් ම ගෙවෙනවා. **මහණෙනි, මනා කොට දුක් ගෙවීම පිණිස පවතින ස්කන්ධයන්ගේ උදය වැය කියලා කියන්නේ ඒකයි.**[177] මේ වගේ යථාර්ථයකට එනවා ඕගොල්ලෝ. ඔතනට එන්න නම් ඕගොල්ලෝ ලෝකේ ප්‍රතික්ෂේප කරන්න වෙනවා. ලෝකේ ඉන්න තාක් ඕගොල්ලෝ අයිති ලෝකෙට

~ පණුවාගෙන් පාඩමක් ~

පණුවෙක් සමනළයෙක් වෙන්න නම් ඌට තියෙනවා ප්‍රතිපදාවක්. පණුවා; පණුවෙක් විදිහට යනකන්, පණුවෙක් විදිහට කනකන්, පණුවෙක් විදිහට ක්‍රියාකාරකම් කරනකන්, අනික් පණුවෝ එක්ක ඇවිදින්න යන තාක් ඌට සමනළයෙක් වෙන්න බැහැ. පණුවෙකුට සමනළයෙක් වෙන්න ඕනේ නම් පණුවෙකුට අයිති සියලු ම ක්ෂේත්‍රය නවත්තන්න වෙනවා.

පණුවට සිද්ධ වෙනවා කෝෂයක් බැඳගෙන වෙන ම පැත්තකට වෙලා පණුවෙක් විදිහට කන එක, පණුවෙක් විදිහට යන එක, පණුවෙක් විදිහට ඉන්න එක, අනික් පණුවෝ ඇසුරු කරන එක ආදී පණුවෙකුට අයිති සම්පූර්ණ ක්ෂේත්‍රය ම ප්‍රතික්ෂේප කරන්න. ප්‍රතික්ෂේප කරලා, පැත්තකට වෙලා කෝෂයක් බැඳගෙන හිටියහම දවස් ගාණක් ගියාට පස්සේ මෙන්න සෘද්ධියකින් වගේ උඩින් යන්න පුළුවන් ලස්සන සමනළයෙක් වෙනවා.

---

177 https://tipitaka.lk/sn-5-4-2-1/sinh - **පටිලාභ සූත්‍රය- මුදුතර වර්ගය- ඉන්ද්‍රිය සංයුත්තය- සංයුත්ත නිකාය 5- 357 පිටුව**

පණුවට කවුරුත් අකමැති. පණුවෙක් ඇඟේ ගෑවුනොත් කැමති ද? නැහැ. සමනළයෙක් ඇඟේ වැහුවොත් අප්‍රිය ද? නැහැ, තව අතත් දික් කරලා ගන්න හදනවා නේද. හැබැයි හොඳට මතක තියාගන්න, පණුවා සමනළයෙක් වුණේ නිකන් නෙමෙයි, විශාල කැප කිරීමක් කරලා.

ඒ වගේ ඕගොල්ලෝ ලෝකෙට අයිති විදිහට යනවා නම්, ලෝකෙට අයිති විදිහට ඉඳගෙන ඉන්නවා නම්, ලෝකෙට අයිති විදිහට සිතීම්, කීම්, කිරීම් කරනවා නම්, ලෝකෙට අයිති දේවල්වලට නෑදෑකම් කියමින් ඒවා ගැන හිත හිතා ඉන්නවා නම්, හිතෙන් හරි ලෝකෙට අයිති පාරවල් දිගේ යනවා නම් ඕගොල්ලෝ කවදාකවත් රහතන් වහන්සේ නමක් වෙන්නේ නැහැ. එහෙම නැතිනම් අනාගාමී බ්‍රහ්මයෙක් වෙන්නේ නැහැ, ඕගොල්ලෝ මනුස්සයෙක් ම යි.

මනුස්සයෙක් කන විදිහට, මනුස්සයෙක් යන විදිහට, මනුස්සයෙක් ඉන්න විදිහට, මනුස්සයෙකුට තියෙන නෑදෑකම් සියලු ම කාරණා ටික අයින් කරලා කෝෂයක් බැඳ ගන්නවා වගේ ප්‍රතිපදාවකට ඇවිල්ලා ඉවර වෙලා තමයි ඕගොල්ලොන්ට රහතන් වහන්සේ නමක් හෝ අනාගාමී බ්‍රහ්මයෙක් වෙන්න පුළුවන් වෙන්නේ.

හොඳට මතක තියාගන්න පණුවෙක් හැටියට හැසිරෙනකන් එයා පණුවෙක් ම මිසක සමනළයෙක් වෙන්නේ නැහැ කියන එක. ඒ වගේ හොඳට මතක තියාගන්න ඕනේ මනුස්සයෙක් හැටියට හිතීම්, කීම්, කිරීම් කෙරුවොත් මැරෙන්න වෙන්නෙත් මනුස්සයෙක් හැටියට ම යි කියන එක.

ඕගොල්ලෝ ධ්‍යානලාභී අනාගාමී බ්‍රහ්මයෙක් හෝ රහතන් වහන්සේ නමක් හැටියට වෙනවා නම් අනික් අය දිහා බලන්න එපා. අනික් අයත් කතා කර කර ඉන්නවා නේ. ඒ හින්දා අපිටත් මොකද ඉතින්, කියන තැනකින් හිටියා කියලා හරි යන්නේ නැහැ. පණුවෙක් කෝෂයක් බැඳගත්තොත් ඒ පණුවා සමනළයෙක් වෙයි. අනික් පණුවා අදාළ නැහැ. අනික් පණුවා කෝෂයක් බැඳගත්තොත් එයා සමනළයෙක් වෙයි මිසක අර පණුවා

කෝෂයක් බැඳගත්තා කියලා හෝ බැඳගත්තේ නැහැ කියන එක මේ පණුවට අදාළ වෙන්නේ නැහැ.

ඒ වගේ අනික් කෙනා භාවනා කෙරුවද, නැද්ද කියන එක අදාළ නැහැ. කෙනා කෙනා දත යුතුයි. හොඳට මතක තබාගන්න ඕනේ මනුස්සයෙක් හැටියට සිත් මාත්‍රයක් හෝ උපදින ගතිය තියෙනවා නම් ඒත් රහතන් වහන්සේ නමක් හෝ අනාගාමී බ්‍රහ්මයෙක් වෙන්නේ නැහැ. යෑම් ඊම් ගැන තව කවර කතා ද.

මනුස්සයෙකුගේ ටිකකුයි බ්‍රහ්මයෙකුගේ ටිකකුයි කියලා දෙකක් තියෙන්න පුළුවන් ද? බැහැ. මනුස්සයෙකුට අයිති සියලු ක්ෂේත්‍රය දුරු කළොත් එයා නැගිටින්නේ ඊට වඩා සිය දහස් ගුණයකින් ලස්සන ජීවිතයක් ඇතුව, බලවත් ජීවිතයක් ඇතුව, සෘද්ධියක් ඇතුව. ඒ නිසා ඒ වෙනුවෙන් පොඩි පරිත්‍යාගයක්, කැප කිරීමක් කරන්න වෙනවා.

තේරුම් ගන්න, මේ ලෝකය කියන එක උප්පත්ති වශයෙන් අරගෙන ආව එකක් නෙමෙයි. පටිච්චසමුප්පාද චක්‍රය සක්‍රිය වීම නැමැති මෙන්න මේ වගේ දෝෂයකට හැදුණු එකක් කියලා මම හැමවෙලාවේ ම කියන්නේ. මෙච්චර දහමක් අහලත් මේ තුළ නිෂ්ඨාවකට පැමිණෙන්න විර්යය කරන්නේ නැති නම් ඒක කෙනා කෙනාගේ දෝෂය මිසක, මම දන්නේ නැහැ මීට එහා දෙයක් තියෙනවා ද කියන එක.

නමුත් කෙනා කෙනා වීර්යය කළොත් අනාගාමී බ්‍රහ්මයෙක් හෝ රහතන් වහන්සේ නමක් වෙන්නේ නැද්ද කියලා බලන්නකෝ. ආස්‍රව ටික ක්ෂය කර ගත්තොත් ඕගොල්ලෝ අනිවාර්යයෙන් ඒ තැනට එනවා.

~ අපේ ම ජීවිතයේ අපිට නොපෙනෙන ඇත්ත ~

මේ තව කතාවක් නෙමෙයි, ජීවිතයේ සැබෑ සිද්ධිය මේ කියන්නේ. නිවන කියන්නේ සත්‍යාවබෝධයක් නේ. ඇත්ත ඇති හැටිය අවබෝධ කර ගන්න එකක් මිසක තවත් නිකන් මොකක් හරි කතාවක් නෙමෙයි. ඒක

තේරුම් ගන්න ඕනේ. අපේ ජීවිතයක තියෙන සැබෑ ම තත්ත්වය බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරන්නේ.

හැමදාම පැවතුන, හැමදාම පවතින ඒත් ලෝකයාට නොපෙනෙන ලෝකයේ ඇත්ත බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ. අපේ ජීවිතවල තියෙන අපි ම නොදන්නා, අපි ම නොදකින ඒත් අපේ ම ජීවිතවල තියෙන සැබෑ ම ඇත්ත බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ මිසක බුදු දහම කියලවත් වෙන එකක් හිතන්න එපා අමුතුවෙන්.

"සවාකඛාතො භගවතා ධම්මො" [178] - භාග්‍යවතුන් වහන්සේ මනා කොට ධර්මය දේශනා කරලා තියෙනවා කියන එක කියන්න තියෙන ශක්තියත් ඒක. බුදුරජාණන් වහන්සේගේ දහමක් දේශනා කරලා තියෙනවා නම් අපිට කියන්න බැහැ බුදුරජාණන් වහන්සේ මනා කොට ධර්මය දේශනා කරලා තියෙනවා කියලා.

කොහොමද අපි කියන්නේ? බුදුරජාණන් වහන්සේගේ හිතේ තියෙන එකක් හෝ අපිට නොපෙනෙන එකක් කිව්වා නම් *"සවාකඛාතො භගවතා ධම්මො"* කියලා අපි කියනවා නම් ඒකට කියන්නේ 'අමුලිකා ශ්‍රද්ධාව' කියලා. නමුත් ඒ දේශනා කරන කාරණාව අපි තුළින් ම දැකිය හැකි හින්දයි අපිට කියන්න පුළුවන් බය නැතුව භාග්‍යවතුන් වහන්සේ ධර්මය මනා කොට දේශනා කරලා තියෙනවා කියන එක.

ඕගොල්ලෝ කොහාට හරි සාස්තරයක් අහන්න යනවා කියන්නකෝ. එතකොට සාස්තරකාරයා ඕගොල්ලොන්ගේ හිතේවත් නැති දෙයක් ගැන හෝ වෙන වල්පල් ටිකක් කිවුවොත් මනා කොට සාස්තරය කිවුවා කියලා කියනව ද? නැහැ.

නමුත් ඕගොල්ලෝ සාස්තරය අහන්න ගියහම කියන කියන එක ඕගොල්ලොන්ට පේනවා, ඔගොල්ලොන්ගේ ගෙදර වෙච්ච සිද්ධිය ම යි කියන්නේ, ඔයා හිතාගෙන ආපු එක ම යි කියන්නේ. එතකොට මොකක් ද කියන්නේ? මනා කොට සාස්තරය කිවුවා කියනවා නේද අපි. ඇයි? ඒ කියන

---

178 https://tipitaka.lk/mn-1-3-7 - **චූළහත්ථිපදෝපම සූත්‍රය- ඕපම්ම වර්ගය- මජ්ඣිම නිකාය 1- 446 පිටුව**

කියන එකක් ගානේ තමන්ට තමන් තුළින් ම දකින්න පුළුවන් වෙච්ච හින්දා. දකින්න බැරි නම් සාස්තරකාරයා කියපු සාස්තරය නියමයි කියනවා ද ඕගොල්ලෝ? නැහැ.

ඒ වගේ බුදුරජාණන් වහන්සේ දේශනා කරපු දේ දකින්න බැරි නම් අපිට, පේන්නේ නැති නම් අපි කොහොම ද භාග්‍යවතුන් වහන්සේ ධර්මය මනා කොට දේශනා කරලා තියෙනවා කියලා කියන්නේ? බුදුරජාණන් වහන්සේ දේශනා කරන දේ අපි තුළ පේනවා නම් අනේ මේ ඇත්ත නේ කියලා, භාග්‍යවතුන් වහන්සේ ධර්මය මනා කොට දේශනා කරලා තියෙනවා, මොන තරම් ඇත්තක් ද කියලා කියන්න පුළුවන්. මම මේ පෙන්නපු මාර්ගයේ යන්නකො පොඩ්ඩක් ඉස්සරහට, ඕගොල්ලෝ ම කියන් නැති වෙයිද බලන්න බුදුරජාණන් වහන්සේගේ දහම මොන තරම් ඇත්තක් ද කියන එක.

~ අපි විඳින්නේ බැහැර පවතින දේවල් ද~

චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා කියන වචනවල තියෙන අර්ථයවත් අපි හරියට දන්නේ නැහැ, කොච්චර ගැඹුරක් තියෙනවා ද කියලා.

ඒකෙන් කියනවා, බැහැර දෙයක් නෙමෙයි උඹලා විඳින්නේ කියන කාරණාව. අපි ම විඳලා, (චක්ඛු සම්ඵස්සජා වේදනා, සොත සම්ඵස්සජා වේදනා, ඝාන සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ සම්ඵස්සජා වේදනා) අපි ම ඊට හිතලා, හැබැයි බැහැර දෙයක් වින්දා කියලා තීන්දු තීරණ අරන් තියෙන්නේ මේ. භවය කියන්නේ ඒකට.

ඒ වැරැද්ද හැදිච්ච හැටි පටිච්චසමුප්පාදයෙන් පෙන්වන්නේ. *“අවිජ්ජාපච්චයා සඞ්ඛාරා”* කියලා ඇත්ත නොදන්නාකම නිසා බාහිරයට ගියපු හැටි පෙන්වන්නේ. ඒකයි උපාදානයට හිත විදිහට ඇහැ උපද්දලා,

රූපය උපද්දලා බලලා කවදාවත් බේරෙන්න බැහැ. එතනින් අහකට යන කොට ම දෙවැන්නෙක් ඉන්නවා ම වෙනවා.

ඒ මොකද? එහෙම බලන එක තුළ ම තියෙනවා ආධ්‍යාත්මික හටගන්නා ස්පර්ශයේ ඇත්ත නොදන්නාකම, නොදකිනකම නිසයි බාහිරයට ගිහින් තියෙන්නේ කියන එක. එතකොට අලුතෙන් බාහිර පැත්තට නොයන්නත් ඕනේ, බාහිර පැත්තට ගිය හුරුව කපන්නත් ඕනේ කියලා දෙකක් තියෙනවා අපිට.

එතකොට එන්නේ කොතැනට ද අපි? බාහිර ඉඳන් ආධ්‍යාත්මික පැත්තට ස්පර්ශ වීමෙන් හටගන්නා වේදනාවක් විඳින්නේ කියන තැනක නතර වෙනවා ඇවිල්ලා. ස්පර්ශ නිරෝධයෙන් ඒ වේදනාව නිරුද්ධ වෙනවා කියන එක පෙනෙනවා. ඕනේ නම් සංඥා වේදයිත නිරෝධ සමාපත්තියට වුණත් සමවදින්න පුළුවන්.

අවිද්‍යා සහගත මනසකින් ඉන්න අපි ඇහෙන ශබ්දයක් ගානේ කන යොමු කරගෙන ඉන්නවා බාහිරයට. එතකොට කවදාවත් ගොඩ යන්න බැහැ. ඒකයි, **කන මාරයා, ශබ්දය මාරයා, සෝත විඤ්ඤාණය මාරයා**[179] කියලා කියන්නේ. අලුතෙන් බාහිර පැත්තට යන එක නවත්තන්නත් ඕනේ සහ ගියපු හුරුව නවත්තන්නත් ඕනේ.

ඒ දෙක ම නැවැත්තුව ගමන් අපි ඉන්නවා කොතැන ද? ශබ්දයක් සෝත ප්‍රසාදයට ගැටෙනවා කියන එක නුවණින් දැනගෙන ඉන්නවා. එතකොට බාහිර ශබ්ද හොයාගෙන යන්න හේතු නැහැ. එහෙම ඒවා නැහැ නේ, ඒක බොරුවක් කියලා දන්නවා.

කනට (සෝත ප්‍රසාදයට) ගැටුණු ශබ්දය නම් අපිට ඇහෙන්නේ, ඒ ශබ්දය සෝත ප්‍රසාදයෙන් බැහැර (බඹයක් පමණ ශරීරයෙන් එළියේ තියෙන ශබ්දයක්) කියන තැනකින් නැඹුරු වෙනවා නම් අපි මේ නැති ප්‍රශ්නයක් ඇති කර ගෙන තියෙන්නේ.

---

179 https://tipitaka.lk/sn-4-1-7-3/sinh - **සමිද්ධි මාරපඤ්හ සූත්‍රය- මිගජාල වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 87 පිටුව**

ඒ ඇයි? අපි හොයන්න යන ශබ්දය සෝත ප්‍රසාදයට ගැටිලා ඒ ස්පර්ශය විඳලත් ඉවරයි එතකොට. ඊට පස්සේ දෙවනුවට බාහිරයට නැඹුරු වෙලා මේ තියෙන්නේ. මම ඔය කතා කරන්නේ ඔහොම යථාර්ථයක් ගැන. ඒ හින්දා ලෝකය කියන එක පුතේ තේරුම් ගන්න ඕනේ.

~ ලෝකය තිබුණොත් බැඳුම් ගොඩයි ~

ඔය ලෝකය කියන එක තියෙන්නේ නිකන් ම නිමිති ටිකක් නෙමෙයි. ඕකේ ඇතුළේ තියෙනවා සංයෝජන (බැඳුම්). අම්මා ඉන්නවා, තාත්තා ඉන්නවා, දරුවෝ ඉන්නවා, නෑදෑයෝ ඉන්නවා, යුතුකම් තියෙනවා, වගකීම් තියෙනවා, යානවාහන ඉඩකඩම් තියෙනවා. ඕවා දාලා යන්න බැහැ කියලා බැඳුම් තියෙනවා.

ඕඝ තියෙනවා, කාමය පැත්තට, භවය පැත්තට, දිට්ඨිය පැත්තට, අවිද්‍යාව පැත්තට ම ගහගෙන යන යෝග තියෙනවා, කාමය පැත්තට, භවය පැත්තට, දිට්ඨිය පැත්තට, අවිද්‍යාව පැත්තට යොදවන කියන ගති ටිකකුත් එක්ක තියෙන්නේ. ඒ හින්දා මේ හිරවෙලා ඉන්නේ අපි. ඒ හින්දා ඇත්ත ම වෙලා තියෙන්නේ ලෝකය අපිට.

ඉතින් හොඳ වීර්යයක් ඕනේ, අච්චර කෙලෙස් ගති තියෙද්දිත් ලෝකයෙන් එතෙර වෙන පැත්තට කඩාගෙන යන්න. මේ ඇත්ත ම යි කියලා හිතින් පෙන්වද්දිත්; ඕක ඇත්ත නෙමෙයි, ඕක භවය. ඔය භවය (ලෝකය) හැදුණේ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතු ටිකෙන්.

අවිද්‍යා කර්මයෙන් කියන්නේ ආධ්‍යාත්මික පැත්තට ආපු එකට බාහිරට නැමුනා කියන එකයි. ඊට පස්සේ ඒකට 'පුද්ගලයෙක්', 'දෙයක්' කියලා හොඳට තණ්හා උපාදාන වෙච්ච හින්දා නේ මට මේ නිමිති තියෙන්නේ කියන කතාව මේ කියන්නේ.

අම්මා, තාත්තා, ගෙවල් දොරවල්, පාරවල් මතක් වෙන ගානේ ඔය ඔක්කොම හැදිලා තියෙන්නේ කොහොම ද? අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර

කියන හේතු ප්‍රත්‍ය ටිකෙන්. චක්ඛු ප්‍රසාදයට ගැටුණු රූපය යි පෙනෙන්නේ කියලා ගත්තා නම් එළියේ පාරවල් තියෙනවා කියලා හම්බ වෙයි ද අපිට? නැහැ. බාහිර තියෙනවා කියලා බලපු එකේ දෝෂය නිසයි එහෙම වෙන්නේ. එහෙම බාහිරට නැමෙන සිද්ධිය තමයි *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"* කියන සිද්ධියෙන් පෙන්වන්නේ.

චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්ස, ඝාන සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස, මනෝ සම්ඵස්ස කියන ස්පර්ශ නිසා ඇතිවෙන සිද්ධාන්තයක් තියෙන තැනක, ඒ බව නොදැන බැහැර තියෙන දෙයක් හැටියට හිතලා උපාදානයට හිත විදිහට ඇහැ රූප, කන, ශබ්ද, නාසය, ගන්ධ, දිව, රස, කය, ඵොට්ඨබ්බ, මන, ධම්ම උපද්දලා ඒවාට තණ්හා උපාදාන වෙලා ලෝකය හදාගත්තා නම්, එතකොට අපි ඒ හදාගත්ත ලෝකය උප්පත්ති වශයෙන් ගෙනාව ද? නැහැ. එතකොට එයා හොඳට දන්නවා, මේ ලෝකය කියන එක හැදුණේ මෙහෙම *"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"....* ලෙස ඇරඹෙන පටිච්චසමුප්පාද සිද්ධියකින් කියලා.

~ ලෝකය ඇත ද නැත ද~

කච්චානගොත්ත සූත්‍රයේ පෙන්වන්නේ, **කච්චිචාන, බොහෝ සෙයින් ලෝකයා ඇත සහ නැත කියන අන්ත දෙක ඇසුරු කරනවා. ලෝකය ඇතිවෙන හැටි දකින කෙනා ලෝකය නැහැ කියන්නේ නැහැ.**[180]

රූපය චක්ඛු ප්‍රසාදයට ම යි වදින්නේ, ශබ්දය සෝත ප්‍රසාදයට ම යි වදින්නේ කියන තැනක දකින්න බැරුව බැහැර පැත්තට නැමිලා හිතලා, *(අවිජ්ජාපච්චයා සඞ්ඛාරා)* චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ උපද්දලා, නාමරූප දෙකට බැසගෙන උපාදානයට හිත විදිහට ඇහැ, කන හදාගෙන, ඒ ආයතනවලට රූප, ශබ්ද ස්පර්ශවන කොට ඒවා විඳලා තණ්හා උපාදාන වෙලා නිමිති හදාගෙන ලෝකය හැදෙන ක්‍රමයක් තියෙනකන් ලෝකය නැහැ

180 https://tipitaka.lk/sn-2-1-2-5/sinh - **කච්චානගොත්ත සූත්‍රය- ආහාර වර්ගය- අභිසමය සංයුත්තය- සංයුත්ත නිකාය 2- 29 පිටුව**

කියන්න පුළුවන් ද? බැහැ. ඒ හින්දා මේ ලෝකය හැදෙන හැටි දකින කෙනා නැහැ කියන්නේ නැහැ කියනවා.

ලෝක නිරෝධය දකින කෙනා ලෝකය තියෙනවා කියන්නේ නැහැ කියනවා. යම්කිසි කෙනෙකුට අවිද්‍යාව ප්‍රහීණ නම්, ඒ කියන්නේ චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා කියලා චක්ඛු ප්‍රසාදයට රූපය ගැටුණු නිසා, සෝත ප්‍රසාදයට ශබ්දය ගැටුණුකම නිසා ඇති වුණ වේදනාවක් කියලා නුවණින් දකිනකමක් තිබුණා නම් මනස බාහිරට නැඹුරු වෙන්නේ නැහැ. ඔතන තමයි පිරිසිදු මනස.

අවිද්‍යාව නැති තැනක මනස තිබුණා නම් රූප, ශබ්ද පැත්තට හිතනවා කියන සංඛාර වෙන්නේ නැහැ. එහෙම හිතුවේ නැති වුණොත් චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ හැදෙන්නේ නැති නිසා නාමරූප දෙකට බැසගෙන උපාදානයට හිත විදිහට ඇහැ, කන හැදෙන්නේ නැහැ.

උපාදානයට හිත විදිහට ආයතන හැදෙන්නේ නැති නිසා රූප, ශබ්ද ආදිය ස්පර්ශ වෙන්නේ නැහැ. ස්පර්ශය නොවන නිසා ඒ අරමුණ විඳලා තණ්හා උපාදාන වෙලා ලෝකයක් හැදෙන්නේ නැහැ. එහෙම ලෝක නිරෝධය දකින කෙනා තියෙනවා කියන්නේ නැහැ.

"එතෙ තෙ කච්චාන උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති" - මේ අන්ත දෙකට නොපැමිණ මධ්‍යම ප්‍රතිපදාවෙන් තථාගතයන් වහන්සේ ධර්මය දේශනා කරනවා. තියෙනවා කියන්නෙත් නැහැ, නැහැ කියන්නෙත් නැහැ.

"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති. අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධෝ. සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධෝ -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධෝ හොතීති." කියලා හොඳට පටිච්චසමුප්පාදය දේශනා කරනවා.

අහලා තියෙනවා නේද ඒ සූත්‍රය. ඒ කිවුවේ ඕක. මෙච්චරත් මේ කතා කරලා පැහැදිලි නැතුව නිවන කියලා දෙයක් හොයනවා නම්, ඒ හොයන

නිවන මොකක්ද කියන එක ප්‍රශ්නයක්. දුකේ නිරෝධයට, ලෝක නිරෝධයට අමතරව තවත් එකක් තියෙනවා ද කියන එකක් මම දන්නේ නැහැ. මම නම් දන්නේ එක දෙයයි. දැන් ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස් නිරුද්ධ වෙනවා නම්, මතු ප්‍රතිසන්ධියත් නැති වෙනවා නම් තණ්හාවගේ නැති වීමෙන් ඒක තමයි නිවන.

ලෝක නිරෝධය වෙනවා, *"අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො"* කියන තැනකින් අවිද්‍යාව නැති තැනකට මනස අරගෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම පැත්තට හිතන එක නතර වෙච්ච ගමන් ම චක්‍රය නතර වෙනවා.

ඒක වෙනවා අලුතෙන් ඇහැ බාහිරට නමන්නෙත් නැතුව, නමපු හුරුවත් ගෙවපු ගමන් ආපහු සීමා නොකරන ලද මනසට එනවා. ආස්‍රව දුරු වුණහම මොකුත් කරන්න දෙයක් නැහැ. නිරායාසයෙන් ම සීමා නොකරන ලද මනසට එනවා. ඔය කතාව ම යි එදත් මම කිවුවේ. අදත් කියන්නේ ඒ කතාව ම යි. අමුතු බණක් නෙමෙයි මේ කියන්නේ. මේ ජීවිතයේ සැබෑ ම තත්ත්වය.

වීර්‍යය තියෙන්න ඕනේ පුතේ. කවුරුවත් දිහා බලන්න එපා. ඕගොල්ලොන්ට හොඳටම තේරෙන්න ඕනේ, මට දැන් වෙලා තියෙන්නේ මේ වැරැද්ද. මෙන්න මෙතනට (ලෝක නිරෝධයට) එන්න තියෙන්නේ. ඒ ලෝක නිරෝධය/ දුක්ඛ නිරෝධය සාක්ෂාත් වෙන්න කාලයක් යයි. නමුත් මේ දර්ශනය ගැන නිසැක බවට පත් වෙන්න වැඩි කල් යන්නේ නැහැ.

අපි ම ලෝකය උපද්දවා ගෙන පරිහරණය කරලා තියෙනවා මිසක බැහැර තිබිලා නෙමෙයි නේද කියන උත්තරය එන්න වැඩි කල් යන්නේ නැහැ. එහෙම රූප, එහෙම ශබ්ද නැහැ, අපි අවිද්‍යාවෙන් ඉපැද්දුවේ නැත්නම්. මේ නැති ප්‍රශ්නයක් අපි ඇති කර ගෙන තියෙන්නේ. දුක උපද්දවා ගෙන දුක් විඳිනවා කියලා කියන්නේ ඕකට තමයි. අර කතාවකට කියන්නේ ඉල්ලගෙන කනවා කියලා. මේ ඉල්ලගෙන කාලා තියෙන්නේ.

භාවනා කරන්න කියලා ගියහම ඕගොල්ලොන්ට කරන්න තියෙන්නේ, ඔය ඇත්ත පෙන්වන එක. ඒ කියන්නේ ලෝකේ කියලා යමක් මොනවා හරි නිමිත්තක් තියෙනවා නම් ඕගොල්ලො දන්නවා වෙච්ච දේ.

චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්සයක්ව තිබුණු එක එතනින් නතර නොවී ස්පර්ශ වෙච්ච අරමුණ බැහැර තියෙන්නේ කියලා රූපය පැත්තට, ශබ්දය පැත්තට හිතලා චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ උපදවාගෙන ඊට නැඹුරු වෙච්ච හින්දයි මේ ප්‍රශ්නය කියලා.

ඒකයි ***"පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"*** [181] කියලා කිවුවේ. පංච උපාදානස්කන්ධයක් උපදවාගෙන බේරෙන්න නම් බැහැ. රූපයට නැඹුරු වුණොත් කෙලෙස් ඇති වුණත් නැතත් මෙහෙම රූපයක් තියෙනවා කියන නිමිත්ත හෝ හිටිනවා. ඒ ඇයි? දෙවැන්නෙක් ඉන්නවා නේ. තමන්ට පරිබාහිර යමක් තියෙනවා ම වෙනවා.

අවිද්‍යාව සහිත ව හිඳිමින් මනස සීමා කරලා රූපය බලලා අනික් පැත්තට යන්නකෝ බලන්න. ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. නිමිති හිටිනවා ම යි. ඒ හින්දා දැන් තියෙන්නේ එක දෙයයි.

~ උපකාරක ධර්ම ~

මේ සඳහා ඉන්ද්‍රිය සංවරය ඇති කර ගන්න ඕනේ. ඇහෙන් රූප බලලා ලෝභ ද්වේෂ අකුසල ධර්ම ඇති නොවෙන විදිහට නිමිති අනුනිමිති ගන්න එක පුළුවන් තරම් නතර කර ගන්නවා. (අනෙක් ආයතන වලිනුත් එහෙමයි). නිමිති අනුනිමිති නොගෙන සංවර වෙන්න නම් කායාගතාසතිය වගේ බොහෝම ආරක්ෂිත තැනක ඉන්න ඕනේ.

සතිපට්ඨානයේ පිහිටලා ඉන්ද්‍රිය සංවරය ඇති කර ගන්නවා. භෝජනයේ පමණ දැන ගන්නවා. නිදි දුරු කරනවා. සමථ කමටහනකින් හිත

---

181 https://tipitaka.lk/kn-ps-1-1-1 - **ශ්‍රැතමය ඥානය- ඥාන කතා- පටිසම්භිදාමාර්ගය- බුද්දක නිකාය- 74 පිටුව**

වඩමින් පංච උපාදානස්කන්ධයේ උදය වැය පෙන්වනවා. ඒ කියන්නේ ස්පර්ශ ආයතන හය උපාදානයට හිත විදිහට උපද්දපු හුරුව ගෙවනවා.

~ ආස්‍රව ගෙවුණොත් ~

ලෝකය කියලා තියෙන්නේ පුතේ, ආස්‍රව ටිකක්. භවය කියන්නේ ලෝකයට නමක්. ආස්‍රව කියන්නේ ලෝකයට නමක්. ආස්‍රව කිවුවත්, භවය කිවුවත්, ලෝකය කිවුවත් එක තැනක්. අම්මා, තාත්තා, ගෙවල් දොරවල් කියලා අපිට හුරුවක් තියෙනවා. ඕකට කියනවා 'කාමාස්‍රවය'. ඕකට තමයි කාම භවය කියන්නේ. ඕකට තමයි කාම ලෝකය කියන්නේ.

ඔය මනසේ තියෙන සිද්ධියට කියන්නේ කාම භවයේ කර්ම භවය කියලා. ඔය තියෙනවා කියලා හිතන දේවල් බලන්න ගියහම කාම භවයේ උප්පත්ති භවය වෙනවා. ආයෙත් උප්පත්ති භවය නිසා කර්ම භවය. ආයෙත් කර්ම භවය නිසා උප්පත්ති භවය. ඔය දෙක කැරකි කැරකී තියෙනවා.

හැමදාම භවයේ ඇතුළේ මිසක භව නිරෝධයක් වෙන්නේ නැහැ. භව නිරෝධයක් වෙන්න නම් ආස්‍රව ක්ෂය වෙන්න ම ඕනේ. ආස්‍රව ක්ෂය වුණහම ඕගොල්ලෝ ඉන්නේ යථාර්ථයේ. එතකොට ඕගොල්ලො දන්නවා චක්ඛු සම්ඵස්සජා වේදනාවක් එනවා. ස්පර්ශය නිරුද්ධ වෙන කොට ඒ වේදනාව නිරුද්ධ වෙනවා. සෝත සම්ඵස්සයෙන් උපන්න වේදනාව ස්පර්ශය නැති වෙන කොට නැති වෙනවා කියලා.

බුදුරජාණන් වහන්සේ වේදනාව කියන තැනින් ගොඩක් වෙලාවල්වල දී නවත්තන්නේ ඔය නිසයි. මනස සීමා නොකරනවා කියනකම වුණේ ම බැහැරට ගියේ නැහැ කියනකම හින්දයි. සීමා නොකරන ලද මනසක් ඇති විට එහෙ (බාහිර) ඉඳන් මෙහාට එන කොට ඒ පැත්තෙන් මොනවත් තියෙනවා ද සීමා වෙලා? නැහැ. බාහිර නිමිති අහුවෙලා නැති එකෙන් තියෙනවා චක්ඛු සම්ඵස්සය වෙන්නේ කියන එක. නැතිනම් රූපය චක්ඛු ප්‍රසාදය කරා පැමිණි ගතියක් තියෙන්නේ කියන සිද්ධිය වෙන්නේ කියන එක.

යථාර්ථයට එන කොට ස්පර්ශය යන පැනවීම පනවන්න බැරි වෙනවා.[182] ඒ කියන්නේ; ඇහැ, රූප කියලා එකක් උපද්දන්නේ නැහැ. ආස්‍රව ක්ෂය කරලා සීමා නොකරන ලද මනසේ ඉන්න කෙනාට මේ ඇහැ, මේ රූප කියලා නිමිත්ත් නැහැ. එහෙම එකක් දන්නේ නැහැ එයා.

පෙනෙන දේ පෙනීමෙන් පස්සේ නිරුද්ධ යි, ඇහෙන දේ ඇහීමෙන් පස්සේ නිරුද්ධ යි සීමා නොකරන ලද මනසේ ඉන්නවා නම්. භාවනා කරන්න කියලා කියන්නේ ඔන්න ඔය දෝෂය හදාගන්න ඕනේ නිසා. එතකොට අපි තේරුම් ගන්න ඕනේ, මොකක් ද මේ වෙලා තියෙන්නේ කියන එකත්, අපි කොතැනට ද එන්න ඕනේ කියන එකත්.

කනට ශබ්දය ගැටෙන තැන නම් සෝත සම්ඵස්සය, ඇහැට රූපය ගැටෙන තැන නම් චක්ඛු සම්ඵස්සය සිද්ධවන තැන ඉන්න ඕනේ කිවුවට එහෙම ඉන්න බැහැ. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නැති වෙනවා කියලා බලන්න ඕනේ වුණාට බලන්න බැහැ.

ඕගොල්ලොන්ට තියෙන්නේ ආස්‍රව ක්ෂය කර ගන්න. එතකොට නිරායාසයෙන් ම චක්ඛු සම්ඵස්ස, සෝත සම්ඵස්ස ආදී සම්ඵස්සයන්ට නුවණ එනවා, ඒවා පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව ම නැති වෙනවා කියලා. මෙතන කළ යුත්තක් නෙමෙයි, මෙතනට පැමිණ ජීවත් වෙන්න තියෙන්නේ.

පොඩි වෙහෙසක් විතරයි වෙන්න තියෙන්නේ. මහා වැඩ ගොඩක් නැහැ. ඒ කියන්නේ අම්මා, තාත්තා, ගෙවල්, දොරවල්, යානවාහන, ඉඩකඩම් කියන පංච උපාදානස්කන්ධ ලෝකයේ ලෝභ, ද්වේශ දෙක ඇති නොවෙන විදිහට ඒ ඒ තැන විදර්ශනා කරන්න තියෙන්නේ.

182 https://tipitaka.lk/mn-1-2-8/sinh - **මධුපිණ්ඩික සූත්‍රය- සිහනාද වර්ගය- මජ්ඣිම නිකාය 1- 283 පිටුව**

~ ආයතන ගැට ගැසීම නිසා ලෝකය සජීවී වන හැටි ~

රූපය පිළිගන්න නම් එපා. 'අම්මා' කියන එක ඇත්ත වුණොත් මනුස්සයෙක් ම තමයි අපි. කවදාවත් අනාගාමී බ්‍රහ්මයෙක් හෝ රහතන් වහන්සේ කෙනෙක් වෙන්න බැහැ. අපිට අම්මා ඉන්නවා කියන එක ඇත්ත ම වගේ කියලා දැනෙනවා. උණුසුමත් දැනෙයි, ස්පර්ශයත් දැනෙයි, සෙනෙහසත් දැනෙයි. ඇයි එහෙම වෙන්නේ?

'අම්මා' කියලා කනබොන ආහාරයෙන් හැදෙන රූපය දිහා බලාගෙන ඉන්න කොට ඒ රූපය අතින් බදාගෙන හිටියා නම් කාය සම්ඵස්සය නිසා උණුසුමත් දැනෙයි. ඒ නිමිත්ත රූපයට ගැට ගහලා 'අම්මා අල්ලන් හිටපු උණුසුම' කියලත් දැනෙයි.

කනබොන ආහාරයෙන් හැදුණු රූපයට 'අම්මා' කියලා හොම්බ තියාගෙන ඉන්න කොට සුවඳක් ආවා නම් 'මේ අම්මාගේ සුවඳ නේ' කියලත් හිතෙයි. ඒ හින්දා තමයි 'අම්මා' කියන එක අපිට සජීවී වෙලා තියෙන්නේ. එහෙම අපිට තේරෙද්දිත් අපි පෙන්වන්න ඕනේ ඇත්ත යථාර්ථය. ඕගොල්ලොන්ගේ නුවණ කෙලෙස්වලට වඩා බලවත් වෙන්න ඕනේ. මෙතන තියෙන යථාර්ථය මේක නේද කියලා පෙන්වන්න ඕනේ. එතකොට තමයි පංච උපාදානස්කන්ධ ලෝකය ගැලවෙන්නේ.

මනුස්ස ලෝකේ නෑදෑකම් තියාගෙන බ්‍රහ්මයෝ ඉන්නේ නැහැ. බ්‍රහ්මයන්ට බ්‍රහ්ම ලෝකෙත් නැදෑයෝ ඉන්නවා, මෙහෙත් නැදෑයෝ ඉන්නවා කියලා එකක් නැහැ. එක්කෝ මනුස්සයෙක් නම් මනුස්සයෙක්. බ්‍රහ්මයෙක් නම් බ්‍රහ්මයෙක්. භාගයක් පණුවා, භාගයක් සමනළයා එහෙම වෙන්න බැහැ. පණුවා නම් පණුවා, සමනළයා නම් සමනළයා. ඉතින් ඕක තමයි මට කියන්න තියෙන්නේ.

~ භාවනා කරන විදිහ ~

ඒ හින්දා ටිකක් භාවනා කරන්න. භාවනා කරන්න කියන කොට සති නිමිත්තේ හිත තියාගෙන ආනාපානසතිය වඩන්න. මනසට බැහැර දෙයක් ඇති බවට සිහිවෙන කොට ඒක අල්ලගන්නවා. මේ ආස්‍රව නේ කියලා හඳුන ගන්නවා මුලින් ම. 'අම්මා' සිහි වෙනවා නම් මේ කාමාස්‍රවය නේද.

'යම්කිසි දෙයක් දුරක තියෙනවා' කියලා හැඟෙනවා නම් මේ භවාස්‍රවය නේද. අම්මා දුරක ඉන්නවා කියලා හැඟෙනවා නම් කාමාස්‍රවය හා භවාස්‍රවය එකට යෙදිලා නේද. මේ ආස්‍රව ඇති වුණේ කොහොමද? අවිද්‍යා කර්මයෙන් කියන කොට බාහිරයට නැමිලා උපාදානයට හිත විදිහට අරමුණක් අල්ලගෙන ඒකට අපි ම තණ්හා උපාදාන වෙච්ච නිසා නේද මේ ආස්‍රව ඇතිවෙලා තියෙන්නේ කියලා පටිච්චසමුප්පාදය මෙනෙහි කරනවා.

අවිද්‍යාව නැති වුණා නම්, රූපය චක්ඛු ප්‍රසාදයට ස්පර්ශ වන බව, ශබ්දය සෝත ප්‍රසාදයට ම ගැටෙන බව තේරුණා නම් මම බාහිර පැත්තට නැමෙන්නේ නැහැ නේද. එහෙම වුණා නම් මේ වගේ නිමිති හිටින්නේ නැහැ නේ කියන එක කෙටියෙන් පෙන්වන්න. අවිද්‍යාව නැති වුණා නම් කියලා කියන්නේ, ශබ්දය කනට ම ඇවිල්ලා ගැටෙන බව මට තේරුණා නම් ශබ්දය තියෙනවා කියලා මම බැහැරට යොමු වෙන්නේ නැහැ. එහෙම බැහැරට යොමු නොවුණා නම් උපාදාන වෙන්නේ නැහැ.

උපාදාන නොවුණා නම් මෙහෙම නිමිත්තක් මට නැහැ නේද කියන එක තමයි අවිද්‍යාව නැති වීමෙන්, කර්මය නැති වීමෙන්, තණ්හාවගේ නැති වීමෙන්, ආහාර නැති වීමෙන් කියන එකෙන් කියන්නේ කියලා එයාට තේරෙනවා. එහෙනම් එයාට තේරෙනවා මගේ ම දෝෂයට තමයි නිමිති හදාගෙන තියෙන්නේ කියන එක.

දෙපැත්තක් තියෙනවා දැන්. ඔන්න දැන්; 'අම්මා ඉන්නවා', 'ගෙදර තියෙනවා', 'ගම තියෙනවා' කියලා හැඟෙන කොට මේක තමයි භවය. අවිද්‍යා කර්මයෙන් බැහැර රූපය පැත්තට නැඹුරු වෙලා 'පුද්ගලයෙක්',

‘කෙනෙක්’, ‘දෙයක්’ විදිහට හිතපු හින්දා නේද මෙහෙම නිමිති හැදිලා තියෙන්නේ කියන එක පෙන්වනවා.

ඒ වගේ ම අනික් පැත්තට පෙන්වනවා. රූපය චක්ඛු ප්‍රසාදය කරා ඇවිල්ලා ඒ ස්පර්ශය නිසා හටගත්ත වේදනාවක් ඇති වෙන්නේ කියන තැනක සිහිය නුවණ පවත්වා ගත හැකි තැනක මට ඉන්න පුළුවන් වුණා නම් මම බාහිරයට නැඹුරු වෙන්නේ නැහැ නේද. එහෙම නැඹුරු නොවුණා නම් මට මෙහෙම නිමිත්තක් හිටින්නේ නැහැ නේ කියලා පෙන්වනවා.

ඔහොම ටිකක් විදර්ශනා කරනවා. සමථ කමටහනකින් හිත වඩනවා. නොබෝ දවසකින් පංච උපාදානස්කන්ධ ලෝකය ම උපද්දවා ගෙන පරිහරණය කරන්නේ කියලා ටක්ගාලා සම්මාදිට්ඨිය උපදිනවා. ලෝකය බිම තියන්න එපා කියලා මම මේ කියන්නේ. ඕගොල්ලෝ දැන් මේ පොළොවට තියලා නේ තියෙන්නේ. පොළොව පිටින් උදුරලා ගන්න.

ටක්ගාලා උදුරන්න පුළුවන්. සමුදයට බැලුවා, හිත පිළිගන්නේ නැත්නම් නිරෝධයට (වැයට) බලනවා. *“සමුදයධම්මානුපස්සී වා, වයධම්මානුපස්සී වා, සමුදයවයධම්මානුපස්සී වා”* - ඇතිවීමට හෝ පෙන්වනවා, නැතිවීමට හෝ පෙන්වනවා, ඇතිවීම නැතිවීමට පෙන්වනවා.

ඇහෙන ශබ්දය කනට ම යි ගැටෙන්නේ කියන යථාර්ථය තේරෙන තැනක මම හිටියා නම් බැහැර ශබ්දයක් ඇහෙන්න පුළුවන්කමක් තියෙයි ද මට, එහෙනම් හිත නමනවා ද බැහැරට? එහෙම හිත නැමුවේ නැති වුණා නම් බැහැර ශබ්දයක් තියෙනවා කියන නිමිත්තක් තියෙයි ද මට? අම්මාගේ හඬ, දරුවෙක්ගේ හඬක් කියලා හම්බවෙයි ද මට? කියලා තමන්ගෙන් ම අහනවා. එතකොට තමන් දන්නවා එහෙම හම්බ වෙන්නේ නැහැ කියලා.

කාගේ හරි හඬක් ආවා නම් තමන්ගේ කන ගාව ම ශබ්දය ඉපදිලා, කන ගාව දී ම නැති වුණා නම් බැහැර තිබිලා නෙමෙයි නේ කියන අන්න ඒ ඇත්තට එනවා. අන්න ඒ විදිහට පෙන්න පෙන්න හිත වඩන්න. හිත වඩමින් පෙන්වන්න.

හැමදෙනාට ම තෙරුවන් සරණයි!

පූජනීය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින් 2018.11.17 දින ලබුනෝරුවකන්ද ආරණ්‍ය සේනාසන වාසී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් සිදු කළ ධර්ම දේශනාවක් ඇසුරෙන් පිටපත් කිරීමකි.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අපි හැම කෙනෙක් ම මහණ වුණේ බොහොම ශ්‍රද්ධාවෙන්. මේ අවස්ථාව, මේ වටපිටාව ලබා ගන්න කල්ප ගණනක් අපි පෙරුම් පුරන්න ඇති. සසර බොහෝ කාලයක් සතර අපායන්වල දුක් විඳලා විඳලා පෙර පිනකට බුද්ධෝත්පාද කාලයක්, මනුස්ස ජීවිතයක්, සද්ධර්මය තියෙන වටපිටාවක් ලබාගෙන අපි උපන්නා.

ඉතින් කොහොම හරි අපිට පිනකුත් තිබුණා මගේ බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදි වෙන්නත්. අපි හැමදෙනාගෙම ඒකායන බලාපොරොත්තුව වුණේ කොහොම හරි මේ ජීවිතයේ දී ම සසර දුක අවසන් කර ගන්නත් ඒ පණිවිඩය අනික් අයට කියලා දෙන්නත්.

~ ලෝකේ කරන්න තියෙන අමාරු ම වැඩේ ~

ඉතින් ඒ නිසා අපි වීර්‍ය කළ යුතුයි, අපි යමක් සඳහා මේ ශාසනයට ආවා නම් ඒ ආපු ඉලක්කය සම්පූර්ණ කර ගන්න. මෙතනදි මම ඕගොල්ලොන්ට පොඩි කරුණාක් මතක් කරනවා. ගොඩක් කල් නෙමෙයි, දවස් හතක් විතර මම භාවනා කරන හැටි කියලා දෙනවා. ලෝකේ තියෙන කරන්න අමාරු ම දේ තමයි කරන්න වෙන්නේ.

හැබැයි ඒ ටික හුරු වුණොත් අපිට ජීවිතයේ ඕනෑම තැනක ජීවත් වෙන්න පුළුවන්. ඒ එක්ක ම කිසිම අපහසුවකින් තොරව මුළු ජීවිතයේ ම සැපෙන් සොම්නසෙන් ඉන්නත් පුළුවන්. ඒ වගේ ම මේ සසර ගමන අවසන් කරන්නත් පුළුවන්. ඒකට ලොකු ම ලොකු කැප කිරීමක් තියෙන්නට ඕනේ. ඒ

වෙන මොකවත් නෙමෙයි, අපි මෙන්න මේ කායගතාසතිය පුරුදු පුහුණු කරන එක.

කායගතාසතියේ තියෙන ආනිසංස මොනවද, කායගතාසතිය වඩන හැටි කොහොමද කියලා පිටකය පුරාවට තථාගතයන් වහන්සේ මොන මොන තැන්වල, මොන මොන විදිහට පෙන්නලා තියෙනවා ද කියලා ඉස්සෙල්ලා ටිකක් බලමු. තම තමන් තෝර ගත්ත සූත්‍ර ටික ගන්න. ඉස්සෙල්ලා ම මාත් සූත්‍රයක් ගන්නම්.

~ ජප්පාණක සූත්‍රය [183] ~

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ ඉන්න කාලේ භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කරලා කියනවා, “මහණෙනි, යම්කිසි විදිහක සැරව පිරුණු තුවාලයක් තියෙන මනුස්සයෙක් කටු සහිත කැලේකට ගියොත් ඒ කටු හෝ ඇනිලා වේදනාව එනවා. එහෙම නැතිනම් ගස්වල කොළ අතු වැදිලා හෝ එහෙම නැතිනම් කෝටු කෑලි වැදිලා හෝ දුක් දොම්නස් උපදිනවා.

ඒ වගේ සමහර භික්ෂුවක් ආරණ්‍යයකට ගියොත් හෝ, ගමකට ගියොත් එයා ගැන මිනිස්සු මෙහෙම කියනවලු. ඔය ආවේ අහවල් හාමුදුරුවෝ. එයා මේ වගේ දුස්සීල කෙනෙක්, මේ වගේ නරක කෙනෙක්, මේ වගේ අසත්පුරුෂ ගති තියෙන කෙනෙක් කියලා ලෝකයා කතා කරනවලු. එයාව කටුවක් වගේ දුරු කරන්න පුළුවන්, කටුවක් වගේ භික්ෂුවක් කියලා මිනිස්සු කතා කරනවලු”.

ඉතින් ඒ නිසා බුදුරජාණන් වහන්සේ පෙන්වනවා අනික් අයට, “ඒ භික්ෂුව කටුවක් කියලා හඳුනගෙන, ඒ එක්ක ම කටුවක් නොවෙන විදිහට සංවරය හා අසංවරය කියන එකත් දැනගෙන අසංවරය දුරු කරලා

183 https://tipitaka.lk/sn-4-1-19-10/sinh - **ජප්පාණක සූත්‍රය- ආසීවිස වර්ගය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 379 පිටුව**

සංවරයේ පිහිටන්න” කියලා. එතකොට සංවරය හා අසංවරය දැන ගන්නට ඕනේ.

- **අසංවර්ය යනු**

මොකක්ද අසංවරය කියලා කියන්නේ? ඇහෙන් රූපයක් දැකලා, දකින රූපේ සතුටු වශයෙන් ඇලෙනවා, එහෙම නැතිනම් අමනාප වශයෙන් ගැටෙනවා, එළඹ සිටි කායගතාසතිය නැතිව විසිරුණු සිත් ඇතුව ළාමක අකුසල ධර්මයෝ ඇතිවෙන විදිහට ඇහෙන් අසංවර විදිහට නිමිති ගන්නවා.

ඒ විදිහට ම කනෙන්, නාසයෙන්, දිවෙන්, කයෙන්, මනසින් අරමුණු දැනගෙන ඒවායේ සතුටු වශයෙන් ඇලෙනවා. එක්කෝ අසතුටු වශයෙන් ගැටෙනවා. එළඹ සිටි කායගතාසතිය ඇත්තේ ම නැහැ. ළාමක අකුසල ධර්මයෝ වෑහෙන විදිහට ඉන්නවා. මෙන්න මෙහෙම අසංවරයෙන් ඉන්න කෙනා තමා ගමට ගියත්, ආරණ්‍යයකට ගියත් දුරු කළ යුතු අසත්පුරුෂ, වැරදි ගති ඇති කටුවක් වගේ කෙනෙක් කියන තත්ත්වයට පත් වෙන්නේ.

ඒ වගේ ඇහෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, කයෙන්, මනසින් ඇලෙන විදිහට හෝ ගැටෙන විදිහට හිත මෙහෙයවලා, කායගතාසතිය වඩන්නෙත් නැතුව පැත්තකට වෙලා ඉන්න කොට එයාගේ හිත හැම වෙලාවක ම දැකපු රූපේ පැත්තට අදිනවා. අහපු ශබ්දය පැත්තට අදිනවා. ලබපු ගඳ සුවඳ පැත්තට අදිනවා. ලබපු රස පැත්තට අදිනවා. ලබපු ස්පර්ශ පැත්තට අදිනවා. ධර්මාරම්මණ පැත්තට අදිනවා. යමකට හේතු සකස් වුණා ද ඒ පැත්තට යනවා.

~ සත්තු භයදෙනාගේ උපමාව ~

බුදුරජාණන් වහන්සේ උපමාවක් හැටියට සර්පයෙකුත් ගන්නවා, කිඹුලෙකුත් ගන්නවා, බල්ලෙකුත් ගන්නවා, නරියෙකුත් ගන්නවා, පක්ෂියෙකුත්

ගන්නවා, වඳුරෙකුත් ගන්නවා. පක්ෂියාගේ නැට්ටෙත් ලණුවක් ගැට ගහනවා, සර්පයාගේ නැට්ටෙත් ලණුවක් ගැට ගහනවා. කිඹුලාගේ නැට්ටෙත් ලණුවක් ගැට ගහනවා, බල්ලාගේ, වඳුරාගේ, නරියාගේ නැට්වලත් වෙන වෙන ම ලණු ගැට ගහනවා.

එහෙම ලණු ගැට ගහලා ඉතුරු ලණු කෙළවරවල් හය එකට එකතු කරලා ගැටයක් ගහලා අතහරිනවා. එතකොට සර්පයා අදිනවා හුඹහට යන්න. කිඹුලා අදිනවා වතුරට යන්න. බල්ලා අදිනවා ගමට යන්න. නරියා අදිනවා සොහොනට යන්න. වඳුරා අදිනවා ගහට යන්න. පක්ෂියා අදිනවා අහසට ඉගිලෙන්න. දැන් හයදෙනා හය පැත්තට ලොකු කලබගෑනියක්. ඔය අතර එකෙක් බලවත් වෙයි ද අනෙක් අය දුබල වෙයි ද ඒ ඔක්කොම සත්තු ටිකත් ඇදගෙන ඌ කැමති පැත්තට යනවා.

කායගතාසතිය වඩන්නේ නැති; දකින, අහන, දැනෙන, දැන ගන්න අරමුණුවල ඇලෙන විදිහට, ගැටෙන විදිහට මනසක් පවත්වනවා කියන්නේ සත්තු හයදෙනාගේ නැටි ටික එකට එකතු කරලා ගැටයක් ගහලා තියෙනවා වගේ. එහාට ඇද ඇද මෙහාට ඇද ඇද ඉන්නවා. එක ආයතනයක් බලවත් වෙනවා ද අනික් ඔක්කොම යට කරගෙන ඒ ආයතනය පැත්තට යනවා.

රූප බලන්න තියෙන හේතු (කෙලෙස්) බලවත් වූණා ගමන් ඔක්කොම යට කරගෙන ඒ පැත්තට යනවා. ශබ්ද අහන්න තියෙන හේතු (කෙලෙස්) බලවත් වුණා ද ඔක්කොම යටපත් කරගෙන ඒ පැත්තට යනවා. ස්පර්ශ ලබන්න තියෙන හේතු (කෙලෙස්) බලවත් වුණා ද ඔක්කොම යටපත් කරගෙන ඒ පැත්තට යනවා.

- **සංවරය යනු**

සංවරය කියලා කියන්නේ මොකක් ද? ඇහෙන් රූප දැකලා රූපයේ සතුටින් ඇලෙන්නෙත් නැහැ, අසතුටින් ගැටෙන්නෙත් නැහැ. කනෙන් ශබ්ද අහලා ශබ්දයේ ඇලෙන්නෙත් නැහැ, ගැටෙන්නෙත් නැහැ. ඒ වගේ ම

නාසයෙන් ගන්ධ, දිවෙන් රස, කයෙන් ඵොට්ඨබ්බ, මනසෙන් ධම්මාරම්මණයන් සිහි කර ගෙන ඒකේ සතුටින් ඇලෙන්නෙත් නැහැ. අසතුටින් ගැටෙන්නෙත් නැහැ. එළඹ සිටි කායගතාසති ඇතුව වාසය කරනවා.

එයා දන්නවා, එළඹ සිටි කායගතාසතිය නැති කෙනෙකුට පෙනෙන, ඇහෙන, දැනෙන, දැන ගන්න අරමුණුවල ඇලෙන්නේ ගැටෙන්නේ නැතුව ඉන්න බැහැ. පෙනෙන, ඇහෙන, දැනෙන, දැන ගන්න අරමුණුවල ඇලෙන ගැටෙන කෙනාට පැත්තකට වෙලා ඉන්න කොට ඒවා කෙරෙහි නිතර ම ඇදෙන විදිහට සිතුවිලි උපදින එක නවත්තන්නත් බැහැ කියලා.

එබඳු වූ කෙලෙස් සිතුවිලි උපන්නොත් ඒ ඒ බාහිර ආයතනය පැත්තට කඩාගෙන යන එක නවත්තන්න බැහැ. එහෙම ගියොත් වැරදි වෙනවා, අඩුපාඩු වෙනවා. ගමේ හිටියත් ආරණ්‍යයේ හිටියත් අහවලා මෙන්න මෙහෙම වැරදි කරන කටුවක් වගේ දුරින් ම දුරු කළ යුතු කෙනෙක් ය කියන තැනට පත්වෙනවා කියලා දන්නවා.

ඒ හින්දා අසංවරයත් දන්නවා, අසංවරය නිසා කටුවක් වෙන විදිහත් දන්නවා. එයා සංවරය හා අසංවරයත් දන්නවා. දැනගෙන එයා සංවරයේ පිහිටනවා. කොහොමද සංවරය කියන්නේ? ඇහෙන් රූප දැකලා ඇලෙන්නේ ගැටෙන්නේ නැහැ. කනෙන් ශබ්ද අහලා ඇලෙන්නේ ගැටෙන්නේ නැහැ. නාසයෙන් ගඳ සුවඳ, දිවෙන් රස, කයෙන් ඵොට්ඨබ්බ, මනසෙන් ධම්මාරම්මණ හිතලා ඇලෙන්නේ හෝ ගැටෙන්නේ නැහැ.

~ කායසතාසතියට උපමාව ~

සර්පයාගේ නැට්ටේ ලණුවක් ගැට ගැහුවා, කිඹුලාගේ නැට්ටේ ලණුවක් ගැට ගැහුවා, බල්ලාගේ නැට්ටේ ලණුවක් ගැට ගැහුවා, නරියාගේ නැට්ටේ ලණුවක් ගැට ගැහුවා, පක්ෂියාගේ නැට්ටේ ලණුවක් ගැට ගැහුවා, වඳුරාගේ නැට්ටේ ලණුවක් ගැට ගහලා ලණුවල ඉතුරු කෙළවරවල් හය ම අරගෙන කණුවක හෝ ටැඹක ගැට ගහනවා.

කණුවක හෝ ටැඹක ගැට ගැහුවහම වෙනදා වගේ ම ඇදගෙන යන්න හදනවා, නමුත් ඇදගෙන යන්න බැහැ. ඇයි ඒ ලණුවල ඉතුරු කෙළවරවල් ටික ගැට ගහලා තියෙන්නේ කණුවේ හෝ ටැඹේ නිසා. ඒ නිසා ගලවගෙන යන්න බැහැ. එහාට මෙහාට ඇද්දට යන්න බැහැ, කණුවේ ගැට ගහලා නිසා. ඒ සත්තු ටික ම හෙම්බත් වෙලා කණුව මුල ම වැතිරෙන දවසක් එනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, “මහණෙනි, ඒ වගෙයි මම මේ කායගතාසතිය කණුවකට/ ටැඹකට උපමා කරමි”. කණුවේ බැඳපු ගමන් සත්තු හීලෑ වෙන්නේ නැහැ. කණුවේ බැඳපු ගමන් වෙනදා වගේ ම එහාට මෙහාට යන්න අදිනවා. නමුත් යන්න දෙන්නේ නැහැ, කණුවේ බැඳලා නිසා. වැඩි දවස් උන් දඟලන්නේ නැහැ. උන්ට ම හෙම්බත් වෙලා කණුව මුල ම වැතිරෙන දවසක් එනවා.

ඒ වගේ කායගතාසතියේ යම්කිසි කෙනෙක් අඛණ්ඩව සිත බැඳ ගත්තොත් බාහිර ආයතනවලට හිත අදින ගතිය නොබෝ දිනකින් ම නතර වෙනවා, අපේ පැවිදි ජීවිතයත් සාර්ථක වෙනවා. ඒ නිසා අපි කායගතාසතිය වඩන්න ඕනේ.

දැන් අපි මතක් කරමු, කායගතාසතිය වඩන හැටි හා කායගතාසතිය ගැන කියලා තියෙන සූත්‍ර. හරි එහෙම නම් සූත්‍ර ටික එක එක්කෙනා තියෙන තැන් ටික සටහන් කරන්නකෝ. සටහන් කරලා කෙටියෙන් කියමු. මේ දේශනාව ඉවර වෙලා කායගතාසතිය ගැන තැන් තැන්වලින් බලපු ඔක්කොම සූත්‍ර ටික එක ලිස්ට් එකකට ගන්න. මට දැනට අඞ්ගුත්තර නිකායේ ඒකක නිපාතයේ කායගතාසති වග්ගය යි, අමත වග්ගය යි දෙන්නකෝ.

කායගතාසතිය ගැන බුදුරජාණන් වහන්සේගේ විස්තරය

මුලින් ම අමත වග්ගයේ සූත්‍ර ටික ගමු. මෙන්න මේ ටිකට හොඳ අවධානයක් යොමු කරන්න. මේ ටිකේ වටිනාකම තේරුම් ගන්න.

~ අමත වග්ගය [184]~

1. මහණෙනි, යම්කිසි කෙනෙක් කායගතාසතිය පරිභෝග නොකරයි නම් ඔහු නිවන පරිභෝග නොකරන කෙනෙක්.

2. මහණෙනි, යම්කිසි කෙනෙක් කායගතාසතිය පරිභෝග කරයි නම් ඔහු නිවන පරිභෝග කරන කෙනෙක්.

3. මහණෙනි, යම්කිසි කෙනෙක් කායගතාසතිය නො වළඳන ලද ද, එයා නිවන (අමෘතය) නො වළඳන ලද කෙනෙක්.

4. මහණෙනි, යම්කිසි කෙනෙක් කායගතාසතිය වළඳන ලද ද, ඔහු නිවන (අමෘතය) වළඳන ලද කෙනෙක්.

5. මහණෙනි, යම් කෙනකුන්ගේ කායගතාසතිය පිරිහුනා ද, ඔහු නිවනෙන් (අමෘතයෙන්) පිරිහුන කෙනෙක්.

6. මහණෙනි, යම් කෙනකුන්ගේ කායගතාසතිය නොපිරිහුනේ ද, ඔහු නිවනෙන් (අමෘතයෙන්) නොපිරිහුන කෙනෙක්.

7. මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය අනධිගමයෙන් වරද්දවා ගත්ත ද, ඔහු විසින් නිවන (අමෘතය) වරද්දවා ගන්නා ලදී.

---

184 https://tipitaka.lk/an-1-16-8/sinh - **අමෘත වර්ගය- ඒකධම්ම පාළිය- ඒකකනිපාතය- අඞ්ගුත්තර නිකාය 1- 93 පිටුව**

8. මහණෙනි, යම් කෙනකුන් විසින් කායගතාසතිය ඇරඹුවේ ද, වරදවා නොගත්තේ ද, ඔහු විසින් නිවන (අමෘතය) සම්පාදනය කර ගත්තේ වේ.

9. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පමා කෙරේ ද, ඔහු නිවන (අමෘතය) පමා කෙරේ.

10. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පමා නොකෙරේ ද, ඔහු නිවන (අමෘතය) පමා නොකරයි.

11. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතියේ මුලා වේ ද, ඔහු නිවනේ (අමෘතය) මුලා වේ.

12. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතියේ මුලා නොවේ ද, ඔහු නිවනේ (අමෘතය) මුලා නොවේ.

13. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය ඇසුරු නොකළේ ද, ඔහු නිවන (අමෘතය) ඇසුරු නොකළේ වෙයි.

14. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය ඇසුරු කළේ ද, ඔහු නිවන (අමෘතය) ඇසුරු කළේ වෙයි.

15. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය නො වඩන්නේ ද, ඔහු නිවන (අමෘතය) නොවඩන ලද්දේ වෙයි.

16. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය වඩන්නේ වේ ද, ඔහු නිවන (අමෘතය) වඩන ලද්දේ වෙයි.

17. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය බහුල වශයෙන් පුරුදු නොකරන්නේ වේ ද, ඔහු නිවන (අමෘතය) පුරුදු නොකරන්නේ වෙයි.

18. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය බහුල වශයෙන් පුරුදු කරන ලද ද , ඔහු නිවන (අමෘතය) පුරුදු කරන ලද්දේ වෙයි.

19. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය විශිෂ්ඨ ඥානයෙන් නොදන්නා ලද්දේ ද, ඔහු නිවන (අමෘතය) විශිෂ්ඨ ඥානයෙන් නොදන්නා ලද්දේ වෙයි.

20. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය විශිෂ්ඨ ඥානයෙන් දන්නේ වේ ද, ඔහු නිවන (අමෘතය) විශිෂ්ඨ ඥානයෙන් දන්නා ලද්දේ වෙයි.

21. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පිරිසිඳ නො දන්නා ලද ද, ඔහු නිවන (අමෘතය) පිරිසිඳ නොදන්නා ලද්දේ වෙයි.

22. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පිරිසිඳ දන්නා ලද ද, ඔහු නිවන (අමෘතය) පිරිසිඳ දන්නා ලද්දේ වෙයි.

23. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පසක් නොකරන්නේ වේ ද, ඔහු නිවන (අමෘතය) විශිෂ්ඨ ඥානයෙන් පසක් නොකරන්නේ වෙයි.

24. මහණෙනි, යම් කෙනෙක් කායගතාසතිය පසක් කරන ලද්දේ වේ ද, ඔහු නිවන (අමෘතය) පසක් කරන ලද්දේ වෙයි.

ඔය සූත්‍ර 24 තමයි අමත වග්ගයේ කායගතාසතිය ගැන තියෙන සූත්‍ර ටික.

~ කායගතාසති වග්ගය [185] ~

1. “මහණෙනි, යම් කිසිවකු විසින් මහසමුදුර සිතින් පහස්නා ලද්දේ නම්, මහමුහුදට ගලා බස්නා යම් කිසි කුඩා නදීහු වෙත් ද, ඒ සියල්ල එයට ඇතුළත් වෙති”. ඒ කියන්නේ යම්කිසි කෙනෙක් මහා සමුද්‍රය ඇහෙන් දැකලා තියෙනවා නම් යම්කිසි ගංගාවෝ තිබේ නම් ඒ සියලුම ගංගාවෝ ඇහෙන් දැකපු මුහුදට යි ගලා බසින්නේ. ඒ වගේ යම්කිසි කෙනෙක් කායගතාසතිය පුරුදු පුහුණු කරනවා නම්, ඒ කායගතාසතියට සියලු විද්‍යාවන් ඇතුළත්. සියලු කුසල ධර්මයෝ ම ඇතුළත් කොට පවතිනවා.

2. “මහණෙනි, එක් ම ධර්මයක් වඩන ලද්දේ බහුල වශයෙන් කරන ලද්දේ මහත් වූ සංවේගය පිණිස පවත්නේය. මහත් වූ අර්ථය පිණිස පවත්නේය. මහත් වූ යෝගක්ෂේමය (සතර ශ්‍රාමණ්‍යඵල) පිණිස පවත්නේය. සති සම්පජඤ්ඤ පිණිස පවත්නේය. ඥානදර්ශන ප්‍රතිලාභය පිණිස පවත්නේය. දිට්ඨධම්ම සුඛ විහරණය පිණිස පවත්නේය. විද්‍යා - විමුක්ති ඵල ප්‍රත්‍යවේක්ෂා කිරීම පිණිස පවත්නේය. කවර එක ම ධර්මයක් ද යත්: **කායගතාසතිය යි.**

   මහණෙනි, මේ එක් ධර්මය වඩන ලද්දේ බහුල වශයෙන් කරන ලද්දේ මහත් සංවේගය පිණිස පවත්නේය. මහත් අර්ථය පිණිස පවත්නේය. මහත් යෝගක්ෂේමය පිණිස පවත්නේ ය. සිහිය හා සම්‍යක් ප්‍රඥාව පිණිස පවත්නේය. ඥානදර්ශන ප්‍රතිලාභය පිණිස පවත්නේය. දිට්ඨධම්ම සුඛ විහරණය පිණිස පවත්නේය. විද්‍යා විමුක්ති ඵල ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නේය.

3. මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි කය ද සන්සිඳෙයි. සිත ද සන්සිඳෙයි. විතර්ක විචාරයෝ ද සන්සිඳෙත්. සියලු විද්‍යාභාගීය ධර්මයෝ ද භාවනාවෙන් පිරිපුන් බවට පත් වේ. කවර

---

[185] https://tipitaka.lk/an-1-16-7/sinh - **අමෘත වර්ගය- ඒකධම්ම පාළිය- ඒකකනිපාතය- අඞ්ගුත්තර නිකාය 1- 89 පිටුව**

එක් ධර්මයක් වැඩූ කල්හි ද යත්: **කායගතාසතිය යි.** මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි කය ද සන්සිඳෙයි. සිත ද සන්සිඳෙයි. විතර්ක විචාරයෝ ද සන්සිඳෙත්. සියලු විද්‍යාභාගීය ධර්මයෝ ද භාවනාවෙන් පිරීමට යයි.

4. මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි නූපන් අකුසල ධර්මයෝ ද නූපදිත්. උපන් අකුසල ධර්මයෝ ද ප්‍රහීණ වෙත්. කවර එක් ධර්මයක් වැඩූ කල්හි ද යත්: **කායගතාසතිය යි**. මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් කළ කල්හි නූපන්නා වූ ද අකුසල ධර්මයෝ නූපදිත්. උපන්නා වූ ද අකුසල ධර්මයෝ ප්‍රහීණ වෙත්.

5. මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි නූපන්නා වූ ද කුසල ධර්මයෝ උපදිත්. උපන්නා වූ කුසල ධර්මයෝ ද බොහෝ බව පිණිස විපුල බව පිණිස පවත්නාහ. කවර එක් ධර්මයක් වැඩූ කල්හි ද යත්: **කායගතාසතිය** වැඩූ කල්හි යි. මහණෙනි, මේ එක් ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් කළ කල්හි නූපන්නා වූ ද කුසල ධර්මයෝ බොහෝ බව පිණිස විපුල බව පිණිස පවත්නාහ.

6. මහණෙනි, මේ එක්ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි අවිද්‍යාව ප්‍රහීණ වේ. විද්‍යාව උපදී. අස්මිමානය (මම වෙමි කියන හැඟීම) ප්‍රහීණ වේ. සප්ත අනුශයයෝ නැසීම වේ. දස සංයෝජනයෝ ප්‍රහීණ වෙත්. කවර එක් ධර්මයක් වැඩූ කල්හි ද යත්: **කායගතාසතිය යි**. මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි අවිද්‍යාව ප්‍රහීණ වේ. විද්‍යාව උපදී. අස්මිමානය ප්‍රහීණ වේ. අනුශයෝ නැසීමට යෙත්. සංයෝජනයෝ ප්‍රහීණ වේ.

7. මහණෙනි, එක් ම ධර්මයක් වඩන ලද්දේ බහුල වශයෙන් කරන ලද්දේ ප්‍රඥා ප්‍රභේදය (බොහෝ ආකාරයට බොහෝ තැන්වල නුවණ ඇතිවීම)

පිණිස පවත්නේ ය. අනුපාදා පරිනිර්වාණය පිණිස පවත්නේ ය. කවර එක් ධර්මයක් ද යත්: **කායගතාසතිය යි.** මහණෙනි, මේ එක් ම ධර්මය වඩනා ලද්දේ බහුල වශයෙන් කරන ලද්දේ ප්‍රඥා ප්‍රභේදය පිණිස පවත්නේ ය. අනුපාදා පරිනිර්වාණය පිණිස පවත්නේ ය.

8. මහණෙනි, එක් ම ධර්මයක් වැඩූ කල්හි බහුල වශයෙන් පුරුදු කළ කල්හි අනේක (නොයෙක්) ධාතූන්ගේ ලක්ෂණ ප්‍රතිවේධය වෙයි. ධාතූන්ගේ නානාභාවයෙන් ලක්ෂණ ප්‍රතිවේධය වේ. අනේක ධාතූන් පිළිබඳ ප්‍රතිසම්භිදා ඥානය පහළ වේ. කවර එක් ධර්මයක් වැඩූ කල්හි ද යත්: **කායගතාසතිය යි.** මහණෙනි, මේ එක් ම ධර්මය වැඩූ කල්හි බහුල වශයෙන් කළ කල්හි අනේක ධාතූන්ගේ ප්‍රතිවේධය වේ. නානාධාතූන්ගේ ප්‍රතිවේධය වේ. අනේක ධාතූන්ගේ ප්‍රතිසම්භිධා ඥානය වේ.

9. මහණෙනි, එක් ම ධර්මයක් වඩන ලද්දේ බහුල වශයෙන් කරන ලද්දේ සෝවාන් ඵල පසක් කිරීම පිණිස පවත්නේ ය. සකෘදාගාමී ඵල පසක් කිරීම පිණිස පවත්නේය. අනාගාමී ඵල පසක් කිරීම පිණිස පවත්නේ ය. අරහත් ඵලය පසක් කිරීම පිණිස පවත්නේ ය. කවර එක් ධර්මයක් ද යත්: **කායගතාසතිය යි.** මහණෙනි, මේ එක් ම ධර්‍මය වඩනා ලද්දේ බහුල වශයෙන් කරන ලද්දේ සෝවාන් ඵලය පසක් කිරීම පිණිස පවත්නේ ය. සකෘදාගාමී ඵලය පසක් කිරීම පිණිස පවතී. අනාගාමී ඵලය පසක් කිරීම පිණිස පවත්නේ ය. අරහත් ඵලය පසක් කිරීම පිණිස පවත්නේ ය.

මේ තමයි කායගතාසතියේ ආනිසංස. අපි බලාපොරොත්තුවන අපිට අවශ්‍ය සියලුම ටික එක තැනක තියෙයි නේද? ගැඹුරු ම දේ නෙමෙයි, ඉතා ම ගැඹුරු, අද දවසේ අපහසුවෙන් තේරුම් ගන්නවන, තේරුම් ගන්න උත්සාහවත් වුණාත් නොතේරෙන, ඒ ධර්මයෝ පවා ප්‍රකට කරලා, පහළ

කරලා දීමේ හැකියාව තියෙනවා කායගතාසතියට. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,

"එකායනෝ අයං භික්ඛවේ මග්ගෝ සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදෝමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං චත්තාරෝ සතිපට්ඨානා".[186] –

"මහණෙනි, මේ එක ම මඟ යි. සත්ත්වයන්ගේ පිරිසිදු බව ඇති වෙන්නත්, හැඩිම් වැළපීම් ඉක්මවීමටත්, දුක් දොම්නස් නැති කරන්නටත්, මාර්ගඵල ලබන්නටත්, නිවන සාක්ෂාත් කරන්නටත් මේ සතර සතිපට්ඨානය යි කියලා. සතර සතිපට්ඨානයේ ප්‍රථම කොටස ගත්තහම කායානුපස්සනාව. කායානුපස්සනාව කියලා කියන්නේ කායගතාසතියට. කය අනුව ගිය සිහිය.

'කාය' කියන්නේ කය. 'ගතා' කියන්නේ ගිය. 'සති' කියන්නේ සිහිය.

~ කරන්න අමාරු ම දේ ~

ඕගොල්ලෝ දන්නේ නැතුව ඇති මේ ලෝකේ කරන්න අමාරු ම දේවල්වලින් වැඩිම අමාරු ම දේ ඕක කියලා. ඇයි ඒ? අපේ හිත හරියට කකුළුවා එළියට ඇස් ගෙඩි දෙක දාගෙන ඉන්නවා වගේ; රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන ටිකට හිත යොමා ගෙන අපි ඉන්නේ. අපේ සිත තියෙන්නේ එහෙම.

"බහිද්ධා විඤ්ඤාණං වික්ඛිත්තං විසටන්ති" [187] - බාහිර ආරම්මණයන් කෙරෙහි අපේ හිත විසිරිලා පැතිරිලා තියෙන්නේ. වික්ෂිප්ත මනසක ලක්ෂණය, විසිරුණු මනසක ලක්ෂණය, සමාධිමත් නැති මනසක ලක්ෂණය, ඒකාග්‍රතාවයක් නැති මනසක ලක්ෂණය තමයි විඤ්ඤාණය බාහිර අරමුණේ විසිරිලා පැතිරිලා තියෙන එක.

---

186 https://tipitaka.lk/dn-2-9/pali - **මහා සතිපට්ඨාන සූත්‍රය- දීඝ නිකාය 2- 436 පිටුව**

187 https://tipitaka.lk/mn-3-4-8 - **උද්දේසවිභඞ්ග සූත්‍රය- විභඞ්ග වර්ගය- මජ්ඣිම නිකාය 3- 474 පිටුව**

රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්මාරම්මණ ගැන ම පුන පුනා හිතනවා. ඒ කියන්නේ බාහිර සත්ත්වයෝ, පුද්ගලයෝ, දේවල් තියෙනවා කියලා ඒවා ම අරමුණු කර කර හිත හැසිරෙනකම. හරියට අර සත්තු හය දෙනාගේ නැටි ටික එකට ගැට ගහලා දාපු තැන වගේ.

~ අපේ හිත බාහිර අරමුණුවල විසිරිලා තියෙන්නේ ඇයි~

බාහිර අරමුණුවල සිත විසිරිලා පැතිරිලා තියෙන්නේ මොකක් නිසා ද? සතිපට්ඨානය නැති නම් කායගතාසතිය නොවැඩූ නිසා. මම අර ගොඩාක් සූත්‍ර අරන් පෙන්නුවේ ඒවා ඉගෙන ගත්තා නම් කායගතාසතියේ තියෙන වටිනාකම තේරෙනවා. කායගතාසතිය නැතුව කවදාවත් නිවනට යන්න බැහැ කියන එක තේරෙනවා. ඊගාවට අපේ පැවිදි ජීවිතය සාර්ථක කර ගන්න, අපේ පැවිදි ජීවිතයට ලොකු ශික්ෂණයක් ගන්න කායගතාසතිය උදව් වෙනවා.

~ සොඳුරු වූ ද නමුත් දුෂ්කර වූ ද ගමනක ඇරඹුම~

කළ්‍යාණ මිත්‍ර ඇසුරෙන් සද්ධර්ම ශ්‍රවණයෙන් අපි දැක්ක යුතු දර්ශනය, අපි පැමිණිය යුතු තැන, යා යුතු තැන ගැන දැන ගන්නට ඕනේ. නමුත් ඊට පස්සේ එදවස ම මහණ වෙච්ච කෙනාටත් පටන් ගන්න පුළුවන් තැනකයි මේ සාසනය තියෙන්නේ. හත් හැවිරිදි වයසෙන් මහණ වෙච්ච කෙනාටත් පටන් ගන්න පුළුවන් තැනකයි මේ සාසනය තියෙන්නේ.

ඒ නිසා මම ඕගොල්ලොන්ට එක දෙයක් මතක් කරනවා. අද ඉඳලා අවංකව අපි හැම කෙනෙක් ම ටිකක් කායගතාසතිය කරලා බලමු. දවස් හතක් බැරි නම් අපි දවස් තුනක් දාගමුකො. හෙට දවසේ ඉඳන් දවස් තුනක් අඛණ්ඩව ම අතරක් නැතුව පැතිරුණු වතුරක් වගේ එක දිගට හිතින් අතනොහැර කායගතාසතිය වඩමු.

නියම විදිහට කායගතාසතිය වඩන කෙනෙකුට කල්ලි ගැහෙන්න බැහැ, දෙන්නෙක් එක්ක ඉන්න බැහැ. දෙන්නෙක් එක්ක එකට හිටියොත් කායගතාසතිය වඩන්න බැහැ. මේ කමටහනෙන් නිරායාසයෙන් ම අනවශ්‍ය සංයෝජන අතහැරෙනවා. හැම සංයෝජනයක් ම ගලවනවා මේ කමටහනෙන්. උදේ හයේ ඉඳන් හවස හය වෙනකන් පර්යංකය බැඳගෙන නැගිටින්නේ නැතුව සමාධියකින් ඉන්න කෙනෙක්ටත් පැයක් කායගතාසතිය වඩන්න කිවුවොත් බැහැ වඩන්න. අර සමාධියට සමවැදිලා ඉන්න එක ලෙහෙසි යි.

අපේ හිත පුරුදු වෙලා තියෙන්නේ ම බාහිරයට යන්න. නමුත් කායගතාසතිය වඩනවා කියලා ආධ්‍යාත්මික කය පැත්තට යොමු වූ පමණකින් ම රූප සිහි කරන්න, ශබ්ද සිහි කරන්න, ගන්ධ සිහි කරන්න, රස සිහි කරන්න, ඵොට්ඨබ්බ සිහි කරන්න, ධම්මාරම්මණයන් පැත්තට හැරිච්ච, ඒවායේ රස විඳපු මනසට ඉඩ නැහැ.

අපිට සංයෝජන ඇතිවෙලා, වෙහෙස ඇතිවෙලා යන්න තියෙන ගති ටික ඔක්කොම නතර වෙනවා. ඕනෑම කෙනෙකුට කරන්න පුළුවන් එකක්, උත්සාහයයි අවශ්‍ය. සති නිමිත්තේ හිත තියාගෙන තමන්ගේ ශරීරය ගැන ම නුවණින් මෙනෙහි කරමින් ම ඉන්න එකට කියනවා ***"අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති".*** [188]

එහෙම කායගතාසතිය වඩන කොට බැරිවෙලා හරි බාහිර කෙනෙක්ව, පුද්ගලයෙක්ව සිහි වුණොත් ඒ සිහිවෙච්ච අරමුණොත් ස්කන්ධයන්ගේ උදය වැය බලලා හෝ කනබොන ආහාරයෙන් හැදෙන ඒ කයේ ඇත්ත ඇති හැටිය පෙන්වනවා.

යටත් පිරිසෙයින් යන එන කොට ඉඳලා කිසිම වෙලාවක තමන්ගේ කය පැත්තට හැරිලා ඉන්න ගතිය අතහරින්නේ නැතුව අඛණ්ඩව උදේ ඉඳන් හවස් වෙනකන් එක ම එක දවසක් ඉඳලා බලන්න. ඒක මුළු හිතින් ම ගන්න. මොන විදිහකටවත් කයෙන් සිහිය අහකට යන්න දෙන්නේ නැතුව තියා

188 https://tipitaka.lk/mn-1-1-10 - **සතිපට්ඨාන සූත්‍රය- මූලපරියාය වර්ගය- මජ්ඣිම නිකාය 1- 136 පිටුව**

ගන්න. අමතක වෙලා හිත බාහිරයට ගියත් ක්ෂණිකව මතක් කරලා අරගෙන ආපහු කය කෙරෙහි ම තියා ගන්නවා කියලා උත්සාහවත් වෙන්න.

එක ම එක දවසක් උදේ ඉඳන් හවස් වෙනකන් කය කෙරෙහි සිහිය පිහිටුවා ගන්න උත්සාහවත් වෙමින් ඉඳලා බලන්න. අනික් දවස්වලට භාවනා කරන්න හදන කොට ඇතිවෙච්ච ප්‍රතිඵලයත්, කායගතාසතිය එක පැය ගාණක් වඩපු එකේ වෙනසත් ඕගොල්ලොන්ට ම එතකොට තේරේවී. ඕක එක දිගට ම කරනවා කියනවා කියන එක ලෙහෙසි නැහැ, අමාරුයි. හැබැයි වීර්යය තියෙන කෙනාට බැරි නැහැ. කායගතාසතිය වඩන්න පුළුවන් එක එක විදිහට.

කායගතාසතිය වඩන ක්‍රම

~ අනිත්‍ය සංඥාව~

අනිත්‍ය සංඥාවෙන් බලන්න පුළුවන්. සරල තැනින් පටන් ගමු. කොහොමද අනිත්‍ය සංඥාව වඩන්නේ මේ කය පැත්තට යොමුවෙලා? කය හිතෙන් අල්ලගෙන මේ රූපය මෙහෙම තිබුණාට කන් ඇහෙන්නේ නැති, ඇස් පෙනෙන්නේ නැති, ජරා ජීරණ ස්වභාවයට පත්වෙනවා නේද කියලා තමන්ගේ කය ගැන හිතනවා. හම රැළි වැටෙන දවසක් එනවා නේද, දත් වැටෙන දවසක් එනවා නේද, අතපය වලංගු නැතිවෙන දවසක් එනවා නේද, මේකේ කකුල් කැපෙන්න පුළුවන්, අත් කැපෙන්න පුළුවන්, ඇස් අන්ධ වෙන්න පුළුවන්. මේ වගේ වෙනස් වෙන්න පුළුවන් හේතු බොහෝයි.

කුඩා කාලේ ‘මම’ කියලා ගත්ත රූපය ළමා කාලේ වෙන කොට නැහැ. ළමා කාලේ ‘මම’ කියලා ගත්ත රූපය තරුණ කාලේ වෙන කොට නැහැ. තරුණ කාලේ ‘මම’ කියලා ගත්ත රූපය තලත්තෑනි කාලේ වෙන කොට නැහැ. තලත්තෑනි කාලේ ‘මම’ කියලා ගත්ත රූපය තව අවුරුදු දහයක් විතර යන කොට නැහැ. රූපය කියන්නේ එබඳු වූ වෙනස්වන

ධර්මයක් නේද. මම නෙමෙයි, මගේ ඇඟ නෙමෙයි, ඒ තමයි රූපයේ ස්වභාවය. එහෙම අනිත්‍ය සංඥාවෙන් බලන්න පුළුවන්.

~ අනත්ත සංඥාව~

අනත්ත සංඥාවෙන් බලන්නත් පුළුවන්. මේ රූපය; බත්, පාන්, කවුපි, මුං ඇට ආදී සත්ත්ව පුද්ගල නොවන කනබොන ආහාරය නිසා නේද හැදෙන්නේ. මේ ශරීරයේ තියෙන්නේ පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු නේද. අනාත්ම ආහාරය නිසා හටගන්න මේ රූපය අනාත්ම ම යි නේද.

මම ලෙඩ වෙනවට කැමති නැහැ. ඉතින් 'මේ රූපය මම' නම් මේ රූපයට ලෙඩ නොවී තියා ගන්න පුළුවන් වෙන්න ඕනේ නේ. තමන් ම එහෙම තර්ක විතර්ක කරනවා මේ කය ගැන. ඉතින් මම මහලු බවට කැමති නැහැ. ඒත් මේ රූපය දිරනවා නේ. මම මැරෙන්න කැමති නැහැ, ඒත් මේ රූපය නැසෙනවා නේ. එහෙනම් ඒකෙන් කියන්නේ තමාගේ නොවනකම නේද, අනාත්ම ස්වභාවය නේද.

මම මුත්‍රවලට කැමති නැහැ. ඒත් මේ කයේ මුත්‍ර උපදිනවා නේ. මම අසුචිවලට කැමති නැහැ, අසුචි පිළිකුල්. නමුත් අසුචි හැදෙනවා නේ මේ කයේ. මම කබවලට කැමති නැහැ. හැබැයි කබ උපදිනවා නේ මේ කයේ. මම හොටුවලට කැමති නැහැ. එත් මේ කයේ හොටු උපදිනවා නේ.

එහෙනම් මගේ නොවනකම නේද කියලා මේ කය මම, මගේ, මගේ ආත්මය කියන ගතිය ගැලවෙන්න මෙහෙම බලන්නේ. ඒ විදිහට අනාත්ම සංඥාවෙන්, තමාගේ නොවනකම ඔප්පු කර කර පෙන්වනවා. දවස පුරාවට ම ආධ්‍යාත්මික පැත්තට හැරිලා කය ගැන සිහියෙන් ඉන්නවා.

කනබොන ආහාරය සත්ත්වයෙක්, පුද්ගලයෙක් නොවන අනාත්ම හේතුවක්. අනාත්ම හේතුවක් නිසා හටගත්ත මේ රූපය අනාත්ම ම යි. බාහිර මැටි ටිකක හෝ කළුගලක තද කර්කශ ස්වභාවයක් (පඨවි) තියෙනවා නම්,

මැටි ටිකක්, කළුගලක් සත්ත්වයෙක් පුද්ගලයෙක් නෙමෙයි වගේ ම මේ රූපයේ තියෙන පඨවි ස්වභාවයට අයත් කෙස් ටිකත් සත්ත්වයෙක්, පුද්ගලයෙක් නෙමෙයි නේද. මේ වගේ එකින් එකට කුණප කොටස් ටික ගැන බලනවා. මැටි ටිකක්, කළු ගලක් 'පුද්ගලයෙක්' නොවනවා වගේ මේ ශරීරයේ තියෙන ලොම්, නිය, දත් ආදී කොටස් සත්ත්වයෙක් පුද්ගලයෙක් නෙමෙයි, ඒ පඨවි ධාතුව ම යි නේද කියලා බලනවා.

"යා චෙව බො පන අජ්ඣත්තිකා පඨවීධාතු යා ච බාහිරා පඨවීධාතු පඨවීධාතුරෙවෙසා".[189]- ආධ්‍යාත්මික පඨවි ධාතුවත් බාහිර පඨවි ධාතුවත් දෙක ම සමාන කරමින් බලනවා. පඨවි ධාතුව කියලා කියන්නේ සත්ත්වයෙක්, පුද්ගලයෙක් නෙමෙයි. පඨවි ස්වභාවය කියන්නේ තද කර්කශ ස්වභාවයට. පඨවි ධාතුව ආධ්‍යාත්මික තිබුණත් බාහිර තිබුණත් පඨවි ධාතුව, පඨවි ධාතුව ම යි කියලා ඔප්පු කරලා පෙන්වනවා. ඒ විදිහට අනාත්ම සංඥාවෙන් බලන්න පුළුවන්.

~ අසුභ සංඥාව ~

මේ ශරීරය කෙස්, ලොම්, නිය, දත්, සම් ආදී කුණප කොටස් තිස් දෙකකින් යුක්තයි නේද. ඇහෙන් කඹ ගලනවා, නාසයෙන් හොටු ගලනවා, කටින් කුණුකෙළ ගලනවා, කන් වලින් කන්කුණු වැගිරෙනවා, අධෝ මාර්ගයෙන් අසුචි වැගිරෙනවා, මුත්‍ර මාර්ගයෙන් මුත්‍ර ගලනවා. දහඩිය දැම්මහම කිහිලිවල ගඳ, වුරුණුතෙල් ගඳ, දත් මැද්දේ නැත්නම් කටේ ගඳ මේ විදිහට මහා අසුචි ගලන රූපයක් නේද මේ කියලා බලනවා. බුදුරජාණන් වහන්සේ පෙන්නපු අවවාද සිහි කර ගන්නවා.

මුඛ නවයක් තියෙන හොඳට පැසුණු නමුත් පුපුරලා නොගිය සැරව ගෙඩියක් ගත්තොත්; යම් යම් මුඛයකින් වැහුනොත් පිළිකුල් දෙයක් ම, දුගඳ

189 https://tipitaka.lk/mn-1-3-8 - මහාහත්ථිපදෝපම සූත්‍රය- ඕපම්ම වර්ගය- මජ්ඣිම නිකාය 2- 450 පිටුව

දෙයක් ම, අසුචි දෙයක් ම ගලන්නාක් මෙන් මුඛ නවයක් ඇති පිරුණු සැරව ගෙඩියක් වගේ, වැසිකිළි වළක් බඳු රූපය නේද මේ කියලා බලනවා.

මේ රූපයෙන් යමක් එළියට වැගිරුනොත් පිළිකුල් දෙයක් ම වැගිරෙනවා, දුගඳ දෙයක් ම වැගිරෙනවා, අසුචි දෙයක් ම වැගිරෙනවා, අකැමැති දෙයක් ම වැගිරෙනවා නේද කියලා මේ කය දිහා පිළිකුල් සංඥාවෙන් බලනවා.[190]

~ ආදීනව සංඥාව ~

අනේ මේ කය පරිහරණය කරන කොට සීතලෙන් පීඩා විඳින්න වෙනවා. උෂ්ණයෙන් පීඩා විඳින්න වෙනවා. මැසි මදුරු ස්පර්ශයෙන් පීඩා විඳින්න වෙනවා. අව්වෙන්, වැස්සෙන්, සර්පයන්ගෙන් පීඩා විඳින්න වෙනවා. කටු කිනිති ඇනිලා, කෝටු පාරවල් වැදිලා, කකුල් පහරවල් වැදිලා, අත් පහරවල් වැදිලා, දඬුමුගුරු පහරවල් වැදිලා, කඩු පහරවල්, කිනිසි පහරවල් කාලා පීඩා විඳින්න වෙනවා නේද මේ කය නිසා.

ජරා ජීර්ණ බවින් පීඩා විඳින්න වෙනවා නේද, ඒ වගේ ම මේ කය නිසා නොයෙක් දුක් විඳින්න වෙනවා නේද කියලා මේ කය මම නෙමෙයි, ආදීනව ගොඩක් නේද මේ පරිහරණය කරන්නේ කියන තැනකින් ආදීනව සංඥාවෙන් හෝ බලන්න පුළුවන්. මං මේ කියන ක්‍රම මතක තියාගන්න. ඒ කියන්නේ ඕගොල්ලොන්ට කායගතාසතිය වඩන්නේ කොහොමද කියලා වඩන්න කරුණු නැතිනම් මේ ඕනේ විදිහකට බලන්න පුළුවන්.

~ පහාණ සංඥාව ~

පහාණ සංඥාවෙන් බලනවා. මෙබඳු වූ අසුචියෙන් යුක්ත කුණු ගොඩක් වූ, අනාත්ම වූ මේ කය ‘මම’ කියලා, ‘මගේ’ කියලා, ‘මගේ ආත්මය’

190 https://tipitaka.lk/an-9-1-2-5/sinh - **ගණ්ඩොපම සූත්‍රය- සිහනාද වර්ගය- නවක නිපාතය- අඞ්ගුත්තර නිකාය 5- 425 පිටුව**

කියලා පෙන්වන කෙලේසයෙන් මනස මුදවා ගන්න ඕනේ නේද, මේ කෙලේසය දුරු කර ගන්න ඕනේ නේද, මේ කෙලේසය ගෙවාගන්න ඕනේ නේද කියලා මෙනෙහි කරන්න. එතකොටත් 'මේ කය මම' කියලා පෙන්වන උපාදාන ගතිය ටික ටික අයින් වෙනවා. මෙබඳු වූ අනාත්ම වූ ආදීනව සහිත කය 'මම' කියලා පෙන්වන උපාදාන ගතියෙන් මිදෙන්න ඕනේ කියන තැනකින් බලනවා.

~ කායගතාසතියෙන් ම ජීවත්වන හැටි ~

මේ විදිහට අනිත්‍යයෙන් හෝ, අනාත්මයෙන් හෝ, අසුභයෙන් හෝ, ආදීනවයෙන් හෝ, පහාණ සංඥාවෙන් හෝ කුමන ආකාරයකට බලමින් කය කෙරෙහි ම හිත තබා ගන්නවා. ඒ වගේ ම කයට හැප්පෙන, කයට අහුවෙන හැම දෙයක් ගැන ම සිහිය යි ඒ වෙලාවට. අපි යමක් අල්ලන කොට පඨවි ධාතුව පඨවි ධාතුවේ ස්පර්ශ වෙනවා නේද කියලා ක්ෂණිකව සිහි කර ගන්නවා. ඒ කියන්නේ මේ කයේ අහුවෙන තැන තද ගතිය යි, අහුවෙන වස්තුවේ තද ගතිය යි දෙකට හිත යොමු කරලා බලනවා.

ඊට පස්සේ, ***"ගච්ඡන්තෝ වා ගච්ඡාමීති පජානාති"*** [191] - යන කොට යන බවට හොඳට සිහිය හා නුවණ යි. මම යනවා, මම එනවා නෙමෙයි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතු රූප මිටිය 'යමි' කියන චේතනාව නිසා මේ කයේ ඉදිරියට යෑම ආපසු ඒම පෙනෙනවා නේද කියලා නුවණින් බලනවා.

අපි කය කෙරෙහි සිහිය පවත්වන්නේ නැතුව, තමා ළඟ සිද්ධියේ ඇත්ත නොපෙන්වා මේ කය මම, මගේ කියන තැනකින් බැසගෙන හිඳිමින් මහා ගැඹුරු දර්ශන කතා කෙරුවත් අපි නතර වෙලා තියෙන්නේ මම යි ඒ දර්ශනය බැලුවේ කියන තැනක. ඔබ පටන් ගන්නවා නම් අද ඔබ පිහිටලා ඉන්න තැනට ම පහර ගහන්න. එතකොට අපි අහගත්ත දර්ශනය ගාවට නිරායාසයෙන් ළඟා වෙයි. ඒ නිසා එක දෙය යි මම මතක් කරන්නේ.

---

191 https://tipitaka.lk/mn-3-2-9 - **කායගතාසති සූත්‍රය- අනුපද වර්ගය- මජ්ඣිම නිකාය 3- 240 පිටුව**

අඛණ්ඩව වීර්යය කරන, නොසෙල්වෙන වීර්යය තියෙන කෙනාට කායගතාසතිය වඩන්න පුළුවන්.

අපි නිවන් දකින්න නම් ආවේ, කායගතාසතිය වඩන්න අපිට වීර්යය, උත්සාහය නැති නම් අපිට නිවන් දකින්න බැහැ. කායගතාසතිය වඩා ගන්න වීර්යය නැතිකමට තමයි අපි ජීවිතයට සාධාරණයක් කර ගන්න හදන්නේ. අපි විභාග ලියනවා, නොයෙක් බාහිර දේවල් කරන්නේ මොකට ද? එහෙන් සුරක්ෂිතභාවයක් හොයා ගන්න.

නමුත් මාස ගාණකට ඕගොල්ලොන්ගේ ජීවිතයට සුරක්ෂිතභාවයක් ලැබෙන්න බාහිර දෙයක් කරන කොට, එක ම එක දවසක්, රැයක් දහවලක් වීර්යය කරන්න කායගතාසතියට. මුළු ජීවිතයට ම විතරක් නෙමෙයි මුළු සසරට ම සුරක්ෂිතභාවය ලැබෙයි. ඕගොල්ලෝ මුළු හිතින් ම වටලලා අරන් එක සතියක් අඛණ්ඩව කායගතාසතිය වැඩුවොත්, එක සතියෙන් මුළු පැවිදි ජීවිතය ම දිනුවා වෙයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය එදාට විතරක් හරි, අද ඒකේ ප්‍රතිඵල නැහැ කියලා එකක් නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ***"ඉමෙ ච සුභද්ද භික්ඛූ සම්මා විහරෙය්‍යුං අසුඤ්ඤො ලොකො අරහනෙතහී"ති.***[192] සුභද්ද, මනා කොට පිළිවෙත් පිරුවොත් රහතුන්ගෙන් කිසි කලෙකත් මේ ලෝකේ හිස් වෙන්නේ නැහැ කියලා.

අද වෙන කොට මනා කොට පිළිවෙත් පුරනවා කියන ටික අඩුයි. කිසි කෙනෙක් මේ ලෝකේ අදට මම දන්නේ නැහැ කවුරුවත් ම අවංකව අතනොහැර කායගතාසතිය වඩනවා ද කියලා. පැය ගාණක් භාවනා කරයි, පැය භාගයක් භාවනා කරයි, පැය කාලක් භාවනා කරයි, ටිකක් හිතයි, එච්චරයි. නමුත් කායගතාසතිය ටැඹකට කණුවකට උපමා කළා කියන්නේ මේ කය පැත්තට නැඹුරු වෙලා හරියට කූඩැල්ලෙක් එල්ලුනා වගේ අතනොහැර මුළු හිතින් කය ගැන ම සිහිය පවත්වාගෙන ඉන්න එකට.

---

192 https://tipitaka.lk/dn-2-3 - **මහාපරිනිර්වාණ සූත්‍රය- දීඝ නිකාය 2- 238 පිටුව**

කණුවක ටැඹක බැන්දාට, ඒත් සත්තු ටික තමන් කැමති ඒ ඒ පැත්තට යන්න අදිනවා වගේ මුල් දවස්වල රූප සිහි වෙනවා, ශබ්ද සිහි වෙනවා, ගන්ධ, රස, ඵොට්ඨබ්බ සිහි වෙනවා. ඒ නිසා බාහිර ආයතන ටිකට යන්න ම හදනවා. ඒත් යන්න නම් දෙන්නේ නැහැ, ක්ෂණිකව මතක් කරලා සිහිය සහ නුවණ කය කෙරෙහි තබා ගන්නවා.

මුල් කාලේ දී කය කෙරෙහි හිත තියා ගත්තට බැහැ එහෙම ඉන්න. කිඹුලාට වතුරට ම යි පැනලා හුරුව, බල්ලාට ගමට ම යි පැනලා හුරුව, නරියාට සොහොනට ම යි පැනලා හුරුව, නයාට හුඹහට ම යි පැනලා හුරුව, කුරුල්ලාට අහසට ම යි පැනලා හුරුව, වඳුරාට ගහට ම යි පැනලා හුරුව වගේ රූපය පැත්තට, ශබ්දය පැත්තට, ගන්ධය පැත්තට, රස පැත්තට, ඵොට්ඨබ්බ පැත්තට, ධම්මාරම්මණ පැත්තට ම යන්න හදනවා අපේ හිත.

~ මාරයාගේ ඉඩම හා පියා සතු ඉඩම ~

බාහිර ආයතන පැත්ත තමයි මාරයාගේ ක්ෂේත්‍රය. කායගතාසතිය කියලා කියන්නේ පියා සතු ඉඩම.[193] මෙතන හිටියොත් විතරයි ඕගොල්ලෝ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන ටිකට නොයා බේරෙන්න පුළුවන් වෙන්නේ. කර්ම රැස් නොවී හැංගිලා ඉන්න තියෙන එක ම තැන. මෙතන ඉන්නේ නැතුව බාහිර ආයතන පැත්තට යන්න, යොමු කරන්න ඕගොල්ලොන්ට සාධාරණීකරණය කරන්න බොහෝ කරුණු ගොඩක් ඉදිරිපත් වෙයි. මාර යුද්ධය කියලා කියන්නේ ඒ මොන දේ මොන විදිහට ආවත් තමන්ගේ කය කෙරෙහි ම සිහිය දැඩි කර ගෙන පවත්ව ගන්න තමන් දක්ෂවන එකට.

චූටි ඇසිල්ලේ ඉක්මනට ම ඕගොල්ලොන්ට අමතක වෙලා බාහිරයට නැඹුරු වෙලා හොඳට වැඩ කටයුතු කරමින් ඉඳී. ඒ වෙලාවට බොහොම

193 https://tipitaka.lk/sn-5-3-1-7/sinh - **මක්කට සූත්‍රය- සතිපට්ඨාන සංයුක්තය- සංයුත්ත නිකාය 5- 273 පිටුව**

දැහැමි සිතුවිලිත් පහළ වෙයි. ගොඩක් පිං සිද්ධ වෙයි මේක කළොත් කියලා. වැඩ කටයුතු කරන්න බැරිකමක් නැහැ කායගතාසතිය වැඩුවා කියලා. මම ඒ වැඩ කටයුත්ත කරනවා. හැබැයි කායගතාසතියේ හිඳිමින් ම කියලා පටන් ගන්න.

උදළු ගානවා නම්, සුද්ද කරනවා නම්, කුටියක් හදනවා නම් පුළුවන් ඒ දේවල් කරන්න කායගතාසතියේ හිඳිමින් ම. නමුත් ආධුනික මනසේ දී වැඩ කටයුතු කරමින් කායගතාසතිය පවත්වන්න බැහැ තමන්ගේ ඉන්ද්‍රිය ශක්තිය නැති නිසා. කායගතාසතියේ ම හිඳිමින් වැඩ කටයුතු කරන්න පුළුවන් සිහිය හොඳට දියුණු වුණාහම. ඒ හින්දා මුල දී වැඩ කටයුතු අඩු ම කර ගන්න වෙනවා.

~ තණ්හාව දෙවැන්නා ~

දෙන්නෙක් එක්ක එකට කාණ්ඩ ගැහි ගැහී කවදාවත් කායගතාසතිය වඩන්න බැහැ. කායගතාසතිය වඩන කෙනාට හුදකලා බව ම යි සුදුසු. අපි කවුරු හරි කෙනෙක් තව එක් කෙනෙක් එක්ක ඉන්නවා නම් දකින්න මෙයා කායගතාසතිය වඩන්නේ නැති කෙනෙක්, කායගතාසතියට කැමති නැති කෙනෙක්, මෙයා නිවන් දකින්න කියලා ආවට නිවන් දකින්න කැමති නැති කෙනෙක්, නිවන වඩන්නේ නැති කෙනෙක් කියලා හඳුනා ගන්න.

කායගතාසතිය අතහැරෙන නිසා ම යි තව කෙනෙක් හම්බ වෙන්නේ. **තණ්හාව දෙවැන්නා.**[194] තව එක් කෙනෙක් ඉන්නවා කියන එක නිර්මාණය කරලා එයා එක්ක ගනුදෙනු කරන මනස කෙලේසයකින් හදලා තියෙන්නේ. තණ්හාවේ ලක්ෂණය තමයි තව එක් කෙනෙක් එක්ක කටයුතු කරන්න හදලා තියෙන එක. දෙවැන්නෙක් නැතුව තනියම ඉන්න පුළුවන් එක ම කෙනා කායගතාසතිය වඩන කෙනා විතරයි.

---

194 https://tipitaka.lk/sn-4-1-7-1/sinh - **මිගජාල සූත්‍රය- සළායතන සංයුත්තය- සංයුත්ත නිකාය 4- 81 පිටුව**

~ කායගතාසතිය කළ්‍යාණ මිත්‍රයා කර ගන්න ~

කායගතාසතිය මේ ලෝකේ ඉන්න එක ම කළ්‍යාණ මිත්‍රයා කර ගන්න. ඕගොල්ලෝ පෞද්ගලිකව යහළුවෙක්ව හදාගන්න කායගතාසතිය නැමති. එයා හරි සත්පුරුෂයා. එයාව ඇසුරු කරන්න. එයා එක්ක කතාබහ කරන්න.

ආනන්ද මහතෙරුන් වහන්සේ දේශනා කළ ගාථාවක (ආනන්දතෙථේර ගාථා) තියෙනවා, ළඟින් ම ඉඳලා උපස්ථාන කරපු බුදුරජාණන් වහන්සේත් පිරිනිවන් පාලා. සැරියුත් මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ, රාහුල මහරහතන් වහන්සේ වගේ එකට හිටපු සබ්‍රහ්මචාරී මහරහතන් වහන්සේලාත් පිරිනිවන් පාලා. එදා හිටපු ඇසුරු කළ බොහෝ කළ්‍යාණ යහළු මිත්‍රයෝ පිරිනිවන් පාලා. පැත්තකට වෙලා ඉන්න කොට ආනන්ද මහරහතන් වහන්සේට මෙහෙම හිතෙනවා ලු.

"අබහතීතසහායසස අනීතගතසත්ථුනො,
නත්ථි එතාදිසං මිත්තං යථා කායගතා සති".[195]

("පහව ගිය කළණ මිතුරන් ඇතියාහට, පළමු පිරිනිවියා වූ ශාස්තෘන් වහන්සේ ඇතියාහට, කායගතාසතිය වැනි කළණ මිතුරෙක් තවත් නැහැ")

මගේ ශාස්තෘන් වහන්සේත් කලින් පිරිනිවන් පෑවා. එකට හිටපු සබ්‍රහ්මචාරී වහන්සේලාත් පිරිනිවිලා, මට අද දවසේ ඉන්න එක ම කළ්‍යාණ මිත්‍රයා කායගතාසතිය යි. කායගතාසතිය නිසයි ඒ දේවල්වලින් පීඩාවක්, දුකක් නොඑන මට්ටමට තමන් රැකිලා තියෙන්නේ කියනවා.

තමන්ගේ ජීවිතයට දුකක් පීඩාවක් එන්න නොදී ශාස්තෘන් වහන්සේ ළඟ හිටියා වගේ තමන්ව අද රැක ගන්නේ කායගතාසතිය යි කියනවා. ඇසුරු කරපු කළ්‍යාණ මිත්‍රයෝ අද වෙන කොට පහව ගියත්, ඒ පහව ගිය කළ්‍යාණ මිත්‍රයෝ තමන් ගාව හිඳිමින් අවවාද අනුශාසනා කරමින් තමන්ව

---

195 https://tipitaka.lk/kn-thag-17-3 - **ආනන්ද ස්ථවිරගාථා- තිංසතිනිපාතය- ථේරගාථා- ඛුද්දක නිකාය- 236 පිටුව**

රැක බලා ගන්නවා වගේ තමන්ව අද රැක ගන්නේ කායගතාසතිය යි කියනවා.

~ නිවන් පුරට යන වාහනයක් බඳු කායගතාසතිය ~

අපි මෙපමණාකිනුත් ලැජ්ජා වෙන්නට ඕනේ, අපි හැම කෙනෙක් ම අද දවස වන කොට කායගතාසතිය හඳුනා නොගත්තා නම්, කායගතාසතිය අතහැරලා දර්ශනයක් ගැන හෝ හිත හිතා බාහිර ආයතන ටිකේ ඉන්නවා නම් අපි හඳ ගැන කතා කර කර ඉන්නවා. හැබැයි හඳට යන ක්‍රමයක් නැහැ වගේ එතකොට.

හඳ ගැන කතා නොකළත් හඳට යන රොකට් එකක නැගලා ඉන්නවා වගෙයි කළ්‍යාණ මිත්‍ර ඇසුරෙන් සද්ධර්ම ශ්‍රවණයෙන් ලැබිලා තියෙන ස්පර්ශ ආයතන හයේ යථාභූත ඥාන දර්ශනය ගැන පුන පුනා හිතුවේ නැතත්, ඒ දර්ශනයට ළඟාවන යානයක නැගලා ඉන්නවා අපි කායගතාසතිය වඩනවා නම්.

කායගතාසතිය වැඩුවොත් බැරි වෙලාවකවත් මේ ජීවිතයේ ආස්‍රව ක්ෂය නොවුණොත්, ඊගාව බුද්ධ ශාසනයක කෙස්රොද කපලා අතට දෙන ප්‍රමාදය විතරයි ඕනේ. සමහර කුඩා ස්වාමීන් වහන්සේලා කෙස්රොද අතට දීලා *“කෙසා ලොමා නඛා දන්තා නඛෝ”* කියලා තචපංචකය කියන්න හම්බ වෙන්නේ නැහැ, ‘කෙසා’ කියන කොට ම රහත් වෙලත් ඉවරයි.

ඇයි ඒ? සසරෙදිත් බොහෝ කොට බහුල කොට කායගතාසතිය වඩලා තිබුණු නිසා. හොඳට තේරෙනවා, කෙස් ටික දකින කොට ම මම නෙමෙයි, මගේ නෙමෙයි, මගේ ආත්මය නෙමෙයි කියලා. ඒ විතරක් නෙමෙයි, මේ කයේ ඔක්කොම කොටස් තමන්ගේ නෙමෙයි කියලා.

කෙස් ටිකක් කපලා අතට තිබ්බොත්, මේ කෙස් ටික මම හෝ මගේ හෝ, මගේ ආත්මය වෙනවා ද? නැහැ. එහෙනම් මේ කයේ තියෙන හැම කොටසක් ම මම හෝ, මගේ හෝ, මගේ ආත්මය නොවෙන කොටස් ටිකක් නේද කියලා තමන්ට හොඳට තේරෙනවා.

ඒ නිසා දවස පුරාවට ම කය කුණාප කොටස් වශයෙන් හෝ බලමින්, බාහිර ධාතුවට සම කරමින් හෝ බලමින්, ආදීනවයෙන් හෝ බලමින්, අනිත්‍යයෙන් හෝ බලමින්, පීඩාවක් වශයෙන් හෝ බලමින් කය කෙරෙහි ම හිත යොමු කරන්න. සිහිය කයෙන් අහකට ගත්තොත් ඒ යන්නේ මාරයාගේ ක්ෂේත්‍රයට යි කියලා හිතා ගන්න.

වීර්යය වඩනවා නම් ඕගොල්ලොන්ට මේ අපහසුකම එක රැයක් දහවලක් තියෙයි. එහෙම නැතිනම් එක දවසක් තියෙයි. මුල් පැයේ තිබුණු අපහසුකම නැහැ දෙවෙනි පැයට එන කොට. එච්චර වේගවත්ව මේකේ ප්‍රතිඵලය දැනේවි. හැබැයි ආරම්භක අවස්ථාවේ මොන විදිහකටවත් ඉන්න අපහසු වෙයි. විනාඩියක් හිටියොත් මතක නැහැ කයෙන් අහකට හිත ගිහින්.

තමන්ට තේරෙයි අවශ්‍ය ම තැන එහෙනම් මෙතන තමයි සිහිය පිහිටුවා ගන්න. එහෙම කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන ඉන්න බැහැ නම් දැන ගන්න එතන තමයි ජීවිතයේ අවශ්‍ය ම තැන කියලා. අපේ ජීවිතයේ අපි භාවිතා කරලා නැති ම තැන ඒ.

බණ දහම් විදිහට හෝ හිතමින් අපේ මනස පහසුවෙන් ඉන්න පුළුවන් තැනක් තියෙනවා නම් දකින්න මේක නෙමෙයි තැන. නමුත් කයට සිහිය යොමු කර ගෙන කොච්චර වෙලා ඉන්න පුළුවන් ද කියලා බලන්න. එහෙම ඉන්න කොච්චර අපහසු ද කියලා තේරෙයි එතකොට.

~ කායගතාසතිය ජීවිතය කර ගන්න ~

යෑම් ඊම් ආදී ඉරියව් පවත්වන කොට ඒ ඉරියව් කය කෙරෙහි පිහිටි සිහියෙන් ම කරනවා. ඒ වගේ ම පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතුවෙන් හැදුණු කය ඇසුරු කර ගෙන පවතින සිතේ ඇතිවෙන චේතනාව නිසා මේ කයේ ඉදිරි යෑම, ආපසු ඒම පෙනෙනවා නේද කියලා තමන් හොඳට දන්නවා.

‘මම යනවා නෙමෙයි’, මේ කයේ ඉදිරියට යෑම හා ආපසු ඒම වෙන්නේ මේ කය ඇසුරු කර ගෙන පවතින සිතේ ඇති චේතනාව නිසා. සිතෙන් ඇති කරපු වායෝ ධාතුව තෙරපීම නිසා මේ කයේ සෙලවීම වෙන්නේ. කයට ඒ ඒ ඉරියව් පැවැත්වීම කරන්න පුළුවන් නම් හිත නැති චේතනා නැති මළමිනියටත් ඇවිදින්න පුළුවන් වෙන්න ඕනේ නේ.

ඊටපස්සේ, **නවසිවථික** [196] වශයෙන්, මේ කයට නැඹුරු වෙලා මේ කයෙන් සිත නිරුද්ධ වුණොත් ඉදිමිලා, නිල්වෙලා, පුපුරලා, සැරව ගොඩක් වන දවසක් එනවා නේද. මේ මුළු රූප මිටියට ම පණුවෝ ගහලා සිලි සිලි ගාලා පණුවෝ නලියන, මේ කයේ හැම කොටසක් ම පණුවන් විසින් කා දමන බවට පත් වෙනවා නේද.

මේ කය බල්ලන් විසින් කඩාකන, හිවලුන් විසින් කඩාකන, ගිජුලිහිණියන් විසින් කඩාකන තත්ත්වයට පත් වෙනවා නේද. මස් ලේවලින් බැඳුණු ඇටනහරක් විතරක් ඉතුරු වන දවසක් එනවා නේද. ඇටසැකිල්ලක් පමණක් බවට පත් වෙන්න පුළුවන් කය නේද මේ කියලා බලන්න පුළුවන්.

ඕගොල්ලොන්ට යද්දී එද්දී, පැන් පහසු වෙද්දී ආදී හැම වෙලාවේ ම කය ගැන බලන්න පුළුවන්. ටොයිලට් එකට ගියහම ටොයිලට් කළහම හොඳට ඒකේ නිමිත්ත ගන්න. මේ ශරීරයේ ඇතුළේ මෙච්චර අසුචි නේද මේ තිබුණේ, මෙච්චර ගඳ ගහන දේවල් නේද තිබුණේ. යද්දී එද්දිත් සිහි කරනවා මේවා ම නේද දැනුත් මේ ශරීරයේ තියෙන්නේ. මෙච්චර මේ වගේ අසුචියක් තියෙන තැනක නේද මේ කය ‘මම’ කියලා සුභ විදිහට හිතාගෙන ඉන්නේ.

අපි අද ඒ අසුභ නිමිති ගන්නේ නැහැ. නමුත් අසුභ භාවනාව කරන, කායගතාසතිය වඩන කෙනා අසුභ වූ පිළිකුල් නිමිත්තක් දැක්කොත් ක්ෂණිකව අහක බලාගන්නේ නැහැ කියනවා. හොඳට ඒ නිමිත්ත ගන්නවා. අසුචි ගොඩක් දැක්කොත්, මළකුණක් දැක්කොත් ඒ නිමිත්ත අරගෙන බාහිර අසුචිය පිහිටලා තියෙන ආධාරකය, වටපිටාව පිරිසිදු යි. නමුත් මේ ශරීරයේ තියෙන අසුචිය, අසුචිය තුළ ම යි තියෙන්නේ කියලා පෙන්වනවා. එතකොට

196 https://tipitaka.lk/mn-1-2-3/sinh - **මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රය- සිහනාද වර්ගය- මජ්ඣිම නිකාය 1- 211 පිටුව**

බාහිර තියෙන අසුචිය තව හොඳයි කියනවා මේ කයේ ඇතුළේ තියෙන අසුචියට වඩා.

ඒ විදිහට ***"උච්චාරපස්සාවකම්මෙ සමපජානකාරී හොති"*** [197]- මුත්‍ර කරන කොටත් හොඳට හිතනවා. මුත්‍ර කියලා කියන්නේ අපෝ ධාතුව. ආපෝ ධාතුව සත්ත්වයෙක් පුද්ගලයෙක් නෙමෙයි. "මේ මගේ කොටසක් ද වැගිරෙන්නේ, මේ ආපෝ ධාතුව නේ, මේ ශරීරයේ ඇතුළේ නේ තිබුණේ. ඉතින් ඒ ආපෝ ධාතුව කොහොමද 'මම' වෙන්නේ, 'මගේ' වෙන්නේ" කියලා හොඳට නුවණින් විමසනවා. වැසිකිළි කරන කොටත් මළපහ කියන්නේ මේ ද පඨවි ධාතුව නේද. අසුභයෙන් හෝ ධාතු වශයෙන් මෙනෙහි කරනවා. ඒවායේ අසුභ නිමිත්ත හොඳට ගන්නවා.

මේ වගේ කායගතාසතියට ආවරණය නොවුණු තැනක් නැහැ ජීවිතයේ. දානශාලාවට ගිහින් දන් වළඳන කොට බත් කටක් කන කොට සත්ත්ව නොවන, පුද්ගල නොවන සංඥාව ඕගොල්ලොන්ට හොඳට මෙනෙහි කරන්න පුළුවන්. මේ බත්, ව්‍යංජන කියන්නේ සත්ත්ව පුද්ගල නොවන අනාත්ම වූ කොටස්.

ආහාරය නිසා නේද මේ කයේ කෙස්, ලොම්, නිය, දත්, සම් ආදී කොටස් හැදෙන්නේ.[198] සතර මහා ධාතු රූප මිටිය යැපෙන්නේ මේ නිසා නේද. ඕගොල්ලොන්ට කනබොන ආහාරය ම කමටහනක් වෙයි කායගතාසතිය වඩා ගන්න. ඒ වගේ ගිලන්පස ටිකක් වළඳන කොට, පැන් ටිකක් වළඳන කොට මේ ආපෝ ධාතුව නේද. ඒ ආපෝ ධාතුව නිසා නේද මේ ශරීරයේ පැවැත්ම වෙන්නේ කියලා හොඳට නුවණින් හිතනවා.

හැම වෙලාවක ම කයට වැදෙන දේවලුත් සතර මහා ධාතුයි, ඒවා ස්පර්ශ වන කයත් සතර මහා ධාතු යි කියලා බලන්න. මේ විදිහට කයේ අනාත්ම ස්වභාවය ම බලන්න, කය කෙරෙහි නැඹුරු වෙච්ච මනසකින් ඉන්න. උත්සාහය, වීර්යය තියෙනවා නම් කායගතාසතිය වඩන එක පොඩි

---

197 https://tipitaka.lk/mn-3-1-7 - **ගණකමොග්ගල්ලාන සූත්‍රය- දේවදහ වර්ගය- මජ්ඣිම නිකාය 3- 92 පිටුව**

198 https://tipitaka.lk/an-4-4-1-9/sinh - **තික්ඛුනී සූත්‍රය- සිවුවැනි පණ්ණාසකය-චතුක්ක නිපාතය- අඞ්ගුත්තර නිකාය 2- 283 පිටුව**

ළමයෙකුට හෝ කරන්න පුළුවන් එකක්. අපි අඛණ්ඩව නොකරන එකෙයි දෝෂය තියෙන්නේ.

ඔහොම කායගතාසතිය වඩලා බලන්න වෙනස කොච්චර ද කියලා. ඕගොල්ලෝ තමන්ගේ කයේ ඇත්ත බලන්න කියලා සිහිය යොමු කළ පමණකින් ම රූපයට, ශබ්දයට, ගන්ධයට, රසයට, ඵොට්ඨබ්බයට යන්න නොදී සංවර කර ගන්න පැය ගාණක් සිතුවිලි එක්ක ඔට්ටුවන සිත, බාහිර ආයතන පැත්තට නොයන නිසා සංවර වෙනවා.

~ කමටහන ආදරෙන් රැක ගන්න ~

කය කෙරෙහි ම සිහිය පිහිටුවා ගෙන ඉන්න හුරු නැහැ අපිට. ඒ හුරු නැතිකම නිසා අපි පහසු ක්‍රම, කෙටි ක්‍රම හොයා ගන්නවා බාහිරයට යන්න. කඩුවක් කිනිස්සක් අරගෙන නම් එන කොට මූ නම් හතුරෙක් වධකයෙක් කියලා අපි දන්නවා. හැබැයි සිල් රෙද්දක් පොරවාගෙන කිනිස්ස ඉනේ ගහගෙන අවොත් හොයන්න බැහැ.

ඒ වගේ බාහිර කෙලේසයක් එන කොට නම් දන්නවා ඔන්න තමන්ව කායගතාසතියෙන් අයින් කරන්න කියලා. නමුත් කායගතාසතියෙන් අයින් කරන්න සමහරවිට බොහෝ දැහැමි විදිහට සංකල්ප එන්නත් පුළුවන්. එතකොට අපි හිතන්නේ ඒකත් කුසලයක් කියලා. කුසල් තමයි, නමුත් මේ වෙලාවේ දී ඒවා කමටහනට බාධාවක්. කමටහන කියලා කියන්නේ අඛණ්ඩව කායගතාසතිය, කය කෙරෙහි සිහිය පිහිටුවා ගෙන ඉන්න එකට.

ඉස්සර සමහර ස්වාමීන් වහන්සේලා පිණ්ඩපාතයේ වඩින කොට කය කෙරෙහි සිහිය අමතක වෙලා ගියහම, ඊට පස්සේ මතක් කරනවා, මම අහවල් තැන වෙනකන් සිහියෙන් ආවා. අහවල් තැන දී කමටහන අතහැරුණා කියලා සිහිය අතහැරිච්ච තැනට ආපහු යනවා. ආපහු එතනට ගිහිල්ලා, හොඳට සිහිය පිහිටුවා ගෙන ආයෙත් ඉදිරියට වඩිනවා කියනවා.

ආයෙත් ටික දුරක් යන කොට බැරිවෙලා හෝ කය කෙරෙහි සිහිය අමතක වෙලා ගියොත්, තමන් දන්නවා අහවල් තැන දක්වා ම කය කෙරෙහි හොඳට සිහියෙන් ආවා. ඉතුරු ටික තමයි සිහිය අතහැරිලා ගිය ටික, ඒ නිසා ඒ සිහිය අතහැරුණු තැනට ආපහු වැඩලා හොඳින් සිහිය පිහිටුවා ගෙන ආයෙත් සිහියෙන් ම ඉස්සරහට වඩිනවා.

ඉස්සර මේ සම්බන්ධව කතා තියෙනවා, ඔය බව නොදන්නා ගිහියෝ අර හාමුදුරුවන්ට නම් පිස්සු කියලා කියනවා ලු. නමුත් එහෙම කිවුව අයට අකුසල් සිද්ධ නොවෙන්න රහත් වෙලා සෘද්ධි ප්‍රතිහාර්‍ය පාලා පෙන්නපු අවස්ථාවලුත් තියෙනවා. ඒක වතක් - 'ගතපච්ඡාගත වත' කියලා. ගිහිල්ලා ආපහු එනවා.

තව සමහර ස්වාමීන් වහන්සේලා කටේ වතුර පුරවාගෙන යනවා ලු. ඒ මොකද, තව කවුරු හරි එක්ක කතා කරන්න වෙයි කියලා. ඉස්සර ස්වාමීන් වහන්සේලා රහත් වුණා, අද ඉන්න ස්වාමීන් වහන්සේලා රහත් වෙන්නේ නැහැ කියලා ලෝකයා කියනවා. ඉස්සර ස්වාමීන් වහන්සේලා කෙලෙස් ගෙවා ගන්න වීර්යය යි, උපායශීලී. අද අපි එහෙම වීර්යය කරන්නේ නැහැ. අපි එහෙම උපායශීලී නැහැ.

අද අපි ටිකෙන් ටික අපහසුවක් නැතිව නිවන ළඟා වෙනකන් ඉන්නේ. අපි ඇඟට දැනෙන්න වීර්යය කරන්නේ නැහැ. ඒකේ ප්‍රතිඵලය Exercise machine එකක (ව්‍යායාම් කරන යන්ත්‍රයක) දුවනවා වගේ එක ම තැන. නමුත් එදා වීර්යය කරපු උත්තමයෝ පැවිදි වෙලා නොබෝ කලෙකින් මාර්ගඵල ලැබුවා.

පිරිසෙන් වෙන්වෙලා, හුදෙකලා වාසයට පැමිණිලා යම් අර්ථයක් සඳහා කුලපුත්‍රයෙක් පැවිදි වුණා නම් ඒ සිය අර්ථය සඳහා කාය ජීවිත දෙකේ අපේක්ෂාවෙන් තොරව අප්‍රමාදීව වාසය කළා. **යමක් සඳහා ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයෙක් ශාසනයේ පැවිදි වුණා නම් ඒ උතුම් අරිහත්වය නොබෝ**

කාලෙකින් සාක්ෂාත් කර ගත්තා[199] කියලා හම්බ වෙනවා ඉස්සර. ඒත් අද ඒ තත්ත්වය කෝ?

~ නිවන ස්පර්ශ කිරීමට නම් ~

ඕගොල්ලෝ එක අතකට වාසනාවන්ත යි. කායගතාසතිය වඩන කොට අනුක්‍රමයෙන් ආස්‍රව ක්ෂය වන කොට තමන් දැක්ක යුතු දර්ශනයත් අපි මතක් කරලා තියෙයි. තව දුරටත් කළ්‍යාණ මිත්‍ර ඇසුර තියෙනවා. මොන තරම් අසංඛතය අතට දෙන මට්ටමක දැනුමක් තිබුණත් නිවන කවදාවත් ජීවිතය කර ගන්නේ නැහැ කායගතාසතිය නැති කෙනා.

ඒ කිවුවේ නිවන ස්පර්ශ කරනවා කියන එක වෙන්නේ නැහැ. නිවන ගැන හිතිය හැකි, නිවන ගැන කිවුව හැකි. නමුත් නිවන කියන එක ජීවිතය කර ගන්නේ නැහැ. නිවනේ සිසිල ලැබෙන්න නම් එක දෙය යි කරන්න ඕන. ඒ තමයි කායගතාසතිය වඩන එක.

කවුද කැමති අඛණ්ඩව හුදෙකලා වාසයට ගිහිල්ලා තනි තනිව ම දින තුනක් මේක කරන්න? බැරි කවුද ඉන්නේ? බැරි කට්ටියත් අත උස්සන්න බලන්න. හැම දෙයක් කරන්නත් ජීවිතයේ සතුටු තැනක ඉන්න ඕනේ. ඕගොල්ලෝ මේ දවස් තුන කායගතාසතිය වැඩුවොත් ජීවිතය ඇත්තට ම සතුටු තැනකට පත් වෙයි.

හොඳට මතක තියා ගන්න මේ දුන්නු ඉලක්කය ලෙහෙසි එකක් නෙමෙයි. මේකේ බැරෑරුම්කම තේරුම් ගන්න. ඒ කියන්නේ ලෝකේ තුළ මොන තරම් ආශ්චර්යමත් කාම වස්තු පැත්තෙන් ගත්තොත් දේපළ වස්තුව, රජකම්, ඇමතිකම්, චක්‍රවර්ති රජකම් ආදී ඔය හැම ගතියකට ම යන්න තියෙන සියලු කෙලෙස් යට කරන්න පුළුවන්කමක් කායගතාසතියට තියෙන්න ඕන.

---

199 https://tipitaka.lk/sn-5-3-1-3/sinh - **භික්ඛු සූත්‍රය- සතිපට්ඨාන සංයුක්තය- සංයුත්ත නිකාය 5- 265 පිටුව**

එතකොට ඒ වගේ හැම දේකට ම, හැම තැනකට ම වඩා ශ්‍රේෂ්ඨ උසස් ගතියක් ඇති වෙනවා කියන පැත්තට යොමු වෙන්න ලෙහෙසි වීර්යයකින් බැහැ. ඔය කියන තරම් ඔච්චර අමාරු ද නැද්ද කියලා බලන්න පැය කාලක් යෝගිකව කරලා බලමු ද අපි?

මේ පැය කාල ඇතුළත තියෙන්නේ ම එක තැනක ඉඳගෙන ඉන්නවා නම් හෝ ඇවිදිනවා නම් ඒ ඉරියව්වට මුලින් ම සිහිය තියා ගෙන ඒ සිහියට අනුවෙච්ච කය කෙරෙහි කුණාප වශයෙන් හෝ බලමින්, බාහිර ධාතුවට මේ කයේ ධාතු ස්වභාවය සම කරමින් හෝ ආදීනව බලමින් හෝ ඕනෑම විදිහකින් හිතුව හැකි.

මේ කය නිසා සීත, උෂ්ණ, මැසි මදුරු දුක් විඳින්න වෙනවා නේද. නින්දා අපහාස ඇනුම් බැනුම් අහන්න වෙනවා නේද. සිත නිරුද්ධ වුණොත් මේ කය ඉදිමිලා නිල්වෙලා පුපුරලා ඕජා ගලන තත්ත්වයට පත් වෙනවා නේද. මේ ඕනෑම ක්‍රමයකට හිතන්න පුළුවන්.

එහෙම හිතමින් ඉමු බලන්න කොච්චරක් පුළුවන් වෙනවා ද කියලා. 09.00 යි වෙලාව. ඕනේ නම් නැගිට්ටට කමක් නැහැ. කුස්සියට ගියාට කමක් නැහැ. එළියට යන්න නම් බැහැ මං හිතන්නේ වහිනවා නේද. මේ Recorder එක off කරන්න පුතේ.

ඔන්න දැන් අපි නැගිටින කොට බලන්න, සාමාන්‍යයෙන් මේක Off කරන්න කිවුවහම අපි ටක්ගාලා ඒ වස්තුව සිහි කරගෙන ඒක කරන්න නේ නැගිටින්නේ. නමුත් වෙනස, මේ දේ කරන්න ඕනේ කියලා හිතුනොත් කය කෙරෙහි සිහිය තියාගෙනයි මේකට යොමු වෙන්නේ. අන්න ඒකයි අමාරු.

දැන් කෝප්පය ගන්න ඕනේ වුණොත් කෙලින්ම කෝප්පයට හිත යොමු කරලා කෝප්පය දිහා බලාගෙන නේ අපි ගන්නේ. එතකොට ම අපිට ආධ්‍යාත්මික කය කෙරෙහි පවත්වපු සිහිය මඟහැරිලා. නමුත් ඒ සිද්ධිය ම කරලා බලන්න මෙහෙම. කය කෙරෙහි සිහිය තබා ගෙන කෝප්පය ගන්න

කොට හොඳට අල්ලන අතත් එක්ක තමයි ඕගොල්ලොන්ට සිහිය තියෙන්න ඕන.

ඕගොල්ලොන්ට ඉස්සෙල්ලා ම සිහිය එන්නේ වස්තුවට නෙමෙයි, අල්ලන අතට එන්න ඕනේ. වෙනස ඒකයි. පෙනෙන දේට අත තියලා ගන්නවා කියන කොට ම ඕගොල්ලෝ දැන ගන්න ඒ තමයි අඛණ්ඩව කායගතාසතිය නොවඩන මනසක ලක්ෂණය කියලා. අපි හුරු වෙලා තියෙන්නේ ම එහෙම.

නමුත් කායගතාසතිය වඩන කෙනා වස්තුව අල්ලන කයට යි සිහිය. අනික් කෙනා කෙලින් ම බාහිරයට නැඹුරු වෙලා කෝප්පය ගන්නවා. නමුත් කායගතාසතිය වඩන කෙනා සිහි ඇතුව අතපය දිගහරිනවා, හකුළනවා. කෝප්පය ගන්නවා කය කෙරෙහි සිහිය අතනොහැර. නුවණයි පඨවි ධාතුව, පඨවි ධාතුව එක්ක ස්පර්ශ වෙනවා කියන එකටත්. හැම වෙලාවේ ම ආධ්‍යාත්මික පැත්තේ ම යි සිහිය. ඔන්න ඕවා තමයි ක්‍රමවේද මේ කායගතාසතිය සාර්ථක වෙන්න.

හැම කෙනෙක් ම ඉඳගෙන ඉන්න කොට කායගතාසතිය වඩයි කෙස්, ලොම්, නිය, දත් ආදී වශයෙන් බලමින්. හැබැයි ජීවත් වෙන්න යන කොට කෙලින් ම කෝප්පය ගන්න යන්නේ. සිහි ඇතුව ම අතපය දිගහරිනවා කියන එක කරන්නේ නැහැ. අත හකුළනවා කියන එකත් සිහි ඇතුව ම, අත දිගහරිනවා කියන එකත් සිහි ඇතුව ම කරන්න ඕන. ලෝකයා බාහිර ආයතනයට නැමිලා කෝප්පය ගත්තා, කෝප්පය දුන්නා කියන කොට, කායගතාසතිය වඩන කෙනා සිහි ඇතුව ම අතපය හකුළනවා දිගහරිනවා කියන එකෙන් ඒ වැඩේ ම කරලා තියෙනවා.

"සම්ඤ්ඤිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති" [200]- අපි නිකන් පිස්සුවට අතපය දිගහරිමින් හකුළුවමින් ඉන්නේ නැහැ නේ. අතපය හකුළන කොට දිගහරින කොට කියලා කියන්නේ එක්කෝ මොනවා හරි දෙයක් ගන්නවා, මොනවා හරි දෙයක් එක තැනක ඉඳන් තවත් තැනකට තියනවා කියන සිද්ධියක් නෙමෙයි ද කරන්නේ?

---

200 https://tipitaka.lk/sn-5-3-1-2 - **සතෝ සූත්‍රය- සතිපට්ඨාන සංයුක්තය- සංයුත්ත නිකාය 5- 262 පිටුව**

අපි නිකන් හිතාගෙන ඉන්නේ ඉඳගෙන හිටියා ඔන්න ටිකක් අත දිගහැරියා. ඔහොමද අපි *සම්ඤ්ඤපිතෙ පසාරිතෙ* හැම වෙලාවේ ම කර කර ඉන්නේ? *"සම්ඤ්ඤපිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති"* කියලා නුවණින් අතපය හකුළනවා දිගහරිනවා කියලා කියන්නේ අපි මොනවා හරි ගන්නවා, මොනවා ම හෝ යමක් දෙනවා, මොනවා හෝ දෙයක් විසි කරනවා කියන මේ සිද්ධාන්තයට සිහියයි නුවණයි කියන එක එතකොට.

එයාගේ ඉන්ද්‍රිය පුදුම විදිහට සංවර වෙන්නේ. ඒ කියන්නේ අති වේගයෙන් ක්‍රියාකාරකම් කරන්න බැහැ එතකොට. එක පාරට යමක් ගන්න බැහැ. ගන්නවා කියන ක්‍රියාවට සිහිය යි. එතකොට තමන්ගේ අත ගැන පඨවි ධාතු කියලා නුවණත් තියෙයි, තමන්ගේ සිහිය කය හරහා ම යි තියෙන්නේ. කයෙන් ඔබ්බට ගෙනියන්නේ නැහැ.

ඒ කියන්නේ බාහිර වස්තු මත මනස පතිත වෙන්න ක්‍රියාකාරකම් කරන්නේ නැහැ. ගන්න කොට ගන්නා බව දන්නවා කියන කොට ඒකෙන් කියනවා වස්තු අහුවෙන විදිහට කරන්න එපා. හොඳට තමන්ට සිහිය තියෙනවා අත දිගහරින හකුළන සිද්ධියට.

කුටියට ගියහමත් වැඩ කටයුතු කරද්දිත් එහෙමයි. ඒකයි කායගතාසතිය තනි නොවිච්ච කෙනෙකුට කරන්න බැහැ. කොච්චර සිහිය ද කියන්නේ ඉඳගෙන ඉඳලා නැගිටින කොට බාහිර වස්තුවක් බලාගෙන නැගිටිනවා කියන ක්‍රියාව තියෙන්න බැහැ. සිහියෙන් ම කය කෙලින් කරන එක, කය නමන එක කරන්න ඕනේ. යන කොට යන බවට සිහිය යි. හතර ඉරියව්වේ ම කය ගැන දැනුම් සහගතව ම යි තියෙන්නේ.

කයේ පවත්වන ඉරියව්ව ගැන දැනුම් සහිතව ම යි කියන එකෙන් කියනවා, බාහිර වස්තුවක් සිහි කර ගෙන යන්න හදන්නේ නැහැ. බාහිර වස්තුව ගාවටයි යන්න ඕනේ කියලා දන්නවා. හැබැයි කය කෙරෙහි සිහියෙන් කරන්නේ. කායගතාසතිය වඩන අඳ දවසේ කිසි කෙනෙක් ඒක කරන්නේ නැහැ.

අද බොහෝ අය කායගතාසතිය වඩනවා කියලා කරන්නේ මොකක් ද? ඉඳගෙන ඉන්න කොට කෙස්, ලොම්, නිය, දත්, සම්, මස් කියලා බලනවා. හැබැයි කෝප්පය ගන්න කොට මම කෝප්පය ගන්නේ කියන මට්ටමකයි තියෙන්නේ. කෝප්පය ගන්න පුද්ගලයාව නියෝජනය වන තැනට පහර වදින විදිහට නෙමෙයි ක්‍රියාව සිද්ධ කරන්නේ.

දැනට ඉඳගෙන ඉන්න කොට හරි අඛණ්ඩව ම සිහිය තමන්ගේ කය පැත්තේ තියාගෙන ඉන්න පුළුවන් ද කියලා බලන්න. එක ම දෙයක් මුමුණා මුමුණා ඉන්නේ නැතුව මේ කයේ සැබෑ ස්වභාවය ප්‍රකට වන එක එක ක්‍රම වලට හිතන්න බලන්න. ඒතකොට බලන්න ඒ ටිකට බාහිර අරමුණු වලින් තමන්ගේ මනස මඟහැරිලා තියෙන හැටි. එහෙම නම් අපි ටිකක් කායගතාසතිය වඩමු.

හැමදෙනාට ම තෙරුවන් සරණයි!

<u>මෙම උතුම් ධර්ම ග්‍රන්ථය සැකසීම වෙනුවෙන් මූල්‍යමය දායකත්වය ලබා දුන් කළණ මිතුරන්</u>

ලක්ෂ්මන් සිල්වා මහතා සුමේධා මහත්මිය

කසුන් දෙල්ගොල්ල මහතා සහ අනුරාධා දෙල්ගොල්ල මහත්මිය

තරින්ද්‍රා ධර්මසිරි මහත්මිය

මධුරිකා ජයවර්ධන මහත්මිය සහ සමන් ජයවර්ධන මහතා

සන්ධ්‍යා සමරතුංග මෙනවිය

නිමාලි ගුණාවර්ධන මහත්මිය

යිෂානි අබේසූරිය මහත්මිය

සහන් සිතිජ මහතා

පර්ල් චෙරින් මෙනවිය

ශෙහාරා ප්‍රනාන්දු මෙනවිය

ධනුෂ්ක ජයසුන්දර මහතා සහ දිනුෂි ධර්මසූරිය මහත්මිය

සෝමා තෙන්නකෝන් මහත්මිය

සුමිත්‍රා සමරවික්‍රම මහත්මිය

නිමන්ත නිරෝධ මහතා

සෝවාන් වීමට

මේ සාසනය ගොඩක් වෙනස්.
මේ දහමෙන් තොර ලෝකයා කියන්නේ අපි ඉපදෙන්නත් ඉස්සෙල්ලා
ලෝකය තිබ්බා. ඒ ලෝකෙට අපි උප්පත්ති වශයෙන් ආවේ.
එහෙම උප්පත්ති වශයෙන් ඇවිල්ලා අපි ජීවත් වෙලා මැරිලා යනවා.
ලෝකේ තියෙනවා වගේ තැනකින්නේ හඳුන ගන්නේ.

ඒ කිව්වේ ගෙවල්, මිනිස්සු, යානවාහන, ඉඩකඩම්, බස්, පාරවල් තියෙන
ලෝකයක් තමයි තියෙන්නේ. ඔය ලෝකෙට තමයි අපි උප්පත්ති වශයෙන් ආවේ.
එහෙම උප්පත්ති වශයෙන් ඇවිල්ලා අපි ටික කාලයක්
ඒ ලෝකේ තුළ ජීවත් වෙලා මැරිලා යනවා.
නමුත් අපි ජීවත් වුණු ලෝකේ තියෙනවා වගේ තැනකින්නේ
අශ්‍රැතවත් පෘථග්ජනයා (ලෝකයා) ලෝකය ගැන හඳුනගන්නේ.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඒක එහෙම නෙමෙයි.
"ඡස්සු ලොකො සමුප්පන්නො" ස්පර්ශ ආයතන හය උපන්න කල්හි
ලෝකය උපන්නේ කියලා. "ලෝකයත්, ලෝකයේ ඇතිවීමත්,
ලෝකයේ නැතිවීමත්, ලෝකය නිරුද්ධ කරන මාර්ගයත්
මම මේ සංඥා සහිත සිත සහිත බඹයක් පමණ ශරීරයෙන් පනවමි" කියලානේ
බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ.
එතකොට තේරුම් ගන්න, භවය කියන්නේ පංච උපාදානස්කන්ධ ලෝකයට.
ඔය ලෝකය කියන එක හැදිච්ච න්‍යාය තමයි
පටිච්චසමුප්පාද සිද්ධියෙන් පෙන්වන්නේ.

(පූජ්‍යපාද බාත්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේගේ දේශනාවකින්...)

ධර්ම දානය පිණිසයි.